305 වන කාණ්ඩය - 09 වන කලාපය
தொகுதி 305 - இல. 09
Volume 305- No. 09

2023 සැප්තැම්බර් 05 වන අඟහරුවාදා
2023 செப்ரெம்பர் 05, செவ்வாய்க்கிழமை
Tuesday, 05th September, 2023

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

ආර්ථික අර්බුදයේ බලපෑම සමනය කිරීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයන් ආදේශ කිරීම

විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම

වරප්‍රසාද: ගරු එස්.එම්. මරික්කාර් මහතා මාධ්‍ය සාකච්ඡාවකදී සිදු කළ ප්‍රකාශය

වරප්‍රසාද: ගරු අලි සබ්රි රහීම් මන්ත්‍රීවරයාගේ නොමනා ක්‍රියා කලාපය

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

2023 අ.පො.ස. (උසස් පෙළ) විභාගය නොවැම්බර් මාසයේ පැවැත්වීමෙන් සිසුන්ට සිදුවන අසාධාරණය

**සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත් කෙටුම්පත:**

පළමුවන වර කියවන ලදී

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**

වල්පොල පියනන්ද අධ්‍යාපන සහ සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) - [ගරු සංජීව එදිරිමාන්න මහතා] - පළමුවන වර කියවන ලදී

**ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත:**

දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

**ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:**

දෙවන වර කියවා ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී

**සමාධි ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත:**

දෙවන වර කියවා ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී

**වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත:**

ඉල්ලා අස්කර ගන්නා ලදී

**කල්තැබීමේ යෝජනාව:**

බාල වරදකරුවන් සමාජගත කිරීමේදී මතුවන ගැටලු

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**

உண்ணாட்டரசிறை (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு

பொருளாதார நெருக்கடியின் தாக்கத்தினைத் தணித்தல் பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர்கள் பதிலீடு

வெளிப்படையான மற்றும் பொறுப்புக்கூறவேண்டிய அரசாங்கமொன்று பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர் பதிலீடு

சிறப்புரிமை: மாண்புமிகு எஸ்.எம். மரிக்கார் ஊடக மாநாட்டில் தெரிவித்த கூற்று

சிறப்புரிமை: மாண்புமிகு அலி சப்ரி ரஹீமினது முறையற்ற நடத்தை

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**

2023 க.பொ.த. (உயர் தர) பரீட்சையை நவம்பரில் நடத்துவதால் மாணவர்களுக்கு ஏற்படும் அநீதி

**குடியியல் வான்செலவு (திருத்தம்) சட்டமூலம்:**

முதன்முறை மதிப்பிடப்பட்டது

**தனி உறுப்பினர் சட்டமூலங்கள்**:

வல்பொல பியனந்த கல்வி கலாசார மன்றம் (கூட்டிணைத்தல்) – [மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன] - முதன்முறை மதிப்பிடப்பட்டது

**ஆயுள்வேதம் (திருத்தம்) சட்டமூலம்:**

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

**ஸ்ரீ பாலாபிவூர்தி வர்தன சமிதிய (கூட்டிணைத்தல்) சட்டமூலம்:**

இரண்டாம் முறை மதிப்பிடப்பட்டு, சட்டவாக்க நிலையியற் குழுவுக்குச் சாட்டப்பட்டது

**சமாதி சமூக அபிவிருத்தி மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்:**

இரண்டாம் முறை மதிப்பிடப்பட்டு, சட்டவாக்க நிலையியற் குழுவுக்குச் சாட்டப்பட்டது

**சொத்துக்களையும் பொறுப்புக்களையும் வெளிப்படுத்தல் (திருத்தம்) சட்டமூலம்:**

வாபஸ் பெறப்பட்டது

**ஒத்திவைப்புப் பிரேரணை:**

சிறார் குற்றவாளிகளைச் சமூகமயப்படுத்தும்போது ஏற்படும் பிரச்சினைகள்

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
- Inland Revenue (Amendment) Bill: Determination of the Supreme Court
- Sectoral Oversight Committee on Alleviating the Impact of the Economic Crisis: Substitution of Members
- Sectoral Oversight Committee on an Open and Accountable Government: Substitution of Member
- Privilege: Statement Made by Hon. S.M. Marikkar at a Media Conference
- Privilege: Unethical Conduct of Hon. Ali Sabri Raheem

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
- Injustice to Students by Holding the 2023 G.C.E (Advanced Level) Examination in November

CIVIL AVIATION (AMENDMENT) BILL:
- Read the First time

PRIVATE MEMBERS' BILLS:
- Walpola Piyananda Educational and Cultural Foundation (Incorporation) - [The Hon. Sanjeeva Edirimanna] - Read the First time

AYURVEDA (AMENDMENT) BILL:
- Read a Second, and the Third time, and passed as amended

SRI BALABHIVURDHI WARDANA SAMITHIYA (INCORPORATION) BILL:
- Read a Second time, and allocated to Legislative Standing Committee

SAMADHI COMMUNITY DEVELOPMENT FOUNDATION (INCORPORATION) BILL:
- Read a Second time, and allocated to Legislative Standing Committee

DECLARATION OF ASSETS AND LIABILITIES (AMENDMENT) BILL:
- Withdrawn

ADJOURNMENT MOTION:
- Issues Related to Reintegration of Young Offenders

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2023 සැප්තැම්බර් 05 වන අඟහරුවාදා***
*2023 செப்ரெம்பர் 05, செவ்வாய்க்கிழமை*
*Tuesday, 05th September, 2023*

**පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
### உண்ணாட்டரசிறை (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு
### INLAND REVENUE (AMENDMENT) BILL: DETERMINATION OF THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

I wish to announce to Parliament that I have received the Determination of the Supreme Court in respect of the Bill titled "Inland Revenue (Amendment)", which was challenged in the Supreme Court in terms of Article 121 (1) of the Constitution.

For reasons provided in the Determination, the Supreme Court has held that neither the Bill nor any of its provisions are inconsistent with Article 12 or any provisions of the Constitution.

Accordingly, the Bill can be validly passed by a simple majority of the Legislature.

I order that the Determination of the Supreme Court be printed in the Official Report of today's proceedings of the House.



*ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය :*
*உயர் நீதிமன்றத் தீர்ப்பு:*
*Determination of the Supreme Court:*

IN THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBI OF SRI LANKA

S.C. (SD) No. 63/2023 and S.C. (SD) No. 64/2023

INLAND REVENUE (AMENDMENT) BILL

BEFORE:

| | | |
|---|---|---|
| Buwaneka Aluwihare, PC | - | Judge of the Supreme Court |
| A.H.M.D. Nawaz | - | Judge of the Supreme Court |
| Arjuna Obeyesekere | - | Judge of the Supreme Court |

S.C. (SD) No. 63/2023

| | | |
|---|---|---|
| Petitioner | : | Chathuranga Abeysinghe |
| Counsel | : | M.A. Sumanthiran, PC with Suren Fernando, Ermiza Tegal and Ms. Divya Mascranghe |
| Intervenient Petitioner | : | Bank of Ceylon |
| Counsel | : | Eraj de Silva with N.K. Ashokbaran, Daminda Wijeratna, Dinesh Vidanapathirana and Janagan |
| Respondent | : | Hon. Attorney General |
| Counsel | : | Nirmalan Wigneswaran, DSG with Amasara Gajadeera, SC, Navodi de Zoysa, SC and Thushara Warapitiya, SC |

S.C. (SD) No. 64/2023

| | | |
|---|---|---|
| Petitioners | : | 1. Swasthika Arulingam<br>2. Jayantha Dehiaththage |
| Counsel | : | Nuwan Bopage with Lahiru Welgama instructed by Ramzi Bacha Associates |
| Respondent | : | Hon. Attorney General |
| Counsel | : | Nirmalan Wigneswaran, DSG with Amasara Gajadeera, SC, Navodi de Zoysa, SC and Thushara Warapitiya, SC |

The Court assembled for hearings at 10.00 am on 28 August 2023.

A Bill entitled the Inland Revenue (Amendment) Act ("the Bill") was published as a supplement to Part II of the Gazette dated 14 July 2023.

The aforesaid Bill which seeks to amend the Inland Revenue Act, No. 24 of 2017 as amended, ("IRA Act") was placed on the order paper and presented to Parliament on 8 August 2023. Two Petitions as numbered above impugn the constitutionality of the Bill and the Petitioners, Intervenient-Petitioner in SC/SD/63/2023 and the Attorney General were heard in support of their respective positions on 28 August 2023.

The Petitioners in SC (SD) 63/2023 and SC (SD) 64/2023 principally focused their impugnation of the Bill on Clause 2 that seeks to increase the tax rate to 30% on that portion of the income inuring to the benefit of Superannuation Funds for the second half of the year of assessment 2023-2024 and subsequent years of assessment. It has to be noted that the present rate of taxation on the income accruing to the superannuation funds remains at 14% and it is this tax rate that is sought to be increased to 30%. But therein lies a qualification to the imposition of the incremental rate of 30% on the interest income of the superannuation funds. The increased tax rate will supervene only in the event there is a non-subscription to an effective participation in the ongoing domestic debt optimization programme (DDO).

Put succinctly, the continued imposition of the lesser rate of 14% on interest income of the superannuation funds is contingent only upon the effective participation of the said funds in the ongoing domestic debt optimization programme (DDO).

All this is made patently clear in Clause 2 of the Bill its legal effect stated therein.

Clause 2 of the Bill

Clause 2 of the Bill which seeks to amend the First Schedule to Act, No. 24 of 2017 provides as follows:

*The First Schedule to the Inland Revenue Act No. 24 of 2017 is hereby amended by the repeal of paragraph 8 of that schedule and the substitution therefor, of the following paragraph:-*

"8. *Tax rate for Employees Trust Funds, Provident, Pension or Gratuity Funds and termination Funds.*

*(1) The taxable income of the Employees Trust Fund, an approved provident or pension fund, or an approved termination fund for a year of assessment commencing on or prior to April 1, 2022 and for the first six months period of the year of assessment commencing on April 1, 2023 shall be taxed at the rate of 14%.*

*(2) Subject to subparagraphs (3) and (4) the taxable income of the Employees Trust Fund, an approved provident or pension fund or an approved termination fund for the second six months' period of the year of assessment commencing on April 1, 2023 and for each year of assessment commencing on or after April 1, 2024 shall be taxed at the rate of 14%.*

*(3) Such part of the gains and profits received or derived by the Employees Trust Fund, an approved provident or pension fund or an approved termination fund from treasury bonds, for the second six months' period of the year of assessment commencing on April 1, 2023 and for each year of assessment commencing on or after April 1 ,2024, shall be taxed at the rate of 30%.*

*(4) Notwithstanding anything to the contrary in the provisions of subparagraph (3), if the Employees Trust, an approved provident or pension fund or an approved termination fund has invested in eligible bonds, and the Registrar of the Public Debt Department of the Central Bank of Sri Lanka confirms that any such funds has effectively participated in the process of domestic debt optimization approved by the Parliament Resolution dated July 1, 2023, such part of the gains and profits received or derived by such funds from the treasury bonds, for the second six months period of the year of assessment commencing on April 1,2023 and for each year of assessment commencing on or after April 1, 2024 shall be taxed at the rate of 14%.*

The **"Statement of Legal Effect"** in the said Bill provides as follows:

*"Clause 2: This clause amends the First Schedule of the Inland Revenue Act, No. 24 of 2017 and the legal effect of that Schedule as amended is to increase the income tax rate applicable to the Employees Trust Fund, an approved provident or pension fund, or an approved termination fund up to 30% and the income tax rate applicable to the funds which effectively participate in the process of domestic debt optimization to continue as 14%."*

Clause 2 (5) of the Bill defines "approved termination fund" as follows:

*"Any thrift, savings or building society or welfare fund to which contributions are made by employees only or, any gratuity fund approved by the Commissioner-General and maintained for the purpose of payment of gratuities to employees on the termination of their services, under the Payment of Gratuity Act, No. 12 of 1983;*

The expression "eligible bonds" is defined to mean

*the treasury bonds applicable for the purposes of domestic debt optimization, issued under the Registered Stocks and Securities ordinance (Chapter 420) that are: -*

*(a) Maturing between June 28, 2023 and December 31,2023 (excluding the treasury bonds maturing on July 15, 2023); and*

*(b) Maturing in the calendar year 2024 to 2032 (both inclusive).*

Though the above definition of eligible bonds occurs in the Bill as above, the learned DSG brought to the notice of this Court that a Committee stage amendment would be moved to the Bill and we would allude to it at the end of this determination.

So, the pith and substance of the Bill is as plain as a pikestaff. The Bill entails that superannuation funds which participate in the domestic debt restructuring programme will continue to be taxed at the existing rate of 14% on the interest income they receive from treasury bonds, whilst those Funds which do not 'voluntarily' participate, will be taxed at 30% of their interest income.

The Petitioners in SC (SD) 63/2023 and SC (SD) 64/2023 contended that the proposed scheme of taxation is offensive of Article 12 (1) of the Constitution as only the superannuation funds have been chosen for taxation, whilst other bondholders including bonds held by Banks have been excepted from the application of the 30% taxation on the interest income and profits arising from treasury bonds. The Petitioners have argued that this categorization is discriminatory and infringes the consecration of equality in Article 12 (1) of the Constitution and the Petitioners have further contended in their written submissions that the resultant position is one of inconsistency with Article 3 of the Constitution. The argument of ad hominem legislation against the Bill was also advanced before Court.

It has to be recalled that the learned President's Counsel for the Petitioner in SC (SD) 63/2023 conceded in oral submissions the long-held prescriptions in regard to fiscal statutes but his contention is that this Bill fits within the straitjacket of manifest unreasonableness in cherry picking the low wage earners and excluding the primary dealers and banks. This brings us to the burden of justifications that State must place before this Court in order to vindicate its argument of constitutional consistency and before we look at the policy considerations that have been advanced before us as founding the fulcrum and furnishing the rationale of the Bill, we proceed, for the sake of completeness, to hark back to the established jurisprudence on taxing matters.

Article 12 (1) of the 1978 Constitution provides that all persons are equal before the law and are entitled to the equal protection of the law. This constitutional provision for equality before the law or the equal protection of the laws has weathered many legal storms. Although greatly weather beaten, the main features of this constitutional doctrine of equality of law are sufficiently well settled to-day. It is enough to state here that Article 12 (1) of the Sri Lankan Constitution does not insist that every piece of legislation must have universal application and it does not take away from the State the power to classify persons for the purposes of legislation, but the classification must be rational, and in order to satisfy this test (i) the classification must be founded on an intelligible differentia which distinguish those that are grouped together from others, and (ii) that differentia must have a rational relation to the object sought to be achieved by the Act. The differentia which is the basis of the classification and the object of the Act are distinct things and what is necessary is that there must be a nexus between them.

Any classification undoubtedly raises the specter of discrimination and arbitrariness but provided that a Bill passes muster on the above tests, the perceived discrimination and arbitrariness recede into a mirage. Taxing statutes are not immune to these tests and these prescriptions equally apply to them.

It is often said that the legislature need not tax everyone in order to tax someone. The observations of Hedge J of the Indian Supreme Court in ***S.K. Dutta v Lawrence*** I.T.R (1968) 68 ITR 272 repay attention.

*"It is well settled that a statute does not have to tax everything in order to tax something. It is allowed to pick and choose districts, objects, persons, methods and even tax rates for taxation if it acts reasonably"*

These views are echoed even in overseas jurisdictions. It was pointed out by Bradley, J. in the ***Bells Gap Bailroad Co. v. Commonwealth of Pennsylvania***, (1890) 134 US 232: 33 Law Ed 892 (E) at p. 895 that the XIV[th] Amendment of the American Constitution was not intended to compel the States to adopt an iron rule of equal taxation. If that were its proper construction, it would not only supersede all those constitutional provisions and laws of some of the States, whose object is to secure equality of taxation, and which are usually accompanied with qualifications deemed material; but it would render nugatory those discriminations which the best interests of society require, which are necessary for the encouragement of needed and useful industries and the discouragement of intemperance and vice, and which every State, in one form or another, deems it expedient to adopt.

It is on this premise that taxing statutes have passed constitutional muster and beknown to all, there is a host of case law here in Sri Lanka which drives home that the constitutional doctrine of equality before the law or the equal protection of the laws is not violated by a reasonable classification and there is no limit as to the classification so long as it has and observes a rational basis.

It is in this context that manifest unreasonableness has been articulated as forming an exception to classifications, that will invalidate a classificatory attempt on the part of the legislature. A slew of precedents have alluded to this and in recent times this Court had occasion to indulge in an exhaustive analysis of tax jurisprudence as laid down in a long line of judicial precedents and recapitulate them in a special determination concerning Surcharge Tax-see **S.C. (SD) No. 19/2022 to S.C. (SD) No. 21/2022 and S.C. (SD) No. 23/2022 to S.C. (SD) No. 29/2022 on Surcharge Tax Bill.** The cases cited therein are a useful reminder of the pith and kernel of the interpretive jurisprudence on taxing statutes and this determination would not labour a regurgitation of the rich case law except when deemed apposite and appropriate.

Pinpointedly it could be said that the rubric of manifest unreasonableness was referred to by the Supreme Court in a determination in relation to the *Inland Revenue* (Amendment) Bill S.C. No. 27/2004.

*"It is clear from the observations made consistently by the Constitutional Court and this Court that in revenue matters, in making classifications for the purpose of granting concessions or imposing liability there is a wide discretion. These measures are taken not only to raise resources necessary for the State but also to direct economic activity projected to the general welfare of the society. Such measures would be considered as inconsistent with Article 12 of the Constitution only if they are manifestly unreasonable or discriminatory."*

These strands of opinion were reflected as far back as the days when the Constitutional Court would pronounce in its pre-enactment appraisal of Bills. In the course of a determination in the case of the Finance (Amendment) Bill, (1978) (5) Decisions, the Constitutional Court of Sri Lanka put forward at page 1 –

*"In taxation matters even more than in other fields, it is well established that the legislature has the greatest freedom in classification. In deciding whether a taxing law is discriminatory or not it is necessary to bear in mind that the State has a wide discretion in selecting the persons or objects it will tax and that a stature is not open to attack on the ground that it taxes some*

*persons or objects and not others. It is only when within the range of its selection the law operates unequally that it cannot be justified on the basis of any valid classification."*

Even in the case of a taxing statute with retrospectivity, the above reasoning has been perceptible in Sri Lanka. The Supreme Court in the determination involving the Value Added Tax (Amendment) Bill S.C. (S.D) No.29/2004 observed as follows:

*"It is settled law that law dealing with tax matters and otherwise valid, creates no unreasonable restriction and would even be retrospective. Such retrospective taxation cannot be regarded as unreasonable. The general notion is that the Legislature is empowered to enact laws, which could be applicable with retrospective effect. (Government of Andra Pradesh v H.M.J [1975] SC 2037). This would include the tax laws (Jawahaumal V State of Rajasthan 1966) SC 764) and retrospective taxation cannot be regarded as unreasonable unless it is clearly prohibitive. More importantly, Parliament is empowered to enact laws having retrospective effect.*

Be that as it may the crux of the arguments before this Court has focused on the selection of what was called a vulnerable populace vis a vis the Banks, primary dealers and other bondholders who have been excluded from the ambit of the Bill under consideration.

**Provenance of the Bill**

Both the learned Deputy Solicitor General and the learned Counsel for the Intervenient Petitioner have traced the origin and rationale of the Bill to the unprecedented economic and social challenges that continue to plague Sri Lanka with severe recession, depleted international reserves, unsustainable public-sector and heightened financial sector vulnerabilities. Extensive background material concerning the continuing economic and financial hardships faced by Sri Lanka and the steps taken with a view to restoring macroeconomic stability and public debt sustainability has been placed before Court and the relevant material discloses that the Government of Sri Lanka (GOSL) has entered into a forty-eight-month arrangement under the Extended Fund Facility (EFF) with the International Monetary Fund (IMF) on 20th March 2023 to secure a speedy transition to economic recovery - (Annex attached to the written submissions filed by the Attorney General - *Cabinet Memorandum titled "Implementation of the Domestic Debt Optimization to restore sovereign debt sustainability" dated 28 June 2023).*

Consequently, the following debt sustainability targets under the IMF-EFF supported programme have been set;

i. To reduce the level of public debt from its status in 2022 of 128% of GDP to below 95% of GDP by 2032;

ii. To reduce the average central Government Gross Financing Needs (GFNs) from its status in 2022 of 34.6% of GDP to below 13% of GDP for the period of 2027-2032, so that rollover risks under stress are manageable;

iii. To limit the foreign exchange debt service of the central government from 9.4% of GDP as at 2022 to below 4.5% of GDP in any year during 2027-32; and

iv. To ensure that the fiscal and external financing gaps are closed.

In order to achieve the target of public debt sustainability, one of the key requirements that has been necessitated is that Sri Lanka carries out a Domestic Debt Optimization (DDO). As a component part of the process, it has been submitted before this Court that the country is expected to have made satisfactory progress on public debt restructuring before the first review of the IMF programme due in September 2023 and towards this end Sri Lanka has already implemented an External Debt Restructuring Programme to restructure its external public debt.

As regards its domestic debt, factors such as the composition, investor and settlement concentrations and impact to the financial system stability have been considered and this court has been served with material pertaining to a mechanism devised to optimize public debt including Local Law Local Currency (LLLC) debt.

As is well known, this would involve Sri Lankan Rupee (LKR) denominated debt governed by Sri Lanka law. Both the external and domestic debts thus appear to be targets of the DDO.

Upon questions posed by this Court in the course of the hearings, it has been submitted that the Local Law Local Currency (LLLC) debt optimization would include the conversion/exchange of Treasury Bonds that have already been issued under the Registered Stock and Securities Ordinance, No. 7 of 1937 (as amended) as at end-May 2023 into new Treasury Bonds to be issued under the said Ordinance.

In order to have the old bonds converted into new bonds, the Ministry of Finance on behalf of the Republic, has issued an Invitation to Exchange to eligible holders, namely the Superannuation Funds, to submit offers to exchange Treasury Bonds issued by the Republic for new Treasury Bonds with an indicative timeline of events along with an exchange memorandum setting out *inter alia* the terms and conditions of the Invitation to Exchange.

It is in this background that the LLLC Debt Optimization entails a tax disincentive whereby, as pointed out by this Court upon a perusal of the relevant clauses of the Bill and the legal effect, the non-participation by superannuation funds is visited with a higher tax rate of 30% on the taxable income of such superannuation funds from Treasury Bonds to be applicable from 1 October, 2023.

Thus it becomes clear that it is these overriding considerations and imperatives that provide the reasons for the proposed enactment of the instant Bill titled Inland Revenue (Amendment) Act. It cannot be gainsaid that it is the DDO that has eventuated in the attempt of the legislature to give effect to these economic considerations that have precipitated in an indispensable adjunct such as a legislative measure. Cataclysmic and catastrophic consequences were referred to in the course of the submissions before this Court. Reference was made to an affidavit filed by the Governor of the Central Bank at paragraph 61 in SC FR/187/2023 of a prophetic doom of an **apocalyptic collapse** that will ensue if the DDO process is unsuccessful or delayed. The Armageddon of gloom has been described in the following tenor:

(a) Currently, Sri Lanka's economic recovery depends solely on the continuation of the IMF-EFF supported programme, which would in turn depend on the successful implementation and completion of the public debt restructuring process.

(b) The first review of the IMF programme is scheduled for September 2023, and the IMF Mission will assess the situation very carefully before recommending the disbursement of the second tranche (SDR 254 million) under the IMF programme.

(c) If the public debt restructuring process is stalled or delayed, the continuation of the IMF programme would be subject to major risks. This will delay all other financial assistance by other multilateral lending institutions such as the World Bank and the Asian Development Bank, which benchmark their funding to the continuation of the IMF programme.

(d) If such foreign funding support does not come through, major balance of payments risks could emerge as the country's official and usable reserve position is still below the adequate levels, and the banking sector's foreign assets' position has not improved compared to pre-crisis levels.

(e) Such a situation would put Sri Lanka in a highly vulnerable position as was witnessed in 2022, where limited foreign exchange availability in the country resulted in a major socio-economic and socio-political catastrophe in the country.

(f) If such situation re-emerges, the GOSL will have no choice but to extend the existing debt standstill on external public debt to a further period, while possibly defaulting on domestic public debt, as the possibility of a large risk premia on domestic borrowings could prevent from mobilizing funds from the domestic market.

(g) This could result in a loss to all domestic as well as external creditors, including superannuation funds and the banking sector.

(h) Possible risks to the financial system stability of the country could put Sri Lankan economy in great danger causing massive losses to businesses and individuals by delaying the envisaged economic recovery to a prolonged period. A banking crisis could risk lifetime savings of the general public including members of superannuation funds.

Having described the era of the doom and gloom that would result as a consequence of any backward reneging on DDO, there is material before us that prophesies that if there is a disruption in the completion of the DDO process, the gains Sri Lanka has made so far would unwind rapidly. Interest rates would escalate as confidence evaporates and the GOSL would not be able to raise funds through auctioning government securities.

These extremely negative consequences of a prognosis have not been contradicted or assailed by the Petitioners. Another salient consideration that weighs with this Court is the alleged proclivity of the external creditors to demand of this nation that they be treated on par with domestic creditors. It is a given that external creditors would not countenance that they are less favorably treated than the domestic creditors of a nation which has embarked on a DDO. It is in this context that the plausibility of including the public debt owed to domestic creditors in the DDO has been advanced as a response. In other words, the external creditors would have their losses shared equally with domestic creditors and this becomes a compelling reason for pursuing domestic creditors in a restructuring program.

As is then well known, the Cabinet decision has been assented to by Parliament by virtue of its overall suzerainty over Finance and the Bill that is sought to be enacted and impugned in these proceedings is a natural concomitant of this continuum.

This Court bears in mind the provenance of the Bill in this trail and in the absence of countervailing evidence to controvert this chain of events, we are not fortified with cogency of material to the contrary such material to stymie or frustrate the legislative purpose that is sought to be pursued. However, we would presently return to the

question as to how some bondholders have been excluded from the ambit of the proposed legislative measure.

From the foregoing discussion it becomes crystal clear that just as much as external creditors absorb the losses, domestic creditors such as domestic savers, consumers, taxpayers and depositors do get inflicted with their share of losses and the unintended consequences resulting from this aspect of DDO concerning domestic creditors are not lost sight of by this Court as has been made clear in the material that has been made available before this Court.

It has been urged before us that in the context of Sri Lankan restructuring of International Sovereign Bonds (ISBs) and Sri Lanka Development Bonds (SLDBs), domestic banks lie exposed to the losses stemming from the restructuring and the banks cannot further contribute to the restoration of the country's debt solvency given their thin capital buffers after two years of intense crisis. In such circumstances it has been submitted by the learned DSG for the Attorney General that pension funds would be able to contribute by bringing flow relief to the future refinancing of the treasury.

In addition, to the above second round effects, it has also been asserted before this court that the domestic banking sector has suffered serious wounds illustrated by a large destruction in private credit and a surge in Non-Performing Loans. (NPLs). It has been asserted before this Court that economic recovery can only materialize with a strong and healthy banking sector that can (re)lend to productive projects.

In support of this contention that the categorization sought to be enacted by the proposed law is rational and reasonable, it has been submitted by the learned Counsel for the intervenient petitioner that whilst 30% corporate income tax is imposed by Inland Revenue (Amendment Act no.45 of 2022) on both, banks and primary dealers, the superannuation funds such as EPF and ETF are taxed at only 14%. This has not been changed by the Inland Revenue (Amendment) Act no.45 of 2022. Several factors have been cited before this Court as rationale for excluding the banks and primary dealers from the ambit of the law. They are usefully set out in the following table.

| Banks | Primary Dealers, and other corporations. | EPF, & ETF |
|---|---|---|
| • 30% Corporate Income Tax (imposed by Inland Revenue (Amendment) Act No.45 of 2022);<br>• 14% VAT (not passed on); (cf. page 23 of 'IPI')<br>• With certain other taxes the total tax burden is over 50%.<br>• i.e., the State makes more money from the banking sector, than the banks.<br>• Through high tax payment, the banking sector is helping the government's fiscal consolidation efforts. | • 30% Corporate Income Tax (imposed by Inland Revenue (Amendment) Act No.45 of 2022);<br>• Through high tax payment, the primary dealers are also helping the government's fiscal consolidation efforts. | • Only 14% Income Tax (not changed by the Inland Revenue (Amendment) Act No.45 of 2022)) |
| • Banks gave moratorium on the direction of the CBSL and faced the brunt of non-performing loans during the Covid- 19 pandemic, and the subsequent<br>• Economic crises. The moratorium extended up to 31st December 2022.<br>• The Banks are already facing severe non-performing loan burden.<br>• So, any disturbance to financial system stability could be costly. | • Primary dealers and other corporations hold only Rs. 153 billion of Treasury Bonds as at the end of 2022, and the Insurance companies hold around Rs. 310 billion of Treasury Bonds. This is a small percentage of total outstanding Treasury Bonds of Rs. 8722 billion as at end of 2022. Compared to the amount of Gross Financing Needs (GFNs) support anticipated, these entities do not have adequate investments in Treasury Bonds, and if they are taken for negotiations, it will add around additional 380 entries. The operational difficulties in negotiating with such larger number of entities for an insignificantly marginal contribution for the envisaged GFN support would delay the debt restructuring process, jeopardizing the said process. In any event, these corporations are already paying 30% Corporate Income Tax, which is more than double of what the EPF, and ETF are paying now. It is also noteworthy that these corporations have already taken a major hit due to the economic contract, labor turnover, low profitability and losses. | |
| • Disruptions to the banking system will adversely impact the effective transmission of monetary policy.<br>• So, the main effort is preserving the 57.2 million customer deposits in the banks and letting no room for a bank run.<br>• A bank run is when the customers of a bank or other financial institution withdraw their deposits at the same time over fears about the bank's solvency.<br>• A bank run will be catastrophic and deadly to the already devastated economy. | | • There is no risk of a run on the EPF or ETF, as the withdrawal of EPF, and ETF are statutorily limited to certain circumstances.<br>• The EPF members are eligible to claim their retirement benefits (contributions and accumulated interest) only upon reaching the retirement age of 50 years for females and 55 years for males. In addition, members are also entitled to withdraw funds in their EPF accounts in the events of migration, permanent disability, leaving the employment due to marriage (only for female members) and joining a pensionable employment.<br>• ETF can be claimed only upon cessation of an employment. However, once a withdrawal is obtained, a member has to wait for five years from the date of cessation of employment relating to the last refund claim to make another withdrawal even if the employment changed. |
| • The Banks are already affected by the debt restructuring of the International Sovereign | | • The EPF, and ETF does not hold any International Sovereign Bonds, or |

| | | |
|---|---|---|
| Bonds, and the Sri Lanka Development Bonds, which the Sri Lankan Banks also hold. <br>• They will be, like all other holders of the International Sovereign Bonds, and the Sri Lanka Development Bonds will have to take a haircut. | | the Sri Lanka Development Bonds. They won't be taking any haircut. |

The above table clearly shows that the banks, primary dealers, and other corporations are already paying income taxes at the rate of 30%. What is envisaged in this bill is, the EPF & ETF would have to pay an income tax of 30%, or in the alternative they are given an incentive/concession, where they will only be paying 14% if they opt for the domestic debt optimization (DDO) as proposed. Granting incentives/concessions for the survival and revival of the country's economy, is clearly a reasonable exercise of the executive policy as endorsed by the legislature.

There is institutional incapacity in the Courts to reassess or reappraise the above policy decisions in the event evidence to the contrary is unavailable. In the circumstances this Court perceives a rationale underlying the differentiation and this Court is not irresistibly driven to the conclusion that the policy is manifestly unreasonable. In the circumstances the Parliament which has full control of public finance in terms of Article 148 of the Constitution is at liberty to make reasonable classification and we take the view that manifest unreasonableness does not taint the clauses in the Inland Revenue (Amendment) Act that is sought to be impugned in these proceedings.

Before we part with this determination this Court wishes to dispose of a preliminary objection that both the learned DSG for the Attorney General and the learned Counsel for the intervenient petitioner raised in *limine* to the maintainability of these proceedings. Juxtaposing some of the averments in a previous fundamental rights application namely, SC FR application 187/2023 both Counsel argued that the case of the Petitioners in SC SD 63/2023 and 64/2023 is fundamentally premised upon the challenge to the DDO process raised in the fundamental rights application. It has to be pointed out that the focus of inquiry in these proceedings is the consistency of the provisions in the impugned bill with the Constitution. In the FR application there was no such inquiry, which is *sui generis* to invocation of jurisdiction under Article 121 of the Constitution. In the circumstances the argument on issue estoppel, does not arise for consideration.

In the course of his submissions the learned DSG for the Attorney General submitted that an amendment would be moved during the Committee Stage to the Inland Revenue (Amendment Bill), in order to exclude the Treasury Bonds which will be matured on September 1, 2023 from the definition of the "eligible bonds", as follows;

"eligible bonds" means

> *the treasury bonds applicable for the purposes of domestic debt optimization, issued under the Registered Stocks and Securities Ordinance (Chapter 420) that are: -*
>
> *(a) Maturing between June 28, 2023 and December 31,2023 (excluding the treasury bonds maturing on July 15, 2023 and September 1, 2023) ; and*
>
> *(b) Maturing in the calendar year 2024 to 2032 (both inclusive)."*

From the foregoing reasons that we have adumbrated in the determination, we proceed to hold that neither the Bill nor any of its provisions is inconsistent with Article 12 or any provisions of the Constitution. Accordingly, this Bill can be validly passed by a simple majority of the legislature.

Buwaneka Aluwihare, PC
Judge of the Supreme Court

A.H.M.D.Nawaz
Judge of the Supreme Court

Arjuna Obeyesekere
Judge of the Supreme Court

## II

## ආර්ථික අර්බුදයේ බලපෑම සමනය කිරීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයන් ආදේශ කිරීම
## பொருளாதார நெருக்கடியின் தாக்கத்தினைத் தணித்தல் பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர்கள் பதிலீடு
## SECTORAL OVERSIGHT COMMITTEE ON ALLEVIATING THE IMPACT OF THE ECONOMIC CRISIS: SUBSTITUTION OF MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා, ගරු එස්.බී. දිසානායක මහතා සහ ගරු ධම්මික පෙරේරා මහතා ආර්ථික අර්බුදයේ බලපෑම සමනය කිරීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩු සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130 (3) හි විධිවිධාන ප්‍රකාරව, 2023 සැප්තැම්බර් 01 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන ගරු නිමල් ලාන්සා මහතා, ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා සහ ගරු මංජුලා දිසානායක මහත්මිය එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## III

## විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව: සාමාජිකයකු ආදේශ කිරීම
## வெளிப்படையான மற்றும் பொறுப்புக்கூறவேண்டிய அரசாங்கமொன்று பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர் பதிலீடு
## SECTORAL OVERSIGHT COMMITTEE ON AN OPEN AND ACCOUNTABLE GOVERNMENT: SUBSTITUTION OF MEMBER

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුව සඳහා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 130(3) හි විධිවිධාන ප්‍රකාරව, 2023 සැප්තැම්බර් 01 දින තේරීම් කාරක සභාව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු සංජීව එදිරිමාන්න මහතා එම කාරක සභාවේ සේවය කිරීම පිණිස නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

## IV

## වරප්‍රසාද: ගරු එස්.එම්. මරික්කාර් මහතා මාධ්‍ය සාකච්ඡාවකදී සිදු කළ ප්‍රකාශය
சிறப்புரிமை: மாண்புமிகு எஸ்.எம். மரிக்கார் ஊடக மாநாட்டில் தெரிவித்த கூற்று
PRIVILEGE: STATEMENT MADE BY HON. S.M. MARIKKAR AT A MEDIA CONFERENCE

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය විසින් 2023 ජූලි 18 දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

## V

## වරප්‍රසාද: ගරු අලි සබ්රි රහීම් මන්ත්‍රීවරයාගේ නොමනා ක්‍රියා කලාපය
சிறப்புரிமை: மாண்புமிகு அலி சப்ரி ரஹீமினது முறையற்ற நடத்தை
PRIVILEGE: UNETHICAL CONDUCT OF HON. ALI SABRI RAHEEM

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ සභානායක ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් 2023 අගෝස්තු 25වන දින වරප්‍රසාද ප්‍රශ්න යටතේ පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

## VI

## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2023 සැප්තැම්බර් 05 අඟහරුවාදා, එනම් අද දින මධ්‍යාහ්න 12.00ට කාරක සභා කාමර අංක 02 හි දී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සාමාජික මන්ත්‍රීවරයන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

**ගරු ප්‍රසන්න රණතුංග මහතා (නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Urban Development and Housing and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(iii) 2022 වර්ෂය සඳහා ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව.

මෙම වාර්තා ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ 71 වගන්තිය යටතේ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව සහ අදාළ නියාමන අධිකාරීන් විමසා, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ජූනි 02 දිනැති අංක 2334/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කරමි.

මෙම නියෝග රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමිය වෙනුවෙන් මම (451 අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥාපනතේ 24 (1) (ජ), (ට) සහ (ඩ) වගන්ති සමඟ කියවිය යුතු 64 (2) (ඊ) වගන්තිය, 23අ, 23ආ, 23ඇ, 23ඈ සහ 28 (3) වගන්ති සමඟ කියවිය යුතු 64 (1) වගන්තිය, 24 (1) වගන්තිය, 3අ වගන්තියේ (3), (4) සහ (5), (6) සහ 64 වගන්ති, 3 (4) වගන්තිය සහ 64 වගන්තිය සහ 58 හා 59 වගන්ති සමඟ කියවිය යුතු 64 වගන්තිය යටතේ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යවරිය විසින් සාදන ලදුව 2023 අගෝස්තු 21 දිනැති අංක 2346/02 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කරමි.

මෙම නියෝග වනජීවී හා වන සම්පත් සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා (ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன - போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் வெகுசன ஊடக அமைச்சரும்)
(The Hon. (Dr.) Bandula Gunawardana - Minister of Transport and Highways and Minister of Mass Media)

ගරු කථානායකතුමනි, 2022 වර්ෂය සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මම 2021 වර්ෂය සඳහා ජාතික පසු අස්වනු කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2022 වර්ෂය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු සුබසාධක අරමුදලේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන් මම 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45(1අ) වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 ජූලි 04 දිනැති අංක 2339/06 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කරමි.

මෙම නියෝග අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නලින් ප්‍රනාන්දු මහතා (වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் பர்னாந்து - வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்பு அமைச்சர்)
(The Hon. Nalin Fernando - Minister of Trade, Commerce and Food Security)

ගරු කථානායකතුමනි, 1995 අංක 35 දරන මිනුම් ඒකක, ප්‍රමිති සහ සේවා පනතේ 4 (1)(ඊ) වගන්තිය යටතේ වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2022 අගෝස්තු 26 දිනැති අංක 2294/54 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය මම ඉදිරිපත් කරමි.

මෙම නිවේදනය වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු කථානායකතුමනි, ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් "ජාතික ආර්ථිකය නගාසිටුවීම සඳහා බදුකරණය විධිමත් කිරීම" සම්බන්ධයෙන් සකස් කරන ලද වාර්තාව මම ඉදිරිපත් කරමි.

ගරු කථානායකතුමනි, අපි ස්තුතිවන්ත වෙනවා, මේ කමිටු වාර්තාව ඉදිරිපත් කරන්න විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා සහ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ කෙටි කාලය තුළ විශාල උනන්දුවක් හා උත්සාහයක් දැරීම ගැන. මෙහිදී අපේ අවධානය යොමු වුණේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ඉදිරිපත් කර තිබෙන කොන්දේසි තුනක් පිළිබඳවයි. උද්ධමනය තනි ඉලක්කමකට ගෙන ඒම, ඒ වාගේම සංචිත වැඩි කිරීම හා රාජ්‍ය බදු ආදායම වැඩි කිරීම කියන ඒවා තමයි එම කොන්දේසි. නමුත්, අපි කමිටුව හැටියට දැක්කේ, රාජ්‍ය බදු ආදායම එකතු කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා රේගුව දැනට කරන කාර්යය පිළිබඳ අපට පැහැදීමක් නැහැ කියන එකයි. ඒ නිසා ඒ පනත් සංශෝධනය කිරීම ඇතුළු නව යෝජනා ගණනාවක් මේ වාර්තාව තුළින් අපි ඉදිරිපත් කරලා තිබෙනවා. මේ වාර්තාව ඉදිරිපත් කිරීම සඳහා ලබා දුන් සහයෝගය වෙනුවෙන් කමිටුවේ සියලු දෙනාට මම ස්තුතිවන්ත වෙනවා.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම එම කාරක සභාව වෙත යොමු කරන ලද ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) உபுல் கலப்பத்தி)
(The Hon. (Dr.) Upul Galappaththi)

ගරු කථානායකතුමනි, අම්බලන්තොට, රන්ගිරි විහාර පාර, 24/2-24/3 දරන ස්ථානයෙහි පදිංචි ඩී. මුනිදාස මෙන්ඩිස් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු එච්. නන්දසේන මහතා**
(மாண்புமிகு எச். நந்தசேன)
(The Hon. H. Nandasena)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කැබිතිගොල්ලෑව, හඳවල පාර, අංක 108 දරන ස්ථානයේ පදිංචි එච්.එම්.ජී. හේරත් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) තඹුත්තේගම, එච්.එන්.බී. බැංකුව ඉදිරිපිට යන ලිපිනයේ පදිංචි පිලිප් දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සරත් වීරසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා අවස්ථාවක් ඉල්ලා සිටියා. දැන් කථා කරන්න. ඔබතුමාට විනාඩි දෙකක කාලයක් ලැබෙනවා.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)

ගරු කථානායකතුමනි, මේ අවස්ථාව ලබාදීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. 2023 උසස් පෙළ විභාගයට පෙනී සිටින සිසුන්ට වන අසාධාරණයක් ගැනයි මම මේ කථා කරන්නේ. 2020දී සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි දරුවන් තමයි 2023 A/L විභාගයට පෙනී සිටින්නේ. නමුත්, 2020ට නියමිත O/L විභාගය පැවැත්වුයේ 2021 මාර්තු මාසයේදී. 2021 මාර්තු මාසයේ පවත්වපු සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල අනුව, උසස් පෙළ ඉගැන්වීම් ආරම්භ කළේ 2022 මාර්තු මාසයේ 5වන දායින් පසුවයි. එහෙම බලද්දී ඉගෙනුම් කාලයේ අවුරුදු දෙකක් සම්පූර්ණ වෙන්නේ 2024 මාර්තුවලටයි. ඒ නිසා ඒ දරුවන් කියන්නේ 2024 මාර්තු මාසයේ මේ උසස් පෙළ විභාගය පවත්වන්න කියලායි.

ඒ වාගේම, ජාතික අධ්‍යාපන ආයතනය මඟින් සම්පාදනය කරන ලද විෂය නිර්දේශය අනුව, වසර දෙකහමාරක් තුළ තමයි උසස් පෙළ මේ විෂයයන් හදාරන්න ඕනෑ. නමුත්, මෙවර උසස් පෙළ විභාගය පවත්වන අවස්ථාව වන විට එම කාලසීමාව ලෙස තිබෙන්නේ වසරකුත් මාස 10යි. එතැනදීත් ඒ ගොල්ලන්ට ලොකු අසාධාරණයක් වෙලා තිබෙනවා. ඒ වාගේම, උසස් පෙළ සිසුන්ට වාර විභාග 6ක් තිබෙන්න ඕනෑ. නමුත්, වාර විභාග 4යි තිබෙන්නේ. ඒ වාගේම, දෙවැනි සහ තුන්වැනි වාරවල ඉගෙන ගන්න සිසුන්ට මේ හේතුව නිසා මාස 5ක පමණ කාලයක් අඩුවෙලා තිබෙනවා. උදාහරණයක් විධියට කිව්වොත්, 2010දී ප්‍රතිඵල නිකුත් වුණාට පස්සේ, ඊළඟ විභාගය සඳහා දින 244ක් තිබිලා තිබෙනවා. 2019දී විභාග ප්‍රතිඵල නිකුත් වුණාට පස්සේ, ඊළඟ විභාගය සඳහා දින 290ක් තිබිලා තිබෙනවා. නමුත්, මෙවර ප්‍රතිඵලවලින් පසුව තිබෙන්නේ දින 84යි. එම නිසා මේ උසස් පෙළ විභාගය කල් දාන්න කියලා තමයි ඔවුන් ඉල්ලා සිටින්නේ. ඔවුන්ගේ ඉල්ලීම අනුව මම මේ ප්‍රකාශය කළේ ඔබතුමාගේ අවසරය මතයි, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27 (2) යටතේත් ඒ ප්‍රශ්නයම ගරු විපක්ෂ නායකතුමා මතු කරලා තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න. ඉතා වැදගත්, ජාතික වැදගත්කමකින් යුතු කාරණයක් ඉදිරිපත් කරන්න තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමා, විනාඩියකින් ඒ කාරණය ඉදිරිපත් කරලා අවසන් කරන්න.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, මේ රටේ දැන් හදිසියේම තෙල් මිල වැඩි වෙලා තිබෙනවා; ගෑස් මිලත් වැඩි වෙලා තිබෙනවා. අපේ විෂය භාර ඇමතිතුමා මේ පිළිබඳව මේ ගරු සභාවට ප්‍රකාශයක් කළ යුතුයි කියා මා කියා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු විදුලිබල සහ බලශක්ති ඇමතිතුමනි, ඔබතුමා ඒ පිළිබඳව දැන් ප්‍රකාශයක් කරනවාද?

**ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)

ගරු කථානායකතුමනි, මෙය හදිසි මිල සංශෝධනයක් නොවෙයි. ඉන්ධන මිල මාසිකව සංශෝධනය කිරීමට මීට වසරකට පෙර සිට තමයි අප කටයුතු කරන්නේ. ඒ අනුව පසුගිය නොවැම්බර් මාසයෙන් පසුව පළමු වතාවට තමයි ඩීසල් මිල වැඩි වුණේ. අපි පසුගිය නොවැම්බර් මාසයේ සිට මාස නවයක කාලයක් ඩීසල් මිල එක හා සමානව පවත්වාගෙන ගිහින් තිබෙනවා. ඒ වාගේම පසුගිය නොවැම්බර් මාසයේ සිට මේ වසරේ සැප්තැම්බර් පළමුවන දා වනකල් ඩීසල් ලීටරයක මිල රුපියල් 124කින් අඩු කර තිබෙනවා. මෙවර රුපියල් 35කින් මිල වැඩි වුණා. ඒක ලෝක වෙළෙඳ පොළේ තිබෙන මිල ගණන් අනුවයි සිදු වන්නේ. ගරු වාසුදේව නානායක්කාර මැතිතුමනි, ඔබතුමා මිල සූත්‍රය පිළිබඳව කරුණු මතු කර තිබෙනවා මම දැක්කා. ගරු කථානායකතුමනි, හැම වතාවකම මිල සංශෝධනයක් වුණාට පසු දවසේම අපි මිල සූත්‍රය ප්‍රසිද්ධ මාධ්‍යයට ලබා දුන්නා. ගරු මන්ත්‍රීතුමාට අවශ්‍ය නම් ඒ මිල සූත්‍රයට අනුව කළ මේ සංශෝධනයට අදාළ ලේඛනය මම සභාගත කරන්නම්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ඒ හැම සංශෝධනයකටම අදාළ මිල සූත්‍රය ඔබතුමා මේ ගරු සභාවේ සභාගත කරන්න ඕනෑ.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු කථානායකතුමනි, අපි හැම දාම එය ගැසට් කරනවා. ඒක ප්‍රසිද්ධ මාධ්‍යයට නිකුත් කර තිබෙනවා. මම මේ අවස්ථාවේදී එය **සභාගත*** කරනවා.

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# வினாக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

## විදුලි අර්බුදය: විසඳුම්
மின்சார நெருக்கடி: தீர்வு
POWER CRISIS: SOLUTIONS

2845/2023

**1. ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා**
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකාවේ විදුලි අර්බුදයක් ඇති වීමට හේතුව කවරේද;

(ii) එවැනි විදුලි අර්බුදයක් ඇති වන බව අදාළ බලධාරීන් විසින් පූරෝකථනය කර තිබුණේද;

(iii) විදුලි අර්බුදය විසඳීම සඳහා කෙටි කාලීන හා දිගු කාලීන විසඳුම් හඳුනාගෙන තිබුණේද;

(iv) ඉදිරියේදී මෙවැනි විදුලි අර්බුද ඇති වීම වැළැක්වීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கையில் மின்சார நெருக்கடி ஏற்படுவதற்கான காரணம் யாதென்பதையும்;

(ii) இவ்வாறான மின்சார நெருக்கடி ஏற்படுமென அதிகாரிகளால் எதிர்வுகூறப்பட்டிருந்ததா என்பதையும்;

(iii) மின்சார நெருக்கடிக்குத் தீர்வு காண்பதற்காக, குறுகிய கால மற்றும் நீண்ட காலத் தீர்வுகள் இனங்காணப்பட்டிருந்தனவா என்பதையும்;

(iv) எதிர்காலத்தில் இவ்வாறான மின்சார நெருக்கடி ஏற்படுவதைத் தடுப்பதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Energy:

(a) Will he inform this House -

(i) the reason for the power crisis that has emerged in Sri Lanka;

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා ]

(ii) whether relevant authorities had predicted of such a power crisis;

(iii) whether short-term and long-term solutions had been identified to resolve the power crisis; and

(iv) what measures will be taken to avert such power crisis in due course?

(v) If not, why?

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) පසුගිය කාලයේ ශ්‍රී ලංකාවේ විදුලි අර්බුදයක් ඇති වීමට හේතු කිහිපයක් විය. ලංකා විදුලිබල මණ්ඩලය සතු බලාගාරවල ස්ථාපිත ධාරිතාව - installed capacity - මෙගාවොට් 4,200ක් පමණ වන අතර එය වියළි කාලගුණික තත්ත්වයකදී පවා අඛණ්ඩව පැය 24 පුරා දිවයිනේ විදුලි අවශ්‍යතා සැපයීමට ප්‍රමාණවත් විය.

නමුත්, රුසියානු-යුක්රේන යුද තත්ත්වය මත ඉන්ධන, දැවි තෙල්, ගල් අඟුරු සහ බොර තෙල්වල මිල ශීඝ්‍රයෙන් ඉහළ යෑම සහ රටේ ඇති වී තිබූ විදේශ විනිමය අර්බුදය නිසා අවශ්‍ය ඉන්ධන, ගල් අඟුරු සහ දැවි තෙල් ආනයනයට ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොතිබීම මෙම අර්බුදයට එක් ප්‍රධාන හේතුවක් විය. එමෙන්ම, පිරිපහදුව වසා දැමීමට සිදු වීම හේතුවෙන් නිෂ්පාදනය කර ගත හැකි නැප්තා සහ දැවි තෙල් ලබා ගැනීම සීමා වීම, රට තුළ සහ විදුලිබල මණ්ඩලය තුළ ඇති වී තිබූ ආර්ථික සහ මූල්‍ය අර්බුදය සහ විදේශ විනිමය මිල දී ගැනීමට පවා අවශ්‍ය මූල්‍ය ශක්තිය නොතිබීම මීට බලපෑ අනෙකුත් හේතු විය. විදුලිබල මණ්ඩලයේ දීර්ඝ කාලීන විදුලි ජනන සැලසුම් ඒ ආකාරයෙන් ක්‍රියාත්මක නොකිරීම සහ කොවිඩ් - 19 අර්බුදය නිසා බලාගාර සහ යටිතල පහසුකම් ඉදිකිරීම සහ අත්‍යවශ්‍ය නඩත්තු කටයුතු ප්‍රමාද වීම මෙන්ම, දීර්ඝ කාලයක් මුළුල්ලේ අඩු වියදම් බලාගාර සහ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ඉදිකිරීම කල්ගත වීම ද මීට බලපෑ සෙසු හේතු විය.

තවද, විදුලිබල මණ්ඩලය විදුලිය අළෙවි කිරීමේදී අය කරන ගාස්තු ක්‍රමය වසර 9කින් සංශෝධනය නොවීම, නව තාක්ෂණයට අනුගත වීමේ දුර්වලතා මෙන්ම තරගකාරී වෙළෙඳ පොළ ක්‍රමයක් මත පදනම් විදුලි උත්පාදන වෙළෙඳ පොළක් නිර්මාණය වී නොතිබීම යන කරුණු ද ශ්‍රී ලංකාව තුළ විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රගමනයට බාධා වී ඇති කරුණු සහ ඇති වූ විදුලි අර්බුදයට හේතු වශයෙන් හඳුනා ගත හැකි ය.

(ii) අඩු වියදම් නව බලාගාර සැලසුම් සහගතව ඉදිකිරීම ප්‍රමාද වීම හෝ අත්හිටුවීම, කාලගුණික විපර්යාස, අය ක්‍රමය වසර 9කින් සංශෝධනය නොවීම සහ වියදම් ආවරණය වන ගාස්තු ක්‍රමයක් නොමැති වීම මත පැය 24 පුරා විදුලි බලය උත්පාදනය කිරීමේ අර්බුදයක් ඇති විය හැකි බව විදුලිබල මණ්ඩලයේ පාලන අධිකාරිය සහ විදුලිබල මණ්ඩලයේ පාලන පද්ධතිය -system control - විසින් අවස්ථා කිහිපයකදී පුරෝකථනය කර සහ අනතුරු හැඟවීම් සිදු කර ඇත.

(iii) ඔව්.

අඩු වියදම් විදුලි බලාගාර ජාතික පද්ධතියට එකතු කිරීම තුළින් විදුලි බිල අඩු කිරීම සඳහා මෙන්ම, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය හා එක්ව බලශක්ති පිරිමැසුම් ක්‍රම ක්‍රියාවට නැංවීම හා උපකරණ භාවිතය ප්‍රවර්ධනය කිරීම සහ බලශක්ති කාර්යක්ෂම උපකරණ හඳුන්වා දීම වැනි ක්‍රියාමාර්ග මඟින් විදුලි ඉල්ලුම පාලනය කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කර ඇත.

මෙම වසරේදී ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කරන ලද මෙගාවොට් 35ක ධාරිතාවෙන් යුත් බ්‍රෝඩ්ලන්ඩ් විදුලි බලාගාරය සහ නුදුරු අනාගතයේදී ජාතික විදුලිබල පද්ධතියට සම්බන්ධ කිරීමට නියමිත මෙගාවොට් 122ක ධාරිතාවකින් යුත් උමා ඔය ජල විදුලි බලාගාරය ඊට උදාහරණ වශයෙන් දැක්විය හැක.

මීට අමතරව, දකුණු ප්‍රදේශයේ පවතින විදුලි අර්බුදයට විසඳුමක් ලෙස ඉදිකර ඇති කිලෝමීටර 150ක් පමණ වන පොල්පිටිය සිට හම්බන්තොට දක්වා දිවෙන කිලෝවොට් 220ක රැහැන් මාර්ගය 2023 අගෝස්තු 24වන දින ජාතික විදුලි පද්ධතියට එක් කරනු ලැබීය. තවද, මුල් අදියරේදී මෙගාවොට් 200ක සහ පසුව මෙගාවොට් 350ක ධාරිතාව දක්වා ඉහළ නැංවිය හැකි අයුරින් ස්ථාපනය කරනු ලබන කෙරවලපිටිය සොබාදනවි චක්‍රීය ස්වාභාවික වායු බලාගාරය 2024 මාර්තු වන විට ජාතික විදුලිබල පද්ධතියට එක් කිරීමට නියමිත ය.

වියදම් අනුරූපී අය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම මඟින් සැපයුම්කරුවන්ට කාලීනව ගෙවීමේ හැකියාව ඇති කර ගැනීම සහ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාත්මක කිරීමට සහ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට විදුලිය මිල දී ගැනීමේ නව ක්‍රමයක් සහ නව නීති හඳුන්වා දී ඇත.

අක් වෙරළ සුළං විභව මත සංවර්ධන කටයුතු සිදු කිරීම, පුනර්ජනනීය බලශක්තිය හරිත හයිඩ්‍රජන් බවට පරිවර්තනය සහ ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර විදුලි රැහැන් පද්ධතියක් සමඟ සම්බන්ධ කිරීම ද දිගු කාලීන විසඳුම් ලෙස හඳුනාගෙන ඇත.

(iv) වසර දෙකකට වරක් සමාලෝචනය කිරීමට යටත්ව ලංකා විදුලිබල මණ්ඩලය විසින් ඉදිරි වසර 20ක කාලය තුළ ජාතික පද්ධතියට එකතු කළ යුතු බලාගාර පිළිබඳ දිගු කාලීන අවම වියදම් බලාගාර ඉදිකිරීමේ සැලැස්මක් - Least Cost Long-Term Generation Expansion Plan - සකස් කර ඇත.

2030 වසර වන විට සියයට 70ක් පුනර්ජනනීය බලශක්තිය මඟින් විදුලිය උත්පාදනය කිරීම, අනාගතයේ දී ගල් අඟුරු බලාගාර ඉදිනොකිරීම සහ 2050 වන විට ශ්‍රී ලංකාවේ කාබන් උදාසීන රාජ්‍යයක් බවට පත් කිරීම යන රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව 2023-2042 සඳහා වූ සැලැස්ම සකස් කොට එය මෙම වසරේ සිට ක්‍රියාවට නැංවීමට දැනට කටයුතු සම්පාදනය කොට ඇත.

ගරු කථානායකතුමනි, 2040 වන විට ශ්‍රී ලංකාව කාබන් උදාසීන රාජ්‍යයක් බවට පත් කළ යුතු බව ගරු ජනාධිපතිතුමා මීට සති දෙකකට පෙර යෝජනා කරලා තිබෙනවා. එම සැලැස්මට

අනුගත වෙමින් 2030 වර්ෂය දක්වා කාලය තුළ අදියර දෙකකින්, එනම් 2023 සිට 2026 දක්වා සහ 2027 සිට 2030 දක්වා පිළිවෙළින් මෙගාවොට් 2,534ක් සහ මෙගාවොට් 3,075ක් ලෙස පුනර්ජනනීය බලශක්ති උත්පාදන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමට විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාවට නංවා ඇත.

එමෙන්ම, වහල මත ඉදිකරනු ලබන සූර්ය පැනල භාවිත කිරීම දිරි ගන්වනු වස් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් උපරිම සහන ලබා දී ඇත. පුනර්ජනනීය බලශක්ති ප්‍රභවවලින් ලබා ගැනීමට අපේක්ෂිත, 2023 සිට 2026 සහ 2027 සිට 2030 දක්වා කාල සීමා තුළ ස්ථාපිත කිරීමට නියමිත විදුලි බලාගාර පිළිබඳ සම්පූර්ණ විස්තරයක් මේ සමඟ ඉදිරිපත් කරමි.

එම ලේඛනය මම **සභාගත*** කරනවා.

> අනාගතයේ දී තවදුරටත් අඩු වියදම් ස්වාභාවික වායු බලාගාර පද්ධතියට එකතු කිරීමට සැලසුම්කොට ඇති අතර, දැනට ඩීසල් හෝ දැවිතෙල් මඟින් ධාවනය වන බලාගාර කිහිපයක් ස්වාභාවික වායු මඟින් ධාවනය කළ හැකි වන පරිදි අවශ්‍ය වෙනස්කම් කිරීමට ද සැලසුම් කොට ඇත.
>
> මෙම වසරේ සකස් කරන ලද 2023-2042 කාලීන අවම වියදම් බලාගාර පුළුල් කිරීමේ සැලැස්මට අනුගතව ලංකා විදුලිබල මණ්ඩලය විසින් දිගු කාලීන සම්ප්‍රේෂණ පද්ධතිය සංවර්ධනය කිරීමේ සැලැස්මක් ද සකස් කර ඇති අතර, දිවයිනේ විවිධ ප්‍රදේශවල පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති මඟින් උත්පාදනය කරනු ලබන විදුලිය ඉහළ විදුලි ඉල්ලුමක් සහිත නාගරික ප්‍රදේශ දක්වා සම්ප්‍රේෂණය කිරීමට එමඟින් පහසුකම් සැලසෙනු ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා**
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අමාත්‍යතුමනි, පසුගිය කාලයේ සාම්පූර් විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා ශක්‍යතා වාර්තා අරගෙන, වසර ගණනාවක් පර්යේෂණ කරලා, රජයේ මුදල් විශාල ප්‍රමාණයක් වියදම් කළා. ඒ වාගේම ඉන්දියාවත් ඒ සඳහා මුදල් ලබා දෙන්න පොරොන්දු වී තිබියදී එම විදුලි බලාගාරය ඉදිකිරීමේ කටයුතු නැවැත්වීම සඳහා මේ වෙද්දී රජය ප්‍රතිපත්තිමය තීන්දුවක් අරගෙන තිබෙනවාද කියලා මම දැන ගන්න කැමැතියි.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම සාම්පූර් බලාගාරය ඉදිකරන්න සැලසුම් සකස් කරන්නේ නොරොච්චෝලේ බලාගාරය ඉදිකිරීමත් සමඟයි. එම බලාගාරය ඉදිකිරීමට අදාළව එවකට සිටි ජනාධිපතිතුමා -මහින්ද රාජපක්ෂ මැතිතුමා- 2014 වර්ෂය වනවිට ගිවිසුම්ගත වෙනවා. 2015දී ඒ වැඩ කටයුතු ආරම්භ කරන්න තමයි නියමිත වෙලා තිබුණේ. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේ සඳහා අවශ්‍ය පාරිසරික අධ්‍යයන වාර්තා සියල්ල ලබාගෙන, තාක්ෂණික අවශ්‍යතා සියල්ල සම්පූර්ණ කරගෙන තමයි මේ වැඩ පිළිවෙළට අවතීර්ණ වෙලා තිබුණේ. නමුත් අවාසනාවකට 2015 වනවිට අපි ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන තිබුණේ නැහැ, අපේ රටේ තවදුරටත් ගල් අඟුරු බලාගාර ඉදිකරන්නේ නැහැ කියන කාරණය සම්බන්ධයෙන්. විදුලිබල මණ්ඩලය සහ විදුලි ඉංජිනේරුවන් දිගින් දිගටම පෙන්වා දුන්නේ අවම වියදමකින් අපට අවශ්‍ය firm power ලබා ගැනීම සඳහා මෙවැනි ගල් අඟුරු බලාගාර, එහෙම නැත්නම් තාප බලාගාර එකක්, දෙකක් අපේ රටට තව අවශ්‍ය වෙනවා කියලායි. නමුත් ඒ අවස්ථාවේ විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ දේශපාලන නියෝජිතයන් සහ එම පක්ෂයට අනුබද්ධ පාරිසරික සංවිධාන මේ ගල් අඟුරු බලාගාරය ඉදිකිරීම ගැන විරෝධතාවක් දැක්වූවා. ඒ වෙනුවෙන් අධිකරණයේ නඩුවක් පවා පැවරුණා. හැබැයි, අධිකරණයෙන් තීන්දුවක් දුන්නේ නැහැ, මේ ගල් අඟුරු බලාගාරයේ ඉදිකිරීම් කටයුතු නවත්වන්න කියලා. නමුත් ඒ අවස්ථාවේ උසාවියට දන්වලා තිබුණා, ප්‍රතිපත්තිමය වශයෙන් තවදුරටත් ගල් අඟුරු බලාගාර ඉදිකරන්න කටයුතු කරන්නේ නැහැ කියලා. ඊට හේතුව, ඒ වෙලාවේ බලයට පත් වී සිටි ජනාධිපතිවරයාට උදවු උපකාර කිරීම වෙන්න ඇති.

ඒ නිසා එම ගල් අඟුරු බලාගාරය අපට අහිමි වුණා. නමුත් ඒ ගල් අඟුරු බලාගාරය අහිමි වීම නොවෙයි ගැටලුව වුණේ, ගරු මන්ත්‍රීතුමනි. ඒ ගල් අඟුරු බලගාරයෙන් මෙගාවොට් 500ක් උත්පාදනය කරන්න තමයි අපි සැලසුම් සකස් කරලා තිබුණේ. හැබැයි, ඒ මෙගාවොට් 500ට අදාළව ඉදිකරන්නේ කුමක්ද කියන එක පිළිබඳව වෙනත් සැලසුමක් සකස් කළේ නැහැ. ඒ නිසා තමයි අපි හුඟක් වෙලාවට අර්බුදවලට මුහුණ දෙන්නේ. අපි ප්‍රතිපත්තිමය වශයෙන් තීන්දු ගන්නවා. කාලයක් තිස්සේ ඒ සඳහා වැඩ කරනවා. ඊට පස්සේ ප්‍රතිපත්තිමය වශයෙන් ඒක හකුළා ගන්නකොට, ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්න ඕනෑ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළේ නැහැ. ඒ බලාගාරය සඳහා මූල්‍ය සහයෝගය ලබා දෙන්න යෝජනා කර තිබුණේ ඉන්දියාව. ඔවුන් ඒක බංග්ලාදේශයට ආයෝජනය කළා. දැන් ඒ ප්‍රදේශයේ සූර්ය බලාගාරයක් ඉදි කිරීමට තමයි අපි කටයුතු කර ගෙන යන්නේ. ඒ සිදු වූ පාඩුව අපට පිරිමහන්න බැහැ. නමුත්, අලුත් ප්‍රතිපත්තිවලට අනුව පුනර්ජනනීය බලශක්තියෙන් එම ව්‍යාපෘති ඉදිකරන්න අපි දැන් බලාපොරොත්තු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා ඔබතුමා විශාල කාලයක් ගත්තා.

**ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා**
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉක්මනට අහන්න.

**ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා**
(மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர)
(The Hon. U.K. Sumith Udukumbura)
ගරු අමාත්‍යතුමනි, විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කරනවා කියලා පසුගිය දවස්වල නොයෙක් ප්‍රකාශ ඉදිරිපත් වුණු බව අපි

---

** **පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා]

දැක්කා. එම ප්‍රතිව්‍යුහගත කරන වැඩසටහන මොන විධියටද ඉස්සරහට යන්නේ කියලා අපි දැනගන්න කැමැතියි. ගරු අමාත්‍යතුමනි, සමාජයේ මතයක් තිබෙනවා, විදුලිබල මණ්ඩලයේ 20,000ක් පමණ වන මේ සේවකයන් විදුලිබල මණ්ඩලයට විශාල බරක්, ඒ අය නඩත්තු කරන්න යන වියදම නිසා තමයි අපේ ග්‍රාමීය ජනයාගේ විදුලි බිල දරා ගන්න බැරි විධියට ඉහළ යන්නේ කියලා. ඒ නිසා විදුලි බිල වැඩි වීමට අදාළව විදුලිබල මණ්ඩලයේ සේවකයන් වෙනුවෙන් දරන වියදම ප්‍රශ්නයක් වෙලා තිබෙනවාද කියලා මම දැනගන්න කැමැතියි. මේ වෙද්දී අපේ ගම්වල ජනතාවට ගුණාත්මක විදුලිබල සේවාවක් ලැබෙනවාද කියන එක ගැනත් අපට ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, විදුලි විසන්ධිවීම් වැඩියි.

ඒ වාගේම නව ඉල්ලුම්කරුවන්ට, විශේෂයෙන් අපේ ගම්වල සිටින ජනතාවට විදුලි සැපයුම ලබා දීමේදී විවිධ දුෂ්කරතා සහ ප්‍රමාදවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ වෙනුවෙන් ඔබතුමාට තිබෙන සැලැස්ම මොකක්ද කියා මා දැනගන්න කැමැතියි.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු කථානායකතුමනි, එතුමා දෙවන අතුරු ප්‍රශ්නය යටතේ ප්‍රශ්න හතරක් අහලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, විදුලි සම්බන්ධතා පිළිබඳව ඔබතුමා කියපු කාරණය නිවැරදියි. ගරු කථානායකතුමනි, පසුගිය අවුරුද්දේ පැවති මූල්‍ය අර්බුදය නිසා ඉල්ලුම් කරපු 36,000කට පමණ සැපයුම් ලබා දෙන්න විදුලිබල මණ්ඩලයට නොහැකි වුණා. ඒ සඳහා අවශ්‍ය මීටර්, කේබල් ආනයනය කරන්න සිද්ධ වුණා. මොකද, ඒවා සැපයුම්කරුවන්ට ගෙවීම් කරලා තිබුණේ නැහැ. ඒ නිසා සැපයුම් ලබා දෙන්න නොහැකි වූ 36,000ක පමණ ඉල්ලුම්කරුවන් පිරිසක් හිටියා. නමුත්, මේ අවුරුද්දේ අගෝස්තු මාසය වන විට ඒ 36,000න් 20,000කට වැඩි පිරිසකට අපි ඒ සම්බන්ධතා ලබා දීලා තිබෙනවා. මේ අවුරුද්ද අවසන් වීමට පෙර ඉතිරි පිරිසට විදුලිය ලබා දීමේ කටයුත්තත් අවසන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ඊළඟට, විදුලි සැපයුමේ ගුණාත්මකභාවය පිළිබඳවත් ගැටලු තිබෙනවා, ගරු කථානායකතුමනි. පසුගිය අවුරුදු තුනේ ඇති වෙච්ච මූල්‍ය අර්බුදයත්, ඒ වාගේම කොවිඩ් අර්බුදයත් ඊට හේතු වුණා. එම හේතු නිසා අවශ්‍ය නඩත්තු කටයුතු කරන්න විදුලිබල මණ්ඩලයට නොහැකි වුණා. ඒ නිසා සමහර තැන්වල ඒ අවශ්‍යතාව සපුරන්න බැරි වෙලා තිබෙනවා. දැන් අපි ඒ නඩත්තු කටයුතු කරගෙන යනවා. හැබැයි, එහිදී යම් බාධාවක් ඇති වෙලා තිබෙනවා. මොකද, මේ නඩත්තු කටයුතු කිරීමේදී සමහර වෙලාවට අපට සතිඅන්ත පමණයි භාවිත කරන්න වෙන්නේ. මොකද, සතියේ දිනවල විදුලිය විසන්ධි කළාම බොහෝ තැන්වල රාජකාරි කටයුතු කිරීමට බාධා ඇතිවන නිසා. ටික කාලයක් යන විට අපි ඒ නඩත්තු කටයුතුත් අවසන් කරන්න බලාපොරොත්තු වෙනවා.

ඒ වාගේම අපේ ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුත්ත තවමත් සිදු කරනවා. දැනට අපේ ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙළ අනුව ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලසුම, කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවට ලබා දීලා තිබෙනවා. මීට සති දෙකකට පෙරත් අපි නීතිපතිවරයා සහ කෙටුම්පත් නිලධාරීන් එක්ක ඒ පිළිබඳව සාකච්ඡා කළා. මම බලාපොරොත්තු වෙනවා, මේ සතිය අවසාන වන විට කෙටුම්පත් නිලධාරීන්ගේ සහ නීතිපතිවරයාගේ අනුමැතිය ඒ සඳහා ලැබෙයි කියලා. ඉන් පසු එළඹෙන සතියේදී කැබිනට් මණ්ඩලයට එය ඉදිරිපත් කරලා ලබන මාසය තුළ මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමනි, සේවකයන් 24,000ක් පමණ සිටිනවා. ඒ සේවකයන්ගේ කාර්යක්ෂමතාව පිළිබඳව ගැටලු තිබෙනවා. කොහොමද, අපි ඔවුන් මේ කටයුතු සඳහා යොදවා ගන්නේ? අපට වුවමනා තැන්වලින් සේවක සංඛ්‍යාව අඩු කරන්න අවශ්‍ය පියවර ගැනීමටත්, ඉන්න පිරිස නිසියාකාරව පාවිච්චි කිරීමටත් අපි කටයුතු කරන්න ඕනෑ. ගරු කථානායකතුමනි, සේවකයන් 24,000ක් ඉන්නවා වාගේම, අපි සමහර සේවාවලට outsource කරලාත් ගන්නවා. එම නිසා අපට මේක විශාල බරක්. අපි ඒක තේරුම් අරගෙන තිබෙන්නේ. නමුත්, ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩ පිළිවෙළත්, අපේ වියදම් කළමනාකරණය කිරීමත් කියන මේ වැඩ පිළිවෙළ දෙකම එකට යන්න වෙනවා.

## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පොලිස් ඒකකය: නැවත පිහිටුවීම
## இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகத்தின் பொலிஸ் அலகு: மீள ஸ்தாபித்தல்
## POLICE UNIT OF SRI LANKA BUREAU OF FOREIGN EMPLOYMENT: RE-ESTABLISHMENT

2932/2023

**2. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

කම්කරු සහ විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පොලිස් ඒකකය ස්ථාපනය කරන ලද දිනය හා ඉවත් කරන ලද දිනය කවරේද;

(ii) එම ඒකකය ඉවත් කිරීමට බලපාන ලද හේතු කවරේද;

(iii) විදේශ රැකියා ක්ෂේත්‍රයේ අල්ලස, වංචාව හා දූෂණය ඉහළ ගොස් ඇති පසුබිමක ඉහත සඳහන් පොලිස් ඒකකය ඉවත් කිරීම, නීත්‍යනුකූල හා තාර්කික පදනමකින් තොරව ගනු ලැබූ තීරණයක් බව පිළිගන්නේද;

(iv) එසේ නම්, එම පොලිස් ඒකකය නැවත ස්ථාපිත කිරීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகத்தின் பொலிஸ் அலகு தாபிக்கப்பட்ட திகதி மற்றும் அகற்றப்பட்ட திகதி யாதென்பதையும்;

(ii) மேற்படி அலகு அகற்றப்படுவதற்கு ஏதுவாக அமைந்த காரணங்கள் யாவையென்பதையும்;

(iii) வெளிநாட்டு வேலை வாய்ப்புத் துறையில் இலஞ்சம், ஊழல் மற்றும் மோசடிகள் அதிகரித்துள்ள பின்னணியில் மேற்குறிப்பிட்ட பொலிஸ் அலகு அகற்றப்பட்டமையானது, சட்டரீதியான மற்றும் தர்க்க ரீதியான அடிப்படையின்றி மேற்கொள்ளப்பட்ட ஒரு தீர்மானம் என்பதை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(iv) ஆமெனில், அப்பொலிஸ் அலகை மீண்டும் தாபிக்க மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

( ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Labour and Foreign Employment:

(a) Will he inform this House -

(i) the date on which the Police Unit of Sri Lanka Bureau of Foreign Employment was established and the date on which it was removed;

(ii) the reasons for removing that unit;

(iii) whether he admits that the decision to remove the said Police Unit was taken without a legal and logical basis in the backdrop where bribery, fraud and corruption have increased in the foreign employment sector; and

(iv) if so, the measures taken to re-establish that Police Unit?

(b) If not, why?

**ගරු මනුෂ නානායක්කාර මහතා (කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார - தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சர்)
(The Hon. Manusha Nanayakkara - Minister of Labour and Foreign Employment)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 1995.12.14 දින ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පොලිස් ඒකකය ස්ථාපනය කරන ලදී.

එම ඒකකය 2020.09.15 දිනෙන් යුක්තව විසුරුවා හරින ලදී.

(ii) එවකට ශ්‍රී ලංකාව තුළ පැවති කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුකොටගෙන විදේශ රැකියා ක්ෂේත්‍රය විශාල පසුබෑමකට ලක් වූ නිසා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට බලපාන ලද මූල්‍ය ප්‍රශ්න හේතුකොටගෙන එම ඒකකය 2020.09.15වන දිනෙන් යුක්තව විසුරුවා හරින බවට එවකට විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් සුන්දරම් අරුමෙයිනායහම් මහතා පොලිස් මූලස්ථානය වෙත ලිපියක් යොමු කර ඇත. එය ඇමුණුම මඟින් දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(iii) පිළිනොගනී.

1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනතේ 60වන වගන්තිය යටතේ කාර්යාංශයේ නිලධාරින් හට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දී ඇති බලය යටතේ මේ වන විට විශේෂ විමර්ශන ඒකකය ක්‍රියාත්මක වන අතර, තවදුරටත් විමර්ශන කටයුතු පුළුල් කිරීමේ පදනමින් පළාත් පහක් ආවරණය වන පරිදි පහත සඳහන් පළාත් කාර්යාල පහක විශේෂ විමර්ශන ඒකකය මේ වන විට විමධ්‍යගත කර ඇත.

එම කාර්යාල පහ වනුයේ, මධ්‍යම පළාත් විගමනික සම්පත් මධ්‍යස්ථානය, වයඹ පළාත් විගමනික සම්පත් මධ්‍යස්ථානය, ඌව පළාත් විගමනික සම්පත් මධ්‍යස්ථානය, සබරගමුව පළාත් විගමනික සම්පත් මධ්‍යස්ථානය සහ දකුණු පළාත් විගමනික සම්පත් මධ්‍යස්ථානයයි.

(iv) පොලිස් ඒකකය නැවත ස්ථාපනය නොකරයි.

(ආ) දැනට විශේෂ විමර්ශන ඒකකයේ නිලධාරින් ඉතාම කැපවීමෙන් යුතුව රාජකාරි කටයුතු කරමින් කාර්යාංශයේ බලතල අනුව විදේශ රැකියා සැපයීමේදී සිදුවන අක්‍රමිකතා වැළැක්වීමට කටයුතු කරන බැවින්, පොලිස් ඒකකයක් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවක් නොමැත.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය අහන ගමන්ම පුංචි කාරණාවකුත් ඉදිරිපත් කරනවා. මොකද, මේ සඳහා ඔබතුමාගෙන් වෙනම කාලය ඉල්ලුවොත් මට නොදෙන නිසා.

ගරු කථානායකතුමනි, අද පාන්දර "Channel 4 News" මඟින් ඉදිරිපත් කළා, පාස්කු ප්‍රහාරයට සම්බන්ධ ඉතාම බරපතළ ප්‍රශ්නයක්, බරපතළ තොරතුරු ටිකක්. ඒ තොරතුරු සම්බන්ධව විශේෂ පරීක්ෂණයක් කළ යුතුම වෙනවා. මේ රටේ ජනතාවගේ රුධිරය මහ පොළවට ගලලා විනාශ කරන තැනට ආණ්ඩුව පත් වෙලා තිබෙනවා නම්, ඒ පිළිබඳ පරීක්ෂණයක් වහාම කළ යුතුයි කියන ගමන් තමයි මම අතුරු ප්‍රශ්නය අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකරලා ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, ඔබතුමා අවස්ථාව නොදෙන නිසාම තමයි මම මේ වෙලාවේ ඒ ප්‍රශ්නය ඇහුවේ. ගරු මනුෂ නානායක්කාර මැතිතුමාටත් වලංගු වනවා, "Channel 4 News"වලින් දුන්න news එක පිළිබඳව කථා කිරීම. *[බාධා කිරීමක්]* මම හිතනවා, ආණ්ඩුවේ ඉන්න නිසා මේ වෙලාවේ ඔබතුමාට ඒ සම්බන්ධයෙන් විශාල වගකීමක් පැවරෙනවා කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

* ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, රටේ තිබෙන ප්‍රශ්න තමයි මේ අහන්නේ. වෙන ප්‍රශ්න නොවෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඇසූ ප්‍රශ්නයට අදාළව අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු ඇමතිතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ස්ථාපනය කර තිබූ පොලිස් ඒකකය එතැනින් ඉවත් කළා කියන එක නොවෙයි, අපට තිබෙන ගැටලුව. වර්තමානයේ මේ රටේ පවතින ආර්ථික ප්‍රශ්න නිසා ජනතාව විදේශගත වන්න දැඩි ලෙස උත්සාහ කරද්දී වැඩිපුරම අහුවෙන්නේ හොර ඒජන්සිකාරයන්ට.

ඔවුන් ලියාපදිංචි ඒජන්සිකරුවන් නොවෙයි, හොර කණ්ඩායම්. ඒ නිසා තමයි අද ඩුබායි, ඕමාන් වැනි රටවලට ගිය අපේ ජනතාව විශාල වශයෙන් දවස පුරාම ක්‍රීඩා පිට්ටනිවල, එහෙම නැත්නම් එක එක තැන්වල නිදාගෙන ඉන්නේ. ඒ අයට ලංකාවේ ජීවත් වෙන්න ක්‍රමයක් නැති නිසා ඒ රටවලට ගිහිල්ලා, ඒ ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා. මේ වෙනුවෙන් රටේ ක්‍රියාත්මක වෙන නීතිය සම්බන්ධයෙන් අපට ප්‍රශ්නයක් තිබෙනවා. බොහෝදෙනෙක් මේ ප්‍රශ්නවලින් පැනලා යනවා. මම දන්නවා, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ඒ සමහර දේවල් අදාළ නැති බව. ගරු ඇමතිතුමනි, විෂය භාර අමාත්‍යවරයා හැටියට ඔබතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ ආරක්ෂක අමාත්‍යාංශය සම්බන්ධීකරණය කරගෙන මේ හැම ප්‍රදේශයකම විසිරිලා සිටින මේ හොර ඒජන්සිකරුවන් අල්ලන වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න කියලා. මොකද, එහෙම නොකළොත් මේ රටේ ආර්ථිකය තවදුරටත් කඩාගෙන වැටෙනකොට මේ ප්‍රශ්න සියල්ලටම මේ රටේ අහිංසක ජනතාවටයි මුහුණ දෙන්න වෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නයට මම තව කාරණයක් එකතු කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, හොංකොං -

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ඔබතුමා අතුරු ප්‍රශ්න දෙකම එකවර අහනවාද?

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
අතුරු ප්‍රශ්න දෙකම එකවර අහන්නේ නැහැ. දෙවැනි අතුරු ප්‍රශ්නය මම වෙනම අහනවා. මේ ප්‍රශ්නයටම තව පොඩි කාරණා දෙකක් එකතු කරනවා. නැත්නම් මේ ප්‍රශ්න අහන්න දෙන්නේ නැහැ.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නයේ දෙවැනි කොටසම කැපෙනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, හොංකොං රටේ මේ වෙලාවේ රැකියා රාශියක් තිබෙන බව. හැබැයි හොංකොං රටේ consulate එකක් නැහැ. චීනයේ තමයි තිබෙන්නේ. ඒක චීනයේ තිබෙන නිසා ඒ අයට ඒ රැකියා අවස්ථා ටික සම්පූර්ණ කරගන්න බැහැ. ඒ රැකියාවකට කෙනෙක් ගන්න ලොකු කාලයක් ගත වෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, පළමුවැනි අතුරු ප්‍රශ්නයටම එකතු කරලා ඒ කාරණයටත් පිළිතුරක් ලබා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු කථානායකතුමනි, හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා පළමුව "Channel 4" නාළිකාවේ කාරණාව මතු කරපු නිසා මා ඒකට මුලින්ම පිළිතුරක් ලබා දෙනවා. අපි රජයක් විධියට වගකීමෙන් කටයුතු කරනවා වාගේම ඊයේ කැබිනට් මණ්ඩලය මේ සම්බන්ධයෙන් තීන්දුවක් ගත්තා. ඒ අනුව මේ පිළිබඳව පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කිරීම පිළිබඳ දැනුවත් කිරීම ඉදිරියේදී කරයි.

ඊට අමතරව, අවශ්‍ය නම් ජාත්‍යන්තර වශයෙනුත් පරීක්ෂණ කටයුතු කිරීම පිළිබඳව ඊයේ කැබිනට් මණ්ඩලයේදී අපි සාකච්ඡා කළා. ඒ ක්‍රියාත්මක වීම සඳහා රජය කිසිදු ආකාරයකින් පසුබට වෙන්නේ නැහැ. ඇමතිවරයකු විධියට නොවෙයි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු විධියට ඔය පැත්තේ ඉඳගෙනත් මම පෞද්ගලිකව මේ කාරණාව මතු කළ පුද්ගලයෙක් නිසා කියන්න ඕනෑ, ජිනීවා මානව හිමිකම් කවුන්සලය රැස් වෙන කාලයට "Channel 4" නාළිකාවේ මේ වාගේ වීඩියෝ නිරන්තරයෙන් ප්‍රචාරය වෙන බව. දැන් බලන්න, එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය රැස් වෙන්න තිබෙද්දී තමයි මේ වීඩියෝ එක ප්‍රචාරය වෙන්නේ. ඒ නිසා මේ වීඩියෝ එකේ තිබෙන කරුණු පිළිබඳව අපි අනිවාර්යයෙන්ම අධ්‍යයනය කරන්න ඕනෑ. මේ කියන වෙලාවේ මෙහෙම සාකච්ඡාවක් වෙලා තිබෙනවාද කියලා අධ්‍යයනය කරන්න ඕනෑ. ඒ පිළිබඳව අපේ කිසිම ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මේ කියන විධියට, සැලසුම වූ විධියට ගෝඨාභය රාජපක්ෂ මහත්මයා පත් කරන්න සුරේෂ් සලේ මේ විධියේ ප්‍රකාශයක් කළාය කියලා ඔය කියන මවුලවිවරයාගේ -මවුලවිද කවුද කියලා මම දන්නේ නැහැ- ප්‍රකාශය පදනම් කරගෙන කටයුතු කරනවා නම් කියන්න

කනගාටුයි, ඒ සිද්ධියෙන් පස්සේ කාදිනල්තුමා උදේ පාන්දර ගිහිල්ලා ගෝඨාභය රාජපක්ෂට ඡන්දය දෙන්න කියලා කිව්වේ ඇයි? මුහුණේ අත ගහගෙන අඬ අඬා ඒ සම්බන්ධයෙන් මතවාදයක් ගොඩ නැඟුවේ ඇයි? එහෙම නම්, ඒ පදනමින් යනවා නම්, ඒ අඬපු අය, මේ විධියට වැඩ කරන්න කියපු අය ඒ election campaign එකේ කොටස්කරුවන් වෙන්න ඕනෑ. ඒක මගේ පෞද්ගලික මතය.

දෙවැනි කාරණාව මේකයි, ගරු මන්ත්‍රීතුමනි. රටේ තිබෙන ආර්ථික ප්‍රශ්නයත් එක්ක විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ පොලිස් ඒකකයක් නොමැති වුණාම යම් බලපෑමක් වෙනවා නේද, තවදුරටත් ජනතාව වැරදි වැඩවලට අල්ලා ගන්න වැඩකටයුතු සිදු වෙනවා නේද කියලා ඔබතුමා ඇහුවා.

ඔව්. අපි ඒ වෙනුවෙන් ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා පොලීසිය, විදේශ කටයුතු අමාත්‍යාංශය ඇතුළුව අමාත්‍යාංශ ගණනාවකින් සමන්විත වූ විශේෂ කාර්ය සාධක බලකායක් සකස් කර තිබෙනවා. ඒ කාර්ය සාධක බලකාය හරහා human trafficking වළක්වන්න, වංචාකරුවන් වළක්වන්න විශේෂ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඊට අමතරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනත තවදුරටත් ශක්තිමත් කරලා, රැකියා සඳහා රට යවනවා කියලා සල්ලි එකතු කරපු අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා. ඒ වාගේම අපි විශ්වාස කරනවා, මේ සඳහා නීතිය ක්‍රියාත්මක කරනවා වාගේම, ඉන් එහාට ගිය දැනුවත් කිරීමක් අවශ්‍ය වන බව.

ගරු කථානායකතුමනි, මේ ඒජන්සිවලට හසුවෙන්න එපා කියලා අපි මේ පාර්ලිමේන්තුවේදීම අවස්ථා ගණනාවකදී කියලා තිබෙනවා. ඒ වුණත් මිනිස්සු හැමදාම, රට යවනවා කියලා කවුරු හරි කිව්වොත් ඒවාට හසු වෙනවා. ඒවාට හසුවෙන්නේ නැතිව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි ආයතනයකින් විතරක් විදේශගත වෙන්න කියන පණිවුඩය ඔබතුමන්ලා ජනතාවට ලබා දෙන්න. එතකොට මේ ප්‍රශ්නය මතු වෙන්නේ නැහැ.

ඔබතුමා දෙවැනි අතුරු ප්‍රශ්නය විධියට හොංකොං රාජ්‍යයේ consulate එකක් පටන් ගන්නවාද කියලා ඇහුවා. විදේශ කටයුතු අමාත්‍යතුමා මේ සභාවේ ඉන්නවා. එතුමා අනාගතයේදී ඒ සම්බන්ධයෙන් කටයුතු කරයි. ඒ සඳහා අවශ්‍ය ආර්ථික තත්ත්වය, ඒ සඳහා වූ පහසුකම් -විදේශ කටයුතු අමාත්‍යාංශයේත්, විදේශ රැකියා අමාත්‍යාංශයේත් සේවකයන්ගේ අඩුවක් තිබෙනවා- සඳහා උත්තර හොයාගෙන තවත් consulate එකක් පටන් ගන්න පුළුවන්ද කියන කාරණාව ගැන විදේශ කටයුතු අමාත්‍යාංශය තීරණය කරයි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒකට තමයි උත්තර දුන්නේ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ඇමතිතුමා අතුරු ප්‍රශ්න දෙකකට උත්තර දුන්නාට, මම ප්‍රශ්න දෙකක් ඇහුවේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා අතුරු ප්‍රශ්න දෙකක් නොවෙයි, හතරක් ඇහුවා.

ප්‍රශ්න අංක 3 -2971/2023- (1), ගරු හේෂා විතානගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4, ගරු අශෝක් අබේසිංහ මහතා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මම දෙවැනි අතුරු ප්‍රශ්නය ඇහුවේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට සභාවේ කාලය නාස්ති කරන්න දෙන්න බැහැ.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මම නැඟිටලා දෙවැනි අතුරු ප්‍රශ්න ඇහුවාද කියන්න, කථානායකතුමනි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හැම දාම ඔය ප්‍රශ්නය මතු වෙනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
හැම දාම එහෙම කරන අය ඉන්නවා වෙන්න පුළුවන්. මම දෙවැනි අතුරු ප්‍රශ්නය නැඟිටලා ඇහුවේ නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම බලාගෙන හිටියා. ඔබතුමාගේ පළමුවන අතුරු ප්‍රශ්නයෙන් ප්‍රශ්න හතරක් ඇහුවා. ඔබතුමා අතුරු ප්‍රශ්න හතරක් ඇහුවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා මුල් ප්‍රශ්නයට අදාළ නැති ප්‍රශ්නත් ඇහුවා. ඒක නිසා කරුණාකරලා ඉඳගන්න.

## කැලණිවැලි දුම්රිය මාර්ගය නවීකරණ ව්‍යාපෘතිය: ප්‍රගතිය
## களனிவெளிப் புகையிரதப் பாதையை நவீனமயப்படுத்தும் கருத்திட்டம்: முன்னேற்றம்
## KELANI VALLEY RAILWAY LINE RENOVATION PROJECT: PROGRESS

3078/2023

**4. ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කැලණිවැලි දුම්රිය මාර්ගය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ මේ දක්වා සිදු කර ඇති කාර්යයන් කවරේද;

(ii) එම ව්‍යාපෘතියේ මේ වනවිට ප්‍රගතිය කවරේද;

(iii) ඉහත ව්‍යාපෘතිය අතරමග නවතා දමා තිබේද;

(iv) එම ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

போக்குவரத்து மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) களனிவெளிப் புகையிரதப் பாதையை நவீன மயப்படுத்தும் கருத்திட்டத்தின்கீழ், இதுவரை மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக்கைகள் யாவையென்பதையும்;

(ii) மேற்படி கருத்திட்டத்தின் தற்போதைய முன்னேற்றம் யாதென்பதையும்;

(iii) மேற்படி கருத்திட்டமானது இடைநடுவில் நிறுத்தப்பட்டுள்ளதா என்பதையும்;

(iv) மேற்படி கருத்திட்டத்தின் தற்போதைய நிலைமை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Transport and Highways:

(a) Will he inform this House -

(i) the tasks that have been carried out so far under Kelani Valley Railway Line Renovation Project;

(ii) the current progress of the aforesaid project;

(iii) whether the said project has been halted midway; and

the current status of the aforesaid project;

(b) If not, why?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කැලණිවැලි දුම්රිය මාර්ගයේ මරදාන සිට පාදුක්ක දක්වා කොටස විදුලිකරණය කරන ලද ද්විත්ව දුම්රිය මාර්ගයක් ලෙස රථගාල් පහසුකම් සහිත නවීන දුම්රිය ස්ථාන හා නව සංඥා පද්ධතියක් සමඟ (මාලිගාවත්ත සිට මාලපල්ල දක්වා කොටස ගුවන්ගත මාර්ගයක් ලෙස) සංවර්ධනය කිරීම සඳහා වන ශක්‍යතා අධ්‍යයනය, සවිස්තරාත්මක ඉංජිනේරු සැලසුම්, ඇස්තමේන්තු හා ලංසු ලේඛන ඉදිරිපත් කර ඇත. තවද මෙම කොටසේ යෝජිත සංවර්ධන කටයුතු සඳහා පාරිසරික බලපෑම් ඇගයීම වාර්තාව - EIA report - සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් අනුමැතිය ලබා දී ඇත. එමෙන්ම පාදුක්ක සිට අවිස්සාවේල්ල දක්වා කොටස විදුලිකරණය කරන ලද තනි මාර්ගයක් ලෙස සංවර්ධනය කිරීම සඳහා වන මාර්ග පථයට අදාළ සැලසුම් ද සකස් කර ඇත.

මෙයින් පළමු අදියර ලෙස මරදාන සිට පාදුක්ක දක්වා කොටස විදුලිකරණය කරන ලද ද්විත්ව දුම්රිය මාර්ගයක් ලෙස නවීන නැවතුම්පොළවල් සමඟින් (එකවර වාහන 100ක් නැවැත්වීමේ පහසුකම් සහිතව) නව සංඥා පද්ධතියක්ද සමඟ ඉදිකිරීමටත්, කාර්ය බහුල වේලාවලදී මැදිරි 12ක් සහිත දුම්රිය විනාඩි 7කට වරක් ධාවනය කිරීමට සැලසුම් සකස් කර තිබුණි. මෙහිදී දුම්රිය හරස් මාර්ග 56කින් හා දුම්රිය මාර්ගයට සමාන්තර මාර්ග 10කින් සමන්විත මරදාන සිට මාකුඹුර දක්වා කොටස ගුවන්ගත මාර්ගයක් ලෙස ඉදිකිරීමටත් යෝජනා විය. මෙම දුම්රිය හරස් මාර්ග 56න් 22ක් සඳහාම දුම්රිය මාර්ගය පොළොව මතින් ඉදිකරන්නේ නම් ගුවන් පාලම් ඉදි කළ යුතු බව මාර්ග සංවර්ධන අධිකාරියේ නිර්දේශය වී තිබුණි. ඒ අනුව දුම්රිය හරස් මාර්ග හා සමාන්තර මාර්ගවලට වන බලපෑමෙන් නගරයේ ඇතිවන තදබදය වළක්වා ගැනීමටත්, දුම්රිය හරස් මාර්ග හා සමාන්තර මාර්ගවලට වන බලපෑමෙන් නගරයේ ඇතිවන තදබදය වළක්වා ගැනීමටත් දුම්රිය මාර්ගය ඉදිකිරීමෙන් පසු නගරයේ වාහන තදබදය වැළැක්වීම සඳහා මීටර් තුනක් උස වැටකින් දුම්රිය මාර්ගය ආවරණය කෙරෙන නිසා නගර බෙදී යෑම වැළැක්වීම සඳහාත් දුම්රිය මාර්ගය ඉහළින් ඉදිකළ පසු එහි පහළ කොටස ආදායම් උත්පාදනය සඳහා යොදා ගැනීමත් යන කරුණු සලකා බලා මෙම කොටස ගුවන්ගතව ඉදිවිය යුතු බව විදේශීය හා දේශීය විද්වතුන් 50කින් පමණ සමන්විත උපදේශක සමාගමේ යෝජනාව විය. වියදම් ඇස්තමේන්තු සැසඳීමේදී ද මෙම කොටස ගුවන්ගතව ඉදිකිරීම පොළොව මතින් ඉදිකරනවාට වඩා ලාභදායී බව සනාථ විය.

නමුත් 2020.05.13 වන දින අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද සංදේශය මඟින් පත් කරන ලද,

1. මහාචාර්ය ලලිතසිරි ගුණරුවන් මහතා (සභාපති)

2. ආචාර්ය ඩී.එස්. ජයවීර මහතා (සාමාජික)

3. ජානක කුරුකුලසූරිය මහතා (සාමාජික) ගෙන් සමන්විත

කමිටුව හමුවේ දුම්රිය මාර්ගය මරදාන සිට මාකුඹුර දක්වා කොටස ගුවන්ගත මාර්ගයක් ලෙස ඉදිකිරීමේ යෝජනාව දැඩි ලෙස විවේචනයට ලක්විය. මේ සම්බන්ධයෙන් ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ප්‍රවාහන අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද ලිපිය ඇමුණුම 01 ලෙස ඉදිරිපත් කරනවා. මෙහිදී යෝජනාව වූයේ මෙම කොටස පොළොව මතින් ඉදිකරන ලෙසයි. මේ සම්බන්ධයෙන් 2022.07.05 දින රැස් වූ COPA මඟින් නිර්දේශ කර ඇත්තේ

මෙලෙස විදේශීය හා දේශීයව සැදුම්ලත් උපකදේශකයන් මඟින් කරන ලද සැලසුම ඇගැයීමට ලක් කිරීමට තරම් කම්ටුව සතු සුදුසුකම් සොයා බලන ලෙසයි. COPA එකේ නිර්දේශ ඇමුණුම 02 ලෙස ඉදිරිපත් කරනවා.

ඇමුණුම් 01 හා 02 **සභාගත*** කරමි.

තවද, මෙම සැලසුම් සකස් කිරීමේ කාර්යයට සමගාමීව සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩ ලබා ගැනීම සඳහා මරදාන සිට පාදුක්ක දක්වා කොටසේ දුම්රිය රක්ෂිතය අනවසරයෙන් භාවිත කරන්නන් 1,600ක් පමණ ඉවත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ප්‍රකාරව ඔවුන් වෙත ප්‍රතිලාභ ලබා දී දුම්රිය රක්ෂිතයෙන් ඉවත් කිරීම සිදු කරගෙන යන අතර, මේ වන විට හඳුනා ගත් අනවසර නේවාසික ඉදිකිරීම් 670ක් සඳහා නිවාස ලබා දීමෙන්ද, වෙනත් ඉදිකිරීම් 38ක් සඳහා වන්දි ලබා දීමෙන්ද දුම්රිය රක්ෂිතයෙන් අනවසර භාවිත කරන්නන් ඉවත් කර ඇත. තවද ඉදිකිරීම් කටයුතු සඳහා අත්‍යවශ්‍ය වන හෙක්ටෙයාර 9.8ක පුද්ගලික ඉඩම් ප්‍රමාණයෙන් මරදාන සිට නාවින්න දක්වා කොටසෙහි ඉඩම් ප්‍රමාණය වන හෙක්ටෙයාර 1.70ක් අත්පත් කර ගැනීම සඳහා ඉඩම් කට්ටි 355ක් ලෙස හඳුනාගෙන ඉඩම් අත්පත් කර ගැනීමේ පනත අනුව එයින් ඉඩම් කට්ටි 343ක් සඳහා දෙවන මට්ටමේ ගැසට් නිවේදනය පළ කර ඇති අතර, එයින් ඉඩම් කට්ටි 287කට 5 වන මට්ටමේ නිවේදනය පළ කර ඇති අතර මේ වන විට ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය තාවකාලිකව අත්හිටුවා ඇත.

කෙසේ වෙතත්, කැලණිවැලි දුම්රිය මාර්ගය සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අරමුදල් ආසියානු සංවර්ධන බැංකුව විසින් වෙන් කර තිබුණද මහ භාණ්ඩාගාරය විසින් යවන ලද අංක ER/AB/Tr/Gen Vol I හා 2020.07.20 දිනැති ලිපියට අදාළව අවසානයේ එම අරමුදල් අහෝසි වූ අතර නැවත අරමුදල් ප්‍රභවයක් හඳුනාගත නොහැකි වීම නිසා ව්‍යාපෘති ක්‍රියාත්මක නොවීය. පසුව අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2021.06.10 දින අරලියගහ මන්දිරයේදී පැවති සාකච්ඡාවට අනුව, කැලණිවැලි දුම්රිය මාර්ගය සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා රජයේ සහ ආසියානු සංවර්ධන බැංකු අරමුදල් යොදා ගැනීමෙන් ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවකින් අනුමැතිය ලැබී ඇත.

මෙම සියලු සැලසුම් හා ඇස්තමේන්තු 2021.06.08 දින ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව වෙත භාරදී ව්‍යාපෘතිය වෙත පැවරී තිබූ කාර්යය අවසන් කර ඇත. ඉදිකිරීම් සම්බන්ධව මෙම ව්‍යාපෘතිය වෙත කාර්යයක් මෙහිදී පැවරී තිබුණේ නැත.

(ii) 2021 ජූලි 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව මෙතෙක් අරමුදල් සපයන කිසිදු ආයතනයක් ඉදිරිපත් වූ බවක් ව්‍යාපෘතිය වශයෙන් අප වෙත දැනුම්දීමක් කර නොමැත. රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය යටතේ දුම්රිය මාර්ගය නවීකරණය කළ යුතු බව 2022 අගෝස්තු 30 දින අතුරු අය වැය කථාවේදී ගරු ජනාධිපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී. ඒ අනුව සංවර්ධන කටයුතු සඳහා පෞද්ගලික අංශයේ හවුල්කරුවන් හඳුනා ගැනීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය සේවය විසින් කටයුතු කරනු ඇත. නමුත්, ඒ සඳහා ගත් කිසිදු උත්සාහයක් මෙතෙක් සාර්ථක වී නැත.

කෙසේ වෙතත්, මරදාන සිට පාදුක්ක දක්වා කොටසේ ව්‍යාපෘතිය නිසා බලපෑමට ලක් වන බවට හඳුනාගත් බලපෑම්ලාභීන් 1,600න් නිවැසියන් 670ක් නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාගත් නිවාස ඒකකවල නැවත පදිංචි කර, ඔවුන් භාවිත කළ ඉදිකිරීම් ඉවත් කොට දුම්රිය මාර්ග රක්ෂිතය පිළිසකර කිරීම මේ දිනවල සිදු කරමින් පවතී. ඉතිරි බලපෑම්ලාභීන්ගෙන් නිවැසියන් 574ක් සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් නිවාස මිලදී ගැනීම සඳහා කටයුතු සිදු කර ඇති අතර, මේ වන විට එම නිවාස ඉදිකරමින් පවතී. තවත් නිවාස ඒකක 120කින් යුතු මහල් නිවාස සංකීර්ණයක් දුම්රිය කාර්යක්ෂමතාව නැංවීමේ ව්‍යාපෘතිය විසින් මාලපල්ල ප්‍රදේශයේ ඉදිකරමින් පවතී. නුදුරේදී එහි වැඩ අවසන් කිරීමට උපදෙස් ලබා දී ඇත.

(iii) කැලණිවැලි දුම්රිය මාර්ගයේ මරදාන සිට පාදුක්ක දක්වා කොටසේ සංවර්ධනයට අදාළ සැලසුම්, ඇස්තමේන්තු හා ලංසු ලියවිලි සකසා අවසන් කර පාරිසරික බලපෑම් ඇගැයීම් වාර්තාව සඳහා අනුමැතිය ද ලබාගෙන ඇතත්, ඉදිකිරීම් සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක නොවේ. නමුත්, මේ වන විට ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉඩකඩ ලබා ගැනීම සඳහා දුම්රිය රක්ෂිතයේ පදිංචිකරුවන් ඉවත් කිරීමේ ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කරමින් පවතී.

(iv) ඉහත (i) හා (ii) හි සඳහන් කර ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු මන්ත්‍රීතුමනි, මම සියලු විස්තර ටික ඔබතුමාට දැනුම් දුන්නා. අදාළ වන වැදගත්, මෙතෙක් හෙළිදරව් නොවූ ලියවිලි රාශියක් තිබෙනවා. පොදු ජනයාගේ යහපත පිණිස ඒ ලියවිලි සියල්ලත් මා ඉදිරිපත් කරන්නම්. ඕනෑ කෙනෙකුට ඒවා උපුටා පළ කරන්න පුළුවන්.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත් නියෝජනය කරන දිස්ත්‍රික්කයේ සහ පළාතේ තමයි, කැලණිවැලි දුම්රිය මාර්ගය පිහිටා තිබෙන්නේ.

2018 දී ඉදිරිපත් කළ කැලණිවැලි දුම්රිය මාර්ග සංවර්ධන සැලැස්ම ගැන තමයි එතුමා දීර්ඝ ප්‍රකාශයක් කළේ. දැන් ඒ දුම්රිය මාර්ගයේ වැඩ කටයුතු අතරමඟ නතරවෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා 1994 ඉඳලා අවුරුදු 30කට ආසන්න කාලයක් ආණ්ඩුවේ ඇමතිවරු වශයෙන් ඉන්නවා. මේ කියන දුම්රිය මාර්ගයේ දිනකට මඟීන් 20,000ක් පමණ ගමන් කරනවා. නමුත් දුම්රිය 18ක් පමණයි තවම ක්‍රියාත්මක වෙන්නේ. පැයට කිලෝමීටර 26ක වේගයෙන් තමයි ඒ දුම්රියත් ධාවනය කරන්නේ. ඔබතුමා දැන් කිව්වා, හැම විනාඩි හතකට වරක් ඒ දුම්රිය මාර්ගයේ දුම්රියක් ධාවනය කරන තත්ත්වයට පත් කරනවා කියලා. හැබැයි, දැනටත් මේ කිලෝමීටර 65 තුළ දුම්රිය හරස් මාර්ග 148ක් තිබෙනවා. කොළඹ - පාදුක්ක අතරතුර තිබෙන සමහර දුම්රිය හරස් මාර්ගවල විනාඩියට වාහන 15ක්, 16ක් ධාවනය වෙනවා.

---

***** **පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අශෝක් අබේසිංහ මහතා]

දැන් ADB එකෙන් loans ලබා දීම නතර වෙලා තිබෙන්නේ. අර කිව්ව ගුණරුවන් වාර්තාව අනුව එහි නවීකරණ කටයුතු නතර කළා නම්, දැන් සාමාන්‍ය තත්ත්වයට හෝ පත් කරන්න රජයේ ප්‍රතිපාදන හෝ වෙනත් ප්‍රතිපාදනවලින් ඒ වැඩකටයුතු පටන් ගන්න ඔබතුමන්ලාට අදහසක් තිබෙනවාද කියා මම ගරු ඇමතිතුමාගෙන් දැනගන්න කැමැතියි.

ඔබතුමා කිව්ව විධියට දැන් මහල් නිවාස සංකීර්ණය ඉදිකිරීම වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 160ක් හම්බවෙලා තිබෙනවා, වෙන ව්‍යාපෘතියකින්. හැබැයි, 2023 වසරේ ඇමෙරිකානු ඩොලර් මිලියන 200ක් මේ ව්‍යාපෘතියට ලැබෙන්න තිබුණා, ආසියානු සංවර්ධන බැංකුවෙන්. ඒකත් දැන් නතරවෙලා තිබෙනවා. ඔබතුමන්ලා නියෝජනය කරන දිස්ත්‍රික්කයේ දවසකට 20,000ක් පමණ ජනතාව ගමන් කරන මේ දුම්රිය මාර්ගය රජයේ ප්‍රතිපාදන -භාණ්ඩාගාර ප්‍රතිපාදන- තුළින් හෝ අලුත්වැඩියා කරන්න ඔබතුමන්ලා ගෙන ඇති අලුත් වැඩ පිළිවෙළ මොකක්ද කියලාත් මම ඔබතුමාගෙන් දැනගන්න කැමතියි, ගරු ඇමතිතුමනි.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
ගරු මන්ත්‍රීතුමනි, ගරු අගමැතිතුමාටත්, මටත් කැලණි මිටියාවතේ මේ දුම්රිය මාර්ගය නවීකරණය කරන්න තිබෙන උනන්දුව තරම් උනන්දුවක් ඔබතුමාට ඇති වීම පිළිබඳව මම පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, කෙටියෙන් උත්තර දෙන්න. පෙර වරු 10.30ට වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න ඇසීම අපි නතර කරනවා.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
මේ දුම්රිය මාර්ගය නවීකරණය කරන්න අවශ්‍ය සියලු උත්සාහය අපි දරා තිබෙනවා. රාජ්‍ය තාන්ත්‍රික මට්ටමිනුත් අපි උත්සාහ දරනවා, මේ කිලෝමීටර 60ක කොටස විදුලිකරණය කරන ලද ද්විත්ව දුම්රිය මාර්ගයක් බවට පත් කර ගන්න. ගරු අග්‍රාමාත්‍යතුමාත්, මමත් කැබිනට් මණ්ඩලය තුළදීත්, ඉන් පිටතදීත් ඒ වෙනුවෙන් කටයුතු කරනවා. ඔබතුමන්ලා දැනගත යුතු සරල, පරම සත්‍යය තමයි, අපි ගත්ත විදේශ ණය වාරික ගෙවලා නැතිව අපිට කිසි කෙනෙකු තඹ සතයක්වත් අලුතින් ණය දෙන්නේ නැහැ කියන එක. රජයට ඒ කටයුත්ත කරන්න මුදල් නැහැ කියන එක උගත් ගරු මන්ත්‍රීවරයකු වන ඔබතුමාට මම කියන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, 2022 අවුරුද්දේ මේ රටේ සමස්ත බදු ආදායම රුපියල් බිලියන 1,751යි. ඒකෙන් රාජ්‍ය සේවකයන්ගේ වැටුප් ගෙවන්න රුපියල් බිලියන 956ක් වැය වුණා. විශ්‍රාම වැටුප් ගෙවන්න රුපියල් බිලියන 309ක් වැය වුණා. රාජ්‍ය වැටුප් හා විශ්‍රාම වැටුප් ගෙවන්න විතරක් සමස්ත බදු ආදායමින් සියයට 74ක් -රුපියල් බිලියන 1265ක්- වැයවෙලා තිබෙනවා.

සහනාධාරවලට වැය වෙලා තිබෙනවා රුපියල් බිලියන 506ක්. එතකොට රුපියල් බිලියන 1,771යි. බදු ආදායම තිබෙන්නේ රුපියල් බිලියන 1,751යි. ලංකා ආණ්ඩුව ගන්න මුළු බදු ආදායමෙන් දරන්න පුළුවන් වියදම් දෙකක් විතරයි. ඒ, වැටුප්, විශ්‍රාම වැටුප් සහ සහනාධාර විතරයි. ඒ අවුරුද්දට ගෙවන්න තිබෙන ණය පොලිය රුපියල් බිලියන 1,565ක්. ඉතින්, කොහෙන්ද සල්ලි හොයන්නේ? සල්ලි තමයි ප්‍රශ්නය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, අනවශ්‍ය විස්තරවලට යන්නේ නැතුව ඔබතුමා ප්‍රශ්නයට උත්තර දෙන්න.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩු තමයි 1994 ඉඳන් අවුරුදු තිහක්ම මේ රට පාලනය කළේ. රටේ ආදායම මෙහෙම අඩු වෙන්නේ කොහොමද?

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardana)
ගරු මන්ත්‍රීතුමනි, දැන්වත් තේරුම් ගන්න හැම දාම රට පාලනය කරලා තිබෙන්නේ, පාරවල් හදලා තිබෙන්නේ, පාලම් හදලා තිබෙන්නේ, ඇනිකට් හදලා තිබෙන්නේ, වේලි හදලා තිබෙන්නේ, සංවර්ධන යෝජනා ක්‍රම සියල්ල කරලා තිබෙන්නේ දේශීය හා විදේශීය වශයෙන් ණය අරගෙන කියලා. ගත්ත ණය ගෙවන්නේ නැතුව, ජාත්‍යන්තරයට ණය පොල්ලක් තබා තිබෙනවා. මේ ප්‍රශ්නය විසඳා ගන්නේ නැතුව මොනවත් කරන්න බැහැ කියන එක මේ ගරු සභාව දැන්වත් තේරුම් ගන්න.

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා දීර්ඝ විස්තරයක් කළා. *[බාධා කිරීමක්]* මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා තමයි 1994 ඉඳන් අවුරුදු 30ක් රට පාලනය කළේ. 2020 වෙද්දී අපේ රටේ සමස්ත ණය රුපියල් කෝටි දහතුන් ලක්ෂයයි. දැන් රුපියල් කෝටි විසිහත් ලක්ෂයයි. මේ ටික කාලයටත් රුපියල් කෝටි දාහතර ලක්ෂයක් අරගෙන මේ කටයුතුවත් කරන්නේ නැද්ද? මේ වන විට මහරගම දක්වා ඒ ජනාකීර්ණ ප්‍රදේශවල නිවාස ඉවත් කරන්න වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ ඉවත් කරන නිවැසියන් සඳහා නිවාස ලබා දෙන්න ඔබතුමන්ලා සකස් කර තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද? දැන් නිවාස කොච්චර ඉවත් කරලා තිබෙනවාද? ඒ ඉවත් කරන නිවාස සඳහා ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ මොකක්ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මුල් ප්‍රශ්නයෙන් ඇහුවේ නිවාස පිළිබඳව නොවෙයි නේ.

ප්‍රශ්න අංක 5 - ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

## මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ : ඉදිකිරීම සඳහා ලබාගත් ණය

මத்தள ராஜபக்ஷ சர்வதேச விமான நிலையம்: நிர்மாணத்திற்காகப் பெறப்பட்ட கடன்கள்

MATTALA RAJAPAKSA INTERNATIONAL AIRPORT: LOANS OBTAINED FOR CONSTRUCTION

3095/2023

**5. ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය,- (1):

(අ) (i) වර්ෂ 2017 සිට මේ දක්වා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ විසින් උපයන ලද ආදායම සහ දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගුවන් තොටුපළ ඉදිකිරීම සඳහා ලබා ගෙන ඇති දේශීය හා විදේශීය ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ණය ලබා ගෙන ඇති එක් එක් ආයතනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඉහත ගුවන් තොටුපළ ඉදිකිරීම සඳහා ලබා ගන්නා ලද ණය මුදල්, ඵලදායීව භාවිතා කර නොමැති බවට විගණන වාර්තාවලින් අනාවරණ වී ඇති බව පිළිගන්නේද;

(ii) එම ගුවන් තොටුපළ ආර්ථිකයට වැය බරක් නොවී පවත්වාගෙන යැම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

துறைமுகங்கள், கப்பற்றுறை மற்றும் விமான சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2017ஆம் ஆண்டு தொடக்கம் இதுவரை மத்தள ராஜபக்ஷ சர்வதேச விமான நிலையத்தினால் ஈட்டப்பட்ட வருமானம் மற்றும் மேற்கொள்ளப் பட்ட செலவினம் வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி விமான நிலையத்தை நிர்மாணிப் பதற்காகப் பெறப்பட்டுள்ள உள்நாட்டு மற்றும் வெளிநாட்டுக் கடனின் அளவு வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iii) மேற்குறித்த கடன் பெறப்பட்ட ஒவ்வொரு நிறுவனமும் வெவ்வேறாக யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி விமான நிலையத்தை நிர்மாணிப் பதற்காகப் பெறப்பட்ட கடன், பயன்மிக்க வகையில் பயன்படுத்தப்படவில்லை என கணக்காய்வு அறிக்கைகளில் வெளிப்படுத்தப் பட்டுள்ளதனை ஏற்றுக்கொள்வாரா என்பதையும்;

(ii) மேற்குறித்த விமான நிலையத்தை பொருளாதாரத்திற்கு சுமையின்றிப் பேணிச் செல்வதற்கு மேற்கொள்ளப்படும் நடவடிக் கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Ports, Shipping and Aviation:

(a) Will he inform this House -

(i) the income earned from and the cost incurred on the Mattala Rajapaksa International Airport from 2017 to date, separately;

(ii) the amount of local and foreign loans obtained to construct that airport, separately; and

(iii) each of the institutions from which those loans have been obtained, separately?

(b) Will he also inform this House -

(i) whether he admits the fact that the loans that have been obtained to construct the above airport have not been utilized efficiently, as revealed by the audit reports; and

(ii) the measures that would be adopted to maintain that airport without it being a burden to the economy?

(c) If not, why?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி நிமல் சிறிபால த சில்வா - துறைமுகங்கள், கப்பற்றுறை மற்றும் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala de Silva, Attorney-at-Law - Minister of Ports, Shipping and Aviation)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ආදායම් සහ වියදම් රුපියල්වලින් ගණනය කර ඇත.

| | 2023/මාස | 2022 | 2021 | 2020 | 2019 | 2018 | 2017 |
|---|---|---|---|---|---|---|---|
| ගගන ආදායම් | 54,830,744 | 21,760,304 | 27,711,302 | 17,635,814 | 7,706,428 | 10,804,343 | 44,589,208 |
| ගගන නොවන ආදායම් | 109,036,672 | 56,237,881 | 65,760,284 | 24,955,893 | 8,503,824 | 11,735,366 | 32,680,798 |
| **මුළු ආදායම්** | **163,867,416** | **77,998,185** | **93,471,586** | **42,591,707** | **16,210,252** | **22,539,708** | **77,270,005** |
| **මුළු වියදම්** | **1,211,396,684** | **2,033,000,227** | **2,036,770,615** | **2,151,916,749** | **2,190,942,860** | **2,199,763,516** | **2,314,897,394** |

[ගරු නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා ]

අනෙක් ඔක්කෝම විස්තර ටික ඉහත වගුවේ තිබෙනවා.

(ii) විදේශීය ණය

චීන එක්සිම් බැංකුව මඟින් ඇමෙරිකානු ඩොලර් 189,827,804.76ක් (යුවාන් මිලියන 1,300) සියයට 2ක වාර්ෂික පොලී අනුපාතයකට යටත්ව අවුරුදු 15ක් තුළදී ගෙවා නිම කිරීමට (2015-2030)

දේශීය ණය

ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් රුපියල් බිලියන 4ක ණයකර නිකුතුවක් මඟින් ඉතිරි ගෙවීම් සඳහා AWPLR + සියයට 2ක වාර්ෂික පොලියක් මත වර්ෂ 15ක් තුළදී ගෙවා නිම කිරීමට (2019-2034)

(iii) චීන එක්සිම් බැංකුව සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව

(ආ) (i) එකී ණය මුදල් ඵලදායී ලෙස යොදා ගනිමින් වසරකට මිලියනයක මඟී ධාරිතාවක් ඉසිලිය හැකි නව ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් වසර 4ක් තුළ ගොඩනඟා තිබේ.

(ii) ගුවන් තොටුපළ ආර්ථිකයට වැය බරක් නොවී පවත්වාගෙන යෑම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග රාශියකි. ඒවා මෙසේයි.

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ නව ව්‍යාපෘති

1. ආයෝජන සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලියවිලි කැඳවීම (EOI)

- වරාය, නාවික හා ගුවන්සේවා අමාත්‍යාංශය සමඟ එක්ව එයාර්පෝට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම ආයෝජන සඳහා කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලියවිලි වර්ෂ 2023 මැයි මස 27වන දින කැඳවන ලද අතර, එය මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ අනාගත දියුණුව ඉලක්ක කර ගනිමින් කරන ලද්දකි.
- මේ මඟින් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන ඍජු සහ වක්‍ර ගුවන් සේවා සම්බන්ධ ව්‍යාපෘති පහත පරිදි වේ.

| ඍජු ව්‍යාපෘති | වක්‍ර ව්‍යාපෘති |
|---|---|
| නඩත්තු අලුත්වැඩියා සහ නැවත ඉදිකිරීමේ (MRO) ව්‍යාපෘති සහ ඊට අදාළ සහාය සේවා | පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති (සූර්ය බලශක්තිය) |
| පියාසර පාසල්, ගුවන් ඉංජිනේරු පාසල් | හෝටල්, ආගන්තුක සේවා, ජාත්‍යන්තරව පිළිගත් වෙළඳ කුටි, සම්බාහන මධ්‍යස්ථාන, කාර්මික උද්‍යාන (නිෂ්පාදන, ඇසුරුම්, ගබඩා පහසුකම්) |

| ඍජු ව්‍යාපෘති | වක්‍ර ව්‍යාපෘති |
|---|---|
| නඩත්තු අලුත්වැඩියා සහ නැවත ඉදිකිරීමේ (MRO) ව්‍යාපෘති සහ ඊට අදාළ සහාය සේවා | පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති (සූර්ය බලශක්තිය) |
| ගුවන්යානා අමතර කොටස් නිෂ්පාදනය සහ ගබඩා කිරීම | ප්‍රවර්ධන සහ සැපයුම් ක්‍රියාවලි කළමනාකරණය (ගබඩා, කුරියර් පහසුකම්, ප්‍රවාහන) |
| ස්ථිර පදනම් සහිත මෙහෙයුම් (FBO) | |
| දීර්ඝ කාලීන ගුවන්යානා නැවතුම් පහසුකම් | |

- මේ යටතේ මෙහෙයුම්කරුවන් 4 දෙනෙකු සාර්ථක ලෙස ආයෝජන අවස්ථාවන් ඉල්ලුම් කර ඇති අතර එය MRO ව්‍යාපෘති, ප්‍රවර්ධන සහ සැපයුම් ක්‍රියාවලි කළමනාකරණය, පුහුණු මධ්‍යස්ථාන, ගුවන් යානා අමතර කොටස් නිෂ්පාදනය, දීර්ඝ කාලීන ගුවන් යානා නවාතැන් පහසුකම් සඳහා වේ.
- මෙම අනේකවිධ යෝජනා ගුවන් තොටුපොළේ විවිධ පැතිකඩවල වර්ධනය සඳහා ඉවහල් වන අතර, එය ගුවන් සේවා කර්මාන්තය තුළ ගුවන් තොටුපොළෙහි කාර්යයන්හි උපයෝගිතාව මනාව ඉහළ නැංවීමට ඉවහල් වන අතර, එමඟින් රටේ ආර්ථික වර්ධනය හා රටේ ගුවන් සේවා කර්මාන්තයේ ප්‍රගතිය ආවරණය කරයි.

2. ගුවන් යානා කොටස් කර සැකසීමේ යෝජනා

- එයාර්පෝට් ඇන්ඩ් ඒවියේෂන් සර්විසස් (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගමට Aitken Spence Aero Space Technologies (Pvt.) Limited වෙතින් ගුවන් යානා කොටස් කර සැකසීම සඳහා යෝජනාවක් ලැබී ඇත.
- මේ මඟින් භාවිතයෙන් ඉවත් කිරීමට නියමිත පැරණි ගුවන් යානා කොටස් කර අපනයනය සඳහා සැකසීම සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය ඇමෙරිකානු ඩොලර් අදියර දෙකකින් ආයෝජනය කිරීමට බලාපොරොත්තු වේ. ඒ සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ අවසරය ලබා ගැනීමට ආයෝජකයන් කටයුතු කරමින් සිටී.

(ඇ) අදාළ නොවේ.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා කියපු විධියට පාඩුව මිලියන 150ක් ද? එය පැහැදිලි වුණේ නැහැ.

**ගරු නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva, Attorney-at-Law)
පාඩුව අවුරුද්දකට බිලියනයක් පමණ වෙනවා.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
බිලියනයක් පමණ වෙනවා ද?

ගරු කථානායකතුමනි, මත්තල ගුවන් තොටුපොළ ගැන කථා කරන කොට අපි එදා කිව්වා ඒක සුදු අලියෙක් කියලා. අද ඒක තහවුරු වෙලා තිබෙනවා. අපේ රටේ බදු ගෙවන අහිංසක ජනතාව දැන් බිලියනයක් පාඩු කරගෙන තිබෙනවා. ඒ පාඩුව ඩොලර් බිලියනයක් නේද, ගරු ඇමතිතුමනි?

**ගරු නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva, Attorney-at-Law)
රුපියල් බිලියනයක්.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ඔබතුමා කියන විධියට රුපියල් බිලියනයක් පාඩුයි නේ. ගරු කථානායකතුමනි, මේ රට අද කඩා වැටිලා තිබෙනවා. රටේ තෙල් මිල වැඩි කළා; ගෑස් මිල වැඩි කළා; විදුලි බිල වැඩි කළා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය කාරණා කියන්න වෙනම විවාදයක් ගන්න. දැන් ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු ඇමතිතුමනි, මේ රටේ අහිංසක මිනිසුන්ගේ ධනය මේ විධියට අවභාවිත කරපු අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක වන්නේ කොහොමද කියලා අපි දැනගන්න කැමැතියි.

**ගරු නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මත්තල ගුවන් තොටුපොළ ලංකාවේ දෙවැනි ජාත්‍යන්තර ගුවන් තොටුපළ හැටියටයි අපි හැදුවේ. රටක ගුවන් ක්ෂේත්‍රය තුළ එම රටට හැම විටම දෙවැනි ගුවන් තොටුපළක් අවශ්‍යයි. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ තිබුණේ නැත්නම්, අපේ කටුනායක ගුවන් තොටුපළේ යම් ආපදාවක් වුණොත් එයට පැමිණෙන ගුවන් යානා නැවත හරවාගෙන මදුරාසිය දක්වා යන්න ඕනෑ. එතකොට ඒ ගුවන් යානා අමතරව විශාල තෙල් ප්‍රමාණයක් අරගෙන එන්න ඕනෑ.

ඒ නිසා හැම වෙලාවේම ගුවන් සමාගම් අහනවා, දෙවැනි ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් ආසන්නයේ තිබෙනවාද කියලා. මේ ගුවන් තොටුපොළට යන්න ගත වෙන්නේ විනාඩි 15යි. ඒ නිසා ඒ තුළින් විශාල වාසියක් - advantage - සමස්ත ගුවන් සේවය සඳහා ලැබී තිබෙනවා.

ගරු කථානායකතුමනි, අනෙක් කාරණය මේකයි. මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළට ඕනෑම හදිසි අවස්ථාවකදී ගුවන් යානා ගොඩ බස්වන්න පුළුවන්. අපි දන්නවා, කාරණා ගණනාවක් නිසා - විවිධ කාලගුණික තත්ත්ව නිසා, වෙනත් විවිධ හේතු නිසා - කටුනායක ගුවන් තොටුපොළට ගොඩ බස්වන්න බැරි වුණු වෙලාවල ගුවන් යානා ගණනාවක්ම මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළට ගොඩ බස්වා තිබෙන බව. ඒ නිසා අපට එහි වාසිය රුපියල් ශතවලට විතරක් ලඝු කරන්න පුළුවන්කමක් නැහැ. සමස්ත ගුවන් සේවාව පිළිබඳ තත්ත්වය සමාලෝචනය කරලා තමයි මෙය කරන්න ඕනෑ. නමුත් අපි දැන් පුළුවන් තරම් දුරට මෙම ගුවන් තොටුපොළ වෙනත් නව ව්‍යාපෘති ගණනාවක් සඳහා යොදා ගැනීමට කටයුතු කරනවා. ඒ පිළිබඳ විස්තර ඉහත පිළිතුරේ සඳහන් කර තිබෙනවා. අපට දවසකින් දෙකකින් එම කටයුත්ත කරන්න බැරි වෙයි. නමුත් ඉදිරි කාලය තුළ අපට මේ පාඩුව යම් ආකාරයකට අවම කරගන්න පුළුවන් වෙයි.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු කථානායකතුමනි, මේ අනුව පැහැදිලියි, හදිසි අවස්ථාවක භාවිත කරන්න අවශ්‍ය කරන ගුවන් තොටුපොළක් සෑදීම සඳහා මේ රටේ මිනිසුන්ගේ රුපියල් බිලියනයක සල්ලි විනාශ කරලා මේ රට මේ වාගේ ආර්ථික අර්බුදයකට පත් කළ බව.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ අවස්ථාව තිබෙන්නේ කථා පවත්වන්න නොවෙයි නේ. ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ශ්‍රීලන්කන් ගුවන් සේවය ප්‍රතිව්‍යුහගත කරනවා කියනවා; විකුණනවා කියනවා. ඒ වැඩ පිළිවෙළ මොකක්ද? විශේෂයෙන් ජපානයෙන් ලැබුණු ණයක් එක්ක යම්කිසි ඇමතිවරයෙක් පගාවක් ඉල්ලුවා කියලා ඒ අය ව්‍යාපෘතියෙන් ඉවත් වුණා. දැන් එම කටයුත්ත නැවත වතාවක් ආරම්භ කර තිබෙනවාද කියා සහ ශ්‍රීලන්කන් ගුවන් සේවය පිළිබඳව ගන්නා තීරණය මොකක්ද කියා මා දැනගන්න කැමැතියි.

**ගරු නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு சட்டத்தரணி நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva, Attorney-at-Law)
තමුන්නාන්සේ පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා අසත්‍ය කියන්න එපා. එහෙම දෙයක් වෙලා නැහැ. මම ඒ පිළිබඳව ප්‍රකාශ ගණනාවක් කර තිබෙනවා, මීට පෙර. තමුන්නාන්සේට ඕනෑ උදේ පාන්දර මාධ්‍යයට මොනවා හෝ යමක් කථා කරන්නයි. එහෙම කරන්න එපා. මේ රටේ මිනිස්සු මෝඩයන් නොවෙයි. තමුන්නාන්සේලාගේ ඔය උප්පරවැට්ටි ජනතාව දන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -3107/2023- (2), ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා**
(மாண்புமிகு கோவிந்தன் கருணாகரம்)
(The Hon. Govindan Karunakaram)
Sir, I ask the Question on behalf of the Hon. Sivagnanam Shritharan.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
You can ask that Question in the Second Round.

## රජය විසින් පවත්වාගත යුතු සහල් සංචිතය: විස්තර
### அரசாங்கத்தால் பராமரிக்கப்படும் அரிசி கையிருப்பு: விபரம்
### RICE RESERVE MAINTAINED BY GOVERNMENT: DETAILS

3173/2023

**7. ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රජය විසින් වාර්ෂිකව පවත්වාගත යුතු සහල් සංචිතය කොපමණද;

(ii) එම සංචිතය පවත්වාගනු ලබන ආයතනය කවරේද;

(iii) සංචිතය සඳහා සහල් ලබා ගනු ලබන ක්‍රමය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) වර්ෂ 2017 සිට 2021 දක්වා රජය විසින් පවත්වා ගන්නා ලද සහල් සංචිතය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කාලය තුළ එම සහල් සංචිතයෙන් මුදා හරින ලද සහල් ප්‍රමාණය එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත සහල් සංචිතයෙන් සහල්, මුදා හරින ලද ආයතන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) වාර්ෂික අවශ්‍යතාව සඳහා ප්‍රමාණවත් සහල් සංචිතයක් පවත්වා නොගන්නේ නම්, ඊට හේතු කවරේද;

(ii) ප්‍රමාණවත් සහල් සංචිතයක් පවත්වා නොගැනීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකයට සිදු වන බලපෑම කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

வர்த்தக, வாணிப மற்றும் உணவுப் பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்கத்தினால் வருடாந்தம் பேணிச் செல்லப்படவேண்டிய அரிசியின் கையிருப்பு யாதென்பதையும்;

(ii) அக்கையிருப்பைப் பேணிவரும் நிறுவனம் யாதென்பதையும்;

(iii) கையிருப்பைப் பேணுவதற்காக அரிசியைப் பெற்றுக்கொள்ளும் வழிமுறை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 2017ஆம் ஆண்டு முதல் 2021ஆம் ஆண்டு வரை அரசாங்கத்தினால் பேணிவரப்பட்ட அரிசியின் கையிருப்பானது, ஒவ்வொரு வருடத்தின் அடிப்படையில் தனித்தனியே யாதென்பதையும்;

(ii) மேற்குறிப்பிட்ட காலப்பகுதியில் குறித்த அரிசிக் கையிருப்பிலிருந்து விடுவிக்கப்பட்ட அரிசியின் அளவானது ஒவ்வொரு வருடத்தின் அடிப்படையில் தனித்தனியே யாதென்பதையும்;

(iii) மேற்குறிப்பிட்ட அரிசிக் கையிருப்பிலிருந்து எந்தெந்த நிறுவனங்களுக்கு அரிசி விடுவிக்கப்பட்டது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) வருடாந்த தேவைக்குப் போதிய அரிசிக் கையிருப்புப் பேணிச் செல்லப்படவில்லை எனின், அதற்கான காரணங்கள் யாவையென்பதையும்;

(ii) போதியளவு அரிசிக் கையிருப்பைப் பேணிச் செல்லாததன் காரணமாக, இலங்கையின் பொருளாதாரத்திற்கு ஏற்படும் தாக்கம் யாதென்பதையும்;

அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Trade, Commerce and Food Security:

(a) Will he inform this House -

(i) the size of the rice reserve that should be maintained by the Government annually;

(ii) the institutions that maintain the said reserve; and

(iii) the method used to obtain rice for the reserve?

(b) Will he also inform this House -

(i) the size of the rice reserve that had been maintained by the Government from 2017 to 2021, separately for each year;

(ii) the amount of rice released from the reserve during that period, separately for each year; and

(iii) the institutions to which rice was released from the said reserve?

(c) Will he further inform this House -

(i) the reasons for not maintaining a rice reserve sufficient for the annual requirement;

(ii) the impact on the economy of Sri Lanka owing to not maintaining a sufficient rice reserve?

(d) If not, why?

**ගරු නලින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2017 වර්ෂයේ සිට රජය මඟින් සහල් සංචිතයක් පවත්වාගෙන ගොස් නැත.

(ii) උක්ත (අ) (i) අනුව පැන නොනඟී.

(iii) උක්ත (අ) (i) අනුව පැන නොනඟී.

(ආ) (i) උක්ත (අ) (i) අනුව පැන නොනඟී.

(ii) උක්ත (අ) (i) අනුව පැන නොනඟී.

(iii) උක්ත (අ) (i) අනුව පැන නොනඟී.

(ඇ) (i) උක්ත (අ) (i) අනුව පැන නොනඟී.

(ii) වාර්ෂික සහල් අවශ්‍යතාව මෙට්‍රික්ටොන් මිලියන 2.6ක් පමණ වේ. දීර්ඝ කාලයක් තිස්සේ රටට අවශ්‍ය සහල් අවශ්‍යතාවෙන් යම් ප්‍රමාණයක් සංචිතයක් වශයෙන් රජය විසින් පවත්වාගෙන යෑමට නොහැකි වී ඇත. සහල් නිෂ්පාදනය රටේ අවශ්‍යතාවට සරිලන බවට වාර්තා වී තිබුණු අතර සමහර අවස්ථාවල ස්වාභාවික ආපදා හා නොවැළැක්විය හැකි සාධක හේතුවෙන් රටේ අවශ්‍යතාව සපුරා ගැනීමට නොහැකි වී ඇත. මීට අමතරව පසුගිය කාලයේ රසායනික පොහොර අත්හිටුවීම නිසා දේශීය සහල් නිෂ්පාදනය සැලකිය යුතු අඩු වීමක් පෙන්නුම් කර තිබුණි. එම නිසා දේශීය නිෂ්පාදනයෙන් කොටසක් සහල් සංචිතයක් වශයෙන් පවත්වා ගෙන යෑමට 2017 සිට රජයට නොහැකි අවස්ථා උද්ගත විය. රටේ පවතින අවශ්‍යතාව පිරිදී රජය සහල් ආනයනය කිරීමට කටයුතු කර ඇත. මීට අමතරව 2020 ඔක්තෝබර් මස සිට 2021 ජනවාරි මස දක්වා ආරක්ෂිත සහල් තොග පවත්වාගෙන යෑම සඳහා කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව යන මැයෙන් අංක අමප/20/1325/313/009 ලෙස ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2020.09.28 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණය ක්‍රියාවට නංවමින් රුපියල් බිලියන 2.241ක කාරක ප්‍රාග්ධන මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ණය ආවරණ ලිපිය මත ලංකා සතොස සමාගම වෙත මූල්‍ය පහසුකම් ලබා දෙන ලදී. එසේ මූල්‍ය පහසුකම් ලබා දුන්න ද දේශීය වෙළෙඳ පොළේ සහල් සඳහා පනවා තිබූ උපරිම සිල්ලර මිලට වඩා ඉහළ මිල ඉදිරිපත්වීම හේතුවෙන් සහල් මිල දී ගැනීමට නොහැකි විය. ඉන් පසුව රටේ පැවති ආර්ථික අර්බුදය නිසා සහල් සංචිතයක් සඳහා මූල්‍ය පහසුකම් ලබා දී නොමැත.

වී අලෙවි මණ්ඩලය මඟින් ගොවීන්ගෙන් ලබා ගන්නා වී තොගය සංචිතයක් වශයෙන් පවත්වා ගැනීම සුදුසු බවත්, සහල් සංචිතය සහල් වශයෙන් පවත්වාගෙන යනවාට වඩා වී වශයෙන් පවත්වා ගැනීම මඟින් දිගු කාලයක් පවත්වා ගත හැකි බවත් කෘෂිකර්ම අමාත්‍යාංශයට දැනුම් දී තිබේ.

2024 වර්ෂයට අදාළව ජාතික අය වැය මඟින් සහල් මෙට්‍රික් ටොන් 50,000ක සංචිතයක් පවත්වා ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර දෙන ලෙසට මහා භාණ්ඩාගාරය වෙත දැනුම් දී ඇත.

(ඈ) අදාළ නොවේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමා, "සහල් සංචිතය" කියලා තිබෙන එක පොඩි වැරදීමක්. "වී සංචිතය" කියන එක තමයි හරි.

වර්ෂ 2017 ඉඳලා 2021 දක්වා වී සංචිතයක්වත් තබා ගත්තාද? එහෙම නැත්නම් 2021 සිට 2023 දක්වා තිබුණාද? අපේ ගරු කෘෂිකර්ම ඇමතිතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. ගරු කෘෂිකර්ම ඇමතිතුමනි, ඔබතුමාට ඒ ගැන යම් අදහසක් තිබෙනවාද?

**ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Amaraweera - Minister of Agriculture)
ගරු කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා අහන කාරණය සම්බන්ධයෙන් කිව්වොත්, ඇත්තටම වී සංචිතයක් තබා ගැනීම අත්‍යවශ්‍යයි. එතකොට තමයි පෞද්ගලික අංශය වැඩි මිලට විකුණනකොට අපට සහල් මිල පාලනය කර ගන්න පුළුවන් වෙන්නේ. නමුත් අද වෙනකොට අපට එවැනි සංචිතයක් නැහැ. මේ වෙනකොට අපි - වී අලෙවි මණ්ඩලය - යම් මුදල් ප්‍රමාණයක් වෙන් කර ගත්තත්, මුදල් අමාත්‍යාංශයෙන් තමයි ගැනුම් මිල නියම කරලා තිබෙන්නේ. ඒ මිලට ලබා ගන්න පුළුවන් වුණේ ඉතාම සුළු වී ප්‍රමාණයක් පමණයි. එම නිසා අපි ළඟ වී සංචිතයක් නැහැ. අනිවාර්යයෙන්ම සංචිතයක් තබාගත යුතුයි කියන මතයේ මමත් ඉන්නවා. ඒ පිළිබඳව අපි දැන් සාකච්ඡා කරගෙන යනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, මේ කාරණයත් එක්ක එක් අර්බුදයක් පැන නඟිනවා. එක පැත්තකින් කෘෂිකර්ම අමාත්‍යාංශයත් විශ්වාස කරනවා, වී සංචිතයක් තබාගන්න ඕනෑ කියලා. මිල පාලනය කිරීම සම්බන්ධයෙන් කථා කරනකොට වෙළෙඳ ඇමතිතුමාත් කියනවා, සහල් සංචිතයක් තබාගන්න ඕනෑ කියලා. ආණ්ඩුව විධියට ඔවුන් කියනවා, "අපි වී මිලදී ගන්න දිස්ත්‍රික්ක මට්ටමින් මුදල් වෙන් කර තිබෙනවා" කියලා. හැබැයි, අද වෙලා තිබෙන්නේ මොකක්ද? අද අම්පාර, පොළොන්නරුව වගේ ප්‍රදේශවලින් ඉතාම අඩු මිලට -කුණු කොල්ලයට- වී මිලදී ගෙන තිබෙනවා. රුපියල් 85ක් වගේ මිලකට තමයි ගොවීන් තමන්ගේ වී අස්වැන්න විකුණලා තිබුණේ. ඇත්ත වශයෙන්ම වියදම එක්ක බැලුවාම රුපියල් 110ත්, රුපියල් 120ත් අතර ප්‍රමාණයක් තමයි ගොවියාට ලැබෙන්න ඕනෑ මිල විධියට තිබුණේ. නමුත් ඒ මිල ලැබුණේ නැහැ. ඒක නිසා මේක විශාල ප්‍රශ්නයක් බවට පත්වෙලා තිබෙනවා. හේතුව, අද විශාල වී ප්‍රමාණයක් ආනයනය කර තිබෙනවා. මම ගරු වෙළෙඳ ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, කොපමණ මෙට්‍රික් ටොන් ප්‍රමාණයක් පිට රටින් ගෙන්වලා තිබෙනවාද කියලා. මොකද, මේ හේතුව නිසා අද විශාල අර්බුදයක් පැන නැඟිලා තිබෙනවා. ගොවීන්ට සාධාරණ මිලක් නොලැබීම නිසා තවදුරටත් වගා කටයුතු කරන්න බැරි තැනට ඔවුන් තල්ලු වෙලා තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඉක්මනින් ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම මේ කරුණු ටික අහන්න එපායැ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඉක්මන් කරලා අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අහන ගමන් තමයි ඉන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වැල්වටාරම් කියවන්නේ නැතුව ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වැල්වටාරම් නොවෙයි, මම කියපු එක කාරණයක හෝ වැරැද්දක් තිබෙනවාද කියලා ඔබතුමා කියන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ ප්‍රශ්නය කෙළින් අහන්න. අතුරු ප්‍රශ්න දෙකක් අහන්න අවස්ථාව තිබෙනවා නේ. ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දෙවැනි අතුරු ප්‍රශ්නය තමයි මම මේ අහන්නේ.

කෘෂිකර්ම ඇමතිතුමාත් සභාවේ සිටින නිසා කරුණාකරලා මට කියන්න, සහල්වල මිල මේ වාගේ තත්ත්වයකට පත් වෙන්න හේතුව මොකක්ද කියලා. ආණ්ඩුව විධියට ඔබතුමන්ලා ළඟ ඒ සඳහා වැඩ පිළිවෙළක් තිබෙනවාද? ගරු වෙළෙඳ ඇමතිතුමාගෙනුත් මම අහන්න කැමැතියි, මේ රටේ අස්වැන්නත් එක්ක ගිය අවුරුද්දේ සහ මේ අවුරුද්දේ කොපමණ වී මෙට්‍රික් ටොන් ප්‍රමාණයක් ගෙනැත් තිබෙනවාද කියලා.

**ගරු නලින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)
ගරු මන්ත්‍රීතුමනි, අපි අරගෙන ගිය පොහොර ප්‍රතිපත්තිය නිසා මේ රටේ දේශීය කෘෂිකර්මය - විශේෂයෙන්ම වී ගොවිතැන - සම්පූර්ණයෙන්ම කඩා වැටුණු බව අපි කවුරුත් දන්නවා. එම නිසා 2022 අවුරුද්ද සඳහා වී මෙට්‍රික් ටොන් ලක්ෂ හතහමාරකට ආසන්න ප්‍රමාණයක් මේ රටට ආනයනය කර තිබෙනවා. හැබැයි, අපි පසුගිය මහ කන්නය ඉතාම සාර්ථක මහ කන්නයක් බවට පත් කර ගත්තාට පස්සේ මේ අවුරුද්දේ අටවැනි මාසය වෙනකල් එක වී ඇටයක්වත් ආනයනය කළේ නැහැ.

අපට අවශ්‍ය වී ප්‍රමාණය මහ කන්නයෙන් ලැබුණා. නමුත්, මේ යල කන්නයේ දී අපි අස්වැන්න බලාපොරොත්තු වුණත් සමහර අවස්ථාවලදී සමහර ප්‍රදේශවල අස්වැන්නේ අඩුවීමක් තිබුණා, නියඟය සහ වෙනත් නොයෙකුත් හේතු නිසා. හැබැයි, ඒ මොනවා කළත් අපි දැනට,-

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මට රීති ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, රීති ප්‍රශ්නයක් නම් ඒක ඉදිරිපත් කරන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මීට පෙර පැවැති සභා වාරයක දී මම මතු කළ ප්‍රශ්නයකට මුදල් රාජ්‍ය අමාත්‍ය රංජිත් සියඹලාපිටිය මැතිතුමා මේ ගරු සභාවේ දී කිව්වා, "සංචාරකයන්ට වුවමනා කරන සමහර හාල් වර්ග හැර වෙන කිසිම හාල් වර්ගයක් ලංකාවට ගෙන්වූයේ නැහැ" කියලා. ඒ කියන්නේ, අපේ පරිභෝජනයට. දැන් ඔබතුමා ලබා දුන් උත්තරයෙන් කියන්නේ ඒක නොවෙයි. ඔබතුමා පිළිගන්නවා, මේ රටේ මිනිස්සුන්ගේ පරිභෝජනයට හාල් මෙට්‍රික් ටොන් ලක්ෂ අටහමාරක් ගෙනාවා කියලා. *[බාධා කිරීමක්]* හරි, හරි. ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමාගෙන් මම ඇහුවේ, "පසුගිය අවුරුද්දේ සිට මේ දක්වා" කියලා. එතුමා කිව්වේ, "සංචාරකයන්ට විතරයි. මෙහේ පරිභෝජනයට ගෙනාවේ නැහැ" කියලා.

**ගරු නලින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)
ඔබතුමා ඒ උත්තරය හරියට අහගෙන ඉඳලා නැහැ, ගරු මන්ත්‍රීතුමා. ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා කිව්වේ, "සහල් ආනයනය කිරීම නවත්තපු දා ඉඳලා අද වෙනකන් පසුගිය මාස අට තුළ හාල් ඇටයක් ආනයනය කරලා නැහැ" කියලා. විශේෂයෙන්ම බාස්මතී වාගේ හාල්. ඔබතුමාට ඕනෑ නම් මේ සම්බන්ධයෙන් කියා තිබෙන ඒ හැන්සාඩ් වාර්තාව අරගෙන බලන්න. ඔබතුමාට ඒ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒ ගැන ඇහුවොත් අපි ආයෙත් පිළිතුරු ලබා දෙන්නම්. හැබැයි, අපි 2021-2022 අවුරුද්ද සඳහා තමයි 750,000කට ආසන්න මෙට්‍රික් ටොන් ප්‍රමාණයක් ආනයනය කරලා, අවශ්‍යතාව අනුව රටේ ජනතාවට ඒවා ලබා දුන්නේ. හැබැයි, ඔබතුමා කියන විධියට මෙවර යල කන්නයත් එක්ක නැවත හාල් මිල වැඩිවීමක් තිබෙනවා. ඔබතුමා කියපු විධියට, හාල් මිල වැඩිවීමට අනුව ගොවියාට ලබා දුන් වීවලට ඒ සාධාරණය ඉෂ්ට වුණා ද කියන එක ගැන ප්‍රශ්නයක් තිබෙනවා. හැම දාම වෙනවා වාගේ, අඩු මිලට වී අරගෙන වැඩි මිලට හාල් විකුණන තත්ත්වයක් තමයි මේ වන විට තිබෙන්නේ. මොකද, පසුගිය සති දෙකතුනක කාලය තුළ රුපියල් 40කින්, 50කින් හාල් කිලෝ එකක මිල වැඩි වෙලා තිබෙනවා. සහල් සඳහා අනිවාර්යයෙන්ම පාලන මිලක් තිබෙනවා. හැබැයි, ඒ පාලන මිලෙන් එහා ගියොත් අපට එය නවත්වන්න වෙනවා. එහෙම නැත්නම් යම් ප්‍රමාණයක අඩුවීමක්, එහෙම නැත්නම් යම් සංචිතයක් ඕනෑ වුණොත් ඒ සංචිතය වෙළෙඳ පොළෙන් ගන්න බැහැ. හේතුව, එතකොට වෙළෙඳ පොළේ හාල් තවත් අඩු වෙනවා. එහෙම වුණොත් හාල් ආනයනය කරලා යම් සංචිතයක් තබා ගන්න අපි වැඩ පිළිවෙළක් සාකච්ඡා කර තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමා කිව්වා යම් හාල් ප්‍රමාණයක් තිබෙනවා කියලා. මම ඊයේ "Food City" එකකට ගියා, මගේ පෞද්ගලික පාවිච්චියට කිරි සම්බා ටිකක් මිලදී ගන්න. අද

කොළඹ නගරයේ කිසිම තැනක කීරි සම්බා ටිකක් හොයා ගන්න බැහැ. මම වෙළෙඳ සැල් තුන හතරකටම ගිහිල්ලා බැලුවා. කරුණාකරලා වෙළෙඳ ඇමතිතුමා විධියට ඔබතුමාට කියන්න පුළුවන් ද, මේකට හේතුව මොකක්ද කියලා?

**ගරු නලින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு நலின் பர்னாந்து)
(The Hon. Nalin Fernando)

දේශීය කීරි සම්බා කිලෝ එකක් සඳහා රුපියල් 260ක පාලන මිලක් තිබෙනවා. අද වෙද්දී කීරි සම්බා කිලෝ එකක් රුපියල් 280ක්, රුපියල් 285ක් වෙලා තිබෙනවා. ඒ නිසා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය විසින් ඒ අයව වටලන්න කටයුතු කරලා තිබෙනවා.

ඒක තමයි වෙලා තිබෙන්නේ. හැබැයි, මහා පරිමාණයේ මෝල්හිමියන් ළඟ අවශ්‍ය තොග ප්‍රමාණවත් පරිදි විශාල වශයෙන් තිබෙනවා. ඒවා රුපියල් 260ට අඩුවෙන් දෙන්න පුළුවන්. මේ මහා පරිමාණ මෝල්හිමියන් සමහර අවස්ථාවල පාරිභෝගිකයාගෙන් වැඩි මුදලක් ගන්න කටයුතු කරන බව අපි කවුරුත් දන්නවා. මුලදී කිව්වා වාගේ, මේ මුදල වී ගොවියාට ගියා නම් අපට දුකක් නැහැ. ඒක දරා ගන්න පාරිභෝගිකයා කැමතියි. මේ මුදල යන්නේ පාරිභෝගිකයාටවත්, වී නිෂ්පාදකයාටවත් නොවෙයි. ඒ නිසා අපි ඉදිරි සතිය ඇතුළත මේ සම්බන්ධව ක්‍රියාමාර්ග ගන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 8 -3231/2023- (1), ගරු නිරෝෂන් පෙරේරා මහතා. [සභා ගර්භය තුළ නැත.]

ප්‍රශ්න අංක 9 -3527/2023- (1), ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා. [සභා ගර්භය තුළ නැත.]

## ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ අනුබද්ධ ආයතන: 2015-2019 දක්වා බඳවා ගත් සේවකයන්
## தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபை மற்றும் துணை நிறுவனங்கள்: 2015 - 2019 வரையான ஆட்சேர்ப்பு
## NATIONAL HOUSING DEVELOPMENT AUTHORITY AND AFFILIATES: RECRUITMENT FROM 2015-2019

3537/2023

**10.ගරු එම්.ඩබ්ලිව්.ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා**
(மாண்புமிகு எம். டப்ளியு. டீ. சஹன் பிரதீப் விதான)
(The Hon. M. W. D. Sahan Pradeep Withana)

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ජාතික නිවාස සංවර්ධන අධිකාරියට හා එහි අනුබද්ධ ආයතනවලට බඳවාගන්නා ලද සේවකයන් සංඛ්‍යාව එක් එක් තනතුර අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ බඳවා ගන්නා ලද සේවකයන් අවශ්‍ය සුදුසුකම් සපුරා තිබුණේද;

(iii) නොඑසේ නම්, ඔවුන් බඳවාගන්නා ලද පදනම කවරේද;

(iv) එම බඳවාගැනීම් කවර ප්‍රදේශ ආවරණය වන පරිදි සිදුකර තිබුණේද;

(v) එම සේවකයන්ගෙන් අපේක්ෂිත ඉහළ ඵලදායකත්වයක් ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டு தொடக்கம் 2019ஆம் ஆண்டு வரை தேசிய வீடமைப்பு அபிவிருத்தி அதிகார சபை மற்றும் அதனுடன் இணைந்த நிறுவனங் களுக்கு ஆட்சேர்க்கப்பட்ட ஊழியர்களின் எண்ணிக்கையானது ஒவ்வொரு பதவியின் அடிப் படையில் தனித்தனியாக எத்தனை என்பதையும்;

(ii) அவ்வாறு ஆட்சேர்க்கப்பட்ட ஊழியர்கள் தேவை யான தகைமைகளைப் பூர்த்திசெய்திருந்தனரா என்பதையும்;

(iii) இல்லையெனில், அவர்கள் ஆட்சேர்க்கப்பட்ட அடிப்படை யாதென்பதையும்;

(iv) மேற்படி ஆட்சேர்ப்புகள் எப்பிரதேசங்களை உள்ளடக்கும் வகையில் மேற்கொள்ளப்பட்டிருந் தன என்பதையும்;

(v) எதிர்பார்க்கப்பட்ட உயர் உற்பத்தித் திறன் மேற்படி ஊழியர்களிடம் இருந்து பெறப்பட்டுள் ளதா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Urban Development and Housing:

(a) Will he inform this House -

(i) the number of employees recruited to the National Housing Development Authority and its affiliates from 2015 to 2019, separately according to each position;

(ii) whether the employees so recruited met the required qualifications;

(iii) if not, the basis on which they were recruited;

(iv) the areas covered by the said recruitments;

(v) whether the high productivity expected of those employees has been achieved?

(b) If not, why?

**ගරු තේනුක විදානගමගේ මහතා (නාගරික සංවර්ධන හා නිවාස රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தேனுக விதானகமகே - நகர அபிவிருத்தி மற்றும் வீடமைப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Thenuka Vidanagamage - State Minister of Urban Development and Housing)

ගරු කථානායකතුමනි, නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙනවා.

(අ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා අනුබද්ධ ආයතන නොමැති අතර දිවයින පුරා ස්ථාපනය කරන ලද දිස්ත්‍රික් කාර්යාල/නගර කාර්යාල සඳහා 2015, 2016, 2017, 2018, 2019 යන වර්ෂයන්හි

[ගරු තේනුක විදානගමගේ මහතා ]

බඳවාගෙන සේවයට වාර්තා කරන ලද කාර්ය මණ්ඩලය තනතුරු අනුව වෙන් වෙන් වශයෙන් ඇමුණුම් අංක 1, 2, 3, 4, 5 මඟින් ඉදිරිපත් කර ඇත.

අංක 1 සිට 5 දක්වා ඇමුණුම් **සභාගත*** කරමි.

(ii) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත 2015-2019 කාල වකවානුව තුළදී බඳවා ගන්නා ලද ස්ථිර කාර්ය මණ්ඩලය මෙම අධිකාරියට අනුමත බඳවා ගැනීම් පරිපාටියේ පවතින සුදුසුකම් 1979 අංක 17 දරන පනතේ විධිවිධාන අනුව පත්වීම් බලධාරියා වන අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත බඳවාගෙන ඇත. එමෙන්ම මෙම අධිකාරියේ කොන්ත්‍රාත් හා දෛනික කාර්ය මණ්ඩලය සඳහා බඳවා ගැනීම් පරිපාටියක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොමැති අතර කොන්ත්‍රාත් හා දෛනික පදනමින් බඳවාගත් සේවකයන් 1979 අංක 17 දරන පනතේ විධිවිධාන අනුව පත්වීම් බලධාරියා වන අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත බඳවා ගැනීමට කටයුතු කර ඇත.

(iii) අදාළ නොවේ.

(iv) 2015-2019 කාල වකවානුව තුළදී බඳවා ගන්නා ලද කාර්ය මණ්ඩලය ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය හා දිවයින තුළ පවතින දිස්ත්‍රික් කාර්යාල 25ක් හා නගර කාර්යාල 2හි සේවා අවශ්‍යතාව මත එම දිස්ත්‍රික් ආවරණය වන පරිදි පත්වීම් බලධාරියාගේ අනුමැතිය පරිදි බඳවාගෙන අනුයුක්ත කර ඇත.

(v) එම කාලය තුළ බඳවා ගන්නා ලද සේවකයින් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත් අතර, ඔවුන්ගේ කාර්යක්ෂමතාව හා ඵලදායකත්වය සම්බන්ධයෙන් විශ්ලේෂණයක් සිදු කර නොතිබුණි. එසේම වැටුප් වර්ධක ලබා දීමක් හෝ වෙනයම් කාර්යක්ෂමතා ඇගැයීමක් නොකරන ලදී. ඒ අනුව මෙම කරුණ සම්බන්ධයෙන් විශ්ලේෂණාත්මක ලෙස ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොමැති බව කාරුණිකව සඳහන් කරමි.

තවද, ඉහත කී කාල පරිච්ඡේදය තුළ මෙම අධිකාරියේ ස්ථිර සේවයට බඳවා ගන්නා ලද සේවකයින්ගෙන් 43දෙනෙක් මේ වන විට සේවයේ නියුක්තව සිටින අතර ඔවුන්ගේ පෞද්ගලික ලිපි ගොනු පරීක්ෂා කිරීමේදී විෂය, ආයතනයේ දැක්ම පිළිබඳ ක්‍රියාකාරිත්වය දැනීම, නායකත්වය හා වෙනස් වන තත්ත්වයන්ට අනුව සකස් වීමේ හැකියාව යන නිර්ණායක පදනම් කරගනිමින් ඔවුන් අනුයුක්තව සිටින සේවා ස්ථානවල අංශ ප්‍රධානීන් විසින් කාර්යඵල වාර්ෂික ඇගැයීම් කර ඇති අතර, කාර්යඵල සතුටුදායක තත්ත්වයක පැවති හෙයින් වැටුප් වර්ධක හිමිකර දීමට කටයුතු කර ඇති බව නිරීක්ෂණය වේ.

(ආ) අදාළ නොවේ.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු එම්.ඩබ්ලිව්.ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා**
(மாண்புமிகு எம். டப்ளியு. டீ. சஹன் பிரதீப் விதான)
(The Hon. M. W. D. Sahan Pradeep Withana)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මෙම බඳවා ගැනීම් වැඩි වශයෙන් සිදු වී ඇත්තේ දිස්ත්‍රික්ක කීයකද?

**ගරු තේනුක විදානගමගේ මහතා**
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
ගරු කථානායකතුමනි, එවකට මේ විෂය භාර ඇමතිවරයා විධියට කටයුතු කළේ වත්මන් විපක්ෂ නායකතුමා වන සජිත් ප්‍රේමදාස මැතිතුමා. එතුමා නියෝජනය කළ දිස්ත්‍රික්කයෙන් තමයි එම බඳවා ගැනීම් කරලා තිබෙන්නේ. දළ වශයෙන් 2,100ක් පමණ ඒ කාලය තුළදී බඳවා ගෙන තිබෙනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒ දිස්ත්‍රික්කයෙන් විතරක් ද?

**ගරු තේනුක විදානගමගේ මහතා**
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
ඔව්, ඒ දිස්ත්‍රික්කයෙන් විතරක් 2,100දෙනෙක් බඳවා ගෙන තිබෙනවා, 2015-2019 කාලය තුළදී.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒ කියන්නේ, හම්බන්තොටින්?

**ගරු තේනුක විදානගමගේ මහතා**
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
ඔව්. හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් පමණක්.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එහෙම හොඳද?

**ගරු තේනුක විදානගමගේ මහතා**
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
ඒක තමයි තිබෙන ප්‍රශ්නය.

**ගරු එම්.ඩබ්ලිව්.ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා**
(மாண்புமிகு எம். டப்ளியு. டீ. சஹன் பிரதீப் விதான)
(The Hon. M. W. D. Sahan Pradeep Withana)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

කොන්ත්‍රාත් පදනම යටතේ මෙම සේවකයන් බඳවා ගැනීම නීති විරෝධී ද? මේ නීති විරෝධී බඳවා ගැනීම් සම්බන්ධයෙන් ආයතනය ගෙන ඇති පියවර මොනවාද?

**ගරු තේනුක විදානගමගේ මහතා**
(மாண்புமிகு தேனுக விதானகமகே)
(The Hon. Thenuka Vidanagamage)
ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම කොන්ත්‍රාත් පදනම මත මෙම සේවකයන් බඳවා ගැනීම සම්පූර්ණයෙන්ම නීති විරෝධීයි. මොකද, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අනුමත

සේවක සංඛ්‍යාව ඉක්මවා ගිහිල්ලා තමයි මේ බඳවා ගැනීම් කරලා තිබෙන්නේ. ඒ වාගේම අවිච්ඡේද බඳවා ගැනීම් සඳහා වාර්ෂිකව නිවාස සංවර්ධන අධිකාරියෙන් රුපියල් මිලියන 1,537ක අධික පිරිවැයක් දරා තිබෙනවා.

මේ ඇතැම් අය ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කාර්යාලවලට යොමු කළත්, සමහර අයට මේසයක්, පුටුවක් පවා තිබුණේ නැහැ, ගරු කථානායකතුමනි. දිස්ත්‍රික්ක අනුව අපි වාර්තා ගෙන්වා ගත්තාම පෙනෙනවා, මේ බොහෝ අය හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් තමයි සේවයට යොදවා තිබෙන්නේ කියලා. මේ අය කාර්යාලයට වාර්තා කරලා එවකට හිටපු අමාත්‍යතුමාගේ - වත්මන් විපක්ෂ නායකතුමාගේ- කාර්යාලයේ සේවය කරලා තිබෙන බව තමයි වාර්තා වෙන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 3 -2971/2023- (1), ගරු හේෂා විතානගේ මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ගරු කථානායකතුමනි, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 -3107/2023- (2), ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
ගරු කථානායකතුමනි, ගරු සිවඥානම් ශ්‍රීතරන් මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## විදේශ ධීවර යාත්‍රා නීති විරෝධී ලෙස ඇතුළුවීම: වැළැක්වීම
சட்டவிரோதமாகப் பிரவேசிக்கும் வெளிநாட்டு மீன்பிடிப் படகுகள்: தடுத்தல்
ILLEGAL ENTRY OF FOREIGN FISHING VESSELS : PREVENTION

3231/2023

**8. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු නිරෝෂන් පෙරේරා මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு நிரோஷன் பெரேரா சார்பாக)
(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. Niroshan Perera)
ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2023 වර්ෂයේදී ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් අත්අඩංගුවට ගන්නා ලද විදේශීය ධීවර යාත්‍රා සංඛ්‍යාව කොපමණද;
(ii) එම යාත්‍රා ලියාපදිංචි රටවල් කවරේද;
(iii) එහිදී අත්අඩංගුවට ගන්නා ලද පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ මුහුදු සීමාවට නීති විරෝධී ලෙස ධීවර යාත්‍රා ඇතුළුවීම වැළැක්වීම සඳහා අදාළ වන නිර්දේශ ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් රජයට ඉදිරිපත් කර තිබේද;
(ii) එසේ නම්, එම නිර්දේශ කවරේද;
(iii) ඒ අතරින් මේ වන විට ක්‍රියාත්මක නොකරන ලද නිර්දේශ කවරේද;
(iv) එම නිර්දේශ ක්‍රියාත්මක නොකිරීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பாதுகாப்பு அமைச்சரைக் கேட்ட வினா:

( அ) (i) 2023ஆம் ஆண்டு இலங்கைக் கடற்படையின ரால் கைதுசெய்யப்பட்ட வெளிநாட்டு மீன்பிடிப் படகுகளின் எண்ணிக்கை யாதென்பதையும்;
(ii) அப்படகுகள் பதிவுசெய்யப்பட்டுள்ள நாடுகள் யாவையென்பதையும்;
(iii) அதன்போது கைதுசெய்யப்பட்ட நபர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) இலங்கைக் கடற்பரப்புக்குள் சட்டவிரோதமான முறையில் பிரவேசிக்கும் மீன்பிடிப் படகுகளைத் தடுப்பதற்கான பரிந்துரைகள் இலங்கைக் கடற்படையினரால் அரசாங்கத்திடம் சமர்ப்பிக் கப்பட்டுள்ளனவா என்பதையும்;
(ii) ஆமெனில், அப்பரிந்துரைகள் யாவை என்பதை யும்;
(iii) அவற்றில் தற்போது நடைமுறைப்படுத்தப்படா துள்ள பரிந்துரைகள் யாவை என்பதையும்;
(iv) அப்பரிந்துரைகளை நடைமுறைப்படுத்தாமைக் கான காரணங்கள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු ගයන්ත කරුණාතිලක මහතා ]

asked the Minister of Defence:

(a) Will he inform this House -

(i) the number of foreign fishing vessels taken into custody by the Sri Lanka Navy in the year 2023;

(ii) the countries where those vessels have been registered; and

(iii) the number of persons arrested during such incidents?

(b) Will he also inform this House -

(i) whether the Sri Lanka Navy submitted recommendations to the Government to prevent illegal entry of fishing vessels into Sri Lankan waters;

(ii) if so, the aforesaid recommendations;

(iii) the recommendations, among them, which have not been implemented so far; and

(iv) the reasons for not implementing those recommendations?

(c) If not, why?

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, ආරක්ෂක අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

*** සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) විදේශීය ධීවර යාත්‍රා 13කි.

(ii) එම යාත්‍රා ලියාපදිංචි රට වන්නේ ඉන්දියාවයි.

(iii) පුද්ගලයන් ගණන 84යි.

(ආ) (i) ඔව්, නාවික හමුදාවේ නිර්දේශ ආරක්ෂක අමාත්‍යාංශය හරහා අදාළ අනෙකුත් අමාත්‍යාංශ/ආයතන වෙත ඉදිරිපත් කර ඇත.

(ii)
- ඉන්දිය ධීවරයන් ගැඹුරු මුහුදේ ධීවර කටයුතු සඳහා යෙදවීම තුළින් ඔවුන් විසින් ශ්‍රී ලංකා මුහුදු තීරය ආක්‍රමණය කරමින් සිදු කරන මසුන් ඇල්ලීම නැවැත්වීම.
- 2018 අංක 1 දරන ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) (සංශෝධන) පනතේ විධිවිධාන සම්පූර්ණයෙන් බලාත්මක කිරීමත්, එහි අඩුපාඩු ඇත්නම් නව අණ පනත් සැකසීම.
- ඉන්දිය ධීවරයන් ශ්‍රී ලංකා මුහුදු තීරයට ඇතුළු වන දිනයන් හිදී ඉන්දිය වෙරළාරක්ෂක නෞකා ඉන්දිය-ශ්‍රී ලංකා දේශ සීමා ආසන්නයේ දියත් කිරීම.
- නීති විරෝධීව මසුන් ඇල්ලීම සඳහා ශ්‍රී ලංකා මුහුදු සීමාවට ඇතුළු වන ඉන්දිය ධීවර යාත්‍රා අත්අඩංගුවට ගැනීම සහ පවතින ධීවර අණ පනත් අනුවඑම යාත්‍රා රාජසන්තක කිරීම.
- මේ සඳහා සුබවාදී ආකල්පයෙන් යුතු විසඳුමක් ඉන්දියානු බලධාරීන් විසින් ක්‍රියාත්මක කිරීම.

(iii) ඉහත ඉදිරිපත් කරන ලද නිර්දේශ එක් එක් ආයතන/ අමාත්‍යාංශය විසින් වෙන් වෙන්ව තනිව ක්‍රියාත්මක කළ නොහැකි අතර, එකී නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධව කටයුතු කර ඇත්තේ සියලු ආයතන/අමාත්‍යාංශ එක්ව සාමූහික වශයෙනි. එම නිසා නිර්දේශ සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොකළ නිර්දේශ වෙන්කොට දැක්වීමට නොහැක. කෙසේ වුවද එකී නිර්දේශ සම්බන්ධයෙන් මේ වන විට ගෙන ඇති පියවර පහත පරිදි වේ.

1. ඉන්දිය ධීවර යාත්‍රා මගින් ශ්‍රී ලංකා මුහුදු සීමාව තුළ අඛණ්ඩව මසුන් ඇල්ලීම සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග සබැඳිව විදේශ කටයුතු අමාත්‍යාංශය, ධීවර අමාත්‍යාංශය, ශ්‍රී ලංකා නාවික හමුදාව, ශ්‍රී ලංකා පොලීසිය, ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුව, රාජ්‍ය බුද්ධි සේවාව සහ යුද්ධ හමුදා බුද්ධි අධ්‍යක්ෂ මණ්ඩලය යන ආයතන වෙතින් අදහස්/යෝජනා/උපදෙස් ලබා ගෙන ඒ අනුව සකස් කරන ලද විශේෂ වාර්තාව 2022 ජනවාරි මස ජාතික ආරක්ෂක කවුන්සලය වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වගකීම ඒ හා සබැඳි ආයතන වෙත පැවරී ඇත.
2. මෙරට නාවික කටයුතුවලට අදාළ වැදගත් තොරතුරු රැස් කිරීම විශ්ලේෂණය හා හුවමාරු කර ගැනීම සඳහා ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානයෙහි තොරතුරු හුවමාරු මධ්‍යස්ථානයක් -Information Fusion Centre - IFC එකක් - ස්ථාපිත කර ඇත. එමගින් මෙරට මුහුදු සීමාවෙහි නිරීක්ෂණ කටයුතු සිදු කරමින් මුහුදු සීමාව සඳහා තර්ජනයන් විය හැකි ක්‍රියාකාරකම් හඳුනාගෙන එම තොරතුරු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය පාර්ශ්ව වෙත ලබා දීම සිදු කරයි.
3. ශ්‍රී ලංකා මුහුදු තීරයේ අනවසර ධීවර කටයුතුවල යෙදීම හේතුවෙන් අත්අඩංගුවට ගනු ලබන ඉන්දිය ධීවර යාත්‍රා නිදහස් කිරීමේදී ඇතිවන ගැටලුකාරී තත්ත්වයන් සම්බන්ධයෙන් නාවික හමුදා මූලස්ථානය වෙතින් ඉදිරිපත් කර ඇති නිර්දේශ ධීවර අමාත්‍යාංශය වෙත යොමු කර ඇති අතර, ධීවර අමාත්‍යාංශය ඒ පිළිබඳව අධිකරණ අමාත්‍යාංශය සහ අධිකරණ සේවා කොමිෂන් සභාවේ අවධානයට යොමු කර සුදුසු විසඳුම් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර ඇති බව නිරීක්ෂණය වේ.

(iv) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

## රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සතු දැන්වීම් පුවරු: කුලියට දීම
அரச பொறியியல் கூட்டுத்தாபன விளம்பரப் பலகைகள்: வாடகைக்கு விடல்
HOARDINGS OF STATE ENGINEERING CORPORATION: RENTING OUT

3527/2023

**9. ගරු ගයන්ත කරුණාතිලක මහතා (ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා වෙනුවට)**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - மாண்புமிகு உபுல் மஹேந்திர ராஜபக்ஷ சார்பாக)
(The Hon. Gayantha Karunatilleka on behalf of the Hon. Upul Mahendra Rajapaksha)

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව සතු දැන්වීම් පුවරු 2015 වර්ෂයේ සිට කුලී පදනම මත ලබා දී තිබේද;

(ii) එසේ නම්, එම දැන්වීම් පුවරු කුලී පදනම මත ලබා ගෙන ඇති ආයතන කවරේද;

(iii) ඒ වෙනුවෙන් ලැබී ඇති වාර්ෂික ආදායම කොපමණද;

(iv) කුලී පදනම මත එම දැන්වීම් පුවරු ලබා දෙනු ලබන ක්‍රමවේදය කවරේද;

(v) එම දැන්වීම් පුවරු කුලී පදනම මත ලබා දෙනු ලබන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரச பொறியியல் கூட்டுத்தாபனத்திற்குரிய விளம்பரப் பலகைகள் 2015ஆம் ஆண்டு தொடக்கம் வாடகை அடிப்படையில் வழங்கப் பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி விளம்பரப் பலகைகளை வாடகை அடிப்படையில் பெற்றுக்கொண்டுள்ள நிறுவனங்கள் யாவையென்பதையும்;

(iii) அதற்காகக் கிடைத்துள்ள வருடாந்த வருமானம் எவ்வளவு என்பதையும்;

(iv) வாடகை அடிப்படையில் மேற்படி விளம்பரப் பலகைகள் பெற்றுக்கொடுக்கப்படும் முறையியல் யாதென்பதையும்;

(v) மேற்படி விளம்பரப் பலகைகள் வாடகை அடிப்படையில் வழங்கப்படும் காலப்பகுதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance, Economic Stabilization and National Policies:

(a) Will he inform this House -

(i) whether the hoardings owned by the State Engineering Corporation have been rented out since the year 2015;

(ii) if so, the establishments that have acquired such hoardings on rental basis;

(iii) the annual income received from that;

(iv) the methodology according to which such hoardings are rented out; and

(v) the period for which the said hoardings are thus provided on rent payment basis?

(b) If not, why?

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු කථානායකතුමනි, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை:*
** Answer tabled:*

(අ) (i) ඔව්, කුලී පදනම මත ලබා දී තිබේ.

(ii)

| ආයතනයේ නම | ලබා දී ඇති ස්ථානය |
|---|---|
| රිච්ඩ්සන් ආයතනය | මරදාන ගුවන් පාලම |
| එස්.කේ. හෝල්ඩින් ආයතනය | මරදාන ගුවන් පාලම |
| හමර් බී.ටී.එල්. ආයතනය | මරදාන ගුවන් පාලම |
| අවුට් ඔෆ් හෝම් මීඩියා ආයතනය | ප්‍රධාන කාර්යාලය |
| රෝයල් කන්ස්ට්‍රක්ෂන් ආයතනය | මරදාන ගුවන් පාලව |
| | කොටුව ලෝටස් පාර පාලම |
| | පෑලියගොඩ වැඩබිම |

(iii)

| වර්ෂය | වාර්ෂික ආදායම (රුපියල් මිලියන) |
|---|---|
| 2015 | 1.76 |
| 2016 | 1.94 |
| 2017 | 2.14 |
| 2018 | 3.79 |
| 2019 | 1.03 |
| 2020 | 0.47 |
| 2021 | 5.71 |
| 2022 | 6.37 |
| 2023 | 6.20 |

(iv) ටෙන්ඩර් කැඳවීම මඟින්.

(v) වසරකට ගිවිසුම්ගත වේ. ගිවිසුම් දීර්ඝ කිරීමේදී කුලී මුදල වාර්ෂිකව සියයට 10කින් වැඩි කරනු ලැබේ.

(ආ) පැන නොනඟී.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අභිමතය පරිදි දැන් අවස්ථා ගණනාවකදී විවිධ අයට ප්‍රශ්න අහන්න අවස්ථාව ලබා දුන්නා. නමුත්, මම යමක් අහනකොට තමයි ප්‍රශ්න ඇති වෙන්නේ. ඒ නිසා මම අද ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්නයට අමතරව, ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අවසරය පරිදි තවත් ප්‍රශ්න කිහිපයක් මතු කරනවා. ගරු සරත් වීරසේකර මැතිතුමාට ලබා දුන් වරප්‍රසාදයම මටත් ලබා දෙන්න ඕනෑ කියලා මේ අවස්ථාවේදී මම මතක් කරන්න කැමැතියි.

අපේ ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානයට මම මේ අවස්ථාවේ විශේෂයෙන්ම යොමු කරන්නේ මෙන්න මේ

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කාරණයයි. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, වර්තමානයේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට ලැබෙන වැටුපෙන් විශාල කොටසක් බදු ලෙස නැවත අය කර ගන්නවා. විශ්වවිද්‍යාල ආචාර්යවරයෙකුගේ වැටුප් විස්තරය අරගෙන බැලුවාම පේනවා රුපියල් 100,000කට අධික මුදලක් කැපෙන්නේ මේ බදුවලට බව. ගරු කථානායකතුමනි, ඒ කරුණු-කාරණා, තොරතුරු සියල්ලට අදාළ වැටුප් විස්තර දෙකක් මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

මේ නිසා එම ආචාර්යවරුන්ගේ ජීවන රටාවේ දැඩි වෙනසක් ඇති වෙලා තිබෙනවා. ගරු අමාත්‍යතුමනි, මේ බොහෝ දෙනෙක් අද රට අත් හැරලා යනවා. මේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වැටුප දෙස බැලුවාම, ඒ වාගේම ඒ වැටුපෙන් කෙරෙන අඩු කිරීම් දෙස බැලුවාම ඇත්තටම ඔවුන්ගේ අතට ඉතිරි වෙන්නේ සොච්චම් මුදලක් බව අපට පෙනෙනවා. මේ නිසාම විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ආචාර්යවරුන්ගේ බරපතළ හිඟයක් -ඌනතාවක්- ඇතිවෙලා තිබෙනවා. විශේෂයෙන්ම විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ වැඩකටයුතු කරන ආචාර්යවරු, මහාචාර්යවරු, කථිකාචාර්යවරු ඇතුළු ඒ කාර්ය මණ්ඩලයට පනවපු මේ බදු බර නිසා සිදුවන බුද්ධි ගලනය - brain drain එක - වාගේම විශ්වවිද්‍යාලවල ඇති වී තිබෙන මේ ආචාර්යවරුන්ගේ හිඟය පිළිබඳවත් ඔබතුමාගේ පූර්ණ අවධානය යොමු කරන්න. ආචාර්යවරුන්ට ලැබෙන වැටුප්, වේතන, දීමනා සියල්ල පිළිබඳ විස්තර ඇතුළත් ලේඛන දෙකක් මම සභාගත කළා. එම ලේඛන බැලුවාම ඔබතුමාටම තේරුම් යයි, මේ විධියට බදු ගහනකොට ඔවුන්ගේ අතේ ඉතිරි වෙන්නේ කොයි තරම් පොඩි මුදලක්ද කියලා. ඉතින්, අපේ රටෙන් පිට රටට බුද්ධිය ගලනය වෙන එක පුදුමයක් නොවෙයි. ඒ නිසා කරුණාකර මේ වෙනුවෙන් ඔබතුමා ගන්නා ක්‍රියාමාර්ග මේ අවස්ථාවේ ගරු සභාවට හෙළිදරව් කරන්න කියා මම ඉල්ලීමක් කරනවා.

ගරු අමාත්‍යතුමනි, මා හමුවන්න ආවා, රැකියා විරහිත උපාධිධාරීන් පිරිසක්. ඔවුන්ගෙන් අතිමහත් බහුතරයක් කලා උපාධිධාරීන්. මේ වෙනකොට 30,000කට ආසන්න උපාධිධාරීන් පිරිසක් රැකියා විරහිතභාවයෙන් පෙළෙනවා. මම දැක්කා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමා පාර්ලිමේන්තුවේ කමිටුවක් ඉදිරියට ගිහිල්ලා කියනවා, මේ කලා උපාධිධාරීන් බිහිවීම තුළ ඒ අයට රැකියා ලබා දීමේ නිශ්චිත වැඩ පිළිවෙළක් නැහැයි කියන කාරණාව. එතකොට අධ්‍යාපන ක්‍රමයේ අඩුපාඩුවලට මේ තරුණ සම්පත, මේ බුද්ධි සම්පත වග කියන්න ඕනෑද? මොකක්ද, ඒ සඳහා ඔබතුමන්ලා ගන්නා ක්‍රියාමාර්ගය? රැකියා විරහිත උපාධිධාරීන් 30,000ක් ඉන්නවා. ඒ අයගෙන් අතිමහත් බහුතරයක් කලා උපාධිධාරීන්. "ආ, මේ අය කලා උපාධිධාරීන්, මේ අයට රස්සා දෙන්න බැහැ" කියලා ඔවුන් කුණු බක්කියට දානවාද? එහෙම නැත්නම් මේ සඳහා රජය සතුව තිබෙන විකල්ප වැඩ පිළිවෙළ මොකක්ද?

ඒ අය employ කරන්න බැරි නම්, අඩු ගණනේ ඒ අයට පුහුණුවක් ලබා දීලා, ඒ පුහුණුව ලබන කාලයේ යම්කිසි දීමනාවක් ලබා දීලා, skill එකක් ලබා දෙන්න ඕනෑ. එහෙම කරලා හෝ ඔවුන් employable නොකරන්නේ ඇයි? විශ්වවිද්‍යාලයට ඇතුළු වෙනකොට ඒ දරුවන්ට කියන්නේ නැහැ නේ, කලා උපාධිධාරියෙකු වෙනවා නම් ඔබට විරැකියා පෝලිමේ ඉන්න වෙනවා කියලා. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, මේ කාරණාව ඔබතුමාගේ දැඩි අවධානයට යොමු කරනවා. මේ රටේ අධ්‍යාපන ක්‍රමයේ තිබෙන අඩු පාඩුවලට මේ රටේ දරුවන්ට, තරුණ තරුණියන්ට වගකියන්න බැහැ. එම නිසා වහාම අධ්‍යාපන ප්‍රතිසංස්කරණයක් සිදු වෙන්න ඕනෑ. හෙට-අනිද්දා නොවෙයි, අදම එම අධ්‍යාපන ප්‍රතිසංස්කරණය පටන් ගන්න ඕනෑ. විශේෂයෙන්ම STEAM education - Science, Technology, Engineering, Arts and Maths - පැත්තට වාගේම English, environmental sciences, medicine, management sciences, IT and computer science කියන නව තාක්ෂණය පැත්තටත් දරුවෝ යොමු කරන්න ඕනෑ. එහෙම නොකර හැම අවුරුද්දේම කලා උපාධිධාරීන් පිරිසක් විශ්වවිද්‍යාලවලින් පිට වෙනකොට රැකියා විරහිතභාවයට එකතු වීම තුළ ඇත්ත වශයෙන්ම සිදු වෙන්නේ, සමාජය විසින් තරුණ සම්පත සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීමක්. ඒක ඉතාම වැරැදියි. එයට පැහැදිලි හා විධිමත් වැඩ පිළිවෙළක් අවශ්‍යයි. ගරු ඇමතිතුමනි, ඒ ගැනත් මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු විපක්ෂ නායකතුමනි,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පොඩ්ඩක් ඉන්න, ගරු ඇමතිතුමා. මම කථා කරලා ඉවර නැහැ. දැන් ගරු සරත් වීරසේකර මන්ත්‍රීතුමාට අවස්ථාව දුන්නා නේ. ඒ වාගේ මටත් අවස්ථාව දෙන්න. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. "ඔවා දෙනු පරහට - තමා සම්මතෙහි පිහිටා සිට" කියන එක අහලා තිබෙනවා නේ. ගරු ඇමතිතුමනි, පොඩ්ඩක් ඉන්න. මේ මගේ අවසාන point එක.

පාර්ලිමේන්තුවේ කථා කරනවා වැඩියි, ප්‍රශ්න ඉදිරිපත් කරනවා වැඩියි කියලා ජනාධිපතිතුමාට කියලා තිබෙන්නේ මම නොවෙයි නේ. ඔබතුමන්ලාගේ පොහොට්ටු Group එකේ මන්ත්‍රීවරු. හැබැයි, සරත් වීරසේකර මන්ත්‍රීතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න පුළුවන්, අපට කථා කරන්න අවස්ථාව දෙන්න බැහැ. ඒක වැරැදියි; සම්පූර්ණයෙන් වැරැදියි. ගරු කථානායකතුමනි, එක රටක් - එක නීතියක් කියලා නේ කිව්වේ. මම ඔබතුමාට කියන්න කැමැතියි, සරත් වීරසේකර මන්ත්‍රීතුමාට අදාළ වන නීතිය, සජිත් ප්‍රේමදාසටත් අදාළ වෙන්න ඕනෑ බව.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
මම විනාඩියයි ගත්තේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
විනාඩියක් වුණත් අවස්ථාව ගත්තා නේ. ඒක වෙනම කථාවක්. මෙතැන අපි කථා කරනකොට කෑ ගහන්නයි, ඒ අය කථා කරනකොට නිහඬව ඔළුව වන වනා ඉන්නයි, එහෙම දෙවිධියක් කරන්න බැහැ. මෙතැන ඉන්න හැමෝම එකයි. 225දෙනාටම එක වරප්‍රසාදය හිමි වෙන්න ඕනෑ.

ගරු ඇමතිතුමනි, ඊළඟට මම ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, ගුරු උපදේශක සේවාවේ තිබෙන ඌනතා කෙරෙහි. මම ඔබතුමාට අවස්ථා ගණනාවකදී ඒ පිළිබඳව පැහැදිලිවම කියා තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, අද ඔබතුමාත් සමඟ ඒ ගැන සාකච්ඡා කරන

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

නිසා. හැබැයි, සභා ගර්භයේදීත් මම එය මතු කරන හේතුව මෙයයි, ගරු අමාත්‍යතුමනි. මීට පෙර අවස්ථා ගණනාවකදී අපි මේ ගැන කථා කරලාත් තිබෙනවා.

දැන් ගුරු උපදේශක සේවාව ස්ථාපනය කර තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවාද, අනුමත කාර්ය මණ්ඩලය වන 4,471න් 2,300යි ඉන්නේ කියලා? මොකක්ද, අපේ අධ්‍යාපන ක්ෂේත්‍රයට යන කල? ගුරු උපදේශකවරු වෙන්න බොහෝදෙනෙක් කැමති නැහැ, වැටුප් ඌනතාව නිසා; වැටුප් විෂමතාව නිසා. අවස්ථා ගණනාවකදි ගුරු උපදේශකවරුන්ට ගැළපුම් දීමනාවක් දීලා තිබෙනවා. ඒක තාවකාලික පිළියමක් නේ. මේ ගුරු උපදේශකවරුන්ට අභිමානයෙන් තමන්ගේ රාජකාරි කටයුතු කිරීමේ අවස්ථාව ලබා දෙන්න ඕනෑ, ගමන් වියදම් දීමනා ලබා දෙන්නට ඕනෑ. ඒ මොනවත් කෙරෙන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ගුරු උපදේශක සේවාවට ප්‍රවේශ වෙන්න අද කවුරුත් කැමති නැති බව ඔබතුමා දන්නවාද? ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා මේ ගුරු උපදේශක සේවාවේ තිබෙන ගැටලු කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා.

ගරු ඇමතිතුමනි, ස්ථාවර නියෝග 27 (2) යටතේ මගේ ප්‍රශ්නයට දැන් යොමු වෙන්නම්. එතකොට ඔබතුමාට ඔක්කෝටම එකවර උත්තර දෙන්න පුළුවන්.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### 2023 අ.පො.ස. (උසස් පෙළ) විභාගය නොවැම්බර් මාසයේ පැවැත්වීමෙන් සිසුන්ට සිදුවන අසාධාරණය
### 2023 க.பொ.த. (உயர் தர) பரீட்சையை நவம்பரில் நடத்துவதால் மாணவர்களுக்கு ஏற்படும் அநீதி
### INJUSTICE TO STUDENTS BY HOLDING THE 2023 G.C.E. (ADVANCED LEVEL) EXAMINATION IN NOVEMBER

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු කථානායකතුමනි, මෙරට අධ්‍යාපනයේ ප්‍රධානතම කඩඉම් විභාගය අ.පො.ස. (උසස් පෙළ) විභාගයයි. දරුවන් අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටින්නේ බොහෝ අපේක්ෂාවන් සහිතවයි. පසුගිය අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵලත් දැන් නිකුත් වෙලා තිබෙනවා. ඒ ප්‍රතිඵල අනුව අ.පො.ස. උසස් පෙළ විභාගය සමත් වුණු සියලු සිසු දරු දැරියන්ට අපේ ශුභාශිංසන -සුබපැතුම්- මා පිරිනමනවා. මෙවර 2023 වසරේ පැවැත්වීමට නියමිතව ඇති අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටින දරුවන්ට බොහෝ අසාධාරණකම්වලට මුහුණ දෙන්නට සිදු වී තිබෙනවා.

මෙවර අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පළමුවර පෙනී සිටින්නේ 2020 වසරේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට මුහුණ දුන් දූ දරුවන්ය. මෙම දරුවන්ට අ.පො.ස. (උසස් පෙළ) සඳහා පාසල් ආරම්භ කෙරුණේ ද ප්‍රමාදවයි. එමෙන්ම රට තුළ පැවති ආර්ථික අර්බුදය තුළින් ද දැඩි ලෙස පීඩාවට පත් වූයේ මෙම දරුවනුයි. ඉන්ධන අර්බුදය නිසා ඇතැම් කාලවලදී පාසල් වසා තිබුණා. මේ නිසා ද සිදු වුණේ ඔවුන්ගේ අධ්‍යයන කාල සීමාව අඩු වීමයි. ඉහළ උද්ධමනයත් සමඟ, ආර්ථික අර්බුදයත් සමඟ අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය පාසල් පොත්පත්, උපකරණ මිලදී ගැනීමේදී ද මේ දරුවන්ට විවිධ අපහසුතාවන්ට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඉන්ධන අර්බුදය වාගේම විදුලි අර්බුදයත් මේ අධ්‍යාපන ක්‍රියාවලියට හරස් වුණා.

එසේ තිබියදී අධ්‍යාපන බලධාරීන් විසින් සිය පහසුව තකා අ.පො.ස. (උසස් පෙළ) විභාගය නියමිත කාලයට පෙර පැවැත්වීමට තීරණය කිරීම තුළින් දරුවන් බොහෝදෙනා දැඩි පීඩනයකට ලක්ව තිබෙනවා. එබැවින් රජය මෙම දරුවන් පිළිබඳව සානුකම්පිතව සිතා බලා ඔවුන්ගේ අධ්‍යාපන අරමුණු ජයග්‍රහණය කිරීම සඳහා සාධාරණ අවස්ථාවක් ලබා දිය යුතු වෙනවා. එම නිසා මෙය ජාතික වැදගත්කමකින් යුතු ප්‍රශ්නයක් හැටියට සලකා අධ්‍යාපන ඇමතිතුමාට මේ කරුණු කාරණා ඉදිරිපත් කරමින්, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු බලාපොරොත්තු වෙනවා.

01. මේ වසරේ අ.පො.ස. (උසස් පෙළ) විභාගය පැවැත්වෙන කාල වකවානුව කුමක්ද? අපට ආරංචියි, නොවැම්බර් 27 වැනි දා තීන්දු කරලා තිබෙනවාය කියලා. ඒක හරිද? අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටීමට නියමිත පාසල් අයදුම්කරුවන් සහ පෞද්ගලික අයදුම්කරුවන් සංඛ්‍යාව වෙන් වශයෙන් කොපමණද? 2024 මාර්තු මස පැවැත්වීමට නියමිතව තිබූ මෙවර උසස් පෙළ විභාගය ඉදිරියට ගැනීමට රජය තීරණය කළේ මන්ද? ඔබතුමා දන්නවා, ජාතික අධ්‍යාපන ආයතනය විෂය නිර්දේශය නිර්මාණය කරලා තිබෙන්නේ, වසර දෙකහමාරක් තුළ අධ්‍යාපන කටයුතු ක්‍රියාත්මක කරන්නයි. *[බාධා කිරීමක්]* ඔබතුමාගේ අවස්ථාවේදී ඔබතුමා උත්තර දෙන්න. හැබැයි, 2024 මාර්තු අවසන් වෙන්නට තිබෙන විෂය නිර්දේශය සම්පූර්ණයෙන් ආවරණය කරන්නේ නැතුව නොවැම්බර් 27 වැනි දා උසස් පෙළ විභාගය පවත්වන්න තීන්දු කරලා තිබෙනවා. එහෙම කොහොමද කරන්නේ? ඒක සාධාරණද? ඒ නිසා මම අහනවා, උසස් පෙළ විභාගය ඉදිරියට ගැනීමට රජය තීරණය කළේ මන්ද? ආර්ථික අර්බුදය තුළින් පීඩාවට පත් වුවත් කෙසේ හෝ ධෛර්යයෙන් සිය අධ්‍යාපන කටයුතු සිදු කළ දරුවන්ට දැඩි අසාධාරණයක් සිදු නොවන්නේද?

ගරු ඇමතිතුමනි, ඔබතුමා හොඳින්ම දන්නවා, හරි නම් වාර විභාග 6ක් සම්පූර්ණ වෙන්න ඕනෑ, විෂය නිර්දේශය සම්පූර්ණ කරන්න. නමුත් මෙවර වාර විභාග 4යි සම්පූර්ණ වෙන්නේ. එතකොට 6ක් කරන්න ඕනෑ වෙලාවේ වාර විභාග 4ක් කරලා, 2ක් පැත්තක තියලා, නොවැම්බර් 27 වැනි දා උසස් පෙළ විභාගයට මුහුණ දෙන්න කියලා දරුවන්ට කියනවා. ඒක හරිද?

02. ජාතික අධ්‍යාපන ආයතනය විසින් සම්පාදනය කර ඇති උසස් පෙළ විෂය නිර්දේශය ආවරණය කිරීම සඳහා කොපමණ කාලයක් හිමි විය යුතුද? මෙවර උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටින දරුවන්ගේ විෂය නිර්දේශය ආවරණය කිරීමට හිමි වූ කාලය කොපමණද? මේ වන විට පාසල්වල උසස් පෙළ විෂය නිර්දේශය ආවරණය කර තිබේද? නොඑසේ නම්, ඉතිරි මාස කිහිපය තුළදී විෂය නිර්දේශය ආවරණය වන්නේද? එසේ නොමැතිව උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටීමට දරුවන්ට සිදු වීම තුළින් ඔවුන්ට සිදු වන්නේ දැඩි අසාධාරණයක් නොවේද?

03. මෙවර උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටින දරුවන් වෙනුවෙන් කොපමණ වාර විභාග ගණනක් පවත්වා තිබේද? තවත් කොපමණ වාර විභාග සංඛ්‍යාවක් පැවැත්වීමට නියමිතව ඇත්ද? උසස් පෙළ විභාගය පැවැත්වීමට ප්‍රථමයෙන් එම වාර විභාගද පවත්වා අවසන් කිරීමට රජය සැලසුම් කර තිබේද? නොඑසේ නම්, නිසි පරිදි වාර විභාග පවා නොපැවැත්වූ වටපිටාවක දරුවන් සිය ජීවිතයේ කඩඉම් විභාගයක් ලෙස සලකන උසස් පෙළ විභාගය සඳහා හොඳින් සූදානම් වී ඇත්දැයි සිතන්නේ කෙසේද?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ගරු අමාත්‍යතුමනි, දූ දරුවන්ගේ සරසවි සිහිනය -උසස් අධ්‍යාපනය සඳහා වන විශ්වවිද්‍යාල සිහිනය- බොඳ කරන පියවරක් තමයි මේ අරගෙන තිබෙන්නේ. සිසු දූ දරුවන්ගේ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් හැටියට අපි එය දකිනවා. ඒ නිසා තවදුරටත් මේ ගැන හිතලා සිසුන්ගේ පැත්තෙන් යහපත් තීරණයක් ගන්න කියා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

04. දෙවන වර හෝ තෙවන වර අපේක්ෂකයින්ට මෙම වසරේ පැවැත්වෙන උසස් පෙළ විභාගය සඳහා පෙනී සිටීමට අවශ්‍ය අධ්‍යයන කටයුතු සිදු කිරීමට ලැබෙන කාලය ප්‍රමාණවත්ද?

ගරු ඇමතිතුමනි, මා ළඟ තිබෙනවා ලේඛනයක්. මා එය සභාගත කරන්නම්. මෑත කාලයේදී, ප්‍රතිඵල නිකුත් කිරීමත් සමඟ second shy, third shy කරන ශිෂ්‍යයින්ට නැවත විභාගය කිරීම සඳහා සාධාරණ කාල වකවානුවක් ලැබිලා තිබෙනවා. මෙම ලේඛනයේ සඳහන් එම කාල වකවානු මම දැන් කියන්නම්. ප්‍රතිඵල පැමිණීමෙන් පසු විභාගයට තිබුණු කාලය 2010දී දින 244යි; 2011දී දින 224යි; 2012දී දින 187යි; 2013දී දින 228යි; 2014දී දින 220යි; 2015දී දින 211යි; 2016දී දින 210යි; 2017දී දින 211යි; 2018දී දින 219යි; 2019දී දින 289යි; 2020දී දින 279යි; 2021දී දින 147යි.

හැබැයි, ගරු අමාත්‍යතුමනි, ඔබතුමන්ලා මෙදා පාර දීලා තිබෙන්නේ දින 80යි. එතකොට second shy, third shy කරන, stream එක වෙනස් කරන්න තීන්දු ගත්ත දූ දරුවන් දින 80කින් නැවත second shy, third shy කරන්නේ කොහොමද? ගරු කථානායකතුමනි, මේ විස්තරය සම්පූර්ණයෙන් ඇතුළත් ලේඛනය මම **සභාගත*** කරනවා.

මේ නිසා දරුවන් බොහෝ පිරිසක් දැඩි පීඩනයකට ලක්ව ඇති බව ඔබතුමා නොදන්නේද? ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසුව නැවතත් උසස් පෙළ විභාගයට සූදානම් වීම සඳහා අවම වශයෙන් දින 150ක කාලයක් -මාස 5ක කාලයක්- ලබා දිය නොහැකේක්ද? එසේ නම්, ඊට හේතු කවරේද?

ඒ වාගේම විදුහල්පති ශ්‍රේණිධාරින්ගේ සංගමය - Graded Principals' Association - බොහොම පැහැදිලිව ජාතික විභාග පැවැත්වීමේ දින වකවානුවල යෝග්‍යතාව පිළිබඳව ප්‍රකාශයක් නිකුත් කරමින් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ දැන ගැනීම පිණිස මම එම ලිපියත් **සභාගත*** කරනවා.

ඒ වාගේම මම බොහොම කාරුණිකව ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. මම හිතනවා, ඔබතුමා සවන්දෙන ඇමතිවරයෙක් කියලා. ඔබතුමා සවන්දෙන නිසා තමයි අපි ඔබතුමාට ප්‍රශ්න ඉදිරිපත් කරනේන්.

මේ ප්‍රශ්නයටත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න. වාර විභාග හරියට පවත්වන්නේ නැතුව, විෂය නිර්දේශය හරියට ආවරණය කරන්නේ නැතුව අ.පො.ස. (උසස් පෙළ) විභාගය පැවැත්වීම දූ දරුවන්ට මානසිකව බලපානවා. බරපතළ, දැවැන්ත මානසික පීඩනයකට ඒ දූ දරුවන් ලක් වෙලා තිබෙන මොහොතක මම ඉල්ලීමක් කරනවා, ඔවුන්ට සාධාරණය ඉෂ්ට කරන්න කියලා.

---

** * පුස්තකාලයේ තබා ඇත.*

** * நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** * Placed in the Library.*

අනෙක් කාරණය, ඇයි ප්‍රතිඵල නිකුත් කරන්න පරක්කු වුණේ? ඒක දරුවන්ගේ වරදක්ද? ඒක දරුවන්ගේ වරද නොවෙයි. ඒක පරක්කු වුණේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ අකාර්යක්ෂමතාව නිසා; හරියට marking process එක ක්‍රියාත්මක නොවුණු නිසා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔබතුමා දන්නවාද, -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමාගේ වෙලාවේදී උත්තර දෙන්න. දැන් කලබල වෙන්න එපා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මම කලබල වෙන්නේ නැහැ. අකාර්යක්ෂමතාව නිසාය කියන එක මම පිළිගන්නේ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා තරහා ගන්න එපා. කලබල වෙන්න එපා.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
FUTA එකේ strike එක සහ ගුරු සංගම්වල තිබුණු ප්‍රශ්නයයි ඒකට හේතු වුණේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Paper marking කරපු අයගේ ගෙවීම් ප්‍රශ්නය විසඳන්නේ උසස් පෙළ දූ දරුවන් ද? උසස් පෙළට පෙනී සිටි දූ දරුවන් නොවෙයි, markingවලට ගෙවන්නේ.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
නැහැ, නැහැ. ගරු කථානායකතුමනි, -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට අවස්ථාව දෙන්න. ප්‍රශ්න පත්‍ර markingවලට ගෙවන්නේ උසස් පෙළ දූදරුවන්ගේ දෙමව්පියන් නොවෙයි. Paper markingවලට ගෙවන්නේ අධ්‍යාපන අමාත්‍යාංශය.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ ප්‍රශ්නය අහලා අවසාන කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Papers mark කිරීම ප්‍රමාද වූ එකට දූ දරුවන් මොකටද වන්දි ගෙවන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ ප්‍රශ්නය අහලා අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ අයගෙන් නේ පළිගන්නේ. ඒක වැරැදියි. ගරු ඇමතිතුමා ඒකට උත්තරයක් දෙන්න.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණාවත් කියන්න ඕනෑ. ජනාධිපතිවරණයට ඉදිරිපත් වුණු අපේක්ෂකයෙක් මම. ජනාධිපතිවරණයේදී කාදිනල්තුමා ගෝඨාභය රාජපක්ෂ මහත්තයාට ඡන්දය දෙන්න කිව්වාය කියන කාරණාව මේ සභාවේදී කිව්වා. මම කියනවා එහෙම දෙයක් කිව්වා නම් කිව්වේ, අතිඋතුම් වූ කාදිනල්තුමා පමණක් නොවෙයි, කතෝලික ප්‍රජාව ඇතුළු මේ රටේ ජනතාව, රටේ ජාතික ආරක්ෂාව පිළිබඳව ගැටලුවක් තිබුණු නිසා වෙන්න ඇති. ඒ ගැටලුවේදී අපි අසමත් වුණා, ගෝඨාභය සමත් වුණා කියන විශ්වාසය මතයි ඒ පත් කිරීම කළේ කියලා කිව්වේ. හැබැයි, ලජ්ජයි ගරු කථානායකතුමනි. පිට රට investigation එකකින්, පිට රට මාධ්‍යයකින් අපේ රටේ බලධාරීන්ට කියන්න ඕනෑ ද, පාස්කු ඉරුදින ප්‍රහාරයේ මහ මොළකරුවන් හොයන්න, පාස්කු ඉරුදින ප්‍රහාරයට වග කිව යුත්තන් හොයන්න කියලා? ඒකට පිට රටින් අපට උපදෙස් ඕනෑද? මේ රටේ පාලකයන්ට හිතක්, පපුවක් නැද්ද, සත්‍යය හොයන්න; ඇත්ත කථා කරන්න? මම කියනවා, කාදිනල්තුමා මට විරුද්ධව ඡන්දය දෙන්න කිව්වාට කමක් නැහැ කියලා. එහෙම කිව්වා නම් ඒ කිව්වේ හිතේ තිබුණු වේදනාවට. කතෝලික ප්‍රජාවට අදටත් ඒ වේදනාව තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පොඩ්ඩක් ඉන්න. එහෙම නතර කරන්න බැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය අහලා අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. මට අවස්ථාව දෙන්න. මම කියනවා, පාස්කු ඉරුදින ප්‍රහාරයට වගකිව යුතු මහ මොළකරුවන් කවුද කියන එක මේ රටේ පරීක්ෂණයක් හරහා සොයා ගන්න බැහැ කියලා. ඒකට international investigation එකක් අවශ්‍යයි; ජාත්‍යන්තර පරීක්ෂණයක් අවශ්‍යයි. මම කියනවා, කාදිනල්තුමාට අපහාස කරන්න එපා කියලා. To His Eminence Malcolm Cardinal Ranjith, අපහාස කරන්න එපා; කතෝලික ප්‍රජාවට අපහාස කරන්න එපා; කතෝලික ආගමික නායකයන්ට අපහාස කරන්න එපා. ඒ අයගේ හදවතේ වේදනාවක් තිබෙනවා.

ආණ්ඩුවේ මේ ගොල්ලන්ට අවශ්‍ය වෙලා තිබුණේ බලයට එන්න. මේ ගොල්ලන් ඒ සඳහා ඒක පාවිච්චි කළා. එදා පාස්කු ඉරුදින ප්‍රහාරය ගැන කියමින් කිඹුල් කඳුළු හෙළුවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ ප්‍රශ්නය අහලා අවසන් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා ඇතුළු ඒ හැම දෙනාම වේදිකාවක්, වේදිකාවක් පාසා පාස්කු ඉරුදින ප්‍රහාරය ගැන කථා කළේ නැද්ද? ආණ්ඩුවේ ඉන්න මේගොල්ලන් කථා කළේ නැද්ද? ඡන්ද ගත්තේ නැද්ද? ඒ නිසා මම කියන්න කැමැතියි, කාදිනල්තුමාටත්, කතෝලික ප්‍රජාවටත්, කතෝලික රදගුරුතුමන්ලාටත් අපහාස කරන්න එපා කියලා. පාස්කු ඉරුදින ප්‍රහාරය ගැන වහාම ජාත්‍යන්තර පරීක්ෂණයක් අවශ්‍යයි. ඒ ජාත්‍යන්තර පරීක්ෂණය කරන්න මේ රජයට කොන්දක් තිබෙනවාද, නැද්ද කියන එකත් මම අහන්න කැමැතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා උත්තර දෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඇමතිතුමා උත්තර දෙන්නේ නැද්ද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු ඇමතිතුමාගේ අවසරය මත මම මේ ප්‍රශ්නය අහන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මැතිතුමා. ඔබතුමාගේ ප්‍රශ්නයත් ඉක්මනින් අහන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාගේ අවසරය මත ගරු විපක්ෂ නායකතුමා මතු කරපු උසස් පෙළ දරුවන්ගේ ප්‍රශ්නයට අදාළවයි මම මේ ප්‍රශ්නය අහන්නේ. ඒ ප්‍රශ්නය ඉතා සංවේදී ප්‍රශ්නයක්, ගරු කථානායකතුමනි. අපි පක්ෂ - විපක්ෂ භේදයකින් තොරව ඒ දිහා සංවේදීව බැලිය යුතුයි කියන එකයි මගේ අදහස.

විපක්ෂ නායකතුමා කිව්වා වාගේ ඒ දරුවන්ට සැලකිය යුතු අසාධාරණයක් වුණා. මම කියන්නේ නැහැ, ඒ අසාධාරණය එක පැත්තකින් වුණා කියලා. කොවිඩ් වසංගතය වාගේ ස්වභාව ධර්මයෙන් ආපු ප්‍රශ්නත් තිබුණා. රටේ ආර්ථික අර්බුදය විසින් ඇති කරන ලද ප්‍රශ්නත් තිබුණා. ඒ වාගේම වැටුපෙන් උපයන විට බද්දක් අය කිරීම මඟින් විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට ඇති වෙලා තිබෙන අසීරුතාව පිළිබඳ ප්‍රශ්නයත් එක්ක ආරම්භ කරපු වැඩ වර්ජනය තිබුණා. ඒවා නිසා උත්තර පත්‍ර බැලීම ප්‍රමාද වුණා. ඒ සියල්ල අදාළයි මේ අද ඇති වෙලා තිබෙන තත්ත්වයට. මේ තත්ත්වය විසින් අද බැට කන්න වෙලා තිබෙන්නේ, අ.පො.ස. (උසස් පෙළ) විභාගය ලියපු දරුවන්ට. මගේ පැමිණිල්ල ඒකයි.

[ගරු විමල් වීරවංශ මහතා]

2020දී පවත්වන්න තිබුණු අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය 2021 මාර්තු මාසයේදී තමයි පැවැත්වුවේ. එතැන විශාල ප්‍රමාදයක් වෙලා තිබෙනවා. එසේම, ඒ ගොල්ලෝ උසස් පෙළ පන්තියට එනකොට 13 වන ශ්‍රේණියේ හිටපු ළමයි -2021 සිසුන්- උසස් පෙළ විභාගයට පෙනී සිටිය යුතුව තිබුණා. නමුත්, එම විභාගය 2022 පෙබරවාරි 7වන දා සිට මාර්තු 5වන දා දක්වා කල් ගියා. එසේ කල් යෑමට විවිධ හේතු බලපෑවා. ඒ අය තමයි, මෑත කාලීන ඉතිහාසයේ වඩාත්ම දුෂ්කර තත්ත්වයක් යටතේ මේ පරීක්ෂණවලට මුහුණ දුන්නු දරුවෝ.

ගරු කථානායකතුමනි, එම අධ්‍යයන කාලය -අවුරුදු 2- සම්පූර්ණ වෙන්නේ 2024 මාර්තු මාසයේදී. නමුත්, ඒ දරුවන් සඳහා උසස් පෙළ විභාගය 2023 නොවැම්බර් 27 වන දින පවත්වන්න යනවා. ගරු ඇමතිතුමනි, සාමාන්‍යයෙන් syllabus cover කරන්න ජාතික අධ්‍යාපන ආයතනයෙන් අවුරුදු දෙකහමාරක කාලයක් වෙන් කරලා තිබෙනවා. නමුත්, මෙතැනදී මේ අවුරුදු දෙකහමාරක කාලය ඒ දරුවන්ට ලැබෙන්නේ නැහැ. ඒ නිසා තමයි දරුවන් අතිමහත් පීඩනයකට පත් වෙලා තිබෙන්නේ. අනෙක් කාරණය මේකයි. වසර දෙකහමාරක කාලයක් සඳහා හදපු විෂය නිර්දේශය මේ දරුවන් හා ගුරුවරුන් වසරකුත් මාස 10ක් වැනි කෙටි කාලයක් තුළ ඉවර කරන්න ඕනෑ. ඒක අභියෝගයක්. ගුරුවරුන්ගේ පැත්තෙන් බැලුවත් ඒක අභියෝගයක්.

ඒ වාගේම, මෙතැනදී කියැවුණු කරුණුවලට අමතරව විදුලිය කප්පාදුව නිසා මාර්ගගත ක්‍රමයට අධ්‍යාපනය ලැබීමේදී ඒ දරුවන් අසීරුතාවට පත් වුණා, ඉන්ධන අර්බුදය නිසා රටේ ඇති වෙච්ච තත්ත්වයෙන් බැට කෑවා, 2023 වසරේදී උසස් පෙළ විභාගයට පළමුවැනි වරට මුහුණ දෙන සිසුන්ගේ පළමු අධ්‍යයන වර්ෂයෙන් සැලකිය යුතු කාලයක් අඩු වුණා, ආර්ථික අර්බුදයේ බලපෑමට ලක් වුණා, පාසල් උපකරණවල මිල වැඩි වුණා, කඩදාසි හිඟයත් එක්ක සමහරුන්ට පාසල් පොත් පත් හොයා ගන්න නැති වුණා, උපකාරක පන්ති ගාස්තු ඉහළ ගියා, ප්‍රවාහන ගාස්තු ඉහළ ගියා. මේ හැම එකකටම පහළ පන්තියේ දරුවන්, මැද පන්තියේ දරුවන් ඉතා බරපතළ ලෙස මුහුණ දුන්නා.

ගරු අධ්‍යාපන ඇමතිතුමනි, මම මතු කරන කාරණය මෙයයි. මේ හැම සිදුවීමකින්ම ඒ දරුවන්ට විශාල බලපෑමක් සිදු වුණා කියලා විභාග දෙපාර්තමේන්තුවත් පිළිගත්ත නිසා තමයි සියයට 80ට තිබූ අනිවාර්ය පැමිණීම සියයට 40 දක්වා අඩු කළේ. ඒ කියන්නේ තිබුණු වාතාවරණය - crisis - තුළ කලින් ප්‍රමාණයට පැමිණීම බලාපොරොත්තු වෙන්න බැහැ කියලා විභාග දෙපාර්තමේන්තුවත් දන්නවා. ඉතින්, ඒ කාරණය පිළිගන්න නිසාත්, 2022 උසස් පෙළ ප්‍රතිඵල ලබා දීම ප්‍රමාද වෙච්ච නිසාත්, සැප්තැම්බර් මාසයේදී ප්‍රතිඵල නිකුත් වුණාම, නොවැම්බර් මාසය වනකොට, ඒ කියන්නේ මාස 3කින් එම විභාගය repeat කරන්න බැරි නිසාත්, මේ දරුවන් ගැන වැඩි අවධානයක් යොමු කළ යුතුව තිබෙනවා. අපි දන්නවා, සමහර දරුවෝ, දක්ෂ දරුවෝ පාස් වෙයි කියලා බලාගෙන ඉන්නවා කියලා. එක දිස්ත්‍රික්කයකින් 50දෙනෙක් විශ්වවිද්‍යාල සඳහා තෝරන කොට 51වැනියාත් දක්ෂ දරුවෙක් වෙන්න පුළුවන්. ඒ දරුවාට මාස තුනෙන් තමන්ගේ අඩු පාඩුව නිවැරදි කරගන්න පුළුවන් වෙයිද? ඒ විශ්මකර්ම ක්‍රියාව කරන්න ඒ දරුවන්ට හැකියාවක් තියෙයිද?

ගරු අධ්‍යාපන ඇමතිතුමනි, ඔබතුමා මේ කාරණය පිළිබඳව සංවේදියි. අපි දන්නවා, අද වනකොට මේ රටේ තරුණ පරම්පරාව ඉලක්ක කර ගත් radicalization movement එකක් තිබෙනවා කියලා. මුළු සමාජය ගැනම වෛරය වපුරන, මේ සමාජයේ හර පද්ධති ගැන වෛරය වපුරන, වටිනාකම්වලට ගහන, සමාජය පිළිගත් සමස්තය තු තු කරන, හෙළා දකින ඉතා භයානක radicalization එකක් මේ සමාජයේ සිද්ධ වෙනවා. අම්මා, තාත්තා නොසලකන, සමාජයටම වෛර කරන එහෙම radicalization එකක්, රැඩිකල්කරණයක් දරුවන් ඉලක්ක කරගෙන මේ රටේ සිද්ධ වෙනවා. ඒ රැඩිකල්කරණයට ලක් වන දරුවන් තමයි සමහර වෙලාවට මත් ද්‍රව්‍යවලට පවා අවතීර්ණ වෙන්නේ. එම නිසා දරුවන්ගේ මේ අවශ්‍යතාව ගැන සංවේදීව නොබැලුවොත්, "මේ පාර්ලිමේන්තුවේ 225දෙනාම අපේ ප්‍රශ්නය ගැන තැකීමක් කළේ නැහැ" කියලා ඔවුන්ට පෙනුණොත්, ඒක ඉතාම බරපතළයි.

මම ඔබතුමාට පොඩි යෝජනාවක් කරන්න කැමැතියි. මම දන්නේ නැහැ, මේක ප්‍රශස්ත යෝජනාවක් ද කියලා. නමුත්, මම ඔබතුමාට යෝජනාවක් කරන්නම්. අපි ශිෂ්‍යත්ව විභාගයටත් කාලය වෙන් කරලා තිබෙනවා. සාමාන්‍ය පෙළ විභාගයටත් කාලය වෙන් කරලා තිබෙනවා. මම දන්නේ නැහැ, මේ යෝජනාව සුදුසු ද කියලා. සුදුසුයි නම්, දෙසැම්බර් මාසයේ හෝ ජනවාරි මාසයේ මුල මේ විභාග තුනම පවත්වන්න අපට බැරිද? විභාග තුනම එකවර පවත්වන්න. අර නිවාඩුව නැති කරලා, ඒ කියන්නේ ශිෂ්‍යත්වය සහ සාමාන්‍ය පෙළ සඳහා දීමට තිබෙන නිවාඩුව නැති කරලා ඒ විභාග තුනම එකවර පවත්වන්න. මම හිතන විධියට ඒ සඳහා කාර්ය මණ්ඩලය ප්‍රමාණවත්; පාසල්වල ගොඩනැඟිලි ප්‍රමාණය ප්‍රමාණවත්. මේ විභාග තුනම එකට පැවැත්වුවාම, ශිෂ්‍යත්වයට යන්නේ දවසයි, දෙකයි. සාමාන්‍ය පෙළත්, උසස් පෙළත් අවුරුද්ද අන්තිමේ සිට ජනවාරි මාසයේ මුල් භාගය දක්වා කාලය තුළ පවත්වන්න පුළුවන්. මම දන්නවා, ඒ දරුවන්ට නැති වෙච්ච කාලය මුළුමනින්ම දෙන්න බැහැ කියලා. හැබැයි, අපට කරන්න පුළුවන් උපරිමය කළ යුතුයි කියලායි මම කියන්නේ. එම නිසා කාරුණිකව මේ යෝජනාව ගැන සලකා බලන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු නීතිඥ ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு சட்டத்தரணி டபிள்யு.டி.ஜே. செனவிரத்ன)
(The Hon. W.D.J. Seneviratne, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, අද වන විට සබරගමුව විශ්වවිද්‍යාලයේ ඉතාම බරපතළ ප්‍රශ්නයක් පැන නැඟිලා තිබෙනවා. මෙම විශ්වවිද්‍යාලයට සම්බන්ධ වෛද්‍ය පීඨය ආරම්භ කළේ මීට අවුරුදු 5කට පෙර. එයට බඳවා ගත්තේ 2017 වසරේදී උසස් පෙළ සමත් ශිෂ්‍යයන්.

මේ වන කොට ඒ දරුවෝ අවසාන වසරට ප්‍රවේශ වෙලා ඉන්නේ. සැප්තැම්බර් මාසයේ 11වන දා වනකොට - ලබන සතිය වෙද්දී - ඒ දරුවන්ගේ අවසන් වසරේ වැඩ කටයුතු ආරම්භ කළ යුතුව තිබෙනවා. නමුත්, අර්බුද කිහිපයක් මතු වෙලා තිබෙනවා. වෛද්‍ය ශිෂ්‍යයන්ගේ තුන්වන සහ හතරවන වසරවල අධ්‍යාපන කටයුතුවලදී සමාන්තර සායනික විෂයයන් ඉගැන්වීම ඉතාම වැදගත් වෙනවා. එම විෂයයන් ඉගැන්වීමට අවශ්‍ය විද්‍යාගාර පහසුකම්, දේශනශාලා ආදි සෑම දෙයක්ම අඩංගු සබරගමුව වෛද්‍ය පීඨයේ සමාන්තර සායනික ගොඩනැඟිලි සංකීර්ණයෙහි ඉදිකිරීම් කටයුතු 2020 වසරේදී ආරම්භ කළත්, මෙතෙක් ඒ වැඩ කටයුතු අවසන් කර නැහැ. සමාන්තර සායනික ගොඩනැඟිල්ලක් නොමැති වීම දරුවන් සහ විශ්වවිද්‍යාල පරිපාලනය මුහුණ දෙන බරපතළ ගැටලුවක් වෙලා තිබෙනවා.

අනෙක් බරපතළම කාරණාව මෙයයි. සාමාන්‍යයෙන් වෛද්‍ය පීඨයේ අවසන් වසර අධ්‍යයන කටයුතු සිදු කෙරෙන්නේ ඒකක 5කින් සමන්විත මහාචාර්ය ඒකකය තුළයි. එය Sri Lanka Medical Council එක පිළිගත් World Federation for Medical Educationහි accreditation guidelines අනුව ප්‍රමිතිගත වෛද්‍ය අධ්‍යාපනයක් ලබා දීම සඳහා පැවතිය යුතු අනිවාර්යය අංගයක්.

නමුත්, සමාන්තර සායනික ගොඩනැඟිල්ල තවමත් විවෘත කර ගැනීමට නොහැකිව තිබෙන නිසා, ඒ මහාචාර්ය ඒකකය මෙතෙක් ස්ථාපනය වෙලා නැහැ. ඒ නිසා මෙය ඉතා ගැටලු තත්ත්වයක්.

එම දූ දරුවන් වෙනුවෙන් මම ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, පහත සඳහන් ගැටලු දෙක අපට හැකි ඉක්මනින් නිරාකරණය කර දෙන්න කියා. ගරු ඇමතිතුමනි, අවශ්‍ය මුදල් කඩිනමින් ලබා දී සමාන්තර සායනික ගොඩනැඟිල්ලේ වැඩ අවසන් කරලා වෛද්‍ය පීඨය වෙනුවෙන් මහාචාර්ය ඒකකය ස්ථාපනය කර දෙන්න. එය සිදු වන තෙක් අපි එම දරුවන්ට ප්‍රමිතිගත අවසන් වසර අධ්‍යාපනයක් ලබා දෙන්න ඕනෑ. ඒක රජයේ වගකීම. එහෙම නැත්නම් අභියෝගයට ලක් වන්නේ ඒ දරුවන්ගේ අධ්‍යාපනයේ ඇති වැදගත්කම. ඒ නිසා ප්‍රමිතිගත අවසන් වසර අධ්‍යාපනයක් ලබා දීම සඳහා මහාචාර්ය ඒකකයට වෙනත් ප්‍රමිතිගත විකල්ප ක්‍රමයක් භාවිත කරන්න අවශ්‍ය පහසුකම් සලස්වා දෙන්න. එම කරුණු දෙක මම මේ අවස්ථාවේදී ගරු ඇමතිතුමාට ඉදිරිපත් කරනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මට විනාඩියක කාලයක් දෙන්න.

ගරු කථානායකතුමනි, පසුගිය රැස්වීම් සතියේ දවසක වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න වටයේදී අපේ ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමාටත්, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමාටත් දෙවැනි අතුරු ප්‍රශ්නය ඇසීමේ අවස්ථාව මූලාසනයෙන් ලබා දී තිබුණේ නැහැ. ඒ දෙවැනි අතුරු ප්‍රශ්නය ඇසීමට අවස්ථාව ලබා නොදීම ගැන ඒ ගරු මන්ත්‍රීතුමන්ලා දෙපළටම ලොකු දුක් ගැනවිල්ලක් තිබුණා. දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න තිබෙන මොහොතේ එයට උත්තර නොදී ඇමතිවරිය නැඟිටලා යන්න ගියා. මම ඒ කාරණය කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න තිබෙන අවස්ථාව ගරු වසන්ත යාපාබණ්ඩාර මැතිතුමාටත්, ගරු නලින් බණ්ඩාර ජයමහ මැතිතුමාටත් අහිමි කරලා තිබියදී ඔබතුමා ඔබතුමාගේ අභිමතය පරිදි එතුමන්ලාට එදින පාර්ලිමේන්තු සභා ගර්භයේ රැඳී සිටීම තහනම් කළා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, ප්‍රශ්නයට උත්තර නොදී මේ සභා ගර්භයෙන් නැඟිට ගිය ඇමතිවරියට ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද කියලා. මම කියනවා, ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා සහ ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා සම්බන්ධයෙන් ඔබතුමා ගත්තු පියවර වැරැදියි කියලා. වැරැදි පියවරක් ගත්තේ. එතුමන්ලාට පාර්ලිමේන්තු සභා ගර්භයේ රැඳී සිටීම තහනම් කළත්, උත්තර නොදී සභා ගර්භයෙන් නැඟිටලා ගිය ඇමතිවරියට මොනම ක්‍රියා මාර්ගයක්වත් අරගෙන නැහැ. මෙහෙම දෙයාකාරයකින් සැලකිල්ලක් දක්වන්නේ කොහොමද ගරු කථානායකතුමනි?

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, ගරු සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා, ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා සහ ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා සම්බන්ධයෙන් දැන් මතු කළ ප්‍රශ්නයට අදාළවයි මමත් මේ කාරණාව මතු කරන්නේ. මූලාසනය විධියට ඔබතුමා තීන්දුවක් දීලා තිබෙනවා. මූලාසනයට ගරු කරන එක අපේ වගකීම. ඒක වෙනම කාරණාවක්, ගරු කථානායකතුමනි. නමුත්, ඒ සිද්ධියට අදාළවම මුලසුනට ආණ්ඩු පක්ෂයෙනුත් දැඩිව අපහාස එල්ල වුණා, ගරු අගමැතිතුමාගේ ඉඳලාම. එහෙම නම්, පළමුවැනි කාරණය තමයි, එකම සිද්ධියට අදාළව දෙවිධියකට සලකා තිබීම. ගරු වසන්ත යාපාබණ්ඩාර මැතිතුමා නවක මන්ත්‍රීවරයෙක්. මනාප ඡන්ද ලක්ෂයකට වැඩි ප්‍රමාණයක් ලබාගෙන පාර්ලිමේන්තුවට පැමිණි මන්ත්‍රීවරයෙක්. වෘත්තියෙන් නීතිඥයෙකු වන නිසා එතුමා නීතිය පිළිබඳ හොඳ දැනීමක් තිබෙන කෙනෙක්. එතුමා ආවේගශීලී වෙන්නට ඇති. ඒ ඇමතිවරිය උත්තර නොදී පලා යෑමේ සිද්ධිය නවක මන්ත්‍රීවරයෙකු විධියට එතුමාට තේරුම් ගන්න බැහැ; කියවා ගන්න බැහැ. මම හිතනවා, ඒක ඔබතුමා තේරුම් ගනීවි කියලා.

ප්‍රශ්නවලට උත්තර නොදී හිටපු අවස්ථා නම් අපි මේ පාර්ලිමේන්තු ඉතිහාසයේ දැක තිබෙනවා. හැබැයි, මගේ පාර්ලිමේන්තු ජීවිතයේ ප්‍රශ්නයකට උත්තර නොදී පලා යන අවස්ථාවක් දැක්කේ පළමුවන වතාවට. ඒ නිසා මම මේ කාරණය සම්බන්ධයෙන් ඔබතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, ගරු කථානායකතුමනි. මේ ගරු සභාවේ මුලසුන දරන තැනැත්තා යම් තීන්දුවක් ගන්නවා නම්, ඒ තීන්දුව සාධාරණ වෙන්න ඕනෑ. ඒක පළමු කාරණය. ඒක ආණ්ඩුවට හෝ විපක්ෂයට කියා බෙදුණු තීන්දුවක් වෙන්න බැහැ. නමුත්, මේ සිදුවීමේදී අපි ඒ බෙදීම දකිනවා.

දෙවන කාරණය මේකයි. දෙවැනි අතුරු ප්‍රශ්නය ඇසීම මන්ත්‍රීවරයෙකු වන ගරු වසන්ත යාපාබණ්ඩාර මැතිතුමාගේ අයිතිය. එතුමා ඒ අයිතිය පාවිච්චි කරන්න උත්සාහ ගන්න කොට තමයි ගරු ඇමතිතුමිය මඟ හැරලා යන්න හැදුවේ. ඒ නිසා මා ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුවේ නවක මන්ත්‍රීවරුන් විධියට පත් වුණු ගරු මන්ත්‍රීවරුන්ට ඡන්දය දීපු ජනතාව කෙරෙහි ගෞරවය ඇතිව ඒ කාරණා දිහා බලන්න කියලා.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
ගරු කථානායකතුමනි, ගරු විමල් වීරවංශ මැතිතුමා ඉතා පැහැදිලිව කරුණු දක්වමින් කිව්වා, උසස් පෙළ විභාගය කල් දැමිය යුත්තේ ඇයි කියලා. එතුමා ඉතා හොඳින්, ලස්සනට කරුණු දක්වමින් ඒ කාරණය කිව්වා. ඉදිරි උසස් පෙළ විභාගයට පෙනී ඉන්න බලාපොරොත්තු වන ලක්ෂ තුනකට ආසන්න දරුවන් සියලුදෙනා බලාගෙන ඉන්නවා, මේ ගරු මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවේදී මේ කාරණය ගැන ගරු කථානායකතුමාට කියා සාධාරණ විසඳුමක් ලබා දෙයි කියලා. මේ කාරණය ඔවුන්ගේ අනාගත ජීවිතය පිළිබඳ කඩඉම් ප්‍රශ්නයක්. ඒ නිසා මේ සියලු කරුණු සලකා බලා එම විභාගය තව මාස හතරකින්, පහකින් හෝ ලබන අවුරුද්දේ මාර්තු මාසය දක්වා හෝ කල් දමන්න කියා අපි ඔබතුමාගෙන් ඉතා බැගෑපත්ව ඉල්ලා සිටිනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, ඔබතුමාටත් මේ කාරණයටම ද මැදිහත් වෙන්න ඕනෑ?

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම විනාඩි එකහමාරකින්, පුළුවන් වුණොත් ඊටත් වඩා අඩු කාලයකින් අවසන් කරනවා.

ගරු කථානායකතුමනි, ඉදිරි උසස් පෙළ විභාගයට පළමුවන වර, දෙවන වර සහ තුන්වන වර මුහුණ දෙන දරුවන් ඉල්ලන්නේ අමතර කාලයක් නොවෙයි. මා පසු ගිය සති අන්තයේ සෙනසුරාදා සහ ඉරිදා මාතරදී මහජන දින දෙක පවත්වන විටත් ආපු බොහෝ දෙනෙක් - 200කට වැඩි පිරිසක් - ඉදිරි උසස් පෙළ විභාගයට පෙනී සිටින දරුවෝ. ඒ දරුවන් ඉල්ලන්නේ සහන කාලයක් හෝ අමතර කාලයක් හෝ නොවෙයි. මෙතෙක් අවුුරුදු 10ක් තුළ පැවැති උසස් පෙළ විභාග ගෙන බලන්න. ඒ දරුවන් ඉල්ලන්නේ ඒවායේ ප්‍රතිඵල ආපු කාලය සහ ඊළඟ විභාගය පැවැත්වීම අතර නියමිත කාල පරතරයත්, පළමු වරට උසස් පෙළ විභාගයට පෙනී සිටින දරුවන්ට උසස් පෙළ පන්ති පටන් ගන්නා දිනයේ සිට විභාගය පැවැත්වීම දක්වා වන නියමිත කාල පරතරයත් ලබා දෙන්න කියලායි; ඒ සාධාරණ කාලය ලබා දෙන්න කියලායි.

මම දැන් ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාගෙන් කාරණයක් පැහැදිලිව දැනගන්න කැමතියි. ගරු විමල් වීරවංශ මැතිතුමා සහ ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා මීට කලින් අවස්ථාවක කියපු විධියට අනාගතයේදී සාමාන්‍ය පෙළ විභාගය සුපුරුදු පරිදි දෙසැම්බර් මාසයේදී පවත්වන්නත්, උසස් පෙළ විභාගය අගෝස්තු මාසයේදී පවත්වන්නත් රජය බලාපොරොත්තු වෙනවාද? ගරු ඇමතිතුමනි, එහෙම කරන්න රජය බලාපොරොත්තු වෙනවා නම් විභාගය පැවැත්වීම, පිළිතුරු පත්‍ර එකතු කිරීම, පිළිතුරු පත්‍ර පරීක්ෂාව, ප්‍රතිඵල නිකුත් කිරීම හා විශ්වවිද්‍යාලයට බඳවා ගැනීම කියන කාරණා සියල්ලට ක්‍රමික කාල රාමුවක් හදා ගන්න, මේ අවුරුද්දේ ජනවාරි මාසයේ අපි මේ විභාගය පවත්වනවා, ඊළඟට අපි විභාගය පවත්වන දිනය දින 30කින් මෙහාට ගන්නවා කියලා. එහෙම කරමින් ආපස්සට ඇවිත් අවුරුදු දෙකකින් හෝ තුනකින් හෝ අර කියපු කාලවල විභාග පවත්වන්න. එහෙම නැත්නම්, කලින් කියපු දෙවැනි විකල්ප යෝජනාවට යන්නත් පුළුවන්. ඒ තමයි උසස් පෙළ විභාගයත්, සාමාන්‍ය පෙළ විභාගයත් දෙසැම්බර් මාසයේ පැවැත්වීම. මේක අවුරුදු ගණනකට කලිනුත් -අපි උසස් පෙළ කරපු කාලයේදීත්- මතු වෙලා යට ගිය යෝජනාවක්. ශිෂ්‍යත්ව විභාගයත් ඒ කාලයටම පවත්වන්න. එහෙම නැත්නම් ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා කියපු විධියට එක විභාගයක් අත්හැරලා විශ්වවිද්‍යාලයට double batch එකක් ගන්නා විධියේ ක්‍රමයක් හදන්න. හැබැයි, එහි ප්‍රායෝගික ප්‍රශ්න තිබෙනවා. ඔබතුමා දන්නවා, දැන් සෞඛ්‍ය පද්ධතිය පවත්වා ගෙන යන්නේ පෙර සීමාවාසික වෛද්‍යවරුන්ගෙන් බව. එතකොට අවුරුද්දකට වතාවක් repeat batch එකයි, proper batch එකයි කියලා දෙකක් හදන්න ඕනෑ. එහෙම කළේ නැත්නම් සීමාවාසික පුහුණුව ලබන වෛද්‍යවරුන්ගේ ඌනතාවක් අපේ සෞඛ්‍ය අංශය තුළ ඇති වෙනවා. ඒ නිසා උසස් පෙළ විභාගය පැවැත්වීම සහ විශ්වවිද්‍යාලයට බඳවා ගැනීම කියන කාරණා එක් පැත්තකින් සෞඛ්‍ය ක්ෂේත්‍රය සමඟත් බැඳී තිබෙනවා. ගරු ඇමතිතුමනි, එම නිසා මේ සියල්ල සලකා තීරණයක් ගන්න. ඉදිරි උසස් පෙළ විභාගයට මුහුණ දීමට නියමිත දරුවන් ඉල්ලන්නේ කාලයක් තිස්සේ පවත්වාගෙන ආ රටාව බිඳින්න එපා කියලායි. මීට කලින් දවස් 200 ගණනක, 300 ගණනක කාලයක් දීලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඊළඟ උසස් පෙළ විභාගය පවත්වන්නේ නොවැම්බර් මාසයේයි කියන තැනින් මිදිලා ඒ දිනය සාධාරණ කාලයකින් ඉදිරියට ගෙන යන්න. සමහර විට ඔබතුමා අද හදාගෙන ඇවිත් තිබෙන්නේ, "එම විභාගය නොවැම්බර් මාසයේම පවත්වනවා" කියන කොන්ක්‍රීට් උත්තරය නම් මම කියනවා, එහෙම තැනකට යන්න එපා, මේ ප්‍රශ්නයට සාධාරණ විධියට ශාස්ත්‍රානුකූල ක්‍රමයක් හදන්න කියලා. එහෙම කළේ නැත්නම් ලබන අවුරුද්දේත් මේ කාලයට මේ ප්‍රශ්නයම පැන නඟිනවා. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමා අද සකස් කරගෙන ආ උත්තරය කෙසේ වෙතත් අද දෙන උත්තරය ලබන අවුරුද්දේත් මේ වාගේ කාලයක මේ කාරණයටම අදාළව නැඟිටලා කියන්න පුළුවන් විධියේ, ඊළඟට පත් වෙලා එන අධ්‍යාපන ඇමතිවරයාටත් - මොකද, 2025 වන විට මහ මැතිවරණය පවත්වා ඉවරයි නේ - කියන්න පුළුවන් වන විධියේ ශාස්ත්‍රීය උත්තරයක් වෙන්න ඕනෑ. එවැනි ශාස්ත්‍රානුකූල උත්තරයක් හදා ගන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා විනාඩි පහක් ගත්තා.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජී.එල්. පීරිස් මන්ත්‍රීතුමා.

**ගරු (මහාචාර්ය) ජී.එල්. පීරිස් මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஜீ.எல். பீரிஸ்)
(The Hon. (Prof.) G.L. Peiris)
ගරු කථානායකතුමනි, අපේ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය තුළ - පාර්ලිමේන්තු ක්‍රමය තුළ - මන්ත්‍රීවරයෙකුට තිබෙන ඉතා වැදගත් අයිතියක් තමයි ඇමතිවරුන්ගෙන් ප්‍රශ්න ඇසීම. එය පාර්ලිමේන්තුවට බාර වෙලා තිබෙන කර්තව්‍යයෙන් ඉතා වැදගත් කොටස කියලායි මා හිතන්නේ. විධායකය නියෝජනය කරමින් ඇමතිවරු පාර්ලිමේන්තුවට එනවා.

එතකොට උදෑසන අනෙක් කටයුතු ආරම්භ වීමට පෙර ඇමතිවරුන්ගෙන් ප්‍රශ්න ඇසීමට මන්ත්‍රීවරුන්ට සම්පූර්ණ අයිතිය තිබෙනවා. ඉස්සෙල්ලාම ප්‍රශ්නයක් අහනවා. ඇමතිතුමා හෝ ඇමතිතුමිය ඒකට පිළිතුරු දෙනවා. එතකොට ස්ථාවර නියෝග අනුව, ඒ මන්ත්‍රීවරයාට තව අතුරු ප්‍රශ්න දෙකක් ඇසීමට අයිතිය තිබෙනවා. ඇමතිවරු ඒ ප්‍රශ්නවලට උත්තර දීම උද්ධච්ච ලෙස ප්‍රතික්ෂේප කරනවා; උත්තර දෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි, ඒ අවස්ථාවේ සභා ගර්භයෙන් පිට වෙලා යනවා කියන ආකල්පය අනුගමනය කරනවා නම්, සම්පූර්ණ පාර්ලිමේන්තු ක්‍රමය හා සම්ප්‍රදාය එතැනම කඩා වැටෙනවා කියන එක මම ඉතා ගෞරවයෙන් ඔබතුමාට කියනවා. ඊට පස්සේ පාර්ලිමේන්තු ක්‍රමයක් මේ රටේ නැහැ. ගරු කථානායකතුමනි, එම නිසා මම ඔබතුමාට කියන්න කැමැතියි, ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමා හා ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා පාවිච්චි කළේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා ස්ථාවර නියෝග අනුව ඒ මන්ත්‍රීවරුන්ට අයිති වන සහජ වැදගත් අයිතිවාසිකමක් බව. ගරු කථානායකතුමනි, එවන් අවස්ථාවක දී

ඒ මන්ත්‍රීවරුන් සහා ගර්භයෙන් නෙරපා දැමීම කිසිසේත් අනුමත කරන්න බැරි ක්‍රියාමාර්ගයක් කියලා මම හිතනවා. ඒක භයානක පූර්වාදර්ශයක්. එවැනි දෙයක් මීට පස්සේ සිදු නොවේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අධ්‍යාපන ඇමතිතුමා, කලින් ප්‍රශ්නයට උත්තර දීලා ඉවර කරන්න.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා.

**ගරු ඩලස් අලහප්පෙරුම මහතා**
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, ඊයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල ආවා. එම විභාගයට පෙනී සිටි දරුවෝ කොවිඩ් වසංගතය ආරම්භක අවස්ථාවේ දී සාමාන්‍ය පෙළ විභාගයට මුහුණ දීපු දරුවෝ. මම එතකොට ඔබතුමන්ලාගේ ආණ්ඩු පක්ෂය පැත්තේ හිටියේ. ඉතිහාසයේ අපේ රටේ ඉතාම දරුණු පීඩනයකට ලක් වෙච්ච දරුවන් පිරිසක් තමයි එම විභාගයට ඉදිරිපත් වුණේ. ඔබතුමාත් දන්නවා ඇති, දෙලක්ෂ හැටතුන් දහසයි මේ විභාගයට ඉදිරිපත් වුණේ. හැබැයි, තුන්ලක්ෂ විසිදහස් ගණනක් ඉල්ලුම් කරලා තිබුණා. එම විභාගයට ඉල්ලුම් කරපු ප්‍රමාණයෙන් විශාල ප්‍රමාණයක් - සියයට 18කට වැඩි ප්‍රමාණයක් - විභාගයට ආවේ නැහැ. ඒ, එදා තිබුණු පීඩනය නිසායි. වෙන හේතුවක් නිසා නොවෙයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා සංවේදී ඇමතිවරයෙක් නිසායි මම මේක කියන්නේ. පාස්කු ප්‍රහාරයේ ඉඳලාම එක දිගට බාධාවලට මුහුණ දීපු දරුවන් කණ්ඩායමක් මේ ඉන්නේ. ඒ නිසා අපි මෙතැනදී ප්‍රතිපත්ති සම්පාදකයන් විධියට වාගේම පියවරුන් විධියට, මවුවරුන් විධියට ඔවුන් දිහා බලන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, ඔබතුමා ගෙන එන තර්කය අපි එක පැත්තකින් පිළිගන්නවා. ඒ තමයි, කොයි වෙලාවේද මේ කටයුතු ආපහු rerail කරන්නේ කියලා. දැන් Derail වෙච්ච එකක් තිබෙනවා. එතැනදී දරුවන්ගේ මතට බර පැටවෙන්නේ නැති වෙන විධියට කටයුතු කළ යුතුව තිබෙනවා. ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමාත් දන්නවා භාෂා තුනෙන් උසස් පෙළ ප්‍රශ්න පත්‍ර 65ක් තිබෙන බව. භාෂා තුනෙන් සාමාන්‍ය පෙළ ප්‍රශ්න පත්‍ර 55ක් තිබෙනවා. ලෝකයේ එහෙම නැහැ. ඉතා පීඩාවට ලක් වෙච්ච දරුවන් කණ්ඩායමක් මේ ඉන්නේ. ගරු ඇමතිතුමනි, ඒ නිසා පියෙකුගේ මානයෙන් මේ දිහා බලන්න. සහන ඉල්ලන කාලයක් නොවුණත්, යම් සහනයක් දෙන්නට ඔබතුමාට හැකියාව තිබෙනවා කියලා මා විශ්වාස කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමනි, ඉක්මන් කරන්න.

**ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මම විනාඩි දෙකයි ගන්නේ. වැඩිය ගන්නේ නැහැ.

ඇත්තටම එදා සිද්ධියේදී අපි මයික් කැඩුවේ නැහැ. ඒ වාගේම මිරිස් කුඩු ගැහුවේත් නැහැ. ගරු අග්‍රාමාත්‍යතුමා අපි ගරු කරන කෙනෙක්. එතුමා නියෝජ්‍ය කථානායකතුමාට කිව්වා, මේ සභාව පාලනය කරන්න බැරි නම් බැහැලා යන්න කියලා. ගරු කථානායකතුමනි, ඔබතුමා ඒ video recordings බලන්න. ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා කිව්වා, පෙරවරු 10.30න් පස්සේ අපි කිසි කෙනෙකුට උත්තර දෙන්නේ නැහැ කියලා. මූලාසනයට අපි ගරු කරනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාගේ නියෝගය පිළිපදිමින් ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමාත්, මමත්, කිසිදු බාධාවක් නොකර පිටව ගියේ ඒ නිසායි. ගරු කථානායකතුමනි, නමුත් මේ කියන අතුරු ප්‍රශ්න දෙක අහද්දී අපි පාවිච්චි කරපු වචන ප්‍රමාණය හා කාලය, ඊට පෙර කරන ලද ප්‍රශ්න කිරීම්වලදී අමාත්‍යවරුන් හා මන්ත්‍රීවරුන් පාවිච්චි කරපු කාලය සමඟ සංසන්දනය කරලා බලන්න. අපි කිසිසේත්ම වැඩිපුර කාලයක් භාවිත කළේ නැහැ. ගරු කථානායකතුමනි, හුදෙක් අර ගැලරියේ සිටි දරුවෝ පෙන්නලා අපට කරපු ඒ අපහාසය පිළිබඳව හා අමාත්‍යතුමිය උත්තර නොදී පලා යෑම පිළිබඳව විධිමත් කටයුත්තක් කරන්න කියලා මා ඔබතුමාගෙන් ඉල්ලනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, එදා ඒ සිදුවීමට මුහුණ දුන් මන්ත්‍රීවරයකු විධියට මට ඒ අතුරු ප්‍රශ්නය අහන්න අවස්ථාව දුන්නේ ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා. මම අතුරු ප්‍රශ්නය අහන්න වචන පහළොවක්වත් පාවිච්චි කළේ නැහැ. එතැනදී

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මූලාසනයට කියා සිටියා, "සභාව පාලනය කරන්න බැරි නම් බැහැලා යන්න" කියලා. ගරු කථානායකතුමනි, ඒ අවස්ථාවේ මූලාසනයේ හිටියේ ගරු නියෝජ්‍ය කථානායකතුමායි.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*
මේ සභාවේ මූලාසනයට අපහාස කළා කියන්නේ, ඔබතුමාට අපහාස කළා වාගේ තමයි. ඒ වාගේම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
නැහැ, මම නොවෙයි. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, -

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
සමාවෙන්න. සමාවෙන්න, ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමනි. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා කටයුතු කළේත් ඒ ආකාරයට. ගරු නියෝජ්‍ය කථානායකවරයාගේ මුහුණේ තිබුණු ස්වරූපයෙන් ඇත්තටම ඒ අවස්ථාවේ එතුමා ඉතාම අපහසුතාවට පත් වුණු බව අපි දැක්කා. ගරු නියෝජ්‍ය කථානායකතුමා ඒ ආකාරයට අපහසුතාවට පත් වුණු නිසා තමයි අපේ ප්‍රශ්න ඇසීමේ අවස්ථාව නොදුන්නේ.

ගරු කථානායකතුමනි, මීට කලකට පෙර කංචන විජේසේකර මහත්මයා, මනුෂ නානායක්කාර මහත්මයාට මේ සභාවේදී ගහන්න ගිය අවස්ථාව අපට මතකයි. ඒ ගැන පරීක්ෂණයක් පවත්වනවා කියලා ඔබතුමා කිව්වා. නමුත්, සිදු වුණු පරීක්ෂණයක් නැහැ. ඒ වාගේම, මීට කලකට පෙර තිසකුට්ටි ආරච්චි මන්ත්‍රීවරයා අපේ රෝහිණී කවිරත්න මන්ත්‍රීතුමියට අපහාස කළා. ඒ ගැනත් ඔබතුමා පරීක්ෂණයක් කරනවා කිව්වා. ඒ පරීක්ෂණය තිබ්බෙත් නැහැ. හැබැයි, මමත්, වසන්ත යාපාබණ්ඩාර මන්ත්‍රීතුමාත් සම්බන්ධව එදාම පරීක්ෂණය තියලා අප දෙදෙනා මේ සභාවෙන් එළියට දැම්මා. ගරු කථානායකතුමනි, අගමැතිවරයාටත්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයාටත් මේ සභාව මෙහෙයවන්න දෙන්න එපා කියලායි මම කියන්නේ. ආණ්ඩු පක්ෂයටත්, විපක්ෂයටත් දෙපැත්තටම සමානව සලකන මේ සභාවේ ප්‍රධානියා ඔබතුමායි. ඒ නිසා මූලාසනයේ ගෞරවය රැකෙන ආකාරයට ඔබතුමා කටයුතු කරන්න. ගරු නියෝජ්‍ය කථානායකවරයාට සහ ඔබතුමාගේ සභාපති මණ්ඩලයට මූලාසනයේ ගෞරවාන්විතව කටයුතු කරන්න පුළුවන් ආකාරයට මේ මූලාසනයේ ගෞරවය රකින්න කියලා මම ඉතාම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු අජිත් රාජපක්ෂ මහතා (නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා)**
(மாண்புமிகு அஜித் ராஜபக்ஷ - பிரதிச் சபாநாயகரும் குழுக்களின் தவிசாளரும்)
(The Hon. Ajith Rajapakse - Deputy Speaker and Chairman of Committees)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය කථානායකතුමාට මොකක්ද කියන්න තිබෙන්නේ?

**ගරු අජිත් රාජපක්ෂ මහතා**
(மாண்புமிகு அஜித் ராஜபக்ஷ)
(The Hon. Ajith Rajapakse)
ගරු කථානායකතුමනි, මේ කාරණය දිගින් දිගටම ඇදුණු නිසායි මම මේ ගැන කථා කරන්නේ. මේ ප්‍රශ්නය අවසන් වෙලා තිබුණු නිසා ආයෙත් ඒ ගැන කථා කරලා නිකම් කුණු අවුස්සන්න ඕනෑ නැහැ කියලායි මම හිතන්නේ. එදා සභාවේ දී ඇති වෙච්ච සිදුවීම බැලුවොත්, අපේ මන්ත්‍රීතුමන්ලා ප්‍රශ්න කීයක් අහලා තිබෙනවා ද කියලා සොයා බලන්න කියලා මම ඔබතුමාගෙන් බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. අසා තිබෙන්නේ ප්‍රශ්න එකක් ද, දෙකක් ද, තුනක් ද, හතරක් ද කියලා ඒ වාර්තාව බැලුවාම හොඳට පෙනෙයි. මූලාසනය මෙහෙයවූ මම ඒ වෙලාවේ දැකපු දේ තමයි, අපේ සමහර මන්ත්‍රීවරු ප්‍රශ්න හතරක් විතර එකට එකතු කරලා එක ප්‍රශ්නයක් විධියට අහනවා. එතකොට සභාවේ සිටි ඇමතිවරුන්ගෙන් විරෝධයක් ආවා, මේ ප්‍රශ්න ඇසීම පැයකට සීමා කරන්න, නැත්නම් මේ සභාව පාලනය කර ගන්න බැහැ කියලා. ඒ අනුව තමයි මම මූලාසනයේ සිටි නියෝජ්‍ය කථානායකවරයා හැටියට පුළුවන් තරම් කාලය සීමා කරන්න කටයුතු කළේ. නමුත්, ඔබතුමා ගරු මන්ත්‍රීතුමන්ලා දෙදෙනා මේ සභාවෙන් එළියට දමන්න තීන්දුව ගත්තේ, ඔවුන් දෙදෙනා මූලාසනයට ඇවිල්ලා මූලාසනයේ මේසයට අතින් පහරදීලා හැසිරුණු නිසායි. ඒ නිසා එදා ඔබතුමා කියන්න කලින් මම කිව්වා, මේ මන්ත්‍රීවරු දෙදෙනා එළියට දමන්න කියලා. එහෙම කියලා තමයි මම සභාව කල් තියලා ගියේ. නමුත්, එතුමන්ලා කියන සිද්ධියයි, මේ සිද්ධියයි කාරණා දෙකක්. එදා දිනයේ ඒ වීඩියෝ එක ගත්තා නම් පැහැදිලිව පෙනේවි ප්‍රශ්න කීයක් අහලා තිබෙනවා ද, ප්‍රශ්න කීයකට උත්තර දීලා තිබෙනවා ද කියලා. ඒ නිසා ඒ ගැන වෙනම විමසීමක් කරන්න. නමුත්, අගමැතිතුමාත්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් විපක්ෂයේ හැමදෙනාගෙන්ම ඉල්ලුවේ, මේ ගරු සභාවේ කාලය කළමනාකරණය කර ගන්න කියලායි. ඒ වගකීම තමයි මම ඉෂ්ට කළේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමාගෙන් අසා තිබෙන ප්‍රශ්නවලට දැන් උත්තර දෙන්න.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා විසින් මතු කරන ලද මුල් ප්‍රශ්න තුනත්, ස්ථාවර නියෝග 27 (2) යටතේ ඇසූ ප්‍රශ්නයත්, ඊට අදාළව ගරු විමල් වීරවංශ මැතිතුමාත්, ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමාත්, ගරු සරත් වීරසේකර මැතිතුමාත් ඒ ප්‍රශ්නයටම අදාළව මතු කළ ප්‍රශ්න කිහිපයටත් මම එකවර උත්තර දෙන්නම්.

ඊට අමතරව ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මන්ත්‍රීතුමා සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ගැන ඇහුවා. ගරු විපක්ෂ නායකතුමා 27 (2) ප්‍රශ්නයට පෙරාතුව ප්‍රශ්න 3ක් යොමු කළා. එසේ ඉදිරිපත් කරපු එක් ප්‍රශ්නයක් තමයි, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගෙන් බදු අය කිරීම සම්බන්ධ ප්‍රශ්නය. ප්‍රධාන වශයෙන් විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වැටුපට අමතරව academic allowance එකයි, research allowance එකයි කියලා දෙකක් ලැබෙනවා. ඇමතිවරයෙකුගේ මූලික මාසික වැටුප රුපියල් 65,000යි. මන්ත්‍රීවරයකුගේ මූලික මාසික වැටුප රුපියල් 54,000යි. ඒකට fuel allowance, අරවා මේවා ඔක්කෝම එකතුවෙලා තමයි ඉතිරි ටික එන්නේ. හැබැයි, අර දුෂ්කර අවස්ථාවේදී රජය ගත්ත ප්‍රතිපත්තිමය තීන්දුව නිසා පසුගිය වර්ෂයේ අය වැය ඉදිරිපත් කරන අවස්ථාවේ සියයට 36 බදු කාණ්ඩයට අපි ඔක්කෝම අහුවුණා. ඒ වාගේම, වෘත්තිකයිනුත් ඒකට අහුවුණා. විශ්වවිද්‍යාල ආචාර්යවරු ගැන අහපු නිසායි මම මෙය කියන්නේ. වෛද්‍යවරු, විශ්වවිද්‍යාල ආචාර්යවරු, ඉංජිනේරුවන් කියන ඔක්කෝම ඒ සියයට 36 කාණ්ඩයට අහුවුණා. Academic allowance එකයි, research allowance එකයි දෙකම මූලික වැටුපට එකතු කරලා total එක ගන්නකොට,

සියයට 36 කොටසට තමයි මේ සියලුදෙනාම අහුවුණේ. එහි ප්‍රතිඵලයක් හැටියට ඒ මුළු ගාණ එකතුවෙලා එනකොට සියයට 36ක බදු ඒ අයට වැටුණා. ඊළඟට, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ වැටුප ඒ ආකාරයෙන් ලැබීම නිසා පසුගිය කාලය පුරාවටම ඒ සම්බන්ධයෙන් සාකච්ඡා වුණා; විරෝධතා පැවැත්වුණා. මේ සියල්ල සිදු වුණා.

නමුත්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සම්බන්ධයෙන් 2023 වර්ෂයේ ජනවාරි මාසයේ තමයි මම මුලින්ම සාකච්ඡාවක් පැවැත්වුයේ, උසස් පෙළ උත්තර පත්‍ර සමීක්ෂණය ආරම්භ කිරීමට පෙරාතුව. මොකද, ඒ ප්‍රශ්නය මම දැක්කා. එහෙම දැකපු නිසා තමයි ගරු අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2023 ජනවාරි මාසයේදී පළමු සාකච්ඡාව Temple Treesවල පැවැත්වුයේ. ඒ විභාගය අවසන් වුණේ මාර්තු මාසයේ මැද. ඒ අනුව මාර්තු මාසයේ මැද තමයි paper marking පටන් ගන්න තිබුණේ. නමුත්, මම ජනවාරි මාසයේම ඒ සඳහා සාකච්ඡා ආරම්භ කළා. එතැනදී යම් යම් කරුණු අපි නිරාකරණය කරගත්තා. Sabbatical leave අරගෙන විදේශගත වෙනකොට ගෙවන්න වූ ගුවන් ගමන් බලපත්‍ර ගාස්තුව වැනි ප්‍රශ්නත්, තවත් ප්‍රශ්නත් එහිදී අපි විසඳා ගත්තා. හැබැයි, අර tax ප්‍රශ්නය තමයි මූලික වශයෙන් අපට විසඳා ගන්න තිබුණේ. ඒ නිසා තමයි FUTA එකට සිදු වුණේ යම් වෘත්තීය ක්‍රියාමාර්ගයකට යන්න. නමුත්, research allowance සම්බන්ධයෙන් අද වෙනකොට පවතින තත්ත්වය මේකයි. ගරු ජනාධිපතිතුමා එක්ක ඊට පසුව තිබුණු සාකච්ඡාවකදී මේ පිළිබඳව අදාළ නිලධාරින් සහ නීතිපතිතුමාගේ opinion අරගෙන කටයුතු කරන්න ඕනෑ කියන මතයට පැමිණි නිසා, මීට සතියකට පමණ පෙර ඒ පිළිබඳ නීතිපතිතුමාගේ මතය - opinion - දේශීය ආදායම් දෙපාර්තමේන්තුවටත්, භාණ්ඩාගාරයටත් යවන්න පුළුවන්කම ලැබුණා. ඒ අනුව නිලධාරින් විසින් එම වාර්තා සකස් කරලා, මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කරලා ඉදිරි කටයුතු සිදු කරාවි.

ඊළඟට, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ හිඟය - *[බාධා කිරීමක්]* මට ඒක කරන්න බැහැ නේ. මගෙන් කෙරෙන්න ඕනෑ කටයුතු ටික මම කර තිබෙනවා. අවශ්‍ය සාකච්ඡා පවත්වා නීතිපතිතුමාට අදාළ කරුණු යොමු කරලා එතුමාගේ මතය භාණ්ඩාගාරයේ Fiscal Policy Department එකට යවලා, එතැනින් වාර්තාව සකස් කරලා මුදල් අමාත්‍යාංශයට යවලා අවශ්‍ය නිර්දේශය ගන්න ඕනෑ. ඒක ඒ පාර්ශ්වයෙන් කෙරෙන්න ඕනෑ දෙයක්. මගේ පාර්ශ්වයෙන් කෙරෙන්න ඕනෑ කටයුතු ටික මේ වෙනකොට මම කරලා තිබෙනවා. ඒ ගැන FUTA එක හොඳටම දන්නවා.

ගරු විපක්ෂ නායකතුමනි, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ හිඟය ඇති වුණේ මෙහෙමයි. සාමාන්‍යයෙන් තිබුණු හිඟයට අමතරව තවත් පුරප්පාඩු ප්‍රමාණයක් එකතු වුණා, මේ තිබෙන ප්‍රශ්නත් එක්ක. ඒ වාගේම, අවස්ථාව ලැබෙනවා නම් ආචාර්යවරුන් රට හැර යෑමේ ප්‍රවණතාවකුත් ඇති වුණා. මේ වෙනකොට මම ඒකටත් විසඳුමක් ලබා දී තිබෙනවා. ඒ අනුව එම සාකච්ඡාවේදීම තීරණයකට ආවා, 2023 වර්ෂයේ පළමුවැනි මාස හයේදී විශ්‍රාම ගිය, ඉල්ලා අස් වූ සහ සේවය හැර ගිය අය නිසා ඇති වූ පුරප්පාඩු පුරවන්න. මොකද, ඒ සඳහා මුදලුත් තිබෙන නිසා. නමුත්, ගණනය කර බැලුවාම ඒ ප්‍රමාණය විතරක් මදි. ඒ නිසා මම නැවත අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කරලා 2022 වර්ෂයත් ඇතුළත් කරගෙන 2022, 2023 කියන වර්ෂ දෙකේදීම විශ්‍රාම ගිය, රට හැර ගිය සහ ඉල්ලා අස් වූ academicsලා වෙනුවෙන් බඳවා ගැනීම් කිරීමට අනුමැතිය ලබා ගත්තා. රාජ්‍ය විශ්වවිද්‍යාල 17 තුළ 1,054දෙනෙකුගේ පුරප්පාඩු ඇති වෙලා තිබෙනවා. ඒ පිරිසට වැටුප් ගෙවීමට අවශ්‍ය මුදලුත් තිබෙනවා. ඒ නිසා එම පුරප්පාඩු ටික පිරවීම සඳහා UGC එකේ උපදෙස් අනුව අදාළ විශ්වවිද්‍යාල 17 දැන් එම කටයුතු කරගෙන යනවා. එතකොට මුළු සංඛ්‍යාවෙන් සියයට 50කට මඳක් වැඩි පිරිසක් ඊළඟ මාසය, මාස එකහමාර තුළ බඳවා ගන්න පුළුවන්. ඉතිරි ප්‍රමාණය ගණනය කර එවන්න කිව්වා, ඉදිරි අය වැය යෝජනාවට ඇතුළත් කර ඒ පිරිසත් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කිරීමට. මෙන්න මේක තමයි ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළ පළමු ප්‍රශ්නයට මේ අවස්ථාවේදී දෙන්න පුළුවන් පිළිතුර.

රැකියා විරහිත උපාධිධාරින් 30,000ක් ගැනත් එතුමා සඳහන් කළා. රැකියා විරහිත උපාධිධාරින් පිළිබඳව 2018 වර්ෂයේදී මතු වූ තත්ත්වයත් එක්ක අයදුම් පත් කැඳවා 52,000ක් සංවර්ධන නිලධාරින් හැටියට බඳවා ගෙන තිබෙනවා. පෞද්ගලික අංශයේ සේවය කළ අයත් ඒ අවස්ථාවේ රාජ්‍ය සේවයට ආවා. රාජ්‍ය අංශයේ හිටපු සමහර අයත් එතැනට ආවා. ඒ 52,000න් 22,000ක් පාසල්වලට යොමු කර තිබෙනවා, කිසිදු වරණයකින් -තෝරා ගැනීමකින්- තොරව ගුරුවරු හැටියට පුහුණුවීමට.

උදාහරණයක් ගන්න. ගුරු සේවා ව්‍යවස්ථාව අනුව උපාධිධාරින් බඳවා ගැනීමට අයදුම් පත් කැඳෙව්වාටත් පසු, ඒ විභාගය පැවැත්වීමට ඔන්න මෙන්න කියා තිබියදී ඒ කාරණයට අදාළ කරුණු කිහිපයක් මත යම් පිරිසක් අධිකරණයට ගියා. මම ඒ ගැන නැවත කියන්න යන්නේ නැහැ. ඊට පසුව ඇති වූ පුරප්පාඩු තමයි දැන් මේ තිබෙන්නේ. රැකියා විරහිතව සිටි උපාධිධාරින්ගෙන් කොටසක් දැන් සංවර්ධන නිලධාරින් හැටියට ඉන්නවා. ඉන් කොටසක් රාජ්‍ය සේවයේ ඉන්නවා. තව කොටසක් ගුරු වෘත්තිය බලාපොරොත්තුවෙන් ඉන්නවා. මේ 30,000ක පිරිස තමයි දැන් ඉතිරිව සිටින්නේ.

ඊළඟට, කලා උපාධිධාරින් ගැනත් විපක්ෂ නායකතුමා විශේෂ අවධානයක් යොමු කළා. අපි UGC එකත් එක්ක කථා කරලා කලා උපාධිධාරින්ට තොරතුරු තාක්ෂණ විෂය අනිවාර්යයෙන්ම ඉගැන්වීමටත්, ඒ අය තොරතුරු තාක්ෂණය අතින් සන්නද්ධ කිරීමටත් අවශ්‍ය පියවර ගෙන තිබෙනවා. ඒ නිසා තොරතුරු තාක්ෂණය කියන විෂය පිළිබඳ ප්‍රවීණතාවක් ලබා ගත්තාම මම හිතන විදියට කලා උපාධිධාරින් වුණත් රැකියා විරහිතව ඉන්න ඕනෑ නැහැ. මොකද, අද අපේ රටේ software industry එක දිහා බැලුවොත්, ඒ තුළ විශාල සේවක ඌනතාවක් තිබෙන බව පෙනී යනවා.

ඊළඟ එක තමයි, STEAM education. STEM education මුලින්ම පටන් ගත්තේ 2003දී. ඒ, 1999දී ඇමෙරිකාවේ National Science Foundation එක කරපු survey එකක ප්‍රතිඵලයක් හැටියට. STEM - Science, Technology, Engineering and Mathematics - education පෙරදිගට ආවාට පස්සේ දැන් රටවල් 100ක් විතර මේකට "A" අකුරත් එකතු කරලා තිබෙනවා, STEAM - Science, Technology, Engineering, Arts and Mathematics - කියලා. Arts කියන එකෙන් කියැවෙන්නේ සෞන්දර්ය විෂයයන් විතරක් නොවෙයි. ඒකට මානව විද්‍යා විෂයයන්, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව සහ වාණිජ විෂයයන් කියන ඔක්කෝම එකතු කරලා තිබෙනවා. මේක අලුත් දෙයක් නොවෙයි. මේකෙන් කියන්නේ න්‍යායාත්මකව කියන දේ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි මට්ටමට මේ ඉගැන්වීමේ ක්‍රමය වෙනස් කරන්න කියන එකයි.

උදාහරණයක් වශයෙන් කිව්වොත්, වාණිජ විෂයය වෙන්න පුළුවන්, විද්‍යාව විෂයය වෙන්න පුළුවන්, එහි යම් සිද්ධාන්තයක් ඉගැන්වූවාම ඒක වෙනස් වෙන්නේ නැහැ. අදත් නිව්ටන්ගේ තුන්වෙනි නියමය වෙනස් වෙලා නැහැ. ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමනි, මම මතකයෙන් කියන්නම්, නිව්ටන්ගේ තුන්වෙනි නියමයෙන් කියන්නේ සමාන හා ප්‍රතිවිරුද්ධ බලය ගැන. සමාන හා ප්‍රතිවිරුද්ධ බලයට සරල උදාහරණය තමයි, jet

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

එක. එහිදී පහළට යෙදෙන තෙරපීමට සමාන බලයක් උඩට යනවා. ඒක බොහොම සරල සිද්ධාන්තයක්. ඒ, මම සාමාන්‍ය පෙළට සහ උසස් පෙළට භෞතික විද්‍යාව කරනකොට ඉගෙන ගත්තු ඒවා. ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා, එතුමාත් මේවා ගැන දන්නවා. හැබැයි, මේවා ප්‍රායෝගිකව වෙන දේ. දේදුන්නක් පායනකොට මොකක්ද වෙන්නේ? එක පැත්තකින් වහිනවා, අනෙක් පැත්තෙන් හිරු එළිය එනවා. එතකොට වතුර බින්දුවලට වැටෙන ආලෝක කිරණ වර්ණ හතකට කැඩිලා දේදුන්නක් පායනවා. එවැනි දේවල් සඳහා උදාහරණ අපේ පන්ති කාමරවලදී කරලා පෙන්වනවා. ඒවා ප්‍රායෝගිකව පරීක්ෂණාගාරවලදීත් කරනවා.

හැබැයි, අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද තිබෙන්නේ විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක්. අපි, තමුන්නාන්සේලා හැමෝම මේකට වග කියන්න ඕනෑ. අවුරුදු 74ක් තිස්සේ තිබුණු ක්‍රමය වෙනස් කරන්න ඕනෑ කියලා මේ රටේ තරුණයෝ කියන්නේ ඒකයි. නමුත්, මේ වෙනස කරන්න කවුරුවත් ඉදිරිපත් වුණේ නැහැ. කන්නන්ගර මැතිතුමා අධ්‍යාපනයේ කුලුනු තුනක් ගැන කිව්වා. ඒවා තමයි දැනුම, කුසලතා සහ ආකල්ප. දැනුම හොඳයි. දැනුම - knowledge - ඕනෑ තැනකින් දැන් ලබා ගන්න පුළුවන්, ටිකක් ඉහළ පන්තිවලට ගියාම. ආකල්පත් නරකම නැහැ, තවම. කුසලතා -skills- තමයි ප්‍රශ්නය. මේක තමයි හැමෝටම තිබෙන ප්‍රශ්නය. දැන් කලා උපාධිධාරීන් රැකියා විරහිත වෙන්නේ ඇයි? Skill එක තමයි එතැන තිබෙන ප්‍රශ්නය. අනෙක් ඒවායේ skills තිබෙනවා.

එහෙම නැතිව බැහැ නේ. වෛද්‍ය උපාධිය කරලා සීමාවාසිකව හිටියාම නේ, වෛද්‍ය වෘත්තියට යන්නේ. අපි නීති විද්‍යාලයෙන් පිට වුණාට පස්සේ මාස 6ක් apprenticeship කරන්න ඕනෑ. එහෙම කරලා තමයි නීතිඥ වෘත්තියට යන්නේ. ඒ skill එක හදා ගන්න ඕනෑ. හැබැයි, දැන් ඉන් එහාට ගිහින් තිබෙන්නේ. අද පාසලේදීම skills දෙන්න ඕනෑ. ඒ නිසා තමයි, STEM education ඇමෙරිකා එක්සත් ජනපදය 2003දී හඳුන්වා දුන්නේ. අද ඇමෙරිකා එක්සත් ජනපදයේ GDP එකෙන් සියයට 62ක් නිර්මාණය කරන්නේ STEM education හරහා අධ්‍යාපනය ලබපු පිරිස. අපි තවම එතැනට ගියේ නැහැ.

මම විද්‍යා හා තාක්ෂණ විෂයය භාර අමාත්‍යවරයා වශයෙන් ගරු විපක්ෂ නායකතුමාත් එක්කම කැබිනට් මණ්ඩලයේ ඉන්නකොට එදා හිටපු අධ්‍යාපන ඇමතිතුමාට යෝජනා කළා, STEM education හඳුන්වා දෙන්න කියලා. ඒ, 2017දී. ඒක වුණාද? නැහැ. නමුත් මම දැන් ඒක පටන් ගත්තා. මම මීට මාසයකට කලින් පටන් ගත්තා, launching එක. හැබැයි, ඒක විශාල ප්‍රතිසංස්කරණයක් එක්ක ඉස්සරහට යන්න ඕනෑ. ඒ සඳහා තමයි අපි උත්සාහ කරන්නේ. ගරු විපක්ෂ නායකතුමනි, ඔබතුමා ඒ ප්‍රශ්නය ඇසීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. *[බාධා කිරීමක්]* 30,000 පිළිබඳව මට මෙතැනදී අධ්‍යාපන ඇමතිවරයා හැටියට උත්තර දෙන්න බැහැ, ගරු විපක්ෂ නායකතුමනි. ඒ සම්බන්ධයෙන් රජය හැටියට ප්‍රතිපත්තිමය තීන්දුවක් අරගෙන, ඒ අය skills පැත්තට යොමු කරලා, ඒ skills එක්ක රැකියා ලබා දෙන තැනට ගෙනයන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, ගුරු උපදේශක සේවාව ආරම්භ කළේ මීට බොහොම කාලයකට කලින්. පළාත් මට්ටමින් තමයි එය ක්‍රියාත්මක වුණේ. එහි ව්‍යවස්ථාව හඳුන්වා දීලා, සම්මත කරලා තිබෙනවා. ව්‍යවස්ථාව සම්මත කළාට පස්සේ ප්‍රශ්නයක් ආවා. ඒකට හේතුව මොකක්ද? පසුගිය අවුරුද්දේ ගුරුවරුන්ගේ වැටුප් විෂමතාව ඉවත් කිරීමට වැටුප් තල ඉහළට ගේනකොට ගුරු උපදේශක සේවාවේ මෙතෙක් හිටපු ජ්‍යෙෂ්ඨ ගුරුවරුන්ගේ වැටුපේ යම් පරතරයක් ආවා. එතකොට ඒ පරතරය පියවන්න ඕනෑ. ඒකට ගැළපුම් දීමනාවක් දුන්නා. ඒ පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා. ඒක මම පසුගිය කාලයේත් සාකච්ඡා කළා. අදත් අපි සාකච්ඡා කරමු. ඒකට විසඳුමක් දෙන්න අවශ්‍ය අමාත්‍ය මණ්ඩල සන්දේශයත් මම සූදානම් කරලා තිබෙන්නේ. ඒ නිසා එය සම්මත වෙන විට ඔබතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නයටත් පිළිතුරක් ලැබේවි කියලායි මගේ විශ්වාසය.

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මැතිතුමා සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ගැන ප්‍රශ්නයක් ඇහුවා. ගරු මන්ත්‍රීතුමනි, ඒක තමයි කියන්නේ යම් පීඨයක් හෝ විශ්වවිද්‍යාලයක් පටන් ගන්න ඕනෑ සැලැස්මක් ඇතිව කියලා. කෙනෙකුට අදහසක් ආවාම විශ්වවිද්‍යාලයක් පටන් ගන්න කියනවා, පීඨයක් පටන් ගන්න කියනවා. සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය පටන් ගත්තා. හැබැයි, වෛද්‍ය පීඨය පටන් ගන්නකොට ඊට අවශ්‍ය පහසුකම් හදලා තිබුණේ නැහැ.

අවුරුදු තුනක් යනකොට එතැන clinical training පටන් ගන්න ඕනෑ. ඊළඟට එතැනට professorial units එන්න ඕනෑ. එහෙම නේද බුද්ධික පතිරණ මැතිතුමනි? අවුරුදු දෙකකින් පස්සේ අවුරුදු තුනක් වෙනකොට ඒවා එන්න ඕනෑ. ඔවුන්ට ඒවා තිබුණේ නැහැ. ඒ අතරතුර කොවිඩ්-19 ඇවිල්ලා, ඒ වාගේම ආර්ථික ප්‍රශ්නත් ඇවිල්ලා ඒ දේවල් පහු වුණා. නමුත්, විපක්ෂ නායකතුමාගේත් ඉල්ලීමක් මත අපි මීට සති දෙකකට කලින් ඒ පහසුකම් ගැන පාර්ලිමේන්තුවේ කාරක සභා ශාලාවකදී සාකච්ඡා කළා. ඒකට, Faculty එකේ Dean ආවා. ඒ වාගේම අදාළ නිලධාරිනුත් අපි ගෙන්වූවා. ඒ සාකච්ඡාවෙන් පස්සේ එම කටයුතු සම්පාදනය වන බවත්, අදාළ පාර්ශ්වවලට කියලා අවසන් අදියරේ තිබෙන ඒ ගොඩනැඟිලිවල ඉදිකිරීම් කටයුතු ඊළඟ මාසය තුළදී අවසන් කරලා මේ කටයුතු ආරම්භ කරන බවත් දැනුම් දෙන අතර, මම මැදිහත්වෙලා මහා භාණ්ඩාගාරයටත් දැනුම් දීලා අවසාන අත්තිකාරම් ගෙවීම් සඳහා මුදල් යැවීමට අවශ්‍ය කටයුතුත් කරලා තිබෙනවා. ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මන්ත්‍රීතුමනි, එම නිසා ඔබතුමාගේ ප්‍රශ්නයට දැන් විසඳුම් දීලා තිබෙනවා. ඉදිරි මාසය, එකහමාර තුළදී මේ ප්‍රශ්නයේ මූලික කටයුතු ටික අවසන් වෙලා එම වෛද්‍ය ශිෂ්‍යයන්ගේ clinical trainingවලට යන්න සහ ඔවුන්ට අවශ්‍ය පහසුකම් ලබා ගන්න සුදුසු පරිසරය අපි හදලා තිබෙනවා.

ඊළඟට, ස්ථාවර නියෝග 27 (2) යටතේ අහපු ප්‍රශ්නයටත් මම පිළිතුරු දෙන්නම්. ගරු කථානායකතුමනි, ගරු විමල් වීරවංශ මැතිතුමා කිව්වා වාගේ මේ ප්‍රශ්නය මතු වෙන්න හේතු කිහිපයක් තිබුණා. එකක් කොවිඩ්-19 නිසා විභාග කල් යෑම සහ පාසල් ආරම්භ කිරීම කල් යෑම. ඊළඟට, ගුරු වෘත්තීය සමිතිවල වෘත්තීය ක්‍රියාමාර්ග. ඊට පස්සේ ඇති වූ අනෙකුත් වෘත්තීය සමිති ක්‍රියාමාර්ග. ඒ ඔක්කෝම නිසා දැන් මේ තැනට ඇවිල්ලා තිබෙනවා. මේ සංඛ්‍යාලේඛන හා දත්ත ටික ඔබතුමන්ලාගේ දැන ගැනීම සඳහා මම ප්‍රකාශ කරන්නම්. අපි මේවාට සංවේදී නොවී ඉන්නවා නොවෙයි. මම මුලින්ම කියන්න ඕනෑ, මේ සියලු දේ සකස් කිරීමේදී අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කරන්නේ ලක්ෂ 41ක් වන සමස්ත දරුවන් දිහා බලලා බව. වර්ෂයක් තුළ ප්‍රධාන විභාග තුනක් පවත්වන්නට ඕනෑ. එක, පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය. ඊළඟට අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය. ඒ සඳහා දින 10-14 අතර කාලයක් යනවා. ඒ කාලයේදී මුළු දිවයිනේම පාසල් වහන්න වෙනවා. ඊළඟට, විෂයයන් 62ක් සඳහා අ.පො.ස. (උසස් පෙළ) විභාගය පවත්වන්නට ඕනෑ. ඒ සඳහා වැඩ කරන දින 20ක් යනවා. විභාගයට timetables හදනකොට පෝය සහ ඉරිදා දින අතහරින්න ඕනෑ. එතකොට, අ.පො.ස. (උසස් පෙළ) විභාගය පවත්වන්න මාසයක් යනවා.

ඊළඟට, විභාග දෙපාර්තමේන්තුවට විභාග දෙකක් අතර පරතරය අඩුම තරමින් මාස තුනක්වත් අවශ්‍යයි. මොකද,

අයදුම්පත් කැඳවීම, ඒවා process කිරීම කරන්න ඕනෑ. Papers ටික නම් කලින් හදාගන්නවා කියමුකෝ. ඊට පස්සේ marking schemes හදන්නත් ඕනෑ. උසස් පෙළ විභාගය කලින් සකස් කරගෙන තිබුණාට, ප්‍රශ්න පත්‍රයට පිළිතුරු දුන් පසුව sample එකක් test කරලා තමයි හැම paper එකක් සඳහාම සිටින Chief Controllers of Examination, paper settersලා marking scheme එක finalize කරන්නේ. එම නිසා A/L Exam එක පවත්වනකල් marking scheme එක finalize කරන්න බැහැ. ඒ වාගේ ඉතාම දුෂ්කර, වෙහෙසකර කාර්යයක තමයි විභාග දෙපාර්තමේන්තුව යෙදිලා ඉන්නේ. පසුබිම් කාරණා හැටියටයි මම මේ කරුණු ටික කියන්නේ.

ඒ වාගේම මීට ප්‍රස්තුත කාරණයත් මම සඳහන් කරන්නට ඕනෑ. මෙවර උසස් පෙළ විභාගයට පෙනී සිටින දරුවන් 2021 මාර්තු 01වැනි දින සිට මාර්තු 10වැනි දා දක්වා පැවැත්වූ සාමාන්‍ය පෙළ විභාගයට තමයි පෙනී සිටියේ. එම විභාගයේ ප්‍රතිඵල දීලා තිබෙන්නේ 2021 සැප්තැම්බර් මාසයේ 23වැනි දා. ඒ කාලයේ හිටපු අධ්‍යාපන ඇමතිතුමා දැන් මේ සභාවේ ඉන්නවා. ගරු මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා තමයි එතකොට අධ්‍යාපන වාගේම උසස් අධ්‍යාපන ඇමතිවරයා වශයෙනුත් කටයුතු කළේ. විභාගය අවසන් වුණේ මාර්තු 10වැනි දා, ප්‍රතිඵල දීලා තිබෙන්නේ සැප්තැම්බර් 23වැනි දා. සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල දෙන්නම මාස 6ක් ගිහිල්ලා තිබෙනවා. ඒ, මම ඇමතිවරයා වශයෙන් ඉන්නකොට නොවෙයි. හිටපු ඇමතිතුමා දැන් මේ සභාවේ ඉන්නවා. එතුමා සාක්ෂි දරයි. ඒකට හේතු තිබුණා නේ. විමල් වීරවංශ මන්ත්‍රීතුමා කිව්වා, කොවිඩ් තිබුණා, අරගළ තිබුණා, ඒ එක්කෝම තිබුණා කියලා. විපක්ෂ නායකතුමනි, සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල නිකුත් කරන්න විතරක් මාස 6ක් ගිහිල්ලා තිබෙනවා. ඒ දරුවෝ තමයි මේ. මේ දරුවෝ ඒ වෙලාවේත් මාස 6ක් බලාගෙන ඉඳලා තිබෙනවා, සාමාන්‍ය පෙළ ප්‍රතිඵල එනකල්. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ, ඒක ගැන මම පසුව කියන්නම්. මම එතැනට එන්නම්. එතකොට, ප්‍රතිඵල දුන් දිනය සැප්තැම්බර් 23 කියලා ගත්තොත්,- අපි ඒ දිනය සැප්තැම්බර් 30 කියලා කියමුකෝ. ඒ දරුවන් ඊට කලින් උසස් පෙළ විභාගය සඳහා සූදානම් වෙනවා. සාමාන්‍ය පෙළ විභාගය ලියපු ගමන් ඒ ළමයි උසස් පෙළ විභාගයට සූදානම් වෙනවා, බල-බලා ඉන්නේ නැහැ. අපි ඒකත් අතහැරලා ගනිමුකෝ. සැප්තැම්බර් 23වන දා ප්‍රතිඵල දුන්නා, සැප්තැම්බර් 30වන දා ඉඳලා නොවැම්බර් මාසයේ 27වන දා දක්වා තමයි දැනට අපි යෝජනා කරලා තිබෙන්නේ. එතැන ඉඳලා දින හතක් මෙහාට දාලා අපි නොවැම්බර් 20 කියලා ගත්තොත්, ඒ මුළු කාලය අවුරුදු දෙකයි මාසයයි දින 10ක් වෙනවා. ඒ වාගේම මේ දරුවන් සඳහා පාසල් දින 343ක් පවත්වා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ දින 343 ගණනය කිරීමේ දී පාසල් වාර ගණන ගැනත් සඳහන් වුණා. සාමාන්‍යයෙන් වාර හයක් තිබෙන්න ඕනෑ. එතකොට වාර විභාග හයක් තිබෙනවා. නමුත්, මේ වාර හය කලින් තිබුණා වාගේ -කොවිඩ් වසංගතයට කලින් තිබුණා වාගේ- හරියටම ජනවාරි පළමුවැනි දා හෝ දෙවැනි දා ඉඳන් මාර්තු හෝ අප්‍රේල් මුල වෙනකල්, අප්‍රේල් තුන්වන සතියෙන් පටන් අරගෙන අගෝස්තු වෙනකල් තිබුණේ නැහැ. ඒ විධියට පාසල් වාර තුනක් නොවෙයි තිබුණේ. හේතුව, එහෙම වාර පවත්වන්න පුළුවන්කමක් තිබුණේ නැහැ, පාසල් වසා තැබීමයි, වරින් වර නිවාඩු දෙන්නයි වූ නිසා. ඒ නිසා අගෝස්තු මාසයේ නිවාඩුව හැකිතාක් කෙටි කළා. වාර දෙකක් අතර දින තුනයි තිබුණේ. සිකුරාදා නිවාඩු දුන්නා, ඊළඟ සඳුදා පටන් ගත්තා. මොකද, අපේ දරුවන්ගේ කාලච්ඡේද ගණන, අවශ්‍ය දින ගණන දෙන්න ඕනෑ නිසා. ඒක මැරතන් එකක් වාගේ, නැත්නම් මීටර් 100 දුවනවා වාගේ දුවන්න නොවෙයි දුන්නේ. මේ දරුවන්ගේ ප්‍රතිඵල 2021 සැප්තැම්බර් මාසයේ 23වන දා දුන්නා. කොවිඩ් උග්‍ර වශයෙන් තිබුණේ 2020 සහ 2021 වර්ෂවල. 2021 වර්ෂයේ අග හරියට එනකොට බොහෝ දුරට කොවිඩ් සමනය වෙලා තිබුණේ. ඊළඟට, දින 343ක් පාසල් පවත්වා තිබෙනවා. මම මේ උත්තර ටික කියලා ඉවරයි. දැන් මම ගරු විපක්ෂ නායකතුමාගේ ප්‍රශ්න ටිකට පිළිතුරු දෙනවා.

01\. I. 2023 අ.පො.ස. (උසස් පෙළ) විභාගය 2023.11.27 සිට 2023.12.21 දක්වා පැවැත්වීමට දැනට යෝජනා කර තිබෙනවා.

ඒ එක්කම උත්තර පත්‍ර සමීක්ෂණයත් ඊළඟ සතියේ දී ආරම්භ කරන්න ඕනෑ. මොකද, උත්තර පත්‍ර සමීක්ෂණයේ පළමුවැනි වටය අවසන් කරන්න අඩුම ගණනේ සති දෙකකට වඩා යන නිසා.

II. ඒ සඳහා මේ වන විට අයදුම් කර ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව,

| | | |
|---|---|---|
| පාසල් අයදුම්කරුවන් | - | 268,625 |
| පෞද්ගලික අයදුම්කරුවන් | - | 55,288 |
| මුළු අයදුම්කරුවන් සංඛ්‍යාව | - | 323,913 |

මුළු අයදුම්කරුවන් මේ වන විට පැවැත්වීමට නියමිත විභාගයට අයදුම් කරලා අවසානයි. 2022දී අයදුම් කරපු සංඛ්‍යාව 331,000යි. ඒ, ඊයේ ප්‍රතිඵල නිකුත් කරපු උසස් පෙළ විභාගයට. එතකොට ආසන්න වශයෙන් 2022 දී අයදුම් කරපු සංඛ්‍යාව 331,000යි. 2023 දී අයදුම් කරපු සංඛ්‍යාව 323,913යි. අයදුම්කරුවන් 8,000ක වෙනසක් තමයි තිබෙන්නේ. බොහෝ වෙලාවට සමහර විෂයයන්වලට, වෙනත් පාඨමාලාවලට අවශ්‍ය නිසා දෙවැනි, තුන්වැනි, හතරවැනි වතාවටත් පෙනී ඉන්නවා. එවැනි පිරිසක් -සාමාන්‍යයෙන් අවුරුද්දකට 5,000ක්, 6,000ක් පමණ- ඉල්ලුම් කරනවා. පසුගිය වර්ෂයේ ඉල්ලුම් කළ හා සමානවම මේ වර්ෂයේත් විභාගයට ඉල්ලුම් කරලා අවසානයි. ඒ කියන්නේ දරුවෝ සූදානම් වෙලා අවසානයි.

ගරු කථානායකතුමනි, ඊළඟ කාරණය මෙයයි. මට මතකයි, ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා කිව්වා, පසුගිය වසරේ විභාගයට අයදුම් කළ 331,000ක අයදුම්කරුවන්ගෙන් විභාගයට පෙනී ඉඳලා තිබෙන්නේ 263,935යි කියලා. ඒ කියන්නේ අයදුම් කරපු අයගෙන් සියයට 20ක් විභාගයට පෙනී ඉඳලා නැහැ. ඒ සඳහා විවිධ හේතු තිබෙන්න පුළුවන්.

III. 2023 අ.පො.ස. (උසස් පෙළ), නියමිත කාලයට පෙර විභාගය පවත්වන්නේ නැහැ.

නියමිත කාලයක් කියලා කවුරුවත් සඳහන් කරලා තිබුණේ නැහැ. ඉතා පැහැදිලිව පෙනෙනවා ඇති, අවුරුදු දෙකයි මාසයයි දවස් දහයක්. ප්‍රතිඵල දීමත්, විභාගය පැවැත්වීමට නියමිත කාලය සති දෙක දෙක අඩු කළත් මෙන්න මේ කාල සීමාව ලැබිලා තිබෙනවා. 2023 අ.පො.ස. (උසස් පෙළ) විභාගය පැවැත්වීම සම්බන්ධව මුල් වරට තීරණය කර තිබුණේ 2023.10.16 දින සිටයි. නමුත්, පසුගිය විභාගයේ උත්තර පත්‍ර සමීක්ෂණය වෘත්තීය ක්‍රියාමාර්ග හේතුවෙන් කල් යෑම නිසා එය නැවත නොවැම්බර් මාසයේ අග දක්වා reschedule කරන්න වුණා. දැනට විභාගය පැවැත්වීම සඳහා නියම කර ඇති දිනය වන 2023.11.27වන දා

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

මුලින් යෝජිත දිනයට වඩා මාසයකට පසු දිනයක් වන බැවින් අයදුම්කරුවන්හට එමඟින් අසාධාරණයක් සිදු වී නොමැත.

ඒ කාරණයත් මම මෙහිදී පෙන්වා දෙන්න ඕනෑ. 2023 ඔක්තෝබර් මස පවත්වන විභාගය වෙනුවෙන් අපි මාස 4කට පෙර දී තමයි විභාගය පවත්වන වකවානුව සඳහන් කළේ; මීට මාස හතරකට පෙරදී. ඉස්සරහට තිබෙන මාස දෙක ගත්තොත්, මාස හයක් පමණ කාල සීමාවක් ලැබිලා තිබෙනවා, පූර්ව දැනුම් දීමේ ඉඳලා විභාගයට සූදානම් වෙන අයට. ආර්ථික ගැටලු තිබුණත් සිසුන් බහුතරයක් යෝජිත දිනයට විභාගය පෙනී සිටීමට විශාල සූදානමකින් ඉන්නවා.

02. සාමාන්‍යයෙන් NIE එකේ නිර්දේශ අනුව වාරයකට සති 10-12 අතර කාලයක් පාසල් පැවැත්වෙනවා. අවමය සති 10ක්, උපරිමය සති 12ක්. එතකොට සතියකට කාලච්ඡේද 10ක් තුළ වැඩ කෙරෙන්න ඕනෑ. සති 10ට ගත්තොත් කාලච්ඡේද 100යි. සියය හයෙන් වැඩි කළාම හයසියයයි. විෂය නිර්දේශය ආවරණය කරන්න තිබෙන්නේ අවමය දින 300ක් සහ උපරිමය දින 360ක්. නමුත් දින 343ක් පාසල් පවත්වා තිබෙනවා. එතකොට අවමයට වඩා වැඩියි, උපරිමයට වඩා අඩු වෙන්නේ දින 17යි. ඒ කරුණු ටික මම සඳහන් කරන්න ඕනෑ.

මම නැවතත් කියනවා, උසස් පෙළ විභාගයට යෝජිත දින වනවිට දින 343ක් පාසල් පවත්වා තිබෙන බව. එම නිසා නියමිත කාලච්ඡේද සංඛ්‍යාව ආවරණය වෙනවා. අපි ඊයේ වනවිට පළාත්වල තොරතුරු ලබා ගත්තා. ඒ ලබාගත් තොරතුරු අනුව විෂය නිර්දේශ බොහෝදුරට අවසන් කරලා තිබෙනවා. ඒක තමයි අපට ලබා දුන්න තොරතුර. පළාත් නවයම සම්බන්ධ කරලා අපි "Zoom" meeting එකක් ගත්තා. දරුවන් දැනටමත් විභාගයට සූදානමින් ඉන්නවා.

මෙහිදී ඔබතුමන්ලා මේ ප්‍රශ්නය මතු කරපු එක හොඳයි. මොකද, මහජන නියෝජිතයන් හැටියට ඔබතුමන්ලා ළඟට එන ප්‍රශ්න මෙතැනදී ඉදිරිපත් කරන්න ඕනෑ. ඒ ගැන මගෙන් අහන්නත් ඕනෑ. මම පිළිතුරු දුන්නේ මේ සියලු කරුණු අරගෙන.

ගරු කථානායකතුමනි, මේ විභාගය යම් ආකාරයකින් විශාල කාල පරාසයකින් කල් දැමීමක් කළොත්, මාර්තු අග සහ අප්‍රේල් මුල දින 14ක් අරගෙන පැවැත්වීමට තිබෙන අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය අනිවාර්යයෙන්ම කල් යනවා. ඊළඟට අපි සැලසුම් කරලා තිබෙනවා, 2024 වර්ෂයේ අවසානය වනවිට 1 සිට 13 දක්වා විෂය නිර්දේශ ආවරණය කරලා අවසන් කරන්න. මේ විභාගය කල් දැමීමක් සිදු වුණොත්, ලක්ෂ 41ක් වන දරුවන්ගේ අධ්‍යාපන කාලය 2025 අවුරුද්දෙත් අඩුම ගණනේ තව මාස හතරක්, පහක් එහාට යනවා. අපි මේ අවුරුද්දේ මේ ප්‍රශ්නය කළමනාකරණය කළේ නිවාඩු දින ගණන අඩු කරගෙන. නොවැම්බර් 27වන දා පටන් අරගෙන දෙසැම්බර් 20වන දා විභාගය අවසන් වෙනකොට අනෙක් දරුවන්ට ඒ දෙසැම්බර් මාසයේ නිවාඩුව ලැබෙනවා. එතකොට විභාගය පැවැත්වීමට නැවත පාසල් වහන්න වෙන්නේ නැහැ. හැබැයි, අපි මේ කාල සීමාව නොගත්තොත් ගිය අවුරුද්දේ වුණා වාගේ අනිවාර්යයෙන් නැවතත් මාසයක් පාසල් වහන්න වෙනවා. දරුවන්ට දෙසැම්බර් මාසයේත් නිවාඩු දීලා ආපසු පෙබරවාරි මාසයේ නැත්නම් ඉන් එහාට නිවාඩු දෙන්න වෙනවා.

අධ්‍යාපන අමාත්‍යාංශයයි, විභාග දෙපාර්තමේන්තුවයි එකතු වෙලා විභාග කාලසටහන් හදනවා. ඒක හදද්දී වාරසටහන්වලට ගළපා ගන්න ඕනෑ. විභාග කාලසටහනයි, වාරසටහනයි එකට යමින් තමයි මෙතෙක් කල් පැවැත්වුණේ.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Mark the papers leniently.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
එහෙම කරන්න බැහැ. Papers leniently mark කරන්න බැහැ. පසුගිය උසස් පෙළ විභාගයෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශයට සමත් ප්‍රතිශතය 62.9යි, මෙවර 63.3යි. අපට දුෂ්කරතා තිබෙන්න පුළුවන්. නමුත් මතක තියාගන්න, අපේ සමහරු 20වැනි සියවසේ ඉන්නවා නම් දරුවෝ ඉන්නේ 21වැනි සියවසේ තුන්වැනි දශකයෙනුත් එහාය කියන එක. මෙන්න මේකයි අපට තේරුම් ගන්න බැරි දේ. මේ පාර්ලිමේන්තුවේ අපි ඉස්සෙල්ලා තේරුම් ගන්න ඕනෑ, අපි ඉන්නේ 21වැනි සියවසේ තුන්වැනි දශකයේ මුල හරියේ කියලා. නමුත් දරුවෝ ඉන්නේ තුන්වැනි දශකයෙනුත් එහා.

දැන් මේ තුන්වැනි වාරය නිසා මම ඉල්ලීමක් කරනවා, ලංකාව ඇතුළත උසස් පෙළ දරුවෝ ඉගෙන ගන්න ඕනෑම පාසලක සමීක්ෂණයක් කර බලන්න කියලා. සමහර පාසල්වල උසස් පෙළ දරුවන් සියයට 10ක්වත් පාසල් එන්නේ නැහැ. පැමිණීම සියයට 40ට අඩුයි. මොකද, දරුවෝ study leave වාගේ අරගෙන දැන් විභාගයට සූදානම් වෙනවා.

03. i. 04කි.

ii. 01කි.

වාර හයක් තිබෙනවා. වාර හයෙන් වාර හතරක් සම්පූර්ණයෙන් අවසන් කරලා තිබෙන්නේ. දැන් ඊළඟ පරීක්ෂණය තියන්නත් කල් තිබෙනවා. මම මුලින් සඳහන් කළා වාගේ වාර ගණන වෙනස් වුණේ අර කාලය වෙනස් වෙච්ච නිසා. නමුත් අවශ්‍ය දින ගණන ලැබිලා තිබෙනවා. දින අවමය 300යි, උපරිමය 360යි. අපි නොවැම්බර් අගට ගණන් බැලුවත් දින 360න් දින 343ක් පාසල් පැවැත්වෙනවා. ඒ කියන්නේ නොවැම්බර් 27ට පෙරාතුව ගණන් බැලුවත්. මම පැහැදිලි කළේ ඒ කරුණු ටික. *[බාධා කිරීමක්]* ගරු විපක්ෂ නායකතුමනි, දරුවෝ වාර විභාගවලට එන්නේත් නැහැ. *[බාධා කිරීමක්]* ඉන්න මම කියන්නම්. හැබැයි, අපි තියන්න ඕනෑ. පස්වැනි වාර විභාගයත් පවත්වන්න පුළුවන්. සමහරවිට වාරයකට දින කිහිපයක් වැඩි වෙන්න පුළුවන්, කාලය ගණනය කර ගැනීමේදී. එතකොට වාර විභාග තියන්න ගියොත් ප්‍රායෝගිකව දුෂ්කරතා එනවා. නමුත් ඒ වාර විභාගවලින් දරුවන්ගේ දැනුමේ ප්‍රමාණය තක්සේරු කිරීමක් වෙනවා. පාසල්වලින් ඒවායේ අඩුවක් කරන්නේ නැහැ.

iii. ඔව්.

iv. නියමිත පරිදි වාර විභාග පවත්වා ඇති අතර, ඉදිරි වාර විභාගද, නියමිත පරිදි

පැවැත්වීමට සැලසුම් කර තිබෙනවා.

04. 2023 අ.පො.ස. (උසස් පෙළ) විභාගය පැවැත්වෙන දිනයන් සම්බන්ධයෙන් (2023.10.16 සිට 2023.11.10 දක්වා) ගරු අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීමෙන් අනතුරුව, (අංක ED/09/12/06/05/01-2023 හා

> 2023.02.16 දිනැති අමාත්‍ය මණ්ඩල සටහන) අ.පො.ස. (උසස් පෙළ) විභාගය පැවැත්වීමට නියමිත දින පිළිබඳ සිසුන් දැනුවත් කරන ලදී. තවද, 2023.11.27 දින සිට 2023.12.31 දක්වා විභාගය පැවැත්වීමට තීරණය වූ පසු ඒ පිළිබඳවද 2023.07.19 දිනැතිව සිසුන් දැනුවත් කර ඇත. ඒ අනුව, දෙවන වර හා තෙවන වර අපේක්ෂකයන්ට සූදානම් වීමට ප්‍රමාණවත් කාලයක් හිමි විය.
>
> ඒ සඳහා අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කර තිබුණා. උත්තර පත්‍ර සමීක්ෂණය කල් යෑම නිසා නැවත වතාවක් reschedule කළා. විභාගය නැවත ප්‍රතිලේඛනගත කළා.

2022 වර්ෂයේ පෙනී සිටි සංඛ්‍යාව 323,913කි. ඒ ප්‍රතිඵල නිකුත් කර අවසන් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මෙවර තමයි උත්තර පත්‍ර සමීක්ෂණය ආරම්භ කිරීමත්, ප්‍රතිඵල නිකුත් කිරීමත් අතර අඩුම කාල සීමාවක් ගත වුණේ. උත්තර පත්‍ර සමීක්ෂණය නැවත ආරම්භ කළාට පස්සේ FUTA එකෙන් විශාල සහයෝගයක් ලබා දුන්නා. ඒ වාගේම ගුරුවරුත් විශාල සහයෝගයක් ලබා දුන්නා. උසස් පෙළ විභාගයේ උත්තර පත්‍ර සමීක්ෂණය කරනවා කියන්නේ, ඉතාම වෙහෙසකර ක්‍රියාවක්. ගුරුවරයෙකුට, උත්තර පත්‍ර 10යි දවසකට සමීක්ෂණය කරන්න පුළුවන්. මැදදී දවසක් දෙකක් නිවාඩු දීලා තමයි ඒ ගොල්ලන් සමීක්ෂණ කටයුතු නැවත ආරම්භ කළේ. අපි ඔවුන්ගේ ඒ දීමනාවත් වැඩි කරලා දුන්නා. ඒවා ගෙවීමත් ආරම්භ කළා. ආණ්ඩුවට ආර්ථික ප්‍රශ්න කොච්චර තිබුණත්, දරුවන් වෙනුවෙන් ඒ කටයුතු අපි සම්පූර්ණ කර තිබෙනවා.

තවද, විභාගයට පෙනී සිටි සිසුන් විභාගය අවසන් වූ වහාම නැවත විභාගයට පෙනී සිටීම පිළිබඳ සලකා බලා ඒ සඳහා සූදානම් වීමට කටයුතු කරනු ලබයි. මෙය සාමාන්‍ය සම්ප්‍රදායකි.

දෙවනවර හෝ තුන්වන වර පෙනී සිටීමට සූදානම් වීමට ගතවන කාලය නිශ්චිත නැත.

සාමාන්‍යයෙන් මාස 5ක් ඕනෑය කියලා අපි සඳහන් කළා. ඒ නිසා තමයි අපි මීට මාස 4කට කලින් පූර්ව දැනුම් දීමක් කළේ මේ විභාගය පැවැත්වෙන වකවානුව පිළිබඳව. හැබැයි, මීට මාස එකහමාරකට කලින් අයදුම්පත් කැඳවීම close කරනකොට අයදුම් කරපු සංඛ්‍යාවෙන් පේනවා, දෙවන වර තුන්වන වර පෙනී සිටීමට සූදානම් වන අයත් අයදුම් කර අවසන් බව. ඒ අයත් දැනුවත් වෙලා තිබෙනවා, විභාගය තිබෙන්නේ මේ කාලයේ කියලා.

තවදුරටත් විභාගය පැවැත්වීම ප්‍රමාද වීම තුළින් විශ්වවිද්‍යාල ප්‍රවේශය, රැකියා අවස්ථා සඳහා ප්‍රවේශවීමේ වයස් ප්‍රමාද වීම තුළින් සිසුන්ට බලවත් අසාධාරණයක් සිදු වේ.

යෝජිත විභාග කාල සටහන හා වාර සටහන නැවත සංශෝධනයක් සිදු වුවහොත් අති බහුතරයක් වූ සිසුන් ප්‍රමාණයකට අසාධාරණයක් සිදු වන අතර එමඟින් සමස්ත සිසුන්ගේ මානව හිමිකම් කඩවනු ඇත.

ඒ එක්කම, අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට පෙනී සිටින දරුවන්ටත්, අනිකුත් දරුවන්ටත් ඒ ගොල්ලන්ගේ පාසල් කාලයට අදාළව බලවත් අසාධාරණයක් වෙන්න පුළුවන්. දෙමව්පියන්ගේත්, දරුවන්ගේත් විශාල ඉල්ලීමක් තිබෙනවා, හැකි ඉක්මනින් මේ විභාග තියලා, හැකි ඉක්මනින් ප්‍රතිඵල ලබා දීලා, හැකි ඉක්මනින් විශ්වවිද්‍යාලයට යවන්න කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
එතකොට අර ටියුෂන් කට්ටිය-

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඒක වෙනම ප්‍රශ්නයක්. හැබැයි මම දන්නා තරමින්, උපකාරක පන්ති ගුරුවරුත් මේ වන විට උපකාර ලබා දීම බොහෝ දුරට අවසන් කරලා තිබෙනවා.

දින 21ක් විභාගයට වෙන් කළ යුතුයි. දෙසැම්බර් මස සියලු දරුවන්ට නිවාඩු දෙන බැවින් හා පාසල් වසා තැබෙන බැවින් විභාගයට පෙනී සිටින දරුවන්ට හැර සෙසු ලක්ෂ 41ක් වන දරුවන්ට නිවාඩු කාලයකි. විභාගය කල් දැමුවහොත් නැවත විභාගය පැවැත්වීමට දින 21ක් පාසැල් වසා තැබිය යුතුයි. තවද යෝජිත අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය නැවත කල් දැමීමට සිදු වේ. 2024 වර්ෂය තුළ සියලු දරුවන්ගේ විෂය ආවරණය කිරීම කල් ගොස් කොවිඩ්- 19 හා 2022 රටේ ඇති වූ තත්ත්වයෙන් පසුගාමී වූ අධ්‍යාපනය යථා තත්ත්වයට පත් වීම වැළැකෙනු ඇත. එමඟින් ලක්ෂ 41ක් වන සමස්ත සිසුන්ටම අසාධාරණයක් වනු ඇත.

*[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ප්‍රශ්නයේ තවත් කරුණු තිබෙන බව ඇත්ත. නමුත්, මම මේ කරුණු ඉදිරිපත් කරන්න ඕනෑ. යම් පිරිසක් ඔබතුමන්ලා මුණ ගැසිලා කරුණු කියන එක ඇත්ත. ඒ වාගේම අපට අනෙක් පැත්තෙන් කියනවා, මේ විභාගය තියන්න ඕනෑමයි කියලා. එහෙම කියන අති බහුතර දරුවෝ පිරිසකුත් ඉන්නවා. ඉතින් අපි ඒ දෙකම තුලනය කරන්න ඕනෑ. ඒ නිසා ගරු විපක්ෂ නායකතුමාත්, අනෙක් මන්ත්‍රීතුමන්ලාත් කිව්වා වාගේ අපි මේ පිළිබඳව සංවේදීව කටයුතු කරනවා. අපි සමස්ත අධ්‍යාපනයම සලකා බලන්න ඕනෑ. ඒ වාගේම අපි ඊළඟ මාසය හමාර තුළදී සමස්ත අධ්‍යාපනයේම සිදු විය යුතු වෙනස්කම් පිළිබඳව කටයුතු කරනවා. විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයෙන් යම්තාක් දුරට ඉවත් වෙලා කුසලතා මත පදනම් වූ අධ්‍යාපනයකට යන්න බලාපොරොත්තු වෙනවා. ඔබතුමා කිව්වා වාගේ STEAM education සඳහා යන්න කාලයක් ගත වෙනවා.

ගරු විපක්ෂ නායකතුමනි, අපි විෂය නිර්දේශයක් අවුරුදු 8කට වතාවක් සංශෝධනය කරනවා. *[බාධා කිරීමක්]* ඉන්නකෝ. මම ඒක ගැන අවසානයේ කියන්නම්. එතකොට විෂය නිර්දේශය සංශෝධනය කළොත්, අවුරුදු 8ක් ගත වෙනවා ඒ circle එක ඉවර කරන්න. ඒ circle එකට අවුරුදු 8ක් ගත වෙනවා. එතකොට education reform එකකට ගියොත් කොච්චර කල් යයිද? නමුත්, එච්චර කල් ගතකරන්න අවශ්‍ය නැහැ. මොකද, දැන් සමාජය දැනුවත්, ඔබතුමන්ලා දැනුවත්. ඒ නිසා අපි ඉතාම කෙටි කාලයක් තුළදී සැලසුම් කර තිබෙන, නැවත සංශෝධනයට ලක් වෙච්ච education reforms ඉදිරිපත් කළාම මේ ප්‍රශ්නවලට පිළිතුරු ලැබේවි. එතෙක් යම් අසාධාරණයක් වෙනවා නම් යම් සිසුන් පිරිසකට, ඒ ගැන සංවේදීව සලකා බලන්නත් සූදානම් කියන කාරණය සඳහන් කරමින් මගේ පිළිතුරු දීම අවසන් කරනවා.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
Hon. Speaker, I was contacted by the family of the late Hon. A. Amirthalingam, one-time Leader of the Opposition in this Parliament. Last week, a statement was made by an Hon. Member of Parliament from the Government side, quoting certain words attributed to Mrs. Amirthalingam in the 70s. The Hon. Member from the Government said, “She said that she could not sleep until she wears a shoe made out of the skin of the last Sinhalese in the South”. Sir, this happened in the 70s, you may remember.

[ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

The family members of the Hon. Amirthalingam contacted me from London and sent me the Reports of the Sansoni Commission. The Sansoni Commission was appointed to go into the incidents at that time. The Commission called for seven police reports regarding the occasions where Mrs. Amirthalingam was supposed to have made that statement. None of the police statements referred to those words. So, they contacted me from London and want to deny this. Sir, I **table*** the findings of the Sansoni Commission, which had rejected that statement attributed to her.

There is one more matter, Sir.

ගරු අධ්‍යාපන ඇමතිතුමනි, දැන් සබරගමුව විශ්වවිද්‍යාලය ගැනත් සඳහන් වුණා. මමයි එවකට උසස් අධ්‍යාපන ඇමතිවරයා හැටියට එය පටන් ගත්තේ. අපේ ආණ්ඩුව තමයි එය පටන් ගත්තේ. අපි ගොඩනැඟිල්ලක් කුලියට අරගෙන එය පටන් ගත්තා. මොකද, දෙයක් පටන් ගත්තොත් තමයි ඒක ඉස්සරහට යන්නේ. ඒ කාලයේ අපට හොඳට සල්ලි තිබුණා. අපි ඒ වෙනුවෙන් සැලැස්ම හදලා තිබුණේ. නමුත් මොකක්ද වුණේ? තමුන්නාන්සේලා රට බංකොලොත් කළා. මම තමයි ඒ විශ්වවිද්‍යාලය පටන් ගත්තේ. අපේ ගරු තලතා අතුකෝරල මැතිනියගේ ඉල්ලීමකට අනුව මම තමයි එය පටන් ගත්තේ. එදා අපට සල්ලි තිබුණා. We had a plan. නමුත් තමුන්නාන්සේලා රට බංකොලොත් කළා.

I will take just a minute, Sir. අර ලොකු සමාගම්වලින් රජයට එන්න තිබුණු VAT එකෙන් බිලියන 800ක් තමුන්නාන්සේලා නැති කර ගත්තා නේ. තමුන්නාන්සේලා රට බංකොලොත් කරලා දැන් අපට දොස් කියන්න බැහැ. දැන් ඒ විශ්වවිද්‍යාලය හොඳින් පවත්වාගෙන යනවා.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත් කෙටුම්පත
### குடியியல் வான்செலவு (திருத்தம்) சட்டமூலம்
### CIVIL AVIATION (AMENDMENT) BILL

"Bill to amend the Civil Aviation Act, No. 14 of 2010."

***පිළිගන්වන ලද්දේ වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා විසිනි.***

***2023 සැප්තැම්බර් 19වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*துறைமுகங்கள், கப்பற்றுறை மற்றும் விமான சேவைகள் அமைச்சர் சார்பாக மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2023 செப்ரெம்பர் 19, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Susil Premajayantha, on behalf of the Minister of Ports, Shipping and Aviation; to be read a Second time upon Tuesday, 19th September, 2023*

*and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.*

**** පුස්තකාලයේ තබා ඇත.***

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### වල්පොල පියනන්ද අධ්‍යාපන සහ සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත
### வல்பொல பியனந்த கல்வி கலாசார மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்
### WALPOLA PIYANANDA EDUCATIONAL AND CULTURAL FOUNDATION (INCORPORATION) BILL

**ගරු සංජීව එදිරිමාන්න මහතා**
(மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன)
(The Hon. Sanjeeva Edirimanna)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා:

"වල්පොල පියනන්ද අධ්‍යාපන සහ සංස්කෘතික පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතු ය."

**ගරු අකිල එල්ලාවල මහතා**
(மாண்புமிகு அகில எல்லாவல)
(The Hon. Akila Ellawala)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.***

***පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.***

***වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත අධ්‍යාපන අමාත්‍යතුමා වෙත පවරන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6)இன்படி கல்வி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Education for report.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත, දෙවන වර කියවීම.

## ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත
## ஆயுள்வேதம் (திருத்தம்) சட்டமூலம்
## AYURVEDA (AMENDMENT) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*
*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*Order for Second Reading read.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන්, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සිසිර ජයකොඩි රාජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 12.07]

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා (දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி - சுதேச வைத்திய இராஜாங்க அமைச்சர்)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law - State Minister of Indigenous Medicine)

ගරු කථානායකතුමනි, අද අපි 1961 අංක 31 දරන ආයුර්වේද පනතට සංශෝධන ගෙන එනු ලබනවා. අවුරුදු 62කට වැඩි කාලයක් තිස්සේ විවිධ සාකච්ඡාවලට ලක් වුණු සංශෝධන රාශියක් තමයි අද ඉදිරිපත් කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

*අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. AJITH RAJAPAKSE] took the Chair.*

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2021 වර්ෂයේ අය වැය විවාදයේදී තමයි ආයුර්වේද පනත සංශෝධනය කරන බවට අපි මුලින්ම ප්‍රකාශ කළේ. ඒ සඳහා රජයේ ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය, ආයුර්වේද ක්ෂේත්‍රයේ සියලුදෙනා, පාරම්පරික වෛද්‍යවරුන්ගේ සම්මේලන, පාරම්පරික වෛද්‍යවරුන් සහ ගරු මැති ඇමතිතුමන්ලා සමඟත් අවුරුදු දෙකකට වැඩි කාලයක් සිදු කරන ලද දීර්ඝ සාකච්ඡාවක ප්‍රතිඵලයක් විධියටයි මේ සංශෝධන ඉදිරිපත් වෙන්නේ. ඒ වාගේම මෙය නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේත්, නීතිපති දෙපාර්තමේන්තුවේත් දීර්ඝ සාකච්ඡාවකට ලක් කළා. හිටපු අධිකරණ අමාත්‍ය ගරු අලි සබ්රි මැතිතුමා විසින් මේ කටයුතු කාර්යක්ෂම කිරීම සඳහා ලබා දුන් විශේෂ සහයෝගය මම මේ අවස්ථාවේදී සිහිපත් කරනවා. එසේ සිදු කරන ලද දීර්ඝ සාකච්ඡාවකින් පසුවයි මේ සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ.

මේ සංශෝධන මඟින් අප බලාපොරොත්තු වන මූලික කාරණා හතක් මම මේ ගරු පාර්ලිමේන්තුවේ අවධානයට යොමු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ "ආයුර්වේද කොමසාරිස්" කියන තනතුර "ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා" ලෙස සංශෝධනය කිරීමට අපි යෝජනා කරනවා. ආයුර්වේද දෙපාර්තමේන්තුව දැනට වඩා කාර්යක්ෂම කිරීම තමයි අපි මේ තුළින් බලාපොරොත්තු වන්නේ. මේ සමස්ත සංශෝධනයෙන් අපි අරමුණු කරන්නේ අපේ ආයතන කාර්යක්ෂම කිරීම, තිරසර සංවර්ධනයට උචිත වන පරිදි පනත්, රෙගුලාසි ආදිය යාවත්කාලීන කිරීම වාගේම, අපේ රටේ විදේශ විනිමය උත්පාදන මාර්ගයක් ලෙස දේශීය වෛද්‍ය ක්‍රම ආර්ථික වටිනාකමක් සහිතව වාණිජමය ක්ෂේත්‍රයක් කරා ගමන් කරවීමයි.

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ව්‍යුහය වෙනස් කිරීම පිළිබඳව වෘත්තීය සමිති විසින් දීර්ඝව කරන ලද සාකච්ඡාවක ප්‍රතිඵලයක් වශයෙන් ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා, අතිරේක ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයා ආදි වශයෙන් පත් කිරීම් කරලා එම ක්ෂේත්‍රය කාර්යක්ෂම කිරීම සඳහා වූ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමත් මේ පනත මඟින් අප බලාපොරොත්තු වන එක් මූලික අරමුණක් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම බොරැල්ලේ පිහිටා තිබෙන අපේ ආයුර්වේද මහ රෝහල "ආයුර්වේද ජාතික රෝහල" ලෙස නම් කළ යුතු බවට අපි යෝජනා කරනවා, මේ සංශෝධනය මඟින්. ඒ වාගේම ඊට අනුරූපීව අනෙකුත් ආයුර්වේද රෝහල්වල නම් "ආයුර්වේද ශික්ෂණ රෝහල්", "ආයුර්වේද පර්යේෂණ රෝහල්" ලෙස වෙනස් කිරීම ද සිදු කරනු ලබනවා.

අපේ ආයුර්වේද ක්ෂේත්‍රයේ අධ්‍යාපනය ලබන උපාධිධාරි ශිෂ්‍යයන්ට ඒ ශික්ෂණ රෝහල් යටතේ පුහුණුවත්, සායනික අධ්‍යයනයත් කිරීමට අවශ්‍ය පරිසරය සකස් කිරීමේ සහ ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ පිළිගැනීමක් බොරැල්ල ආයුර්වේද ජාතික රෝහලට ලබා දීමේ අරමුණින් තමයි මේ දෙවන සංශෝධනය අප විසින් සිදු කරනු ලබන්නේ.

ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ සභා කිහිපයක් පවතිනවා. ඒවා තමයි, ආයුර්වේද වෛද්‍ය සභාව, ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලය සහ ආයුර්වේද පර්යේෂණ කමිටුව. ඒ කමිටුවල සාමාජිකයන් ලෙස විශ්වවිද්‍යාලවල

[ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා]

නියෝජිතයන් පත් කිරීමේ අවශ්‍යතාවක් පවතිනවා. ආයුර්වේද පර්යේෂණ කමිටුව තිබෙනවා. එය තිබුණ ද දීර්ඝ කාලයක් තිස්සේ මේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා විවිධ විවාදවලදී සඳහන් කළා, අපේ පර්යේෂණ ක්‍රියාවලිය පිළිබඳව. එළඹෙන සිකුරාදා, සෙනසුරාදා සහ ඉරිදා - සැප්තැම්බර් 8, 9, 10 දිනවල - බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වෙන දේශීය වෛද්‍ය අධ්‍යාපන හා වෙළඳ ජාත්‍යන්තර ප්‍රදර්ශනයේදී අපි එවැනි පර්යේෂණ වාර්තා 250කට වැඩි ප්‍රමාණයක් එළි දක්වන්න බලාපොරොත්තු වෙනවා. පර්යේෂණ සඳහා දිරිගන්වන්න ආයුර්වේද පර්යේෂණ කමිටුවේ විශ්වවිද්‍යාලවල නියෝජිතයෙක් නැහැ. ඒ නිසා මෙම සංශෝධනය මඟින් ආයුර්වේද වෛද්‍ය සභාවටත්, ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලයටත්, ආයුර්වේද පර්යේෂණ කමිටුවටත් විශ්වවිද්‍යාලවලින් නියෝජිතයන් නම් කරනවා. දැනට නියෝජනය වන්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා අංශයෙන් පමණයි. ඒ වෙනුවට එම කමිටුවට වැඩි නියෝජනයක් ලබා දීම සඳහා යක්කල අලුතින් ආරම්භ කරපු ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරයෙකු නිල බලයෙන් නම් කරන්න අපි යෝජනා කර තිබෙනවා.

ඒ වාගේම යාපනයේ විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨයෙන්, නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨයෙන්, කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ, ආයුර්වේද සහ යුනානි ඒකකවලිනුත් කථිකාචාර්යවරයකු බැගින් නියෝජිතයන් වශයෙන් ඊට නම් කරන්නට යෝජනා කර තිබෙනවා. විශේෂයෙන්ම මේ කාරණයේදී අපේ පාරම්පරික වෙද මහත්වරු ඉල්ලා සිටියා, මේ සභා -විශේෂයෙන් ආයුර්වේද වෛද්‍ය සභාව- ආයුර්වේද වෛද්‍යවරුන්ගෙන් පමණක් සමන්විත වුණොත්, ඔවුනට යම් යම් ගැටලුවලට මුහුණ දෙන්න සිදු වෙයි කියලා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මතු කරපු කරුණ තවත් පැහැදිලි කරගන්නයි මම මෙය අහන්නේ. ඔබතුමා ඉදිරිපත් කරන සංශෝධනවල තිබෙනවා, " 'ආයුර්වේද' යන්නට ආයුර්වේද, සිද්ධ, යුනානි සහ දේශීය චිකිත්සා වෛද්‍යකර්ම සහ ශල්‍යකර්මය ද වෙනත් යම් ආසියාතික රටවලට ආවේණික හා ඒ අදාළ රටවල රජයන් විසින් පිළිගත් වෙනත් යම් වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම ද ඇතුළත් වේ" කියා. එතකොට මේ නිර්වචනය ඇතුළට ද අපේ සාම්ප්‍රදායික වෙදකම කියන එක එන්නේ?

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)
ඒ සියල්ලම ඇතුළත් වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ වාක්‍යයට සිද්ධ, යුනානි, දේශීය චිකිත්සා වෛද්‍යකර්ම, ශල්‍යකර්ම, වෙනත් යම් ආසියාතික රටවලට ආවේණික හා ඒ අදාළ රටවල රජයන් විසින් පිළිගත් වෙනත් යම් වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම තිබෙනවා නම් ඒ සියල්ල අයිති වෙනවා. *[බාධා කිරීමක්]* මම උත්තරය දෙන්නම්, ගරු මන්ත්‍රීතුමා. මෙතෙක් කලක් පැවත එන, අපේ ඒ පාරම්පරික වෛද්‍ය ක්‍රම ගැන තමයි මේකෙන් අදහස් කරන්නේ. මීට පෙරත් ඔය නිර්වචනයම තමයි තිබුණේ. අපි ඒක පුළුල් කරලා තිබෙනවා "වෙනත් යම් ආසියාතික රටවලට" කියලා. අපේ රටේ ඉතිහාසයේ තිබුණා අලි ඇතුන්ට වෙදකම් කරන ක්‍රම. නමුත් ඒවාට ලියා පදිංචිය දෙන්න බැහැ. ගව ආදි සතුන්ට වෙදකම් කරන ක්‍රම තිබුණා. නමුත් ඒවාට ලියා පදිංචිය දෙන්න බැහැ. ඒවා ඇතුළත් කරගන්න බැරි වුණා. ඒ නිසා අපි ඒ පාරම්පරික වෛද්‍යවරුන්ටත්, එවැනි විවිධ ක්ෂේත්‍රවල විශේෂ වෛද්‍යවරුන්ටත් ලියා පදිංචිය ලබා දීමට අවශ්‍ය විධියට නිර්වචනය පුළුල් කරලා තමයි මෙසේ සඳහන් කර තිබෙන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මට තිබෙන කුකුස තමයි, ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය සංශෝධනයේ තිබෙනවා, " රජයන් විසින් පිළිගත් ...." කියලා. ඔබතුමා කිව්වා වාගේම, දැනට පිළිගෙන නැති සමහර සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රම තිබෙනවා. නමුත්, ඒ අය පාරම්පරිකව ඒ වෛද්‍ය ක්‍රමය පවත්වාගෙන එනවා. "ආයුර්වේද" යන්නට ඇතුළත් වන ඒ වාගේ සාම්ප්‍රදායික වෛද්‍ය ක්‍රමවලට ඔබතුමා උදාහරණ දෙකක් කිව්වා. නමුත් මට තිබෙන ප්‍රශ්නය තමයි, යම්කිසි වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමයක් ඇතුළත් කර ගන්නවා වාගේම, සමහර වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම ඇතුළත් කර නොගෙන බැහැර කරන්නත් මේ පනත් කෙටුම්පතෙන් ඉඩක් හැදෙනවාද?

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාරම්පරික වෛද්‍යවරුන්ට අදාළව මේ අන්තර්ගතය සිද්ධ කළේ වෙනත් යම් ආසියාතික රටවලට ආවේණික වෛද්‍ය ක්‍රමයක් කියන කාරණාව මතයි. ඒ නිර්වචනය තුළ තමයි මෙතෙක් කාලයක් පාරම්පරික වෛද්‍යවරුන් සඳහා අවස්ථාව ලැබුණේ. ඒක එලෙසම පවත්වා ගන්නවා. පනතේ 67 වගන්තියේ ඉතා නිශ්චිතව දක්වනවා, "ලියාපදිංචියක් නැති යම් පාරම්පරික වෛද්‍යවරයෙක් ඉන්නවා නම්, වාණිජමය සංකල්පවලින් බැහැරව ප්‍රතිකාර ලබා දීමට ඔවුන්ට ඉඩකඩ තිබෙනවා" කියලා. පනතේ 67 වගන්තිය කිසිම ආකාරයක වෙනසක් කරන්නේ නැහැ. ඔබතුමා කියන ප්‍රශ්නයට 67 වන වගන්තියෙන් උත්තර ලැබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, දැන් "හෙළ වෛද්‍ය ක්‍රමය" කියලා වෛද්‍ය ක්‍රමයක් පවත්වාගෙන යනවා නේ. ඒකට නීත්‍යනුකූල පිළිගැනීමක් ලැබිලා නැහැ. ඒ වාගේ වෛද්‍ය ක්‍රම මේකට ඇතුළත් වනවාද?

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)
අනිවාර්යයෙන්ම ඇතුළත් වනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)

මගේ ඊළඟ ප්‍රශ්නය තමයි, එම වෛද්‍යවරු "ආයුර්වේද" යන්නට ඇතුළත් කිරීම මඟින් ඔබතුමා කිව්වා මුදල් අය කර ගන්න බැහැ කියලා. අපි දන්නවා සමහර ඒ වාගේ වෛද්‍යවරු මුදල් ගන්නේ නැහැ. හැබැයි, ඒ ප්‍රතිකාරයෙන් යම් සහනයක් තිබෙන බව දැනුණාම මිනිස්සු බුලත් අතකුත් එක්ක කීයක් හෝ තියනවා, ඒ වෛද්‍යවරයාට දිගටම ඒ වැඩේ කරගෙන යන්න. ඒක නීතිමය වශයෙන් වරදක් වෙලා හිරේ යන්න සිද්ධ වන දෙයක්ද?

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)

එය කිසිසේත්ම නීතිමය වශයෙන් වරදක් වෙන්නේ නැහැ. පාරම්පරික වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම ලංකාවේ පමණයි පවතින්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම වගකීමෙන් කියන්නේ. ලෝකයේ පාරම්පරික වෛද්‍යවරුන්ට නිල අයිතිය ලබා දෙන්නේ ලංකාවේ පමණයි. ඒ නිසා ඕනෑම වෛද්‍ය ක්‍රමයක් යටතේ ප්‍රතිකාර කරන්න, පෞද්ගලික මට්ටමෙන් ප්‍රතිකාර කරන්න අවශ්‍ය සම්පූර්ණ සුදුසුකම සහ හැකියාව ලැබෙනවා. වාණිජමය කාරණයක් කියන්නේ, ආරෝග්‍යශාලාවක් පිහිටුවීම වාගේ අවස්ථාවකදී ඔහු විසින් ආයුර්වේද හෝ -ඒ කියන්නේ, පාරම්පාරික හෝ උපාධිධාරියෙක්- කවුරු හෝ වෛද්‍යවරයෙකු සම්බන්ධ කරගෙන තමයි මේ වෘත්තිය සිද්ධ කරන්න ඕනෑ. ඒ, රෝහල් පිහිටුවද්දි. හැබැයි, ඔවුන්ට ප්‍රතිකාර කරන්න, මුදලක් ලබා ගන්න, බුලත් අතේ තියලා පිළිගැනීමක් ලබා ගන්න බාධාවක් නැහැ. ඒ වෛද්‍ය ක්‍රමය එලෙසින් පිළිගන්නවා. ඔබතුමා වාගේම අපිත් මේ රටේ ඉතිහාසයේ පටන් පැවැති පාරම්පරික වෙදකමට, හෙළ වෙදකමට පක්ෂයි. අබ මල් රේණුවක තරමින්වත්, අංශු මාත්‍රයකින්වත් මේ පනත් කෙටුම්පත තුළින් එම වගන්ති ගැන කථා කරලා නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

අපි මුල ඉඳලාම ඔබතුමාගෙන් ඉල්ලුවා, "චිකිත්සා" කියන වෛද්‍ය ප්‍රතිකාර ක්‍රමය "ආයුර්වේද" යන්නට ඇතුළත් කරන්න කියලා. හෙළ වෙදකම සහ සියල්ලම ඒකෙන් ආරක්ෂා වනවා, ගරු රාජ්‍ය ඇමතිතුමනි. "වෛද්‍ය චිකිත්සා" කියලා තමයි කලින් පනතේ තිබුණේ. අපි ඒක දිගින් දිගටම ඉල්ලා සිටියා. මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි, "වෛද්‍ය චිකිත්සා" කියන ක්‍රමය මෙයට අන්තර්ගතද කියලා.

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)

ඒක තිබෙනවා; අන්තර්ගතයි. ඔබතුමා ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පතේ 30වන පිටුව බලන්න. එහි 89 වන වගන්තිය සංශෝධනය යටතේ මෙසේ තිබෙනවා:

" 'ආයුර්වේද' යන්නට, ආයුර්වේද සිද්ධි යුනානි සහ යෝග සහ දේශීය චිකිත්සා ඖෂධ ප්‍රතිකාර ක්‍රම..."

සියලු දේශීය චිකිත්සා ක්‍රම ඇතුළත්. සියලු දේශීය ප්‍රතිකාර ක්‍රම ඇතුළත්. සියලු පාරම්පරික ප්‍රතිකාර ක්‍රම ඇතුළත්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, සියලුදෙනා ඉල්ලන තවත් කාරණයක් තමයි දේශීය වෛද්‍ය සභාවක් ස්ථාපිත කරන්න කියන කාරණය. මොකද හේතුව, දේශීය වෛද්‍ය සභාව ස්ථාපිත කළායින් පස්සේ දේශීය හෙළ වෙදකමට ශක්තියක් ලැබෙනවා. දැන් ඔබතුමන්ලා සිදු කර තිබෙන මේ ක්‍රියාදාමය තුළ, ආයුර්වේද වෛද්‍යවරුන් විසින් ක්‍රියාත්මක කරනු ලබන, පාලනය කරනු ලබන තැනකට දේශීය හෙළ වෙදකම තල්ලු වෙයි කියන බියක් ඔවුන්ට තිබෙනවා. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨය හැදුවේම මේ රටේ දේශීය වෛද්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නයි. නමුත්, අද සිද්ධ වෙන්නේ ඒක නොවෙයි. ඒ ගැන කියන්න කරුණු ගණනාවක් තිබෙනවා. මගේ කථාවේදී ඒ කරුණු මතු කරන්නම්.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, අද මේ තිබෙන ක්‍රියාදාමය හරියට ක්‍රියාත්මක කරන්න පුළුවන් නම්, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨය හදන්න අපි වෙච්ච මහන්සියේ අරමුණ හරියට ක්‍රියාත්මක කරන්න පුළුවන් නම්, දේශීය වෛද්‍ය සභාවත් සම්බන්ධ කරලා දේශීය හෙළ වෙදකම ක්‍රියාත්මක කරන්න ඔබතුමාට ලොකු ශක්තියක් ලබා දෙන්න පුළුවන් වෙයි.

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව ඕනෑ. ගරු මැති, ඇමතිතුමන්ලාට එතුමන්ලාගේ වෙලාවේ දී ඒ කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. මම ඒ ප්‍රශ්නවලට උත්තර දීමට සූදානමින් සිටිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු රාජ්‍ය ඇමතිතුමාගේ පැහැදිලි කිරීමෙන් පස්සේ කථා කළා නම් හරි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)

මේ පනත් කෙටුම්පතෙහි මූලික අරමුණු ටික ඉදිරිපත් කරලා කාරණයට අදාළව මම කථා කරනවා. ඔබතුමන්ලාගේ අවස්ථාවලදී ඒ කරුණු ඉදිරිපත් කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒ නිසා දැන් මේ පනත් කෙටුම්පත ගැන පැහැදිලි කරන්න මට අවස්ථාව ලබා දෙන්න. මේ පනත් කෙටුම්පතේ මැදින් අල්ලාගන්න එපා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව අවසන් වුණාට පස්සේ එතුමන්ලාගේ වෙලාවේ දී එතුමන්ලාට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු රාජ්‍ය ඇමතිතුමා ඉල්ලීමක් කරනවා, එතුමාගේ පැහැදිලි කිරීම කරන්න අවස්ථාව දෙන්න කියලා. පස්වරු 12.30ට දිවා ආහාර විවේකය සඳහා සභාවේ කටයුතු තාවකාලිකව නවත්වනවා. ඒ නිසා ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කරුණු පැහැදිලි කරන්න.

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)

මේ සංශෝධන යටතේ ගෙනෙන යෝජනා මොනවාද කියලාවත් කරුණු ඉදිරිපත් කරන්න මට අවස්ථාව දෙන්න. මේ සියලු ප්‍රශ්නවලට පිළිතුරු සූදානමින්, මේ පනත් කෙටුම්පත ගැන දීර්ඝ අධ්‍යයනයකින් පසුව තමයි මේ සංශෝධන කරන්නේ.

[ගරු නිතිඥ සිසිර ජයකොඩි මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෛද්‍යවරුන්ගේ සම්මේලන කිහිපයක් තිබෙනකොට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට අලුතින් විශ්වවිද්‍යාල නියෝජිතයෝ පස්දෙනෙක් විතර පත් වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එසේ නියෝජිතයෝ පස්දෙනෙක් විතර පත් වුණාම පාරම්පරික වෛද්‍යවරුන්ගේ නියෝජනය අබිබවා උපාධිධාරී ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සංයුතියේ වැඩිවීමක් වෙනවා. අපි ඒක තේරුම් ගත්තා. පාරම්පරික වෛද්‍යවරුන්ගේ රජයේ පිළිගත් සම්මේලන තිබෙනවා. ඉන් එකක් තමයි ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයෙන් පිට වෙච්ච වෛද්‍යවරුන්ගේ සම්මේලනය. එහි හීන්නිලමේ වෙද මහත්තයා ඇතුළු මේ රටේ පාරම්පරික වෛද්‍යවරු විශාල පිරිසක් ඉන්නවා.

තවත් පාරම්පරික වෛද්‍යවරුන්ගේ සම්මේලනයක් තිබෙනවා - ඒක සේන බණ්ඩාර වෙද මහත්තයා සහ අනුරාධපුරයේ ගුණවර්ධන වෙද මහත්තයා නියෝජනය කරන සම්මේලනලයක්. මේ සම්මේලනවලින් වෛද්‍යවරු නම් කරලා එච්චාම අමාත්‍යවරයාට බලතල තිබෙනවා, ඒ අයගෙන් තෝරාගත් පිරිසක් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට නම් කරන්න. එතකොට එහි පාරම්පරික වෛද්‍යවරුන්ගේ නියෝජනයක් තිබෙනවා. අමාත්‍යවරයාට මීට පෙර මේ සභාවට වෛද්‍යවරුන් නොවන අය පත් කරන්න පුළුවන් තුන්දෙනායි. මේ කාරණය ඔස්සේ අපි සලකා බැලුවා, මේ වෛද්‍ය සභාව තුළ ආයුර්වේද වෛද්‍යවරුන්ගේ සංයුතිය වැඩියි, පාරම්පරික වෛද්‍යවරුන්ගේ සංයුතිය අඩුයි කියන එක. මේ පාරම්පරික වෛද්‍යවරුන්ගේ සම්මේලනයටත්, අමාත්‍යවරයාගේ අභිමතය පරිදි සාමාජිකයන් 12දෙනෙකු පත් කරන්නත් අමාත්‍යවරයාට බලය තිබෙනවා. ඒ නිසා එය වටහාගෙන අපි ඒ බලය ලබා ගත්තා.

ඒ අනුව, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට පත් වෙන අය අතරට යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ නියෝජිතයකු පත් වෙන්න ඕනෑ. ඔවුන් උපාධිධාරී වෛද්‍යවරු බිහි කරනවා, ඔවුන්ගේ නියෝජනයක් නැතුව. මේ වාගේ සීමිත පිරිසක් අතර වෛද්‍ය සභාවක් ක්‍රියාත්මක වෙන්නේ කොහොමද? ඒ නිසා ඒ අයටත් නියෝජනය ලබා දෙනවා වාගේම, පාරම්පරික වෛද්‍යවරුන්ගේ මුළු නියෝජනය 12 දක්වා වැඩි කිරීම මේ සංශෝධනයෙන් කරනවා. ඔබතුමන්ලා වාගේම අපිත් පාරම්පරික වෛද්‍ය ක්‍රමයට ආදරෙයි. ඒ නිසා අපි හොඳින් තේරුම් අරගෙන මේ වෛද්‍ය සභාවේ සංයුතියේ යම් ගැටලුවක් ඇති වෙනවා නම්, ඒ සඳහා පාරම්පරික වෛද්‍යවරුන්ගේ පැත්ත බර කිරීම සඳහා අවශ්‍ය යම් සමතුලිතතාවක් ඇති කරන්න කටයුතු කර තිබෙනවා. මේ නියෝජනය විශ්වවිද්‍යාල විසින් ඉල්ලනවා නම්, උපාධිධාරින් විසින් ඉල්ලනවා නම්, පර්යේෂණ වාර්තා කරනවා නම්, අලුතින් ආරෝග්‍යශාලා ඇති වෙනවා නම් ඒ ආරෝග්‍යශාලාවලට අලුත් ප්‍රතිකාර ඒකක රටේ ඇති වෙනවා. ඒවා කාර්යක්ෂම කරන්න ඕනෑ. ඒවා පිළිගන්න අවස්ථා වැඩි කරන්න ඕනෑ. දකුණේ හෝටල් ක්ෂේත්‍රය තුළ අලුත් ආයුර්වේද රෝහල් පද්ධති ඇති වෙනවා. ඒ නිසා මේ පවතින ව්‍යුහයට වඩා මේ ව්‍යුහය පුළුල් කරලා වැඩි අවස්ථාවක් දුන්නොත් තමයි දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය කර්මාන්තයක් වශයෙන් ප්‍රවර්ධනය කරන්න පුළුවන්කම ලැබෙන්නේ. ඒ නිසා ප්‍රතිකාර ක්‍රම වර්ධනය කරන්නත්, කර්මාන්තයක් වශයෙන් වර්ධනය කරන්නත් අවශ්‍ය කාර්යක්ෂමතාව ඇති කරන්නත්, ඒ සඳහා නිපුණතාවෙන් යුතු අය ඉස්සරහට ගන්නත් තමයි මේ සංශෝධන අපි ඉදිරිපත් කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමන්ලා සියලුදෙනා දන්නවා, ඉතා විවාද සම්පන්න කාරණයක් මේ සංශෝධන මඟින් අපි ඉදිරිපත් කරන බව. ඔසු උයන් සහ ඔසු වගා කිරීම සඳහා වූ යෝජනාවක් අනෙක් සංශෝධනය මඟින් ඉදිරිපත් කරනවා. ගරු ජනාධිපතිතුමා විසින් පසුගිය අය වැය යෝජනාවල දීත් ඉදිරිපත් කරන ලද පරිදි ඖෂධීය කංසා වගා කිරීමට අවශ්‍ය අනුමැතිය ආයුර්වේද නීති සංග්‍රහයේ ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කරන්න ඉදිරියේ දී බලාපොරොත්තු වෙනවා.

නමුත්, ඒ වාක්‍යය මේ පනත් කෙටුම්පතේ නැහැ. මේ පනත් කෙටුම්පතේ තිබෙන්නේ, ඔසු උයන් හෝ ඔසු වගා සම්බන්ධයෙන් පමණයි. මෙතැනදී අපි ඉතාම ප්‍රවේශම් වෙලා තිබෙනවා, රටට හානියක් නොවෙන්න කටයුතු කරන්න. එය දීර්ඝව කළ සාකච්ඡාවක ප්‍රතිඵලයක්. මේ පනත් කෙටුම්පතට අපි ගෙනෙන සංශෝධනවල ඔසු වගාව අර්ථ දක්වා තිබෙනවා, "ආයුර්වේද ඖෂධ සංග්‍රහයේ නියම කරන ලද ආයුර්වේද කාර්යය සඳහා වන යම් ඖෂධීය ශාක වගාවක් අදහස් වන අතර එයට, වාණිජමය කාර්යය සඳහා යොදා ගැනෙන එවැනි වගාවක ඵලදාව, අස්වැන්න හෝ අවශේෂ ද අයත් වේ" යනුවෙන්. එහි අපි පැහැදිලිවම සඳහන් කරලා තිබෙනවා, ආයුර්වේද කාර්යය සඳහා වන යම් ඖෂධීය ශාක යනුවෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉන්දියානු රජය තීරණය කරලා තිබෙනවා, 2027න් පසුව අමුද්‍රව්‍ය වශයෙන්, ශාකමය වශයෙන් ලෝකයට ඖෂධ අපනයනය කරන්නේ නැහැ කියලා. ඉන් පසුව ඔවුන් නිස්සාර ද්‍රව්‍ය වශයෙන් පමණයි බෙහෙත් අපනයනය කරන්නේ. එහෙම වුණොත්, අපේ දේශීය වෙදකම නැති වෙනවා; පාරම්පරික වෙදකම නැති වෙනවා. තවමත් අපි වාණිජමය වශයෙන් අපේ පාරම්පරික ඖෂධ වවන්නේ නැහැ. විශේෂයෙන්ම ඉන්දියාව ඒ තීන්දුව ගත්තොත් සහ අපේ රටේ වැවිය හැකි ඖෂධ අපි වගා නොකර හිටියොත්, අපට මුහුණ දෙන්න වෙන ඉදිරි කාල පරිච්ඡේදය ඉතා භයානක වෙනවා. ඒ නිසා මේක මේ කංසා සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි. අපේ රටේ වැවෙන ඖෂධ වාණිජමය වශයෙන් වගා කිරීමට අවසර දෙන්න ඕනෑ. අපි දන්නවා, රුපියල් 400ට තිබුණු තිප්පිලි කිලෝවක් අද රුපියල් 9,000ක් පමණ වන බව. වී වගා කරන පහත් බිම් ප්‍රදේශවල තිප්පිලි ඉතා සුලබව වැවෙනවා. නමුත්, වාණිජමය වශයෙන් කවුරුවත් එම ඖෂධය වගා කරන්නේ නැහැ. කෙනෙක් ඇවිල්ලා අපට කිව්වා, මාසයකට පොල්පලා කන්ටේනරයක් රට යවන්න ඔහු ලෑස්තියි කියලා. ඉතින් අපි ඒ ගැන හොයා බැලුවා. තැන් තැන්වලින් පොල්පලා ගැලෙව්වාම කන්ටේනරයක් තියා ටොන් එකක්වත් හොයා ගන්න බැහැ. එම නිසා මේ දේවල් වාණිජමය වශයෙන් වගා කළොත් පමණයි රටට ආර්ථිකමය වශයෙන් ඵලදායි වෙන්නේ. බොහෝ ශාක අපේ රටේ වැවෙද්දී අපි පිට රටින් ගෙන්වනවා. වාණිජමය වශයෙන් රට තුළ ඒ ශාක වගා කරන්නේ නැහැ. ඒ නිසා කංසාවලට පමණක් මේ කාරණය අදාළ කර ගන්න එපා. මොකද, ඖෂධ වර්ග රාශියක් මේ වෙනකොට අපි ආනයනය කරනවා. ඒ නිසා අපට අවශ්‍ය වෙලා තිබෙනවා, වාණිජමය කර්මාන්තයක් විධියට මේ ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කරන්න. එහෙම නැත්නම් අපේ දේශීය සහ පාරම්පරික වෙදකම නැති වෙලා යනවා. අපට අවශ්‍ය බොහෝ ශාක වර්ග අපි වගා කරන්නේ නැහැ. අපි බණින්න විතරයි ඉන්නේ. අලුතෙන් දෙයක් කරන්න හැදුවොත් ඒකට විරුද්ධ වෙන්න විතරයි ඉන්නේ. නිදහස් අධ්‍යාපන පනත ගෙනාපු වෙලාවේ, නිදහස් අධ්‍යාපනය ඇති කරන්න ගිය වෙලාවේ නිදහස් අධ්‍යාපනය නැති කරනවා කියලා පෙළපාළි ගිය රටක් තමයි අපේ රට. අපි මේ කටයුතු කරන්නේ, පාරම්පරික වෙදකම රැක ගන්නයි. ඒ සඳහා අපි ඖෂධ වගා කරන්න ඕනෑ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාත් ගියා නේද? අපි ඔක්කෝම ගියා නේ.

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)

කොහේටද? *[බාධා කිරීමක්]* මම මේ කථා කළේ, 1947දී නිදහස් අධ්‍යාපන පනත ගෙනා අවස්ථාවේ වූ සිදුවීමක් ගැන. එහෙම නැතුව ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට විරුද්ධව පෙළපාළි ගිය එක ගැන නොවෙයි. දයාසිරි ජයසේකර මැතිතුමා කියන, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා එළවන්න පෙළපාළියේ ඉස්සරහින් ගිය එක ගැන නොවෙයි මම කිව්වේ. 1947දී නිදහස් අධ්‍යාපන පනත ගෙනා අවස්ථාවේ වූ සිදුවීමක් ගැනයි මම කිව්වේ. අපට අලුත් දෙයක් කරන්න ඉඩ දෙන්නේ නැහැ. ආයුර්වේද දෙපාර්තමේන්තුව අකර්මණ්‍ය ලු, ඒකට පිළිගැනීමක් දෙන්නේ නැහැ ලු, අලුත් බෙහෙත් අනුමත කරන්නේ නැහැ ලු. හැබැයි කාර්යක්ෂම කරන වැඩ පිළිවෙළක් ගැන කථා කළොත්, සංවාදශීලිව ඒකට එකඟ වීම පිළිබඳ ප්‍රශ්නයක් මේ ගරු පාර්ලිමේන්තුව තුළ තිබෙනවා. එය අපි වෙනස් කර ගත යුතුයි. අපි ඔක්කෝම එකතු වෙලා එය වෙනස් කරමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම තවත් විවාද සම්පන්න කාරණයක් තිබෙනවා. ආයුර්වේද වෘත්තිකයන් සඳහා අපි ලියාපදිංචිය ලබා දෙනවා. විශේෂයෙන්ම ආයුර්වේද සම්බාහන ශිල්පීන් සහ ශිල්පිනියන් සඳහා NVQ Level 4 පුහුණුවක් ලබා දීලා ලියාපදිංචිය ලබා දෙන්න අපි අදහස් කරනවා. අපි ඒක කරන්නේ සද්භාවයෙන්. ලංකාවේ හෝටල් කාමර 42,000ක් පමණ තිබෙනවා. ඒ අතර ආයුර්වේද කාමර 5,000ක් තිබෙනවා. නමුත්, ලාභ ලබන්නේ ආයුර්වේද කාමරවලින්. ජර්මනියෙන් එන විදේශිකයෙකුට දවස් 14ක් ප්‍රතිකාර කළොත්, රුපියල් ලක්ෂ 10ක් ඉක්ම වූ මුදලක් ගෙවනවා.

හැබැයි ප්‍රතිකාර කරනකොට ඔවුන් අහනවා, මේ සම්බාහන ශිල්පීන්ට ශිල්පිනියන්ට තිබෙන සුදුසුකම මොකක්ද කියලා. එතකොට ඒකට කියන්න දෙයක් ඒ අයට නැහැ. අද විපක්ෂ නායකතුමා කිව්වා, skills තිබෙන වෘත්තිකයන් බිහි කරන්න ඕනෑ කියලා. ඒ නිසා අපි යෝජනා කර තිබෙනවා, NVQ Level 4 මට්ටමේ පුහුණු පාඨමාලා ආරම්භ කරන්න. අපි මේ කියන්නේ spa ගැන නොවෙයි. මේ රටේ ඉගෙන ගත්ත දරුවන්ට විදේශ රටවලට යන්න නම් යම් වෘත්තීය සුදුසුකමක් තිබෙන්න ඕනෑ. එ් නිසා අපි දැනටමත් වගකීම් සහගතව NVQ Level 4 මට්ටමේ පුහුණු පාඨමාලා ආරම්භ කර තිබෙනවා. ඒ සඳහා තෝරා ගත් ආයතනවලට අවසර දීලාත් තිබෙනවා. හැබැයි, ලබා දෙන සහතිකයේ "ආයුර්වේද" කියන වචනය තිබෙන්න ඕනෑ. මොකද, පිටරටවල් ඒක ඉල්ලනවා. සම්බාහන ශිල්පීන්, ශිල්පිනියන් හැටියට පුහුණුවක් ලබාගෙන ඒ කාර්යය සතුටින් කරන්න කැමැති අය වෙනුවෙන් වෘත්තීය සුදුසුකමක් සැකසීම සඳහා අපි රටක් විධියට එකතුවෙලා, අලුතින් හිතලා යමක් කරන්න ඕනෑ කියලා මම විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණා ඉදිරිපත් කරද්දී විශේෂයෙන්ම මතභේදයට තුඩුදෙන විවාද සම්පන්න කාරණා තිබෙන නිසාත්, ඒවාට දණ්ඩන පැවරීමටත් අපි යෝජනා ඉදිරිපත් කර තිබෙනවා. ඒවා සකස් කළේ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඒවාට එකඟ නොවෙනවා නම්, ඉදිරිපත් කර තිබෙන සංශෝධන ඕනෑම අවස්ථාවක ඉල්ලා අස්කර ගන්න අපි සූදානම්. ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ. නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවත්, නීතිපති දෙපාර්තමේන්තුවත් අවසර දෙනවා නම්, ඒවා ඉවත් කර ගන්න අපි සූදානම්.

අපි මේ රටේ පාරම්පරික වෛද්‍යවරුන්ට කිසිම අගතියක් වෙන්න ඉඩ දෙන්නේ නැහැ. අපි ඒ අය අමතක කරන්න නරකයි. අද පාරම්පරික වෛද්‍යවරු සඳහා සභාවක් ඉල්ලනවා. හැබැයි අපි පිළිගන්න ඕනෑ, ආයුර්වේද වෛද්‍ය සභාවේ සිටින උපාධිධාරියෙකුගේ තත්ත්වයටම පාරම්පරික සර්වාංග වෙද මහත්මයාත් පත් කළ යුතු බව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යම් පරීක්ෂණයක් අවශ්‍ය වෙනවා, වෛද්‍ය වෘත්තියට පිවිසෙන්න. ඒ සඳහා අපි පහසුකම් සපයා තිබෙනවා. අවුරුදු 45ට වැඩි අයට දැන් වාචික පරීක්ෂණයක් විතරයි පවත්වන්නේ. මෙතෙක් කල් පැවතුණේ ලිඛිත විභාගයක්. පාරම්පරික කැඩුම් බිඳුම් වෛද්‍යවරයෙක් තමයි ඒ සම්මුඛ සාකච්ඡාවේදී ප්‍රශ්න අහන්නේ. හැබැයි, පරීක්ෂණයක් කරන්න ඕනෑ. අපි දන්නවා, සමහර විදේශ රටවලින් වෛද්‍ය උපාධිය ලබාගෙන එන අයට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෙන්න අවස්ථාව දෙන්නේ නැහැ කියලා. නමුත්, අපි එහෙම කරන්නේ නැහැ. වෛද්‍යවරයෙක් බවට පත් කරන්න නම්, පරීක්ෂණයක් කරන්න ඕනෑ. පරීක්ෂණ කරන්නේ නැතිව බොරුවට හදාගත්ත සභාවලින් ඒ කටයුතු සිදු කිරීම තුළින් කපාරම්පරික වෛද්‍යවරුන්ටත්, රටටත් හානියක් සිද්ධ වෙනවා. මේ ක්ෂේත්‍රයේ ඉන්න අවුරුදු 70ට වඩා වැඩි පාරම්පරික වෛද්‍යවරුන්ගේ ගෙවල්වලට ගිහිල්ලා ඒ අයගේ සුදුසුකම් අනුව ලියාපදිංචිය ලබා දෙන්න අපි අවස්ථාවක් සලසා දී තිබෙනවා. ඒ ආකාරයට අපි ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ ලියාපදිංචියට අදාළ ගැටලු විසඳන්න උත්සාහ කරලා තිබෙනවා.

ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රයේ ගුණාත්මකභාවය වෙනුවෙන් විකල්ප සභා ඇති කිරීම තුළින් අපි සිද්ධ කරන්නේ රටට අවැඩක්. මේ තිබෙන ප්‍රශ්න හොඳටම ඇති. ඒ නිසා මේ ප්‍රශ්න තවදුරටත් අවුල් කරන්නේ නැතිව, මේ ක්ෂේත්‍රය නඟා සිටුවීම සඳහා ගෙනෙන ලද සංශෝධනවලට පක්ෂව ඡන්දය ලබා දෙන්න කියලා ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

දිවා ආහාර විවේකය සඳහා පාර්ලිමේන්තුවේ කටයුතු පස්වරු 1.00 දක්වා අත් හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා 1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

විපක්ෂය වෙනුවෙන් විවාදය ආරම්භ කිරීමට, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා.

ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.00]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1961 අංක 31 දරන ආයුර්වේද පනත මඟින් ආයුර්වේද වෛද්‍ය දෙපාර්තමේන්තුවක් පිහිටුවීමට එදා කටයුතු කළා. ඒ කාලයේ ආයුර්වේද විද්‍යාව මේ තරම් ශක්තිමත් වෙලා තිබුණේ නැහැ. ඊට අවුරුදු 62කට පසුව ආයුර්වේද වෛද්‍ය විද්‍යාව ඉතා සංකීර්ණ ලෙස ප්‍රචලිත වෙලා තිබෙන මෙවන් වෙලාවක මෙම සංශෝධන ගෙන එන එක ගැන අපි සන්තෝෂ වෙනවා. නමුත් මේ සංශෝධන ප්‍රමාණවත් නැහැ. මෙකෙන් බොරුවක් තමයි කරන්නේ. අවශ්‍ය සංශෝධන නොවෙයි මේ කරන්නේ කියන එක තමයි අපට මේ සංශෝධන

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

දැක්කාම පැහැදිලිව පෙනෙන්නේ. එදා 1961 අංක 31 දරන පනත ගෙනෙන කොට ශ්‍රී ලංකාව තුළ තිබුණේ එකම ආයුර්වේද රෝහලයි. නමුත් දැන් ආයුර්වේද රෝහල් 101ක් තිබෙනවා. මධ්‍යම බෙහෙත් ශාලා 250ක් තිබෙනවා. නිදහස් බෙහෙත් ශාලා 245ක් තිබෙනවා. නමුත් ඒවා ගැළපෙන විධියට ශක්තිමත් කරලා නැහැ. ඒ විතරක් නොවෙයි. නව අංශ වශයෙන් ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය සේවයක් ආරම්භ කරලා තිබෙනවා. දේශීය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන තිබෙනවා. එදා ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද විද්‍යාලය විශ්වවිද්‍යාලයක් මට්ටමට තිබුණේ නැහැ. නමුත් අද විශ්වවිද්‍යාල මට්ටමින් එවැනි ආයතන හතරක් තිබෙනවා. ඔසු උයන් අක්කර 300කට වඩා තිබෙනවා.

අවුරුදු 62කට පසුව ගෙනාපු මේ සංශෝධන ආයුර්වේද වෛද්‍ය විද්‍යාවට ගැළපෙන ආකාරයේ සංශෝධන විධියට අපට පෙනෙන්නේ නැහැ. රාජ්‍ය ඇමතිතුමා අටපට්ටම් කරලා, රවුම් කරලා ලස්සන ලස්සන සුරංගනා කථා කිව්වා, මේ ගැන. නමුත් මේ පනත් කෙටුම්පතේ අන්තර්ගතය දිහා බැලුවාම ඔය කියන සුරංගනා කථා මෙකෙන් පිළිබිඹු වෙන්නේ නැහැ. මෙක නංගි පෙන්නලා අක්කා දෙනවා වාගේ වැඩක්. අක්කත් නොවෙයි දීලා තිබෙන්නේ, ආච්චි. අක්කා දීලා නම් කමක් නැහැ. සමහර අවස්ථාවල මේ පනත සංශෝධනය වෙලා තිබෙනවා. ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය ආරම්භ කරන වෙලාවේ පොඩි පොඩි සංශෝධන සිදු වුණා. ඒ වාගේ පොඩි සංශෝධන වුණා මිසක් පසුගිය අවුරුදු 62ටම ක්‍රමානුකූලව සංශෝධනයක් වෙලා නැහැ. 1961 ආයුර්වේද පනත වර්තමානයේ විශාල සංශෝධනයකට මෙන්ම අදට ගැළපෙන පරිවර්තනයකට යා යුතුයි කියන එක අපි පිළිගන්නවා. සංශෝධනයක් අවශ්‍යයි. අපි ඒක පිළිගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1961දී මේ ආයුර්වේද පනත හදන කොට විශ්වවිද්‍යාල ආයුර්වේද උපාධිධාරීන් හිටියේ නැහැ. ආයුර්වේද වෛද්‍ය ශිෂ්‍යයෝ හිටියේ නැහැ. එදා පාරම්පරිකව කරගෙන ආපු, එහෙම නැත්නම් වික්‍රමාරච්චි ආයුර්වේද විදුහලෙන් ඩිප්ලෝමා වාගේ සහතික ගත්ත අය තමයි හිටියේ. නමුත් අද සහමුලින්ම වෙනස් තත්ත්වයක් තිබෙන්නේ. අද බටහිර වෛද්‍ය විද්‍යාව පරයන තරමට අපේ රට තුළ ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය පුළුල් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගංජා වගාවත්, සම්බාහනය තුළින් ගණිකා වෘත්තියත් ගෙනෙන්න, ඇමතිවරයා විසින් නිලධාරීන් පාලනය කරන්න, මර්දනය කරන්න මේ සංශෝධන කරලා තිබෙන බවයි අපට පෙනෙන්නේ. එහෙම නැතුව මේක සමස්ත ආයුර්වේදය ගැන කථා කරන පනත් කෙටුම්පතක් නොවෙයි කියන එක අපි පැහැදිලිව කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආයුර්වේද වෛද්‍ය විද්‍යාව කියන්නේ රාජ්‍ය අනුග්‍රහය ඇතුව ශ්‍රී ලංකාව තුළ පවතින සමාන්තර වෛද්‍ය ක්‍රමයක්. එය රෝග නිවාරණය, රෝග ප්‍රතිකාර කියන දෙකම යටතේ විද්‍යාත්මක පසුබිමක් සහිතව අපේ රටේ ක්‍රියාත්මක වෙනවා. නමුත් කනගාටුවට කරුණක් වන්නේ, මේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය අපේ රටේ ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්ති තුළට ඇතුළු කරලා නැති එකයි. අපේ රටේය කියලා මෙච්චර පුරසාරම් දොඩවන දේශීය ආයුර්වේද වෛද්‍ය ක්‍රමය රටේ ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියට එකතු කරලා නැහැ. එහෙම නොකර තමයි මේ වෙන වෙන සෙල්ලම් දාන්න හදන්නේ. ඒ නිසා අපි කියනවා, ප්‍රථමයෙන්ම ආයුර්වේද වෛද්‍ය ක්‍රමය අපේ රටේ ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියට ඇතුළු කරන්න කියලා. ඇයි ඇතුළු කරන්න බැරි?

2017 වර්ෂයේදී ඉන්දියාව ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තියට ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ඇතුළු කළා. ගරු ඇමතිතුමනි, ඒ ගැන දැන ගන්න ඕනෑ නම් ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් තොරතුරු ගන්න පුළුවන්.

තවත් හාස්‍යයට කරුණක් වන්නේ මෙයයි. ලෝකයේ කිසිම රටක් දේශීය වෛද්‍ය ක්‍රමයක තිබෙන වෛද්‍ය අධ්‍යාපනය, ඖෂධ නියාමනය, වෛද්‍ය සේවාව එකම පනතකින් ඉදිරිපත් කරලා නැහැ. බටහිර වෛද්‍ය විද්‍යාවේ බැලුවත් ඒවාට වෙන වෙනම පනත් හදලා තිබෙනවා. ඒකයි අපි කියන්නේ, 1961 පනතට සංශෝධන ටිකක් ගෙනැල්ලා පොඩි පොඩි සුකුරුත්තං ටිකක් දාලා ඒක අස්සේ ආයුර්වේද වෛද්‍ය විද්‍යාව විකුණාකමින් ගංජා වගාව, කංසා වගාව ප්‍රචලිත කිරීමේ වැඩ පිළිවෙළක් හා සම්බාහනය තුළින් ගණිකා වෘත්තිය කරන්න කටයුතු කරනවා කියලා.

ඒවා කළාට කමක් නැහැ. සම්බාහනය කියන්නේ ආයුර්වේදයේ ඉතා වැදගත් ශිල්ප ක්‍රමයක්. ඒක ඉතා වැදගත් ශිල්ප ක්‍රමයක්. නමුත්, ධම්මික පැණිය ගෙනාවා වාගේ ආයුර්වේදයත් විනාශ කරන වැඩ පිළිවෙළක් තමයි මේ සංශෝධන පනත් කෙටුම්පතින් කරන්න හදන්නේ. යටි අරමුණ වෙනස් විධියකට ක්‍රියාත්මක කරන්නයි මේ හදන්නේ කියන එක මම විශේෂයෙන්ම කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පනත ශක්තිමත් කරන්න නම්, මෙම කටයුත්ත කරන්නේ සද්භාවයකින් නම්, මේ පනත් කෙටුම්පත අද සම්මත කරන එක නවත්වලා හරියට වැඩේට බහින්න කියලා මම කියනවා. ඔබතුමන්ලා කිව්වාට, විශේෂඥ වෛද්‍යවරුන්, වෘත්තීය නිපුණතා තිබෙන අය එකතු කරගෙන නොවෙයි මෙම කටයුත්ත සිදු කළේ. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, මගේ කථාවට බාධා කරන්න එපා කියලා. හැබැයි, ඔබතුමා කථා කරන වෙලාවට මේ පනත් කෙටුම්පත හදපු කණ්ඩායම කවුද කියලා නැවත වතාවක් මේ ගරු සභාවට හෙළි කරන්න. කවුරු එක්කද මේ කටයුත්ත කළේ කියන එක හෙළි කරන්න.

ගංජා ව්‍යාපාරිකයෝ ටිකයි, තවත් ව්‍යාපාරිකයෝ ටිකකුයි, සම්බාහන මධ්‍යස්ථානවල ගණිකා වෘත්තිය කරන්න යන කණ්ඩායමකුයි එකතු වෙලා සංචාරකයන් ගෙන්වා ගන්න හදන වැඩ පිළිවෙළක් මිසක්, සමස්ත ආයුර්වේදය ඉස්සරහට ගැනීමේ, ශක්තිමත් කිරීමේ වැඩ පිළිවෙළක් අපි මේ තුළින් දකින්නේ නැහැ. ඒ හින්දා අපි කියනවා, වෛද්‍ය අධ්‍යාපනය හා වෘත්තීය නියමයන් විධිමත් කිරීම සඳහා එක පනතක් ගෙනෙන්න කියලා. පාරම්පරික වෛද්‍යවරුන් උපාධිධාරී මට්ටමට ගෙන යන ක්‍රමයක්, තවත් වැඩ පිළිවෙළක් එම පනතට ඇතුළත් කරන්න.

එදා, 1961දී මේ පනත හදන කොට උපාධිධාරී ආයුර්වේද වෛද්‍යවරුන් හිටියේ නැහැ. එදා පනත හැදුවේ එදා තත්ත්වයට ගැළපෙන ආකාරයට. නමුත් අද ආයුර්වේද උපාධිධාරීන් ඉන්නවා. එ් වාගේම ශක්තිමත්ව වැඩුණු පාරම්පරික වෛද්‍ය පරපුරකුත් ඉන්නවා. ඒ නිසා පාරම්පරික වෛද්‍යවරුන් සහ උපාධිධාරීන් කියන කණ්ඩායම් දෙක සම මට්ටමින් ගැනෙන ආකාරයේ වැඩ පිළිවෙළක් මේ තුළ තිබෙන්න ඕනෑ, යන්ත්‍රණයක් තිබෙන්න ඕනෑ. ඒ මට්ටමට කෙනෙකු ගෙනෙන්නේ කොහොමද කියලා මේ පනත් කෙටුම්පතේ සඳහන් වෙන්නේ නැහැ. ඒ වාගේම ආයුර්වේද සෞඛ්‍ය සේවා සැපයීමට, ආයුර්වේද දෙපාර්තමේන්තුව පිහිටුවීමට වෙනම පනතක් ඕනෑ. බටහිර

වෛද්‍ය විද්‍යාවේ තිබෙන්නේත් එහෙමයි. ඒකයි මම කිව්වේ, මේක අස්සේ ඔක්කොම කුරු ගාලා බොරුවක් කරන්න හදනවා කියලා. ඖෂධ නියාමනය සඳහා වෙනම පනතක් ගේන්න ඕනෑ. ඖෂධ නියාමනය සඳහා මේ පුංචි පනතට පොඩි පොඩි කෑලි එකතු කරලා හරියන්නේ නැහැ. ඒ නිසා තමයි සමස්ත ආයුර්වේද වෛද්‍ය විද්‍යාවටම අපකීර්තියක් වන අන්දමින් පසුගිය කාලයේ ධම්මික පැණිය promote කළේ. ඇමතිතුමාත්, රාජ්‍ය ඇමතිතුමාත් ඇතුළු මේ ඔක්කොම අය උත්සාහ කළේ, මිනිස්සු නොමඟ ඇරියේ ධම්මික පැණිය promote කරන්නයි. එවැනි විධිවිධාන මේ පනත තුළ තවමත් ඒ විධියටම තිබෙනවා. ඒකයි අපි කියන්නේ ඖෂධ නියාමනය සඳහා වෙනම පනතක් ඕනෑ කියලා. ඒ සමඟම පෞද්ගලික සේවා ආයතනය ලියාපදිංචි කිරීම සහ නියාමනය කිරීම සඳහාත් පනතක් අවශ්‍යයි කියන එක මම මේ අවස්ථාවේදී කියනවා. මෙම පනත් කෙටුම්පතට හැම එකෙන්ම මැල්ලුම් වාගේ ටික ටික එකතු කරලා, බොරුවක් කරලා, වෙනත් දේවල්වලට යන්න එපා, කෙළින් වැඩේට බහින්න කියලා මම කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශීය වෛද්‍ය විද්‍යාව නිර්මාණය වන්නේ වෛද්‍ය චතුස්පාද මතයි. වෛද්‍යවරයා, ඖෂධ, රෝගියා, උපස්ථායකයා කියන මේ හතර මතයි දේශීය වෛද්‍ය විද්‍යාව නිර්මාණය වෙලා තිබෙන්නේ. ඒ හින්දා එම වැඩ පිළිවෙළ අරමුණු කරගෙන මේ පනත හදන්න. නැතිව වෙන වල්පල් අරමුණු කරගෙන කටයුතු කරන්න එපා කියන එක මම විශේෂයෙන් කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගම්පහ ඉපදිච්ච කෙනෙකු වශයෙන්, ආයුර්වේදය රටට බිහි කරපු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් තුළ තිබෙන ගමක ඉපදිච්ච කෙනෙකු වශයෙන් මම කියනවා, එදා ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද වෛද්‍යවරයා මුළු රටේම කටයුතු කළ බව. ඒ නිසා මට වගකීමක් තිබෙනවා. මම බැඟෑපත්ව ඉල්ලනවා, කරුණාකරලා 1961 ආයුර්වේද පනත සංශෝධනය කරන්න කියලා. හැබැයි, මේ පනත සංශෝධනය කරන්නේ කංසා වැවීම promote කිරීමේ යටි අරමුණකින් වෙන්න බැහැ; සම්බාහන මධ්‍යස්ථාන හරහා ගණිකා වෘත්තිය ඇති කරලා, සංචාරක ව්‍යාපාරය ගෙනෙන්න තිබෙන යටි අරමුණකින් වෙන්න බැහැ. මේ පනත් කෙටුම්පත සම්මත කරන්න ඕනෑ, අද මේ පනත සංශෝධනය කරන්න ඕනෑ, අප රටේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ශක්තිමත් කිරීමටයි. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ශක්තිමත් කිරීමට මෙම පනත සංශෝධනය කරනවා නම්, කරුණාකරලා මේ බොරු වැඩේ තාවකාලිකව -මාසයකට, දෙකකට- නවත්වන්න. අපිත් ඔබතුමන්ලාට උදව් කරන්නම්. ආයුර්වේදය ශක්තිමත් කිරීම සඳහා වන පනත් හතර අපි එකතුවෙලා හදමු. ඒ පනත් හතර ගෙනැල්ලා ආයුර්වේද වෛද්‍ය ක්‍රමය, බටහිර වෛද්‍ය විද්‍යාව වාගේම ශක්තිමත් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1961 ආයුර්වේද පනතේ 5 වන වගන්තිය, 6 වන වගන්තිය, 63 වන වගන්තිය දෙස බැලුවොත් පෙනෙනවා, ඇමතිවරයාට බලය තිබෙන බව නිලධාරියා ලවා වැඩ කරවන්න. ඇමතිවරයාට බලය තිබෙනවා නිලධාරියා පාලනය කරන්න. ඒ වාගේ දේවල් මේ ශතවර්ෂයට ගැළපෙන්නේ නැහැ. අද අපි යහ පාලනය තුළින් කථා කරන්නේ ස්වාධීන කොමිෂන් සභා පිළිබඳවයි. ඒ නිසා කරුණාකර ආයුර්වේද නිලධාරින් පාලනය කිරීමේ බලය, නියාමනය කිරීමේ බලය ඇමතිතුමාගෙන් අයින් කරලා දමන්න ඕනෑ. ඒ සඳහා ස්වාධීන,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මට තව විනාඩි දෙකක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එච්චර වෙලාවක් දෙන්න බැහැ, දැන් අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ඒ වාගේම 80 වන වගන්තියේ සඳහන්ව තිබෙනවා, ඇමතිවරයා කියන දේ නිලධාරින් ඇහුවේ නැත්නම් ඔහු දඬුවමකට ලක් කරන්න, උසාවියට අරගෙන යන්න පුළුවන් කියලා. මම කියනවා, රාජ්‍ය නිලධාරින්ට මීට වඩා ශක්තියක් දෙන පනතක් ගෙනෙන්න කියලා.

අවසාන වශයෙන් මම කියනවා, කොමසාරිස්වරු, නියෝජ්‍ය කොමසාරිස්වරු පත් කරනවා කියලා මහ ලොකුවට කථා කළාට, ඒක විෂයානුබද්ධ නැහැ කියලා. විෂයානුබද්ධ කොමසාරිස්වරු පත් කරන්න. ආයුර්වේද කොමසාරිස්වරු එක්කෙනෙක් නොවෙයි දෙන්නෙක් අවශ්‍යයි. තාක්ෂණය යොදාගෙන වැඩ කරන ගොඩක් ආයතනවලට වෙලා තිබෙන්නේ, SLAS නිලධාරියෙකු ආවාම තාක්ෂණික නිලධාරින් යටපත් වෙන එක. SLAS නිලධාරියෙකු පාලනය සඳහා පත් කරන්න. හැබැයි, තාක්ෂණ විෂය සඳහා වෛද්‍යවරයෙක් ආයුර්වේද කොමසාරිස්වරයා වශයෙන් පත් කරන්නය කියන කාරණයත් මා විශේෂයෙන්ම කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පතෙහි 7.(ආ) වගන්තියෙහි මෙසේ සඳහන් වෙනවා:

> "දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත සහ නියුක්ත වීමට යෝජිත පුද්ගලයන්ට ශිෂ්‍යත්ව සහ වෙනත් පහසුකම් සැපයීම මඟින් ආයුර්වේදය හැදෑරීම හා පර්යේෂණ කිරීම දිරිමත් කිරීම සහ එවැනි ආයතන සඳහා මූල්‍ය ආධාර ප්‍රදානය කිරීම සහ වෙනත් ආධාර සැපයීම"

ඒ මූල්‍යාධාර ලබා දෙන්නේ, දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත සහ නියුක්ත වීමට යෝජිත අයට. කොහොමද මේකට "යෝජිත" කියන වචනයක් ඇතුළත් කරලා තිබෙන්නේ? කවුද යෝජිත අය? ඒ කියන්නේ, කාගේ හෝ හිතේ තිබෙන අයටත් දෙන්න ඒ ආධාර පුළුවන්ද? ඉතින්, මේ පනත් කෙටුම්පත හැදුවේ කවුද කියන එක අපට තේරෙන්නේ නැහැ. මේකේ සත්‍ය අරමුණක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ, බොරුවක් කරන්නේ. ගංජා වවන්න ඕනෑ නම් වෙනම පනතක් ගෙනෙමු, ඖෂධ නියාමන අධිකාරිය පනත තුළ. ගණිකා වෘත්තිය නීතිගත කරන්න ඕනෑ නම් වෙනම පනතක් ගෙනෙමු. ආයුර්වේදය මුවාවෙන් මේ වැඩේ කරන්න එපා. පනත් හතරක් විධියට වෙන වෙනම අරගෙන, අදාළ විෂයන් හරහා කටයුතු කරන්න කියා මම ඉල්ලීමක් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 19ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.12]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදය පැවැත්වුවත්, ඒකට නොවෙයි මගේ අවධානය යොමු කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මගේ අවධානය යොමු කරන්නේ, අද වන විට සමාජ මාධ්‍ය තුළ වාගේම රට තුළ කථා බහට ලක් වන මාතෘකාවක් පිළිබඳවයි. ඒ තමයි, 2019 අප්‍රේල් මාසයේ 21වැනි දා සිදු වූ පාස්කු ඉරුදින ප්‍රහාරය සම්බන්ධයෙන් "Channel 4" කියන නාළිකාව විසින් විනාඩි 5ක වාර්තාමය වැඩසටහනක් එළි දැක්වීමට කටයුතු කර තිබෙන එක ගැන.

දකුණේ සිංහල නායකයෙකු බලයට පත් කරන්න තමයි, මේ පාස්කු ඉරු දින ප්‍රහාරය එල්ල කළේ කියන චෝදනාව තමයි මේ වැඩසටහන හරහා ඉදිරිපත් කරන්නේ. මේ වීඩියෝව ඉදිරිපත් වෙන්නේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ සැසි වාරය ලබන 11වැනි දා පැවැත්වීමට නියමිත පසුබිමක. එම සැසිවාරය පැවැත්වීම පෙනි පෙනී තමයි හැමදාම "Channel 4" එක හැම දාම මේ video clips එළියට දමන්නේ. "Channel 4" නාළිකාව 2012දීත්, 2014දීත්, 2016දීත් වීඩියෝ පට එළියට දැම්මා. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ සැසි වාරය පවත්වන්න ඔන්න මෙන්න තියලා එම නාළිකාව හැම දාම වීඩියෝ එකක් එළියට දමනවා. යුද්ධයේ තීරණාත්මක වෙලාවේ සුදු කොඩි ඔසවාගෙන ආපු අහිංසක දෙමළ ජනතාව ඝාතනය කරපු හමුදාවක් හිටපු රටක් කියලා video clips හදපු "Channel 4" නාළිකාව තමයි මේ කටයුත්තත් කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "Channel 4" නාළිකාව හරහා මේ පැමිණිල්ල ඉදිරිපත් කරන පුද්ගලයා තමයි, හන්සීර් අසාද් මවුලානා කියන පුද්ගලයා. මේ පුද්ගලයා අපේ පාර්ලිමේන්තුවේ ඉන්න සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මන්ත්‍රීතුමාගේ මාධ්‍ය ලේකම් හැටියට හඳුන්වනවා. ඔහු මේ වනකොට ස්විට්සර්ලන්තයේ දේශපාලන රැකවරණ ඉල්ලමින් සිටින පුද්ගලයෙක්. මේ පුද්ගලයා ගැන කථා කරනවා නම්, ඔහුගේ ලංකා බැංකු ගිණුමට 2018 ඉඳලා 2020 වනකල් විදේශ රටවලින් ලක්ෂ 700ක සල්ලි ඇවිල්ලා තිබෙනවා. මේ ප්‍රකාශය කරන පුද්ගලයාට විදේශ රටවලින් ලක්ෂ 700ක සල්ලි ඇවිල්ලා තිබෙනවා. ඒ වාගේම ඔහු දෙහිවල, ස්ටේෂන් පාරේ නිවසක් විකුණලා තිබෙනවා, රුපියල් ලක්ෂ 500කට. ඒ වාගේම ඔහු වාහනයක් විකුණලා තව රුපියල් ලක්ෂ 140ක් බැංකුවට ලැබී තිබෙනවා. හැබැයි, මෙච්චර සල්ලි තිබෙන පුද්ගලයාට 2017 වසරේ වැඩ කරද්දී කොට ඔහුගේ පඩිය රුපියල් 6,000යි. රුපියල් 6,000ක් පඩි ගත්ත මවුලානාගේ බැංකු ගිණුමට රුපියල් ලක්ෂ 700ක් සල්ලි එනවා; රුපියල් ලක්ෂ 500ක ගෙවල් විකුණනවා; රුපියල් ලක්ෂ 140ක වාහන විකුණනවා. ඒ පුද්ගලයා තමයි කියන්නේ, දකුණේ සිංහල නායකයෙකු ගෙනෙන්න පාස්කු ප්‍රහාරය එල්ල කළා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වංචනික ක්‍රියා සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව පොලීසිවල පැමිණිලි ගණනාවක් තිබෙනවා. එවැනි දූෂිත ගනුදෙනුවලට සම්බන්ධ වෙච්ච, ස්විට්සර්ලන්තයේ සරණාගතයෙකු හැටියට සිටිමින් දේශපාලන රැකවරණ ඉල්ලන පුද්ගලයෙකු තමයි මේ චෝදනා කරන්නේ, දකුණේ සිංහල නායකයෙකු බලයට පත් කරන්න පාස්කු ප්‍රහාරය එල්ල කළා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දකුණේ නායකයෙකු බලයට පත් කරන්න මේ වාගේ කටයුත්තක් කරන්න ඕනෑද? ඒ සිද්ධිය වුණේ 2019 අවුරුද්දේ. 2018 අවුරුද්දේ පළාත් පාලන මැතිවරණය තිබුණා. ඒ මැතිවරණයේදී ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් ඉදිරිපත්වෙලා, සියයට 79ක් පළාත් පාලන ආයතන දිනා ගත්තා. පාස්කු ප්‍රහාරය සිදු වෙන්න කලින් අපි රටේ ජන මතය හදලා ඉවරයි. රාජපක්ෂවරුන්ට බලයට එන්න පාස්කු ප්‍රහාර ගෙනෙන්න ඕනෑ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2019.04.21වැනි දා වුණු ඒ සිද්ධියේදී කොළඹදී නවදෙනෙකු මරාගෙන මැරුණා. සායින්දමරුදු ප්‍රදේශයේදී 16දෙනෙකු මිය ගියා. මේ පිළිබඳව සැකපිට 720ක් අත්අඩංගුවට ගෙන තිබෙනවා; නඩු 70ක් දාලා තිබෙනවා. ඒ ප්‍රහාරය වළක්වා ගන්න බැරි වුණාය කියලා එවකට හිටපු ජනාධිපතිවරයාට, ආරක්ෂක ලේකම්වරයාට, පොලිස්පතිවරයාට හා බුද්ධි ප්‍රධානී නිලන්ත ජයවර්ධනට -මේ සියලුදෙනාට- නඩු දාලා තිබෙනවා. මේ සිද්ධිය සම්බන්ධයෙන් ඇමෙරිකාවේ සහ ඕස්ට්‍රේලියාවේ ෆෙඩරල් පොලීසිය විසින් පරීක්ෂණයක් ආරම්භ කළා; ඇමෙරිකාවේ FBI එක ලංකාවට ආවා; CIA පරීක්ෂණයක් ආරම්භ කළා; ඇමෙරිකානු අධිකරණ දෙපාර්තමේන්තුව වාර්තාවක් ඉදිරිපත් කළා; ඇමෙරිකානු අධිකරණය නඩු තුනක් දැම්මා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමෙරිකාවේ අධිකරණ දෙපාර්තමේන්තුව - Office of Public Affairs, US Department of Justice - ඒ සිද්ධිය සම්බන්ධයෙන් - මේ ඝාතනවලට සම්බන්ධ වුණේ කවුද, මේ පිටුපස තිබුණු සිද්ධිය මොකක්ද කියන මේ කාරණා සියල්ල පිළිබඳව- ඉදිරිපත් කර ඇති වාර්තාව සහ මේ වෙනකොට ඒ සම්බන්ධයෙන් ඇමෙරිකානු රජය ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව - US Department of State - විසින් තානාපතිවරයාට එවා තිබෙන email එකේ පිටපතක් මම මේ අවස්ථාවේ **සභාගත*** කරනවා.

මම විශේෂයෙන් මේ කාරණයත් කියන්න කැමතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැම දාම එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ සැසි වාරය ළං වෙනකොට මේ "Channel 4" කියන නාළිකාව මෙවැනි දේ කරනවා. මේකට සම්බන්ධවෙලා ඉන්න දෙමළ ඩයස්පෝරාව, NGO කල්ලිය විපක්ෂයේ යම් දේශපාලන පක්ෂ ගණනාවක් එක්ක සම්බන්ධවෙලා, ඊළඟ මැතිවරණය ඉලක්ක කර රටේ වෙන මතයක් හදන්න හදනවා. ඒකට තමයි මේ උත්සාහ කරන්නේ. ඒ නිසා මේ වීඩියෝ පටය බලන මිනිසුන්ගෙන් අපි මේ කාරණය අහනවා. මුස්ලිම් අන්තවාදීන් නවදෙනෙකු මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල කරයිද, දකුණේ සිංහල බෞද්ධ නායකයෙකු ජනාධිපති කරවන්න? එහෙම අසනීපයක් ඒ අයට තිබෙනවාද? ඒ අන්තවාදීන්ගේ මොළය හොඳ නැද්ද? මුස්ලිම් අන්තවාදීන් නවදෙනෙකු සිංහල, බෞද්ධ නායකයෙකු බලයට පත් කරන්න මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල කළා කියන එක තමයි මේ පුද්ගලයා කියන්නේ.

මරාගෙන මැරෙන ඒ නවදෙනාගෙන් හයදෙනෙක් ඒ සිද්ධිය වෙන්න දවසකට කලින් කොළඹ එක්තරා තැනකදී කළ වීඩියෝවක් අපි දැක්කා. ඒ වීඩියෝ එකේ ඒගොල්ලන් මොනවාද කියන්නේ? "අපි පල්ලිවලට ගහනවා, කෝවිල්වලට ගහනවා, අපට සල්ලි හම්බ වුණේ මෙතැනින්, අපි කරන්නේ මේකයි" කියලා ඒ සියලුදෙනා කියා තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ඒ නිසා පාස්කු ප්‍රහාරය සිද්ධ වුණේ ඒ අන්තවාදීන්ගේ අවශ්‍යතාවකටයි කියන එක මේ වෙනකොට ඇමෙරිකානු FBI වාගේම CIA කියන සියලු අංශ විසින් හඳුනාගෙන තිබෙන වෙලාවක, ගරු ජනාධිපතිතුමා ලබන 11වැනි දා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලයේ සැසි වාරයට සහභාගී වෙන්න නියමිත වෙලාවක, සුපුරුදු පරිදි සල්ලි කීයක් හෝ පුද්ගලයෙකුට දීලා ඉහත සඳහන් කළ නාළිකාව විසින් වීඩියෝ පටයක් හදනවා. ඒ අය මේ හදන්නේ රට අස්ථාවර කරන්න; රටේ ඉන්න සිංහල මිනිස්සු අතර බෙදීම් ඇති කරන්න; රටේ තුළ සමාජ අසහනයක් හදන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටක් හැටියට අපි යුද්ධ කරලා, රණ්ඩු කරලා, ගිනි තියාගෙන, මරාගෙන වෙන් වුණා. අද අපි සියලුදෙනා එකට එකතු වෙලා ජීවත් වෙනවා. අද මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් අපි ඔක්කොම එකට ජීවත් වෙනවා. අපේ ආසනවල අපි එකට ජීවත් වෙනවා. අපි දෙමළ මනුස්සයෙකුට කරදරයක් වෙන්න ඉඩ දෙන්නේ නැහැ. අපි මුස්ලිම් මනුස්සයෙකුට කරදරයක් වෙන්න ඉඩ දෙන්නේ නැහැ. මම එදාත් මගේ කථාවේදී කිව්වා, නාවලපිටිය ආසනය ජාතික සමගියට හොඳම උදාහරණය බව. සිංහල, දෙමළ, මුස්ලිම් තුන් වර්ගයම එහි ඉන්නවා. වත්තේම ඉන්න දෙමළ මිනිසුන්ට ගැහුවා; මම නාවලපිටිය ආරක්ෂා කළා. වත්තේම ඉන්න මුස්ලිම් මිනිසුන්ට ගැහුවා; මම නාවලපිටිය රැක්කා. මුස්ලිම් හා දෙමළ මිනිසුන්ට කරදර කරන්න අපි ඉඩ දුන්නේ නැහැ. සහෝදරයන්, මිතුරන්, ඥාතීන් වාගේ අපි මේ රටේ එකට ජීවත් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඩයස්පෝරාවෙන් ජීවත් වන, ඩයස්පෝරාවෙන් පඩි ගන්නා, දෙකේ පන්තියේ NGO නඩවලට අවශ්‍ය මත රටේ සමාජගත කරන්න හදනවා. පාස්කු ප්‍රහාරය ජනාධිපතිවරණය ඉලක්ක කරලා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බලයට පත් කරන්න කරපු දෙයක් කියලා අද කියනවා. මේ රටේ මිනිස්සු 2019 වනකොට, එනම් 2018 පළාත් පාලන මැතිවරණයේදීම තීරණය කරලා ඉවරයි, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව ගෙදර යවන්න. ජනතාව ඒ පළාත් පාලන මැතිවරණයේදී පළාත් පාලන ආයතනවලින් සියයට 72ක් පොහොට්ටුවට දීලා දීලා ඉවරයි. එහෙම නම්, අපට ආයෙත් බලය ගන්න බෝම්බ පත්තු කරන්න දෙයක් නැහැ; බෝම්බ දමන්න දෙයක් නැහැ; මරාගෙන මැරෙන්න දෙයක් නැහැ. අපි පැහැදිලිව කියනවා, මේවා පිටුපස ඉන්න අයගේ සියලු තොරතුරු අපි ඉදිරියේදී එළි දක්වනවා කියලා.

දැන් කියනවා, අපේ ජාතික බුද්ධි අංශයේ ප්‍රධානියා වන සුරේෂ් සලේ කියන තැනැත්තා මේ මේ පුද්ගලයන් එක්ක සාකච්ඡා කළා, ගනුදෙනු කළා කියලා. ඔය කියන කාලයේ ඔහු ලංකාවේවත් නැහැ. 2019දී බුද්ධි අංශ ප්‍රධානී, මේජර් ජනරල් සුරේෂ් සලේ ලංකාවේ නැහැ. ඔහු හිටියේ විදේශගත වෙලා. ඒ නිසා තනිකර, සම්පූර්ණ බොරුවක් මවා පාලා, මේ රට තුළ නැවත විවිධ චෝදනා හදලා, මත හදලා, සමාජගත කරලා, වැරදි මත හදලා කතෝලික ජනතාව කුපිත කරවලා, තමන්ගේ ඡන්ද ගොඩ වැඩි කර ගන්න කරන නින්දිත, පහත් ක්‍රියාවක් හැටියටයි අපි මෙය දකින්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙනත් මොකවත් ඕනෑ නැහැ, ඇමෙරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව මේ ප්‍රකාශය පිළිබඳ පැහැදිලි ප්‍රකාශයක් නිකුත් කරනවා. පාස්කු ඉරිදා සිද්ධිය සම්බන්ධව 720 දෙනෙකු අත් අඩංගුවට ගත්තා; නඩු 70ක් දාලා තිබෙනවා. හිටපු ජනාධිපති හා ආරක්ෂක ලේකම් ඇතුළු සියලුදෙනාට නඩු දාලා තිබෙනවා. අද විශේෂයෙන් අධිකරණයේ ඒ නඩු අහනවා. මීට වඩා මොකක්ද කරන්න කියන්නේ? ඒ සිද්ධිය වෙලාවේ රාජකාරි ඉටු කරපු නැති අය, ඒකට සම්බන්ධ වෙච්ච අය ඇතුළු සියලුදෙනාට විරුද්ධව රටේ නීතිය ක්‍රියාත්මක කරලා තිබෙනවා; උපරිම නීතිය ක්‍රියාත්මක කරලා තිබෙනවා. පොලීසිය භාර ඇමතිතුමා කිව්වා, පාස්කු ඉරිදා ප්‍රහාරයට සම්බන්ධ පරීක්ෂණ දැන් අවසාන මට්ටමේ තිබෙන්නේ කියලා. දැන් සියලු පරීක්ෂණ අවසානයි. අවසාන අදියරේ දැන් එය තිබෙන්නේ. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා. මේ රටේ සමස්ත ජනතාව සත්‍යය නොදන්නවා නොවෙයි. මේ රටේ මිනිස්සු දන්නවා, "Chanel 4" නාළිකාව කාගේද, "Chanel 4" එකට සල්ලි දෙන්නේ කවුද කියලා. යුද්ධයේ තීරණාත්මක වෙලාවේ හැම දාම වාගේ ඔවුන් අපේ බුද්ධි අංශවලට, අපේ හමුදාවලට චෝදනා එල්ල කළා. අපේ බුද්ධි අංශවලට හැම දාම පහර ගැහුවා. අපේ හමුදාවලට හැම දාම පහර ගැහුවා. 2012දී වීඩියෝවක් එළියට දැම්මා; 2014දීත් දැම්මා; 2016දීත් දැම්මා; 2018දීත් දැම්මා. මගේ දුරකථනයේ ඒවා තිබෙනවා. හැම අවුරුද්දකම වාගේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ සැසිවාරය පැවැත්වෙන්න සුමානයකට කලින් ඒ ගොල්ලෝ වීඩියෝවක් එළියට දමනවා. ඒකේ ඉන්නවා, ඒ කාලයේ ඔබතුමන්ලාගේ පැත්තේ හිටපු, CID එකේ හිටපු නිශාන්ත කන්දරාජා. පසුගිය කාලයේ තමුන්නාන්සේලාගේ සියලු කටයුතු කරපු පුද්ගලයා. මේ තොරතුරු කියන පුද්ගලයා දැන් දේශපාලන රැකවරණ ඉල්ලා තිබෙනවා. හෙට අනිද්දාට මේ පුද්ගලයාත් රැකවරණ ඉල්ලයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ රටට කියන්නේ, මේ චෝදනාව එල්ල කරන පුද්ගලයා අතිදූෂිත පුද්ගලයෙකු බවයි. සම්පත් බැංකුවේ ඔහුගේ ගිණුමට රුපියල් මිලියන ගණන් ආපු හැටි මේ වන විට පොලීසිය සොයාගෙන තිබෙනවා; හඳුනාගෙන තිබෙනවා. වෙන මොකවත් ඕනෑ නැහැ, සාමාන්‍යයෙන් දෙකේ පන්තියේ ළමයෙකුට වුණත් තේරෙන භාෂාවෙන් කියනවා නම්, මුස්ලිම් අන්තවාදීන් නවදෙනෙක් දකුණේ සිංහල බෞද්ධ නායකයෙකු ජනාධිපති කරන්න මරාගෙන මැරෙයිද? එහෙම කරන්න, මුස්ලිම් අන්තවාදී පුද්ගලයන්ගේ මොළේ අමාරුවක් තිබෙනවාද? අසනීපයක් තිබෙනවාද? වෙන මොකවත් ඕනෑ නැහැ. ඒකම තමයි හොඳම සාක්ෂිය. NGOsවලින් සල්ලි අරගෙන, ඩයස්පෝරාවෙන් සල්ලි අරගෙන, රටේ විවිධ මත සමාජගත කරන්න හදලා, බොරු කියලා, අපේ රටේ ඉන්න ජාතීන් අතර භේද ඇති කරන්න, සිංහල, දමිළ, මුස්ලිම් මිනිසුන් අතර භේද ඇති කරන්න හදනවා. ඒවාට විරුද්ධව කටයුතු කරන්න ඕනෑ කියලායි ආණ්ඩුවට අපි කියන්නේ. ඒවාට විරුද්ධව දෙන්න පුළුවන් උපරිම දඬුවම් දෙන්න ඕනෑ.

එවකට හිටපු ජනාධිපතිතුමා ඒ සිද්ධිය වෙච්ච දවසේ රටින් ගියා. එතුමා දන්නවා සිද්ධිය වෙනවා කියලා. එතුමා ගියා සිංගප්පූරුවට. එතුමාට එන්න කිව්වා, ආවේ නැහැ. ආරක්ෂක කවුන්සිලය මුණගැසුණේ නැහැ. පොලීසිය යටතේ කිසි දෙයක් කළේ නැහැ. ඒ සියලු දේ වෙන්න ඇරලා අද මේ සිද්ධිය වෙනුවෙන් වෙන පැතිවලට ඇඟිල්ල දිගු කරන්න හදනවා.

ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා වෙලා කෙටි කාලයක් හිටියා. හැබැයි, රටේ පැවැති ආර්ථික අර්බුද එක්ක යම් යම් ප්‍රශ්න ඇති වුණා. මම හැම දාම කියන දෙයක් තමයි, මොනවා කිව්වත් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා එළවන්න දායක වෙච්ච හැම කෙනෙකුටම මැරෙන්න විනාඩියක් හරි තියලා තමන්ගේ හිතට එකඟව ඒ වෙනුවෙන් කනගාටුව ප්‍රකාශ කරන්න සිද්ධ වේවි කියන එක. මගේ හෘදය සාක්ෂියට එකඟවයි මම එහෙම කියන්නේ. මම දැකපු විධියට මේ රට පාලනය කරපු නායකයන්ගෙන් දූෂිත නැති, අවංක නායකයෙක් තමයි, ගෝඨාභය රාජපක්ෂ කියන්නේ. එතුමාට ඇඟිල්ල දිගු කරලා එතුමා දූෂිතයෙක්, හොරෙක් කියලා කියන්න කවදාවත් කාටවත් බැහැ. එතුමා නව දේශපාලන සංස්කෘතියක් මේ රටේ හදන්න උත්සාහ කළා. එතුමා ඥාතීන්ට තනතුරු දුන්නේ නැහැ; ජනාධිපති මන්දිරය භාවිත කළේ නැහැ; පාතාලයත් එක්ක ගනුදෙනු කළේ

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

නැහැ; කුඩුකාරයන් සම්බන්ධ කර ගත්තේ නැහැ. එතුමා වාහන දෙකතුනකින් පමණයි ගමන් කළේ. එතුමා මේ රට යැපුම් ආනයන ආර්ථිකයෙන් මුදාගෙන නිෂ්පාදන ආර්ථිකයකට යන්න ගියා.

හැබැයි, එතුමාගෙන් සිද්ධ වෙච්ච, එතුමා ගත්ත තීන්දු තීරණවල යම් යම් අඩු පාඩුකම් තිබුණා. අපි ඒවා පිළිගන්නවා. හැබැයි, පැවති ලෝක ආර්ථික අර්බුදයත් එක්ක මේ අන්තවාදියෝ, ත්‍රස්තවාදියෝ, NGO නඩය එක්කහු වෙලා අරගළයේ යෙදුණු අහිංසක මිනිසුන්ගේ අදහසුත් ඉස්සරහට දමාගෙන ගිහින් එතුමා ඉවත් කරන්න කටයුතු කළා. ඒකට ප්‍රශ්නයක් නැහැ. දැන් ඒක ඉවරයි. හැබැයි, තවත් දිගින් දිගටම ගහන්න එන්න එපා. ගහන්න ගහන්න වදින්නේ මෝඩයා කියනවා වාගේ දිගින් දිගටම මෙවැනි චෝදනා එල්ල කරනවා නම්, මේවාට විරුද්ධව දැඩි පියවර ගන්න කටයුතු කරන බව මතක් කරමින්, මම නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ගෝවින්දන් කරුණාකරම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[பி.ப. 1.27]

**ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා**
(மாண்புமிகு கோவிந்தன் கருணாகரம்)
(The Hon. Govindan Karunakaram)

நன்றி, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! இன்றைய தினம் நாங்கள் ஆயுள்வேதம் (திருத்தம்) சட்டமூலம் தொடர் பான விவாதத்தில் உரையாற்றிக் கொண்டிருக் கின்றோம். இன்றைய தலைப்புக்கு முற்றுமுழுதாக அப்பாற் சென்று நாட்டின் நிலைமை சம்பந்தமாக முன்னாள் அமைச்சர் கௌரவ மஹிந்தானந்த அலுத்கமகே அவர்கள் இங்கு பேசியிருந்தார். நான் ஆயுள்வேதம் சம்பந்தமாகவே பேச நினைக்கின்றேன்.

தற்போது இந்த நாட்டில் கல்விப் பொதுத் தராதர (உயர் தர) பரீட்சைப் பெறுபேறுகள் வெளியாகியிருக்கின்றன. 150,000இற்கும் மேற்பட்ட மாணவர்கள் பல்கலைக்கழக அனுமதிக்குத் தகுதி பெற்றிருக்கின்றார்கள். இந்த நாட்டில் உயிரியல் துறையிலிருந்து பல்கலைக்கழகத்திற்குத் தெரிவு செய்யப்படுபவர்கள் 6 வகையாக பட்டப்படிப்புக்களை மேற்கொள்கின்றார்கள். ஒன்று, Bachelor of Medicine, Bachelor of Surgery. இரண்டு, Doctor of Dental Services. மூன்று, Bachelor of Veterinary Services. நான்கு, Bachelor of Unani Medicine and Surgery. ஐந்து, Bachelor of Science. ஆறு, Bachelor of Nursing.

இலங்கையில் 2008, 2009ஆம் ஆண்டு காலப்பகுதி யிலிருந்து இற்றைவரை ஆயுள்வேத மருத்துவம், சித்த மருத்துவம், யுனானி மருத்துவம் போன்ற பட்டப்படிப்புக்களை முடித்த 1,600இற்கும் மேற்பட்ட பட்டதாரிகள் இன்று வேலைவாய்ப்பற்றிருக்கின்றார்கள். கிழக்கு மாகாணத்தில் மாத்திரம் Siddha medicine பட்டப்படிப்பை முடித்தவர்கள் 44 பேர் இருக்கின்றார்கள். அவர்கள் தவிர, ஆயுள்வேத மருத்துவப் பட்டப்படிப்பு, யுனானி மருத்துவப் பட்டப்படிப்பு ஆகியவற்றை முடித்தவர்களும் இருக்கின்றார்கள். அவர்களது சம்பள அளவுத்திட்டம் Bachelor of Medicine, Bachelor of Surgery - MBBS - முடித்தவர்களுடைய சம்பள அளவுத்திட்டத்துக்குச் சமனாக இருக்கின்றது. கிழக்கு மாகாணத்தில் 68 ஆயுள்வேத, சித்த, யுனானி வைத்தியசாலைகள் இருக்கின்றன. ஆனால், அங்கு வைத்தியர்களுக்கான வெற்றிடங்கள் கூடுதலாக இருக்கின்றன. Bachelor of Unani Medicine and Surgery இற்கு அடுத்தபடியாகவுள்ள BSc in Nursingஇனை மேற் கொள்பவர்களுக்குக்கூட, பட்டதாரியாகி வெளியில் வந்த வுடன் தொழிலுக்கான உத்தரவாதம் இருக்கின்றது. இப்படி நிலைமை இருக்கும்போது, தற்போது வெளியாகியுள்ள உயர் தரப் பரீட்சை முடிவுகளின் அடிப்படையில் இப்பட்டப் படிப்புக்கு மாணவர்களை உள்வாங்க இருக்கின்றீர்கள். சித்த மருத்துவ பட்டப்படிப்பை மேற்கொள்வதென்றால், 5 வருடங்கள் கற்றல் செயற்பாட்டிலும் ஒரு வருட உள்ளகப் பயிற்சியிலும் ஈடுபட வேண்டும். மொத்தமாக 6 வருடங்களை அந்தப் பட்டப்படிப்புக்காகச் செலவழிக்க வேண்டும்.

ஆகையால், இலங்கை முழுவதும் இருக்கும் இந்தப் பட்டதாரிகளை வைத்தியத்துறைக்குள் உள்வாங்கவேண்டிய கட்டாயத் தேவை இருக்கின்றது. இவர்களின் சேவை இந்த நாட்டிற்குத் தேவைப்படாவிட்டால், ஏன் நீங்கள் இந்தத் துறைக்கு மாணவர்களை மீண்டும் மீண்டும் உள்வாங் குகின்றீர்கள்? பல்கலைக்கழகங்களிலுள்ள இந்தத் துறைசார்ந்த பீடத்தை மூடிவிடலாம் என்பது என்னுடைய ஆலோசனையாக இருக்கின்றது. ஏனென்றால், இன்று இந்தப் பட்டப்படிப்பை முடித்தவர்கள் தொழிலின்றி, வேறு எந்தவொரு தொழிலுக்கும் போக முடியாமல் மிகவும் கஷ்டமான நிலைக்குத் தள்ளப் பட்டிருக்கின்றார்கள். அவர்கள் தமிழர்களாக இருந்தாலும் சரி, சிங்களவர்களாக இருந்தாலும் சரி, ஏனைய இனத்தவர்களாக இருந்தாலும் சரியே! இந்தத் துறையில் பட்டப்படிப்பை முடித்த அனைவரையும் வைத்தியத்துறைக்குள் உள்வாங்கவேண்டிய தேவை இருக்கின்றது என்பதை நான் இங்கு கூறிக் கொள்கின்றேன்.

இந்த நாட்டில் எந்தவொரு நல்ல காரியத்தை முன்னெடுத்தாலும் அதற்கு எதிர்ப்புத் தெரிவிப்பதாக சுதேச வைத்திய இராஜாங்க அமைச்சர் அவர்கள் இங்கு பேசும்போது கூறினார். அதைத்தான் நாங்களும் கூறுகின்றோம். 1956ஆம் ஆண்டிலிருந்து மாறி மாறி ஆட்சிக்கு வருகின்ற அரசாங்கங்கள் இந்த நாட்டிலுள்ள இனப் பிரச்சினையைத் தீர்ப்பதற்குரிய நடவடிக்கைகளை எடுத்தாலும், எதிர்க்கட்சி வரிசையில் இருப்பவர்கள் தொடர்ச்சியாக அதற்கு எதிர்ப்பைக் காட்டிவருகிறார்கள். அதன் விளைவாகத்தான், இன்று இந்த நாடு இந்த நிலையில் இருக்கின்றது. உதாரணத்திற்கு, தற்போது அரசியலமைப்பின் 13ஆவது திருத்தச் சட்டத்தை அமுலாக்கவேண்டும் என்று அரசாங்கமும் கற்றுணர்ந்த ஏனைய கட்சியினரும் கூறும்போது, அதற்கு எதிர்ப்புத் தெரிவிப்பதற்கென்றே பலர் இருக்கின்றார்கள்.

நேற்று, நேற்று முன்தினம், அதற்கு முன்னைய நாள் என 3 நாட்களாக மட்டக்களப்பு மாவட்டத்திலிருக்கும் மத்திய அரசாங்கத்திற்கு உட்பட்ட வைத்தியசாலைகள் தவிர, ஏனைய வைத்தியசாலைகளில் தங்கியிருந்து சிகிச்சைபெறும் நோயாளி களுக்கு உணவு வழங்கப்படவில்லை. இதற்கு என்ன காரணம் என்று வினவியபோது, அந்த வைத்தியசாலைகளுக் குரிய allocation கிடைக்கவில்லை என்று கூறப்படுகிறது. மட்டக்களப்பு மாவட்டத்திற்கு கடந்த மார்ச் மாதம் வரைக்குமே 44 மில்லியன் ரூபாய் நிதி கிடைத்திருப்பதாகப் பிராந்திய சுகாதார சேவைகள் பணிப்பாளர் என்னிடம் கூறினார். அரசியலமைப்பின் பதின்மூன்றாவது திருத்தச் சட்டம் அமுல்படுத்தப்பட்டு, அதிகாரங்கள் பகிரப்பட்டிருந்தால், அந்தந்த மாகாண சபைகள் தத்தமது நிர்வாகத்துக்கு உட்பட்ட

வைத்தியசாலைகளைக் கவனித்திருக்கும். மட்டக்களப்பு மாவட்டத்தில் 4 ஆதார வைத்தியசாலைகளும் 19 பிரதேச வைத்தியசாலைகளும் என மொத்தமாக 23 வைத்தியசாலைகள் இருக்கின்றன. இந்த 23 வைத்தியசாலைகளிலும் தங்கியிருந்து சிகிச்சை பெறும் நோயாளர்களுக்கு கடந்த மூன்று நாட்களாகச் சாப்பாடு வழங்கப்படவில்லை. தூரப் பிரதேசங்களிலிருந்து அரச ஆஸ்பத்திரிகளை நம்பி தங்களது நோய்களைத் தீர்க்க வரும் நோயாளர்களுக்குச் சாப்பாடு வழங்கப்படவில்லை என்றால், அதைப் போன்றதோர் அநியாயம் எந்த நாட்டிலும் நடைபெறாது என்பதை நான் இங்கு கூறிக்கொள்கின்றேன்.

கிழக்கு மாகாணத்திற்கான போதனா வைத்தியசாலை - Teaching Hospital - மட்டக்களப்பிலே இருக்கின்றது. கிழக்கு மாகாணத்திலுள்ள ஒரேயொரு Teaching Hospitalஆன அந்த வைத்தியசாலையில் இருக்கும் CT scan இயந்திரம் பழுதடைந்திருக்கின்றது. அதனைப் பழுதுபார்ப்பதற்காக Medical Equipment Services எனப்படும் கம்பனிக்குப் பணம் கட்டப்பட்டு, ஒரு மாதம் கடந்துள்ள நிலையிலும் அந்த CT scannerஇன் tube இன்னும் மாற்றப்படவில்லை. சுகாதார அமைச்சினால் அக்கம்பனிக்கு வழங்கவேண்டிய கொடுப்பனவு மீதமாக இருப்பதால், அந்த CT scanஇன் tubeஐ மாற்றுவதற்கு அக்கம்பனிக்காரர்கள் முயற்சிக்கவில்லை. இதனைச் சுகாதார அமைச்சர் அவர்கள் கருத்திற்கொள்ள வேண்டும்.

வடக்கு, கிழக்குக்கென ஒரேயொரு coronary angiogram machineதான் இருக்கின்றது. அது யாழ். போதனா வைத்திய சாலையிலே இருக்கின்றது. 2021ஆம் ஆண்டு மட்டக்களப்பு போதனா வைத்தியசாலைக்குக் கிடைக்கவிருந்த coronary angiogram இயந்திரத்தை களுத்துறை வைத் தியசாலைக்கு வழங்கினார்கள். அப்போதைய பிரதம அமைச்சர் கௌரவ மஹிந்த ராஜபக்ஷ அவர்களுடனும் முன்னாள் சுகாதார அமைச்சர் கௌரவ பவித்ராதேவி வன்னிஆரச்சி அவர்களு டனும் நாங்கள் இது தொடர்பில் கலந்துரையாடினோம்; பாராளுமன்றத்திலும் பேசினோம்; அமைச்சின் அதிகாரி களுடனும் பேசினோம். இருந்தாலும், அந்த angiogram machine மட்டக்களப்பு போதனா வைத்தியசாலைக்குக் கிடைக்கவில்லை.

தற்போது இன்னுமொரு angiogram machine சுகாதார அமைச்சுக்குக் கிடைக்க இருப்பதாக நான் அறிகின்றேன். இது சம்பந்தமாக நான் சுகாதார அமைச்சருடனும் சுகாதார அமைச்சின் செயலாளருடனும் பேசி இருக்கின்றேன். அவர்கள் இருவரும் மட்டக்களப்பு போதனா வைத்தியசாலைக்கு angiogram இயந்திரம் தேவை என்பதை உணர்ந்து, அதற்கு முக்கியத்துவம் கொடுப்பதாகக் கூறியிருக்கின்றார்கள். மட்டக் களப்பிலுள்ள சத்திய சாயிபாபா வைத்தியசாலை மட்டக் களப்பு போதனா வைத்தியசாலைக்கு angiogram இயந்திரம் ஒன்றைக் கொடுக்க இருப்பதாக சுகாதார அமைச்சின் Director General கூறியிருப்பதாக நான் அறிகின்றேன். இந்தியாவி லிருந்து வைத்தியர்கள் வந்து குழந்தைகளுக்கு இருதய சத்திர சிகிச்சைகளை மேற்கொள்ளும் அந்த சத்திய சாயிபாபா வைத்தியசாலையில் ஒரு angiogram இயந்திரம் இருக்கின்றது. அது அந்த வைத்தியசாலையின் தேவைக்கென இருக்கின்றது. அது அரசாங்க வைத்தியசாலை அல்ல. அது தனியார் வைத்தியசாலையாகும். அரசாங்கத் திற்குக் கிடைக்க இருக்கும் angiogram இயந்திரத்தை மட்டக்களப்பு போதனா வைத்திய சாலைக்குக் கொடுப்பதாக சுகாதார அமைச்சர் அவர்கள் உத்தரவாதம் அளித்திருக் கின்றார். அந்த உத்தரவாதத்தை அவர் நிறைவேற்ற வேண்டுமென்று நான் இந்தச் சந்தர்ப்பத்திலே கேட்டுக்கொள்கின்றேன்.

சுகாதார அமைச்சருக்கு எதிராக இச்சபையில் நம்பிக்கையில்லாப் பிரேரணை கொண்டுவரப்பட்டு, அது தொடர்பான விவாதம் அடுத்துவரும் மூன்று தினங்களுக்கு நடைபெற இருக்கின்றது. அது சம்பந்தமாக நான் இன்று இங்கு ஒருசில விடயங்களைக் கூறவேண்டிய தேவை இருக்கின்றது. ஏனென்றால், அந்தப் பிரேரணையில் எனக்குப் பேசுவதற்கான சந்தர்ப்பம் கிடைக்குமோ தெரியாது. இந்த நம்பிக்கையில்லாப் பிரேரணையானது ஓர் அமைச்சருக்கு எதிராகக் கொண்டுவரப்பட இருகின்றது. கொரோனா தொற்றுப் பரவிய காலத்தில் தடுப்பூசிக்கு முக்கியத்துவம் வழங்காமல், மதத்தின்மீது மூடநம்பிக்கை வைத்து புனித நீர் என்று கூறி, குடத்தில் தண்ணீரைக் கொண்டுவந்து, அதனை ஆற்றிலே கலந்தார்கள். அந்தக் காலகட்டத்தில் நூற்றுக் கணக்கான உயிர்களைக் கொரோனா வைரஸ் காவு கொண்டது. அப்போது சுகாதார அமைச்சருக்கு எதிராக இச்சபையில் நம்பிக்கையில்லாத் தீர்மானம் கொண்டுவரப் படவில்லை.

இந்த நாட்டில் சுகாதார அமைச்சானது, பல்வேறு குறைபாடுகளைக்கொண்ட சர்ச்சைக்குரியதோர் அமைச்சாக இன்று மாறியிருக்கின்றது. நாட்டில் அத்தியாவசிய மருந்து களுக்குத் தட்டுப்பாடு நிலவுகின்றது; தரமில்லாத மருந்துகள் இறக்குமதி செய்யப்படுகின்றன; வைத்திய அதிகாரிகளும் வைத்திய நிபுணர்களும் நாட்டைவிட்டு வெளியேறிக்கொண்டு இருக்கின்றார்கள்; அரச வைத் தியசாலைகளில் நோயாளிகள் இறந்துகொண்டு இருக்கின்றார்கள். இது தவிர, சிகிச்சைகளின் போது குறிப்பாக, கண் சத்திர சிகிச்சையின்போது நோயாளிகள் பாதிப்படைந்து வருகின்றார்கள். தேவையான மருந்துகளை இறக்குமதி செய்வதற்குப் போதுமான அளவு நிதி ஒதுக்கீடுகள் இல்லை. இவ்வாறான காரணங்களுக்காக அரசாங்கத்துக்கு எதிராக நம்பிக்கையில்லாப் பிரேரணையைக் கொண்டுவரலாம்.

பொருளாதார நெருக்கடிமிக்க இச்சூழ்நிலையில் சுகாதாரத் துறையில் மாத்திரமல்ல, அனைத்துத் துறைகளிலுமுள்ள நிபுணர்கள் பலர் நாட்டைவிட்டு வெளியேறிக்கொண்டு இருக்கின்றார்கள். அதற்கான காரண காரியங்களை நாங்கள் கண்டறிய வேண்டும். சுகாதாரத்துறை என்பது, மிகவும் முக்கியமானதொரு துறையாகும். அத்துறை சார்ந்த அமைச்சரோ, அதிகாரிகளோ தவறிழைத்து மக்களுக்கும் நாட்டுக்கும் துரோகம் செய்திருந்தால், அது தொடர்பில் உரிய விசாரணைகளை நடாத்தி, அவர்களுக்கு எதிராக நடவடிக்கை எடுக்கவேண்டுமென்று கேட்டுக்கொண்டு, எனது உரையை முடிக்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු අකිල එල්ලාවල මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු අටක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 1.40]

**ගරු අකිල එල්ලාවල මහතා**
(மாண்புமிகு அகில எல்லாவல)
(The Hon. Akila Ellawala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනිවර කියවීමේ විවාදයටයි අපි සම්බන්ධ වෙන්නේ. 1961 අංක 31 දරන ආයුර්වේද පනතට කරන සංශෝධන පිළිබඳව ගරු සිසිර ජයකොඩි රාජ්‍ය ඇමතිතුමා බොහොම උද්‍යෝගයෙන්, බොහොම උනන්දුවෙන් සහ

[ගරු අකිල එල්ලාවල මහතා]

බොහොම වුවමනාවෙන් අදහස් ඉදිරිපත් කළ බව අපි දැක්කා. මම හිතන විධියට ඉතාම කාලෝචිත සංශෝධන ටිකක් තමයි එතුමා අද ඉදිරිපත් කරන්නේ. එතුමාගේ යෝජනා හැටියට නොවෙයි, විද්වත් කමිටුවක් එක්ක සාකච්ඡා කරලා, ඒ වාගේම ජූලි මාසයේ 05වැනි දා පළමුවැනිවර කියවීමට පාර්ලිමේන්තුවට මෙම පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමෙන් පසුව කළ සියලු කතිකාවල ප්‍රතිඵලයක් හැටියට තමයි අද ඉදිරිපත් කරන මේ සංශෝධනවලට සහයෝගය ලබා ගන්න එතුමා බලාපොරොත්තු වෙන්නේ. මේ සංශෝධන ගෙන ඒම ගැන මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඇත්තටම මේවා කළ යුතු සංශෝධන. නමුත්, මේවා මීට පෙර කරන්න තිබුණු සංශෝධන. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා දැන් හෝ මේ සඳහා උනන්දුවීම ගැන සහ ඔබතුමාගේ දැනුම ඒ සඳහා භාවිත කිරීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඉදිරිපත් කරනු ලබන සංශෝධන ගැන කථා කරනවාට වඩා ප්‍රායෝගික ප්‍රශ්න කිහිපයක් ඉදිරිපත් කරන්න තමයි මම මේ අවස්ථාවේ බලාපොරොත්තු වෙන්නේ. අපි දන්නවා, ආයුර්වේද ක්‍රමය තුළ පවතින ප්‍රාදේශීය රෝහල් අයිති වෙන්නේ පළාත් සභාවලට බව. පළාත් සභා හරහා තමයි ඒ රෝහල් සියල්ල නඩත්තු වෙන්නේ. වෛද්‍යවරුන්ගේ පඩිනඩි, සේවකයන්ගේ පඩිනඩි, දීමනා කියන මේ සියලු දේවල් ලබා දෙන්නේ පළාත් සභා හරහා. නමුත්, මේ වන විට පළාත් සභා අක්‍රිය වෙලා තිබෙන්නේ. පළාත් සභාවල ජනතා නියෝජිතයන් නැහැ. රත්නපුරය දිස්ත්‍රික්කයේ බලංගොඩ, මැදබැද්ද ආයුර්වේද රෝහලත් එක්ක සම්බන්ධ වෙලා මම කටයුතු කරනවා. එතැනදී මම දකින දෙයක් තමයි, වෛද්‍යවරුන් විසින් යම් කිසි භෞතික සම්පත් සංවර්ධනයක්, යම් කිසි නඩත්තුවක් සඳහා ඉල්ලීමක් කළාම එය ඉටු කරන්න ඉතාම අපහසුවීම. මොකද, නිලධාරින් ඒ සඳහා ඉදිරිපත් වෙනවා අඩුයි. ජනතා නියෝජිතයන් පළාත් සභාවල නැති නිසා, පළාත් සභාව තුළින් එම යෝජනා අනුමත නොවෙන නිසා එම යෝජනා ක්‍රියාත්මක කරන්න නිලධාරින් පැකිළෙනවා. එය ලොකු පාඩුවක්. මේ පාඩුව වෙන්නේ වෛද්‍යවරුන්ටවත්, ඒ සිටින කාර්ය මණ්ඩලයටවත් නොවෙයි. මේ පාඩුව වෙන්නේ අපේ අහිංසක රෝගීන්ට. මම දන්නා විධියට බලංගොඩ, මැදබැද්ද ආයුර්වේද රෝහලට ලංකාවේ හැම ප්‍රදේශයකින්ම වාගේ රෝගීන් පැමිණෙනවා. අපි කිහිප වතාවක්ම ඉල්ලීම් කළා, එම රෝහලට තව ගොඩනැඟිල්ලක් ලබා දෙන්න, අවශ්‍ය සේවකයන් සංඛ්‍යාව ලබා දෙන්න, අවශ්‍ය වෛද්‍යවරුන් සංඛ්‍යාව ලබා දෙන්න කියලා. නමුත්, එම කටයුතු සිද්ධ වෙන්නේ බොහොම මන්දගාමීව. ඒ නිසා එතැනට එන සියලු රෝගීන්ට ලොකු අසාධාරණයක් වෙනවා.

ඒ වාගේම බලංගොඩ, මැදබැද්ද ආයුර්වේද රෝහලේ සේවක හිඟයක් පවතිනවා. එම රෝහලට සුළු සේවකයන් 38දෙනෙකු අවශ්‍යයි. නමුත්, දැනට ඉන්නේ 12දෙනායි. ඒ වාගේම රක්වාන රෝහලේ සිටින්නේ සුළු සේවකයින් 6දෙනායි. මේ නිසා එම රෝහල්වල කටයුතු කරගෙන යෑම ඉතාම අපහසු වී තිබෙනවා. මම හිතන විධියට බටහිර වෛද්‍ය ක්‍රමයට වඩා විශේෂයෙන්ම ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේදී විශාල සේවක සංඛ්‍යාවක් අවශ්‍ය වෙනවා, නොයෙක් කටයුතු සඳහා. මොකද, ආයුර්වේද වෛද්‍ය ක්‍රමය තුළ නොයෙක් ස්නාන ක්‍රම තිබෙනවා, තෙල් සාත්තු ක්‍රම තිබෙනවා. ඒ ආකාරයේ ලොකු කාර්යභාරයක් ඒ තුළ සිදු වෙනවා. එම කටයුතු සඳහා වැඩි කාලයකුත් ගත වෙනවා. ඒවාට අවශ්‍ය සුළු සේවක පිරිස් නැති වුණොත්, එම රෝහල්වල කටයුතු ක්‍රියාත්මක කිරීමේදී එම වෛද්‍යවරුන් ලොකු අපහසුතාවකට පත් වෙනවා. ඒ නිසා ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් මම ඉල්ලීමක් කරනවා, පළාත් සභා පිහිටුවන තෙක් මේ කටයුතු කිරීමට අවශ්‍ය අවසර ලබා ගන්න යම් ක්‍රමයක් හදන්න කියලා. මොකද, එහෙම නැති වුණොත් ප්‍රාදේශීය මට්ටමේ තිබෙන රෝහල් අකර්මණ්‍ය වෙනවා. ඒ නිසා ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉතාම කාරුණිකව ඉල්ලා සිටිනවා.

අපේ සාම්ප්‍රදායික වෙදකම මුතුන්මිත්තන්ගේ කාලයේ ඉඳන් එන ඉතාම වටිනා වෙදකමක්. සාම්ප්‍රදායික වෙදකමට කිසිම අගතියක් නොවන විධියට ඔබතුමා අද මේ සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙනවා. ඒක හොඳ වැඩක්. මොකද, ආයුර්වේද ක්‍රමය තුළ තිබෙන ලොකු ප්‍රශ්නයක් තමයි, පාරම්පරික වෙද මහත්වරුන්ට ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වීමට ඇති අපහසුතාව. ඒ නිසා ඒ ක්‍රමය සරල කරනවා නම් හොඳයි. නමුත්, එහි නීත්‍යානුකූලභාවය සහ ලබා දෙන ඖෂධවල ප්‍රමිතිය ගැන අවධානය යොමු කිරීමත් අත්‍යවශ්‍ය කාරණයක්. සාම්ප්‍රදායික වෙදකමේදී ඉතාම හොඳ සහ දුර්ලභ ඖෂධ ඒ වෙද මහත්වරු පාවිච්චි කරනවා. නමුත්, සමහර අවස්ථාවල ප්‍රමිතිය පිළිබඳව තිබෙන ප්‍රශ්න නිසා සමහර රෝගීන් මෙම ඖෂධ භාවිත කිරීමට මැළි වෙනවා. මේ සඳහාත් ඔබතුමා යම් ක්‍රමයක් හඳුන්වා දෙනවා නම් හොඳයි. ඔබතුමා කිව්වා, research and development සඳහා ආයතනයක් පිහිටුවා, විශේෂයෙන් විශ්වවිද්‍යාලවල සිටින විශේෂඥයන් ඒ සඳහා අනුයුක්ත කරනවා කියලා. ඒක ඉතාම හොඳ කාලෝචිත ක්‍රියාවලියක්. එහි ප්‍රතිඵලයක් හැටියට ඉදිරියේදී අපට හොඳ ප්‍රමිතියකින් යුතු ආයුර්වේද ඖෂධ ලබා ගන්න හැකි වෙයි කියා මම හිතනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමාට මම තව යෝජනාවක් ඉදිරිපත් කරන්න කැමැතියි. අපි සියලුදෙනාම දන්නවා, මේ වෙලාව වෙනකොට අපි ආර්ථික අපහසුතාවකට පත් වෙලා සිටින බව. ආර්ථික වශයෙන් බොහොම පහළ තැනක තමයි රටක් හැටියට අපි ඉන්නේ. විදේශිකයන් සමහර වෙලාවට සුමානයයි, දෙකයි ලංකාවේ ඉන්නේ. ඒ අය ඒ රටවල ඉඳන් online systems හරහා ආයුර්වේද පහසුකම් ලබා ගන්න අවශ්‍ය ස්ථාන කලින්ම වෙන් කර ගන්නවා. නමුත් කොළඹ, නුවර ඇතුළු තදාසන්න ප්‍රදේශ හැරුණුවිට අනෙකුත් පළාත්වලට යනකොට මේ පහසුකම් ලබා ගන්න ක්‍රමයක් නැහැ. මම ඔබතුමාට යෝජනාවක් කරනවා, පුළුවන් නම් දිස්ත්‍රික් මට්ටමින් හෝ ආයුර්වේද ගම්මාන ඇති කරන්න කියලා. රජය හරහා ක්‍රියාත්මක වෙන ආයුර්වේද ගම්මානයක් කිව්වාම, විදේශීය සංචාරකයන්ට ඒ තුළින් ලොකු වගකීමක් ලැබෙනවා. ඒ සඳහා පෞද්ගලික ආයතනවල සහයෝගයත් ලබා ගන්න පුළුවන්. පෞද්ගලික ආයතනවලටත් යම් යම් කාර්ය ලබා දෙන්න පුළුවන්, නිසි ක්‍රමයකට අනුව. විදේශිකයන්ට අවශ්‍ය සුවතාව රැක ගැනීමේ හැකියාව ඒ තුළින් ලබා ගැනීමට හැකි වෙයි කියා මා විශ්වාස කරනවා. ඒ වාගේම අපට ඒ හරහා විදේශ විනිමය ළඟා කර ගැනීමටත් පුළුවන්. පසුගිය කාලයේ සමහර මාසවල සංචාරකයන් 125,000ක් විතර ඇවිල්ලා තිබෙනවා. නමුත්, හැම දාම එකම දේ දකිනකොට ඒ සංචාරකයන් නැවත වරක් අපේ රටට ඒම අඩු වෙනවා. ඒ නිසා අපි අලුත් විධියට හිතලා, අලුත් ක්‍රම ඔවුන්ට හඳුන්වා දෙන්න ඕනෑ. විශේෂයෙන්ම ආයුර්වේද සම්පත, වෙදකම හොඳින් ප්‍රචලිත කිරීමේ හැකියාව සහ ඒ දක්ෂතාව අපේ රටට තිබෙනවා. ඒ තුළින් අපි විදේශ විනිමය උපයා ගැනීමේ ක්‍රමයටත් අනුගත වෙන්න ඕනෑ.

මා ජීවත් වන කෝට්ටේ ප්‍රදේශයේ ඉඳලා High Level Road එකට යනකොට 50කට ආසන්න spas සංඛ්‍යාවක් තිබෙනවා. විදේශිකයෙකු spa එකකට යන්නේ හොඳ ආයුර්වේද සම්බාහනයක්, massage එකක් ගන්නයි. දැන් ඔබතුමා යෝජනා කළා, එවැනි තැන්වල සේවය කරන සේවක සේවිකාවන්ට NVQ Level 4 පුහුණුව ලබා දිය යුතු බව. එය ඉතාම හොඳයි. මොකද, යම් සම්බාහන මධ්‍යස්ථානයකට යන පුද්ගලයෙකුගේ අවශ්‍යතාව එතැනින් ඉෂ්ට වෙන්නේ නැත්නම් අපේ ආයුර්වේද ක්‍රමය ගැන

තිබෙන ප්‍රතිරූපය සම්පූර්ණයෙන් විනාශ වෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ NVQ ක්‍රමය ඉතාම ඉක්මනට ගෙනැල්ලා, මේ සම්බාහන මධ්‍යස්ථානවල ඉන්න සේවක සේවිකාවන්ට නිවැරදි පුහුණුව ලබා දෙන්න අවශ්‍ය ක්‍රමයක් හදන්න කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු අකිල එල්ලාවල මහතා**
(மாண்புமிகு அகில எல்லாவல)
(The Hon. Akila Ellawala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ, ගරු ජනාධිපතිතුමාටත්, ඒ වාගේම විදුලිබල හා බලශක්ති අමාත්‍ය ගරු කංචන විජේසේකර මැතිතුමාටත්. ඒ, මා නියෝජනය කරන බලංගොඩ ප්‍රදේශයේ තිබෙන සමනලවැව ජලාශයේ ජලය කාන්දුවීම් නවතාලීමට දරන උත්සාහයට. මොකද, සමනලවැව ජලාශය 1992 වර්ෂයේ සිට විදුලි බලයට සහ කෘෂි කර්මාන්තයට ජලය ලබා දෙනවා.

සමනලවැව ජලාශයේ ජලය කාන්දුවීම නිසා අපට මේ වන විට විදුලිය මෙගාවොට් 120ක් අහිමි වෙලා තිබෙනවා. ගරු ජනාධිපතිතුමාත්, ගරු අමාත්‍යතුමාත් මේ පිළිබඳව අවධානය යොමු කරලා මේ කටයුතු නැවැත්වීමට පියවර ගත යුතු වෙනවා. මේ ජල කාන්දුව සියයට සියයක්ම නවත්වන්න බැරි වුණත්, අඩුම තරමින් සියයට 60ක්, 70ක්වත් නැවැත්වුවොත් ජනනය කරන විදුලිය ප්‍රමාණය වැඩි කර ගන්න අපට පුළුවන් වෙයි. ජනනය කර ගන්නා විදුලිය ප්‍රමාණය වැඩි කර ගන්නවා වාගේම, කල්තොට ප්‍රදේශයේ ඉන්න ගොවි මහත්වරුන්ගේ ජල අවශ්‍යතාව පිළිබඳවත් අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිමින්, මට කථා කරන්න කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මන්ත්‍රීතුමිය. ඔබතුමියට මිනිත්තු 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.50]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද විවාදයට ගන්නා ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව කෙටියෙන් අදහස් කීපයක් ඉදිරිපත් කරන්න මම කැමතියි. ආයුර්වේදය කියන විෂයය ගත්තාම, එය ඉතාම පුළුල් සහ බොහෝ විවිධත්වයක් තිබෙන විෂයයක්. ඉතින් මේ සියල්ල එකම රාමුවකට, එකම නීති පද්ධතියකට ගෙනෙන්න උත්සාහ කරනකොට විවිධත්වය තුළ පැන නැඟෙන නිශ්චිත අවශ්‍යතා සියල්ල නිවැරදිව සලකා බලනවා ද කියන ප්‍රශ්නය මතු වෙන්න පුළුවන්.

ආයුර්වේද ක්ෂේත්‍රය තුළ අද යම් නියාමනයක් අවශ්‍යයි. ඒ වාගේම මීට වඩා යම්කිසි විධියකට ගුණාත්මකභාවය ඉහළ දැමීමත් අවශ්‍යයි. මේ පනත් කෙටුම්පත හරහා ගන්නා ඒ උත්සාහයට අපි එකඟයි. නමුත්, මේ පනත් කෙටුම්පතේ, ආයුර්වේදය කියන විෂයය තුළ ආයුර්වේදය භාවිත කරන අයත්, ආයුර්වේදය තුළ practise කරන අයත් නිර්වචනය කරන විධිය නිසා දේශීය වෛද්‍ය වෘත්තියේ යෙදෙන අයට යම් කිසි විධියකට සැක මතු වෙලා තිබෙනවා, ඔවුන්ට මේ පනත කෙසේ බලපායි ද කියන කාරණය ගැන. ගරු රාජ්‍ය ඇමතිතුමා කිව්වා, "මෙහිදී සියලු පාර්ශ්ව එක්ක සාකච්ඡා කළා" කියලා. ඒක හොඳ දෙයක්. නමුත්, සාකච්ඡා කිරීම වාගේම ඒ එක් එක් පාර්ශ්වය මතු කරපු කාරණා පිළිබඳ අවධානය යොමු කළේ කොහොමද කියන එක දැනගන්න එකත්, ඔවුන්ට මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් තිබෙන ගැටලු පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් දෙන එකත්, ඔවුන් සමඟ සාකච්ඡා කරන එකත් හොඳයි කියලා අපි යෝජනා කරනවා.

ආයුර්වේදය කියන්නේ ඉතාම පුළුල් විෂයයක්. මම කලින් කිව්ව විධියට එහි විවිධ ක්‍රම තිබෙනවා. මෙය සාම්ප්‍රදායික මට්ටමේ ඉඳන් විශ්වවිද්‍යාල මට්ටමේ දැනුම තිබෙන විෂයයක්. මේ තුළ සාම්ප්‍රදායිකව ක්‍රියාවේ යෙදෙන අය ඉන්නවා. බොහෝ විට ඔවුන් දෙස එකම රාමුවකින් බලන එක සුදුසු නැහැ. ඒ විධියට එකම රාමුවකට ඔවුන් දාන එක තුළින් වෙන්න පුළුවන් අසාධාරණය ගැන ඔවුන්ට සැකයක් තිබෙනවා. ඒ නිසා මේ සැක දුරු කරන්නත් යම් කිසි ක්‍රියාමාර්ග ගනියි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ලැබුණු කාලය තුළ තවත් යම් කාරණයකට අවධානය යොමු කරවන්න මම කැමතියි. මේ පාර්ලිමේන්තුව තුළ උදේ වරුවේ බොහෝ සාකච්ඡාවකට බඳුන් වුණු උසස් පෙළ විභාගය පිළිබඳ ප්‍රශ්නය ගැනත් මට යම් කිසි දෙයක් කියන්න අවශ්‍යයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ අධ්‍යාපන ක්‍රමයේ අර්බුදය සම්බන්ධයෙන් කාලයක් තිස්සේ හොඳම නිර්ණායකය බවට පත් වෙලා තිබෙන්නේ, මේ රටේ විභාගයක් පවත්වනවා නම් එම විභාගය පැවැත්වීම දැනුම් දීමේ සිට විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ අවස්ථාව දක්වා හැම අවස්ථාවක්ම විශාල ලෙස ආන්දෝලනාත්මක සාකච්ඡාවකට තුඩු දෙන එක. විභාග ප්‍රතිඵල නිකුත් වෙනකොට ජනතා නියෝජිතයන් හැටියට අපට ලැබෙන ඇමතුම් සිය ගණනකින් වැඩි වෙනවා. මොකද, මේ රටේ ජනතාවට, මේ රටේ ශිෂ්‍යයන්ට මේ අධ්‍යාපන ක්‍රමය ගැන තවදුරටත් කිසිම විශ්වාසයක් හෝ අධ්‍යාපන ක්‍රමය ක්‍රියාත්මක වීම පිළිබඳ යම් කිසි විධියකට හොඳ ආකල්පයක් නැතිවීම නිසාම බලධාරීන් විසින් ගන්නා හැම තීරණයක්ම ප්‍රශ්න කරන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඉතින්, මෙවර අරගෙන තිබෙන තීන්දුව -උසස් පෙළ විභාගයේ දින නියම කිරීම- අනුවත් විශාල ප්‍රශ්න රාශියක් මතු වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාලය තුළ විභාගවලට ඉදිරිපත් වන දරුවන්ට තමයි අපේ අධ්‍යාපන ක්‍රමය තුළ අසාධාරණ අවස්ථා ගොඩකට මුහුණ දෙන්න සිද්ධ වුණේ. කොවිඩ් වසංගතය නිසා වැඩිපුරම කාලයක් පාසල් වසා දැම්මේ අපේ රටේ. ඒ මදිවාට ආර්ථික අර්බුදය නිසා ඔවුන්ට විවිධ ප්‍රශ්නවලට මුහුණ දෙන්න සිදු වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විභාගවලට දින නියම කරනකොට හැමෝම සතුටු කරන්න බැහැ කියලා අපටත් තේරෙනවා. ඒක තමයි යථාර්ථය. අපට ඒකට මුහුණ දෙන්න වෙනවා. විභාග දින නියම කිරීම හෝ වෙලාවට විභාග පැවැත්වීම විතරක් නොවෙයි අධ්‍යාපනයේ වගකීම විය යුත්තේ. මෙවැනි අර්බුද තත්ත්වයක් තුළ ඒ දරුවන්ගේ මානසික පීඩනය පිළිබඳවත්, ඔවුන් විඳපු දේ පිළිබඳවත් යම් කිසි සංවේදීභාවයක් තිබෙන්න ඕනෑ. විභාග දින නියම කිරීම විතරක් නොවෙයි කාරණය. මේ කාලය තුළ ඇති වෙලා තිබෙන learning loss එකත් එක්ක විභාගයේ අන්තර්ගතය අපට ඒ පරිදිම තියාගන්න

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය]

පුළුවන්ද? මේ ළඟදී UNICEF වාර්තාවක් මඟින් ඉදිරිපත් කළා, තුන්වැනි වසරේ දරුවන්ගේ ඉගෙනුම අහිමිවීම ඉතාම ඉහළ මට්ටමක තිබෙන බව. මේ පිළිබඳව ඔබතුමා දන්නවා. හැබැයි, ඒ තත්ත්වය අනෙක් දරුවන්ටත් එසේම බලපාන්න ඇති. අපි ඒ තොරතුරුවත් දන්නේ නැහැ. එවැනි තත්ත්වයක් තුළ නිකම් විභාග පවත්වන එක විතරක් නොවෙයි කළ යුත්තේ. ඒ දරුවන් මුහුණ දුන් ප්‍රශ්න හඳුනා ගන්න ඕනෑ. ඒ දරුවන්ගේ ආතතිය වැඩි වන විධියට විභාග පවත්වන එකත් වැරදියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමිය.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මෙනෙවිය**
(மாண்புமிகு (கலாநிதி) (செல்வி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) (Ms.) Harini Amarasuriya)
අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

Curriculum එකේ ගුණාත්මකභාවය රඳා පවත්වා ගන්නා අතරම, දරුවන්ට සිද්ධ වෙච්ච දේවල්වලට යම් කිසි සාධාරණයකුත් ඉටු විය යුතුයි. කොවිඩ් වසංගතයටත්, ආර්ථික අර්බුදයටත් මුහුණ දුන්න පිරිසක් නිසා මේ දරුවන් වෙත විශේෂ අවධානයක් යොමු විය යුතුයි. කළ යුත්තේ වෙලාවට විභාග පවත්වන එක විතරක් නොවෙයි. ඔවුන්ගේ මානසික සෞඛ්‍ය පිළිබඳවත්, ඔවුන්ට විඳින්න සිද්ධ වෙච්ච පීඩනය පිළිබඳවත් හිතලා සාධාරණ තීන්දුවක් ගන්න කියන ඉල්ලීම කරමින් මම නතර වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විජිත බේරුගොඩ රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.57]

**ගරු විජිත බේරුගොඩ මහතා (පිරිවෙන් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜித பேருகொட - பிரிவெனாக் கல்வி இராஜாங்க அமைச்சர்)
(The Hon. Vijitha Berugoda - State Minister of Piriven Education)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආයුර්වේද පනත සංශෝධනය කිරීමේ මූලික අරමුණු පිළිබඳව ගරු රාජ්‍ය අමාත්‍යතුමා සඳහන් කළා. අපි අහලා තිබෙනවා, "ආරෝග්‍ය පරමා ලාභා" කියලා. ආරෝග්‍ය පරමා ලාභා කියලා නිරෝගීකම උතුම්ම ලාභය බව අපේ බෞද්ධ සමාජයේ කරුණු දක්වා තිබෙනවා. බටහිර වෛද්‍ය ක්‍රමය ලංකාවේ ප්‍රචලිත වෙන්නට කලින්, බටහිර වෛද්‍ය ක්‍රමයට මේ රටේ ජනතාව නැඹුරු වෙන්නට කලින් අපි පාරම්පරිකව රජ දවසේ සිට ආයුර්වේදයට, නැත්නම් හෙළ වෙදකමට තමයි හුරු වෙලා හිටියේ. ඒ හෙළ වෙදකමින් ප්‍රතිකාර කරන්නේ මිනිසුන්ට පමණක් නොවෙයි, සතා සිවුපාවාට, සර්පයන්ට පවා එම වෛද්‍ය ප්‍රතිකාර ලබා දී සුවපත් කර තිබෙනවා. අපේ ඉතිහාසය පරීක්ෂා කිරීමේදී බෞද්ධ සමාජය තුළ ජීවත් වූ මිනිසුන් සතා සිවුපාවාට පවා ආදරය, අනුකම්පාව දක්වපු බව පෙනී යනවා. ඉතිහාසය හදාරනකොට අපට පේනවා, බුද්ධදාස රජතුමා මහ වනාන්තරයකදී ශල්‍යකර්මයක් කරලා සර්පයෙකුගේ ජීවිතය ආරක්ෂා කළ බව. ආයුර්වේද වෙදකම පිළිබඳ අවබෝධයක් තිබෙන සහ එය ඉගෙන ගත් පිරිසක් රජවරු අතර පවා හිටියා. අපේ ආයුර්වේද වෙදකම, නැත්නම් පාරම්පරික වෛද්‍ය ක්‍රමය අපට ඉතා අවශ්‍යයි; ඉතා වැදගත්. අපට මෙහි අවශ්‍යතාව, වැදගත්කම වැඩිව දැනුණේ කොවිඩ් වසංගතය අවස්ථාවේදී. කොවිඩ් වසංගතය මුළු ලෝකයම වෙළාගෙන තිබුණු වෙලාවේ, ශ්‍රී ලංකාවටත් දරුණු විධියට කොවිඩ් වසංගතයට මුහුණ දෙන්න සිදු වුණු වෙලාවේ බටහිර වෛද්‍ය ප්‍රතිකාරවලට අමතරව අපි හැමෝම වාගේ දේශීය වෛද්‍ය ක්‍රමවලටත් යොමු වුණා. අපි දන්නවා, සමහර විශේෂඥ වෛද්‍යවරු පවා ගෙදරදී පස්පංගුව ගත්ත බව. ඒ වාගේම කොත්තමල්ලි පානයක් විධියට භාවිත කළා. මේ වාගේ දේවල්වලින් ශරීරයේ ප්‍රතිශක්තිකරණය වර්ධනය කරගෙන තමයි රෝහල්වලට පවා ගියේ. සමහර වෛද්‍යවරුන්ගේ අදහස්වලින් අපට ඒක තේරුණා.

ඒ නිසා බටහිර වෛද්‍ය ක්‍රමයෙන් ප්‍රතිකාර ලබා ගන්නවා වාගේම, සිංහල වෛද්‍ය ක්‍රමයේ ප්‍රතිකාර පිළිබඳ විශ්වාසයත් තවම අපේ රටේ ජනතාව තුළ තිබෙනවා. ඒ වාගේම එම ප්‍රතිකාරවලින් ලබා ගත් විස්මිත හා ඇදහිය නොහැකි ප්‍රතිඵල අපි දැකලා තිබෙනවා. බොහෝ වෙලාවට පිළිකා රෝග හැදුණාම, වකුගඩු රෝග හැදුණාම, හෘදයාබාධ හැදුණාම බටහිර වෛද්‍ය ක්‍රමයේ උදව් ඉල්ලාගෙන ගියත්, අවසානයේ බොහෝ අය ආයුර්වේද වෛද්‍ය ක්‍රමයේ, නැත්නම් සිංහල වෙදකමේ පිහිට පතන අවස්ථා තිබෙනවා. එහෙම කරලා සුව වූ අවස්ථා අපට දකින්න ලැබෙනවා. එවැනි අවස්ථාවක තමයි දේශීය වෛද්‍ය ගරු රාජ්‍ය අමාත්‍යතුමා මෙම සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ.

1961 අංක 31 දරන ආයුර්වේද පනත 1962දීත්, 1969දීත්, 1977දීත්, 1978දීත් සංශෝධනය වෙලා තිබෙනවා - හතරවතාවක් සංශෝධනය වෙලා තිබෙනවා. හැබැයි, ඊට පස්සේ අවුරුදු 45ක්, 46ක් පමණ වෙනකල් මෙම ආයුර්වේද පනත සංශෝධනය වුණේ නැහැ. ලෝකය වෙනස් වෙනවා, සමාජ ක්‍රමය වෙනස් වෙනවා, ආර්ථික ක්‍රම වෙනස් වෙනවා, මිනිසුන්ගේ සිතුම් පැතුම් අලුත් විධියට, නොයෙක් විධියට වෙනස් වෙනවා, මිනිස්සු වෙනස් විධියට කල්පනා කරනවා. එහෙම නම්, මූලික හරය ඒ විධියටම තිබියදී ආයුර්වේද වෙදකමත් යම් යම් වෙනස්කම්වලට භාජන වෙන්න ඕනෑ.

එම නිසා තමයි අපේ ගරු සිසිර ජයකොඩි රාජ්‍ය අමාත්‍යතුමා ඒ සියල්ල ගැන කල්පනා කරලා විවිධ විරෝධතාවලට, උද්ඝෝෂණවලට මුහුණ දෙමින් මේ අභියෝගය භාරගෙන මේ සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කළේ. අද මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දෙවැනිවර කියවන්නට පෙර කළ යුතු යම් ක්‍රියාවලියක් තිබුණා. ඒ ක්‍රියාවලිය පිළිබඳව එතුමා සඳහන් කළා. ඉතින් අපි බලාපොරොත්තු වෙනවා, මේ තුළින් ආයුර්වේදය ශක්තිමත් වෙලා, ආයුර්වේද ප්‍රතිකාර ක්‍රම බොහොම පිළිවෙළකට, විධිමත්ව මේ රට පුරා ප්‍රචලිත කරන්න. ඒ සඳහා තමයි එතුමා මේ සංශෝධන ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරු 28,000ක් පමණ ඉන්නවා. එයින් 4,000කට ආසන්න පිරිසක් පමණයි උපාධිධාරීන් ඉන්නේ. මෙතැනදී අපි පාරම්පරික වෛද්‍යවරයාත් ආරක්ෂා කර ගන්න ඕනෑ. ගරු අකිල එල්ලාවල මන්ත්‍රීතුමාත් සඳහන් කළා, හෙළ වෙදකම තුළ බොහෝ දස්කම්-විස්කම් දක්වන පාරම්පරික වෛද්‍යවරු ඉන්නවා කියලා. සමහර වෙලාවට

ඒ අයට ලියාපදිංචිය නොතිබෙන්න පුළුවන්. හැබැයි, රෝගීන් සුවපත් කරනවා. ඒ වෛද්‍යවරුන්ට අසාධාරණයක් නොවන විධියට, ඒ අයගේ වෛද්‍ය ක්‍රමවලට අසාධාරණයක් නොවන විධියට ආයුර්වේද පනත සංශෝධනය වීම ඉතා වැදගත්.

ඒ වාගේම දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් අවශ්‍ය වෙනවා. මොකද, ජාතික ප්‍රතිපත්තියක් තුළින් තමයි මේ හැමෝටම අනන්‍ය වන ක්‍රමයක් සලසන්න පුළුවන් වෙන්නේ. ඒ තුළින් රෝගීන් සුවපත් කිරීම තමයි අපි අවසානයේ බලාපොරොත්තු වෙන්නේ. දැන් ආයුර්වේද වෛද්‍යවරයා, පාරම්පරික සිංහල වෛද්‍යවරයා, අමාත්‍යාංශ නිලධාරින්, වෘත්තීය සමිති සහ මේ පිළිබඳව අවධානය දක්වන බොහෝ පිරිසක් ඉන්නවා. ඒ වාගේම බොහෝ පිරිසක් මේ ක්ෂේත්‍රයට සම්බන්ධ වෙලා ඉන්නවා. ඉතින්, ඒ අයගේ ගැටලු සමනය කරලා, එක තැනකට ගෙනැල්ලා, සියලු පහසුකම් සහිතව වැඩ කිරීමට අවස්ථාව සලසන්න දේශීය වෛද්‍ය විෂය සම්බන්ධයෙන් කටයුතු කරන අපේ රාජ්‍ය ඇමතිවරයාට සිද්ධ වෙනවා. එතුමා ඒ සම්බන්ධයෙන් දක්ෂ රාජ්‍ය අමාත්‍යවරයෙකු විධියට කටයුතු කරනවා.

අපි දන්නවා, මේ වාගේ පනත් කෙටුම්පතක් ගෙනාවාම විවේචන එනවා, විරෝධතා එනවා. ඒක සාමාන්‍ය දෙයක්. අපි දන්නවා, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු මේක සර්ව අසුබවාදී විධියට දකිමින් බරපතළ විවේචන එල්ල කරනවා. මේක හැම දාම එක තැන පල්වන විධියට තිබෙන්න අවශ්‍ය නැහැ. සමාජය වෙනස් වෙනකොට, ආර්ථිකය වෙනස් වෙනකොට, වෛද්‍ය ක්‍රම වෙනස් වෙනකොට මේවා පිළිබඳව අත්හදා බලලා, පර්යේෂණ කරලා එයට අනුගත වෙන්න ඕනෑ. එහෙම නැත්නම් ඒක ප්‍රතික්ෂේප වෙනවා. ඒ ආකාරයට කටයුතු කරන්න තමයි ගරු රාජ්‍ය ඇමතිතුමා බලාපොරොත්තු වුණේ. සමහරු බොරු මතවාද පතුරුවනවානේ. කොරහේ කිඹුල්ලු දකින අයත් ඉන්නවා. මෙතැනදී එක් මන්ත්‍රීවරයෙකු කියනවා අපි දැක්කා, මේක කංසා වගාවට නීත්‍යානුකූල භාවයක් ලබා දීමක්, ඒ වාගේම ගණිකා වෘත්තිය අනියම් විධියට නීත්‍යානුකූල කිරීමක් කියලා. ඒවා නොවෙයි මේකෙන් බලාපොරොත්තු වෙන්නේ. තමන්ගේ පුහු දේශපාලන මතවාදයක් ඔළුවේ තබාගෙන, ඒ තුළ ඉඳගෙන කථා කරලා දේශපාලන වාසියක් ලබා ගන්න බලාපොරොත්තු වෙනවා නම්, ඒක මහජන නියෝජිතකයකුගේ වගකීමක් කියලා නම් මම හිතන්නේ නැහැ. එම නිසා අපි මෙහි තිබෙන සාධනීය දේවල් දකින්න ඕනෑ.

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු විජිත බේරුගොඩ මැතිතුමා සඳහන් කළා, දේශීය වෛද්‍ය ක්‍රමය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් පිළිබඳව. අපේ පාරම්පරික වෛද්‍ය ක්‍රමය ආරක්ෂා කර ගනිමින් ඉතිහාසයේ ප්‍රථම වතාවට අපි සකස් කළ දේශීය වෛද්‍ය ක්‍රමය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ලබන මාසය වන විට අපි ඉදිරිපත් කරනවා. අපි ලබන මාසයේ මුල එය ඉදිරිපත් කරන්න වගබලා ගන්නවාය කියන කාරණය කියනවා. එය දැනටත් සකස් කර අවසානයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විජිත බේරුගොඩ මැතිතුමාට තව මිනිත්තුවක කාලයක් තිබෙනවා.

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සිසිර ජයකොඩි රාජ්‍ය අමාත්‍යතුමාට මම ස්තුතිවන්ත වෙනවා, හෙළ වෙදකම රැක ගැනීම සඳහාත්, අපේ මේ වෛද්‍යවරු ආරක්ෂා කර ගැනීම සඳහාත් එවැනි ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට පියවර ගැනීම පිළිබඳව. ඒ වාගේම මතක් කරන්න ඕනෑ "සුව ධරණී" නමින් කොවිඩ් කාලයේ සකස් කළ ඉතා වටිනා ඖෂධය ගැන. ඒ ඖෂධය ලංකාව පුරාම ප්‍රචලිත වුණා. අපි පෞද්ගලිකවත් ඒක පාවිච්චි කළා. එහි ප්‍රතිඵල අපි දකිනවා.

ඒ විතරක් නොවෙයි. හෙළ වෙදකමේ තිබෙන කීර්ති නාමය ලෝකයට ගෙන යන්න එතුමා කටයුතු කළා. විශේෂයෙන් මෙල්බර්න්, ඇඩිලේඩ්, ලන්ඩන්, කැලිෆෝනියා ආදී නගරවලත්, ස්කැන්ඩිනේවියානු රටවලත්, යුරෝපීය රටවලත් සුව ධරණී නැමැති ආයුර්වේද ඖෂධය ප්‍රචලිත වුණා. අපේ රටේ සන්නාමය ලෝකයට ගෙන යන්න ගරු සිසිර ජයකොඩි රාජ්‍ය ඇමතිතුමා විශාල කාර්යභාරයක් කළා. නමුත්, එතුමාට චෝදනා කරනවා, ධම්මික පැණියක් ගැන කියලා. ඒ වෙලාවේ කවුරුත් ජීවිතය බේරා ගන්න විවිධ ප්‍රතිකාර ඔස්සේ ගිය තත්ත්වයක් තිබුණේ. හැබැයි, කොවිඩ්වලින් අපේ රට බේරාගන්න පුළුවන්කම ලැබුණා නේ. එතැනදී එතුමාත් කාර්යභාරයක් කළා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් කථාව අවසන් කරන්න ගරු රාජ්‍ය ඇමතිතුමා.

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
මට තව විනාඩි දෙකක් විතර දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, විනාඩියකින් අවසන් කරන්න.

**ගරු විජිත බේරුගොඩ මහතා**
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය පළාත් සභා විෂයකටත් ඇතුළත් වෙනවා. පළාත් ආයුර්වේද රෝහල් තිබෙනවා. ඒ රෝහල් පළාත් සභාව මඟින් පාලනය වෙනවා; පළාත් පාලන ආයතන මඟින් පාලනය වෙනවා. ඒ වාගේම පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථානත් තිබෙනවා.

බිබිල ආසනයේ, මැදගම ආයුර්වේද රෝහලක් තිබෙනවා. ඒ ආයුර්වේද රෝහලේ ඔසු උයන් මේ වෙනකොට ආරම්භ කරලා තිබෙනවා. ඒ ඖෂධ අළෙවි කිරීමෙනුත් රජයට විශාල මුදලක් ඒ රෝහල ලබා දෙනවා. ඒ වාගේම ආයුර්වේද සම්බාහන ප්‍රතිකාර මඟිනුත් විශාල ආදායමක් ලබා දෙනවා. ඒ වාගේ ආයුර්වේද රෝහල් තිබෙන ස්ථානවල පරිසරයේ ඉඩකඩ තිබෙනවා නම් ඒ කටයුත්ත කරගෙන යන්න පුළුවන්කම තිබෙනවා. ඒ පිළිබඳවත් විශේෂ අවධානය යොමු කරන්න.

ඒ වාගේම බිබිල නිල්ගල ඔසු උයන ගැනත් මම සඳහන් කරන්න ඕනෑ. නිල්ගල වනාන්තරය තිබෙන්නේ මගේ ආසනයේ, බිබිල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ. ඒ ප්‍රදේශයේ මීට කලින් ආයුර්වේද රෝහලක් තිබුණා. නිල්ගල වනය ආශ්‍රිතව කලින්

[ගරු විජිත බේරුගොඩ මහතා]

තිබුණු ආයුර්වේද රෝහල මේ වෙනකොට වසා දමා තිබෙනවා. ඒක පළාත් සභාව මඟින් පාලනය වන රෝහලක්. ඒත් එක්කම ඖෂධ එක්රැස් කිරීමේ සහ ඖෂධ මිලදී ගැනීමේ මධ්‍යස්ථානයක් විධියටත් එය තිබුණා. ඒ කටයුත්තත් දැන් නතර වෙලායි තිබෙන්නේ. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, පුළුවන්කමක් තිබෙනවා නම් ඊට අවධානය යොමු කරලා, පළාත් සභාවත් එක්ක සාකච්ඡා කරලා එය යථාවත් කරන්න කටයුතු කරන්න. නිල්ගල කියන්නේ, ඔසු වනයක්. සුළඟක් හැමුවත් අරළු, බුළු, නෙල්ලි ඖෂධීය සුවඳ ආඝ්‍රාණය කරන්න පුළුවන්. ඒ වාගේ තැන්වල මේ ඖෂධ එකතු කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම වැදගත්. මොකද, දැන් ඉන්දියාවෙන් ඖෂධ ආනයනය කිරීම නතර කරලා තිබෙනවා නම්, මේ කටයුත්ත හරහා එක පැත්තකින් අපට විදේශ විනිමය ඉතිරි වෙනවා. අනෙක් පැත්තෙන්, අපේ රටේ දේශීය ඖෂධ වගා කිරීම තුළින් ජනතාවට ආදායමක් ලැබෙනවා වාගේම ආයුර්වේදයට අවශ්‍ය ඖෂධ ලබාගන්න පුළුවන්කමත් ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විවිධ අභියෝග සහ ප්‍රශ්න මැද්දේ වුණත්, ගරු සිසිර ජයකොඩි මැතිතුමා මේ ආයුර්වේද පනත සංශෝධනය කරන්න කටයුතු කර තිබෙනවා. එවැනි සංශෝධන 28ක් පමණ තිබෙනවා. ඒවා ඇතුළත් කරලා මේ පනත සංශෝධනය කිරීම තුළින් පාරම්පරික වෙදකම, හෙළ වෙදකම ආරක්ෂා කිරීමට, දේශීය වෛද්‍ය ක්‍රමය ආරක්ෂා කිරීමට මහඟු පිටුවහලක් ලැබෙනවා. ඒ නිසා මෙම පනත් කෙටුම්පත ගෙන ඒම ගැන ගරු සිසිර ජයකොඩි රාජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙමින්, මට අවස්ථාව ලබා දුන්න ගරු නියෝජ්‍ය කථානායකතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් තිබෙනවා.

Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සමන්ප්‍රිය හේරත් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, " ගරු සමන්ප්‍රිය හේරත් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சமன்பிரிய ஹேரத் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON. SAMANPRIYA HERATH took the Chair.*

[අ.භා. 2.08]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1961 අංක 31 දරන ආයුර්වේද පනත සංශෝධනය වීම කාලීන අවශ්‍යතාවක් විධියට අපි දකිනවා. වසර 62ක් තුළ මේ පනතට ඉතාම සීමිත සංශෝධන ප්‍රමාණයක් සිදු වෙලා තිබෙන්නේ. කාලීනව මේ සංශෝධන විය යුතුයි වාගේම මෙහි දුර්වලතාත් අපි හඳුනා ගෙන තිබෙනවා. ඒ දුර්වලතාත් අවබෝධ කරගෙන කටයුතු කළ යුතුයි. විශේෂයෙන්ම මෙය විශාල ක්ෂේත්‍රයක් ආවරණය වන පුළුල් සේවාවක්. ඒ සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි මේ සංශෝධන සිදු වුණොත් හොඳයි. විශේෂයෙන් දේශීය වෛද්‍ය සභා පනත විධියටත්, ආයුර්වේද සේවා පනත විධියටත්, ආයුර්වේද ඖෂධ නියාමන අධිකාරිය පනත විධියටත්, පෞද්ගලික වෛද්‍ය ආයතන නියාමන පනත විධියටත් පනත් කිහිපයක් ඇති වන ආකාරයට මෙය පුළුල් වෙනවා නම් හොඳයි කියන එක කියන්න ඕනෑ. ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේදී ගරු සිසිර ජයකොඩි රාජ්‍ය ඇමතිතුමා මේ කරුණු-කාරණා සලකා බලාවි කියලා අපි විශ්වාස කරනවා. ඒ වාගේම, යටි අරමුණු කිහිපයකුත් මේ අස්සේ තිබෙනවාය කියන එක අපට පේනවා. ඒ තමයි, ගංජා නීතිගත කිරීම, වෘත්තීය සමිති මර්දනය සහ බිය ගැන්වීම. ඒ වාගේම වටේ ඉන්න කිහිප දෙනෙකුට තනතුරු දීම. නමුත් මේ යටි අරමුණුවලින් තොරව මේ කටයුත්ත කළොත් හොඳයි කියා මා විශ්වාස කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න ලැබී තිබෙන්නේ විනාඩි 9ක් නිසා ඒ ගැන වැඩි වශයෙන් කථා කරන්න යන්නේ නැහැ.

විශේෂයෙන් මීට කලින් කථා කරපු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා ආයුර්වේද පනත ගැන කථා කළේ නැහැ. හොරාට කලින් කෙසෙල් කැන වැට පැන්නා වාගේ එතුමාට බොහොම කලබල තත්ත්වයක් ඇති වෙලා තිබුණා. එතුමා කථා කළේ "Channel 4" නාලිකාව ගැන. මේ කාරණාව අපි දිගින් දිගටම කථා කරපු කාරණාවක්. මේ කාරණාව ගැන අපේ පැත්තේ ඉඳන් කථා කරපු මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමා, හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා ආණ්ඩුවට ගියා. හැබැයි, අපි මේ කාරණය දිගින් දිගටම ඉස්මතු කළා. මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්න එක හොඳයි. මේ "Channel 4" නාලිකාවෙන් කියන අසාද් මවුලානා කවුද? අසාද් මවුලානා කියන්නේ, වර්තමාන ආණ්ඩුව නියෝජනය කරන පිල්ලෙයාන් මන්ත්‍රීතුමා මහඇමති වෙලා හිටපු කාලයේ ඉඳන්, එතුමා එල්ටීටීඊ සංවිධානයේ හිටපු කාලයේ ඉඳන් පවා එතුමාගේ මුදල් ගනුදෙනු කරපු, එතුමාගේ මුදල් කළමනාකරණය කරපු, එතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ තනතුරු දරපු, ලේකම් තනතුරු දරපු පුද්ගලයෙකුට. මේ කාරණයේ පෙළ ගැස්ම පටන් ගන්නේ 2017දී සහරාන්ගේ කණ්ඩායම මුස්ලිම් ජනතාවට -ඒ ප්‍රදේශයේ ජනතාවට- ප්‍රහාරයක් එල්ල කරලා ඒ කණ්ඩායම සිරගත වීමත් සමඟයි. ඒ අය සිරගත වෙනකොටත් පිල්ලෙයාන් ඉන්නේ සිරගත වෙලා. එතකොට සිරගත වෙලා හිටපු පිල්ලෙයානුත්, මේ සිරගත වුණු සහරාන්ගේ කණ්ඩායමත් යම් කණ්ඩායමක් විධියට එකතු වෙනවා. එතැනදී සංවාදයක් ඇති වෙනවා; සාකච්ඡාවක් ඇති වෙනවා. එතැනදී තමයි මේ සැලසුම් ක්‍රියාත්මක වෙන්නේ. එතකොට පිල්ලෙයාන් දිගින් දිගටම බුද්ධි අංශ ප්‍රධානී සලේ සමඟ ගනුදෙනු කරපු පුද්ගලයෙක්.

පිල්ලෙයාන්, සහරාන්ගේ කණ්ඩායම බන්ධනාගාරයෙන් එළියට එනකොට සලේට සම්බන්ධ කරනවා. අසාද් මවුලානා කියන විධියට වනාතවිල්ලුවේදී සලේ සහ සහරාන්ගේ කණ්ඩායම හමු වෙනවා. මේක බොහොම බරපතළ කාරණයක්. මේ

මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් කියන විදියට මේ කාරණය සරලව ගන්න බැහැ. අපි දන්නවා, එතකොටත් පිල්ලෙයාන් බන්ධනාගාරගතවයි සිටියේ කියලා. පිල්ලෙයාන් නොයෙක් ආකාරයෙන් පණිවුඩ යවනවා තමන් නිදහස් කරන්න කියලා. මොකද, සැලසුම ඇතුළේ සකස් වෙනවා. ඊළඟට, පිල්ලෙයාන්ට අවශ්‍ය වෙනවා එළියට එන්න. පිල්ලෙයාන් සලේ හරහා රජයට පණිවුඩ යවනවා වහාම ඔහු නිදහස් කරන්න කියලා. මේ හැම දෙයක්ම එකින් එක ගැලපිලා, ගැටගැහිලා තිබෙන කාරණා.

පාස්කු ප්‍රහාරය කියන සිද්ධියේ මහ මොළකරුවන් සිටියා කියා අපි දිගින් දිගටම පැහැදිලිවම කිව්වා. මේක බලය ලබා ගැනීම සඳහා වූ සැලසුමක්, කුමන්ත්‍රණයක් කියන කාරණය ගැන අපි දිගින් දිගටම කථා කළා. සලේ පසුගිය කාලයේ මේ අසාද් මවුලානාගෙන් ප්‍රශ්න කරලා තිබෙනවා. "තමුසේ නලින් බණ්ඩාරට, හරින් ප්‍රනාන්දුට, කාදිනල්තුමාට මේ සම්බන්ධව මොනවා හරි තොරතුරු දුන්නාද?" කියා ප්‍රශ්න කරලා තිබෙනවා කියන එක මේ සටහනේ තිබෙනවා. මගේ නමත් සඳහන් වෙලා තිබෙනවා. මොකද, මම සලේ ගැන යම් ප්‍රකාශයක් කළ නිසා, ඔහු මට විරුද්ධව කෝටි ගණනක් වන්දි ඉල්ලපු නඩුවකුත් මේ වන විට පවරා තිබෙනවා. මේ හැම කාරණයක්ම සත්‍යයි කියන එක අද ඔප්පු වෙලා තිබෙනවා. මේ හැම දෙයක්ම, හැම කුමන්ත්‍රණයක්ම සත්‍යයි කියන එක ඔප්පු වෙලා තිබෙනවා.

මම කනගාටු වෙනවා, අද අපේ මනුෂ නානායක්කාර මැතිතුමා කාදිනල්තුමාටත් ඇඟිල්ල දිගු කරලා කථා කරපු එක ගැන. අපි දැන් පැහැදිලිවම කරන්න ඕනෑ මොකක්ද? මේ තොරතුරු අල්ලාගෙන, මේක ප්‍රකාශ වුණේ "Channel 4" නාළිකාවෙන්, ජිනීවා මානව හිමිකම් කොමිසම ඉලක්ක කරගෙන තමයි මෙවැනි ප්‍රකාශ කරන්නේ කියන එකද කියන්න ඕනෑ? මේ හෙළි කරන ලද කරුණු පදනම් කරගෙන පිල්ලෙයාන්ගෙන් ප්‍රශ්න කරන එක නොවෙයිද කරන්න ඕනෑ? සලේගෙන් ප්‍රශ්න කරන එක නොවෙයිද කරන්න ඕනෑ? අසාද් මවුලානා වහාම රටට ගෙන්වා ඔහුගෙන් ප්‍රශ්න කරන එක නොවෙයිද කරන්න ඕනෑ? ඒක කරනවා වෙනුවට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් ලවා "Channel 4" එකට ගස්වන එකද කරන්න ඕනෑ? ජිනීවා මානව හිමිකම් කවුන්සිලය ගැන කථා කරන එකද කරන්න ඕනෑ? ඒක නොවෙයි කරන්න ඕනෑ. මේ සම්බන්ධව වහාම විධිමත් පරීක්ෂණයක් පවත්වන්න ඕනෑ. මේ අසාද් මවුලානා කියන පුද්ගලයා 2021දී හෝ 2022දී විදේශගත වෙලා තිබෙනවා. ඔහු විදේශගත වෙලා තිබෙන්නේ තිබුණු තර්ජන හින්දා. සලේ ඔහුට තර්ජනය කරලා තිබෙනවා, වහාම රටින් පිට වෙන්න කියලා. මේ තොරතුරු නලින් බණ්ඩාරට දුන්නාද, හරින්ට දුන්නාද, කාදිනල්තුමාට දුන්නාද කියා සලේ ප්‍රශ්න කර තිබෙනවා. අසාද් මවුලානාගේ ඒ ප්‍රකාශයේ එය බොහොම පැහැදිලිව කියා තිබෙනවා. එහෙම නම්, මේක ජනාධිපතිතුමාටවත්, රජයටවත් මහ හරින්න පුළුවන් කාරණයක් නොවෙයි.

මේ සම්බන්ධව පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් පත් කරනවා කියලා ආණ්ඩු පක්ෂයේ මනුෂ නානායක්කාර මැතිතුමා අද උදේ කියනවා අපි දැක්කා. ඒ විතරක් නොවෙයි. මේ සම්බන්ධව වහාම ජාත්‍යන්තර පරීක්ෂණයක් පවත්වන්නත් ඕනෑ. අපි එදා ඉඳන් දිගින් දිගටම පාර්ලිමේන්තුවේ කෑ ගැහුවේ එදා සිදු වූ පාස්කු ප්‍රහාරය බලය ලබාගැනීම සඳහා වූ කුමන්ත්‍රණයක් කියමින්. අසාද් මවුලානාගේ මේ ප්‍රකාශයත් එක්ක අද ඒක ඔප්පු වෙලා තිබෙනවා. එහෙම නම්, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාට වර්තමානයේ රාජපක්ෂ ආණ්ඩුවත් එක්ක එකට ඉඳගෙන ඒ සම්බන්ධ පරීක්ෂණ කරන්න පුළුවන්ද? එහෙම පුළුවන් කියන විශ්වාසයක් අප තුළ නැහැ. අපි දන්නවා, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ බලය රඳා පවතින්නේ කොතැනද කියලා. ගෝඨාභය රාජපක්ෂ පාලනය අහිමි වුණාට පසුව එතුමා ජනාධිපතිවරයා බවට පත් කළේ, වර්තමානයේ ඉතිරි වුණු පොහොට්ටුවේ මන්ත්‍රීවරුන්ගේ අවශ්‍යතාව මත බව අපි දන්නවා. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ පැවැත්ම තීන්දු වන්නේ පොහොට්ටුව මතයි කියන එක මුළු රටම දන්නා කාරණයක්. ඒ නිසා රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ පාලන කාලය තුළ පාස්කු ප්‍රහාරය පිළිබඳ නිවැරදි පරීක්ෂණයක් හෝ එහි මහ මොළකරුවන් සොයා ගැනීම සිදු වෙයි කියා අපි විශ්වාස කරන්නේ නැහැ. ඒ නිසා තමයි අපි දිගින් දිගටම මේ ගැන කථා කරන්නේ. එක පැත්තකින් අපට ලජ්ජයි, මේ ගැන දිගින් දිගටම කථා කරපු අපේ සහෝදර මන්ත්‍රීවරුන් දෙදෙනා වන හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා සහ මනුෂ නානායක්කාර මන්ත්‍රීතුමා අද ආණ්ඩුව වෙනුවෙන් පෙනී සිටීම ගැන. අසාද් මවුලානා කියන මේ කාරණා -මේ තොරතුරු- බොහොම පැහැදිලිවම හරින්ට, මනුෂට, අපට ඒ වෙලාවේ ලැබිලා තිබුණා. ඒ නිසා තමයි අපි දිගින් දිගටම මේ ගැන කථා කළේ. අද මම අපේ මිත්‍ර හරින්ට සහ මනුෂට කියනවා, දැන් ඔබතුමන්ලාට මේ තොරතුරු සනාථ කරන්න අවස්ථාව උදා වෙලා තිබෙන බව. මොකද, නම් පැහැදිලිවම කියා තිබෙන නිසා. ඒ නිසා මේ ගැන පරීක්ෂණ පවත්වන්න කියා ජනාධිපතිවරයා යොමු කරන්න හරින්ට, මනුෂට පුළුවන්කම තිබෙන්න ඕනෑ. ඒ සඳහා ජනාධිපතිවරයා යොමු කරලා ඒ ජාත්‍යන්තර පරීක්ෂණය තුළින් ඇත්ත සොයා ගන්න.

එදා පාස්කු ප්‍රහාරයේ වින්දිතයන් විදියට අපේ රටේ කතෝලික ජනතාව විතරක් නොවෙයි රටේ සමස්ත ජනතාව පීඩාවට ලක් වුණා; ආර්ථිකය කඩා වැටුණා; සංචාරක කර්මාන්තය කඩා වැටුණා; නොයෙක් ක්ෂේත්‍රවල විශාල බිඳ වැටීමක් ඇති වුණා; මුස්ලිම් ජනතාවට විශාල පීඩනයක් එල්ල වුණා. දැන් මේ ගරු සභාවේ සිටින රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා නිස්කාරණේ මාස ගණනාවක් හිරේ හිටියා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මාස කීයක් නම් හිරේ හිටියාද? අන්තිමට සේරම එකතු වෙලා තඩි බැවේ මේ රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමාට. මෙතුමා හිරේ දැම්මා. මුස්ලිම් ජනතාවගෙන් පළිගත්තා. අපේ ප්‍රදේශවල මුස්ලිම් පල්ලි කැඩුවා. ඒ සියල්ල වුණේ පාස්කු ප්‍රහාරය නමැති මහා කුමන්ත්‍රණයේ ප්‍රතිඵලයක් විදියට. ඒකෙන් හැම දාම එකට හිටපු ජන කොට්ඨාස දෙකක් වන අපේ මුස්ලිම් සහ සිංහල ජනතාව භේද වුණා; දුරස් වුණා.

අසාද් මවුලානාගේ ඒ ප්‍රකාශයත් එක්ක, "Channel 4" නාළිකාව අද රෑ වනකොට හෙළි කිරීමට නියමිත අනෙකුත් කරුණුත් එක්ක වහාම ජාත්‍යන්තර පරීක්ෂණයක් පවත්වා පාස්කු ප්‍රහාරයට සම්බන්ධ සියලුදෙනාට දඬුවම් ලබා දෙන්න. පිල්ලෙයාන් වෙන්න පුළුවන්, රාජ්‍ය බුද්ධි අංශයේ ප්‍රධානි සලේ වෙන්න පුළුවන්, ඔහුට අණ දුන්නු සහ ඔහු ක්‍රියාත්මක කරවපු දේශපාලන බලධාරින් වෙන්න පුළුවන්, ඊට සම්බන්ධ සියලුදෙනා දඬුවම් ලබන තැනට පත් කරන තීන්දුව ගන්න කියා අපි රජයට කියනවා; ජනාධිපතිවරයාට කියනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (ආචාර්ය) සරත් වීරසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 16ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.17]

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආයුර්වේද පනත සංශෝධනය ගැන වචන කිහිපයක් කථා කරන්න ලැබීම සතුටක්. ආයුර්වේද වෛද්‍ය සභාව, ආයුර්වේද අධ්‍යාපන සහ ආරෝග්‍යශාලා මණ්ඩලය සහ ආයුර්වේද පර්යේෂණ කමිටුව යන ආයතන තුනෙහි පුද්ගල මණ්ඩල සඳහා දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය

[ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා]

නියෝජනය වන පරිදි සංයුතිය පුළුල් කිරීමට ගෙනාපු යෝජනාව ගැන ඇත්ත වශයෙන්ම අපි සතුටු වෙනවා. ඒ වාගේම, "ආයුර්වේද" යන්නට දේශීය චිකිත්සා වෛද්‍යකර්ම සහ ශල්‍යකර්ම ද ඇතුළත් කිරීම අපි මේ අවස්ථාවේ අගය කරනවා. මේ කරුණු ගරු රාජ්‍ය අමාත්‍යතුමා ඊයේ කණ්ඩායම් රැස්වීමේදී ඉතා හොඳින් පහදා දුන්නා.

මම මෙතැනදී වඩාත්ම අවධානයට යොමු කරන්නේ, අපේ පාරම්පරික හෙළ වෙදකම ගැන. පාරම්පරික වෙද මහත්වරුන්ගේ ලියාපදිංචිය පිළිබඳ ප්‍රශ්නයක් මතු වුණා. එතුමා ඉතා පැහැදිලිව කිව්වා වයස අවුරුදු 45ට වැඩි අයට සම්මුඛ පරීක්ෂණයක් පවත්වා, වයස අවුරුදු 45ට අඩු අයට ලිඛිත පරීක්ෂණයක් පවත්වා, වයස අවුරුදු 70ට වැඩි අයට ඒ අයගේ ගම්වලටම ගිහින් ලියාපදිංචිය ලබා දෙනවා කියලා. ඒක ඉතාම හොඳ දෙයක්. ඒ වාගේම, දේශීය වෛද්‍ය ක්‍රම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකසන්නටත් මේ අවස්ථාවේ කටයුතු කිරීම ගැන මගේ ප්‍රණාමය රාජ්‍ය අමාත්‍ය ගරු සිසිර ජයකොඩි මැතිතුමාට පුද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේ කිව යුතු තවත් කාරණයක් තිබෙනවා. මම මීට දවස් දෙකතුනකට ඉස්සෙල්ලා උපහාර උළෙලකට ගියා. ඒ උපහාර උළෙල පැවැත්වුයේ වෛද්‍ය හීන්නිලමේ මැතිතුමා වෙනුවෙන්. එතුමා තමයි කැඩුම් බිඳුම් ප්‍රතිකාර සඳහා ලංකාවේ ඉන්න ඉතා ප්‍රසිද්ධ, ඉතා දක්ෂ වෛද්‍යවරයා. එතුමාට ජනාධිපති සම්මානයකුත් හම්බ වුණා. මීනුවන්ගොඩදී තමයි ඒ උපහාර උළෙල පැවැත්වුයේ. මටත් එයට සහභාගි වෙන්න ලැබුණා. ඒ අවස්ථාවට සහභාගි වෙන්න ලැබීම ගැන මම බෙහෙවින් සතුටු වෙනවා. එතුමා ජාතික වස්තුවක් හැටියට තමයි මා සලකන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත ගැන අද බොහෝ අය කථා කරනවා. එහි අපේ දේශීය චිකිත්සා, හෙළ වෙදකම ගැන සඳහන් වෙලා තිබෙන නිසා පාරම්පරික හෙළ වෙදකම ගැන කෙටියෙන් සඳහන් කරන්න අවසර දෙන්න කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ඉතිහාසයේ මුතුන් මිත්තන් කළ විශ්වකර්ම වැඩ ගැන බලන විට හෙළ දේශීය වෛද්‍ය ක්‍රමයත් එක්තරා විශ්වකර්ම වැඩක් ලෙස අපි සලකනවා. ඒක ඉපැරණි යක්ෂ ගෝත්‍රිකයන් විසින් සොයා ගන්නා ලද්දක් බවයි අප විශ්වාස කරන්නේ. ඒ වෛද්‍ය ප්‍රතිකාරවලට දේශීය යන්ත්‍ර මන්ත්‍රත් ඇතුළත්ව තිබුණා. අපි දන්නවා, ඒ කාලයේ දත් කැක්කුම හැදුණාම ලුණු කැටයකට මතුරලා කැක්කුම තිබෙන දතේ තිබ්බාම දත් කැක්කුම නැති වෙලා ගිය බව. ඒ වාගේම මතුරලා කොස් ගහට ඇණයක් ගැහුවාම දත් කැක්කුම නවතිනවා. කකුලේ මහපටැඟිල්ලට බෙහෙත් බැන්දාම ඇඟේ සුද කැපෙනවා. නාඩි අල්ලලා පුළුවන් ශරීරයේ තිබෙන ඕනෑම රෝගයක් විශ්ලේෂණය කරන්න. සර්පයෙකු දෂ්ට කළාම ඒ ගැන කියන්න එන පණිවුඩකාරයාට අනුව තමයි ඇත්ත වශයෙන්ම දෂ්ට කළ සතා මොකාද, දෂ්ට කළ වෙලාව මොකක්ද කියලා දැනගෙන ප්‍රතිකාර කරනවා කියන්නේ. මේවා බටහිර වෛද්‍ය විද්‍යාවේ නැහැ. ඒ නිසා පැරණි හෙළ වෙදකම අපේ ඓතිහාසික සම්පතක් හැටියට තමයි අපි සලකන්නේ.

ලෝකයේ පැරණිම රෝහල පණ්ඩුකාභය රජු දවසේ තමයි ඉදි කර තිබෙන්නේ. ක්‍රි. පූ. 4 වන සියවස තරම් ඈත කාලයෙන් තමයි ඒ පැරණි රෝහල අපට හමු වෙන්නේ. එම යුගයේ අනුරාධපුරයේ තිඹිරි ගෙයක් සහ ගිලන් හලක් තිබූ බව කියැවෙනවා. පාලි භාෂාවෙන් රෝහලට කියන්නේ, "වෙජ්ජසාලා, ගිලානසාලා, භෙජ්ජ ගෙහ" කියලායි.

"ආරෝග්‍යශාලාව" කියන්නේ ආරෝග්‍ය නැත්නම් නීරෝගීභාවය පවත්වන තැන. ඒ වාගේම, "රෝහල" කියන්නේ රෝග හලන තැන. අපේ හෙළ භාෂාවත් මේ හෙළ වෛද්‍ය ක්‍රමයත් සමඟ තමයි ගිහිල්ලා තිබෙන්නේ. ගිලෙනවාට ඉංග්‍රීසියෙන් අපි කියනවා "sink" කියලා. ඉතින් ගිලන් කියන්නේ ගිලෙනවා කියන එකයි. එතකොට ගිලෙනවා නම් ගිලෙන කෙනෙකු අපි තව ඔබන්නේ නැහැ. ඔහු ඔසවලා තියනවා. ඒකට තමයි "ඔසු" කියලා කියන්නේ. අපේ හෙළ භාෂාවත්, මේ හෙළ වෛද්‍ය ක්‍රමයත් සමඟ තමයි එකිනෙකට සමාන්තරව - parallel ලෙස - යන්නේ. ක්‍රිස්තු වර්ෂ 4වැනි සියවසේ චීන දේශාටක පාහියන් හිමිගේ වාර්තාවලත් සඳහන් වෙලා තිබෙනවා, මිහින්තලයේ පිරිවෙන් සහ ආරාම තිබුණු බවත්, භික්ෂූන් වහන්සේලා 2,000ක් සිටි බවත්, උන්වහන්සේලාට ආහාර සහ බත් ගෙවල් තිබුණු බවත්, රෝහල් තිබුණු බව සහ වෛද්‍යවරු සිටි බවත්.

ඒ වාගේම, අපේ ඉපැරණි මූලාශ්‍ර අනුව භාරතයේ හිමාල අඩවියේ තිබුණු ඍෂි වෛද්‍ය සම්මේලනයට අපේ රට - හෙළ දිවයින - නියෝජනය කළේ පුලස්ති ඍෂිවරයා කියලා තමයි සඳහන් වන්නේ. පුලස්ති ඍෂිවරයාගේ මුනුබුරා තමයි රාවණා රජ්ජුරුවෝ. හෙළ වෙදකම, ගුප්ත ශාස්ත්‍රය සහ රස ශාස්ත්‍රය ඇතුළු සකල විද්‍යාවන්ගේම ප්‍රවීණයකු හැටියට තමයි අපි එතුමා සලකන්නේ. රාවණා රජ්ජුරුවෝ ලියලා තිබෙනවා වෛද්‍ය ග්‍රන්ථ 4ක්. ඒවා තමයි නාඩි තන්ත්‍රය, කුමාර තන්ත්‍රය, උඩීශ තන්ත්‍රය සහ අර්ක ප්‍රකාශය. අපේ හෙළ වෙදකමේ අතීතය නැත්නම් අපේ අභිමානය මොනතරම් දුරට යනවා නේද කියලා අපට ඒකෙන් හිතාගන්න පුළුවන්. ඒ වාගේම තමයි, ඇතැම් ඖෂධ සංස්කරණ සහ චිකිත්සක ක්‍රම අපේ රටටම, අපටම, සිංහලයාටම ආවේණික වෙච්ච දේවල්.

ඉස්සෙල්ලාත් මේ කාරණය කිව්වා. බුද්ධදාස රජ්ජුරුවෝ ක්‍රිස්තු වර්ෂ 337 සිට 365 දක්වා තමයි රජ කළේ. ඔහු වෛද්‍ය කර්මය පිළිබඳ විශේෂඥයෙක්, ශල්‍යකර්මය පිළිබඳ විශේෂඥයෙක්, සූතිකා කර්මය පිළිබඳ විශේෂඥයෙක්, පශු වෛද්‍ය ක්‍රමය ගැන විශේෂඥයෙක්. විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා කිව්වා වාගේ එතුමා බඩේ ගෙඩියක් තිබෙන සර්පයෙක් පවා ශල්‍ය කර්මයකින් සුව කළා කියලා පොතපතේ සඳහන් වෙලා තිබෙනවා. ඒ වාගේම, එතුමා ලියා තිබෙනවා, "සාරාර්ථ සංග්‍රහය" කියලා පොතක්. ඒ වෛද්‍ය පොත තමයි දේශීය වෛද්‍යවරුන්ගේ අත්පොත හැටියට තවමත් සලකන්නේ. එතුමා හැම ගමකම ආරෝග්‍යශාලා පිහිටෙව්වා, හැම ගම් 10කටම එක වෙද මහත්මයෙක් පත් කළා. ඒ කෙත්වල ආදායමෙන් දහයෙන් එකක් ඒ වෛද්‍යවරයාට වැටුප් වශයෙන් දුන්නා කියලා පොතපතේ සඳහන් වෙලා තිබෙනවා. ඒ කියන්නේ අපේ හෙළ වෛද්‍ය ක්‍රමය එතරම් අතීතයට දිව යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම හත්වැනි අග්ගබෝධි රජ්ජුරුවන්ගේ කාලයේ - ක්‍රිස්තු වර්ෂ 766-772 - කළ වෛද්‍ය පර්යේෂණයක් ලොව පළමු වෛද්‍ය පර්යේෂණය, world's first medical research, හැටියට සඳහන් වෙලා තිබෙනවා. එතුමා මුළු ලංකාද්වීපයේම ඖෂධ පැළෑටි රෝගීන්ට හිතකරද, අහිතකරද කියන එක ගැන ඉතා හොඳ අධ්‍යයනයක් කරලා තිබෙනවා. මේක තමයි ලෝකයේ පැවති පළමුවැනිම medical research එක හැටියට සඳහන් වෙන්නේ. අපේ ඉපැරණි රෝහල් තිබිලා තිබෙනවා, මිහින්තලයේ, පොළොන්නරුවේ ආලාහන පිරිවෙනේ, රිටිගල සහ මැදිරිගිරියේ. වසර දහස් ගණනක් පැරණි ඒ බෙහෙත් ඔරු තවමත් තිබෙනවා.

ඒ වාගේම, ඉතා රසවත් දෙයක් අතීතයේ සිදු වෙලා තිබෙනවා. 1907දී මැදිරිගිරියේ ගල් ලෑල්ලක අපේ ශිලා ලිපියක්

මතු වෙලා තිබෙනවා. එහි සඳහන් වන්නේ, ක්‍රිස්තු වර්ෂ 1187 හයවැනි මහින්ද රජුගේ කාලයේ මේ රෝහල්වලට තිබුණු නීතිරීති. දැන් බලන්න, මීට අවුරුදු 1,000කට ඉස්සෙල්ලා අපේ හෙළ වෙදකම කොච්චර අභිමානවත්ද කිව්වොත් ඒ රෝහල්වල තිබෙන නීති-රීති පවා මේ ශිලා ලිපියේ ලියලා තිබෙනවා. එතුමා එහි සඳහන් කර තිබෙනවා, රෝහල පවත්වාගෙන යෑමේ වගකීම කාර්ය මණ්ඩලයට සහ රජුගේම සේවකයන්ට අයිති වන බවත්, රෝහලේ සේවකයන්ට කාර්යාල සේවකයන්ගෙන් වැඩ ගන්න බැරි බවත්, රෝහල නඩත්තු වන්නේ රජු විසින් රෝහලට පරිත්‍යාග කරන ඉඩම්වල තිබෙන ආදායමින් බවත්, රෝහලේ සොරකමක් හෝ අයුතු වැඩක් වුණොත් ඒ වෛද්‍යවරයා සහ නිලධාරින් වහාම සේවයෙන් පහ කරන්න ඕනෑ බවත්, රජ මාලිගයේ අධිපතියෙක් වර්ෂයක් පාසා රෝහලේ කටයුතු අධීක්ෂණය කරන්න ඕනෑ බවත්, රෝගීන්ට කරදර වන ආකාරයට ශබ්ද ඇති වන සංගීත භාණ්ඩ සහ මත්පැන් බීම තහනම් බවත්, ඒවා රෝහල් භූමියෙන් පිට බදු ගෙවන අයට කරන්න පුළුවන් බවත්, රෝහල තුළ තහනම් බවත්. ලෝකයේ කිසිම රටක වසර දහසකට ඉස්සෙල්ලා රෝහලක් පවත්වාගෙන යන නීති පිළිබඳව සඳහන් කරලා නැහැයි කියා තමයි මා කියන්නේ.

ඒ වාගේම, ඉතා රසවත් තවත් දෙයක් මම දැන් කියනවා. ඒ, අපි බොහෝ අය දන්නේ නැති දෙයක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හෙළ වෙදකමේ තිබෙනවා, "කළං" කියලා ඖෂධ මනින ඒකකයක්. ඖෂධ මනින්න භාවිත කරන ඒකකයට අපි කියනවා "කළඳක්" කියලා. කළං එකක් කියලා කියන්නේ ග්‍රෑම් 4.66ක්. රාජ් සෝමදේව කියන අපේ පඬිවරයා නැත්නම් පුරා විද්‍යාව පිළිබඳව විශේෂඥයා කියනවා, පැරණි හෙළ වෙදකමේ ඉතා සියුම් මිනුම්කරණ ක්‍රම තිබුණා කියලා.

අපි දන්නවා, කළං එකක් කියන්නේ ග්‍රෑම් 4.66ක්. කළං එකට තිබෙනවා, මංචාඩි 20ක්. එතකොට මංචාඩියක බර කොච්චර වෙන්න ඕනෑද? මංචාඩියක තිබෙනවා, භාර 8ක්. එහෙම නම්, භාරය කොච්චර සියුම් වෙන්න ඕනෑද? මුල ඉඳලා ගත්තොත්, මෙහෙමයි සඳහන් වෙන්නේ. වීහ 4ක් ගුන්ජා 1යි. ගුන්ජා 2ක් මාසක 1යි. මාසක 2.5ක් අක 1යි. අක 8ක් ධරණ 1යි. ධරණ 5ක් ස්වර්ණ 1යි. ස්වර්ණ 2ක් පල 1යි. පල 100ක් තුල 1යි. තුල 20ක් භාර 1යි. භාර 8ක් මංචාඩි 1යි. මංචාඩි 20ක් කළං 1යි. කළං එකක් ග්‍රෑම් 4.66ක් නම් වීහ 1ක බර කොච්චරද කියලා අපට හිතා ගන්න පුළුවන් නේද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ඒ වාගේ ඉතා සියුම් බරක් සහිතව ඖෂධ ලබා දෙන්නේ නිර්වින්දනයට කියලා තමයි කියන්නේ. රාජ් සෝමදේව මැතිතුමා කියනවා, අවුරුදු දහස් ගණනකට පෙර භාවිත කළ ඉතා සියුම් බර කිරන දණ්ඩක් හම්බ වුණාය කියලා. ඒ වාගේ ඉතිහාසයක් තමයි හෙළ වෙදකමට තිබෙන්නේ.

අපි දන්නවා, පළමුවන පරාක්‍රමබාහු රජ්ජුරුවන්ට ඉතාම ශක්තිමත් නාවික හමුදාවක් සිටි බව. ඒ කාලයේ අපට බුරුමයත් සමඟ වෙළෙඳ ගනුදෙනු තිබුණා. එක්තරා අවස්ථාවක බුරුමයේ රජ්ජුරුවෝ අපේ නෞකා කොල්ලකාලා අපේ නාවිකයන් කන්දක හිර කරලා අපේ වස්තුව කොල්ලකෑවා. ඒක ආරංචි වුණාට පස්සේ පරාක්‍රමබාහු රජ්ජුරුවෝ මොකද කළේ? ත්‍රිකුණාමලයේ සිට මඩකලපුව දක්වා නැව් තටාකාංගණ පහක් හැදුවා. රුවල් නැව් 300ක් නිෂ්පාදනය කළා. නැවියෝ 300ක් බඳවා ගත්තා. ඊට පසුව කිත්ති නගරගිරි සහ ආදිත්‍ය දමිලාධිකාර කියන අද්මිරාල්වරු දෙදෙනෙක් පත් කරලා තමයි ත්‍රිකුණාමල වරායෙන්, Bay of Koddiyarවලින් බුරුමයට යැව්වේ. බුරුමයට යවනකොට, පේගු දේශය ආක්‍රමණය කරනකොට ඒ නෞකාවල ගෙනිහිල්ලා තිබෙනවා, වෛද්‍ය ප්‍රතිකාර සඳහා වෛද්‍ය මණ්ඩලයක්. ඒ වාගේම විෂ යෙදූ ඊතල, තුවාල සුව කිරීම සඳහා විවිධ ඖෂධ බහාලූ හරක් අං යවා තිබෙනවාය කියලා පොත්වල සඳහන් වෙනවා. ඒ වාගේම වගුරු බිම්වල ජලය පිරිසිදු කරන ඖෂධ ගෙන ගියාය කියලා පොත්වල සඳහන් වෙලා තිබෙනවා. ඒ වාගේම ශරීරයේ ගැඹුරට කා වැදී මීට කැඩුණු ඊතල හිස් උදුරා දැමීමට යකඩ අඬු අරගෙන ගියාය කියලා තිබෙනවා. ඒ වාගේම දක්ෂ වෛද්‍යවරු සහ සේවක කාන්තාවන් - nurses- කණ්ඩායමකුත් අරගෙන ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේ ඉතා පැහැදිලිව අපේ හෙළ වෙදකමේ ඉතිහාසය අවුරුදු දහස් ගණනක් ඈතට දිව යනවා. ඒක තමයි හෙළ වෙදකම. ඒ හෙළ අභිමානය අපි ආරක්ෂා කර ගන්න ඕනෑ. ඒ සඳහා අපේ රාජ්‍ය ඇමතිතුමා කරන සේවය මම මේ අවස්ථාවේ දී ගෞරවයට පාත්‍ර කරනවා.

ඊළඟට, කියන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. "Channel 4" ගැන අද කථා කළා. මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාත් ඉතා පැහැදිලිව කිව්වා, සිංහල බෞද්ධ නායකයකු බලයට ගෙනෙන්න මුස්ලිම් අන්තවාදීන් 9දෙනෙක් සහ ගර්භිණී මාතාවන් පවා දරුවන් සමඟ දිවි නසා ගන්නවාද කියලා අපි හිතන්න ඕනෑය කියන එක. ඒක සම්පූර්ණයෙන්ම හාස්‍යයට කාරණයක්. මොකද, බෞද්ධ නායකයකු බලයට ගෙනෙන්න මුස්ලිම් අන්තවාදීන් තමන්ගේ දරුවන් සමඟ බෝම්බ පුපුරුවා ගන්නවාද කියන ප්‍රශ්නය ඉස්සර වෙලාම අහන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම "Channel 4" එක ජිනීවා මානව හිමිකම් සැසි වාරය පටන් ගන්නකොට කරන දෙයක්, එ්ක. අපි දන්නවා, 2011දී ඔවුන් "Sri Lanka's Killing Fields" කියලා චිත්‍රපටයක් කළා. ඊට පසුව 2012දී, "Sri Lanka's Killing Fields: War Crimes Unpunished" කියන චිත්‍රපටය ගෙනාවා. ඊට පසුව 2013දී "No Fire Zone: In the Killing Fields of Sri Lanka" චිත්‍රපටය ගෙනාවා. ඒ සියලු ඒවා ව්‍යාජ චිත්‍රපටවල රඟපෑම් බව ජිනීවා ගිහිල්ලාත්, ඇත්ත වශයෙන්ම පෞද්ගලිකවත් මම සනාථ කළා. දැන් මේ පාස්කු ප්‍රහාරය හමුදාව පිට දමන්නේත්, සිංහල නායකයකු බලයට ගෙනෙන්න කළ කුමන්ත්‍රණයක්ය කියන්නේත්, ජිනීවාවල හෙට-අනිද්දා පටන් ගන්නා මානව හිමිකම් සැසි වාරය නිසායි. අපි දන්නවා, අගෝස්තු 15වැනි දා තමයි ඒක පෙන්වන්න හිටියේ. නමුත් අපි නීති මාර්ගයට ගිය නිසා තමයි සම්පූර්ණයෙන් ඒක අත්හිටුවලා, දැන් මානව හිමිකම් සැසි වාරය පටන් ගන්න ඔන්න මෙන්න තිබියදී නැවත පටන් ගන්නේ.

අපි දන්නවා, අසාද් මවුලානා කියන්නේ, TMVP එකේ මාධ්‍ය ලේකම්. ඔහු ලක්ෂ 700ක් -මිලියන 70ක්- පමණ හොරකම් කරලා රටින් පැනලා ගිහිල්ලා, දැන් එංගලන්තයේ තමයි ඉන්නේ. අපේ සිංහල කියමනක් තිබෙනවා, "ඌරන් කැකුණ තලන විට හබන් කුකුළන්ට රජ මඟුල්" කියලා. ඉතින් මේ වාගේ දේවල් සිදුවෙනකොට අපේ රටට, අපේ හමුදාවලට අවමාන කරන්න, අපහාස කරන්න බලාගෙන ඉන්න අයට ඒක රජ මඟුලක් වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සහරාන්ගේ විනාඩි 28ක වීඩියෝ එකක් තිබෙනවා. ඒකේ ඉතා පැහැදිලිව කියනවා, ඔහු ඒ ප්‍රහාරය කරන්නේ ඇයි, කොහොමද කරන්නේ කියලා.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
ඔබතුමා මගේ වෙලාව ගන්න එපා.

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මම විනාඩියක කාලයක් පමණයි ගන්නේ.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා "Channel 4" ගැන කිව්වා. ඔබතුමන්ලාගේ රජය බලයට පත් වුණේ පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය පසුපස සිටින අය අල්ලනවා කියලා. ඒ අය ඇල්ලුවා නම්, මේ වාගේ කට කථා පැතිරෙන්නේ නැහැනේ. ඔබතුමන්ලා එතැනදී අසාර්ථක වුණා. ඔබතුමන්ලා ඒ පරීක්ෂණය කරලා වැරදිකරුවන් අල්ලා දඬුවම් නොදුන්නේ ඇයි? මොකද, ඔබතුමන්ලා මේ රටේ ජනතාවට ඒ යම් පොරොන්දුවක් දුන්නා.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් යහපාලන රජය කාලයේ හිටියා. යහපාලන රජය කාලයේ තමයි පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය එල්ල වුණේ. පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය එල්ල කරන්න ඉස්සෙල්ලා සහරාන් ඒ වාගේ අන්තවාදී ක්‍රියා 10ක් පමණ සිදුකර තිබෙනවා. නමුත්, ඒ ක්‍රියාවලට සම්බන්ධ වැරදිකරුවන් කවදාවත් අත්අඩංගුවට ගත්තේ නැහැ. හැබැයි ඒ වෙලාවේ බුද්ධි අංශයේ හිටපු ප්‍රධානීන් කිව්වා, සහරාන් අත්අඩංගුවට ගන්න කියලා. නමුත්, අත්අඩංගුවට ගත්තේ නැහැ. ඒ නිසා වළක්වන්න බැරි වුණු, වැළැක්වූයේ නැති ප්‍රහාරයක සම්පූර්ණ වගකීම අපේ පැත්තට දමන්න එපා. ඒ සම්බන්ධයෙන් හත්සියයක් පමණ අත්අඩංගුවට ගත්තා. ඒ සමහරු තවමත් හිරේ ඉන්නවා. ඒ ප්‍රහාරයේ වගකීම ඔබතුමා අපට දමන්න එපා. ඔබතුමන්ලාගේ ආණ්ඩුව කාලයේ - යහපාලන රජය කාලයේ- දේශපාලන අත පෙවීම් සිදු වුණු නිසා තමයි අත්අඩංගුවට ගත් අයත් නිදහස් කළේ. පාස්කු ඉරිදා ප්‍රහාරයේ සම්පූර්ණ වගකීම, ඔබතුමාත් හිටපු යහපාලන රජය භාර ගන්න ඕනෑ කියලා මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය බුද්ධි සේවයේ ප්‍රධානි මේජර් ජනරාල් සුරේෂ් සලේ, Centre for Society and Religionහි විධායක අධ්‍යක්ෂවරයාට විරුද්ධව රුපියල් මිලියන 50ක අපහාස නඩුවක් දමලා තිබෙනවා. ඔහුට තිබෙන චෝදනාව තමයි, සහරාන් හමුවීම, මුදල් සහ වෙනත් සහාය ලබා දීම. ඒවා හිතාමතා ගොතපු දේවල්. කිසිම පදනමක් නැතිව, සාක්ෂියක් නැතිව එතුමාට අපහාස කරන්න හිත ාගෙන කරපු දෙයක් නිසා තමයි එතුමා රුපියල් මිලියන 50ක අපහාස නඩුවක් දමලා තිබෙන්නේ. එහෙම කරලා තිබෙනවා නම්, ඒ නඩුවේදී ඒ චෝදනා ඔප්පු කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පිටරටවල ඉන්න අපේ තානාපතිවරු මේ බොරු චෝදනා, අසත්‍ය ප්‍රකාශවලට එරෙහිව ඒ රටවල වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුයි කියා මා හිතනවා. ඒ වාගේම සහරාන්ගේ විනාඩි 28ක වීඩියෝ එකේ පැහැදිලිව කියනවා, අම්මා, තාත්තා, දරුවෝ ඔක්කෝම අල්ලාහ් දෙවියන් වෙනුවෙන් මේ ප්‍රහාරය එල්ල කරනවා කියන එක. එහෙම නම් ඒක බෞ ද්ධ නායකයන් බලයට ගෙනෙන්න කරපු දෙයක් නොවෙයි. මේ ප්‍රහාරය ඔවුන්ගේ ආගමික නායකයා වෙනුවෙන් කරපු දෙයක් බව ඉතා පැහැදිලිව කියා තිබියදීත් මේ වාගේ ප්‍රකාශ කරන්නේ කොහොමද කියලා තමයි මට අහන්න වෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් ලබා දෙන්න.

පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය ගැන හොයන්න ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් සහ විශේෂ කාරක සභාවක් පත් කළා. අපි ඒවායේ නිර්දේශ ක්‍රියාත්මක කරන්න ඕනෑ. නමුත්, ඒවා ක්‍රියාත්මක කිරීම ප්‍රමාදයි. ඒ ප්‍රහාරයට මුදල් දුන්නේ ඉල්හාම් සහ ඉන්සාෆ්. ඔවුන්ගේ තාත්තා, ඊබ්‍රාහිම් හජ්ජියාර්. ඔහු කුළු බඩු ව්‍යාපාරිකයෙක්. විජයදාස රාජපක්ෂ මැතිතුමා 2015දී කිව්වා, ISIS සංවිධානයට බැඳෙන්න ලංකාවෙන් 32ක් ගියා කියලා. ඒ වෙලාවේ මුජිබුර් රහුමාන් හිටපු මන්ත්‍රීතුමා ඇතුළු අනෙකුත් මුස්ලිම් මන්ත්‍රීවරු ඒක සමච්චලයට ලක් කළා. ඒවා හරියට සොයා බැලුවා නම් එදා මේ ප්‍රහාරය වළක්වා ගන්න තිබුණා.

මේ අවස්ථාවේදී අපි කාදිනල්තුමාට ගරු කරන්න ඕනෑ. එතුමා ඉතා හොඳ නායකයෙක්. පාස්කු ප්‍රහාරයෙන් පසුව ඇති වෙන්න තිබුණු විශාල ගැටුමක් එතුමා නිසා වැළකුණා. නමුත්, අපේ රජය ඒ ප්‍රහාරයට සම්බන්ධ වාර්තා නිසි වෙලාවට උත්වහන්සේට ලබා නොදීම විශාල වරදක්. ඒ සියලු වාර්තාවල තිබෙනවා, මුස්ලිම් අන්තවාදීන් ඔවුන්ගේ ආගමික චින්තනයට අනුව ඒ ප්‍රහාරය එල්ල කළා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[පි.ප. 2.35]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, ஆயுள்வேதம் (திருத்தம்) சட்டமூலம் தொடர்பான இன்றைய விவாதத்தில் பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி கூறுகின்றேன். இந்த விடயத்துக்குப் பொறுப்பான கௌரவ இராஜாங்க அமைச்சர் அவர்கள் இங்கு இருக்கிறார். கொண்டுவரப்பட்டிருக்கின்ற திருத்தங்கள் காலத்திற்குத் தேவையானவைதான். இருந்தாலும், இந்தத் திருத்தங்கள் ஆயுர்வேதக் கல்வி தொடர்பான expertsஇன் ஆலோசனைகள் பெறப்படாமல், ஒருசில வைத்தியர்களுடைய ஆலோசனைப் படி அவசர அவசரமாகக் கொண்டுவரப்பட்டுள்ளதாக ஆயுர்வேத வைத்தியர்கள் பலர் எங்களைத் தொடர்புகொண்டு முறையிட்டிருக்கிறார்கள். மேலும், medicine manufacturing சம்பந்தமாக உரிய expertsஇன் ஆலோசனைகள் எதுவும் பெறப்படாமலே இந்தத் திருத்தங்கள் கொண்டுவரப் பட்டிருப்பதாக சிரேஷ்ட ஆயுர்வேத வைத்தியர்கள் பலர் முறையிடுகின்றார்கள். University Education, UGC, higher education உடன் தொடர்புடைய expertsஇன் ஆலோசனைகள் பெறப்பட வேண்டும் என்ற நிலைப்பாட்டில்தான் அவர்கள் இருக்கிறார்கள். இந்தத் திருத்தங்களினூடாக hospital system,

management, Medical Council போன்றவை எதிர்காலத்தில் அரசியல்மயப்படுவதற்கான வாய்ப்பு இருக்கின்றது. අධ්‍යක්ෂ ජනරාල් என்பவர் இவை எல்லாவற்றுக்கும் பொறுப்பான தலைவராக வரும்பொழுது, சர்வாதிகாரிபோல செயற்படக் கூடிய வாய்ப்பு எதிர்காலத்தில் ஏற்படும். அவ்வாறு ஏற்படும்போது, இன்று எமது நாட்டில் இருக்கின்ற ஆயுர் வேதத்துறை எதிர்காலத்தில் அழிந்து போகக்கூடிய வாய்ப்பிருக்கின்றது. ஆகவே, கௌரவ இராஜாங்க அமைச்சர் அவர்கள் இதனைக் கவனத்திற்கொண்டு, இத்துறை சார்ந்த expertsஇன் ஆலோசனைகளைப் பெற்று, இதில் சில மாற்றங்களைச் செய்ய வேண்டுமென்று நான் அன்பாக வேண்டுகோள் விடுக்கின்றேன்.

கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, குறிப்பாக, வடக்கு, கிழக்கில் ஆயுர்வேதத் துறையை மேம்படுத்துவதற்கு நீங்கள் நடவடிக்கை எடுக்க வேண்டும். கடந்த கால யுத்தத்தினால் அந்தப் பிரதேசங்களில் இத்துறை வீழ்ச்சியடைந் திருக்கிறது. ஆகையால், அங்கு இத்துறையை மீளக் கட்டியெழுப்புவதற்குத் தேவையான கட்டட வசதிகளையும் இன்னோரன்ன வசதிகளையும் ஏற்படுத்திக்கொடுப்பதுடன் வைத்தியர்களையும் நியமிக்க வேண்டும். உங்களுடைய காலத்தில் கடைசியாக வழங்கப்பட்ட சுதேச வைத்தியர் நியமனத்தின்போது, ஒருவருக்குக்கூட யூனானி வைத்தியர் நியமனம் வழங்கப்படவில்லை. இது சம்பந்தமாக நான் உங்களுடைய Commissionerஐத் தொடர்புகொண்டு கேட்டேன். விசேட அமைச்சரவைப் பத்திரத்தினூடாக அந்த நியமனம் வழங்கப்பட்டதனால், தன்னால் யூனானி வைத்தியர் களை அதில் உள்வாங்க முடியாத நிலை ஏற்பட்டதாக அவர் என்னிடம் சொன்னார். காலங்காலமாக சுதேச வைத்தியர் நியமனம் வழங்கப்படும்போது, அதில் ஏழு ஆயுர்வேத வைத்தியர்களும் ஒரு சித்த வைத்தியரும் இரண்டு யூனானி வைத்தியர்களும் உள்வாங்கப்படுவார்கள். ஆனால், கடந்த முறை சித்த, ஆயுர்வேத வைத்திய நியமனங்கள் மாத்திரமே வழங்கப்பட்டன. நூற்றுக்கும் மேற்பட்டவர்களுக்கு ஆயுர்வேத வைத்தியர் நியமனம் வழங்கப்படும்பொழுது, ஒருவருக்குக்கூட யூனானி வைத்தியர் நியமனம் வழங்கப்படவில்லை என்பதை நான் இந்தச் சபையில் வேதனையோடு கூறிக்கொள்கின்றேன். எனவே, எதிர்காலத்தில் சுதேச வைத்தியர்களுக்கான நியமனம் வழங்கப்படும்போது, இந்த முறை விடுபட்ட எண்ணிக்கை யையும் சேர்ந்து கூடுதலானவர்களுக்கு யூனானி வைத்தியர் நியமனங்களை வழங்குவதற்கு நடவடிக்கை எடுக்க வேண்டு மென்று நான் இந்த உயர் சபையில் உங்களிடம் அன்பாக வேண்டுகோள் விடுக்கின்றேன்.

அடுத்து, "Channel 4"இல் வெளிவந்த செய்தி சம்பந்தமாக இன்று இச்சபையில் ஆளும் கட்சியையும் எதிர்க்கட்சியையும் சேர்ந்த பலர் பேசியதை நான் பார்த்தேன். உண்மையிலே மிக வேதனையாக இருக்கிறது. எங்களுடைய அப்பாவி கத்தோலிக் கச் சமூகத்தினருடைய உயிர்களைப் பலியெடுத்து, இந்த நாட்டில் ஸ்தம்பிதமான நிலையை ஏற்படுத்தி, ஒரு தேர்தலை மையப்படுத்திச் செயற்பட்டதாக நேற்றைய "Channel 4" செய்திகள் எங்களுக்குச் சொல்லிக்கொண்டிருக் கிறது. 'ஈஸ்டர்' குண்டுத் தாக்குதல்மூலம் ஒட்டுமொத்த முஸ்லிம் சமுதாயத் தையும் தலைகுனியச் செய்தார்கள். அக்குண்டுத் தாக்குதலைத் தொடர்ந்து அப்பாவிகள் பலரைக் கைதுசெய்தார்கள்; அவர்களுடைய சொத்துக்களைச் சூறையாடினார்கள். குருநாகல், மினுவாங்கொடை போன்ற பகுதிகளிலுள்ள பல பள்ளிவாசல்களையும் முஸ்லிம்களுடைய வீடுகளையும் கடைகளையும் அடித்து நொறுக்கினார்கள். அப்படி அடித்து நொருக்கிய கூட்டம்தான் அன்று ஆட்சிக்கு வருவதற்குப் பக்கபலமாக நின்ற கூட்டம்!

அதுமாத்திரமல்ல, பௌசுல் அமீர் என்ற சகோதரரை அவருடைய 4 சிறிய பிள்ளைகளும் பார்த்துக்கொண்டிருக்க 'அசிட்' வீசிக் கொலை செய்தார்கள்; நூற்றுக்கணக்கான அப்பாவி முஸ்லிம்களை அநியாயமாகச் சிறையிலே அடைத்தார்கள்; இன்றும் பலர் சிறையிலே வாடிக்கொண்டிருக் கிறார்கள். ஜமாஅத்தே இஸ்லாமியின் தலைவரைச் சிறையில் அடைத்தார்கள்; அசாத் சாலியைச் சிறையில் அடைத்தார்கள்; ஹிஜாஸ் ஹிஸ்புல்லா என்ற பிரபலமான சட்டத்தரணியைச் சிறையிலே அடைத்தார்கள்; என்னையும் சிறையிலே அடைத் தார்கள். ஜாமிஆ நளீமிய்யா கலாபீடத்தில் கற்றுக் கொண்டிருந்த அஹ்னாப் என்ற இளைஞன் ஒரு கவிதை எழுதினான் என்பதற்காக அவரை அநியாயமாகச் சிறையில் அடைத்து வைத்திருந்தார்கள். இன்று அவருடைய பெயரை சர்வதேசப் பயங்கரவாதிகளின் பெயர் listஇல் போட்டிருக் கிறார்கள். அவர் எழுதிய கவிதையை தமிழ் மொழி நன்கு தெரியாத translatorமூலம் மொழிபெயர்த்திருக்கிறார்கள். பயங்கரவாதத் தடுப்புப் பிரிவினர் அவர்மீது குற்றம் சுமத்தி, அவரை அநியாயமாகப் பல மாதங்கள் சிறையில் அடைத்துவைத்து, அவருடைய வாழ்க்கையை நாசப்படுத் தினார்கள். பட்டதாரியான அவர் ஓர் ஏழைக் குடிமகனுடைய மகன் ஆவார். அதேபோன்று, அரசியலில் ஈடுபடாத என்னுடைய சகோதரரான ரியாத் பதியுதீனை ஒன்றரை வருடங்கள் சிறையிலே அடைத்தார்கள். அவர் குற்றம்செய்ய வில்லை என்று CIDஇனர் சொல்கிறார்கள். அப்படியிருந்தும் குற்றச்சாட்டுக்களிலிருந்து அவரை விடுவிக்காமல் அவருடைய fileஐ Attorney-General's Department வைத்துக்கொண்டு தூங்கிக்கொண்டிருக்கிறது. அது தொடர்பில் அத்திணைக் களத்திடமிருந்து எந்தப் பதிலும் இல்லை. இவ்வாறு ஆயிரக்கணக்கான முஸ்லிம் இளைஞர், யுவதிகளுடைய வாழ்க்கை நாசமாக்கப்பட்டது.

ஆட்சிக் கதிரையில் அமரவேண்டும் என்பதற்காக இந்த அநியாயத்தைச் செய்திருப்பதாக இன்று சர்வதேச ஊடகம் சொல்லிக்கொண்டிருக்கிறது. இவ்வாறான அநியாயங்களைச் செய்து ஆட்சி பீடம் ஏறியவர்களால் 2 வருடங்கள்கூட ஆட்சி செய்ய முடியாமல் போனது. இந்த நாட்டின் விவசாயத் துறையை நாசமாக்கிய, ஆளுங்கட்சியைச் சேர்ந்த முன்னாள் விவசாயத்துறை அமைச்சர் அவர்கள் இதன் பழியை முன்னாள் சனாதிபதி கோட்டாபய ராஜபக்ஷமீது சுமத்திவிட்டுச் சென்று விட்டார். வாயைத் திறந்தால் பொய் பேசுகின்ற இவர்கள் முழு முஸ்லிம் சமுதாயத்தையும் நோகடித்தார்கள். இந்த நாட்டில் 1,000 வருடங்களுக்கும் மேலாக அமைதியை விரும்பி வாழ்ந்து வருகின்ற முஸ்லிம் சமுதாயத்தின்மீது வீண் பழியைச் சுமத்திய அந்தக் கூட்டம்தான் 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலின் பின்புலத்தில் இருப்பதாக நேற்றைய தினம் "Channel 4" ஊடகம் சர்வதேசத்திற்குச் சொன்னது.

இந்த நாட்டில் ஆட்சி பீடம் ஏறவேண்டும் என்பதற்காக இவர்கள் இவ்வாறான மோசமான செயலைச் செய்தது மட்டுமல்லாமல், அப்பாவி முஸ்லிம் சமுதாயத்தின் சொத்துக் களையும் சூறையாடினார்கள். மேலும், நூற்றுக்கணக்கான முஸ்லிம் மக்களைச் சிறையில் அடைத்து, வாட்டி வதைத் தார்கள். பொய்ச் செய்திகளையும் பொய்க் கதைகளையும் பரப்பி, இந்த நாட்டில் சிங்கள, தமிழ் மக்கள் முஸ்லிம் சமுதாயத்தின்மீது வைத்திருந்த நல்லெண்ணத்தை நாசமாக்கிய நீங்கள் ஒருபோதும் உருப்படமாட்டீர்கள் என்பதை நான் இங்கு சொல்லிவைக்க விரும்புகின்றேன். நாங்கள் எல்லோரும் இந்த உலகில் கொஞ்ச காலம் வாழ வந்தவர்கள். நாங்கள் வாழ்ந்த காலத்தைவிட, எஞ்சியிருக்கின்ற காலம் குறுகியது. நாம் ஒவ்வொருவரும் மரணிக்க இருப்பவர்கள் என்ற சிந்தனை

[ගරු රිසාඩ් බදියුදීන් මහතා ]

உங்களிடம் இருந்திருந்தால், அற்ப அரசியல் இலாபத்துக்காக, அற்ப சுயநலத்துக்காக, அற்ப தேவைக்காக இவ்வாறான கேவலமான, மோசமான செயலை நீங்கள் செய்திருக்க மாட்டீர்கள்!

இந்த நாட்டில் நடக்கக்கூடாத ஒரு சம்பவம் நடந்திருக் கின்றது. அதனால் 300இற்கும் மேற்பட்ட அப்பாவி உயிர்கள் பலியாகி இருக்கின்றன; கத்தோலிக்க சமூகத்தைச் சேர்ந்த பலர் தங்களது கைகளை, கால்களை இழந்து, ஊனமுற்றவர்களாக இருக்கின்றார்கள். இந்த நாட்டிற்கு வந்த சுற்றுலாப் பயணிகள் பலர் அதனால் இறந்திருக்கின்றார்கள். எனவே, இது சம்பந்தமாக நீதியான விசாரணையை முன்னெடுக்குமாறு அல்லது சர்வதேச விசாரணையை முன்னெடுக்குமாறு நாங்கள் மாண்புமிகு சனாதிபதி அவர்களிடம் வேண்டுகோள் விடுக்கிறோம். இன்றும் பலர் சிறையிலே வாடிக் கொண்டிருக் கிறார்கள். அப்பாவிகளை விடுதலை செய்யுங்கள்! இந்தச் சதிக்குப் பின்னால் இருந்த உண்மையான குற்றவாளிகளை, சூத்திரதாரிகளை, சதிகாரர்களைக் கண்டுபிடிப்பதற்கு மாண்புமிகு சனாதிபதி அவர்கள் நீதியான விசாரணையை மேற்கொள்ள வேண்டும். தற்போது பயங்கரவாதத் தடுப்புப் பிரிவிலுள்ளவர்களை வைத்து உண்மையைக் கண்டறிய முடியாது. இது வேலியே பயிரை மேய்ந்த கதையாக இருக் கின்ற காரணத்தால், இச்சம்பவம் தொடர்பாக சர்வதேச விசாரணையொன்றை முன்னெடுக்குமாறு இந்த அரசாங்கத் தைக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.45]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා ඒ පිළිබඳව විවාද කරන අවස්ථාවේ මටත් අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම ගැන සන්තෝෂ වෙනවා.

ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය ගැන කථා කරද්දී අපට හෙළ වෙදකම කියන එක අමතක කරන්න බැහැ. මේ පනත් කෙටුම්පත සංශෝධනය කිරීමේදී හෙළ වෙදකම පිළිබඳව ඇමතිතුමා අවධානය යොමු කරලා තිබෙන්නේ බොහොම අඩුවෙන් කියලා මම හිතනවා. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ඉන්දියාව ඇතුළු රටවල් ගණනාවක තිබෙනවා. නමුත් අපටම උරුම වුණු හෙළ වෙදකමක් තිබෙනවා. මන්ත්‍රීවරුන් කිහිප දෙනෙක් ඒ සම්බන්ධයෙන් කථා කළා. හෙළ වෙදකම හරහා මීට වඩා විශාල කාර්යභාරයක් අපේ රටේ ජනතාවටත්, ලෝකයේ ජනතාවටත් කරන්න අවස්ථාව තිබෙනවා. යම් යම් කාරණාවලදී ඒක පැහැදිලිව දැක ගන්න පුළුවන්.

ඉතිහාසයේ ඉඳලා බැලුවාම අපේ හෙළ වෙදකම තුළින් තමයි රටේ ජනතාවගේ රෝගවලට අවශ්‍ය ප්‍රතිකාර සියල්ල කළේ. වර්ෂ 1500 ගණන්වල බටහිර ජාතීන් අපේ ලංකාවට එන කල්ම හෙළ වෙදකම තමයි අපට තිබුණේ. ඊට පස්සේ තමයි ආයුර්වේදය, බටහිර වෙදකම වාගේ දේවල් ආවේ. මේ වෙනකොට අපේ රට තුළ බටහිර වෙදකම ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. අපි ඒක අවතක්සේරු කරනවා නොවෙයි. ඒක ලෝකයේම තිබෙන දෙයක්. ඒක අවශ්‍යයි. රටේ ජනතාවට රෝගයක් හැදුණාම අලුත් තාක්ෂණයත් එක්ක ඒ ප්‍රතිකාර ලබා ගැනීම අවශ්‍ය වෙනවා.

ආයුර්වේදය ආසියාවේ රටවල් ගණනාවක තිබෙනවා. එය අපේ රටේත් සැලකිය යුතු ස්ථානයකට ඇවිල්ලා තිබෙනවා. මේ පනත සංශෝධනයෙන් ඔබතුමන්ලා බලාපොරොත්තු වෙන්න ඇත්තේ ඒ කටයුතුවල පරිපාලනය සම්බන්ධයෙන් වෙන්න ඇති. අපේ රාජිත සේනාරත්න මන්ත්‍රීතුමා ඇතුළු කණ්ඩායමක් එකතු වෙලා සාකච්ඡා කරලා මේ පනත් කෙටුම්පතට කාරක සභා අවස්ථාවේදී සංශෝධන ගණනාවක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. මම පැහැදිලිව කියනවා, මේ පනත සංශෝධනය කිරීම තුළින් ඔබතුමන්ලා බලාපොරොත්තු වෙන්න ඇත්තේ පරිපාලනය සම්බන්ධයෙන් වෙන්න ඇති කියලා. විශේෂයෙන් ආයුර්වේද ක්ෂේත්‍රයේ පරිපාලනය ආයුර්වේද කොමසාරිස් ජනරාල්වරයෙකු යටතට පත් කරලා අපේ බටහිර වෛද්‍ය ක්‍රමයේ තිබෙන ආකාරයේ පරිපාලන ක්‍රමයක් සකස් කරන්න යන බව මට පෙනෙනවා. ආයුර්වේද ක්ෂේත්‍රයේ ඉන්න වෛද්‍ය මහත්ම, මහත්මීන් අපි සමඟ කථා කළාම කියනවා, අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඒකාධිපති බලයක් ලැබිලා ඒකමතිකව තීන්දු-තීරණ ගන්න අවස්ථාව ලැබෙයි කියලා. ඔවුන්ට ඒ ගැන පොඩි බියක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන්න වෙනවා.

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)

ගරු මන්ත්‍රීතුමනි, මේ සිදු වෙන්නේ දැනට තිබෙන බලය අඩු කිරීමයි. දැනට තිබෙන තත්ත්වය අනුව ආයුර්වේද කොමසාරිස්වරයාට නියෝජ්‍ය කොමසාරිස්වරුන් හරහා කමිටුවල බලය වැඩි කරලා තිබෙනවා. ඒක නිසා ආයුර්වේද කොමසාරිස්තුමාට කමිටුවලදී සභාවේ තීරණ අභිභවා තනි තීරණ ගන්න පුළුවන්. මේ සංශෝධනය හරහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඒ බලය අහිමි කරලායි තිබෙන්නේ. දැන් මේ හරයා වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී කරලායි තිබෙන්නේ. ඔබතුමා කියපු කාරණයේ අනෙක් පැත්ත තමයි මේ පනත සංශෝධනය කිරීම හරහා සිදු වෙලා තිබෙන්නේ.

තව එක කාරණයක් කියන්න ඕනෑ. ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පතට ගරු රාජිත සේනාරත්න ඇමතිතුමා ඉදිරිපත් කරලා තිබෙන සමහර සංශෝධන කියවලා බලද්දී පාරම්පරික වෙදකමට හානියක් සිදුවන බව පෙනෙනවා. පාරම්පරික වෙදකමට අදාළව දැනට පිළිගෙන තිබෙන කිසිම වගන්තියකට අපි හානි කරලා නැහැ. පාරම්පරික වෙදකම රැක ගන්න 1961දී ගෙනාපු ඒ උත්තරීතර පනතේ තිබෙන කාරණා ඒ විධියටම ඉදිරියටත් අරගෙන යනවා.

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කාලය මට දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. ගරු රාජ්‍ය ඇමතිතුමාගේ පැහැදිලි කිරීම ගැන ප්‍රශ්නයක් නැහැ.

එතුමා එහෙම කිව්වාට, ආයුර්වේද ක්ෂේත්‍රයේ ඉන්න වෛද්‍යතුමන්ලා හා ඒ ක්ෂේත්‍රයේ ඉන්න අය මේ පිළිබඳව දක්වන අදහස තමයි මම ප්‍රකාශ කළේ. මේ සංශෝධනය තුළින් කොමසාරිස් ජනරාල් බවට ඒ තනතුර උසස් වෙලා එනවා. ගරු

රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කිව්වා වාගේ ඒ බලය යම් ආකාරයකින් බෙදිලා, එහෙම වෙනවා නම් හොඳයි. ඒ වාගේම, රාජිත සේනාරත්න මැතිතුමා ඇතුළු විපක්ෂයේ අපේ කණ්ඩායම ඉදිරිපත් කරලා තිබෙන සංශෝධනවල ඔබතුමා කියපු ආකාරයෙන් හෙළ වෙදකමට ප්‍රහාරයක් එල්ලවන විධියේ වගන්ති තිබෙනවා කියලා මම හිතන්නේ නැහැ. ඒක ඔබතුමාගේ අදහස.

කොවිඩ් තත්ත්වයෙන් පස්සේ, අපේ රට බංකොලොත්භාවයට පත් වුණාට පස්සේ අලුත්ම තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒක ආයුර්වේද ක්ෂේත්‍රයටත් බලපා තිබෙනවා. හෙට පාර්ලිමේන්තුවට ගෙනෙනවා, මේ රටේ සෞඛ්‍ය ඇමතිවරයාට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක්. ඇයි එහෙම යෝජනාවක් ගෙනෙන්න වෙලා තිබෙන්නේ? අද අපේ රටේ සමස්ත සෞඛ්‍ය ක්ෂේත්‍රයම කඩා වැටිලා. යම්කිසි ලෙඩකට ප්‍රතිකාර ගන්න රජයේ රෝහලකට ගියාම අපට සිදු වෙලා තිබෙනවා එළියෙන් ඒ අවශ්‍ය බෙහෙත් ටික ගෙනෙන්න; ඒ පරීක්ෂණ ටික කර ගන්න. මීට කලිනුත් යම් ප්‍රමාණයකට ඒ තත්ත්වය තිබුණා. දැන් ඒ ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. අපි ප්‍රතිකාරවලට අතින් ගෙවපු මුදල මීට කලින් සියයට 30කට අඩුවෙන් තිබුණා නම්, අද ඒක සියයට 50කට වඩා වැඩි වෙලා තිබෙනවා. අද සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ගැටලු නිසා රටේ සමස්ත ජනතාවට ප්‍රශ්න ගණනාවකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. අඩු ආදායම් ලබන අය රෝගී තත්ත්වවලට රජයේ රෝහලට ප්‍රතිකාර ගන්න ගියාම, එළියෙන් බෙහෙත් ගන්න සහ අනෙකුත් පරීක්ෂණ සඳහා දරන්න වෙන වියදම දරන්න බැරි තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මම විශ්වාස කරනවා, ආයුර්වේදය කියන එක තවදුරටත් දියුණු කරන්න ඕනෑ කියලා.

දැනට ආයුර්වේද රෝහල් ගණනාවක් තිබෙනවා. ඔබතුමා ගෙනෙන මේ පනත් කෙටුම්පතේත් තිබෙනවා, මහ රෝහල්, දිස්ත්‍රික් රෝහල් වාගේ තත්ත්වයට ඒ රෝහල් පත් කරන්න ඕනෑ කියලා. මේ සංශෝධනය කරන යම් යම් කාරණාවලට අපි එකඟයි. ඒ වාගේම තමයි ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය මීට වඩා හොඳ තැනකට ගෙනෙන්න අවශ්‍ය වටපිටාව මේ පනත සංශෝධනය කළා කියලාම ලැබෙන්නේ නැහැ. ඒ සඳහා යම් යම් පියවර ගණනාවක් ගන්න ඕනෑ. ඒ සඳහා අවධානය යොමු කරලා කටයුතු කරන්න කියලා අපි මතක් කරනවා.

ඊළඟට, වර්තමාන රජය විතරක් නොවෙයි, මෙතෙක් බිහිවුණු රජයන් හෙළ වෙදකම සම්බන්ධයෙන් ඉතා අඩුවෙන් තමයි අවධානය යොමු කරලා තිබෙන්නේ. හෙළ වෙදකම ගම් මට්ටමින් පාරම්පරිකව පැවතගෙන ආවා. ඒවා පුස්කොළ පොත්වල සටහන් කරලා තිබුණා. දැන් ඒවා විනාශ වෙලා අපේ රටට අහිමි වෙන තැනකට පත් වෙලා තිබෙනවා. දැන් අලුත් තාක්ෂණය තිබෙනවා. ඒවා සුරක්ෂා කර ගන්න ක්‍රම තිබෙනවා. ඒ නිසා ඒ තිබෙන ටිකවත් ආරක්ෂා කර ගන්නා වැඩ පිළිවෙළකට ගියේ නැත්නම් හෙළ වෙදකම කියන එක අපේ රටෙන් නැති වෙලා යන්න පුළුවන්.

හෙළ වෙදකම ගැන රාවණා යුගයේ ඉඳන්ම කථා කරනවා. ඒ නිසා අපි විශේෂ අවධානයක් මෙයට යොමු කරන්න ඕනෑ. මේ පනත යටතේ වුණත් හෙළ වෙදකමේ නියැලී ඉන්න අයගේ ලියාපදිංචියේදී පවා ගැටලුසහගත තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. රාජ්‍ය ඇමතිවරයා හැටියට ඔබතුමා ඒක දන්නවා. ඒක දිගින් දිගටම සිදුවන කාරණාවක්. ඒ ගැන විශේෂ අවධානයක් යොමු කරලා ආයුර්වේද ක්ෂේත්‍රය ඇතුළේ හෙළ වෙදකමට විශේෂ අවස්ථාවක් ලබා දෙන්න ඕනෑ. ආයුර්වේදයට කොමසාරිස් ජනරාල්වරයෙකු ඉන්නවා. එහෙම නම් හෙළ වෙදකම සඳහාත් නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයෙකුවත් පත් කරලා ඒක වෙනම අංශයක් හැටියට ඉදිරියට ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් ඉතා වැදගත්. දැනටත් හෙළ වෙදකම අමාරුවෙන් පවත්වාගෙන යන වෙද මහත්වරු විශාල පිරිසක් ඉන්නවා. අපි ඒ අය ඇගැයීමට ලක් කරන්න ඕනෑ.

ජනතාවට බෙහෙත් ගන්න හැකියාවක් නැතිව, මුදල් නැතිව ඉන්න මෙවැනි වෙලාවක, හෙළ වෙදකමේ යෙදිලා ඉන්න වෛද්‍යවරුන්ගෙන් විශාල පිරිසක් ඒ ජනතාවට නොමිලේ සේවාව සලසනවා. ඒක අපේ ඉතිහාසයේ ඉඳලාම එන තත්ත්වයක්. ඒ නිසා හෙළ වෙදකම ආරක්ෂා කර ගන්නත්, ඒ සඳහා වෙනම දෙපාර්තමේන්තුවක් එහෙම නැත්නම් ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ වෙනම අංශයක් සකස් කරලා නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරයෙකු යටතේ එම අංශය පවත්වා ගෙන යන්න අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා නම්, හෙළ වෙදකම ඉස්සරහට ගෙන යන්න, එම අධ්‍යාපනය ලබා දෙන්න, ලියාපදිංචිය ලබා දෙන වැඩ පිළිවෙළ කාර්යක්ෂම කරන්න, ඒවාට බාධා ඇති නොවන ආකාරයෙන් කටයුතු කරන්න අවස්ථාව උදා වේවි කියලා මම මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ තව කාරණයක් මම මතක් කරන්න ඕනෑ. අද මන්ත්‍රීවරු ගණනාවක් කථා කළා අපේ රටේ ඇති වූ ඉතාම අවාසනාවන්ත, ඛේදජනක සිද්ධියක් සම්බන්ධයෙන් - පාස්කු ප්‍රහාරය සම්බන්ධයෙන් - "Channel 4" නාළිකාවේ විකාශනය වූ වැඩ සටහනක් පිළිබඳව. මේ තත්ත්වය ඉතාම භයානකයි. අපේ රටට මෙවැනි අවාසනාවන්ත තත්ත්වයක් උදා වීම ඉතාම කනගාටුදායකයි. අපි පැහැදිලිව කියන්න ඕනෑ ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා බලයට පත් වන කොට ඒ ඇති වුණු සිද්ධියත් එක්ක විශාල වාසියක් අත් කර ගත්තා කියලා. මේ ආණ්ඩුව බලයට පත් වුණු වහාම කිව්වේ මොකක්ද? පාස්කු ප්‍රහාරයට සම්බන්ධ සියලු වූදිතයන්ට නීතිය හරියටම ක්‍රියාත්මක කරලා දඬුවම් දෙනවා කිව්වා. නමුත්, එවැනි තත්ත්වයක් පෙනෙන්න නැහැ. පාස්කු ප්‍රහාරය නිසා ජීවිත ගණනාවක් අහිමි වුණා. එම පවුල්වල කාටවත් සෑහීමකට පත් වෙන්න පුළුවන් විධියට ඒ අවශ්‍ය නීතිමය තත්ත්වය, එහෙම නැත්නම් ඒ වැරදිකරුවන්ට දඬුවම් ලබා දෙන ක්‍රියාවලිය මේ රටේ හරියට ක්‍රියාත්මක වෙලා නැහැ කියන එක පැහැදිලියි. ඒ නිසා තමයි මෙවැනි මාධ්‍ය ආයතනවලට අද අවස්ථාව ලැබිලා තිබෙන්නේ අපේ රට පිළිබඳව මෙවැනි ප්‍රචාර ලබා දෙන්න. ඒ නිසා මේ පිළිබඳව නිසියාකාරයෙන් ක්‍රියාත්මක වීම ආණ්ඩුවේ වගකීමක්. මේ පිළිබඳව නිසියාකාරයෙන් පරීක්ෂණ කරලා, මේ රටේ එවැනි ඛේදවාචකයක් ඇති කරන්න සම්බන්ධ වූ සියලුදෙනාටම දඬුවම් ලබා දෙන එක තමයි රජයේ වගකීම කියන එකත් මේ වෙලාවේ ප්‍රකාශ කරමින්, මේ වෙලාව ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩි කීයක් ද තිබෙන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි තුනයි තිබෙන්නේ.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
මට විනාඩි තුනයිද තිබෙන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට විනාඩි තුනයි තිබෙන්නේ.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
ඇයි ඒ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථිකයන්ගේ කාලය අඩුවෙලා තිබෙන්නේ.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
එහෙම නම් අවශ්‍ය නැහැ මට කථා කරන්න. ඒ විනාඩි තුනත් තියා ගන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි තුනක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.57]

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ සාකච්ඡාවට සහභාගි වෙන්න ලැබීම ඉතාම වැදගත්. පළමුවෙන්ම මම කාරණයක් දැන ගන්න කැමැතියි. ආයුර්වේද කොමසාරිස් ජනරාල් ධුරයට පත් කරන්නේ පරිපාලන සේවයෙන් කියලා මට දැන ගන්න ලැබුණා. ඒක එසේද කියන එක මම දන්නේ නැහැ. අපේ ගරු සිසිර ජයකොඩි රාජ්‍ය අමාත්‍යතුමා මට කියාවි ඒ පිළිබඳව. ගරු රාජ්‍ය ඇමතිතුමනි, පරිපාලන සේවයෙන්ද කොමසාරිස් ජනරාල් පත් කරන්නේ?

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රථම වතාවට ආයුර්වේද කොමසාරිස් ජනරාල් ධුරය ආයුර්වේද වෛද්‍යවරයෙක් දරන තත්ත්වයට පත් කළා. කැබිනට් මණ්ඩලයේ අනුමැතිය සහිතව ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවටයි එය සිදු කළේ. එය අඛණ්ඩව පවත්වාගෙන යෑම තමයි අපේ අරමුණ වෙන්නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ ගැන සන්තෝෂයි. මොකද, දිගටම තිබුණු විවාදයක කෙළවරක් ඒකේ තිබෙනවා. ඒ නිසා ඒ ගැන මට සන්තෝෂයි.

ඊළඟට මම ගන්න කැමැතියි, Pharmacopoeia එකේ ප්‍රශ්නය. ඒක හදලා ඉවර වෙන්නේ නැත්තේ ඇයි? 2004 වසරේ සුප්‍රිම් උසාවියේ තිබුණු නඩුවකදී ප්‍රතිඥාවක් දුන්නා, Pharmacopoeia එක හදනවා කියලා.

ඒ වෙලාවේ හිටියේ මොහාන් පීරිස් අග්‍රවිනිශ්චයකාරතුමා. එතුමාගේ නඩු තීන්දුවක - SC.FR.No. 266/2012 දරන නඩු තීන්දුවේ - ඒ බව සඳහන් වෙනවා. 2012 කියන්නේ, ඒ නඩුව ගොනු කළ වර්ෂය. 2014දී තමයි ඒ නඩු තීන්දුව දෙන්නේ. ඒ නඩු තීන්දුවේ කියනවා, Pharmacopoeia එක හදලා ඉවර වෙන්න ඕනෑ, ඉවර වෙලා වාර්තා කරන්න ඕනෑ කියලා. දැන් වනකොට සියයට 45ක් හදලා ඉවරයි කිව්වා. සියයට 45ක් හදලා ඉවරයි කිව්වාම අපේ නීතිඥවරු කියා සිටියා, එහෙම නම් එය සූදානම් වූ වහාම ඉතුරු හරිය පිළිබඳව අපට දැන ගැනීමට සලස්වන්න කියලා. රජයේ නීතිඥවරයාත් එය භාර ගත්තා.

SC.FR.No. 266/2012 දරන නඩු තීන්දුවේ තිබෙනවා, I quote:

> "We are of the view that the State Counsel should convey these concerns to the Respondents who are responsible for the preparation of the Pharmacopoeia which in our view should be published as soon as possible."

මේ කියන්නේ, 2014දී. එහෙම නම්, මොහාන් පීරිස් හිටපු අග්‍රවිනිශ්චයකාරතුමාත් කියා සිටියා, ඒක හදලා අවසන් කළ යුතුයි, අවසන් කරලා වාර්තා කළ යුතුයි කියලා. නමුත්, මේ වනකල් Pharmacopoeia එක හදලා ඉවර නැහැ. ඒක ඔබතුමා දන්නවාද කියන්න මම දන්නේ නැහැ. ඒ නිසා දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? බටහිර වෛද්‍යවරුන් පාවිච්චි කරන උපකරණ පාවිච්චි කරන්න බැහැ.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, නිලධාරි කුටියෙන් ඔබතුමාට උත්තරයක් ලැබෙනවා වාගේ මට පෙනෙනවා. අපි බලමු ඒ උත්තරය මොකක්ද කියලා. කෙසේ නමුත් Pharmacopoeia එක නම් හදලා ඉවර නැහැ.

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)
මේ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයත්, ආයුර්වේද වෛද්‍යවරුත් දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. එහිදී බටහිර ඖෂධ ආයුර්වේද වෛද්‍යවරුන් විසින් නිකුත් කිරීම සම්බන්ධයෙන් අපි එකඟතාවක් පළ කළේ නැහැ. බටහිර ඖෂධ ආයුර්වේද වෛද්‍යවරුන් ලබා දෙනවාට අපි එකඟ නැහැ. ඒකට බටහිර වෛද්‍යවරු ඉන්නවා. හැබැයි, උපකරණ භාවිත කිරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේදීත් එකඟතාවකට ආවා. ඒ වාගේම එය ඉදිරි මාස දෙක තුළ ඉදිරිපත් කරන්න අපි කටයුතු කර තිබෙනවා. එය සකස් කරලා අවසන් කියලාත් මතක් කරනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Pharmacopoeia එක?

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)
ඔව්, කරුණු දෙකයි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Pharmacopoeia එකෙන් උපකරණ භාවිතයට අවසර දෙනවා. මොකද, අපේ ආයුර්වේද වෛද්‍යවරුන්ටත්, පාරම්පරික වෛද්‍යවරුන්ටත් ඒ දවස්වල නොයෙකුත් උපකරණ තිබුණා, ඔවුන්ගේ ප්‍රතිකාර ක්‍රියාදාමය සඳහා. නමුත්, අද වන විට ඒවා භාවිතයේ නැහැ. අද වන විට භාවිතය සඳහා අලුත් උපකරණ ලෝකයට ඇවිල්ලා තිබෙනවා. ශිෂ්ටාචාරය ඒ කොනේ ඉඳලා අර කොනට මාරු වුණා. ඒ නිසා අපේ තිබුණු ඒ උපකරණ භාවිතයෙන් පිටට ගියා. අලුත් ශිෂ්ටාචාරය අලුත් උපකරණ හැදුවා. ඒ උපකරණ භාවිත කිරීමේ අයිතිය අපට දැන් තිබෙනවා නම් සායන ගණනාවක් පවත්වන්න පුළුවන්. ඇයි, අපට නිර්වින්දන බෙහෙත් දෙන්න බැරි? ඇයි, අපට ශල්‍ය කර්ම කරන්න බැරි? ඇයි, අපට ප්‍රසූති කටයුතුවලට මැදිහත් වෙන්න බැරි? මම දන්නේ නැහැ, මේවා - ප්‍රසූති කටයුතු ආදිය - කිසියම් ආකාරයකින් බටහිර වෛද්‍ය ක්‍රමයට ආවේණික දේවල්ද කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉක්මනින් අවසන් කරන්නම්. ගරු රාජ්‍ය ඇමතිතුමා, මට මොකක්දෝ කියන්න ලෑස්ති වෙලා ඉන්නවා.

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)
ඇතැම් ආයුර්වේද වෛද්‍යවරු බටහිර ඖෂධ ලබා දෙනවා. ඒ අය ආයුර්වේද ප්‍රතිකාරයේදී ආයුර්වේද ඖෂධ ලෙස බටහිර ඖෂධ ලබා දෙනවා. *[බාධා කිරීමක්]* අපි එයට එකඟ නැහැ. අපි ඒක අධිකරණයේදී කිව්වා. ඔබතුමා ප්‍රකාශ කළ පරිදි උපකරණ භාවිතයට අපි එකඟයි. ඒ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණයට කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ඔබතුමා කියන පරිදි අපේ ආයුර්වේද උපාධිධාරීන්ගේ කටයුතුවලට ආයුර්වේද ශල්‍ය කොටසත් ඇතුළත්. ඒ නිසා ඒ අයත් ශල්‍යකර්ම කරනවා. එය මේ වන විටත් සිදු කරන කාර්යයක්. අපි එයට එකඟයි.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ශල්‍යකර්ම කරන්නේ කොහොමද නිර්වින්දය කරන්නේ නැතිව?

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)
ඔවුන්ට උපාධියෙන්ම ඒ අයිතිවාසිකම හිමි වෙලා තිබෙන්නේ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
එහෙම නම් ඔවුන්ට බටහිර වෛද්‍යවරුන් පාවිච්චි කරන නිර්වින්දන බෙහෙත් පාවිච්චි කරන්න වෙනවා.

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)
බටහිර ඖෂධවලට අදාළව අපි යම් යම් සීමා දක්වා තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒක හරි. එහෙම කිව්වා නම් හරි.

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)
ඒ හැර ඔබතුමා ප්‍රකාශ කළ පරිදි ආයුර්වේද වෛද්‍යවරුන්ට බැහැ, බටහිර ඖෂධ ලබා දෙන්න. අපි එයට එකඟතාවක් ඇති කරගෙන නැහැ.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
එහෙම කිව්වොත් හරි, ගරු රාජ්‍ය ඇමතිතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු රාජ්‍ය ඇමතිතුමනි. ආයුර්වේද වෛද්‍ය විද්‍යාව නිකම් කහළ ගොඩට දාපු එකක් හැටියට තමයි පසුගිය කාලයේ තිබුණේ. ඔබතුමා රාජ්‍ය අමාත්‍ය ධුරයට පත් වුණාට පස්සේ තමයි ඒක යම් දුරකට නංවලා ගත්තේ. මම ඒ සම්බන්ධයෙන් ඔබතුමාට ප්‍රශංසා කරනවා.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, තවමත් ආයුර්වේද වෙදකමට කියන්නේ non-medical කියලා. ආයුර්වේද වෙදකමට non-medical කියන්නේ මොකද? ආයුර්වේද වෛද්‍යවරයෙකු යම් සහතිකයක් දීලා, භාණ්ඩාගාරය හෝ වෙන තැනකින් ඒක පරීක්ෂාවට ලක් වනකොට තවම කියන්නේ ඒක non-medical කියලා. ඒක කෙළින්ම ආයුර්වේද වෛද්‍ය විද්‍යාවට ගහන පා පහරක්. ඒක නවත්වන්න මේ ආණ්ඩුව ක්‍රියා කළ යුතුයි කියා යෝජනා කරමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.05]

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මේ ගරු සභාවේ රැඳී සිටීම ගැන කෘතඥතාව පළ කරමින් කාරණා පහක් මතු කරන්න මා බලාපොරොත්තු වෙනවා. මා ඒ කාරණා යොමු කළාට පසුව අවසානයේදී ඔබතුමා පිළිතුරු දෙනවා නම් වඩා පහසුයි කියා මා කල්පනා කරනවා.

[ගරු ගෙවිඳු කුමාරතුංග මහතා]

ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාත් මා මේ කියන්න යන දේ පිළිබඳ කාරණයක් මතු කළා. නමුත් මට එතුමාගේ කථාවට සවන් දෙන්න බැරි වුණා. ඔබතුමා ඒකට පිළිතුරකුත් ලබා දුන්නා, ගරු රාජ්‍ය ඇමතිතුමනි. ආයුර්වේද වෛද්‍ය සභාවේ පාරම්පරික වෛද්‍යවරුන්ගේ නියෝජනය සම්බන්ධයෙන් සමාජයේ විශාල කතිකාවක් ඇති වෙලා තිබෙනවා. මේ අලුත් සංශෝධනවලින් අපේ රටේ විශ්වවිද්‍යාලවල ඇති කර තිබෙන දේශීය වෛද්‍ය පීඨවලට අදාළ නියෝජනය ලබා දීමට ඔබතුමා දැන් කටයුතු කර තිබෙනවා. අපි ඒකේ කිසිම වරදක් දකින්නේ නැහැ. හැබැයි, ඇමතිවරයාගේ පත් කිරීම් විධියට නැතිව නිශ්චිතව, සමානුපාතික ආකාරයකට පාරම්පරික වෛද්‍යවරුන්ගේ නියෝජනය ආයුර්වේද වෛද්‍ය සභාවට නම් කරන්න පුළුවන්ද කියන කාරණය තමයි අපි මතු කරන්නේ. ඇමතිවරයා කරන පත්වීම්වලිනුත් අවම වශයෙන් යම් සංඛ්‍යාවක් -දෙකක් හෝ තුනක්- පාරම්පරික වෛද්‍යවරුන් හැටියට නිශ්චිතව පත් කළ නොහැකිද? ඔබතුමාගේ සද්භාවය ගැන අපට ප්‍රශ්නයක් නැහැ, ගරු රාජ්‍ය ඇමතිතුමනි. හැබැයි, ඔබතුමා හැම දාම මේ රාජ්‍ය ඇමති ධුරය දරන්නේ නැති නිසා ඒක මේ පනත් කෙටුම්පතටම ඇතුළත් කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය මා අහනවා.

ඊළඟ ප්‍රශ්නය, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්තුමා සම්බන්ධයෙන්. මම හිතන්නේ ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාත් ඒ කාරණය මතු කළා. ඒ අවස්ථාවේ ඔබතුමා සඳහන් කළා වාගේ මට මතකයි, ඒක පනත් කෙටුම්පතට ඇතුළත් වෙලා නැතත් ආයුර්වේද වෛද්‍යවරයෙකු තමයි කොමසාරිස්තුමා හැටියට දැන් පත් වන්නේ කියන කාරණය. අපි මේ රටේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ගත්තොත්, සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමා කටයුතු කළ යුතු උපදේශක සභාවක් තිබෙනවා, වෛද්‍ය විශේෂඥයන් ඇතුළත් වන. සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා කටයුතු කළ යුත්තේ ඒ විශේෂඥ උපදේශක සභාවේ උපදෙස්වලට අනුගතව. දේශීය වෙදකම සම්බන්ධයෙන්, එහෙම නැත්නම් ආයුර්වේද කොමසාරිස්තුමා සම්බන්ධයෙන් එවැනි වැඩ පිළිවෙළක් අනුගමනය කරන්න පුළුවන්ද කියන කාරණය මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1961 අංක 31 දරන ආයුර්වේද පනත තිබෙන්නේ ඉංග්‍රීසි භාෂාවෙන්. ඒ අනුව පනතේ අරමුණ කියන තැන සඳහන් වන්නේ ආයුර්වේද ප්‍රතිකර්ම විධි කියන කාරණයයි. අප දකින ආකාරයට නම් ආයුර්වේදය කියන එක ඊට වඩා පැතිරී යන දෙයක්. ඒ නිසා ප්‍රතිකර්ම ක්‍රම කියනවාට වඩා රෝගය හඳුනා ගැනීම, රෝගයට ප්‍රතිකර්ම නිර්ණය කිරීම, ප්‍රතිකාරක නිෂ්පාදනය කිරීම සහ ප්‍රතිකාර කිරීම කියන ඒ අංශ හතරම මේ පනත් කෙටුම්පතට ඇතුළත් කරන්න පුළුවන්කමක් ලැබෙනවා නම් වඩා සුදුසුයි කියන එකයි අපේ අදහස. ඒ සඳහා ඔබතුමාට හැකියාවක් තිබෙනවාද?

ඊළඟට කියන්න යන කාරණයත් කියැවුණා. ඒ තමයි, ආසියාතික වෙනත් රටවල පිළිගෙන ඇති වෛද්‍ය ක්‍රම අපේ රටේත් ඒ ආකාරයෙන්ම භාවිතයට මේ යටතේ අවසරය ලැබෙනවා කියන එක. නමුත් අපේ රටේ දේශීය වෛද්‍ය සභාවකින් යම්කිසි විධියකින් පරීක්ෂාවට ලක් නොකර එවැනි අවසරයක් දීම සුදුසුද කියන ප්‍රශ්නය මතු කරන්න අවශ්‍යයි. මොකද, අද වනකොට ඇතැම් රටවල ආයුර්වේදය, ජනතාව සුවපත් කිරීම, ජනතාව ලෙඩ රෝගවලින් මුදා ගැනීම කියන සීමා ඉක්මවා ගොස් වෙළෙඳ භාණ්ඩයක් බවට පත් වෙමින් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු ගෙවිඳු කුමාරතුංග මහතා**
(மாண்புமிகு கெவிந்து குமாரதுங்க)
(The Hon. Gevindu Cumaratunga)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඉක්මනින් අවසන් කරන්නම්.

ඇත්තටම ආසියාව තුළ සිටින ලෝක බලවත් රටවල් වෙළෙඳාම සඳහා මේ ආයුර්වේදය යොදා ගැනීමේ අවස්ථාවක් තිබෙන නිසා, වෙනත් රටක රජයක් පිළිගත්තු පලියට ඒ සඳහා අපේ රටත් අවසරය දිය යුතුද? ඒ සඳහා අපේ රටේ ආයුර්වේද වෛද්‍ය සභාව හෝ ඔබතුමන්ලා නිශ්චය කරන දේශීය වෙදකම සම්බන්ධ විද්වත් සභාවකින් නැවත තීන්දුවක් ගත යුතු නැද්ද? ඒ ගැන කල්පනා කර බලන ලෙස අපි ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් මා කියන්න ඕනෑ, සම්බාහනය පිළිබඳව ඇති වෙලා තිබෙන කතිකාව තුළ, ඒක වෙනම වෘත්තීය සුදුසුකම් සහිතව, වෙනම වෘත්තියක් හැටියට පිළිගැනීමේ ගැටලුවක් නැහැ කියන එක. හැබැයි, ආයුර්වේදයේදී, නැත්නම් දේශීය වෙදකමේදී සම්බාහන කටයුතුවල යෙදෙනවා නම්, ඒක නිසි සුදුසුකම් සහිත වෛද්‍යවරයෙකුගේ උපදෙස් මත හෝ නිසි සුදුසුකම් සහිත වෛද්‍යවරයෙකුගේ අධීක්ෂණය යටතේ සිදු කළ යුතු බවට යම් කිසි ආකාරයක නියමයක් මීට ඇතුළත් කළ හැකිද? ඔවුන්ට වෘත්තීය සුදුසුකම් ලබාදීම ගැන කිසිම ගැටලුවක් නැහැ. හැබැයි, ඔවුන් දේශීය ප්‍රතිකාර ක්‍රම සඳහා, නැත්නම් ආයුර්වේද ප්‍රතිකාර සඳහා යොදා ගැනීමේ දී වෛද්‍යවරයෙකුගේ උපදෙස්වලට යටත්ව සිදු කළ යුතුයි කියන කාරණය ඇතුළත් කළ හැකිද කියන එක දැනගන්න කැමැතියි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා පත් වුණාට පස්සේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ප්‍රතිඥාවක් අනුව, අපේ රටේ දේශීය වෛද්‍යවරුන් සඳහා වෙනම වෛද්‍ය සභාවක් ඇති කරනවාද, නැත්නම් වඩාත් සුදුසු ක්‍රමය කුමක්ද කියන එක ගැන සොයා බලා නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා නීතිඥ කනිෂ්ක විතාරණ මහතාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කළා. මම හිතන විධියට ආර්ථික අපහසුතා නිසා ඒ කමිටුවේ නිර්දේශ ඔබතුමාට ලබා දීම සඳහා එය අවසන් තත්ත්වයකට යොමු නොවුණු බවයි කනගාටුදායක තත්ත්වය. ඇත්තටම ඒ නිර්දේශ ලබා ගෙන මේ ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත ගෙන එන්න තිබුණා නම් වඩා සුදුසුයි කියලා මම හිතනවා. හැබැයි, අපි නීතිඥ කනිෂ්ක විතාරණ මහතා සමඟ කළ සාකච්ඡාවේදී වුණත් අපට දැන ගන්න ලැබුණේ බහුතරයකගේ මතය වෙන්නේ, දේශීය වෙදකමට අදාළව පොදු සභාවක් තිබීම කියන එක ගැටලුවක් නොවෙයි කියන එකයි. හැබැයි, එහිදී මම මුලින් කිව්වා වාගේ අලුත් විශ්වවිද්‍යාලවලට ඉඩ දෙන අතර, ඒ අලුත් ආයතනවලින් එන වෛද්‍යවරුන්ටත් නියෝජනයන් ලබා දෙන අතර, දේශීය පාරම්පරික වෛද්‍යවරයාගේ මතය, නැත්නම් ඔවුන්ගේ නියෝජනය අවතක්සේරු වී නොයන ආකාරයකට ඒ වෛද්‍ය සභාවේ සංයුතිය සකස් කර ගත හැකිද කියන කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ කරුණුවලට අවධානය යොමු කරයි කියලා බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම සුදුසු සංශෝධන තිබෙනවා නම් ඒවා ඇතුළත් කර ගන්නා ලෙස ඉතාම ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු නිතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ගෙවිඳු කුමාරතුංග මන්ත්‍රීතුමා යෝජනා කළ පරිදි අමාත්‍යවරයා විසින් යම් පිරිසක් පත් කරන්න අමාත්‍යවරයාට පූර්ණ බලතල ලැබෙන්නේ නැහැ. ඒ සඳහා සමස්ත ලංකා ආයුර්වේද වෛද්‍ය සම්මේලනය විසින් නම් කරන දසදෙනෙකුගෙන් යුතු මණ්ඩලයකින් යටත් පිරිසෙයින් තුන්දෙනෙකු පත් කළ හැකි විධියට තමයි තිබෙන්නේ. ඒ විධියේ අවස්ථා ගණනාවක් දක්වලා තිබෙනවා. සමස්ත ලංකා ආයුර්වේද වෛද්‍ය සම්මේලනය කියන්නේ, ගම්පහ වික්‍රමාරච්චි වෛද්‍ය විද්‍යාලය සම්බන්ධ කර ගෙන වික්‍රමාරච්චි වෙද රාළහාමිගේ කාල පරිච්ඡේදයේ ඇති කරපු ලංකාවේ පරණම පාරම්පරික වෛද්‍ය සම්මේලනය. ඒ අය අනිවාර්යයෙන් පාරම්පරික වෛද්‍යවරු. අමාත්‍යවරයාට බලය එන්නේ ඒ සම්මේලනයෙන් නම් කරන දසදෙනෙකුගෙන් තුන්දෙනෙකු තෝරා ගන්නයි. ඒ විධියට ආයුර්වේද වෛද්‍යවරුන් නොවන අය පත් කරන්න අනුමැතිය දීලා තිබෙනවා. එහිදී බොහෝවිට පාරම්පරික වෙදකමට හිතවත් අය තමයි නම් කරන්නේ. ඒ අනුව අමාත්‍යවරයාට පසුගිය ආයුර්වේද වෛද්‍ය සභාවට ආයුර්වේද වෛද්‍යවරුන් නොවන තුන්දෙනෙකු පත් කරන්න අවශ්‍ය ප්‍රතිපාදන තිබුණා. ඉතා පැහැදිලිව කියන්න ඕනෑ, ඒ සඳහා පළමුවැනියට අපි පත් කළේ පූජ්‍ය බෙංගමුවේ නාලක ස්වාමීන් වහන්සේ. දෙවැනියට නෙම්සිරි ජයතිලක මැතිතුමා. ඒ වාගේම, ලංකාවේ පාරම්පරික වෛද්‍යවරුන් 250ක් ගැන වාර්තාමය වැඩසටහනක් ඉදිරිපත් කරපු සම්පත් බණ්ඩාර මහතා තමයි තුන්වැනියට පත් කළේ. ඒ නිසා පාරම්පරික වෙදකම ගැන උනන්දුව දක්වන අයගෙන් තමයි අපට පත් කරන්න පුළුවන් අය පවා පත් කළේ. හිතවතුන් ගැන සලකා නොවෙයි, මේ ක්ෂේත්‍රය ගැන හිතලා තමයි පත් කිරීම් කරලා තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරක කාලයක් ලැබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මට විනාඩි 10ක් තිබුණා නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඒක අඩු වෙලා දැන් විනාඩි හතරයි තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

කරුණාකරලා මට තව විනාඩි දෙකක් දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මේ අවස්ථාවේදී, මූලාසනය සඳහා ගරු මන්ත්‍රීවරයකුගේ නමක් යෝජනා කරන ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர)
(The Hon.(Dr.) Sarath Weerasekera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු මංජුලා දිසානායක මහත්මිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சமன்பிரிய ஹேரத் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SAMANPRIYA HERATH left the Chair, and THE HON. (MRS.) MANJULA DISSANAYAKE took the Chair.*

[අ.භා. 3.15]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රාජ්‍ය ඇමතිතුමාත් සභාවේ සිටින නිසා මම විශේෂයෙන්ම කියන්න කැමැතියි, මූලික වශයෙන්ම මේ පනත් කෙටුම්පතේ තිබෙන ප්‍රධානම අර්බුදය මොකක්ද කියන එක. මට තේරෙන විධියට ඒ තමයි පාරම්පරික වෛද්‍ය ක්‍රමය ගැන හඳුනා ගෙන නැතිකම. ඒකයි තිබෙන ප්‍රධානම ප්‍රශ්නය. ඔබතුමන්ලා නීති ගෙනෙනවා. නමුත් අපි දන්නවා පාරම්පරික වෛද්‍ය ක්‍රමය අනුව වෛද්‍යවරයා තමයි රෝග නිර්ණය කරන්නේ කියලා. ඒ වාගේම බෙහෙත් නියම කරනවා, බෙහෙත් හදනවා. ඒ සඳහා අවශ්‍ය ඔසු පැළ ටික සිටුවා ගන්නේ, රෝගියාට සාත්තු කරන්නේ, මේ සියල්ල කරන්නේ ගෝලයන්ගෙන් උදවු අරගෙන. ඒ අය අවට තිබෙන කැලයකින් අවශ්‍ය බෙහෙත් කොළ වර්ග එකතු කරගෙන ඖෂධ හදලා ඒවා ලියාපදිංචි කරන්න NMRA එකට අරගෙන යන්නේ නැහැ. නමුත් මම දකිනවා මේ තුළ තිබෙන ප්‍රධානම අර්බුදය මොකක්ද කියලා.

අපේ සිසිර ජයකොඩි මැතිතුමා එක්ක මගේ තරහක්, වෛරයක් නැහැ. නමුත් ප්‍රශ්නය වන්නේ ඔබතුමන්ලා අද දෙවැනිවර කියවීමට ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පතේ අන්තර්ගතයයි. ඇත්ත වශයෙන්ම අපේ ඉතිහාසයේ තිබුණු දේශීය වෛද්‍ය ක්‍රමය, පාරම්පරික වෛද්‍ය ක්‍රමය සම්පූර්ණයෙන් විනාශ කරන තැනකටයි මේ හරහා ඇවිත් තිබෙන්නේ. ඒකයි අපට තිබෙන ප්‍රශ්නය. සුද්දාගේ කාලයේවත් අපේ රටේ වෛද්‍යවරුන් හිරභාරයට ගත්තේ නැහැ. තොරතුරු සැපයුවේ නැහැ කියලා, කාරණා සැඟෙව්වා කියලා ඉතිහාසයේ කවදාවත් ඒගොල්ලන් හිරභාරයට ගත්තේ නැහැ. ඒ ආකාරයට කවදාවත් සිදු නොවුණු කාරණයක් සම්බන්ධයෙන් වූ සංශෝධනයක් මේ තුළ තිබෙනවා.

ඊළඟට, විශේෂයෙන්ම කියන්න ඕනෑ, අවුරුදු ගණනක් තිස්සේ තිබෙන රහස් වට්ටෝරු තුළින් තමයි පාරම්පරික වෛද්‍යවරයා බෙහෙත් සකස් කරන්නේ කියන කාරණය. දැන් ඔබතුමන්ලා ඒවා ඉල්ලනවා. මේ ඖෂධය හැදුවේ කොහොමද, මේකේ මිශ්‍රණය කොහොමද කියලා නිවැරදි තොරතුරු සපයන්න කියා ඔබතුමන්ලා කියනවා. මේ විස්තර දීපු ගමන් පැහැදිලිවම වෙන්නේ මොකක්ද? ඉතිහාසයේ සිට අවුරුදු ගණනක් තිස්සේ අපේ තිබුණු වට්ටෝරු ටික, රහස් බෙහෙත් ටික, අපේ අත්බෙහෙත් ටික සම්බන්ධ තොරතුරු සියල්ල එක එක කොම්පැනි අතට යනවා. අපි කියන්නේ ඒකයි. අපේ පාරම්පරික

[ගරු දයාසිරි ජයසේකර මහතා]

වෛද්‍ය ක්‍රමය ගැන කිසිදු දැනුමකින් තොරව තමයි මේ පනත් කෙටුම්පත සකස් කර තිබෙන්නේ. ඒකයි අපට තිබෙන ප්‍රශ්නය. ආයුර්වේද වෛද්‍යවරුන්ට අවශ්‍ය විධියට සංශෝධන සිදු කිරීම ගැන අපට ප්‍රශ්නයක් නැහැ.

දැන් බලන්න, අපේ රටේ පාරම්පරික සහ ආයුර්වේද කියන දෙගොල්ලන්ම එකතු කළාම ලියාපදිංචි වෛද්‍යවරුන් 28,000ක් ඉන්නවා. අපේ රටේ පාරම්පරික වෛද්‍යවරුන් 20,000ක් ඉන්නවා. හැබැයි, ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචිය තිබෙන 8,000යි ඉන්නේ. එතකොට මෙම සංශෝධන හරහා ඔබතුමා ගෙනෙන ආයුර්වේද වෛද්‍ය සභාවට මේ අය අතරින් සියයට 80කට වඩා ගෙනෙන්නේ ආයුර්වේද වෛද්‍යවරුන්. එතකොට පාරම්පරික වෛද්‍යවරුන් 20,000ට මොකද වෙන්නේ? මෙන්න මේ කාරණය ගැනත් හොඳින් හිතා බලන්න කියා මම ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

අනෙක් කාරණය මෙයයි. මේ තුළ සඳහන් නොවුණාට කංසා වැවීම සඳහා අවශ්‍ය සහයෝගයත් මෙයින් දීලා තිබෙනවා. අපට ඒක ප්‍රශ්නයක් නොවෙයි. වවාගන්න පුළුවන් නම් වවාගන්න. ඒ අවශ්‍ය වැඩේ කරන්න පුළුවන්. හැබැයි, මේකයි වැඩේ. අපේ ලංකාවේ තිබෙන කංසාවල ඖෂධීය ගුණය වැඩියි, මත් වෙන ගතිය අඩුයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, පිට රටින් ඉල්ලන්නේ මත් වෙන ගතිය වැඩි, ඖෂධීය ගුණය අඩු එක. ඔබතුමා දන්නවා, ලංකාවට ආවේණිකව තිබුණු මීනී මල් දැන් ලංකාවේ නැති බව. දැන් මීනී මල් වෙනුවට වෙන ඒවා ගෙනැල්ලා මෙහේ හදලා තිබෙනවා. වෙන දා ලංකාවේ වැවුණු මීනී මල් දැන් ලංකාව ඇතුළේ නැහැ. බලන්න, බිබිලේ දොඩම් අද නැහැ. අද තිබෙන්නේ පිටින් ගෙනා දොඩම් වර්ගයක්. ඒ විතරක් නොවෙයි, ලංකාවට ආවේණික පෙයාර්ස් අද ලංකාවේ නැහැ. ඒ විධියටම ලංකාවට ආවේණික කංසාත් නැති වුණොත් ලංකාවට ආවේණික, ගුණාත්මකභාවයෙන් වැඩි, ඖෂධීය ගුණයෙන් වැඩි කංසා වෙනුවට පිට රට හදපු කංසා තමයි අනාගතයේ පාවිච්චි කරන්න වෙන්නේ. ඒකේ මත්වෙන ගතිය වැඩියි, ඖෂධීය ගුණය අඩුයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ ගැනත් විශේෂයෙන් කල්පනා කරන්න ඕනෑ. ඔබතුමා දන්නවා මේ වගාව සඳහා ඔබතුමාගේත් අනුමැතිය ඇතිව BOI එකට අවසරය දෙන්න පුළුවන්. ඔබතුමාටත් මම කථා කළේ ඒකයි. අපි දෙදෙනා මේ ගැන කථා කළා. මේ ගැන සම්පූර්ණ වගකීම ඔබතුමාගේ අතට ගන්න. මට මතකයි එක වෙලාවක කංසා වැවීම සඳහා මේ වාගේ proposal එකක් ඇවිල්ලා තිබුණා, ඩොලර් මිලියන ගණනක් invest කරලා. ඒගොල්ලොත් කිව්වේ army එක යොදවා හෝ ඒ ප්‍රදේශ වට කරලා ආරක්ෂාව දෙන්න කියලායි. ඒකට හේතුවක් තිබුණා. ඇෆ්ඝනිස්තානය, පාකිස්තානය වැනි රටවලට කංසාවලින් ඩොලර් බිලියන හතක පමණ ආදායමක් ලැබුණා.

ටිකක් කල් යනකොට මොකක්ද වුණේ? පාකිස්තානයේ, ඇෆ්ඝනිස්තානයේ මිනිස්සු, දරුවෝ විශාල වශයෙන් කංසා බොන්න පටන් ගත්තා. මේකෙන් ඒ රටවල් දෙකම ඉතාම නරක තැනකට පත් වුණා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ නිසා ලංකාවේ කංසා වගා කිරීම ගැන තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න. වෙනත් කාරණයක් නොවෙයි, මේක විශාල අර්බුදයක් වෙයි කියලායි මම කල්පනා කරන්නේ.

අනෙක් කාරණය මෙයයි. මේ පනත් කෙටුම්පතේ 44වෙනි වගන්තිය මඟින් ප්‍රධාන පනතේ 80 වන වගන්තිය ඉවත් කර 80. (1) (අ) සිට (ඇ) දක්වා වගන්ති ඇතුළත් කර තිබෙනවා. නිවැරදි තොරතුරු සැපයීමට අපොහොසත් වීම යටතේ අපේ පාරම්පරික වෛද්‍යවරු සිර දඬුවමකට ලක් කිරීමට අවශ්‍ය කටයුතු ටික මේ හරහා කරලා තිබෙනවා, රහස් වට්ටෝරු සම්බන්ධයෙන් තිබෙන තත්ත්වය යටතේ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, කරුණාකරලා මේකට යම් සංශෝධනයක් ගේන්න. මොකද, ඒ ඖෂධ වට්ටෝරු, ඒ මිශ්‍රණ එළියට යනවා කියන්නේ රටේ විතරක් නොවෙයි, ජාත්‍යන්තර ඖෂධ සමාගම්වලටත් ඒවා හදන්න ඉඩක් ලැබෙනවා කියන එකයි. මේ පනත් කෙටුම්පත අනුව යම් යම් පුද්ගලයන්ට වෙනම සහතික ගන්න වෙනවා. උදාහරණයක් වශයෙන් ගත්තොත්, සාත්තු කරන කෙනා පිටින් සහතිකයක් ගන්න ඕනෑ. බෙහෙත් කලවම් කරන කෙනාත් පිටින් සහතිකයක් අරගෙන එන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව විනාඩියක් දෙන්න.

ඒකයි මම කිව්වේ, මේක පාරම්පරික වෛද්‍ය ක්‍රමය ගැන නොදැන හදපු පනත් කෙටුම්පතක් කියලා. අපේ වෛද්‍යවරයා තමයි රෝග නිශ්චය කරන්නේ, බෙහෙත් ටික දෙන්නේ, බෙහෙත් ටික හදන්නේ, ඒ සියල්ලම කරන්නේ. එතකොට එතැන හැදෙන ගෝලයා තමයි ඊළඟ වෛද්‍යවරයා බවට පත් වෙන්නේ. ඒ නිසා මම කියනවා, මේ පනත් කෙටුම්පත ගෙනාවාට ප්‍රශ්නයක් නැහැ, නමුත් ඒකෙන් දේශීය වෛද්‍ය ක්‍රමය සම්පූර්ණයෙන් විනාශ මුඛයට ගෙන යන වැඩ පිළිවෙළක් සිද්ධ වෙයිද කියන බිය අප සියලුදෙනාටම තිබෙන බව. ඒ නිසා කරුණාකරලා ඒකට අවශ්‍ය විසඳුම් ටික ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඩයනා ගමගේ රාජ්‍ය ඇමතිතුමිය. ඔබතුමියට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.21]

**ගරු ඩයනා ගමගේ මහත්මිය (සංචාරක රාජ්‍ය අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) டயனா கமகே - சுற்றுலாத்துறை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Diana Gamage - State Minister of Tourism)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කංසා වගාව නීතිගත කරලා කංසා පිට රට යැවීමේ - export කිරීමේ - යෝජනාව මම මේ පාර්ලිමේන්තුවට ගෙනාවේ මීට අවුරුදු 2කුත් මාස 10කට පමණ කලින්. මම ඉස්සෙල්ලාම ගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා, එතුමා ඒ යෝජනාව අය වැයෙන් පාස් කර ගැනීම පිළිබඳව.

අද ගෙන එන ලද ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත මඟින් කංසා වගාව නීතිගත කරන්න, මේ රටට විදේශ විනිමය ගේන්න කංසා පිට රට යවන්න ගත්ත පියවර ගැන මම ඉතා සතුටු වෙනවා. අද මට සතුටු විය හැකි දවසක්, මම මෙච්චර කාලයක් සටන් කළ යම්කිසි දෙයක් මේ රටේ සිද්ධ වෙනවා කියලා.

ගරු දයාසිරි ජයසේකර මැතිතුමා කිව්වා වාගේ ලංකාවේ කංසාවල මත්වෙන ගතිය අඩුයි. ඒකට තමයි hemp කියලා කියන්නේ. ලංකාවේ ගොඩක්ම වැවෙන්නේ hemp කියන වර්ගය. හැබැයි, ලංකාවේ කංසා varieties කිහිපයක්ම තිබෙනවා. අවාසනාවකට මේ කංසා varieties ටික test කරන්න lab එකක්වත් මේ රටේ නැහැ. ඒකක්වත් අපි ගෙනැල්ලා නැහැ. ලෝකයේ තිබෙන හොඳම කංසා වර්ගයකුත් ලංකාවේ තිබෙනවා. නමුත්, අපි ඒක test කරලා නැහැ. අපි ඉස්සෙල්ලාම කළ යුත්තේ මේ රටට laboratories ගෙනැල්ලා ලංකාවේ වැවෙන කංසා ගැන test කිරීමයි. ගංජා සහ කංසා කියන්නේ, cannabis and hemp. මෙහේ ගොඩක්ම වගා කරන්නේ hemp කියන එක. ඒකේ මත් ගතිය අඩු වෙන්නේ THC අගය අඩු හින්දා. THC අගය වැඩීම එක තමයි මත් ගතිය වැඩි කරන්නේ. නමුත්, අපට පිට රට යවන්න සිද්ධ වෙලා තිබෙන්නේ අනෙක් එක. ඒකෙන් තමයි CBD oil හදන්නේ. ඇත්තටම ඒ CBD oil තමයි ඖෂධය හැටියට ගන්නේ. එතකොට අපට සිද්ධ වෙලා තිබෙනවා, මේ වගාව කරන්න පිට රටින් මේ seeds ගේන්න. එතකොට මේ seedsවලටත් ඩොලර් යනවා. අන්න ඒ හින්දා තමයි මම BOI එකට proposal එකක් ඉදිරිපත් කරලා කිව්වේ, මෙන්න මේ seedsත් අපි මේ රටේ වගා කර ගත යුතුමයි, අපට එය කළ හැකියි කියලා. පිට රටින් ගෙනෙන seeds අපේ රටේ cultivate කරලා, ඒවා පිට රට යවා විදේශ විනිමය ගේන්නේ කොහොමද කියන එකත් මම පෙන්වා දීලා තිබෙනවා.

ඇත්තටම මම අරගෙන ගිය proposal එක මඟින් BOI එකට හොඳින්ම පෙන්වා දුන්නා, කංසා වගාවෙන් අවුරුද්දක් ඇතුළත ඉතාම ලේසියෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 6ක් අපට හම්බ කරන්න පුළුවන් කියලා. ඒ නිසා අපි මේක තේරුම් ගත යුතුව තිබෙනවා. ඒ වාගේම මෙහිදී අපි ඉස්සෙල්ලාම කළ යුතු වැඩ කොටසක් තිබෙනවා. අපට ඕනෑ ඕනෑ විධියට කොල්ලටයි, බල්ලටයි මේ වගාව කරන්න ඉඩ දෙන්න බැහැ. කංසා වගාව වල්මත් වෙන්න ඉඩ දෙන්න බැහැ. අද කථා කළා වාගේ, කංසා වගාව මේ රට තුළ නීතිගත කරලා, ඕනෑ ඕනෑ තැන්වල වගා කරන්න ඉඩ දීලා, ඕනෑම කෙනෙකුට පාවිච්චි කරන්න දෙන එක නොවෙයි මේකෙන් කළ යුත්තේ. අපි මේකෙන් බලාපොරොත්තු වෙන්නේ මේ රටට විදේශ විනිමය ලබා ගැනීමයි. මම කථා කරන්නේ අන්න ඒ විදේශ විනිමය පැත්ත ගැන. කංසාවලින් කරන්න පුළුවන් දේවල් ගොඩක් තිබෙනවා. අපේ රටේ වැවෙන, මත් ගතිය නැති කංසා, ඒ කියන්නේ hemp ඇත්තටම industrial hemp එකක්. අපේ රට තුළ මේ industry එක දියුණු කරන්න පුළුවන් නම්, අපට ණය බරින් මිදෙන්න ඒක විතරක් ප්‍රමාණවත්. Hempවලින් හදන products ටික බලන්න. අපි තායිලන්තයට ගිහිල්ලා බැලුවොත්, කංසා නීතිගත කරලා මාස පහක් ඇතුළත මේ industry එක තුළින් ඇමෙරිකානු ඩොලර් මිලියන 300ක් හම්බ කළා. මේකෙන් හදන්න පුළුවන් by-products ගැන අපට හිතා ගන්නවත් බැහැ. මොකද, කංසා ගහෙන් හදන fiber තමයි ලෝකයේ තිබෙන strongest fiber එක. Buildingsවලට අවශ්‍ය ගඩොල් පවා අද මේ hempවලින් හදනවා. මේවා අපේ රටේ විශාල වශයෙන් වගා කරන්න පුළුවන්. මේ රටේ තිබෙන දුප්පත්කම - දරිද්‍රතාව- නැති කරන්න පුළුවන් ක්‍රමයක් ගැනයි මම මේ කථා කළේ. මෙච්චර කාලයකට මේ පාර්ලිමේන්තුව තුළ සිටින මන්ත්‍රීවරු දෙසීය ගණනෙන් මට ඉස්සෙල්ලා මේ ගැන කථා කළේ ගරු රාජිත සේනාරත්න මන්ත්‍රීතුමායි. නමුත්, එතැනින් එහාට කවුරුවත් මේ කටයුත්ත කළේ නැහැ. කාන්තාවක් මෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක විධියටයි මම මේ යෝජනාව එදා ගෙනාවේ. ඒ හින්දා මම සතුටු වෙනවා, මේ කටයුත්ත මේ තැනට ගෙන එන්න පුළුවන්කම ලැබීම ගැන. මම වෙනුවෙන් නොවෙයි, මේ ලංකාව වෙනුවෙන් මම ඒ සටන දිනුවා කියලා නිහතමානී පුංචි ආඩම්බරයක් මට තිබෙනවා වාගේම, මම ඒ සටන දිනුවා කියලා විශ්වාස කරනවා. මේකෙන් කරන්න පුළුවන් විශාල වැඩ කොටසක් තිබෙනවා. කංසා නිකම් වගා කරලා මිනිස්සුන්ට පාවිච්චි කරන්න දෙන්නවත්, මත් වෙන්න දෙන්නවත් කියපු කථාවක් නොවෙයි මේක. ඒ හින්දා අපි ඒක ගැන තව ගොඩක්දුරට හිතන්න ඕනෑ.

මම තවදුරටත් කියන්න ඕනෑ, මේ රටේ තිබෙන spas ගැනත්. අද මෙතැනදීත් ඒ ගැන කථා කළා. මේ රටේ හැම තැනම spas තිබෙනවා. අපට ඒවා නවත්වන්න බැහැ. නමුත්, ඒවා නියාමනයක් යටතට ගෙන ආ යුතුමයි. මොකද, ඒවායෙන් සිදුවන සමාජ ව්‍යසනය අපට හිතාගන්නවත් බැහැ. Spas කියන්නේ මේ රටේ අහිංසක තරුණ පරපුර සමාජ රෝග තුළින් විනාශ වන එක තැනක්. එහෙම නම් අපේ රටේ තිබෙන spas අපි නියාමනයක් යටතට ගේන්න ඕනෑ. නියාමනයක් යටතට ගෙනාපු වෙලාවක ඒවායේ වැඩ කරන සියලුදෙනා ඒ නියාමනය තුළින්ම medical checkupsවලට යවන්න අපට පුළුවන් වෙනවා. එහෙම කළොත් මේ රට තුළ සිදුවන ඒ ව්‍යසනය ගොඩක්දුරට අඩු වෙනවා. මම දැකලා තිබෙනවා, spasවලට වැඩියෙන්ම යන්නේ අපේ රටේ තරුණ පරපුර බව. එම නිසා ඒ නියාමනය අනිවාර්යයෙන්ම සිදු විය යුතුයි.

අනික් එක තමයි, ආයුර්වේද වෛද්‍ය විද්‍යාව. ඇත්තටම ආයුර්වේද වෛද්‍ය ක්‍රමය, සිංහල වෙදකම අපේ රට තුළ අපි අගය කරලා නැහැ. විශේෂයෙන්ම අගය කළ යුතු තරමට අගය කරලා නැහැ. මේවා අද පිට රටවල පුදුමාකාර විධියට පිළිගෙන තිබෙනවා. අපේ සිංහල වෙදකම යුරෝපීය රටවල පුදුමාකාර විධියට පාවිච්චි වෙනවා. විශේෂයෙන්ම ආයුර්වේද treatmentsවලට මේ රටට විශාල වශයෙන් සංචාරකයෝ එනවා. නමුත්, අපි මේවා වැඩිදියුණු කරලා නැහැ. අපේ මිනිස්සු මේ සඳහා හරියට train කරලා නැහැ. ඒ අයට මේ ගැන professional training දීලා නැහැ. ඉතින්, අපි අපේ මිනිස්සු මේ වාගේ දේවල් සඳහා professionally train කරන්න ඕනෑ. Massage කිව්වාම බොහෝ මිනිස්සු ඒ ගැන කෙළින්ම වැරදි තීරණයක් තමයි ගන්නේ. හැබැයි, අපේ අය තේරුම් ගන්න ඕනෑ, massage කියන එක පිට රටවල degree level එකට ඉගෙන ගන්නා දෙයක් කියලා. ඒක නිකම් කරන්න පුළුවන් දෙයක් නොවෙයි, degree level එකට ඉගෙන ගන්න දෙයක්. මේ වාගේ දේවල්වලට යොමුවන විශාල පිරිසක් අපේ රට තුළ ඉන්නවා. මොකද, මේවාත් රැකියා. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය තුළ රැකියා විශාල ප්‍රමාණයක් තිබෙනවා. ආයුර්වේද වෛද්‍ය ක්‍රමය තුළ තිබෙන මේ massage parlours, spas හෝටල්වලටත් අත්‍යවශ්‍යයි.

මොකද, ආයුර්වේද ප්‍රතිකාර ලබා ගැනීම වෙනුවෙන්ම මේ රටට සමහර සංචාරකයන් එනවා. ඒ නිසා මේ සියලු දේවල් නිසි ලෙස විය යුතුයි. මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම ගැන මම ඇත්තටම අපේ ගරු සිසිර ජයකොඩි මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි අද අනිවාර්යයෙන්ම මේ පනත් කෙටුම්පත සම්මත කර ගත යුතුයි. මෙවැනි ක්‍රම භාවිත කරමින් මේ රටේ තිබෙන අර්බුදයෙන් බිඳක් හෝ අපි නැති කරගත යුතුයි. එහෙම නැත්නම් අපට මේ රට මෙතැනින් එහාට ගෙන යන්න බැහැ. රටේ තිබෙන සම්පත් අපි නාස්ති කර ගන්නවා නම්, නිධානයක් වාගේ තිබෙන මේ දේවල් අපිම නැති කරගෙන ඒවා අයින් කර ගන්නවා නම් අපට ඕනෑ තැනට කවදාවත් මේ රට ගෙනයන්න බැහැ. ඒක හීනයක් විතරක්ම වෙයි. ඒ නිසා මේ පනත් කෙටුම්පතට අපි සම්පූර්ණයෙන්ම සහයෝගය දක්වලා මේ රට ඉදිරියට ගෙන යන්නත්, මේ රටේ ජනතාවගේ දරිද්‍රතාව නැති කරන්නත් මේ ක්‍රම සහ විධි පාවිච්චි කළ යුතුයි.

මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමියට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 3.30]

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றையதினம் சுதேச வைத்தியத்துறை தொடர்பான விவாதம் இங்கே நடைபெற்றுக்கொண்டிருக்கின்றது. வடக்கு, கிழக்கில் சுதேச வைத்தியத்துறையானது மிகவும் மோசமான நிலையிலே இருக்கின்றது. அங்குள்ள சுதேச வைத்திய நிலையங்களில் அடிப்படை வசதிகள்கூட இல்லை. குறிப்பாக, வைத்தியர்களுக் கான அடிப்படை வசதிகள் இல்லை. அத்துடன், வைத்திய நிலையங்களுக்குத் தேவையான உதவியாளர்களும் இல்லை. இவற்றின் காரணமாக அங்கு இத்துறை அழிவடையும் நிலையில் இருக்கின்றது. தமிழ்ப் பிரதேசங்கள் என்ற காரணத் தினாலே அவை திட்டமிட்ட ரீதியில் புறக்கணிக்கப்பட்டுக் கொண்டிருக்கின்றன. இந்த விடயங்கள் தொடர்பாக சம்பந்தப் பட்ட அமைச்சு கவனம் செலுத்த வேண்டுமென்று நான் இந்த இடத்திலே கேட்டுக்கொள்கின்றேன்.

அடுத்ததாக, 2019ஆம் ஆண்டு இடம்பெற்ற 'ஈஸ்டர்' குண்டுத் தாக்குதலினுடைய சூத்திரதாரிகள் யார் என்பது தொடர்பான செய்தி இன்றையதினம் ஊடகங்களில் தலைப்புச் செய்தியாக வெளிவந்திருக்கின்றது. "Channel 4" ஊடாக வெளிவந்த இந்தத் தகவல் சாதாரணமான ஒரு விடயமல்ல! அதனுடைய சூத்திரதாரியாக இருந்தவர் ஸ்ரீ லங்கா இராணுவத்தோடு சேர்ந்து 2009ஆம் ஆண்டு வரை பல நூற்றுக்கணக்கான பெண்கள் பாலியல் வல்லுறவுக்குள்ளாக்கப் பட்டுக் கொல்லப்படுவதற்கும் பல நூற்றுக்கணக்கான தமிழ் இளைஞர்கள் கடத்தப்பட்டுச் சித்திரவதை செய்யப்பட்டுக் கொலைசெய்யப்படுவதற்கும் ஜோசப் பரராஜசிங்கம் அவர்கள் கொலை செய்யப்படுவதற்கும் காரணமாக இருந்த கிழக்கு மாகாணத்தின் மட்டக்களப்பு மாவட்டத்தில் இருக்கக்கூடிய தமிழீழ விடுதலைப் போராட்டத்தைக் காட்டிக்கொடுத்த "பிள்ளையான்" என்ற நபராவார். அதேபோன்று, ராஜபக்ஷக் கள் தமிழ் மக்கள்மீதான இறுதி யுத்தத்தில் 1 1/2 இலட்சம் மக்களைப் படுகொலை செய்தவர்கள். இவர்கள் 2020இல் மீண்டும் ஆட்சியைப் பிடிப்பதற்காக இந்த நாட்டில் ஒரு படுகொலையை அரங்கேற்றி, அதன் பழியை முஸ்லிம் மக்கள்மீது போட்டு, இந்த நாட்டினுடைய பொருளாதார வளர்ச்சிக்கு மிகப் பெரிய பங்காற்றிய முஸ்லிம் சமூகத்தினரை ஒரேநாளில் குற்றவாளிகளாக்கி, அவர்களுடைய கோடானு கோடி சொத்துக்கள் மற்றும் பொருளாதாரத்தை அழித்து, சிங்கள மக்களை முஸ்லிம் மக்களுக்கு எதிராகத் திருப்பி, சிங்கள மக்களுடைய வாக்குகளை எப்படிப் பெற்றுக் கொண்டார்கள் என்பது நாங்கள் எல்லோரும் அறிந்த ஒரு விடயம்! நான் இந்த இடத்தில் சிங்கள சமூகத்தினரிடம் ஒரு விடயத்தை மிகவும் விநயமாக வேண்டிக்கொள்ள விரும்புகின் றேன். அதாவது, நிதானமாகச் சிந்தியுங்களென்றுதான் வேண்டுகின்றேன். 2009இற்கு முன்னர், தமிழீழ விடுதலைப் புலிகளை யுத்தத்தில் வெற்றிகொள்ள முடியாத ஸ்ரீ லங்கா இராணுவம் - ஸ்ரீ லங்கா அரசாங்கம் -

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සමන්ප්‍රිය හේරත් මන්ත්‍රීතුමා.

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇත්ත වශයෙන්ම ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මන්ත්‍රීතුමා කථා කරන්නේ විෂය ගැන නොවෙයි. එතුමා කරන්නේ ජාතිවාදී කථාවක්. ඒ නිසා මේක වැරදියි. "ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත" ගැන කථා කරන්නයි අද තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඒ සම්බන්ධයෙන් කථානායකතුමාව දැනුවත් කරන්නම්. ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)

2009இற்கு முன்னர், தென்னிலங்கையில் சிங்கள மக்கள் பயணம் செய்த பஸ்களில் குண்டுகள் வெடித்தன; பௌத்த பிக்குகள் கொல்லப்பட்டனர். இந்தச் சம்பவங்கள்கூட, சிங்கள மக்களைத் தமிழ் மக்களுக்கு எதிராகவும் தமிழீழ விடுதலைப் புலிகளுக்கு எதிராகவும் கோபப்படவைத்து, தமிழ் மக்கள்மீது ஓர் இனவழிப்பை மேற்கொள்வதற்காக ராஜபக்ஷக்கள் மேற்கொண்ட சதியாகும். இதுதொடர்பாக ஒரு சர்வதேச விசாரணை நடத்தப்பட்டால் மட்டும்தான் உண்மையை வெளிக் கொண்டுவர முடியும் என்பதை நான் இந்த இடத்திலே பதிவுசெய்துகொள்ள விரும்புகின்றேன். "பிள்ளையான்" உட்பட ராஜபக்ஷக்கள் உடனடியாகக் கைதுசெய்யப்பட வேண்டும். இவர்களுக்கு எதிராகச் சர்வதேச விசாரணை யொன்று மேற்கொள்ளப்பட வேண்டும் என்பதை நான் இங்கு பதிவு செய்துகொள்கின்றேன்.

திருகோணமலை மாவட்டத்தின் வெருகல் பிரதேச செயலாளர் பிரிவில் நாதனோடை என்ற இடத்தில் மிகப்பெரிய தோர் அணைக்கட்டு இருக்கின்றது. அந்த அணைக்கட்டுக்கு ஆபத்து ஏற்படுத்துகின்ற விதமாக அங்கு பாரிய மண்ணகழ்வு நடைபெற்றுக்கொண்டிருக்கின்றது. பிரதேச செயலக அதிகாரி கள், கனியவளத் திணைக்கள அதிகாரிகள் உட்பட பல தரப்புகளுக்கு இலஞ்சம் கொடுக்கப்பட்டே அந்த மண்ணகழ்வுக் கான அனுமதி பெறப்பட்டிருக்கிறது. இரேசா ஜானகி பெர்னாண்டோபுள்ளே என்ற நபருக்கு 3 மாதங்களுக்கு மண்ணகழ்வுக்கான அனுமதி வழங்கப்பட்டுள்ள காரணத்தி னால், பாரிய வெள்ள அழிவைச் சந்திக்கக்கூடிய ஆபத்து அங்குள்ள 9 கிராமங்களுக்கு ஏற்பட்டிருக்கின்றது. 13,000 மக்கள் இதனால் பாதிக்கப்படக்கூடிய நிலைமையிருக்கின்றது. இதன் காரணமாக அங்குள்ள மக்கள் மத்தியில் பதற்ற நிலையும் குழப்ப நிலையும் ஏற்பட்டுக்கொண்டிருக்கின்றது. ஆகவே, அந்த மண்ணகழ்வுக்கான அனுமதியை உடனடியாக இரத்துச் செய்ய வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, திருகோணமலை மாவட்டத்தின் பட்டினமும் சூழலும் பிரதேச செயலாளர் பிரிவில் இலுப்பைக்குளம் கிராம சேவையாளர் பிரிவிலுள்ள பெரியகுளம் சந்தியில் "பொரலுகந்த ரஜமகா விகாரை" என்ற பெயரில்

விகாரையொன்று சட்டவிரோதமாக அமைக்கப்படுகின்றது. நூற்றுக்கு நூறு வீதம் தமிழர்கள் வாழ்கின்ற அந்தப் பிரதேசத்திலே, ஒரு கிறிஸ்தவ தேவாலயத்திற்கும் இரண்டு சைவ ஆலயங்களுக்கும் முன்பாக இனக்குரோதத்தை, இன வன்முறையை ஏற்படுத்துகின்ற நோக்கத்தோடு அந்த விகாரையை அமைப்பதற்கான முயற்சி கள் நடைபெறுகின்றன. அந்த விகாரையின் கட்டுமானப் பணிகள் உடனடியாகத் தடுத்து நிறுத்தப்பட வேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි. කරුණාකරලා ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
Hon. Presiding Member, please give me one more minute.

அத்தோடு, குருந்தூர் மலையில் அமைக்கப்பட்டிருக்கும் விகாரையானது நீதிமன்றத்தின் உத்தரவை மீறிச் சட்டவிரோத மான முறையில் அமைக்கப்பட்டிருப்பதாக நீதிமன்றம் தீர்ப்பளித்து இருக்கின்றது.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි. ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

**ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා**
(மாண்புமிகு செல்வராசா கஜேந்திரன்)
(The Hon. Selvarajah Kajendren)
I am winding up, Madam.

குருந்தூர் மலையில் அமைக்கப்பட்டிருக்கும் சட்டவிரோதக் கட்டுமானம் உடனடியாக அகற்றப்பட வேண்டும். தொல் பொருள் திணைக்களத்திற்குப் பொறுப்பான பணிப்பாளர் உடனடியாகப் பணி நீக்கம் செய்யப்பட வேண்டும்.

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සමන්ප්‍රිය හේරත් මන්ත්‍රීතුමා.

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සෙල්වරාජා කජේන්ද්‍රන් මන්ත්‍රීතුමා කුරුන්දි විහාරය ගැන කථා කළා. එහෙම නම්, අපිටත් වෙනම දිනයක් දෙන්න. අපිටත් ඒ ගැන කථා කරන්න බොහෝ දේවල් තිබෙනවා. එතුමා කථා කළේ අද දිනයේ මාතෘකාවට අදාළව නොවෙයි නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් ගරු කථානායකතුමාව දැනුවත් කරන්නම්.

මීළඟට, ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

**ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා**
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,-

**ගරු කපිල අතුකෝරල මහතා**
(மாண்புமிகு கபில அதுகோரல)
(The Hon. Kapila Athukorala)
Madam, I rise to a point of Order. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට අවස්ථාව ලබා දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කපිල අතුකෝරල මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු කපිල අතුකෝරල මහතා**
(மாண்புமிகு கபில அதுகோரல)
(The Hon. Kapila Athukorala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පාර්ලිමේන්තුව තුළත් සිංහල, දමිළ, මුස්ලිම් නියෝජනයක් තිබෙනවා. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේත් මේ ජාතීන් තුන් වර්ගයම ජීවත් වෙනවා. අද වනතෙක් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මේ ජාතීන් අතරවත් කිසිම ප්‍රශ්නයක් ඇති වෙලා නැහැ. යාපනයෙන් මෙතුමන්ලා කණ්ඩායමක් TNA එකෙන් ඇවිල්ලා තමයි මේ අවුල හදන්නේ. TNA එකෙන් මම ඉල්ලා සිටිනවා, ඔබතුමන්ලා පක්ෂයක් විධියට බොරළු කන්ද විහාරය සම්බන්ධයෙන් ප්‍රශ්න ඇති කරන්න එපා කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අපි ඒ පිළිබඳ ගරු කථානායකතුමාව දැනුවත් කරන්නම්. ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

[අ.භා. 3.37]

**ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා**
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ 1961 අංක 31 දරන ආයුර්වේද පනත සංශෝධනය කිරීම අපේ රටට ඉතා වැදගත් වෙනවා. අවුරුදු 62කට පස්සේ තමයි මෙය සංශෝධනය කරන්නේ. මේක විශේෂ අවස්ථාවක්. මම හිතන විධියට රාජ්‍ය අමාත්‍ය ගරු සිසිර ජයකොඩි මැතිතුමා ආයුර්වේදය පිළිබඳ විශේෂ උනන්දුවක් දක්වනවා. එතුමා අපිට ආවේණික වෛද්‍ය ක්‍රමය ඉහළට ගන්න අවශ්‍ය කටයුතු කරනවා. එතුමා රාජ්‍ය අමාත්‍ය ධුරයට පත් වෙච්ච දවසේ ඉඳන් අපේ දේ රැකගෙන අපේම උරුමය ඉහළට ගැනීම සඳහා ලොකු උත්සාහයක් ගන්නවා. ආයුර්වේද කොමසාරිස්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයත් ඒ සඳහා

[ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා]

සහාය වෙනවා. ඒක ඉතා වැදගත් දෙයක්. අපේ රට ශ්‍රී ලංකාව කිව්වාම, සමහර විදේශිකයෝ ayurvedic medicine ගැන තමයි කථා කරන්නේ. අපේ ආයුර්වේද ක්‍රම ගැන කථා කරන අවස්ථා ගොඩක් මම දැක්කා. අපි රටකට ගියාම ඒ රටවල අය අපෙන් අහන්නේ අපේ රටේ තිබෙන ආයුර්වේද වෛද්‍ය ක්‍රමය ගැනයි. මේ ආයුර්වේද ක්‍රමවේදය හැදුණේ කොහොමද, තාක්ෂණය නැතිව මේ වැඩ කරන්නේ කොහොමද කියලා ඔවුන් අපෙන් අහන බොහෝ අවස්ථා තිබෙනවා.

මම කථා කරන්නේ බදුල්ල දිස්ත්‍රික්කය වෙනුවෙන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. දියතලාව ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය ගත්තොත්, මාසයකට රෝගීන් 7,000ක් විතර බෙහෙත් ගන්නා ස්ථානයක් බවට එය පත් වෙලා තිබෙනවා. විදේශිකයන් විශාල සංඛ්‍යාවක් එහි ආයුර්වේද ප්‍රතිකාර සඳහා එන තත්ත්වයක් තමයි තිබෙන්නේ. අපි මේ වෙලාවේ ආයුර්වේද වෛද්‍ය ක්‍රමය දකින්නේ සංචාරක කර්මාන්තය දියුණු කරන්න පුළුවන් හොඳ අවස්ථාවක් හැටියටයි. ඒ, එක පැත්තක්. අනෙකුත් පාරම්පරික වෛද්‍යවරු නොයෙකුත් විධියට තමන්ගේ වෛද්‍ය වෘත්තීන් ක්‍රියාත්මක කරගෙන යනවා. ඔවුන්ටත් අපි අවස්ථාවක් දෙන්න ඕනෑ. ඒක තමයි අපේ ගරු සිසිර ජයකොඩි මැතිතුමා මේ අවස්ථාවේ දී කරන්න යන්නේ. ඒ අයටත් අවස්ථාවක් දෙන්න ඕනෑ. මම දැක්කා ඔවුන්ගේ ආයුර්වේද වෛද්‍ය ක්‍රම. මම දන්නා ඕස්ට්‍රේලියානු ජාතික කාන්තාවක් ලංකාවට ඇවිල්ලා මාත් එක්ක බණ්ඩාරවෙල තිබෙන ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයකට ගියා. ඒක, පාරම්පරික වෙද මහත්මයෙකුගේ වෛද්‍ය මධ්‍යස්ථානයක්. අපි එතැනට ගියාම එතුමා ඒ කාන්තාවගේ නාඩි - pulse - බලලා ලෙඩක් ගැන කිව්වා. මම එදා දැක්කා, ඒක කොහොමද කළේ කියලා. එතුමා නාඩි බලලා කිව්වා, ඒ කාන්තාවගේ ලේවල තිබෙන ප්‍රශ්නයක් ගැන. ඕස්ට්‍රේලියානු ජාතික ඒ කාන්තාව කිව්වා, "මෙච්චර තාක්ෂණය දියුණු වෙලා තිබියදීත් ඕස්ට්‍රේලියාවේ වෛද්‍යවරුන්ටත් අවුරුදු 15ක් විතර ගියා මේ ලෙඩේ තිබෙනවා කියලා හොයා ගන්න. නමුත්, මෙතුමා මගේ නාඩි බලලා ඒක හොයා ගත්තා" කියලා. ඇය ඒ සඳහා අවශ්‍ය බෙහෙත් අරගෙන ගියා. ඇය මට කිව්වා, මේ ආයුර්වේද ක්‍රමය, මේ බෙහෙත් වර්ග ඉතා සාර්ථකයි කියලා. ඒ වාගේම මේ ක්ෂේත්‍රයේ නොයෙකුත් දක්ෂතා දක්වනවා විතරක් නොවෙයි, සර්ප වෙදකම, අක්ෂි වෙදකම වාගේ ගොඩක් වෙදකම් ගැන අපි ආයුර්වේදයේ කථා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, heart එකේ surgery එකක් කරන්න තිබෙනවා කිව්වාම සමහරු ආයුර්වේද වෙද මහත්තුරු ළඟට යනවා. ගිහිල්ලා බෙහෙත් අරගන්නවා. මම මේ සම්බන්ධව දන්නවා. මොකද, මගේ father-in-lawට එක සැරයක් stent එකක් දාන්න ඕනෑ කියා ලැහැස්ති වෙලා ඉන්නකොට කවුරුන් හෝ ඔහුට කියලා තිබුණා, "අනුරාධපුරයේ වෙද මහත්තයෙක් ඉන්නවා, එතැනට යන්න" කියලා. ඔහු එතැනට ගිහිල්ලා තිබුණා.

ඔහු එතැනට ගිහිල්ලා ප්‍රතිකාර ලබාගෙන, ඊට පස්සේ මාස 2කින් විතර ආපසු doctorට පෙන්වනකොට ඒ තිබුණු block එක නැතිවෙලා. ඔහු ඒ රෝගී තත්ත්වය සුව අතට පත් කරගෙන තිබුණා. ඒ නිසා අපේ ප්‍රතිකාර ක්‍රමවල තිබෙන මේ රහස අපි රැක ගත යුතුයි. අපි මේක රැක ගන්නවා වාගේම මේක develop කරන්න ඕනෑ; දියුණු කරන්න ඕනෑ. මේ ආයුර්වේද ක්‍රම අපි මීළඟ පරම්පරාව වෙතට ගෙනියන්න ඕනෑ. හැබැයි, මේක ඊළඟ පරම්පරාවට යනවා අපි දකින්නේ නැහැ. ඒ නිසා තමයි දැන් ආයුර්වේදය එකතු වෙලා මේ ක්‍රමය ඉස්සරහට ගන්නේ. ආයුර්වේදයේ ඒ කටයුතු සියල්ලම සිද්ධ වෙනවා. ඒ වෛද්‍යවරු මේ වෙනුවෙන් විශාල මහන්සියක් ගන්නා ආකාරය අපි දකිනවා. දැන් අපි හොඳ ක්‍රමවේදයකට ඇවිල්ලා තිබෙනවා; හොඳ තැනකට ඇවිල්ලා තිබෙනවා. මේක ඉතාම වැදගත්. සමහර වෙලාවට දක්ෂ වෙද මහත්වරුන්ට මේ සේවාව කරන්න අවශ්‍ය ශක්තිය ලැබෙන්නේ නැහැ. අපේ වුණත් සහයෝගයක් ඔවුන්ට ලැබෙන්නේ නැති ගතියක් තිබෙනවා. ඒ සහයෝගය ලබා දීම වෙනුවෙන් තමයි අපේ ගරු රාජ්‍ය අමාත්‍යතුමා ඇතුළු සියලුදෙනා අපේ ආයුර්වේදය වෙනුවෙන් මේ වැඩකටයුතු කරන්න සූදානම් වන්නේ. ඔවුනුත් එකතු කරගෙන සාර්ථක ක්‍රමවේදයකට යන්නයි මේ වැඩකටයුතු කරන්නේ. ඒ අයත් එකතු කරගෙන, ඔවුන්ගේ පරම්පරාවෙන් ආපු ඒ දැනුමත් ලබාගෙන, අපේ ආයුර්වේදය ඇතුළු ඒ ක්ෂේත්‍රය පෝෂණය කරන්න තමයි මේ උත්සාහය ගන්නේ. ඒක ඉතාම වැදගත් වෙනවා.

මේ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අපේ ගරු සෞඛ්‍ය ඇමතිතුමාගේත් විශේෂ අවධානය යොමු වෙන්න ඕනෑ. මොකද, ආයුර්වේදය සඳහා වෙන් කරන්නේ ඉතාම සීමිත මුදල් ප්‍රමාණයක්. ඒ සුළු මුදල් ප්‍රමාණයෙන් මේ දේවල් කරන්න බැහැ. සමහර අවස්ථාවලදී රෝගීන්ගේ අවශ්‍යතා වෙනුවෙන් X-ray machines අවශ්‍යයි. ඔවුන්ට scanners අවශ්‍යයි. මොකද, කැඩුම් බිඳුම් රෝගීන් තමයි විශාල ප්‍රමාණයක් එන්නේ. දියතලාව ආයුර්වේද රෝහලට කැඩුම් බිඳුම් සම්බන්ධයෙන් රෝගීන් විශාල ප්‍රමාණයක් එන බව මම දන්නවා. හැබැයි, X-ray එකක් ගන්න X-ray machines තිබෙන hospital එකකට ඒ රෝගීන්ව අරන් යන්න වෙනවා. එම නිසා ඒ උපකරණ නොමැති රෝහල්වලට අවශ්‍ය උපකරණ සපයන්න පුළුවන් නම්, මේ රෝහල් තුළින් තව තවත් උපරිම සේවයක් ගන්න පුළුවන්.

ඊළඟ එක තමයි, පංචකර්ම ප්‍රතිකාර ක්‍රමවේදය. මෙය විදේශිකයන් විශාල සංඛ්‍යාවක් බලාපොරොත්තු වෙන දෙයක්. ඔවුන් ඒ ගැන උනන්දු වෙනවා. හැබැයි, ඒ වෙනුවෙන් අවශ්‍ය පහසුකම් වැඩි කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන් ඇල්ල ප්‍රදේශය ගත්තොත්, ඒ ප්‍රදේශයට සංචාරකයන් විශාල ප්‍රමාණයක් ඇවිල්ලා ඉන්නවා. හැබැයි, නොයෙකුත් spas හදලා නොයෙකුත් විධියට අපේ අය මේ දේවල් කරගෙන යනවා. හැබැයි, ආයුර්වේද රෝහලක් හදලා, එහෙම නැත්නම් ආයුර්වේද මධ්‍යස්ථානයක් දාලා සම්බාහන ක්‍රියාවලිය හරියට කරන්න පුළුවන් දක්ෂ පුද්ගලයන් එතැනට යොමු කරන්න පුළුවන් නම්, නිවැරදි සම්බාහන ක්‍රම අනුව ඒ සේවය ලබා දෙන්න පුළුවන් නම් ඒක ඉතාම වැදගත් වෙනවා. ඒ නිසා ඒ ගැනත් විශේෂ අවධානයක් යොමු කරන්න.

ඖෂධ වර්ග ගැනත් විශේෂයෙන්ම මම කථා කරන්න ඕනෑ. අපේ රට තුළ ඖෂධ වර්ග විශාල වශයෙන් වැවෙනවා. හැබැයි, ඒ ඖෂධ ජනතාව හඳුනන්නේ නැහැ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ ඖෂධ හඳුනා ගැනීමේ ක්‍රමයක් හදන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. අපේ ගම්වල ඉන්න ජනතාව දැනුවත් කරන්න, මේ තිබෙන ඖෂධ ගැන. ඒ වාගේම ඒ තිබෙන ඖෂධ අපේ ආයුර්වේදයට ගැනීම සඳහා වැඩ පිළිවෙළක් හදන්න. දැනට එවැනි ඖෂධ ලබා ගැනීම සිදු වෙන්නේ ටෙන්ඩර් ක්‍රමයට. හැබැයි, සමහර උදවිය තමන්ගේ ගෙදර තිබෙන, පරිසරයේ තිබෙන දේශීය ඖෂධ ආයුර්වේද මධ්‍යස්ථානවලට ගෙනැවිත් දෙනවා. ඒ ඖෂධ නිවැරදිව ලබා ගත හැකි ක්‍රමවත් හැදුවොත් ඒ ජනතාව තවත් උනන්දු වෙලා කටයුතු කරනවා. ඒ හරහා ගමේ ජනතාවගේ ආර්ථිකයත් ශක්තිමත් වෙනවා. ඒ ගැනත් විශේෂ අවධානයක් යොමු කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි ටෙන්ඩර් කරලා මේ ඖෂධ මිලදී ගන්නකොට ඒ වෙනුවෙන් විශාල මුදලක් වියදම්

වෙනවා. අපේ ගම්වල සිටින ජනතාව හරහා මේ ඖෂධ මිලදී ගන්න පුළුවන් නම් ඒ වැය වන මුදල් ප්‍රමාණයෙන් සියයට 50ක් විතර අඩු කර ගන්න පුළුවන්බ වෙයි කියලා මම හිතනවා. ඒ වාගේම, මේ ඖෂධ වැවීම ගෙවතු වගාවක් විධියටත් කරන්න පුළුවන්. ඒ ගැනත් අපි විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. එහෙම නැත්නම් ඉන්දියාවෙන් තමයි අපි ඖෂධ ගේන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය අවසානයි. දැන් කථාව අවසන් කරන්න.

**ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා**
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

අපේ පනතෙන් තිබුණේ නැහැ, ඖෂධ වගා කිරීමේ බලයක්. ඖෂධ නිෂ්පාදනය කරන්න බලයක් තිබෙනවා. ඒක තමයි වෙනස් කරන්න ඕනෑ. ඖෂධ වර්ග කිහිපයක් දැන් අපි ඉන්දියාවෙන් ගේනවා. අතිවිඩයම්, මල්වදම, වළහසාල්, අක්‍රපට්ට, අමුක්කරා - මම හරියට මේ ඖෂධ වර්ගවල නම් pronounce කළා ද දන්නේ නැහැ - වාගේ විශාල ඖෂධ ප්‍රමාණයක් අපි ඉන්දියාවෙන් ගේනවා. අපි මේවා import කරනවා. හැබැයි, මේ ඖෂධ අපිට අපේ රටේ හදාගන්න වෙනවා. මොකද, 2027 වෙනකොට මේවා ඉන්දියාවේ හදලා අපිට නිමි ඖෂධ විධියට තමයි දෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, අපට තිබෙන්නේ ඉතා සීමිත කාලයක් නිසා ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න. නැත්නම් අනෙක් ගරු මන්ත්‍රීවරුන්ට කථා කරන්න තිබෙන වේලාව තවත් අඩු වෙනවා.

**ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා**
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)

අපිට මේ ඖෂධ ලංකාවේ වගා කරගන්න පුළුවන් නම් ඉතාම වැදගත් වෙනවා. ඒ වෙනුවෙන් අවශ්‍ය කටයුතු කරන්න කියලා මම ගරු රාජ්‍ය අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, ඒක ඉතාම වැදගත් දෙයක්.

මී පැණි ගැනත් මම කථා කරන්න ඕනෑ. ඒ නිසා මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මී පැණි ගැන විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. මී පැණි අපේ රටේ හදනවා. හැබැයි, අපි මී පැණි import කරනවා. අපි ඕස්ට්‍රේලියාවෙන් මී පැණි import කරනවා. මෙන්න මේක අපි නවත්වා ගන්නම ඕනෑ. අපි කෘෂිකර්ම අමාත්‍යාංශයත් එක්ක එකතුවෙලා මී පැණි නිෂ්පාදනය කර ගන්න අවශ්‍ය කටයුතු කරනවා.

තව එක කාරණයක් කියලා මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. Prof. Piyal Marasinghe කියලා ආයුර්වේදයට විශේෂ සේවයක් කරපු මහත්මයෙක් හිටියා. මීට මාස කිහිපයකට උඩදී එතුමා මිය ගියා. එතුමා විශ්‍රාම ගියාට පසුව contract basis මත අපේ ඌව පළාතට ගත්තා. එතුමා ඒ ප්‍රදේශයට ලොකු සේවයක්, වටිනා, අගනා සේවයක් කළා. ගරු සිසිර ජයකොඩි රාජ්‍ය අමාත්‍යතුමා මහාචාර්ය පියල් මාරසිංහ මැතිතුමා නමින් බත්ගොඩ ඔසු උයන නම් කළා. එතුමාට කළ ඒ උපහාරය සම්බන්ධයෙන් ගරු සිසිර ජයකොඩි රාජ්‍ය අමාත්‍යතුමාට අපේ ස්තුතිය පුද කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු විපක්ෂ නායකතුමා.

[අ.භා. 3.46]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ආයුර්වේද ක්ෂේත්‍රය පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ මම විශේෂයෙන් මතක් කළ යුතු කරුණක් තිබෙනවා. දේශීය වෛද්‍ය ක්‍රමය කියන්නේ ආයුර්වේද ක්‍රමය ඇතුළු තවත් බොහෝ වෛද්‍ය ක්‍රම සමූහයක එකතුවක් කියන එක අපි අවබෝධ කර ගන්නට ඕනෑ. ඒ හැම වෛද්‍ය ක්‍රමයකටම අනන්‍ය වූ ලක්ෂණ සහ වෙනස්කම් තිබෙනවා. වසර හැටකට ආසන්න කාලයක් පැරණි මේ පනතට කරන සංශෝධන අදාළ සියලු පාර්ශ්වයන්ගේ අදහස් විමසන්නේ නැතිව, නිසි පුළුල් අධ්‍යයනයකින් තොරව කරන සංශෝධන හැටියටයි අපි දකින්නේ. ඒ නිසා අපට ප්‍රශ්නයක් මතු වෙනවා. මේ සංශෝධන මඟින් බලාපොරොත්තු වන අරමුණු කරා ළඟා වෙන්න පුළුවන්ද, බැරිද කියන කාරණාව මේ තුළ ගැටලුකාරී තත්ත්වයක් නිර්මාණය කරන බව අපට පෙනෙනවා.

පනතක අරමුණ විය යුත්තේ පවතින සියලුම තත්ත්වයන් විධිමත් නීති රාමුවක් තුළට ගෙන ඒමත් සමඟ හොඳ නියාමනයක්, ප්‍රගතිශීලී වර්ධනයක් ඇති කිරීමයි. මේ පනත් කෙටුම්පතේ අරමුණු වුණේ ආයුර්වේද කායික වෛද්‍ය විද්‍යා සහ ශල්‍ය විද්‍යා ක්ෂේත්‍රවල නියැළෙන කණ්ඩායම් හා එම ක්‍රියාකාරකම් ලියාපදිංචි කිරීම, පනත යටතේ පිළිගනු ලබන පාඨමාලා වර්ග පුළුල් කිරීම, ආයුර්වේද රෝහල් සඳහා ශ්‍රේණිගත කිරීම යන කරුණු කාරණා. ඒ කෙසේ වෙතත්, මම පෙර කී ආකාරයට පුළුල් අධ්‍යයනයකින් තොරව මේ දේ සිදුවීම තුළ ශ්‍රේෂ්ඨාධිකරණයේදී සාම්ප්‍රදායික දේශීය වෛද්‍ය සේවාවන් සුරැකෙන පරිදි බොහෝ සංශෝධන සහ නියෝග ලබා දෙනු ලැබුවා. ඒ වෙනුවෙන් පෙනී හිටපු සියලුම පාර්ශ්වයන්ට, සියලුම කණ්ඩායම්වලට මගේ කෘතඥතාව පුදකර සිටිනවා.

රජයේ වගකීම වන්නේ වර්තමාන දේශීය වෛද්‍ය සේවය උසස් ප්‍රමිතිගත අයුරකින් පවත්වාගෙන යාම සහ ඒ ක්ෂේත්‍රයේ නියැළී සිටින වෛද්‍යවරුන්ගේ වෘත්තීය ගරුත්වය සුරැකීමයි. ඒ වාගේම යම් වෛද්‍ය ක්‍රමයක් විධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රයක් තුළින් නොපැමිණි බව පවසමින්, ඒ පමණින්ම එය ප්‍රතික්ෂේප කිරීම කරන්න බැහැ. පරම්පරා ගණනාවක් පුරා රහස් බෙහෙත් වට්ටෝරු හා වෙදකම පුහුණු කිරීමෙන් පරම්පරාවෙන් පරම්පරාවට උරුම වූ පුද්ගල දැනුම - tacit knowledge - හා එම ප්‍රතිකාර මඟින් සුව වූ රෝගීන් ප්‍රමාණය ද සැලකිල්ලට ගත් පසු අප කළ යුත්තේ, එම පාරම්පරික වෛද්‍ය ක්‍රම අනාගතය වෙනුවෙන් රැකගැනීම හා සුවහසක් ජනයාගේ යහපත සඳහා තම කාලය, ශ්‍රමය, දැනුම භාවිත කරන දේශීය වෛද්‍යවරුන්ට නිසි ගරුත්වයක් ලබා දීමයි. ඒ නිසා අප රටට ආවේණික වුණු පාරම්පරික වෙදකම සුරැකීමේ කාර්යභාරය හුදෙක් තවත් එක් සම්ප්‍රදායක් සුරැකීමේ අරමුණින්ම නොව, ප්‍රායෝගිකව රෝගීන් සුවපත් කිරීමේ ශක්‍යතා සහිත වෛද්‍ය ක්‍රමයක් ලෙසින් අපි හඳුනා ගන්නට ඕනෑ. ඒ වාගේම, අපට පුළුවන් විශේෂයෙන්ම සෞඛ්‍ය සංචාරක ක්ෂේත්‍රයට, health tourism ක්ෂේත්‍රයට වඩ වඩාත් පුළුල් ලෙස මේ පාරම්පරික වෛද්‍ය ක්‍රම, මේ ආයුර්වේද වෛද්‍ය ක්‍රම උපයෝගි කර ගන්නට. ඇත්ත වශයෙන්ම එය අපේ රටේ සංචාරක ප්‍රවර්ධනයට හොඳ ආයෝජනයක් බවට පත් වෙයි.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

දේශීය වෛද්‍ය ක්‍රම සියල්ල එක් පනතකින් නියාමනය කිරීම සාර්ථක වැඩ පිළිවෙළක් නොවෙයි. ඒ නිසා අපේ යෝජනාව වන්නේ මේ සියලු දේශීය වෛද්‍ය ක්‍රම ආරක්ෂා කරගෙන, ඒවා නිසි ලෙස නියාමනය කරමින් ජනතාවත්, දේශීය වෛද්‍ය ක්‍රමයත් ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුයි කියන එකයි. අපි යෝජනා කරනවා, එක් එක් වෛද්‍ය ක්‍රම සඳහා වෙන වෙනම නීති ගෙන ආ යුතු බව. දේශීය වෛද්‍ය සෞඛ්‍ය පනත, ආයුර්වේද සෞඛ්‍ය සේවා පනත, ආයුර්වේද පෞද්ගලික ආයතන නියාමන පනත, ආයුර්වේද ඖෂධ නියාමන හා ලියාපදිංචි පනත ලෙස එකිනෙකින් වෙන්වූ පනත් 4ක් මේකට අවශ්‍ය වෙයි කියා අපි විශ්වාස කරනවා. ආයුර්වේද, පාරම්පරික ඇතුළු සියලු පාර්ශ්වකරුවන් සමඟ දීර්ඝ සාකච්ඡා කිරීමකින් පසුවයි නව නීති හඳුන්වා දෙන මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙන්නට ඕනෑ. ඒ නිසා දේශීය වෛද්‍ය ක්‍රම ආරක්ෂා කිරීමටත්, මහ ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙනුත් අපි සංශෝධන 21ක් ඉදිරිපත් කරනවා. දේශපාලන අර්ථයෙන් නොව, සමාජ වගකීමක් ලෙස සලකා එම සංශෝධන කෙරෙහි සාධනීය ප්‍රතිචාරයක් ලැබෙනු ඇතැයි අපි විශ්වාස කරනවා. ගරු රාජිත සේනාරත්න මැතිතුමා ඒ සංශෝධන ඉදිරිපත් කරන්නට කටයුතු කරනවා. අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඒ සංශෝධන දෙස ධනාත්මකව බලා ඒවා සිදු කිරීමට සහයෝගය ලබා දෙන්න කියලා.

දේශීය ආයුර්වේද සෞඛ්‍ය සේවය පුළුල් වූ ආයතනික පද්ධතිය තුළ වර්ධනය වී ඇති සේවා අවශ්‍යතා වෛද්‍ය විද්‍යා හා තාක්ෂණ යන අංශයන්හි දියුණුව හා යාවත්කාලීන නවීන වෛද්‍ය හා වෘත්තීය ක්ෂේත්‍ර හා සමගාමීව දියුණුවක් ලබා ගැනීමට අවශ්‍ය නෛතික සහන ලබාදීම මේ සංශෝධනවල අරමුණයි. විශේෂයෙන්ම මේ සංශෝධන අතර පරිපාලනමය කටයුතු සඳහා වඩා වැඩි දේශීය පාරම්පරික හා ආයුර්වේද වෛද්‍යවරුන්ගේ නියෝජනත්වය ලැබෙන පරිදි මෙන්ම එක් එක් දේශීය වෛද්‍ය ක්ෂේත්‍රයන් හා පාරම්පරික වෛද්‍ය ක්ෂේත්‍ර නියෝජනය වන පරිදි හා අමාත්‍යවරයාගේ අභිමතයට සිදු වන පාලනයක් ලෙස නොව, වෛද්‍ය විශේෂඥයන් මඟින් සිදු වන පාලනයක් තහවුරු කිරීම සඳහා පහත වගන්ති සංශෝධනයට යෝජනා කර තිබෙනවා.

ඒවා තමයි, 2, 4, 10, 16, 23, 24, 21 යන වගන්ති හා උපවගන්ති. ඒ වාගේම, ප්‍රමිතිගත දේශීය සෞඛ්‍ය අධ්‍යාපන ක්‍රමයක් සඳහා සංශෝධනය කිරීමට යෝජනා කර තිබෙනවා 7, 11, 16, 22, 20, 33 යන වගන්ති හා උපවගන්ති. ආයුර්වේද ආරෝග්‍යශාලා හා ඖෂධ නිෂ්පාදනාගාර නියාමනය සහ වෛද්‍යවරු ලියාපදිංචිය සඳහා සංශෝධනය කිරීමට යෝජනා කර තිබෙනවා, 10, 20, 24, 25 යන වගන්ති හා උපවගන්ති. ඒ සංශෝධන ඉදිරිපත් කිරීම ගරු රාජිත සේනාරත්න මැතිතුමා විසින් සිදු කරනු ලබනවා.

ඒ සංශෝධන සහිතව වුවත් මේ පනත් කෙටුම්පත මඟින් දේශීය වෛද්‍ය ක්‍රමය යාවත්කාලීන කර ජනතා සුබසිද්ධිය ලබා දීමේ කාර්යය සම්පූර්ණ නොවන බව තමයි අපේ විශ්වාසය. ඒ නිසා මම ගරු රාජ්‍ය ඇමතිතුමාට ආරාධනා කරනවා, සියලු පාර්ශ්ව සමඟ සාකච්ඡා කරලා එක් එක් වෛද්‍ය ක්‍රම යාවත්කාලීන කිරීමට, නියාමනයට අවශ්‍ය නීති සෑදීමට රජය වහාම මැදිහත් වෙලා කටයුතු කරන්න කියලා. එසේ කළ යුතුය කියා මා යෝජනා කරනවා. එවන් ක්‍රියාදාමයක් උදෙසා විපක්ෂයේ පූර්ණ සහයෝගය ලබා දෙන්න අප සූදානම්.

අපි පාරම්පරික වෛද්‍ය ක්ෂේත්‍රය, දේශීය වෛද්‍ය ක්ෂේත්‍රය, ආයුර්වේද වෛද්‍ය ක්ෂේත්‍රය යන මේ ක්ෂේත්‍ර සියල්ල රැක ගන්නට ඕනෑ; ආරක්ෂා කරන්නට ඕනෑ; ඒ වාගේම ඒවා ප්‍රවර්ධනය කරන්නට ඕනෑ. ඒ කාර්යභාරය ඉෂ්ට කිරීම උදෙසාත්, අප විශ්වාස කරන ඒ වෙන් වෙන් වූ අණ පනත් නිර්මාණය කිරීම සඳහාත් රජයේ අවධානය, ඇමතිවරයාගේ අවධානය යොමු වේවා කියා ප්‍රාර්ථනා කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සමන්ප්‍රිය හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.55]

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු මධුර විතානගේ මන්ත්‍රීතුමාට තිබෙන කාලයත් මට ගන්න කිව්වා.

අද දිනයේ ඉදිරිපත් කර තිබෙන ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒ වාගේම ගරු සිසිර ජයකොඩි රාජ්‍ය ඇමතිතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා, මේ අමාත්‍ය ධුරය භාරගත් දවසේ ඉඳන් නිර්මාණශීලීව මේ අමාත්‍යාංශයේ කටයුතු ඉස්සරහට ගෙන යන්න උත්සාහ කිරීම සම්බන්ධයෙන්.

"ආයුර්වේදය" කියන වචනය අපට එන්නේ ඉන්දියාවෙන්. හෙළ වෙදකම සහ පාරම්පරික වෙදකම කියන්නේ අපට ආවේණික වූ වෙදකම. අද බොහෝ දෙනෙක් කරුණු පටලගෙන තාක්ෂණයත් එක්ක මේ වෙදකම සංසන්දනය කරන්න යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගමේ අදටත් තාක්ෂණය තිබෙනවා. මා හිතන විධියට, සුද්දෝ අමුඩ ගහද්දී තමයි අපට ඒ තාක්ෂණය ලැබුණේ. හැබැයි, ඒ වන විට සුද්දෝ අමුඩ ගහලාත් නැහැ. ඒ අය හෙලුවෙන් හිටපු කාලයේ ඉඳලාම තමයි ඒ තාක්ෂණය අපට තිබුණේ. නමුත්, අපි වෙනත් රටක - පිටරැටියන්ගේ - තාක්ෂණයක් ගැන කථා කරනවා. ඒ වාගේම ආයුර්වේදය, හෙළ වෙදකම සහ පාරම්පරික වෙදකම කියන ක්ෂේත්‍ර තුනත් පටලගෙන කථා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම උදාහරණයක් කියන්නම්. ඉස්සර, අපේ ගමේ හිටියා වෙද මහත්තයා. වෙද මහත්තයාට නීති රාමුවක් තිබුණේ නැහැ. එදා අපට වෙද මහත්තයා හඳුනා ගන්න අනන්‍යතාවක් තිබුණා. අපේ මුත්තාත් වෙද මහත්තයෙක්. ඒ නිසා මම ඒ ගැන දන්නවා. කොණ්ඩය ගැට ගැසීම තමයි වෙද මහත්තුරුන්ට තිබිච්ච ආවේණික එකම ලක්ෂණය. කොණ්ඩය ගැට ගහලා, ඒකට පනාව ගහනවා. ඒක තමයි වෙද මහත්තයාගේ ආවේණික ලක්ෂණය. "වෙද මහත්තයා" කියනවාට -ඒ නම කියනවාට - අද ඉන්න ආයුර්වේද දොස්තර මහත්තුරු කවුරුවත් කැමැති නැහැ. අද "doctor" කියලා තමයි ඔවුන්ටත් කථා කරන්න ඕනෑ. "Doctor" කියන වචනයත් අපට ආවේණික වචනයක් නොවෙයි. අපි වෙනස් වෙන්න ඕනෑ තමයි. නමුත්, ඒ වෙනස් වීම අපේ අනන්‍යතාව රැකෙන පරිදි සිදු කරමින් ඉදිරියට යන්න ඕනෑ බව මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉස්සර අපේ ගෙදර හිටපු අත්තා, කිරිඅම්මා දෙදෙනාම වෙද්දු. මොකද, තමන්ගේ දුවගේ හෝ පුතාගේ දරුවා අඬද්දී, රත කල්කය දෙන්න ඕනෑ කාලය ඇවිල්ලා කියලා ගෙදර ඉන්න අත්තාත් දැනගෙන හිටියා; කිරි

අම්මාත් දැනගෙන හිටියා. ඒ අය ඒකට බෙහෙතකුත් නිර්දේශ කළා. හැදුණේ බඩේ අමාරුවක් නම්, ඒ බඩේ අමාරුවට දෙන්න ඕනෑ අහවල් ගහේ පොත්ත කියලා කිව්වා. ඒක තමයි ඒ බෙහෙත. දරුවන් අඬද්දී දන්නවා, අහවල් කාලයට රත කල්කය දෙන්න ඕනෑ කියලා. ඒක නිර්දේශ කරන්නේ වෙද මහත්තයා නොවෙයි, ගෙදර ඉන්න අත්තා සහ කිරි අම්මා. ඒ තරම්ම තාක්ෂණික ඥානයක් අපට තිබුණා. ඒ හින්දා වෙනත් රටවල තාක්ෂණික ඥානයන් අපට අවශ්‍ය වෙන්නේ නැහැ. අත්තා සහ කිරිඅම්මා තමයි අපේ ගෙදර හිටපු හොඳම වෙද්දු. ඒ දෙදෙනා තමයි අපට, අපේ දරුවන්ට ඒ අවශ්‍ය උපදෙස් ටික ලබා දුන්නේ.

ඒ නිසා හෙළ වෙදකම ආරක්ෂා කර ගැනීමේදී අද අපට විශාල අභියෝගයක් තිබෙන බව මම සිහිපත් කරන්න ඕනෑ. ඒ අභියෝගය තමයි, හොරුන්ගෙන් මෙය ආරක්ෂා කර ගැනීම. මොකද, හෙළ වෙදකම ඉතාම ලාභයට විකුණන්න පුළුවන්. පාරම්පරික වෙදකම ඉතාම ලාභයට අද විකිණෙනවා. සමහර වෙලාවට එය පොළේ විකිණෙනවා. තවත් සමහර වෙලාවට නව්‍යකරණය වෙලා වෙන ගොඩනැඟිල්ලක ඒක විකිණෙනවා. ඉතින්, අපේ ගරු රාජ්‍ය ඇමතිතුමා මෙයින් බලාපොරොත්තු වෙන්නේ "කොමසාරිස්" තනතුරෙන් එහා ගිහිල්ලා "කොමසාරිස් ජනරාල්වරයෙක්" පත් කරලා, ඒ බලය විමධ්‍යගත කරලා ඒ කරුණු කාරණා නතර කරන්න අවශ්‍ය නීති සැදීමයි. අපි මෙතැනදී ඉතාම සියුම්ව විග්‍රහ කර ගන්න ඕනෑ තැන් තිබෙනවා.

විශේෂයෙන්ම අපේ හෙළ වෙදකම බුද්ධදාස රජතුමාගේ කාලයේ පටන් පැවත ආ බව අපි අහලා තිබෙනවා. එදා සතුන්ට පවා වෙදකම් කළා. සර්පයන්ට පවා වෙදකම් කළා. ඒ වෙදකම ඒ තරම් දියුණුයි. ඒ වාගේම එදා ශල්‍යකර්ම කළා. අපි දන්නවා, අනුරාධපුරයේ එවැනි ශල්‍යාගාරයක් තිබුණා කියන කාරණය. අද අපට තිබෙන ශල්‍ය උපකරණවලට එහා ගිය තාක්ෂණික උපකරණ අදටත් ඒ භූමියෙන් හමු වෙනවා. ඒ තරම් තාක්ෂණයක් එදා අප සතුව තිබුණා. ඒ නිසා තාක්ෂණය නැහැ කියලා අපට කියන්න බැහැ. අපට තාක්ෂණය තිබුණා. අපේ තාක්ෂණික ඥානය හොරා ගත්තා. එංගලන්තයට නැව් පිටින් අරන් ගිය පුස්කොළ පොත්වල තිබුණේ මෙන්න මේ පාරම්පරික තාක්ෂණික ඥානය. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒවා නැවත ලංකාවට ගෙන්වා ගන්න ඔබතුමාට කැබිනට් අමාත්‍යතුමා එක්ක එකතු වෙලා ලොකු වැඩ පිළිවෙළක් කරන්න සිද්ධ වෙයි. ඒ වාගේම එදා කට වහරින් ගෙනා බෙහෙත් තිබුණා. ඒවා කට වහරෙන් ආවේ. සමහර ඒවා තිබුණා, රහස් බෙහෙත්. නමුත්, ඒවා දුන්නේ නැහැ. මොකක්ද හේතුව? ඒවා දුන්නේ නැත්තේ, ඒ හරහා ලොකු විනාශයක් කරන්න පුළුවන්කම තිබුණ නිසා. ඒ නිසා ඒ වෙදකම දුන්නේ තමන්ගේ පරම්පරාවේ කෙනෙකුට විතරයි. මොකද, තව මනුෂ්‍යයෙකුට විනාශයක් කරන්න එය යොදා ගන්න පුළුවන්කම තිබුණා. යන්ත්‍ර මන්ත්‍ර, ගුරුකම් වගේ දේවල්. ඒ දේවල් රෝග සුවපත් කිරීම සඳහා යොදා ගත් බවත් අපි දන්නවා. ඒ වාගේම සර්පයෙක් කාලා ඒ සම්බන්ධව ආවා නම්, දූත ලක්ෂණ අනුව අහවල් වෙලාවට කැවේ අහවල් සතාය කියන්න පුළුවන් තරමේ තාක්ෂණික ඥානයක් අපට තිබුණු බව අපි දන්නවා. ඒ තාක්ෂණික ඥානය තමයි අපි සොයන්න ඕනෑ. නමුත් අපි කරන්නේ කොහේවත්, කාගේවත් තිබෙන තාක්ෂණික ඥානයක් ගැන කථා කරන එකයි.

අද බලන්න, අපි ගන්නා ආහාර පිළිබඳව. අපි කන්නේ මොනවාද? ගරු රාජිත සේනාරත්න හිටපු සෞඛ්‍ය ඇමතිතුමා සභාවේ ඉන්නවා. ඒ වාගේම අපේ වර්තමාන සෞඛ්‍ය ඇමති ගරු කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමාත් ඉන්නවා. අද මඟුල් ගෙදරකට ගියොත් අපි සම්පූර්ණයෙන් කන්නේ වහ. නමුත් එදා අපේ ආහාර වට්ටෝරුව සැකසිලා තිබුණේ මෙන්න මේ දේශීය වෛද්‍ය ක්‍රමයට අනුවයි; හෙළ වෙදකමට අනුවයි. අපි ගත්ත ආහාර ටික පවා අපි ගත්තේ විද්‍යානුකූලව. අද බලන්නකෝ, මඟුල් ගෙදරකට ගියාම අපි තනිකර කන්නේ වහ නේ. අජිනොමොටෝ නැමැති රසකාරකය දමපු ආහාර තමයි කන්නේ. විශේෂයෙන්ම පාර්ලිමේන්තුව තුළ මේවා සම්බන්ධයෙන් නීති ගෙනෙන්න සිද්ධ වෙලා තිබෙනවා කියා මම කියනවා. මේ තිබෙන ආහාර වට්ටෝරු වෙනස් කරන්න පවා නීති ගෙනෙන්න අපට සිද්ධ වෙයි. අපි දන්නවා, අද මළ ගෙවල්වලට වැඩි වශයෙන් යන්නේ දේශපාලනඥයෝ නේ. මළ ගෙවල් වැඩිම සංඛ්‍යාවක යන්නේ දේශපාලනඥයා. ඒ යන හැම මළ ගෙයක්ම බැලුවොත්, ඒ පිළිකා රෝගය නිසා මිය ගිය කෙනෙකුගේ මරණයක්, එහෙම නැත්නම් වකුගඩු රෝගය නිසා මිය ගිය කෙනෙකුගේ මරණයක්. අපට තිබුණා, දේශීය ආහාර. මෙන්න මේ හෙළ වෙදකමත් එක්ක තමයි ඒ ආහාර බැඳිලා තිබුණේ. අපේ හැම දෙයක්ම මේ හෙළ වෙදකමත් එක්ක බැඳුණු දෙයක්. ඒ නිසා තාක්ෂණික ඥානය ගැන අපට කාගෙන්වත් අහගන්න අවශ්‍යත් නැහැ. ඒ තාක්ෂණික ඥානය අපි සොයා ගෙන යෑම තමයි කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඒකත් මේ අවස්ථාවේ මා සිහිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කටයුතු සඳහා ඒකාබද්ධ වැඩ පිළිවෙළක් අවශ්‍යයි. ගරු සිසිර ජයකොඩි මැතිතුමනි, ඔබතුමා පාර්ලිමේන්තුවේ ඉඳගෙන මේ දේවල් අහගෙන ඇති කියලා මා හිතනවා. මේ සඳහා ඒකාබද්ධ වැඩ පිළිවෙළක් සකස් වෙන්න ඕනෑ. අධ්‍යාපන අමාත්‍යාංශය, කෘෂිකර්ම අමාත්‍යාංශය, දේශීය වෛද්‍ය අමාත්‍යාංශය එකතු වුණු ඒකාබද්ධ වැඩ පිළිවෙළක් අද අවශ්‍යයි. අද පාසල් යන දරුවෙක් අඩුම ගණනේ නිදිකුම්බා පැළය ගැන දන්නවාද? එහෙම දෙයක් ඔවුන් දන්නේ නැහැ. අපට තිබෙන දේශීය පැළෑටිවල අගය අද පාසල් යන දරුවෙක් දන්නවාද? ඒවා ගැන දන්නේ නැහැ. ඒ නිසා අමාත්‍යාංශ මැදිහත් වෙච්ච ඒකාබද්ධ වැඩ පිළිවෙළක් මේ සඳහා අපට අවශ්‍යයි. ඒ වැඩ පිළිවෙළ ඔබතුමා නිර්මාණය කරන්න. අපි ඒකට සහයෝගය දෙන්නම්.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, අද අපට උණක්, හෙම්බිරිස්සාවක් හැදුණු ගමන්ම අපි යන්නේ MBBS දොස්තර මහත්තයා හමු වෙන්න. නමුත් අපි ඉස්සර එහෙම ගියේ නැහැ. අපි දන්නවා, අපි හැමෝම අද රෝගීන් බවට පත් වෙලා ඉවරයි කියන එක. මේ කථා කරන මා ද ඇතුළුව මෙතැන ඉන්න අපි හැම දෙනාම මොකක් හරි රෝගයකින් පෙළෙනවා. හැබැයි, සිංහල වෛද්‍ය විද්‍යාවේ වා පිත් සෙම් කියන තුනට විතරයි බෙහෙත් කළේ. මම මේ බෙහෙත් දෙන්න යනවා නොවෙයි. නමුත් එහෙම සරල වුණාට සංකීර්ණ වෛද්‍ය ක්‍රමයක් අපට තිබුණා. ඒක ආරක්ෂා කර ගැනීම සඳහා අපට වැඩ පිළිවෙළක් අවශ්‍යයි. මේ අණ පනත් ක්‍රියාත්මක කිරීමේදී,- විශේෂයෙන්ම පනත් කෙටුම්පත් ගෙන ඒමේදී - ඒ සඳහා වැඩ පිළිවෙළක් අවශ්‍යයි.

අපි ඒ කාටවත් තාක්ෂණය මුසු කරන්න අවශ්‍ය නැහැ. තාක්ෂණය තිබුණා. ඒ තාක්ෂණය තවමත් ගමේ තිබෙනවා. ඉතාම දක්ෂ වෛද්‍යවරු ගමේ ඉන්නවා. අපි දන්නවා, ඉස්සර වෙද කුල තිබුණු බව. විශේෂයෙන්ම කෙරමිණියේ වෙදකම අපි අහලා තිබෙනවා. ඇවරිවත්තේ වෙදකම, ඒ වාගේම පාදුක්ක උඩුමුල්ලේ වෙදකම ගැන අපි අහලා තිබෙනවා. ඒ වාගේ වෙද කුල තිබුණා. මේ නීති දැම්ම නිසාම අද යම් යම් දේවල් අපට අහිමි වුණාදෝ කියලාත් මට හිතෙනවා. නීති රීති දැම්ම තුළම, නීති ක්‍රියාත්මක කිරීමට යෑම තුළම අද විශාල හොරු, ජාවාරම්කරුවන් පිරිසක් බිහිවෙලා තිබෙනවාදෝ කියලා මට හැඟෙනවා. ගරු සිසිර ජයකොඩි රාජ්‍ය අමාත්‍යතුමනි, මම කලින් කිව්වා වාගේ පාසල් ළමුන් මුල් කරගත් වැඩ පිළිවෙළක් ඔබතුමා නිර්මාණය කරන්න. නිදිකුම්බා ගහේ ඉඳලා අපේ රටේ තිබෙන ඔසු පැළෑටි හඳුනා ගැනීමේ වැඩ පිළිවෙළක් මේ අමාත්‍යාංශ ටික එක්කහු වෙලා නිර්මාණය කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ

[ගරු සමන්ප්‍රිය හේරත් මහතා]

වාගේම, ඇත්තටම මේ ඖෂධ පිට රටින් ගෙනෙන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ළමයින්ට තමන්ගේ ගෙවත්තේ මේ ඖෂධ වගා කරන්න කියලා ආයුර්වේද දෙපාර්තමේන්තුව මැදිහත් වෙලා හැම ඉස්කෝලයකම ඒ ඖෂධ මිලදී ගැනීමේ මධ්‍යස්ථාන විවෘත කළා නම්, මේ ළමයි ඒකට හුරුවෙයි. අඩුම ගණනේ තමන්ගේ ගෙදර ඒ ඖෂධ ටික වගා කරලා, ඒවා මිලදී ගැනීමේ මධ්‍යස්ථානයට ගෙනැල්ලා දෙන ඒ හුරුව ඇති කළා නම්, අපට කොහෙන්වත් අලුතින් ඖෂධ ආනයනය කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ වැඩ පිළිවෙළ අප තුළම තිබෙනවා. තිබෙන ප්‍රශ්නය තමයි අපි ඒකට අවශ්‍ය මැදිහත්වීම කරන්නේ නැති එක. අපි තනි තනිවම මේ දේවල් කථා කළාට ඒවා සිද්ධ වෙන්නේ නැහැ කියන කාරණයත් මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕනෑ.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඉස්සරත් ගංජා පාවිච්චි කළා. හැම ව්‍යංජනයකටම ගංජා දැම්මා. දුම් උරන්න විතරක් නොවෙයි මේ ගංජා පාවිච්චි කළේ. ව්‍යංජන සඳහා අපි ගංජා පාවිච්චි කළා. ඒකෙන් අපට ප්‍රතිශක්තිකරණයක් ඇති වුණා, මා දන්නා හැටියට සහ අහලා තිබෙන විධියට. ඉතිහාසයේ ඉඳලා අපි මේවා දුම් උරන්න විතරක් නොවෙයි පාවිච්චි කළේ. සුද්දෝ මේ රටට ඇවිල්ලා ඉස්සරවෙලාම අපේ වැව් සංස්කෘතියට ගැහුවා. ඒ වාගේම, අපේ හෙළ වෙදකමට ගැහුවා. අපේ තිබුණු පුස්කොළ පොත් ටික අරගෙන ගියා. මේක කලාවත් එක්ක පෝෂණය වෙච්ච වෙදකමක්. විශේෂයෙන්ම හැම පුස්කොළ පොතකම ඕනෑම බෙහෙතක් හඳුන්වලා තිබෙන්නේ ශ්ලෝකවලින්. ඇත්තටම මේ වෙදකම තුළ කලාවත් තිබෙනවා. අපේ කලාවත්, මේ වෙදකමත් - හෙළ වෙදකමත්, දේශීය වෙදකමත්- නිර්මාණය වෙන්නේ එකට. ඒක ආරක්ෂා කරගන්න නම් ව්‍යවස්ථාදායකය හැටියට අපේ දායකත්වය ලබා දීලා, ලොකු වැඩ කොටසක් ඉෂ්ට සිද්ධ කරන්න අපට ලොකු කැපකිරීමක් කරන්න වෙයි කියලා මේ අවස්ථාවේ මා මතක් කරනවා.

මට මතක හැටියට දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්වා, මේ (සංශෝධන) පනත් කෙටුම්පත දේශීය වෙදකමටයි, හෙළ වෙදකමටයි බලපානවා කියලා. මේ පනත් කෙටුම්පතේ 46 වන වගන්තියට ගෙනෙන්නට යෝජිත සංශෝධනයේ තිබෙනවා, " 'ආයුර්වේද' යන්නට, ආයුර්වේද, සිද්ධ, යුනානි සහ දේශීය චිකිත්සා වෛද්‍යකර්ම සහ ශල්‍යකර්මය ද වෙනත් යම් ආසියාතික රටවලට ආවේණික හා ඒ අදාළ රටවල රජයන් විසින් පිළිගත් වෙනත් යම් වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම ද ඇතුළත් වේ" කියලා. මම හිතන විධියට දේශීය වෙදකම සහ හෙළ වෙදකම ඇත්තටම මේකට ඇතුළත් වෙලා නැහැ. ඒකට කිසිම බලපෑමක් නැහැ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මට මතක හැටියට ඊට අදාළ වෙන්නේ 67 වන වගන්තිය නේද? මේ සංශෝධනයේ දී ඒ වගන්තියට අතවත් තියලා නැහැ. ගරු රාජ්‍ය ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් ලොකු අවධානයක් යොමු කරලා තිබෙනවා කියලා මම හිතනවා.

ඔසු උයන් ගැනත් මම කියන්නම්. පත්වුණු සෑම ඇමතිවරයකුම ඔසු උයන් හැදුවා; ලොකුවට නමත් ගහගත්තා. හැබැයි, ඒ ඔසු උයන්වල වර්තමාන තත්ත්වය කොහොමද කියලා සොයා බැලුවොත් වඩාත් හොඳයි කියා මා හිතනවා. ඒකයි මම කිව්වේ, මේකට හොඳ නිර්මාණශීලි වැඩ පිළිවෙළක් අවශ්‍යයි කියලා. එහෙම නැතිව මේ අහවල් ඔසු උයන අපි හැදුවා කියලා එක එක්කෙනාගේ නම් ගහගෙන ගස් ටිකක් හිටෙව්වාට වැඩක් නැහැ. ඒ ගස් ටික ආපසු කැලේට යනවා. එහෙම නොවෙයි. අනාගත පරපුරට තමයි මේ සඳහා උනන්දුව ඇති කරන්න ඕනෑ. අපේ හෙළ වෙදකම සහ දේශීය වෙදකම ගැන අපේ පාසල් දරුවන්ට කියලා දෙන්න ඕනෑ. ඒක කරන්න ලේසියි. එතකොට අර ගමේ ඉන්න වෙද මහත්මයාට "doctor" කියලා ආමන්ත්‍රණය කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. අපේ අනන්‍යතාව තමයි වෙද මහත්තයා කියන එක. ඒ නාමයෙන් තමයි අපි ඔවුන් හඳුන්වන්න ඕනෑ. මම හිතන විධියට අද සිටින ආයුර්වේද වෛද්‍යවරු කැමැති නැහැ, වෙද මහත්තයා, වෙද නෝනා කියලා ඔවුන් හඳුන්වනවාට.

එය ශෝචනීය තත්ත්වයක්. එවැනි කාරණා නිසා අපේ අනන්‍යතාව ආරක්ෂා වෙන්නේ නැති බවත් සිහිපත් කරන්න ඕනෑ. අද අපට තිබෙන ලොකුම ගැටලුව තමයි, අපටම අනන්‍ය වූ, අපටම ආවේණික වූ, හෙළ වෙදකම සහ පාරම්පරික වෙදකම පැත්තකට දාලා, අපට අනන්‍ය නොවූ දෙයක් පසුපස දිවීම. අපේ වෙදකමේදී අවශ්‍ය වුණොත් ශල්‍යකර්ම කළේ රෝගය නිට්ටාවටම සුව වෙන්නයි. ඇත්තටම අපේ ඖෂධ ගැනීමෙන් අතුරු ප්‍රතිඵල ලැබුණේ නැහැ. නමුත්, අද එහෙම නොවෙයි. අපි දන්නවා, අද බෙහෙත් පෙත්තක් බිව්වොත් ඒකේ අතුරු ප්‍රතිඵල තිබෙන බව. දියවැඩියාවට බෙහෙත් බිව්වොත් අනිවාර්යයෙන්ම වකුගඩු දෙකම නරක් වෙනවා. එහෙම නැත්නම් cancer ඇති වෙනවා. ඒකට වෙනත් දේවලුත් බලපාන්න පුළුවන්. නමුත් මම කියන්නේ, අපි මෙන්න මේ කාරණා ටික හරියාකාරව කළමනාකරණය කළ යුතු බවයි. අපේ සමස්ත ජාතියම අද ලෙඩ්ඩු බවට පත් වෙලා ඉවරයි. ඒකෙන් ගොඩ ගන්න නම්, අපේ පැරණි හෙළ වෙදකම සහ පාරම්පරික වෙදකම තුළින් ප්‍රතිකාර ලබා දෙන්න ඕනෑ. ආයුර්වේදය කියන්නේ, අපට ඉන්දියාවෙන් දායාද වෙච්ච දෙයක්. නමුත්, අපට ආයෙත් ඉන්දියාවේ සරණ පතන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ සඳහා අපට තිබෙන්නේ අපේ අනන්‍යතා හොයා ගන්නයි. අපේ ගම්වල වෙද මහත්වරුන්ගේ නිවෙස්වල තවමත් වැඩක් නොගත්, වෙදකම ගැන ලියැවුණු පුස්කොළ පොත් තිබෙනවා. ඇත්තෙන්ම ඒ පුස්කොළ පොත්වල පිළිකා - cancer - රෝගයට අවශ්‍ය බෙහෙත් තිබෙනවා. ඒකට ශල්‍යකර්ම කරන්න අවශ්‍ය නැහැ. අපට තිබෙන ප්‍රශ්නය තමයි, දේශීය වෙදකම තුළින් රෝගයට අවශ්‍ය ප්‍රතිකාර ලබා නොදීම. අද ගොඩනැඟිලා තිබෙන්නේ ඖෂධ මාෆියාවක්.

අපි දන්නවා, හෙට ඉඳන් සෞඛ්‍ය ඇමතිතුමාට එරෙහිව විශ්වාස භංග යෝජනාවක් විවාද වෙන බව. මේක, මාෆියාවක්. නමුත් අපේ වෙදකමේ තිබුණේ නැහැ, මාෆියාවක්. දේශීය වෙදකමේ, හෙළ වෙදකමේ ඒ දේවල් තිබුණේ නැහැ. ගරු සිසිර ජයකොඩි මැතිතුමනි, අපට තිබුණු ඒ අනන්‍යතාව ආරක්ෂා කර ගැනීම සඳහා දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යවරයා විධියට ඔබතුමා අද ලොකු උත්සාහයක් අරගෙන තිබෙනවා. අපි එය අගය කරනවා. අපි මේ පනත් කෙටුම්පතට සහයෝගය දෙනවා. මෙතැනින් එහාට ගිහිල්ලා මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය හා කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ එක්කහු වෙලා ඒකාබද්ධ වැඩ පිළිවෙළක් හදන්න කියලාත් මේ වෙලාවේ මා සිහිපත් කරනවා. අඩුම ගණනේ බෙහෙත් පැළෑටියක වටිනාකමවත් අපේ දරුවන්ට කියලා දෙන වැඩ පිළිවෙළක් සකස් කරන්න. ඒ සඳහා පෙළ පොත්වලට මේ කාරණා ඇතුළත් කරන්න ඕනෑ. ඒ සඳහා ගරු අධ්‍යාපන ඇමතිතුමා එක්ක ඔබතුමා කථා කරන්න. කථා කරලා, දරුවන් දැනගන්න ඕනෑ සීමිත කරුණු ටිකවත් ඔවුන්ට දැනගන්න අවස්ථාව ලබා දෙන්න කියන ඉල්ලීම මම කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු තාරක බාලසූරිය රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.11]

**ගරු තාරක බාලසූරිය මහතා (විදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தாரக்க பாலசூரிய - வெளிநாட்டலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Tharaka Balasuriya - State Minister of Foreign Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 1961 අංක 31 දරන ආයුර්වේද පනත සංශෝධනය කිරීම පිළිබඳව මගේ අදහස් ඉදිරිපත් කරන්න මට විනාඩි 8ක වාගේ කාලයක් හෝ වෙන් කිරීම පිළිබඳව මම ප්‍රථමයෙන්ම ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

අද මෙම විවාදයේදී නොයෙක් අදහස් ඉදිරිපත් වුණා. නමුත් අපි දන්නවා, මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ කංසා නීතිගත කිරීමක් සඳහා නොවන බව. විශේෂයෙන්ම ආයුර්වේද වෛද්‍යවරුන්ට බෙහෙත් සඳහා කංසා අවශ්‍ය වෙනවා. පනත් කෙටුම්පතේ ඒ තාක්ෂණ කාරණා තිබුණත්, ඒ තාක්ෂණ කාරණා ගැන අද මේ විවාදයේදී හුඟදෙනෙක් කථා කළේ නැහැ. විශේෂයෙන්ම අද කථා කළේ කංසා වගාව නීතිගත කිරීමක් ගැන.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු සමන්ප්‍රිය හේරත් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (සෞඛ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல - சுகாதார அமைச்சர்)
(The Hon. Keheliya Rambukwella - Minister of Health)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු සමන්ප්‍රිය හේරත් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු මංජුලා දිසානායක මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சமன்பிரிய ஹேரத் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. (MRS.) MANJULA DISSANAYAKE left the Chair, and THE HON. SAMANPRIYA HERATH took the Chair.*

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියමින් සිටියේ වෙද මහත්වරුන්ට බෙහෙත් වට්ටෝරුවලට පාවිච්චි කරන්න හොඳ කංසා ලබා ගැනීමේ හැකියාවක් නැති බව. ඒ අයට හම්බ වෙන්නේ, පොලීසියෙන් අල්ලා ගත්ත, එහෙම නැත්නම් තහනම් කරපු කංසා. ඇත්ත වශයෙන්ම මේ පනත් කෙටුම්පත හොඳයි. වෙද මහත්වරුන්ගේ වෛද්‍ය ක්‍රම ශක්තිමත් කරන්න මෙම පනත් කෙටුම්පතින් කටයුතු කර තිබෙනවා. මම රූපවාහිනියෙන් දැක්කා, මේ පනත් කෙටුම්පත පිළිබඳව සියලු ආයුර්වේද වෙද මහතුන් කැමැත්ත ප්‍රකාශ කරලා තිබෙන බව. හැබැයි, මේ පනත් කෙටුම්පතින් මොකක් හෝ හානියක් ඉදිරියේදී වෙන්න පුළුවන් යැයි සිතෙනවා නම්, අපි ඒ ගැනත් සැලකිලිමත් වෙන්න ඕනෑ කියලා මම හිතනවා.

රටවල් විශාල ප්‍රමාණයක දැනට කංසා භාවිතය නීතිගත කර තිබෙනවා. කැනඩාව, ජෝර්ජියාව, මෝල්ටාව, මෙක්සිකෝව, දකුණු අප්‍රිකාව, තායිලන්තය, උරුගුවේ වැනි රටවල කංසා නීතිගත කර තිබෙනවා. ඒ රටවල් ඉස්සෙල්ලාම කොහොමද කංසා භාවිතය නීතිගත කළේ? ඇමෙරිකාවේ එක එක ප්‍රාන්තවල මේවා ඉස්සෙල්ලාම නීතිගත කළේ for medical use කියලා. ඒ කියන්නේ, වෛද්‍ය ප්‍රතිකාර සඳහා පාවිච්චි කරන්න පුළුවන් කියලා තමයි මේවා ඉස්සෙල්ලාම නීතිගත කළේ. හැබැයි ටික කාලයක් යනකොට මේවා recreational use වශයෙන් සහ තමන්ගේ කැමැත්තට පාවිච්චි කරන්න පුළුවන් කියා ඒ නීති වෙනස් වෙලා තිබෙනවා. මම දකින අන්දමට කංසා භාවිතය නීතිගත කරනවාද, නැද්ද කියන එක ගැන මේ පනත් කෙටුම්පතෙන් ඔබ්බට ගිහිල්ලා අපි තීන්දුවක් ගන්න ඕනෑ. අපි කංසා වවන්න පටන් ගත්තොත් මොකක්ද වෙන්නේ? Garment factoriesවලින් reject කරන ඇඳුම් ලංකාවේ සමහර කඩවල විකුණනවා වාගේ - stock lot sales දානවා වාගේ - කංසා වවන්න පටන් ගත්තොත් ඒකෙන් යම්කිසි ප්‍රමාණයක් ලංකාවේ market එකට දැම්මොත්, අපේ තරුණ පිරිස මේවා බොන්න පුරුදු වෙනවා.

අපි දන්නවා, කංසාවල chemicals දෙකක් තිබෙන බව. කංසාවල THC කියන chemical එකයි, CBD කියන chemical එකයි තිබෙනවා. THC කියන chemical එක තමයි මත්වෙන්න පාවිච්චි කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ලංකාවේ තිබෙන කංසාවල ඒක ඉතා අඩු ප්‍රමාණයක් තිබෙන්නේ. ඒ වාගේම CBD කියන chemical එක තමයි බෙහෙත්වලට පාවිච්චි කරන්නේ. එක්දහස්නවසිය හැත්තෑ ගණන්වල කංසා පාවිච්චි කරනකොට ඒ කංසාවල THC එක සියයට 3ක, සියයට 4ක වාගේ ප්‍රමාණයක් තමයි තිබුණේ. ඒ කාලයේ මේ THC ප්‍රමාණය සියයට 3ක්, 4ක් තිබුණාට, දැන් වවන කංසාවල එම ප්‍රමාණය සියයට 30කට, 40කට පමණ වැඩි වෙලා තිබෙනවා. හුඟක් වෙලාවට ඒවා Hydroponics කියන ක්‍රමය පාවිච්චි කරලා ware-housesවල, net housesවල තමයි වවන්නේ. ලංකාවේ තිබෙන කංසාවල THC ප්‍රමාණය අඩු නම් අපේ තරුණයෝ ඒවා පාවිච්චියට ගන්නේ නැහැ. ඒවා පාවිච්චියට ගන්නේ නැත්නම් මොකක්ද කරන්නේ? එතකොට, වැඩියෙන් මත්වෙන්න බොහෝදුරට ෆෝමලින් වාගේ දේවල් දාලා තමයි කංසා විකුණන්නේ. මේක සමහර වෙලාවට ගැටලුවක් වෙන්න පුළුවන් කියා මා හිතනවා. හැබැයි, මම මේක දකින්නේ රටේ මුදල් පැත්තෙන්.

අපි දන්නවා, තායිලන්තය වාගේ රටවල් කංසා භාවිතය සම්පූර්ණයෙන්ම නීතිගත කළ බව. කංසා භාවිතය නීතිගත කිරීම හරහා ගිය අවුරුද්දේ -2022දී- ඇමෙරිකානු ඩොලර් මිලියන 800ක ආදායමක් තායිලන්තයට හොයාගන්න පුළුවන් වුණා. ඒ වාගේම, 2030 අවුරුද්ද වෙනකොට මේ ආදායම සියයට දොළොස් ගුණයකින් වැඩි වෙනවා කියලා තමයි අද වන විට වාර්තා වෙලා තිබෙන්නේ. කංසා වගාව නීතිගත කිරීමෙන් අපි බලාපොරොත්තු වෙන දේ සම්පූර්ණයෙන්ම ඉෂ්ට නොවන නිසා අපි තීන්දුවක් ගන්න ඕනෑ, මේක නීතිගත කරනවාද, නැද්ද කියලා. කංසා භාවිතය නීතිගත කරනවා නම් හොඳයි කියන එක තමයි මම නම් විශ්වාස කරන්නේ.

අපි දැක්කා, ඇම්ස්ටර්ඩෑම් වාගේ නගරවලත්, තායිලන්තයේ බොහෝ නගරවලත් කංසා භාවිතය හරහා සංචාරක ක්ෂේත්‍රයෙන් විශාල මුදල් ප්‍රමාණයක් හොයාගන්න පුළුවන් වෙලා තිබෙන බව. අපි කියමුකෝ, මේවා ආයුර්වේද ප්‍රතිකාරවලට වැව්වා කියලා. ආයුර්වේද ප්‍රතිකාරවලට වවපු කංසා බලන්න මේ රටට සංචාරකයෝ එන්නේ නැහැ. එහෙම නම් ඒ සංචාරකයෝ එන්නේ කංසා බොන්න. ඒ නිසා මේ සඳහා සංචාරක පැති ක්‍රමයක් - zonal

[ගරු තාරක බාලසූරිය මහතා]

ක්‍රමයක් - හරි තිබෙන්න ඕනෑ. නැතුව නිකම් බොරුවට මේ ගැන කථා කරලා වැඩක් නැහැ. අන්තිමට මේ වචන කංසා ටික එළියට දාලා ඒවාට තව මොනවා හරි මිශ්‍ර කරලා දරුවන්ට දෙනවා නම් ඒකෙන් රටට ප්‍රගතියක් අත් වෙන්නේ නැහැ.

ඒ වාගේම අපි පිළිගන්න ඕනෑ කාරණාවක් තිබෙනවා. ඇමෙරිකාවේ කැලිෆෝනියාව, කොලරාඩෝ වාගේ ප්‍රාන්තවල තමයි ඉස්සර වෙලාම කංසා නීතිගත කළේ. ඉන් පසුව ඇත්ත වශයෙන්ම ඒ තරුණ තරුණියන්ගේ කංසා පාවිච්චිය වැඩි වෙලා තිබෙනවා. ඒක සියයට 17කින්, 20කින් පමණ වැඩි වෙලා තිබෙනවා. සමහර අය කියනවා, කංසා පාවිච්චි කරනකොට අපේ ප්‍රතිශක්තිකරණය වැඩි වෙනවා, anxietyවලට, පිළිකාවලට හොඳයි කියලා. නමුත් මම එහෙම දෙයක් දන්නේ නැහැ. මම වෛද්‍යවරයෙක් නොවෙයි. ඇත්ත වශයෙන්ම ඒකෙන් හොඳක් වෙනවාද, නරකක් වෙනවාද කියන කාරණය සම්බන්ධයෙන් සත්‍ය වාර්තා - conclusive evidence - තිබෙනවාද කියලා මම දන්නේ නැහැ. කංසා පාවිච්චි කිරීම cancerවලට හොඳ නැහැ කියලා තමයි හුඟක් වෙලාවට කියන්නේ. ඒවාත් අපි අනිවාර්යයෙන්ම සැලකිල්ලට ගන්න ඕනෑ. ඒ වාගේම ඒවා දීර්ඝ කාලීන වශයෙන් පාවිච්චියෙන් සමාජයට මොකක්ද වෙන්නේ කියලා තවම කවුරුවත් අධ්‍යයනය කරලා නැහැ. කැලිෆෝනියාවේත් අවුරුදු 7, 8කට ඉස්සර වෙලා තමයි එය නීතිගත කළේ. ඒ නිසා social fabric එකට මොකක්ද වෙන්නේ කියලා තවම අපි කවුරුවත් දන්නේ නැහැ. හොඳක් වෙනවාද, නරකක් වෙනවාද, කම්මැළි වෙනවාද, මොනවා වෙනවාද කියලා හරියටම දන්නේ නැහැ. ඒ නිසා ඒ පිළිබඳව අපි ප්‍රවේශමෙන් කටයුතු කරන්න ඕනෑ. අපට මේ දෙස එක එක කෝණවලින් බලන්න පුළුවන්. නමුත් මොන කෝණයෙන්ද බලන්නේ කියලා සැලකිල්ලට ගන්න ඕනෑ. මම මේ ප්‍රශ්නය දිහා බලන්නේ ආර්ථික පැත්තෙන්. රටේ තත්ත්වය බලලා අතිරේක ආදායම් මාර්ගයක් සකස් කර ගන්න අවශ්‍යතාවක් තිබෙනවා නම්, -ආසියාවේ එක රටයි කංසා නීතිගත කරලා තිබෙන්නේ- වෙනත් පනතක් මඟින් සංචාරක කලාපවලත් මේක නීතිගත කළොත්, සංචාරක කර්මාන්තය දියුණු කර ගන්න පුළුවන් වෙයි. නමුත් මේ පනත් කෙටුම්පතෙන් එහෙම නීතියක් ඉදිරිපත් වන්නේ නැහැ. ආයුර්වේද වෙද මහත්වරුන්ට අවශ්‍ය කංසා ප්‍රමාණය ආයුර්වේද දෙපාර්තමේන්තුව හරහා ලබා ගන්න හැකියාවක් ඇති කරන එක තමයි මේ පනත් කෙටුම්පතෙන් මූලිකව සිදු වෙන්නේ. කෙසේ වෙතත්, අපේ සිසිර ජයකොඩි රාජ්‍ය ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ආයුර්වේද ක්‍රමවලට අලුත් ජීවයක් ලබා දෙන්න එතුමා මහන්සි වෙලා තිබෙනවා. එතුමාට සුබ පතමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.21]

**ගරු මංජුලා දිසානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க)
(The Hon.(Mrs.) Manjula Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව බොහොම ස්තුතියි.

ආයුර්වේද පනත් කෙටුම්පත සංශෝධනය කරන මේ මොහොතේ ඒ පිළිබඳ අදහස් කිහිපයක් එකතු කරන්න අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. දිවංගත මගේ ආදරණීය ස්වාමිපුරුෂයා අවුරුදු 25ක් පමණ මේ පාර්ලිමේන්තුව නියෝජනය කළා. එතුමා එදා දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යවරයා විධියට කටයුතු කරද්දී 1961 සම්මත වෙච්ච ආයුර්වේද පනත සංශෝධනය කිරීම සඳහා ඉතා විශාල වෙහෙසක් දැරුවා. මමත් ඒ සාකච්ඡාවලට සම්බන්ධ වෙලා තිබෙනවා. 1961 ඉඳලා දැන් අවුරුදු 60කටත් වැඩි කාලයක් ගත වෙලා ආයුර්වේද පනත සංශෝධනය කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. විෂය භාර අමාත්‍යවරයා විධියට කෙහෙළිය රඹුක්වැල්ල අමාත්‍යතුමාත්, දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යවරයා විධියට කටයුතු කරන අපේ සිසිර ජයකොඩි මැතිතුමාත් මේ ගත්ත උත්සාහයට මම ස්තුතිවන්ත වෙනවා. මෙතෙක් වේලා කථා කළ සියලුදෙනාම කිව්වා වාගේම එදා අපේ සංස්කෘතිය රැක්කේ, ඒ වාගේම අපේ ජනතාව නිරෝගීව ජීවත් කෙරෙව්වේ, අපේ පාරම්පරික වෛද්‍යවරු.

ඒ වාගේම තමයි අපේ හෙළ වෙදකම. බලි, තරු, රාවණ, පුලතිසි වාගේ ආදී මුතුන් මිත්තන්ගෙන් පැවත ගෙන ආ දේශීය වෙදකම, හෙළ වෙදකම මේ දක්වා ආරක්ෂා කරමින් පැමිණි අපේ දේශීය වෛද්‍යවරුන්, හෙළ වෛද්‍යවරුන් ඇතුළු වෙදකම් කරපු සියලුදෙනා මම මේ අවස්ථාවේදී ඉතා ගෞරවයෙන් සිහිපත් කරනවා. ඔවුන් මේ රට තුළ ක්‍රියාත්මක කරපු ඒ වෛද්‍ය ක්‍රමයේ වටිනාකම අපට පසුගිය කොරෝනා වසංගත කාලයේ බොහොම තදින් දැනුණා. බටහිර වෛද්‍ය ක්‍රමය මොන තරම් ශක්තිමත් වුණත්, ඒ වෙලාවේ මේ රටේ විතරක් නොව සමස්ත ලෝකවාසී ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කර ගන්න හෙළ වෙදකම තුළින් අපට හැකියාව ලැබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කොරෝනා කාලය කියන්නේ අපේ හෙළ වෙදකමේ වටිනාකම බොහොම තදින් දැනුණු කාලයක්. එදා මෙදා තුර අපේ රටේ ස්ථාපිත වෙලා තිබුණු වෙදකමයි හෙදකමයි දෙකම එකට එකතු කරගත් දේශීය වෛද්‍ය ක්‍රමය ආරක්ෂා කරගෙන ඉදිරියට පවත්වාගෙන යන්න මේ ගන්නා උත්සාහය අපි ඉතා අගය කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු මංජුලා දිසානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க)
(The Hon.(Mrs.) Manjula Dissanayake)
විනාඩි 5ක් තුළ මේ කරුණු කාරණා කථා කරන්නේ කොහොමද කියලා හිතා ගන්න අමාරුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ හෙළ වෛද්‍යවරු, දේශීය වෛද්‍යවරු, සිද්ධ, යුනානි, හෝමියෝපති වෛද්‍යවරු සහ අපේ රටේ කට වචනයෙන් ගෙදරක ඉඳලා අත් බෙහෙත් කරන, වෙදකම් කරන සියලුදෙනා මේ වෙදකම පවත්වාගෙන ආවා. විශේෂයෙන්ම මම මේක අවස්ථාවක් කර ගන්නවා, බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහල, ජාතික ආයුර්වේද ශික්ෂණ රෝහල බවට පත් කිරීම ගැන සතුට ප්‍රකාශ කරන්න. ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත ගැන සාකච්ඡා කරන අද දවසේ ඒ හා සම්බන්ධ සියලු කටයුතු ශක්තිමත්ව, ඉදිරියට ගෙන යන්නට හැකියාව ලැබෙන පරිදි මෙයට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන්න අපි සියලුදෙනාම බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මෙය අවස්ථාවක් කර ගන්නවා, මා ජීවත්වන වයඹ පළාතේ පිහිටා තිබෙන කුරුණෑගල ආයුර්වේද රෝහල පිළිබඳව වචනයක් කථා කරන්න. එය

ප්‍රදේශවාසී සියලුදෙනාගේම ගෞරවාදරයට පාත්‍ර වුණු රෝහලක්. ඒ රෝහලේ පෞද්ගලිකව ප්‍රතිකාර ලබන්න පුළුවන් විධියට ගෙවන වාට්ටු හදලා තිබෙනවා. ඒ වාගේම භික්ෂු වාට්ටුවක් හදලා තිබෙනවා. කොරෝනා වසංගත කාලයේ බටහිර වෛද්‍ය ප්‍රතිකාර කරන රෝහල්වල රෝගීන් මිය යද්දී ඒ ආයුර්වේද රෝහලේ එකම කොරෝනා රෝගියෙකුවත් මිය ගියේ නැහැ. එවැනි තත්ත්වයකට ඒ රෝහල පත් කරලා තිබෙනවා. ඒ රෝගීන් රැකබලා ගන්නට දේශීය වෛද්‍යවරු ඇතුළු කණ්ඩායම දිවා රෑ වෙහෙස මහන්සිවෙලා කටයුතු කළා. අපේ ප්‍රදේශයේ ජනතාවට ඒ ආකාරයේ සේවාවක් ලබා දීම පිළිබඳව ඔවුන්ට ස්තුති වන්ත වෙනවා.

ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කරන්නට වෙහෙස මහන්සි වෙන, ආයුර්වේද කොමසාරිස්තුමා ඇතුළු සියලුදෙනාට ගෞරවය පුද කරන ගමන්ම ඔබතුමන්ලාට මේ කාර්යය තව තවත් ශක්තිමත්ව ඉදිරියට කරගෙන යන්නට හැකියාව ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬවෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජිත සේනාරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.27]

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව විවාද කරන අවස්ථාවේ දේශීය වෛද්‍ය අමාත්‍යවරයා ලෙස කටයුතු කළ කෙනෙකු හැටියට මට කථා කරන්නට අවස්ථාවක් ලැබීම ගැන සන්තෝෂ වෙනවා.

තමුන්නාන්සේලා ඇතුළු අපි ඔක්කෝම දන්නවා, ආයුර්වේදය කියන්නේ අපේ ඉතිහාසය බව. අපේ ඉතිහාසය අවුරුදු දහස් ගණනකට දේශීය වෛද්‍ය විද්‍යාවෙන් තමයි ආරක්ෂා කර ගත්තේ. 17වැනි ශත වර්ෂයේ තමයි පළමුවැනි ඕලන්ද රාජකීය ශල්‍ය වෛද්‍යවරයා ලංකාවට ආවේ. ඒ ඔවුන්ගේ හමුදා භටයන්ගේ සෞඛ්‍ය තත්ත්වය බලා ගන්න. ඇත්තටම බටහිර වෛද්‍ය විද්‍යාව සංස්ථාපනය වුණේ 1848දී පමණ. ලෝකයේ පළමුවෙන්ම ආයුර්වේද රෝහලක් අපේ රටේ තමයි හදලා තිබුණේ. එහි සුවිශේෂ තත්ත්වයක් තිබුණා. ඒ රෝහලේ හැම රෝගියෙක් වෙනුවෙන්ම හෙදියක් හිටියා. අදටත් ලෝකයේ දියුණු රටවලත් රෝහල්වලට එක රෝගියෙක් වෙනුවෙන් එක හෙදියක් දෙන්නට බැරි වෙලා තිබෙනවා.

ඒ වාගේම තමයි, එදා අපි පාවිච්චි කරපු ශල්‍ය උපකරණ. මහාචාර්ය අලුවිහාරේ මැතිතුමා මට ශල්‍ය වෛද්‍ය විද්‍යාව උගන්වපු එක ආචාර්යවරයෙක්. මම College of Surgeons එකට ගිය වෙලාවේ ඒ උපකරණ කට්ටලයේ duplicate එකක් ඔහු මට තෑගි කළා. ඒකේ සඳහන් කරලා තිබෙනවා, "Royal College of Surgeons of England" කියලා. ඒකේ සහතික කරලා තිබෙනවා, ඒ ශල්‍ය උපකරණවල ක්‍රියාකාරිත්වය අද තිබෙන ශල්‍ය උපකරණවලට වඩා බොහොම සංවේදියි, තියුණුයි කියලා. ඒ වාගේ විශාල, දියුණු වෛද්‍ය විද්‍යාවක් අපට තිබුණා. එය කොච්චරක්ද කියතොත්, මැදිරිගිරිය, පොළොන්නරුව වාගේ ස්ථානවල තිබෙන පැරණි සංඝාවාසවල පවා රෝහල් වෙනම තිබුණා. මොකද, ඒ සංඝාවාසවල සංඝයා වහන්සේලා විශාල සංඛ්‍යාවක් වැඩ සිටියා. ඒ නිසා තමයි ලංකාවේ රජවරුන්ගේ මාළිගා පොඩියට හදලා ආගමික සිද්ධස්ථාන -බෞද්ධ සිද්ධස්ථාන- විශාල වශයෙන් ගොඩනැඟුවේ. ඒ වාගේම අපි අමතක කරන්න නරකයි, පණ්ඩුකාභය රජතුමා, සේන රජතුමා, බුද්ධදාස රජතුමා සහ ධාතුසේන රජතුමා. මේ අය වෛද්‍යවරු. ඒ අයට රජකමයි වෙදකමයි දෙකම තිබුණා. බුද්ධදාස රජතුමා ශල්‍ය වෛද්‍යවරයකු හැටියට ක්‍රියා කළා. ඒ විතරක් නොව පශු ශල්‍ය වෛද්‍යවරයෙකු හැටියටත් ක්‍රියා කළා.

සතුන්ගේ රෝගවලට පවා ප්‍රතිකාර කළා. ඒ විධියට දේශීය වෛද්‍ය ක්‍රමය රැක ගෙන ඇවිල්ලා තිබෙනවා. 1926දී බ්‍රිතාන්‍ය රජය පවා මේ දේශීය වෛද්‍ය විද්‍යාව පිළිබඳව අධ්‍යයනයක් කළා. අධ්‍යයනය කරලා මේ වෛද්‍ය ක්‍රම ගැන සෙවීමට කමිටුවක් පත් කළා. මොකද, මේ වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම ඉතාම උසස් තලයක තිබුණු හින්දා. ඒ අනුව, ඒ පිළිබඳව උනන්දුවක් දක්වපු අය පුහුණු කිරීමට රෝහලක් හා විද්‍යාලයක් හැදුවා. ඒක තමයි 1929දී බොරැල්ල කොටා පාරේ දේශීය වෛද්‍ය විද්‍යාලය කියලා ආරම්භ වුණේ. එහි පළමුවැනි වෛද්‍යවරයා විධියට වෛද්‍ය පනික්කාර් මහතා ඉන්දියාවෙන් ආවා. ඒ වාගේම ආචාර්යවරු දෙදෙනෙක් හිටියා. ඒ අයත් ආවේ ඉන්දියාවෙන්.

මේ පිළිබඳව පළමු ආඥාපනත ගෙනාවේ ශ්‍රීමත් එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා 1941දී සෞඛ්‍ය ඇමතිවරයා හැටියට කටයුතු කරන විට. දේශීය වෛද්‍ය ආඥාපනත නමින් එතුමා නිවැරදිව එම ආඥාපනත ගෙනාවා. 1961දී ගෙනාපු පනතෙන් තමයි මෙය ආයුර්වේද පනත හැටියට වෙනස් වුණේ. ඇත්තටම කියනවා නම් අපේ දේශීය වෛද්‍ය විද්‍යාවට ඉන්දියාවෙන් ආපු ආයුර්වේදයත් එකතු වෙලා තමයි මේ "ආයුර්වේදය" කියන තත්ත්වයට පත් වුණේ. 1961දී ගෙනාපු පනත තමයි මම හිතන විධියට අද මේ සංශෝධනයට ලක් කරන්නේ. 1977දී අපේ රටේ පළමුවැනි දේශීය වෛද්‍ය විද්‍යාලය සංස්ථාපනය කරලා, 1982 වෙනකොට ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ ආණ්ඩුව යටතේ එය පළමුවරට විශ්වවිද්‍යාල තත්ත්වයකට පත් වෙනවා, විශ්වවිද්‍යාලයට අනුබද්ධ කරපු වෛද්‍ය පීඨයක් විධියට පත් කරලා. එයින් ආයුර්වේද, යුනානි, සිද්ධ උපාධිධාරී වෛද්‍යවරු බිහි කළා. 1979දී සිද්ධ උපාධිය ලබා දීම යාපනය විශ්වවිද්‍යාලයට පැවරුවා. මේ විධියට තමයි මේ කටයුතු සිද්ධ වුණේ. මේ වෛද්‍ය විද්‍යාව ප්‍රචලිත කිරීම සඳහා එවකට පැවති රජය යටතේ, වි.ජ.මු. ලොකුබණ්ඩාර මැතිතුමාත් ඉතාම විශාල සේවයක් කළා.

ඒ වාගේම මම තව කාරණයක් කියන්න ඕනෑ. මේ දේශීය වෛද්‍ය විද්‍යාව ඒ විධියටම තියා ගෙන හරියන්නේ නැහැ. අපි ඉන්නේ බොහොම දියුණු, නවීන, ඩිජිටල් තාක්ෂණයක් තිබෙන ලෝකයක. අපි ඉන්නේ ගෝලීය ගම්මානයක. ගෝලීයකරණයත් එක්ක අපේ රට දැන් ගමක් විතරයි. අපි කැමැති වුණා හෝ අකැමැති වුණා හෝ ලෝකය ගෝලීයකරණය වෙලා ඉවරයි. ඒක හොඳ දෙයක්. ඒ නිසා අපි ලෝකයත් එක්ක ගමන් කරන්න ඕනෑ. ලෝකයත් සමඟ ගමන් නොකරන කිසිම දෙයක් රඳා පවතින්නේ නැහැ. ඒක මතක තියා ගන්න. ඒක තමයි ස්වභාව ධර්මයේ මූලිකම අංගය. ඒ නිසා මේ අණපනත් ගෙනෙන කොටත්, ක්‍රියා කිරීමේදීත් ඒ ගැන අවධානය යොමු කරන්න ඕනෑ.

මගේ කාලයේ මම පුළුවන් තරම් උත්සාහ කළේ බටහිර වෛද්‍ය ක්‍රමයේ තත්ත්වයට දේශීය වෛද්‍ය ක්‍රමයත් ගෙනෙන්නයි. එදා මම මේ විෂය භාර ඇමති හැටියට එනකොට මේ ක්ෂේත්‍රයේ වෛද්‍ය උපාධිය ලත් 700කට, 800කට වැඩි ප්‍රමාණයක් රැකියා විරහිතව හිටියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රැකියා විරහිත වෛද්‍ය උපාධිධාරින් ඉන්න කොට ඒ

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

වෛද්‍ය ක්‍රමය ගැන ඇති වන පිළිගැනීම මොකක්ද? මම කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා වරම් ගත්තා ඒ සියලු උපාධිධාරීන්ට - 950 දෙනෙකුට- රැකියා ලබා දෙන්න. නමුත්, නොයෙකුත්, නොයෙකුත් තැන්වලට ගිහිල්ලා, පෞද්ගලික අංශයට ගිහිල්ලා ඒ පිරිසෙන් ඉතිරි වෙලා හිටියේ හයසිය ගණනක් විතරයි. ඒ හයසිය ගණනටම රැකියා ලබා දුන්නා.

ඊට පස්සේ මට ඕනෑ වුණේ බටහිර වෛද්‍යවරයාට තිබෙන තත්ත්වය ඔවුන්ටත් ලබා දෙන්නයි. එම නිසා බටහිර වෛද්‍යවරුන්ට දෙන ආකාරයටම වැටුප් තල ඔවුන්ටත් ලබා දුන්නා. ඒ වාගේම තීරුබදු රහිත වාහන බලපත්‍ර දුන්නා, පෞද්ගලික වෛද්‍ය සේවය ලබා දුන්නා. මේ සියලු දේවල් දීලා ඒ අයත්, බටහිර වෛද්‍යවරයාගේ මට්ටමට ගෙනාවා. මොකද, අපි කියනවා නම් දේශීය වෛද්‍ය ක්‍රමය මෙච්චර හොඳයි, ඒ ක්‍රමය ගොඩනඟන්න ඕනෑ, මේක තමයි අපේ වෛද්‍ය ක්‍රමය කියලා, එහෙම නම් තවත් වෛද්‍ය ක්‍රමයක් ඊට වඩා ඉහළින් තිබෙන්න විධියක් නැහැ නේ. අපිත් ඉගෙන ගත්තේ බටහිර වෛද්‍ය විද්‍යාව තමයි. නමුත් අපි දැනගන්න ඕනෑ, කවදාවත් එකම වෛද්‍ය විද්‍යාවකින් මේ ලෝකයේ තිබෙන රෝග නිවාරණය කරන්න බැහැ කියලා. ලෝකයේ තිබෙන සියලු වෛද්‍ය විද්‍යාව -ඒ ඒ රටවල්වලට ආවේණික වූ වෛද්‍ය විද්‍යාව - එකට සංකලනය කරලා, හැම රෝගයක්ම නිවාරණය කර ගන්න පුළුවන් වන ආකාරයට අපි මේ දේවල් ලෑස්ති කර ගන්න ඕනෑ.

මේ සම්බන්ධ අණපනත් ගෙනෙන කොට වාගේම, පසුගිය කාලයේ අපි ගත් හැම ක්‍රියා මාර්ගයක්ම ගත්තේ මෙය නවීන වෛද්‍ය විද්‍යාවක් බවට පත් කිරීමටයි. අපි පර්යේෂණ රෝහල් හැදුවා. ඒ වාගේම පර්යේෂණ කළා. මම පර්යේෂණ ග්‍රන්ථ 107ක් විතර නිකුත් කළා, පාරම්පරික වෛද්‍යවරුන්ගේ කටයුතුවලට අදාළ. මහාචාර්ය රණවීර මහතා එදා මට හුඟක් උදව් කළා. නාවින්න පර්යේෂණ ආයතනය ගොඩනඟලා එහි පර්යේෂණ කළා. පර්යේෂණ 107ක් විතර කරලා ඒ ගොල්ලන්ට සහතිකත් පිරිනැමුවා.

ඒ වාගේම අපි ජාත්‍යන්තර සම්මන්ත්‍රණයක් පැවැත්වුවා. ඒ සම්මන්ත්‍රණයට රටවල් 68කින් ආචාර්යවරු, මහාචාර්යවරු 140 ගණනක් ආවා. ඒ සමහර රටවල මේ ක්‍රමය තිබෙනවාද කියලා අපි දන්නෙවත් නැහැ. මියන්මාරයේ වෙනම තිබෙනවා, සෞදි අරාබියේ වෙනම තිබෙනවා, කොරියාවේ වෙනම තිබෙනවා. ඒ ඔක්කොම රටවලින් කැඳවලා සංකලනය කරලා පැවැත්වූ සාකච්ඡා ශ්‍රව්‍ය දෘශ්‍ය - audio-visual - ක්‍රමයට හැමෝටම අහගන්න සැලැස්වුවා, ඉංග්‍රීසි භාෂාවෙන් සහ සිංහල භාෂාවෙන්. යාපනයෙන් ආපු සිද්ධ වෛද්‍යවරු, වෙද මහත්වරු -ඒ ඔක්කෝම- සංකලනය කරමින් තමයි ඒ සාකච්ඡා මණ්ඩප අපි ඇති කළේ.

අපේ විපක්ෂ නායකතුමා කිව්වා වාගේම එකම පනතකින් මේ ඔක්කොම කරන්න බැහැ. බටහිර වෛද්‍ය විද්‍යාවේ වාගේ මේ දේශීය වෛද්‍ය විද්‍යාවේදීත් ඖෂධ නියාමනය සම්බන්ධයෙන් වෙනම පනතක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම දෙපාර්තමේන්තු හරහා කරන වැඩ පිළිවෙළට වෙනම පනතක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම වෛද්‍ය සභාවට වෙනම පනතක් තිබෙන්න ඕනෑ. පෞද්ගලික රෝහල් ආවරණය කරන්න වෙනම පනතක් තිබෙන්න ඕනෑ. අනෙක, මම එදාත් බලාපොරොත්තු වුණේ, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වාගේම ආයුර්වේද දෙපාර්තමේන්තුවේත් අධ්‍යක්ෂ ජනරාල් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු ඇති කරන්නයි. නමුත්, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ඉන්න සියලුදෙනා ආණ්ඩුවේ SLAS අය. ඒ කියන්නේ, අපේ පරිපාලන ශ්‍රේණියේ අය. ඒ අය ඒක කරනවාට බොහොම විරුද්ධයි. මොකද, එතකොට ඔවුන්ගේ තනතුරු තමයි නැති වෙන්නේ. නමුත්, අධ්‍යක්ෂ ජනරාල් සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු ඇති කළොත්, අපට පුළුවන් අපේ දේශීය වෛද්‍යවරුන් -උපාධිධාරී වෛද්‍යවරුන් සහ අනෙකුත් වෛද්‍යවරුන්- ඒ තනතුරුවලට පත් කරලා ඉදිරියට ඉතා හොඳ වෛද්‍ය විද්‍යාවක් විධියට මෙය ගොඩනැඟීමේ කාර්යභාරය ඒ අයට භාර දෙන්න. ඒ නිසා අපේ යෝජනාවලත් අපි ඉදිරිපත් කරනවා, "කොමසාරිස්" කියන ධුරය ඉවත් කරලා, "අධ්‍යක්ෂ" සහ "අධ්‍යක්ෂ ජනරාල්" කියන ධුර ඇති කරන්න කියලා.

ඒ වාගේම යෝජනා කර තිබෙනවා, ආයුර්වේද ජාතික රෝහල කියන එක ජාතික ආයුර්වේද රෝහල ලෙස නම් කරන්න කියලා. සාමාන්‍යයෙන් ලෝක සම්මතය අනුව, ජාතික දෙයක් තිබෙනවා නම් "ජාතික" කියන වචනය තමයි ඉස්සරහට එන්න ඕනෑ. මේ සියලු කාරණා එක්ක නූතන යුගයට සරිලන විධියට අපේ මේ වෛද්‍ය විද්‍යාව ගොඩනැඟීමේ කාර්යභාරය තමයි අප කළ යුතුව තිබෙන්නේ.

මේ ගරු සභාවේ සාකච්ඡා වුණා, දේශීය වෛද්‍ය විද්‍යාවේ ශල්‍යකර්ම පිළිබඳවත්. මම හිතන හැටියට, මේ ස්ථානයේ තිබෙන රාජ්‍ය නිලධාරීන්ගේ මැදිරියේ අද ඉන්නවා ඇති, Dr. Nazar කියන ආයුර්වේද වෛද්‍යවරයා. එතුමා ශල්‍යකර්ම කරනවා. වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා ඇහුවා, එහිදී නිර්වින්දනයට පාවිච්චි කරන්නේ ඉංග්‍රීසි බෙහෙත් නේද? කියලා. නැහැ, ඉංග්‍රීසි බෙහෙත් නොවෙයි. දේශීය ඖෂධ පාවිච්චි කරලා නිර්වින්දනය කරලා ශල්‍යකර්ම කරනවා. අපි දන්නවා, චීන කටු චිකිත්සාව මඟිනුත් ශල්‍යකර්ම කරනවා, නිර්වින්දය කරන්නේ නැතිව. මම ඒ වෛද්‍යතුමා චීනයටත් යැව්වා, ඒවා ඉගෙන ගන්න.

අනෙක, දේශීය වෛද්‍ය විද්‍යාවේ තිබෙන රහස් වට්ටෝරු ගැනත් අද කථා වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් කිව්වා, රහස් වට්ටෝරුවල ප්‍රශ්නය. එතැන තමයි ලොකුම ප්‍රශ්නය තිබෙන්නේ. බටහිර වෛද්‍ය විද්‍යාවේ යම් ඖෂධයක් අද සොයා ගත්තා නම්, අදම එය ලෝකයට නිරාවරණ කරනවා. නූතන යුගයේ නම් අඩු ගානේ ඒකට patent අගයක් ලැබෙනවා. ඒ කාලයේ patent අගයක් නැති වුණත් ඔවුන් ඒ දේවල් කළා. ඒ නිසා ඒ සොයා ගත්ත හැම දෙයක්ම වෛද්‍ය විද්‍යාවේ ප්‍රගමනය සඳහා බලපවත්වා තිබෙනවා. අපේ සිංහල වෛද්‍යවරු කරන්නේ මොකක්ද? ඒ අය ඒවා තියාගෙන ඉන්නවා. අන්තිමට ඒ ගොල්ලන්ට පපුවේ අමාරුවක් - heart attack එකක් - හැදිලා මිය ගිය දවසට ඔක්කොම ඉවරයි. එතකොට ඒකෙන් ලෝකයට ඇති වැඩක් නැහැ. ලංකාවේ ඉතාම හොඳ ඖෂධ තිබෙනවා. නමුත්, රහස්‍යභාවය ආරක්ෂා කරන්නට යැමෙන් තමයි බොහෝ ඖෂධ ලංකාවේ නැති වෙලා තිබෙන්නේ. ඒ රහස් තමන්ගේ දරුවාට දෙන්න කියලා තබාගෙන ඉන්නවා. අන්තිමට තමන්ගේ දරුවාට වාගේම කාටවත් ඒක නැති වෙනවා. මම ඇමතිවරයා වශයෙන් සිටිනකොට ප්‍රසිද්ධ පාරම්පරික වෛද්‍යවරු සියලුදෙනා ගෙන්වලා කිව්වා, ඔබලාගේ තිබෙන පුස්කොළ පොත් ඔක්කොම මට දෙන්න, ජනාධිපතිතුමා ලවා හෝ ඒ පුස්කොළ පොත්වලට ඕනෑම ගෙවීම් ප්‍රමාණයක් හෝ සහතික පත්‍ර ලබා දෙන්නම්, ඒ ටික අපට දෙන්න කියලා.

ඒ ටික අරගෙන ඒ අනුව තමයි අපි නාවින්නේ ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකය හැදුවේ. එහි ඉන්න තරුණ වෛද්‍යවරුන්ට ඒවා ඉගෙන ගන්න නූතන සිංහල භාෂාවෙන් අපි ඒ වට්ටෝරු ඔක්කොම ඉදිරිපත් කළා. එහෙම කළාම තමයි වෛද්‍ය විද්‍යාව පුළුල් වෙන්නේ. එක එක්කෙනාගේ සොයා ගැනීම්වලින් තමයි වෛද්‍ය

විද්‍යාව ඉදිරියට ගමන් කරන්නේ. අද තිබෙන නූතන වෛද්‍ය විද්‍යාවත් එහෙමයි. අපේ කාලයේ වෛද්‍යවරුන් හැටියට අපි ඉගෙන ගත්තු සමහර දේවල් ඉවත් වෙලා, දැන් අලුත් වෛද්‍ය ක්‍රම ඇවිල්ලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කංසා වගාව ගැනත් මම කියන්න ඕනෑ. කංසා සහ අබිං කියන්නේ දේශීය වෛද්‍ය විද්‍යාවේ එක අංගයක්. මම සෞඛ්‍ය ඇමති ධුරයට පත් වූ වෙලාවේ ලංකාවේ අබිං තිබුණේ නැහැ. ඒ නිසා සමහර ඖෂධ හදා ගන්න බැරි වුණා. ඉන්දියානු රජයට, ඉන්දියානු සෞඛ්‍ය ඇමතිවරයාට කථා කරලා බොහොම අමාරුවෙන් තමයි ඉන්දියාවේ ඉඳලා අබිං ගෙනාවේ. මොකද, ඉන්දියාවත් අබිං පිට රට යැවීම තහනම් කර තිබුණා.

ඒ වාගේම තමයි කංසා වගාව. දැන් කියනවා, කංසා කියන්නේ මත් වෙන්න උරන ද්‍රව්‍යයක් හින්දා කංසා වගා කරන්න එපා කියලා. නමුත් කංසා කියන්නේ හොඳ ඖෂධයක්. ඒ ඖෂධයෙන් ලබා ගන්නා තෙල තමයි වටින්නේ. ඒ තෙල්වලින් මුදල් කෝටිප්‍රකෝටි ගණනින් හම්බ කරන්න අපේ රටට පුළුවන්. නමුත් ඒ සම්බන්ධයෙන් කාලයක් තිස්සේ ඉඳන් විශාල විවාදයක් තිබෙනවා. මමත් ඒ කටයුත්ත කරන්න උත්සාහ කළත් ඒක කරන්න බැරි වුණා. දැන් මොකද වෙමින් තිබෙන්නේ? අපේ කංසාවලට තිබෙන ඉල්ලුම අඩු වෙමින් යනවා. අපේ ඒ market එක දැන් අඩු වෙමින් යනවා. මම ඒ කාලයේ යෝජනා කළා, හමුදාව ලවා අක්කර 1,000ක විතර කංසා වගා කරලා, ආදායම් උපයාගත යුතුයි කියලා. මොකද, බටහිර යුරෝපය දැන් සොයාගෙන තිබෙනවා, මානසික ආතතිය සමනය කරන්න පාවිච්චි කරන antidepressants සහ tranquilizers කියන ඖෂධ හදන්න තිබෙන හොඳම සංඝටකය කංසා බව. කංසා තමයි ඒ වෙනුවෙන් පාවිච්චි කරන්නේ. ඒ සඳහා වන සැපයුම් කිරීමේ අවස්ථාව තමයි තායිලන්තය ගත්තේ. අපි ප්‍රමාද වුණා. අපි ප්‍රමාද වුණු හින්දා ඒ අවස්ථාව අපට නැති වෙමින් යනවා. අපි දැන් කංසා වගා කරන්න හැදුවත් ඒ සඳහා අපට තිබෙන වෙළෙඳ පොළ දැන් නැති වෙලා යමින් තිබෙන්නේ. අපි සීනි හදනවා. ඒ වාගේම අපි සීනි පාවිච්චි කරනවා. සීනිවලින් ඇල්කොහොල් හදනවා. ඇල්කොහොල් හදනවා කියලා අපි සීනි හදන එක නවත්වන්නේ නැහැ නේ. ඉතින්, කංසා ඖෂධයක් හැටියට පාවිච්චි කරන්න බැරි ඇයි? ඒවා පිට රටවලට යවා ආදායම් උපයන්න අපට පුළුවන්. ඒ වාගේම අපේ වෛද්‍ය විද්‍යාවටත් කංසාවලින් ලබා ගන්නා තෙල ඉතා ප්‍රයෝජනවත්. ඉතින් අපි ඒවා ලබා දෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද මේ පනත් කෙටුම්පතට සංශෝධන ගණනාවක් ඉදිරිපත් කරනවා. ඒවා පිළිබඳව සාධනීය විධියට හිතන්න, ඒවා හොඳද නරකද යන්න හොඳින් කල්පනා කර බලන්න කියාත්, ඒවා දේශපාලන කෝණවලින් මනින්න එපා කියාත් මා ඉල්ලා සිටිනවා. පසුගිය ටිකේම ගරු විපක්ෂ නායකතුමා සහ අපි ආයුර්වේද වෛද්‍යවරුන් වාගේම පාරම්පරික වෛද්‍යවරුන් විශාල පිරිසක් හමු වුණා. ඔවුන්ගෙන් ලැබුණු යෝජනා අනුව තමයි ඒ සංශෝධන ඉදිරිපත් කරන්නේ. ඒ සංශෝධන ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (පූජ්‍ය) අතුරලියේ රතන ස්වාමීන් වහන්සේ. ඔබ වහන්සේට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.42]

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනිවර කියවීමේ විවාදයේදී ඒ ගැන අදහස් දක්වන්න මම බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම 1961 දී ඉදිරිපත් කරපු ආයුර්වේද පනත සංශෝධනය කිරීමක් හැටියට තමයි මේ පනත් කෙටුම්පත ගෙනැවිත් තිබෙන්නේ. මේ පනත් කෙටුම්පත පිළිබඳව පාරම්පරික වෛද්‍යවරුන්ගේ දැඩි විවේචනයක් එල්ල වෙලා තිබෙනවා. නමුත් ඒ ගැන කථා කරන්නේ නැතිව ආයුර්වේදය සම්බන්ධයෙන් පොදුවේ සෞඛ්‍යයට අදාළව තිබෙන කාරණා ගැන යම්කිසි අදහස් පළ කිරීමක් කරන්න මා බලාපොරොත්තු වෙනවා.

අපි මුලින්ම "ආයුර්වේදය" කියන වචනය ගනිමු. ඒ සම්බන්ධයෙන් අද විවිධ දේවල් කියනවා. ඒක ඉන්දියාවේ උපන්න එකක්, හින්දු ආගම හා සම්බන්ධ එකක් යනුවෙන් විවිධ අදහස් තිබෙනවා. ඇත්ත වශයෙන්ම ඉන්දියාවේ දැනුම් පද්ධතිය මධ්‍යගත වුණේ විශ්වවිද්‍යාල පහක් නිසා. *[බාධා කිරීම්]* ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා ගරු සභාවට පස්ස හරවාගෙන කරන ඔය කථාව මට බාධාවක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමන්ලාට ඒ බව කියා මේ ගරු සභාව නිශ්ශබ්ද කර දෙන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමන්ලා, කරුණාකර තම තමන්ගේ ආසනවලට යන්න.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු සභාවට පස්ස හරවාගෙන ඉන්න එක ශිෂ්ට නැහැ වාගේම හොඳ නැහැ නේද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මුලින්ම "ආයුර්වේදය" ගැන මගේ අදහස ඉදිරිපත් කරන්න කැමතියි. ආයුර්වේදය සම්බන්ධයෙන් ඉන්දියාව පුරා විසූ ඍෂි මුනිවරයන්ගේ දැනුම මධ්‍යගත කළේ, පර්යේෂණවලට භාජන කළේ බෞද්ධ භික්ෂූන් වහන්සේලායි. නාලන්දා විශ්වවිද්‍යාලය කියන්නේ ඉන්දියාවේ තිබුණු ප්‍රධානම faculty එක. ඇත්ත වශයෙන්ම ඉන්දියාවේ උගත් ගුරුවරුන් අතර රහසිගත ධර්මයක් හැටියට තමයි වෙදකම තිබුණේ. එය මධ්‍යගත වෙලා, සංස්කෘත භාෂාව හරහා විශාල ව්‍යාප්තියකට ලක් වුණේ ඒ හේතුවෙන්.

මම මේ අවස්ථාවේ විශේෂයෙන් "වාග්බට" ගැන කියන්න කැමැතියි. වාග්බට කියන්නේ බෞද්ධ ගුරුවරයෙක්. ඔහු තමයි "අෂ්ඨාංග සංග්‍රහය" ඇතුළු වෛද්‍ය පොත් රාශියක් ලියපු බෞද්ධ ගුරුවරයා. ඔහුගේ ගුරුවරයා තමයි "අවලෝකිත". ඔහුගෙන් පසුව සහ ඔහුට පෙර ආපු "චරක" පවා බෞද්ධ කෙනෙක්. "චරක සංහිතාව" ගත්තත්, "අෂ්ඨාංග සංග්‍රහය" ගත්තත්, ඒ සා විශාල දාර්ශනික වෛද්‍ය පොත් මුළුමනින් නාලන්දා විශ්වවිද්‍යාලය පදනම්ව රචනා වෙච්ච පොත්. නමුත්, අද ඉන්දියාව දැනුවත්වම ඒ සම්බන්ධය - ඒවාට ඇති බෞද්ධයන්ගේ සම්බන්ධය - කඩලා ඒක තනිකර ඉන්දියානු වෙදකමක් හැටියට අරගෙන පැහැදිලි කරනවා. එම වෙදකමට බෞද්ධයන්ගේ ඇති සම්බන්ධය

[ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි]

කියැවෙන උදාහරණයක් ගනිමු. වාග්බටගේ "අෂ්ඨාංග සංග්‍රහය" පටන් ගන්නේ බුදුරජාණන් වහන්සේට නමස්කාර කරලා. ඔහු තමයි එතෙක් පැවැතුණු වෛද්‍ය දැනුම සංවිධිත කළේ. ආයුර්වේද දැනුම ලංකාවට ආවාම ආයුර්වේදය පිළිබඳව අපට අදහසක් තිබුණේ නැහැ. ඒ ආයුර්වේද දැනුම ටිබෙටයට ගියා. මම මේ පනත් කෙටුම්පතට අදාළවයි කියන්නේ. ටිබෙටයට ගිය ආයුර්වේද දැනුම ටිබෙටයේ දැනුමක් හැටියටයි තිබෙන්නේ. මොකද, ආයුර්වේදය ඒ කාලයට, ඒ දේශගුණයට ගැළපෙන පරිදි ටිබෙට්කරණය වෙලා තිබෙනවා. ඒ හේතුවෙන් ඒ නාලන්දා දැනුම පිළිබඳව ඒ රටේ සඳහන් කරන්නේ ආයුර්වේදය කියලා නොවෙයි, ටිබෙට් දැනුම කියලා.

ඒ වාගේම, අපේ හෙළ වෙදකමේ තිබුණු පාරම්පරික දැනුමත්, ආයුර්වේදයෙන් ලැබුණු දැනුමත් ඒකාබද්ධවීමක් අපට දකින්න පුළුවන්. බුද්ධදාස රජ්ජුරුවන්ගේ "සාරාර්ථ සංග්‍රහය" ගත්තත්, ඊට පසු කාලීනව ලියැවුණු පොත් පත් ගත්තත් ආයුර්වේදයේ බලපෑම ඉතා පැහැදිලිව දකින්නට ලැබෙනවා. ඒ වුණත් "සිංහල වෙදකම" කියලා අපේ පාරම්පරික වෙදකමක් තිබුණා. ගරු සිසිර ජයකොඩි රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ දිස්ත්‍රික්කය වන ගම්පහ දිස්ත්‍රික්කය ගත්තොත්, එහි තෙල් බෙහෙත් වර්ග කොයි තරම් නම් තිබෙනවාද කියලා ඔබතුමාම දන්නවා. ලංකාවේ තරම් තෙල් බෙහෙත් තිබෙන, ලංකාවේ තරම් ගෙඩි වෙදකම්වලට බෙහෙත් තිබෙන වෙනත් රටක් නැහැ කියා මා විශ්වාස කරනවා. මේ රටේ තිබෙන තරම් තෙල් බෙහෙත් ඉන්දියාවේවත් නැතිව ඇති.

ඒ ඉන්දියානු ආයුර්වේද දැනුම විශේෂයෙන් චීනය එක්ක හුවමාරු වුණා. ඒ වාගේම ඒ දැනුම අපේ ලංකාවත් එක්ක හුවමාරු වුණා. මෙහේ දැනුම එහේට ගියා; එහේ දැනුම මෙහේට ආවා. ඒ වාගේම අපටම ආවේනික ආයුර්වේද දැනුමක් තිබුණා. අපේ බෙහෙත් වට්ටෝරුවල, චිකිත්සා ක්‍රමවල සම්පූර්ණයෙන් ආයුර්වේද පදනම තිබෙනවා. ඒ වාගේම, අපටම අනන්‍ය වෙච්ච වට්ටෝරු, විධික්‍රම රාශියක් පවතිනවා. ඒවා හඳුනා ගැනීමට තවම ක්‍රමයක් හදලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාරම්පරික ආයුර්වේද වෛද්‍යවරුන්ට දඬුවම් දෙන්න මේ පනත් කෙටුම්පත පාවිච්චි වෙනවා කියලා ආයුර්වේද වෛද්‍යවරුන් තුළ කනස්සල්ලක් තිබෙනවා. මා විශේෂයෙන් කියන්න කැමැතියි, එම කනස්සල්ල මඟ හරවන්න පුළුවන්කම තිබෙන බව. අපි උදාහරණයක් ගනිමු. ගම්පහ දිස්ත්‍රික්කයේ වටද්දර වෙද හාමුදුරුවන් වහන්සේ සතියකට ලෙඩුන් 1,000කට විතර බෙහෙත් කරනවා. උන්වහන්සේට නම් මේ ළඟදී - අවුරුද්දකට විතර කලින් - ලියාපදිංචිය දීලා තිබෙනවා. හැබැයි, ඒ වාගේ තවත් වෙද හාමුදුරුවරු ඉන්නවා; තවත් වෙද මහත්තුරු ඉන්නවා. මේ පනත් කෙටුම්පත සම්මත වුණාට පසුව, ඒ අය නීති විරෝධියි කියලා හිරේ දමනවා නම්, මේ පනත් කෙටුම්පතෙන් කිසිම වැඩක් වෙන්නේ නැහැ. වටද්දර හාමුදුරුවෝ වාගේ ලියාපදිංචි නොවුණු වෙද මහත්තුරු කොච්චර නම් ලංකාවේ ඉන්නවාද? ඒ අය හඳුනා ගෙන ඒ ගොල්ලන්ට අනුමැතිය දෙන්න පුළුවන් සරල ක්‍රමයක් තිබෙන්න ඕනෑ. ඒක තමයි ප්‍රධාන දේ. මම මේ කියන්නේ මගේ අදහස නොවෙයි, දේශීය වෛද්‍යවරුන්ගේ අදහස.

ඊළඟට මම කියන්න ඕනෑ, අමාත්‍යවරයා පත් කරන නියෝජිතයන් පිළිබඳ ප්‍රශ්නය. ඒ පත් කරන අය පිළිබඳ නිර්ණායකයක් තිබෙන්න ඕනෑ, ඒ ගොල්ලන් පාරම්පරික වෛද්‍යවරුන් අතරින් පත් කරනවාද, කොහොමද පත් කරන්නේ යනාදි වශයෙන්. ඒ සඳහා තිබෙන නිර්ණායක මොනවාද කියා සඳහන් කළ යුතුයි. ඒ කියන්නේ, අමාත්‍යවරයා පත් කරන අය පිළිබඳ නිර්ණායකයක් අවශ්‍ය බවයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙදකම, ආයුර්වේදය දියුණු කිරීම සම්බන්ධයෙන් අලුත් ආණ්ඩුවක් යටතේ කටයුතු කළ යුතුයි. මේක ආණ්ඩුවක් නොවෙයි නේ. මේක සංක්‍රාන්තික කාලයක්. දැන් හරියාකාර ආණ්ඩුවක් නැහැ නේ. හොඳ මිනිස්සු විපක්ෂය පැත්තේත් ඉන්නවා; ආණ්ඩුව පැත්තේත් ඉන්නවා. අප දෙගොල්ලන්ම එකතු වෙලා අලුත් ආණ්ඩුවක් හැදිය යුතුයි. දෙපැත්තේම හොඳ මිනිස්සු ඉන්නවා. ඒ වාගේම දෙපැත්තේම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

එහෙම අය දෙපැත්තේම ඉන්නවා. සුපිරි අය මේ පැත්තේත් නැහැ, ඔය පැත්තේත් නැහැ. හැබැයි, හොඳ මිනිසුන්ගේ එකතුවකින් මේ රටේ ගොඩ ගන්න තිබෙන එක ක්ෂේත්‍රයක් තමයි, අපේ වෙදකම. එය දියුණු කිරීම වෙනුවෙන් අපේ අවුරුදු දෙදහස් ගණනක පාරම්පරික දැනුම සහ අපේ අත් දැකීම් පාදක කරගත් විශාල පනතක් ඕනෑ.

"ආයුර්වේදය" කියන්නේ දර්ශනයක්; විධි ක්‍රමයක්; ජීවන ක්‍රමයක්. හෙළ වෙදකමටත් ආවේණික, අනන්‍ය අංග ලක්ෂණ විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ දෙක ඒකාබද්ධවීමක් අවශ්‍යයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මා මෙහිදී විශේෂයෙන් කියන්න කැමැතියි, අපි මේ වෙදකම බ්‍රිතාන්‍යයන්ගේ කාලයේ පටන් ගත්තේ, ආයුර්වේද සභාවක් හැටියට බව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ස්වාමීන් වහන්ස, ඔබවහන්සේට නියමිත කාලය අවසන්.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි හතක් තිබුණා. ඒ කාලය මට අවශ්‍යයි. දීර්ඝ වේලාවක් දී තිබෙන අයගෙන් එය කපා ගන්න. මොකද, විනාඩි පහකදී කථා කරන්න දෙයක් නැහැ නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබවහන්සේට විනාඩි පහයි තිබෙන්නේ.

**ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි**
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
විනාඩි හතක් දීලා තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව කෙටි කරන්නම්.

මම අවසාන වශයෙන් කියන්නේ මෙයයි. විද්‍යෝදය පිරිවෙන පදනම් කරගෙන තමයි ආයුර්වේදය සභාවක් හැටියට මුලින්ම නැඟිට්ටේ. විද්‍යෝදය පිරිවෙන ඇසුරෙහි ආයුර්වේදය ඉගැන්වූවා. අපේ රටට විදේශ ආක්‍රමණ ආවා. චෝළ ආක්‍රමණ සිදු වුණාට පසුව රාජරාජගේ කාලයේ අපේ භික්ෂූන් වහන්සේලා විශාල පිරිසක් සංහාරය කළා.

ඒ කියන්නේ අභයගිරිය, ජේතවනය පදනම් කර ගත්ත විශාල වෛද්‍ය භික්ෂූන් වහන්සේලා ප්‍රමාණයක් හිටියා. අද ගත්තොත් වටඅද්දර පන්සල, කෙරමිණිය, මාලේවෙන පරම්පරාව, දෙනගම

පරම්පරාව ආදී විශාල පාරම්පරික වෙද පරම්පරා රාශියක දැනුම් පද්ධතියක් තිබෙනවා. ඒ නිසා මම කියන්න කැමැතියි, ආයුර්වේද නව පනතක් ලංකාවට අවශ්‍යයි කියලා. විශේෂයෙන්ම ආයුර්වේද වෛද්‍ය විශ්වවිද්‍යාලය, ආයුර්වේද විශ්වවිද්‍යාලයට ගන්නා පදනම අනුව මේ පාරම්පරික වෛද්‍යවරුන්ගේ දැනුමට කිසිම සැලකිල්ලක් නැහැ. කැඩුම් බිඳුම් වෙදකම කියන්නේ ඉන්දියාවේ ආයුර්වේදය නොවෙයි. ඒක ලංකාවට අනන්‍ය වූ එකක්. ඒ වාගේම, උසස් පෙළ විභාගයට සංස්කෘත භාෂාව සමඟ ආයුර්වේදය හඳුන්වා දීම අවශ්‍යයි. ඒ වාගේම බටහිර වෙදකමත්, සිංහල වෙදකමත්, ආයුර්වේද වෙදකමත්, යුනානි ඇතුළු සියල්ලම ඒකාබද්ධ වෙන්න ඕනෑ. ඒක කොරියාව කරලා තිබෙනවා; චීනය කරලා තිබෙනවා. අන්න ඒකෙන් තමයි මේ වෛද්‍ය ක්‍රමය දියුණු වෙන්නේ. විශේෂයෙන්ම නූතන බටහිර වෙදකමේ තාක්ෂණික අංගෝපාංග අපි මේ සඳහා යොදා ගන්නේ කොහොමද කියන එක පිළිබඳ සාකච්ඡාවක් අවශ්‍යයි. විශේෂයෙන්ම හෙළ වෙදකමේ අනන්‍යතාව තහවුරු කරන වෙද සභාවක් නීත්‍යනුකූලව අවශ්‍යයි. ඒ සභාව තහවුරු කරන්න. ඒ සභාවයි, ආයුර්වේද සභාවයි දෙක ඒකාබද්ධ සභාවක් බවට පත් වෙන්න ඕනෑ. ඒක කොයි ආකාරයෙන්ද කරන්නේ කියලා මෙහි නිර්වචනයක් නැහැ. කෙසේ වෙතත්, භික්ෂූන් වහන්සේලා තමයි මේ විශාල කටයුත්තෙහි නිරත වුණේ. අපි භේසජ්ජ මංජුසාව ගත්තොත්, ඒක අසරණසරණ වැලිවිට සරණංකර හාමුදුරුවෝ ලිව්වේ. ඊට පස්සේ අනෝමදස්සී හාමුදුරුවෝ කුරුණෑගල යුගයේදී බෙහෙත් සංග්‍රහ පොත් ලියලා තිබෙනවා. ඒ අනුව භික්ෂූන් වහන්සේලා ඇතුළු බෞද්ධයෝ තමයි ආසියාවේ වෛද්‍ය දැනුම ගොඩනැඟුවේ. ඒ දැනුම අපි හරියට ගන්න ඕනෑ. නාලන්දා විශ්වවිද්‍යාල දැනුම් පද්ධතිය අපි ඉගෙන ගන්න ඕනෑ. ඒ වාගේම, ලංකාවේ මහා විහාරයේ, ජේතවනයේ සහ අභයගිරියේ විශාල වශයෙන් රෝහල් තිබුණා. ඒවා තුළින් වෛද්‍ය විද්‍යාව හදාරලා තිබෙනවා. ඒ දැනුම් පද්ධති තිබෙනවා. ඒ පොත්පත් බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ තිබෙනවා. ඒ ගැනත් අවධානය යොමු කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව අවසාන කරන්න කලින් මේ ගැනත් කියන්න කැමැතියි. අපට විධිමත් ආයුර්වේද පනතක් අවශ්‍යයි. ඒ ආයුර්වේද පනත යටතේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගන්නා පදනම, උසස් පෙළට ආයුර්වේද විෂය හඳුන්වාදීම, සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ආයුර්වේද සහ බටහිර වෙදකම මිශ්‍ර කිරීම, එම වෛද්‍ය ක්‍රම දෙක පිළිබඳ පර්යේෂණ කිරීම, යුනානි සහ සිද්ධ වෙදකම පිළිබඳව හැදෑරීමේ ප්‍රතිපාදන අවශ්‍යයි. සිද්ධ වෙදකම කියලා එකක් තිබුණේ නැහැ. මේ සිද්ධ වෙදකම කියන්නේ මොකක්ද? ඒකත් ඉන්දියාවෙන් ආවේ. ඒක කොහොමද වෙනස් වුණේ? ඒ නිසා මේ ගැන හැදෑරීමක් අවශ්‍යයි. ගරු සිසිර ජයකොඩි රාජ්‍ය ඇමතිතුමනි, මේ පනත් කෙටුම්පතට පාරම්පරික වෛද්‍යවරුන්ගේ විරෝධයක් තිබෙන නිසා මම ඡන්දය දීමෙන් වැළකී සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කංසා වගාව පිළිබඳවත් වචනයක් කියලා මම කථාව අවසාන කරන්නම්. ගරු රාජිත සේනාරත්න මැතිතුමාත් ඒ ගැන කිව්වා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු විධියට කංසා වගා කළාට අපට ප්‍රශ්නයක් නැහැ. ආයුර්වේද වෛද්‍යවරුන්ට දැනුත් වගා කරන්න පුළුවන්. තව ටිකක් ඒ ප්‍රමාණය පළල් කළාට කමක් නැහැ. අපි දන්නවා, ජර්මන්කාරයොයි, ප්‍රංශකාරයොයි කොලනිවල ඔපියුම් වගා කළාට පස්සේ සිද්ධ වෙච්ච දේ. අද පාකිස්තානයේ විතරක් හෙරොයින් පාවිච්චි කරන අය කෝටි 8ක් විතර ඉන්නවා. ඇෆ්ඝනිස්තානය ඉවරෙටම ඉවරයි. කංසා කියන එක මහා පරිමාණ වාණිජ නිෂ්පාදනයක් විධියට නොවෙයි, ඖෂධයක් විධියට, බෙහෙත් සඳහා වන ආයුර්වේද නිෂ්පාදන කරන්න වාණිජමය වශයෙන් වගා කළාට අපේ කිසිම විරුද්ධත්වයක් නැහැ. නමුත්, ජාත්‍යන්තර බහුජාතික සමාගම්වලට අපේ ගස්කොළං ටික කපලා ඒවා වගා කරන්න දීලා මේ සෙල්ලම පටන් ගත්තොත් ලංකාවට වෙන්නේ ඇෆ්ඝනිස්තානයට අත් වූ ඉරණමමයි.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.52]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා**
(மாண்புமிகு உபுல் மஹேந்திர ராஜபக்ஷ)
(The Hon. Upul Mahendra Rajapaksha)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම ගරු සිසිර ජයකොඩි රාජ්‍ය ඇමතිතුමා සිංහල වෛද්‍ය ක්‍රමය, හෙළ වෙදකම පිළිබඳව ලොකු උනන්දුවකින් කටයුතු කරනවා. ඇත්තටම අපි ඒක අගය කරන්න ඕනෑ. අපේකම සහ දේශීයත්වය රැකිලා තිබෙන මෙවන් කාරණාවලට අපි වැඩි අවධානයක් යොමු කරන්න ඕනෑ. එතුමා අපි හමුවෙන හැම අවස්ථාවකම කථා කරන්නේ මේ කාරණාව ගැන. එතුමාට ලොකු වුවමනාවක් තිබුණා, ලියාපදිංචි කර ගන්න අමාරු පාරම්පරික වෛද්‍යවරු ලියාපදිංචි කරන්න. එතුමාට ඒ සඳහා ලොකු කැක්කුමක්, වුවමනාවක් තිබුණා. එතුමා අපි හමුවන හැම වෙලාවකම කිව්වේ, අපි මේ අයගේ පරම්පරාව ගැන හොයනවාට වඩා, මේ අයට ලියාපදිංචිය ලබා දෙන්න කටයුතු කරමු කියලායි. ඒ ගොල්ලන්ගේ වයස අනුව, ප්‍රායෝගිකව වාචික පිළිතුරු අහලා ලියාපදිංචිය දෙමු කියලා තමයි එතුමා කියන්නේ. මේකට යම් යම් අයගේ මොන විධියේ විරෝධතා තිබුණත්, එතුමා ඒ ගන්නා උත්සාහය අපි අගය කරන්නට ඕනෑ. මොකද, ග්‍රාමීය මට්ටමේ පාරම්පරික වෛද්‍යවරුන්ට සමහර විට පරම්පරාව පිළිබඳ ගැටලුවක් තිබෙන්න පුළුවන්. නමුත්, ඔවුන් වෛද්‍යවරුන් වශයෙන් විශාල සේවයක් මේ ජන සමාජයට කරනවා. ඒ අයගේ වෛද්‍ය ක්‍රමය වන සිංහල හෙළ වෙදකම ඔවුන් ඒ ආකාරයෙන්ම පවත්වාගෙන ගිහිල්ලා තිබෙනවා. යම් රෝගීන් ප්‍රමාණයක් ඔවුන්ගෙන් ප්‍රතිකාර ලබනවා. ඒ නිසා ඒ වෛද්‍යවරුන්ටත් යම්කිසි ලියා පදිංචියක් ලබා දීලා සමාජ ගෞරවයක් ලබා දෙනවා නම් අපි ඒක ඉතා අගය කරන්නට ඕනෑ. ඒ වාගේම, වික්‍රමාරච්චි ආයුර්වේද විශ්වවිද්‍යාලයත්, ආයුර්වේදයත් අපේ ප්‍රදේශය තුළ පිහිටා තිබීම ගැන මම ගම්පහ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු වශයෙන් විශේෂයෙන්ම සතුටු වෙනවා.

ඒ වාගේම සිංහල වෛද්‍ය ක්‍රමයට අදාළව අපේ අත්තනගල්ල ආසනයේ ජනතාවට විශාල ඔසු උයනක හිමිකාරිත්වයක් තිබෙන බව මා සඳහන් කරන්න කැමැතියි. මේ සිංහල වෙදකම අපට ආවේණික දෙයක්. ඒ නිසා මේ වෙදකම තවදුරටත් ප්‍රචලිත කරන්නත්, ආරක්ෂා කරන්නත් අපට කරන්න පුළුවන් මොනවාද කියලා අපි සොයා බලන්නට ඕනෑ. හැබැයි, අද ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනිවර කියවීමේ විවාදයට සම්බන්ධ වෙමින් මෙම පනත් කෙටුම්පතට අදාළ සංශෝධන ගැන සාකච්ඡා කරන මේ වෙලාවේ මම කනගාටුවට පත්වෙන කාරණාව මේකයි. මේ විවාදය අවසානයේ මේක ලසු වෙන්නේ කංසා වගා කිරීම කියන කාරණයට නම්, ඒකට මම පෞද්ගලිකව මගේ එකඟතාව දක්වන්නේ නැහැ. අපි මේ හැම දෙයකම හරවත් දේ ගන්නට ඕනෑ. සිංහල වෙදකමට කංසා අවශ්‍ය වෙනවා. හැබැයි, මේ හරහා ඒවා වගා කරන එක නීත්‍යනුකූල කරන්න

[ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා]

කවුරු හරි හිතනවා නම්, අතීතයේ ඒවා තහනම් කළේ මොකද කියන කාරණයත්, ඒවා මත්ද්‍රව්‍යයක් ලෙස සලකා ඒ සම්බන්ධයෙන් යම් කිසි නීතිමය තත්ත්වයක් ඇති කර තිබෙන්නේ මොකද කියන කාරණයත් අපි කල්පනා කරන්නට ඕනෑ. මෙම පනත් කෙටුම්පත සම්මත වීම හරහා "ස්පා" ක්‍රමය සමාජගත කරන්නට ඕනෑ කියලා කවුරු හරි හිතනවා නම්, අපට ඒකත් අනුමත කරන්න පුළුවන්කමක් නැහැ. අපි හරි දේ විතරයි ගන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිතුමාට විරුද්ධව හෙට විශ්වාස භංග යෝජනාවක් ගෙනෙනවා. අපේ ඇමතිතුමා මෙතැන ඉන්නවා. එතුමන්ලා මන්ත්‍රීවරුන් වශයෙන්, පුද්ගලයන් වශයෙන් ඒ තනතුරු දැරුවත්, ඊට ඉහළින් මේවා නියාමනය කරන්න, කරුණු සොයා බලන්න, ඒ ගැන කථා කරන්න යම් යම් ආයතන තිබෙනවා. නමුත් ඒ අය මේ කාරණා වෙනුවෙන් නිසි විධියට කටයුතු නොකර මේවා විනාශ වෙන්න ඉඩ හැර තිබෙනවා. ශ්‍රී ලංකා ජාතික ඖෂධ නියාමන අධිකාරිය තිබෙනවා. මේ ආයතන හරහා හරියට රාජකාරි කරන්නේ නැතුව, යම් යම් දේවලට ඇමතිවරයා ඉලක්ක කරනවා නම් එතැන යම් කිසි අසාධාරණයක් තිබෙනවා කියලා මම හිතනවා. මම කියන්න උත්සාහ කරන්නේ මේකයි. කවුරු හරි මේ හෙළ වෙදකමට මුවාවෙලා අත්තන ඇට දමලා ගුලි හදලා ඉස්කෝල අසල ඒවා විකුණනවා නම්, දරුවන්ට මදනමෝදකය කන්න පුරුදු කරනවා නම්, මත් වෙන ගුලි හදා දෙනවා නම් ඒවාට අනුමැතිය දෙන්න පුළුවන්කමක් නැහැ. මේවා හැම එකක්ම නියාමනය කරන්නට ඕනෑ. නියාමනය කරලා, හරි දේ විතරක් සමාජගත කරන්න ඕනෑ. අපේ ඇමතිතුමා කිව්වා වාගේ අපි නාගයන්ටත් වෙදකම් කළ රාජ පරම්පරාවකට උරුමකම් කියන අය. මේ හෙළ වෙදකම තුළින් ගෞරවනීය සේවයක් සිදු කර තිබෙනවා. මේ හෙළ වෙදකම නිසා තමයි මේ රටේ මිනිස්සු බෝසත්වරයකුට මෙන් සලකමින් වන්දනාමාන කළ නැඳුන්ගමුවේ ඇත් රාජයා සහ තවත් ඇත් රජෙක් නීලම්මහර වෙද හාමුරුදුරුවන්ට ඉන්දියානු රජයේ පරිත්‍යාගයක් වශයෙන් ලැබුණේ. සිංහල වෙදකමට තිබුණු ගෞරවයක් වශයෙන් තමයි ඒ වස්තු අපට ලැබුණේ.

හෙළ වෙදකම කියන්නේ අතීතයේ ඉඳලා පැවත එන දෙයක්. අපේ ගෙවල්වල අම්මලා වුණත් දන්නවා දවසේ කෑම වේල් ටික හදන්න ඕනෑ විධිය කොහොමද, සීනි පාලනය කරන්නේ කොහොමද, රුධිර පීඩනය පාලනය කරන්නේ කොහොමද, මේදය පාලන කිරීම වෙනුවෙන් කරන්නට ඕනෑ මොනවාද, මුත්‍ර අමාරුව සුව කිරීමට කරන්නේ මොනවාද කියලා. ගෙදර ආහාර වට්ටෝරුව සැකසීමේ දී සිංහල වෙදකමත් එක්ක අපි බැඳී තිබුණා. ඒ සිංහල වෙදකම පිළිබඳව අපට අවබෝධයක් ලබා දීලා තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව මම අහගෙන සිටියා. ඔබතුමාගේ කථාවට අපි එකඟයි. මේ විෂය කරුණු පාසල් පෙළ පොතට ඇතුළත් කරන්න ඕනෑ. අපේ ළමයි බෙහෙත් පැළෑටියක් හඳුනන්නේ නැහැ. මේ තරගකාර අධ්‍යාපන ක්‍රමය තුළ, අපි දියුණුයි කියන සමාජ ක්‍රමය තුළ, අපේ දරුවාට තිබෙන දැනුම ඉතාම පහළ මට්ටමක තමයි තිබෙන්නේ. මෙන්න පුතේ මොණර කුඩුම්බිය ශාකය, මෙන්න බැල තණ, මෙන්න බෙහෙත් පැළෑටි කියලා දරුවන්ට හඳුන්වා දෙන්න නම්, අම්මලා කොළඹ ඉඳලා ගමේ වෙල්එළියට යන්න ඕනෑ. ඒ නිසා මේ සමාජය දියුණු වෙමින් ඉතා වේගයෙන් ඉදිරියට ගියත් ආපසු හැරී බලනකොට අපි ගිහින් තිබෙන්නේ හිස් ගමනක්ය කියන එක අපි තේරුම් ගන්නට ඕනෑ. ඒ නිසා අපි හැමෝම එකතු වෙලා හොරුන්ගෙන් මේ වෙදකම බේරා ගන්නට ඕනෑ. හොරුන් මේ වෙදකම විනාශ කරනවා නම්, මේවාට අදාළ ලියාපදිංචි කිරීම් කරන කොට වැරදි දේවල් කරනවා නම් ඒවාට ඉඩ දෙන්නේ නැතුව අපි අවංකවම මේ සිංහල වෙදකම ආරක්ෂා කරන්න ඕනෑ. ඒ සඳහා ගරු ඇමතිතුමාට තිබෙන වුවමනාව නිසා ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පතට ගෙනැවිත් තිබෙන මේ සංශෝධනවලට සහාය දීලා සිංහල වෛද්‍ය ක්‍රමයත්, අපේකමත් ආරක්ෂා කරන්න කටයුතු කරමු කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, විවාදයේ වැඩ කටයුතු අවසන් වන තෙක් සභාවේ කාලය දීර්ඝ කරගන්න අවශ්‍යයි. සභාව ඊට එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

සෞඛ්‍ය අමාත්‍ය ගරු කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට විනාඩි 19ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.59]

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (සෞඛ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல - சுகாதார அமைச்சர்)
(The Hon. Keheliya Rambukwella - Minister of Health)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම දේශීය වෛද්‍ය විද්‍යාවට අදාළව අද සිදු කරන මේ සාකච්ඡාවේ දී ඒ සම්බන්ධයෙන් අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම ගැන මගේ ස්තුතිය ඔබතුමාට මේ අවස්ථාවේ පුද කරනවා. ඒ වාගේම මේ අවස්ථාවේ මම රාජ්‍ය අමාත්‍ය ගරු සිසිර ජයකොඩි මැතිතුමාටත් සුබ පතනවා.

එතුමා මේ විෂය භාර ගත්ත දවසේ ඉඳන් පුදුමාකාර උනන්දුවක් දක්වනවා, විද්‍යාත්මක පදනමක් තුළ ඉඳගෙන, මේ රටේ දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියන ක්ෂේත්‍රයක වර්තමානයේ ඇති වී තිබෙන තත්ත්වය විග්‍රහ කරමින් එය ඉදිරියට ගෙන යන්නත්, ලෝකයේ ඇති වෙලා තිබෙන සෞඛ්‍ය තත්ත්වය තුළ අපේ විවිධ ක්‍රම පාවිච්චි කරමින් අවසානයේ මේ රටේ රෝගී ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා දෙන්නත්. උදාහරණයකට ගත්තොත්, යම් යම් රෝගවලට බටහිර වෛද්‍ය විද්‍යාවෙන් බැහැර ක්‍රමයක් නැහැ කියලා මතවාද තිබෙනවා. හැබැයි, අපේ ඉතිහාසය තුළ දේශීය වෛද්‍ය ක්‍රම තුළින් ඔය කියන සෑම අංශයකම රෝගවලට සාර්ථකව මුහුණ දීලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ඒ ගැන පෞද්ගලික අත්දැකීමක් තිබෙනවා. මේ අත්දැකීම ප්‍රකාශ කළාම බොහෝදුරට හිතන්න පුළුවන්, ඒ ප්‍රකාශ කළ දේවල් කොහොමද අපි පිළිගන්නේ කියලා. මගේ සීයා හිටියේ කිරිදිවැල ප්‍රදේශයේ. ඔහු ප්‍රසිද්ධ වෙලා තිබුණේ, කිරිදිවැල රජ්ජුරුවෝ හැටියට. ඔහු එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමාගේ සෙනෙට් එකේත් කටයුතු කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

*අනතුරුව ගරු සමන්ප්‍රිය හේරත් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு சமன்பிரிய ஹேரத் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. SAMANPRIYA HERATH left the Chair, and THE HON. SPEAKER took the Chair.*

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய றம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ගරු කථානායකතුමනි, ජලභීතිකා රෝගයට වෙදකම් කළ ලංකාවේ හිටපු දක්ෂම වෙද මහත්තයෙක් තමයි අපේ සීයා. මම පොඩි කාලයේ දැකලා තිබෙනවා, ඕනෑම ඉස්පිරිතාලයකට, ඕනෑම අවස්ථාවක -ඕනෑම වෙලාවක- යන්න පුළුවන් විධියට ඔහුට සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් සහතිකයක් දීලා තිබුණු ආකාරය. ඒ කාලයේ අපේ මහ ගෙදර වෙනම කණ්ඩායමක් හිටියා, රෝගීන්ට බෙහෙත් කරන්න. මට මතක විධියට ඒ කාලයේ ජලභීතිකා රෝගයට ඉස්පිරිතාලවලින් vaccines 21ක්ද කොහේද ගහනවා. එහෙම vaccines ගහලාත් බේරා ගන්න බැරි වෙන රෝගීන් එවන්නේ මගේ සීයා ළඟට. යම් රෝගියෙකු තවදුරටත් ජීවත් කරවන්න බැහැයි කියලා ඉස්පිරිතාලෙන් කිව්වාම, එදා ඒ රෝගියා එව්වේ කිරිදිවුල තිබුණු අපේ මහ ගෙදරට. ඒ කාලයේ මම පොඩියි. මම ඇස් දෙකෙන් දැකලා තිබෙනවා, ඒ ළමයින් දම්වැල්වලින් බැඳලා ගේන ආකාරය. එදා එහෙම ගෙනා රෝගීන් අපේ මහ ගෙදර තියාගෙන වෙදකම් කළා. සතියක් යනකොට ඒ අය සම්පූර්ණයෙන් සනීප කරලා තමයි යවන්නේ. මහ විශ්වකර්ම වැඩක් හැටියටයි මම ඒ කාලයේ ඒක දැක්කේ. ඒකට යන්ත්‍ර මන්ත්‍රත් පාවිච්චි කළා; බෙහෙත් වාගේම පැරණි මන්ත්‍ර ක්‍රමත් පාවිච්චි කළා. මට මතකයි, ඒ කටයුතු භාරව සිටියේ බැස්ටියන් කියලා මනුස්සයෙක්. ඒ අත්දැකීම් එක්ක මේ සෞඛ්‍ය අමාත්‍යාංශය භාර ගන්න වෙලාවේ මම ගරු සිසිර ජයකොඩි මැතිතුමා එක්කත් කිව්වා, දේශීය වෛද්‍ය ක්‍රමය කියන්නේ මහා විශ්වකර්ම වැඩ කළ ඉතිහාසයක් තිබෙන, ඉතාම දුර්ලභ ගණයේ සම්පතක් කියලා. සමහර වෙලාවට එය විද්‍යා අංශයෙන් තේරුම් කරන්න බැරි එකක්. අපි ඒවාට කියනවා, lost science කියලා. විද්‍යාවට තේරුම් කර ගන්න බැරි කරුණු සම්බන්ධයෙන් විද්‍යාත්මක පදනමක් තුළ දේශීය වෛද්‍ය ක්‍රමවලින් කටයුතු කළ ආකාරය මම දැකලා තිබෙනවා. ඒක විශාල වැඩ පිළිවෙළක්. මට මතකයි, ඒ කාලයේ රෝගියෙකු අරගෙන එනකොට බුලත් අතක් එක්ක රුපියල් දෙකේ කොළයක් මගේ සීයාට දෙනවා. එතකොට සීයා ඒක අල්ලා විසි කරනවා, මේ ජරාව ගනිල්ලා කියලා. එහෙම තමයි එදා ඒ වෙදකම් කළේ. එහෙම පසුබිමක් තමයි මේ වෙදකම තුළ තිබෙන්නේ.

විශේෂයෙන්ම මේ සම්බන්ධව අපේ රාජ්‍ය ඇමතිතුමා ලොකු අධ්‍යයනයක් කළා. විවිධ අවස්ථාවලදී විවිධ කණ්ඩායම් ගෙනැල්ලා සාකච්ඡා කරන්න, මතවාද ඉදිරිපත් කරන්න අවශ්‍ය පරිසරය හදලා දුන්නා. මට ඇහුණා යම් යම් අවස්ථාවල කියැවෙනවා, මේ කෙටුම්පත ගැන සාකච්ඡාවට බඳුන් වුණා මදි කියලා. විපක්ෂ නායකතුමාත් එහෙම කිව්වා. නමුත්, මා මේ පාර්ලිමේන්තුව තුළම හතර පස් වතාවක් සියලුදෙනාම සම්බන්ධ කරගෙන මේ පිළිබඳ විවිධ සාකච්ඡා පැවැත්වූවා.

මෙහෙම සාකච්ඡා කරනකොට අත්දැකීමෙන් අපි දන්නවා, සියලු දේ අංග සම්පූර්ණ වෙන්නේ නැහැ කියලා. සියලුදෙනාම සතුටු වන දෙයක් කරන්න බොහොම අමාරුයි. හැබැයි, බහුතරයකගේ අවශ්‍යතා සහ අපේ අතින් ගිලිහී යන වැඩ පිළිවෙළ ගැන අවධානය යොමු කරමින්, විශේෂයෙන්ම වර්තමානයේ තිබෙන අවශ්‍යතාවක් හැටියට මේ කටයුතුවලට අවතීර්ණ වීම ගැන මම සතුටු වෙනවා.

ඉන්දියාවේ කේරළ ප්‍රාන්තය ගත්තොත්, අද මේ විෂයයට වෙනම ප්‍රාන්ත ඇමතිවරියක් ඉන්නවා. මේ විෂයයට කරුණු 5ක් අදාළ වෙනවා. ආයුර්වේද, සිද්ධ, යෝගා වාගේ දේවලුත් ඒකට එක්කාසු කරලා තිබෙනවා. ඒවාට සම්බන්ධ කර්මාන්තශාලා පවා තිබෙනවා. විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමනි, පළමුවැනි වතාවට මගේ ඇස් දෙකෙන් දැක්කා, කළු ගල් අඹරලා බෙහෙත්වලට කලවම් කරනවා. ඒක හරිම පුදුමයි. මම ඒක බලන්න ගියා. ඒක අවුරුදු තුනක් ඒ යන්ත්‍රයේ තිබෙන්න හරිනවා. ඒ කියන්නේ, පළමුවැනි අවුරුද්ද තුළ තැබුවාම සාමාන්‍ය paste එකක් හැදෙනවා. අන්තිමට තව paste එකක් හැදෙනවා. ඒ සඳහා අවුරුදු 3ක් ගතවෙනවා. පළමුවැනි අවුරුද්ද මැෂින් එකේ තබනවා. ඒ පළමුවැනි අවුරුද්දම churn වෙනවා. ඒ කියන්නේ දවස් 365ම, පැය 24ම ඒ මැෂින් එක churn වෙනවා, නතර වෙන්නේ නැහැ. ඊට පස්සේ ඊළඟ මැෂින් එකට යනවා. අපේ ඇස් දෙකෙන් දැක්කේ නැත්නම් අපට හිතාගන්න බැහැ, මෙහෙම දේවල් කරන්න පුළුවන් කියලා. හැබැයි, දැන් ඒ දේවල් නවීකරණය කරලා තිබෙනවා. උදාහරණයක් විධියට ගත්තොත්, ඒ products සඳහා දැන් tubes හදලා තිබෙනවා. ගරු රාජිත සේනාරත්න මන්ත්‍රීතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, එංගලන්තයේ බෙස්වෝටර් පාර ගත්තොත්, ඒ පාර දෙපස සම්පූර්ණයෙන්ම තිබෙන්නේ ආයුර්වේද ආරෝග්‍යශාලා. එකම වෙනස තිබෙන්නේ, ලංකාවේ මේ දේවල් quantify කරලා නැහැ. අපි ඉස්සර ගම්පහ වෙද මහත්තයා ළඟට බෙහෙත් ගන්න ගියාම, බෝතලයට අත දාලා ගන්න පුළුවන් බෙහෙත් ප්‍රමාණය අරගෙන දෙනවා. ඒවායේ හරි මිම්මක් තිබුණාද කියන එක සැකයි. අලුත් ක්‍රමය අනුව අපි දැකලා තිබෙනවා, capsules හදනවා. ඒවායේ තිබිය යුතු ග්‍රෑම් ප්‍රමාණය තිබෙනවා. එතකොට ඒකට විද්‍යාත්මක පදනමකුත් එකතු කර තිබෙනවා කියන එකයි මගේ අදහස. එම නිසා මේ අවස්ථාවේ මම ගරු රාජ්‍ය ඇමතිතුමාට සුබ පතනවා, මේ වැඩ පිළිවෙළ ඉදිරියට අරගෙන යන්න.

ඒ වාගේම මේ සංශෝධන පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළා. ශ්‍රේෂ්ඨාධිකරයෙන් ලබා දී තිබෙන උපදෙස් හා නිර්දේශ මත සහ ඒ වෙනස්කම්වලට යටත්ව ඉදිරි දැක්මක් එක්කයි අද මේ පනත් කෙටුම්පත සම්මත කරගන්න හදන්නේ. මේක මෙතැනින් නතර වෙන්නේ නැහැ. ලබන වසර වන විට මේකට තවත් දේවල් එක් කරන්න අත්‍යවශ්‍ය වෙනවා.

මම මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. විශේෂයෙන්ම මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යෑම වෙනුවෙන් මම ගරු රාජ්‍ය ඇමතිතුමාට සුබ පතනවා. මොකද, ඉදිරියේදී -ඊළඟ අවුරුදු 10, 15 තුළ- නිදහස් සෞඛ්‍ය සම්බන්ධයෙන් ප්‍රශ්න මතු වෙන්න පුළුවන්. ඒ නිසා ඒකටත් හරියන විධියට සමාන්තරව යන්න පුළුවන් දේශීය වෛද්‍ය විද්‍යාව හරහා යන තවත් වැඩ පිළිවෙළක් අපට තිබෙන්නට ඕනෑ. ඒක මේ වැඩ පිළිවෙළට substitute එකක් හැටියට වුණත් පාවිච්චි කරන්න පුළුවන් වුණොත් ලොකු දෙයක්.

මම මීට සති දෙකකට කලින් G20 සමුළුවට අදාළ රැස්වීමකට ඉන්දියාවට ගියා. ඒ අග්‍රාමාත්‍යතුමා තමයි ප්‍රධාන අමුත්තා හැටියට ඇවිල්ලා සිටියේ. ඒ වෙලාවේ සාකච්ඡා කළේත් වෛද්‍ය විද්‍යාව බෙදන්න ඕනෑ ක්‍රම ගණනාවක් ගැන. ඔවුන්ගේ රටේ නම් බිලියන

[ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා]

1.5ක ජනගහනයක් ඉන්නවා. එම නිසා ඔවුන්ට එහෙම නොකර බැරි තැනට ඇවිල්ලා තිබෙනවා. ඒ තත්ත්වය පුංචි ආර්ථිකයක් තිබෙන අපේ රටටත් අවශ්‍ය වෙයි කියන අදහස ඉදිරිපත් කරමින්, මම නතර වෙනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.*
*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

***මතු පළවන යෝජනාව සභා සම්මත විය:***
***''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' - [ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]***
*தீர்மானிக்கப்பட்டது.*
*"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக." - [மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த]*
*Resolved:*
*"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Susil Premajayantha]*

***කාරක සභාවේදී සලකා බලන ලදී.***
***[ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.]***
*குழுவில் ஆராயப்பட்டது.*
*[மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.]*
*Considered in Committee.*
*[THE HON. SPEAKER in the Chair.]*

***1 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*1ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 1 ordered to stand part of the Bill.*

## 2 වන වගන්තිය.- (1961 අංක 31 දරන පනතේ දීර්ඝ නාමය ප්‍රතියෝජනය කිරීම)
### வாசகம் 2.- (1961ஆம் ஆண்டின் 31ஆம் இலக்க, ஆயுள்வேதச் சட்டத்துக்கான விரிவுப்பெயரை மாற்றீடு செய்தல்)
CLAUSE 2.- *(Replacement of the Long Title to Act. No. 31 of 1961)*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, සෞඛ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "1 වන පිටුවේ, 5 වන පේළියේ සිට 29 වන පේළිය දක්වා පේළි ( ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

"ආයුර්වේද රෝහල්, ආයුර්වේද ඔසුසල්, ආයුර්වේද බෙහෙත් ශාලා, ආයුර්වේද ගබඩා, ඔසු වගා සහ පර්යේෂණ සහ ව්‍යාප්තිය සඳහා වන ඔසු උයන් ලියාපදිංචි කිරීම සඳහා ද;ආයුර්වේද වෛද්‍යවරයන්, ආයුර්වේද ඖෂධවේදීන්, ආයුර්වේද හෙද හෙදියන් සහ ආයුර්වේද සම්බාහන ශිල්පීන් ලියාපදිංචි කිරීමට සහ ඔවුන්ගේ වෘත්තීය පැවැත්මට අදාළ කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස ආයුර්වේද වෛද්‍ය සභාවක් පිහිටුවීම සඳහා ද; ආයුර්වේද අධ්‍යාපනය හා පුහුණුවට අදාළ අභිඥාන පත්‍ර, සහතිකපත්, උපාධි සහ පශ්චාත් උපාධි ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් ඇතැම් කර්තව්‍ය ඉටු කිරීම පිණිස ද ආයුර්වේද ජාතික රෝහල, ආයුර්වේද ශික්ෂණ රෝහල්, ආයුර්වේද පර්යේෂණ රෝහල් සහ ඊට අනුබද්ධ ඔසුසල්, ඖෂධ නිධි සහ බෙහෙත් ශාලාවලට අදාළ කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස ආයුර්වේද අධ්‍යාපන හා ආරෝග්‍යශාලා මණ්ඩලයක් පිහිටුවීම සඳහා ද;' "

(2) "2 වන පිටුවේ, 1 සිට 4 දක්වා වන පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න:"

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
2 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු රාජිත සේනාරත්න මැතිතුමා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා.

"1 වන පිටුවේ, 21 සහ 22 පේළි ඉවත්කොට පහත පේළි ආදේශ කරන්න:

'ආරෝග්‍යශාලා මණ්ඩලයක් පිහිටුවීම සඳහාද; ජාතික ආයුර්වේද රෝහල, ආයුර්වේද ශික්ෂණ රෝහල් ආයුර්වේද පර්යේෂණ' "

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමා, එම සංශෝධනයට එකඟ ද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
එම සංශෝධනයට එකඟ වෙන්න බැහැ, ගරු සභාපතිතුමනි. හේතුව, ශ්‍රේෂ්ඨාධිකරණයේ දී එකඟ වූ සංශෝධන පමණයි අපට ඉදිරිපත් කරන්න පුළුවන් වන්නේ. නැත්නම් නැවත වතාවක් නීතිපතිතුමාගේ අවසරය ගන්න වෙනවා. ඒ නිසා දැනට අවසරය දීලා තිබෙන කොටස තමයි සංශෝධනය හැටියට ඉදිරිපත් කළේ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
ඔබතුමා,-

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
සංශෝධන ඉදිරිපත් කරන්න පුළුවන් ඒවා තිබෙනවා. නමුත්, එකඟ වුණාට පස්සේ ඒ ලබා දුන්න structure එකෙන් එහාට අපට යන්න බැහැ. ඒකයි සිදු වෙලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඒ අනුව, 2 වන වගන්තිය ගරු අමාත්‍යතුමාගේ සංශෝධනවලට යටත්ව සම්මතයි.

***2 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*2ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 2, as amended, ordered to stand part of the Bill.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
3 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා.

## 3 වන වගන්තිය.- (පොදු සංශෝධන)
### வாசகம் 3.- (பொதுவான திருத்தங்கள்)
CLAUSE 3.- *(General Amendments)*

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "2 වන පිටුවේ, 34 සහ 35 පේළි ඉවත්කොට පහත පේළි ආදේශ කරන්න:

' "ආයුර්වේදය සෞඛ්‍ය සේවකයන්ට", "ජාතික ආයුර්වේදය රෝහලට" සහ "ආයුර්වේද පර්යේෂණ කමිටුවට" ' "

(2) "2 වන පිටුවේ, 13 වන පේළිය ඉවත්කොට පහත පේළිය ආදේශ කරන්න:

"වෙනුවට පිළිවෙළින්, ආයුර්වේද අධ්‍යක්ෂ ජනරාල්වරයා' "

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමා, එකඟ ද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මුලින් කිව්ව ආකාරයටම ඒ සංශෝධනවලට එකඟ වෙන්න බැහැ. නීතිපතිගේ උපදෙස් අනුව තමයි අපි මේ සංශෝධන කරන්නේ. මොකද, ශ්‍රේෂ්ඨාධිකරණයේ දී මෙම සංශෝධනවලට එකඟ වෙනකොට නීතිපතිතුමාගේ එකඟතාවත් එක්කම තමයි එකඟ වෙන්නේ. මම හිතන්නේ ඔබතුමා යෝජනා කරන සංශෝධනයේ ලොකු වෙනසක් වෙන්නේ නැහැ.

3 වන වගන්තිය ඇති සැටියෙන් සම්මත කිරීමට එකඟයි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඒ අනුව, 3 වන වගන්තිය ඇති සැටියෙන් සම්මතයි.

***3 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*3ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 3, ordered to stand part of the Bill.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
4 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා.

## 4 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම)
### வாசகம் 4.- (முதன்மைச் சட்டவாக்கத்தின் 3ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 4.- *(Amendment of section 3 of the principal enactment)*

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"3 වන පිටුවේ, 14 සහ 15 පේළි ඉවත්කොට පහත පේළි ආදේශ කරන්න:
'අතිරේක ආයුර්වේද අධ්‍යක්ෂ ජනරාල්වරු, ආයුර්වේද අධ්‍යක්ෂකවරු, යන වචන' "

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමා එකඟද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඒ සංශෝධනයට එකඟ වෙන්න බැහැ, ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඒ අනුව, 4 වන වගන්තිය ඇති සැටියෙන් සම්මතයි.

***4 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*4ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 4, ordered to stand part of the Bill.*

***5 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*5ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 5, ordered to stand part of the Bill.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
6 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මැතිතුමා.

## 6 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම)
### வாசகம் 6.- (முதன்மைச் சட்டவாக்கத்தின் 5ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 6.- *(Amendment of section 5 of the principal enactment)*

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"3 වන පිටුවේ, 24 සිට 25 දක්වා පේළි ඉවත්කොට පහත පේළි ආදේශ කරන්න:
'අධ්‍යක්ෂ ජනරාල්වරයා, ආයුර්වේද අධ්‍යක්ෂකවරු, නියෝජ්‍ය ආයුර්වේද අධ්‍යක්ෂකවරු යන වචන ආදේශ කිරීමෙන් ඒ' "

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමා, එම සංශෝධනයට එකඟද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
එම සංශෝධනයට එකඟ නැහැ, ගරු සභාපතිතුමනි. 6 වන වගන්තියට ඇති සැටියෙන් එකඟයි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
6 වන වගන්තිය ඇති සැටියෙන් සම්මතයි.

***6 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*6ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 6, ordered to stand part of the Bill.*

## 7 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම)
## வாசகம் 7.- (முதன்மைச் சட்டவாக்கத்தின் 7ஆம் பிரிவை மாற்றீடு செய்தல்)
CLAUSE 7.- *(Replacement of section 7 of the principal enactment)*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "3 වන පිටුවේ, 30 වන පේළියේ සිට 34 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(අ) ආයුර්වේදයට අනුව,

(i) රෝගවලට ප්‍රතිකාර කිරීම සඳහා අවශ්‍ය ආයතන පිහිටුවීම සහ සේවා සැපයීම; සහ

(ii) ප්‍රාථමික සෞඛ්‍ය රැකවරණය සැපයීම' "

(2) "4 වන පිටුවේ, 28 වන පේළිය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ව්‍යාප්තිය සඳහා වන ඖෂධ උයන් හෝ ඖෂධ වගා' "

*සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
7 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මැතිතුමා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "4 වන පිටුවේ, 4 සහ 5 පේළි ඉවත්කොට පහත පේළි ආදේශ කරන්න:

'වෛද්‍ය පශ්චාත් උපාධි සහ සම්බාහන පුහුණු පාඨමාලා හැදෑරීම හා පර්යේෂණ, ප්‍රකාශන පළකිරීම් සඳහා පැවැති එවැනි ආයතන හා පුද්ගලයන්ට' "

(2) "4 වන පිටුවේ, 11 වන පේළිය ඉවත්කොට පහත පේළිය ආදේශ කරන්න:

'මෙම පනත යටතේ ස්ථාපනය කරන' "

(3) "4 වන පිටුවේ, 12 පේළියට ඉනික්බිතිව පහත පේළි ඇතුළත් කරන්න:

'(ඉ) ඖෂධ ලියාපදිංචිය හා නියාමනය මඟින් නිෂ්පාදනය, ගෙන්වීම බෙදාහැරීම, ගබඩා කිරීම සහ වගා කිරීම මඟින් ඖෂධ කළමනාකරණය කිරීම' "

(4) "4 වන පිටුවේ, 17 සිට 20 දක්වා පේළි ඉවත්කොට පහත පේළි ආදේශ කරන්න:

'(ඊ) ආයුර්වේද සෞඛ්‍ය සේවා සපයන වෘත්තිකයන් ලියාපදිංචිය, වෘත්තිය කටයුතු හා ක්‍රියාකාරකම් නියාමනය හා අධීක්ෂණය කිරීම මඟින් ඉහළ වෘත්තිය ප්‍රමිති සහතික කිරීම' "

(5) "4 වන පිටුවේ, 20 වන පේළියට ඉනික්බිතිව පහත පේළි ඇතුළත් කරන්න:

'(උ) වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධව හා අනෙකුත් සහායක සේවා සම්බන්ධව විශ්වවිද්‍යාල ආයතන සහ රජයේ අනුමත වෙනත් ආයතන වෙත එහි උගන්වනු ලබන පාඨමාලා, ආයතන පහසුකම් හා මානව සම්පත් පිළිබඳ කලින් කලට නිර්ණායක, උපමාන හා උපදෙස් ලබා දීම මඟින් ගුණාත්මක තත්ත්වයේ ඉහළ වෘත්තිකයන් පිරිසක් බිහිකිරීම සහ' "

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමා, එම සංශෝධනවලට එකඟද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
එකඟ නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු අමාත්‍යතුමාගේ සංශෝධනවලට යටත්ව 7 වන වගන්තිය සම්මතයි.

***7 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*7ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 7, as amended, ordered to stand part of the Bill.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
8 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මන්ත්‍රීතුමා.

## 8 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියට අලුත් 7අ වගන්තිය ඇතුළත් කිරීම)

### வாசகம் 8.- (முதன்மைச் சட்டவாக்கத்தின் 7அ என்னும் புதிய பிரிவை உட்புகுத்துதல்)

CLAUSE 8.- *(Insertion of new section 7A in the principal enactment)*

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"5 වන පිටුවේ, 1 සිට 12 දක්වා පේළි සම්පූර්ණයෙන් ඉවත් කරන්න."

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු ඇමතිතුමා, එම සංශෝධනයට එකඟද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

එකඟ නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

8 වන වගන්තිය ඇති සැටියෙන් සම්මතයි.

***8 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*8ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 8, ordered to stand part of the Bill.*

## 9 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම)

### வாசகம் 9.- (முதன்மைச் சட்டவாக்கத்தின் 8ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 9.- *(Amendment of section 8 of the principal enactment)*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"5 වන පිටුවේ, 13 පේළියේ සිට 16 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට, පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'9. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි '7 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති අරමුණු ක්‍රියාත්මක කිරීමේ දී, කොමසාරිස්වරයා' යන වචන වෙනුවට, '7 වන වගන්තියේ (අ) සිට (ඉ) දක්වා ඡේදවල නිශ්චිතව දක්වා ඇති අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයාට බලය තිබිය යුතු අතර එසේ කිරීමේ දී කොමසාරිස් ජනරාල්වරයා' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි 'ආයුර්වේද ආරෝග්‍යශාලා' යන වචන වෙනුවට 'ආයුර්වේද රෝහල්, පර්යේෂණ සහ ව්‍යාප්ති සේවා සඳහා වූ ඖෂධ උයන්' යන වචන ආදේශ කිරීමෙන්' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

9 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මැතිතුමා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"5 වන පිටුවේ, 12 වන පේළියට ඉනික්බිතිව පහත පේළි ඇතුළත් කරන්න:

'(අ) ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියට ඉනික්බිතිව පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 7අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය.

7(අ) (1) ඒකාබද්ධ අරමුදලින් වරින් වර ප්‍රදානය කරනු ලබන මුදල්, පනතේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගත යුතුය.

(2) පනතේ නිශ්චිතව දක්වා ඇති අරමුණු ඉටු කිරීමේදී සහ දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය ඉටුකිරීමේදී ගාස්තු හෝ වෙනත් යම් ආකාරයකින් ලැබෙන්නා වූ අයකර ගන්නා වූ හෝ රැස්කරන්නා වූ සියලු මුදල්, ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය.' "

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු ඇමතිතුමා, එම සංශෝධනයට එකඟද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

එකඟ නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු අමාත්‍යතුමාගේ සංශෝධනයට යටත්ව 9 වන වගන්තිය සම්මතයි.

***9 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*9ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 9, as amended, ordered to stand part of the Bill.*

## 10 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම)

### வாசகம் 10.- (முதன்மைச் சட்டவாக்கத்தின் 10ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 10.- *(Amendment of section 10 of the principal enactment)*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"5 වන පිටුවේ, 17 වන පේළියේ සිට 20 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'10. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය-

(1) එහි 'ආයුර්වේද ආරෝග්‍යශාලා' යන වචන දැක්වෙන කවර හෝ තැනක, ඒ වෙනුවට 'ආයුර්වේද රෝහල්, ඖෂධ වගා' යන වචන ආදේශ කිරීමෙන්;

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

(2) එහි 'ආයුර්වේද ආරෝග්‍යශාලාව' යන වචනය දැක්වෙන සෑම තැනක, ඒ වෙනුවට 'රෝහල, ඔසු වගා' යන වචන ආදේශ කිරීමෙන්;

(3) එහි 'ආරෝග්‍යශාලාව' යන වචනය දැක්වෙන සෑම තැනක, ඒ වෙනුවට, 'රෝහල, ඔසු වගා' යන වචන ආදේශ කිරීමෙන්;

මෙයින් සංශෝධනය කරනු ලැබේ.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendment put, and agreed to.*

**ගරු සභාපතිතුමා**

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

10 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මැතිතුමා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)

(The Hon. (Dr.) Rajitha Senarathne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"5 වන පිටුවේ, 19 වන පේළිය ඉවත්කොට පහත පේළිය ආදේශ කරන්න:

'ආයුර්වේද රෝහල් ඔසු වගා, ආයුර්වේද ඔසු සල් යන වචන ආදේශ කිරීමෙන් ඒ' "

**ගරු සභාපතිතුමා**

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

ගරු ඇමතිතුමා, එම සංශෝධනයට එකඟද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**

(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)

(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

එකඟ නැහැ.

**ගරු සභාපතිතුමා**

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

ගරු අමාත්‍යතුමාගේ සංශෝධනයට යටත්ව 10 වන වගන්තිය සම්මතයි.

***10 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*10ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 10, as amended, ordered to stand part of the Bill.*

## 11 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම)

### வாசகம் 11.- (முதன்மைச் சட்டவாக்கத்தின் 11ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 11.- *(Amendment of section 11 of the principal enactment)*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**

(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)

(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "6 වන පිටුවේ, 3 වන පේළියේ සිට12 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' (ඇ)(i) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ, ආයුර්වේද හා යුනානි වෛද්‍ය අංශ නියෝජනය කරමින් එහි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් අතරින් තෝරා පත්කර ගත් සාමාජිකයන් දෙදෙනෙකු;

(ii) ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් විසින් ඔවුන් අතරෙන් තෝරා පත්කර ගත් එක් සාමාජිකයකු;

(iii) ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් අතරින් තෝරා පත්කර ගත් එක් සාමාජිකයකු; සහ

(iv) ශ්‍රී ලංකාවේ නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් අතරින් තෝරා පත්කර ගත් එක් සාමාජිකයකු

ඇතුළු සාමාජිකයන් පස් දෙනෙකු;' "

(2) "6 වන පිටුවේ, 13 වන පේළියේ සිට 18 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(3) එහි (ඊ) ඡේදය ඉවත්කොට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:

"(ඊ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන දොළොස් දෙනෙකුට නොවැඩි සාමාජිකයන්-

(i) එසේ පත් කරනු ලබන සාමාජිකයන්ගෙන් තිදෙනෙකු, ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරු නොවන තැනැත්තන් අතරින්ද;

(ii) එසේ පත් කරනු ලබන සාමාජිකයන්ගෙන් තිදෙනෙකු, සමස්ත ලංකා ආයුර්වේද වෛද්‍ය සංගමය විසින් නාමයෝජිත දස දෙනෙකුගෙන් යුතු මණ්ඩලයක් අතරින් ද;

(iii) එසේ පත් කරනු ලබන සාමාජිකයන්ගෙන් දෙදෙනෙකු සමස්ත ලංකා ආයුර්වේද වෛද්‍ය සංගමයේ සාමාජිකයන් නොවන ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් අතරින් ද;

විය යුතු ය' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

**ගරු සභාපතිතුමා**

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

11 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මැතිතුමා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)

(The Hon. (Dr.) Rajitha Senarathne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "6 වන පිටුවේ, 4 පේළියට ඉනික්බිතිව පහත පේළි ඇතුළත් කරන්න:

'නියෝජනය කරමින් එක් නියෝජිතයෙකු බැගින් දෙදෙනෙකු' "

(2) "6 වන පිටුවේ, 21 පේළිය ඉවත්කොට පහත පේළිය ආදේශ කරන්න:

'(උ) නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු සහ මුදල් හෝ භාණ්ඩාගාර' "

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමා, එම සංශෝධනවලට එකඟද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
එකඟ නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු අමාත්‍යතුමාගේ සංශෝධනවලට යටත්ව 11 වන වගන්තිය සම්මතයි.

***11 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*11ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 11, as amended, ordered to stand part of the Bill.*

***12 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*12ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 12 ordered to stand part of the Bill.*

## 13 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම)
வாசகம் 13.- (முதன்மைச் சட்டவாக்கத்தின் 13ஆம் பிரிவை மாற்றீடு செய்தல்)
CLAUSE 13.- *(Replacement of section 13 of the principal enactment)*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "7 වන පිටුවේ, 21 වන පේළිය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' සභාපතිවරයාට යැවීමෙන්' "

(2) "7 වන පිටුවේ, 25 වන පේළිය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'රැස්වීම් තුනකට නොපැමිණි අවස්ථාවක දී,

(ඈ) ඔහු ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරයකුව සිටීම අවසන් කළ විට හෝ ආයුර්වේද වෛද්‍යවරයකු වශයෙන් ඔහුගේ ලියාපදිංචිය අත්හිටුවමින් සභාව විසින් මේ පනත යටතේ කරන ලද නියමයක් ක්‍රියාත්මක වූ විට; සහ

(ඇ) ඔහු දණ්ඩ නීති සංග්‍රහය යටතේ යම් වරදකට වරදකරු කරනු ලැබූ විට' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***13 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*13ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 13, as amended, ordered to stand part of the Bill.*

***14 සහ 15 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***
*14ஆம், 15ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clauses 14 and 15 ordered to stand part of the Bill.*

## 16 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම)
வாசகம் 16.- (முதன்மைச் சட்டவாக்கத்தின் 22ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 16.- *(Amendment of section 22 of the principal enactment)*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "9 වන පිටුවේ, 27 වන පේළියේ සිට 33 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ඉ) උසස් අධ්‍යාපනය විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන -

(i) එයින් සාමාජිකයන් දෙදෙනෙකු, ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ, ආයුර්වේද හා යුනානි වෛද්‍ය අංශ නියෝජනය කරමින් ද;

(ii) එයින් එක් සාමාජිකයකු, ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයෙන් ද;

(iii) එයින් එක් සාමාජිකයකු, ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයෙන් ද; සහ

(iv) එයින් එක් සාමාජිකයකු, ශ්‍රී ලංකාවේ නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨයෙන් ද;

යන ලෙස එක එක් පීඨයේ හෝ ඒකකයේ කථිකාචාර්යවරයන් අතරින් වන්නා වූ සාමාජිකයන් පස් දෙනෙකු' "

(2) "10 වන පිටුවේ, 1 සිට 4 දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න"

(3) "10 වන පිටුවේ, 7 වන පේළියේ සිට 16 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ඊ) (ඉ) වන ඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයන් නොවන-

(i) එයින් සාමාජිකයන් දෙදෙනෙකු, ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ, ආයුර්වේද හා යුනානි වෛද්‍ය අංශ නියෝජනය කරමින් ද;

(ii) එයින් එක් සාමාජිකයකු, ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයෙන් ද;

(iii) එයින් එක් සාමාජිකයකු, ශ්‍රී ලංකාවේ යාපනය විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයෙන් ද; සහ

(iv) එයින් එක් සාමාජිකයකු, ශ්‍රී ලංකාවේ නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨයෙන් ද,

යන ලෙස එක් එක් පීඨයේ හෝ ඒකකයේ කථිකාචාර්යවරුන් විසින් ඔවුන් අතරින් තෝරා පත්කර ගත් සාමාජිකයන් පස් දෙනෙකු' "

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

(4) "10 වන පිටුවේ, 17 වන පේළියේ සිට 19 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(8) එහි (එ) ඡේදය ඉවත්කොට, ඒ වෙනුවට, පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන්:

'(එ) ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් අතරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන්නා වූ ද, එසේ පත් කරනු ලැබිය යුතු තැනැත්තන්ගෙන් දෙදෙනෙකුට නොඅඩු තැනැත්තන් සමස්ත ලංකා ආයුර්වේද වෛද්‍ය සංගමය විසින් නාමයෝජිත හය දෙනෙකුගෙන් යුතු මණ්ඩලයක් අතරින් වන්නා වූ ද, අට දෙනෙකුට නොඅඩු වන්නා වූ සාමාජිකයන්' "

(5) "10 වන පිටුවේ, 20 වන පේළියේ සිට 29 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න"

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

**ගරු සභාපතිතුමා**

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

සංශෝධන ඉදිරිපත් කිරීමට, ගරු රාජිත සේනාරත්න මැතිතුමා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)

(The Hon. (Dr.) Rajitha Senarathne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "8 වන පිටුවේ, 33 වන පේළියට ඉනික්බිතිව පහත පේළි ඇතුළත් කරන්න:

'සහ

ආයුර්වේද අතිරේක අධ්‍යක්ෂකවරු හා ආයුර්වේද අධ්‍යක්ෂකවරු' "

(2) "9 වන පිටුවේ, 4 වන පේළිය ඉවත්කොට පහත පේළිය ආදේශ කරන්න:

'වෛද්‍ය පීඨයේ පීඨාධිපති සහ පීඨාධිපති නියෝජනය වන වෛද්‍ය උපාධි පාඨමාලාව හැර අනෙක් වෛද්‍ය උපාධි පාඨමාලා දෙපාර්තමේන්තු ප්‍රධානීන් අතුරින් පීඨාධිපති විසින් නම් කරන නියෝජිතයා,' "

(3) "9 වන පිටුවේ, 10 වන පේළියට ඉනික්බිතිව පහත පේළිය ඇතුළත් කරන්න:

'ඒකකයේ ප්‍රධානියා, කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂකවරයා' "

(4) "9 වන පිටුවේ, 17 වන පේළිය ඉවත්කොට පහත පේළිය ආදේශ කරන්න:

'(ඇ) 'ජාතික ආයුර්වේද රෝහලේ ප්‍රධානියා' "

(5) "9 වන පිටුවේ, 2 සිට 4 දක්වා පේළි ඉවත්කොට පහත පේළිය ආදේශ කරන්න:

'කථිකාචාර්යවරු අතරින් ඒ ඒ ආයුර්වේද සිද්ධ යුනානි වෛද්‍ය උපාධි පාඨමාලා නියෝජනය වන ලෙස එක් එක් පාඨමාලාවෙන් ඔවුන් විසින් තෝරාගනු ලබන එක් සාමාජිකයෙකු බැගින් සාමාජිකයන් පස් දෙනෙක්' "

**ගරු සභාපතිතුමා**

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

ගරු ඇමතිතුමා, එම සංශෝධනවලට එකඟද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**

(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)

(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

එකඟ නැහැ.

**ගරු සභාපතිතුමා**

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

ගරු අමාත්‍යතුමාගේ සංශෝධනවලට යටත්ව 16 වන වගන්තිය සම්මතයි.

***16 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*16ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 16, as amended, ordered to stand part of the Bill.*

**ගරු සභාපතිතුමා**

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

17 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු රාජිත සේනාරත්න මැතිතුමා.

## 17 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම)

වාசகம் 17.- (முதன்மைச் சட்டவாக்கத்தின் 23ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 17.- (*Amendment of section 23 of the principal enactment*)

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)

(The Hon. (Dr.) Rajitha Senarathne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"11 වන පිටුවේ, 10 වන පේළිය ඉවත්කොට පහත පේළිය ආදේශ කරන්න:

'ජාතික ආයුර්වේද රෝහලේ ප්‍රධානියා හෝ දේශීය වෛද්‍ය ක්‍රම' "

**ගරු සභාපතිතුමා**

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

ගරු ඇමතිතුමා, එම සංශෝධනයට එකඟද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**

(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)

(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

එකඟ නැහැ.

**ගරු සභාපතිතුමා**

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

17 වන වගන්තිය ඇති සැටියෙන් සම්මතයි.

***17 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*17ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 17 ordered to stand part of the Bill.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
18 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු රාජිත සේනාරත්න මැතිතුමා.

## 18 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම)
வாசகம் 18.- (முதன்மைச் சட்டவாக்கத்தின் 24ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 18.- (*Amendment of section 24 of the principal enactment*)

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"11 වන පිටුවේ, 27 වන පේළිය ඉවත්කොට පහත පේළිය ආදේශ කරන්න:

'වෛද්‍ය ඒකකයේ සහ ජාතික ආයුර්වේද රෝහලේ ප්‍රධානීන්' "

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමා, එම සංශෝධනයට එකඟද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
එකඟ නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
18 වන වගන්තිය ඇති සැටියෙන් සම්මතයි.

***18 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*18ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 18 ordered to stand part of the Bill.*

***19 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*19ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 19 ordered to stand part of the Bill.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
20 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ගරු රාජිත සේනාරත්න මැතිතුමා.

## 20 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම)
வாசகம் 20.- (முதன்மைச் சட்டவாக்கத்தின் 30ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 20.- (*Amendment of section 30 of the principal enactment*)

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "12 වන පිටුවේ, 27 වන පේළියේ සිට 35 වන පේළිය දක්වා පේළි ඉවත්කොට පහත පේළි ආදේශ කරන්න:

'(අ) (i) වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධ විශ්වවිද්‍යාලවල මූලික උපාධි හා පශ්චාත් උපාධි ප්‍රදානය කරනු ලැබීම සඳහා ද අනෙකුත් සහයක වෘත්තීන්ගේ පාඨමාලාවල අධ්‍යයන කරනු ලැබීම පිණිස ඉටුකළ යුතු නියම හා කොන්දේසි පිළිබඳ විශ්වවිද්‍යාල සහ සහයක වෘත්තීන්ගේ පුහුණු ආයතන සමඟ වැඩපිළිවෙළක් යොදා ගැනීම;

(ii) මෙම පනත යටතේ ආයුර්වේද වෛද්‍යවරුන් ලියාපදිංචිය සඳහා සලකා බැලිය යුතු වීම පිණිස විශ්වවිද්‍යාල ආයතන මඟින් පවත්වනු ලබන මූලික උපාධි, පශ්චාත් උපාධි සහ අනෙකුත් සහයක වෘත්තීන් ලියාපදිංචිය සඳහා සලකා බැලිය යුතු වීම පිණිස විශ්වවිද්‍යාල හෝ පිළිගත් රාජ්‍ය ආයතනයක් මඟින් පවත්වනු ලබන මූලික උපාධි පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතික පත්‍ර පාඨමාලාවල අධ්‍යාපන පද්ධති නිශ්චය කිරීම, ප්‍රමිති කිරීම, පිළිගැනීම හා අනුමත කිරීම;' "

(2) "13 වන පිටුවේ, 1 වන සහ 2 වන පේළි ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(iii) රාජ්‍ය සේවයෙහි නියුතු වෛද්‍ය නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග හා මෙම පනත යටතේ ලියාපදිංචිය සඳහා සලකා බලනු ලබන සම්බාහන වෘත්තිකයන් සඳහා වන පාඨමාලාවල විභාග පැවැත්වීම සහ දේශීය හෝ විදේශීය' "

(3) "13 වන පිටුවේ, 15 වන සහ 16 වන පේළි ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' "වෛද්‍ය ලියාපදිංචිය සඳහා වෛද්‍ය උසස් අධ්‍යාපනය සඳහා අවශ්‍ය තැනැත්තන්ට මූලික උපාධි හෝ පශ්චාත් උපාධි ලබා ගැනීමට සම්බාහක පාඨමාලා සම්බන්ධ සහතික පත්‍ර ලබා ගැනීමට තැනැත්තන්ට" යන වචන ආදේශ' "

(4) "13 වන පිටුවේ, 19 වන සහ 20 වන පේළි ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' "වෛද්‍ය ලියාපදිංචිය සඳහා, වෛද්‍ය උසස් අධ්‍යාපනය සඳහා අවශ්‍ය තැනැත්තන්ට මූලික උපාධි හෝ පශ්චාත් උපාධි ලබා ගැනීමට සහ සහයක අනෙකුත් වෘත්තීන් වන හෙද සහ සම්බාහන පාඨමාලා සම්බන්ධ තැනැත්තන්ට", යන වචන ආදේශ' "

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමා, එම සංශෝධනවලට එකඟද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
එකඟ නැහැ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
ගරු සභාපතිතුමනි, ගරු ඇමතිතුමා සිදු කරන සංශෝධනයෙන් කියැවෙන්නේ ඔය අදහස නොවෙයි. පනත්

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

කෙටුම්පතේ සඳහන් කර තිබෙන්නේ වෛද්‍යවරුන්ට, සහයකයින්ට, හෙදියන්ට, ඖෂධවේදීන්ට ආදි සියල්ලන්ටම උපාධි, ඩිප්ලෝමා සහ සහතික පත්‍ර දෙන්න කියලා. ඒ වගන්තිය ඒ විධියට සම්මත වුණොත් වෛද්‍යවරුත් පිටවේවි, සහතිකයක් පිට; වෛද්‍යවරුත් පිටවේවි, ඩිප්ලෝමා එකක් පිට. ඒ නිසායි අප වෙන් වෙන්ව සඳහන් කර තිබෙන්නේ, වෛද්‍යවරුන්ට හා විශේෂඥ වෛද්‍යවරුන්ට උපාධි, අනෙක් අයට ඩිප්ලෝමා සහ සහතික පත්‍ර කියලා.

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මේ වන විට අප ලබා දෙන්නේ උපාධිධාරීන්ට "උපාධිධාරී වෛද්‍ය" කියන ලියාපදිංචිය. පාරම්පරික වෛද්‍යවරුන්ට ලබා දෙන්නේ අදාළ සර්වාංග හෝ විශේෂ ලියාපදිංචිය. අලුත් ඩිප්ලෝමා සහතික ලබා දෙන්නේ නැහැ. ඩිප්ලෝමා සහතික ලබාදෙන ආයුර්වේද ශාස්ත්‍රීය පරීක්ෂණය - DA එක - තිබෙනවා. ඒ නිසා ඒවා එකිනෙකට වෙනස් අංශ තුනක්. විශ්වවිද්‍යාලයෙන් පිට වන අයට උපාධිධාරී, ශාස්ත්‍රීය විභාගය කරන අයට ශාස්ත්‍රීය ඩිප්ලෝමාව - DA එක -, පාරම්පරික වෛද්‍යවරුන්ට වෘත්තීය ලියාපදිංචිය. අපි යම් ලෙසකින් ඒවා වෙනස් කරන්න ගියොත් මුළු ආකෘතියේම වෙනසක් වෙනවා වාගේම ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉදිරිපත් කර තිබෙන මාර්ගෝපදේශවලට පටහැනිව අප කටයුතු කළා වෙනවා. ගරු අමාත්‍යතුමාගේ සාධනීය පිළිතුරු තිබුණත්, අපි ශ්‍රේෂ්ඨාධිකරණයේ මාර්ගෝපදේශවලට යටත්වයි අපේ සංශෝධන සාකච්ඡා කරලා ඉදිරිපත් කර තිබෙන්නේ. ඩිප්ලෝමා සහතික හිතුමතයට දෙන්න බැරි, ශාස්ත්‍රීය විභාගයේදී-

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)

ඒක තමයි කියන්නේ. ඒකම තමයි මමත් කියන්නේ. ඔය පනත් කෙටුම්පතේ වචන යොදලා තිබෙන හැටි බලන්න. පනත් කෙටුම්පතේ තිබෙන්නේ ඔක්කොම එකට දාලා; වෛද්‍ය, ඖෂධවේදී, හෙද ආදි ඔක්කොටම දාලා උපාධි, ඩිප්ලෝමා සහ සහතික දෙන්න කියලා. එතකොට වෛද්‍යවරයාටත් පුළුවන් සහතිකයෙන් යන්න; ඩිප්ලෝමා එකෙන් යන්න. දැන් ඩිප්ලෝමා නැති කරලා නේ තිබෙන්නේ. ඒක වෙන් කරන්න කියලායි අප කියන්නේ, වෛද්‍ය සහ විශේෂඥ වෛද්‍යවරුන්ට උපාධි, අනෙක් අයට ඩිප්ලෝමා සහ සහතික පත්‍ර යනුවෙන්.

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)

ඇත්තටම ඒවා දැනටමත් වෙන් කරලා තිබෙන්නේ. ආයුර්වේද දෙපාර්තමේන්තුව එක්ක අවුරුදු දෙකක් තිස්සේ සිදු කරපු දීර්ඝ සාකච්ඡාවක ප්‍රතිඵල වශයෙනුයි අපි මේ වගන්ති ඉදිරිපත් කළේ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)

උපාධිය වෙනුවට ඩිප්ලෝමා එකක් අරගෙන ආවොත් තමුන්නාන්සේට දෙන්න වෙනවා. එච්චරයි වෙන්නේ. මට කමක් නැහැ.

**ගරු නීතිඥ සිසිර ජයකොඩි මහතා**
(மாண்புமிகு சட்டத்தரணி சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody, Attorney-at-Law)

නැහැ, ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ලබා දුන් මාර්ගෝපදේශවලට යටත්ව තමයි අපි මේ සංශෝධන ඉදිරිපත් කළේ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)

ඒ මාර්ගෝපදේශ ගැන නොවෙයි නේ මේ කථා කරන්නේ. Supreme Court එක බලන්නේ නැහැ නේ, කාටද උපාධි දෙන්නේ, කාටද සහතික පත්‍ර දෙන්නේ කියලා. ඒක සුප්‍රීම් උසාවියේ කටයුත්තක් නොවෙයි නේ. *[බාධා කිරීමක්]* ඒක අපේ ප්‍රතිපත්තිමය තීරණයක්. *[බාධා කිරීමක්]* දැන් අපි ප්‍රතිපත්තියක් ගෙන තිබෙනවා, වෛද්‍යවරුන්ට උපාධි- *[බාධා කිරීමක්]* තමුන්නාන්සේ කියන විධියට සඳහන් කළාම සමහරු වෛද්‍යවරුන් යැයි කියාගෙන සහතික පත්‍ර අරගෙන ඒවි, "මට සහතිකයක් තිබෙනවා, මමත් වෛද්‍යවරයෙක්" කියලා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

20 වන වගන්තිය ඇති සැටියෙන් සම්මතයි.

***20 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*20ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 20, ordered to stand part of the Bill.*

## 21 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය සංශෝධනය කිරීම)

### வாசகம் 21.- (முதன்மைச் சட்டவாக்கத்தின் 33ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 21.- *(Amendment of section 33 of the principal enactment)*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "14 වන පිටුවේ, 8 වන පේළියේ සිට12 වන පේළිය දක්වා වන පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ඈ) ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, යාපනය විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨය නියෝජනය කරමින් එකී එක් එක් විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විෂයය සඳහා වන මහාචාර්යවරු සිව් දෙනෙකු' "

(2) "14 වන පිටුවේ, 25 වන පේළිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(එ) විශේෂ නාම ලේඛනයේ ලියාපදිංචි වූ ආයුර්වේද වෛද්‍යවරුන් අතරින් අමාත්‍යවරයා විසින් පත් කළ සාමාජිකයන් දෙදෙනෙකු; සහ

(ඒ) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ' "

(3) "14 වන පිටුවේ, 29 වන පේළිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'යන සමාජිකයන් දාහතර දෙනෙකුගෙන් සමන්විත විය' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
සංශෝධන ඉදිරිපත් කිරීමට, ගරු රාජිත සේනාරත්න මැතිතුමා.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senarathne)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා.

(1) "14 වන පිටුවේ, 5 වන පේළිය ඉවත් කොට පහත පේළිය ආදේශ කරන්න:

'(ආ) ජාතික ආයුර්වේද රෝහලේ ප්‍රධානියා' "

(2) "14 වන පිටුවේ, 8 වන සහ 9 වන පේළි ඉවත් කොට පහත පේළි ආදේශ කරන්න:

'(ඇ) කොළඹ විශ්වවිද්‍යාලය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විද්‍යාලයේ දේශීය වෛද්‍ය පීඨයේ, යාපනය විශ්වවිද්‍යාලය,' "

(3) "14 වන පිටුවේ, 11 වන සහ 12 වන පේළි ඉවත් කොට, පහත පේළි ආදේශ කරන්න:

'යන එක් එක් විශ්වවිද්‍යාල, කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂ සහ සියලු මූලික උපාධි වෛද්‍ය පාඨමාලා නියෝජනය වන පරිදි මහාචාර්යවරු හය දෙනෙකු' "

(4) "14 වන පිටුවේ, 22 සිට 24 දක්වා පේළි සම්පූර්ණයෙන් ඉවත් කරන්න."

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ පනත් කෙටුම්පතේ තිබෙන එක ප්‍රශ්නයක් තමයි, "ආයුර්වේද ජාතික රෝහල" යනුවෙන් සඳහන් කර තිබීම. ලෝකයේ සම්මතයක් තිබෙනවා නේ. "ආයුර්වේද ජාතික රෝහල" වෙන්නේ නැහැ නේ. නමුත්, පනත් කෙටුම්පතේ සඳහන් කර තිබෙන්නේ, "ආයුර්වේද ජාතික රෝහල" කියලා. වෙන්න ඕනෑ, National Ayurveda Hospital කියලා. එහෙම නේ, වෙන්න ඕනෑ. Ayurveda National Hospital කියන්නේ නැහැ නේ. ඒ වාගේ දේවල් වෙනස් කරන්න කියලා තමයි මේ සංශෝධනයේ සඳහන්ව තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමා, එම සංශෝධනය භාර ගන්නවා ද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මා විසින් ඉදිරිපත් කරන ලද සංශෝධනවලට එකඟයි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමාගේ සංශෝධනවලට යටත්ව 21 වන වගන්තිය සම්මතයි.

***21 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*21ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 21 , as amended, ordered to stand part of the Bill.*

***22 සහ 23 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*22ஆம், 23ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 22 and 23 ordered to stand part of the Bill.*

## 24 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම)
### வாசகம் 24.- (முதன்மைச் சட்டவாக்கத்தின் 51ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 24.- *(Amendment of section 51 of the principal enactment)*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "15 වන පිටුවේ, 18 වන පේළියේ සිට 26 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන් ඡේදය අලුතින් එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ' "

(2) "16 වන පිටුවේ, 1 වන පේළියේ සිට 6 වන පේළිය දක්වා පේළි (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න.' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***24 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*24ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 24, as amended, ordered to stand part of the Bill.*

## 25 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම)
### வாசகம் 25.- (முதன்மைச் சட்டவாக்கத்தின் 52ஆம் பிரிவைத் திருத்துதல்)
CLAUSE 25.- *(Amendment of section 52 of the principal enactment)*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"16 වන පිටුවේ, 7 වන පේළියේ සිට 30 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න.' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***25 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*25ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 25, as amended, ordered to stand part of the Bill.*

***26 සිට 41 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.***

*26ஆம் வாசகத்திலிருந்து 41ஆம் வாசகம் வரை சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 26 to 41 ordered to stand part of the Bill.*

## 42 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 77 වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 42.- (முதன்மைச் சட்டவாக்கத்தின் 77ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 42.- *(Amendment of section 77 of the principal enactment)*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"26 වන පිටුවේ, 7 වන පේළිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(ඒ) වගා කිරීම සඳහා බලපත්‍රයක් හෝ අවසරපත්‍රයක් අවශ්‍ය වන යම් ඖෂධීය පැළෑටියක් ප්‍රකාශයට පත් කිරීම; සහ

(ඔ) ඉහත කී කාරණා හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික' "

***සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendment put, and agreed to.*

***42 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*42ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 42, as amended, ordered to stand part of the Bill.*

***43 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*43ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 43 ordered to stand part of the Bill.*

## 44 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 80 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම)

வாசகம் 44.- (முதன்மைச் சட்டவாக்கத்தின் 80ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 44. - *(Replacement of section 80 of the principal enactment)*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "27 වන පිටුවේ, 15 සහ 16 වන පේළි ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පණස් දහසකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි' "

(2) "27 වන පිටුවේ, 21 වන පේළියේ සිට 32 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'(2) මේ පනත යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක අධිකාරය යටතේ ආයුර්වේදයේ නියැලී සිටිය දී මේ පනතේ විධිවිධාන, ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීති උල්ලංඝනය කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් සිදුකරනු ලබන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ එකකට නොවැඩි දඩයකට හෝ වසර එකකට නොවැඩි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතුය.' "

(3) "27 වන පිටුවේ, 36 සහ 37 පේළි ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'කරනු ලැබීමේ දී රුපියල් ලක්ෂ එකකට නොවැඩි දඩයකට හෝ වසර එකකට නොවැඩි කාල සීමාවක්' "

(4) "28 වන පිටුවේ, 9 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'නොමැතිව කරගෙන යන්නේ නම්; හෝ' "

(5) "28 වන පිටුවේ, 22 සහ 23 වන පේළි ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

'ලක්ෂ දෙකකට නොවැඩි දඩයකට හෝ වසර එකකට නොවැඩි කාල සීමාවක්' "

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Amendments put, and agreed to.*

***44 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*44ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 44, as amended, ordered to stand part of the Bill.*

***45 වන වගන්තිය, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*45ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*
*Clause 45 ordered to stand part of the Bill.*

## 46 වන වගන්තිය.- (ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තිය සංශෝධනය කිරීම)

வாசகம் 46.- (முதன்மைச் சட்டவாக்கத்தின் 89ஆம் பிரிவைத் திருத்துதல்)

CLAUSE 46. - *(Amendment of section 89 of the principal enactment)*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) "30 වන පිටුවේ, 5 වන පේළියේ සිට 11 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' 'ආයුර්වේද' යන්නට ආයුර්වේද, සිද්ධ, යුනානි සහ දේශීය චිකිත්සා වෛද්‍යකර්ම සහ ශල්‍යකර්මය ද වෙනත් යම් ආසියාතික රටවලට ආවේණික හා ඒ අදාළ රටවල රජයන් විසින් පිළිගත් වෙනත් යම් වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම ද ඇතුළත් වේ.' "

(2) "30 වන පිටුවේ, 12 වන පේළියේ සිට 16 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න."

(3) "31 වන පිටුවේ, 18 වන පේළියේ සිට 21 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' 'ඖසු වගාව' යන්නෙන්, ආයුර්වේද ඖෂධ සංග්‍රහයේ නියම කරන ලද ආයුර්වේද කාර්ය සඳහා වන යම් ඖෂධීය ශාක වගාවක් අදහස් වන අතර එයට වාණිජමය කාර්ය සඳහා යොදා ගැනෙන එවැනි වගාවක ඵලදාව, අස්වැන්න හෝ අවශේෂ ද අයත් වේ.' "

(4) "31 වන පිටුවේ, 27 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' '(5) ස්වදේශීය වෛද්‍ය රෝහල' යන යෙදුමේ අර්ථ නිරූපණයට' "

(5) "32 වන පිටුවේ, 1 වන පේළිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' 'ප්‍රාථමික සෞඛ්‍ය රැකවරණය' යන්නෙන් ජනතාවගේ අවශ්‍යතා කේන්ද්‍රකොට ගනිමින් සහ රෝග වැළැක්වීමේ සිට ප්‍රතිකාරය, පුනරුත්ථාපනය සහ උවටැන් සැලසීම දක්වා කාරණා අඛණ්ඩව පවත්වාගනිමින් ජනතාවගේ දෛනික පරිසරයට හැකි පමණ සමීප වන ලෙස හැකි උපරිම තලයේ සෞඛ්‍ය සහ සුබසාධනය මෙන්ම ඒවායේ සාධාරණ බෙදීයාමක් සහතික කිරීම අරමුණු කොටගත් නිරෝගී බව සඳහා වූ සමස්ත සමාජයීය ප්‍රවේශයක් අදහස් වේ.

(6) 'ආයුර්වේද වෛද්‍යවරුන්ගේ නාමලේඛනය' යන යෙදුමේ' "

(6) "32 වන පිටුවේ, 18 වන පේළියේ සිට 21 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:

' 'ලියාපදිංචි ආයුර්වේද සම්බාහන ශිල්පියා' යන්නෙන් මේ පනත යටතේ ආයුර්වේද සම්බාහන ශිල්පියකු ලෙස ලියාපදිංචි තැනැත්තකු අදහස් වේ.' "

(7) "32 වන පිටුවේ, 22 වන පේළියේ සිට 26 වන පේළිය දක්වා (ඒ පේළි දෙක ද ඇතුළුව) ඉවත් කරන්න."

***සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

**ගරු සභාපතිතුමා**

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

ගරු රාජිත සේනාරත්න මන්ත්‍රීතුමා, සංශෝධන ඉදිරිපත් කරන්න.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**

(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)

(The Hon. (Dr.) Rajitha Senarathne)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"33 වන පිටුවේ, 4 වන පේළියට ඉනික්බිතිව පහත පේළි ඇතුළත් කරන්න:

'4 වන වගන්තියේ ආයුර්වේද අධ්‍යක්ෂකවරු පහත පරිදි "අතිරේක ආයුර්වේද අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණික), අතිරේක ආයුර්වේද අධ්‍යක්ෂ ජනරාල් (පාලන), ආයුර්වේද අධ්‍යක්ෂක (ආයුර්වේද සෞඛ්‍ය සේවා), ආයුර්වේද අධ්‍යක්ෂක (ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය), ආයුර්වේද අධ්‍යක්ෂ (පුද්ගලික සේවා), ආයුර්වේද අධ්‍යක්ෂ (මූල්‍ය), ආයුර්වේද අධ්‍යක්ෂ (පාලන), ආයුර්වේද අධ්‍යක්ෂ (සැලසුම්), ආයුර්වේද අධ්‍යක්ෂක (යුනානි), ආයුර්වේද අධ්‍යක්ෂක (සිද්ධ), ආයුර්වේද අධ්‍යක්ෂක (පාරම්පරික) යන වචන අවස්ථාවෝචිත පරිදි ඇතුළත් විය යුතුය.' "

**ගරු සභාපතිතුමා**

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

ගරු ඇමතිතුමා, එම සංශෝධනයට එකඟද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**

(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)

(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

එකඟ නැහැ.

**ගරු සභාපතිතුමා**

(மாண்புமிகு தவிசாளர் அவர்கள்)

(The Hon. Chairman)

ගරු අමාත්‍යතුමාගේ සංශෝධනවලට යටත්ව 46 වන වගන්තිය සම්මතයි.

***46 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*46ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clause 46, as amended, ordered to stand part of the Bill.*

***47 සහ 48 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.***

*47ஆம், 48ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*Clauses 47 and 48 ordered to stand part of the Bill.*

## පොදු සංශෝධන
## பொதுத் திருத்தங்கள்
## GENERAL AMENDMENTS

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**

(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)

(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධන ඉදිරිපත් කරනවා:

(1) " 'ආයුර්වේද හෙද සේවකයන්' යන වචන පනත් කෙටුම්පතේ දැක්වෙන සෑම තැනකටම, ඒ වෙනුවට, 'ආයුර්වේද හෙද හෙදියන්' යන වචන ආදේශ කිරීමෙන්;

(2) 'ආයුර්වේද භෛසජ්ජක' සහ 'භෛසජ්ජක' යන වචන පනත් කෙටුම්පතේ දැක්වෙන සෑම තැනකටම, ඒ වෙනුවට, 'ආයුර්වේද ඖෂධවේදී' සහ 'ඖෂධවේදී' යන වචන ආදේශ කිරීමෙන්;

(3) 'ආයුර්වේද සම්බාහන ශිල්පියා සහ සම්බාහන ශිල්පිනිය' යන වචන පනත් කෙටුම්පතේ දැක්වෙන සෑම තැනකටම, ඒ වෙනුවට, 'ආයුර්වේද සම්බාහන ශිල්පී' යන වචන ආදේශ කිරීමෙන්;

(4) 'ඩිප්ලෝමා' යන වචනය පනත් කෙටුම්පතේ දැක්වෙන සෑම තැනකටම ඒ වෙනුවට 'අභිඥාන පත්‍ර' යන වචන ආදේශ කිරීමෙන්;

(5) 'ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති' යන වචන පනත් කෙටුම්පතේ දැක්වෙන සෑම තැනකටම ඒ වෙනුවට 'ශ්‍රී ලංකාවේ කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති' යන වචන ආදේශ කිරීමෙන්;

(6) 'ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති' යන වචන පනත් කෙටුම්පතේ දැක්වෙන සෑම තැනකටම ඒ වෙනුවට 'ශ්‍රී ලංකාවේ ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපති' යන වචන ආදේශ කිරීමෙන්;

(7) 'ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකය' යන වචන පනත් කෙටුම්පතේ දැක්වෙන සෑම තැනකටම ඒ වෙනුවට 'ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨය' යන වචන ආදේශ කිරීමෙන්;

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

(8) 'ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය ඒකකයේ ප්‍රධානියා' යන වචන කෙටුම්පතේ දැක්වෙන සෑම තැනකටම ඒ වෙනුවට 'ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සිද්ධ වෛද්‍ය පීඨයේ පීඨාධිපති' යන වචන ආදේශ කිරීමෙන්."

*සංශෝධන පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

*திருத்தங்கள் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Amendments put, and agreed to.*

*ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.*

*පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.*

*சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported with Amendments.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**

(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)

(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

තවද, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල භාෂා දෝෂ, මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ හා අංක දෝෂ නිවැරැදි කර ගැනීම සහ ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

*පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන්වන වර කියවා සම්මත කරන ලදී.*

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill, as amended, accordingly read the Third time, and passed.*

## ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

### ஸ்ரீ பாலாபிவூர்தி வர்தன சமிதிய (கூட்டிணைத்தல்) சட்டமூலம்

### SRI BALABHIVURDHI WARDANA SAMITHIYA (INCORPORATION) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*

*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for Second Reading read.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**

(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)

(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, "ශ්‍රී බාලාභිවෘධි වර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදින්, 53(3) වන ස්ථාවර නියෝගය යටතේ, ගරු කථානායකතුමා විසින් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී.*

*சட்டமூலம் இதன்படி, இரண்டாம் முறை மதிப்பிடப்பட்டு நிலைக் கட்டளை 53(3)இன்படி சட்டவாக்க நிலையியற் குழுவிற்கு மாண்புமிகு சபாநாயகர் அவர்களால் சாட்டப்பட்டது.*

*Bill accordingly read a Second time, and allocated by THE HON. SPEAKER to the Legislative Standing Committee under Standing Order 53(3).*

## සමාධි ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත

### சமாதி சமூக அபிவிருத்தி மன்றம் (கூட்டிணைத்தல்) சட்டமூலம்

### SAMADHI COMMUNITY DEVELOPMENT FOUNDATION (INCORPORATION) BILL

*දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.*

*இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for Second Reading read.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**

(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)

(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, "සමාධි ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි මා යෝජනා කරනවා.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

*පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදින්, 53(3) වන ස්ථාවර නියෝගය යටතේ, ගරු කථානායකතුමා විසින් ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාවට පවරන ලදී.*

*சட்டமூலம் இதன்படி, இரண்டாம் முறை மதிப்பிடப்பட்டு நிலைக் கட்டளை 53(3)இன்படி சட்டவாக்க நிலையியற் குழுவிற்கு மாண்புமிகு சபாநாயகர் அவர்களால் சாட்டப்பட்டது.*

*Bill accordingly read a Second time, and allocated by THE HON. SPEAKER to the Legislative Standing Committee under Standing Order 53(3).*

## වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත

### சொத்துக்களையும் பொறுப்புக்களையும் வெளிப்படுத்தல் (திருத்தம்) சட்டமூலம்

### DECLARATION OF ASSETS AND LIABILITIES (AMENDMENT) BILL

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**

(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)

(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ජනාධිපති නීතිඥ (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා විසින් 2021 ජනවාරි 7 වන දින පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් ලෙස පාර්ලිමේන්තුවට පිළිගන්වන ලදුව, අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 4 ලෙස සඳහන් "වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගැනීමට මා අවසර පතනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

***අවසර දෙන ලදුව පනත් කෙටුම්පත ඉල්ලා අස්කර ගන්නා ලදී.***
*சட்டமூலம், அனுமதியுடன் வாபஸ் பெறப்பட்டது.*
*Bill, by leave, withdrawn.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු මංජුලා දිසානායක මැතිනිය.

## බාල වරදකරුවන් සමාජගත කිරීමේදී මතු වන ගැටලු
## சிறார் குற்றவாளிகளைச் சமூகமயப்படுத்தும்போது ஏற்படும் பிரச்சினைகள்
## ISSUES RELATED TO REINTEGRATION OF YOUNG OFFENDERS

[අ.භා. 5.49]

**ගරු මංජුලා දිසානායක මහත්මිය**
(மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க)
(The Hon.(Mrs.) Manjula Dissanayake)
ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"වයස අවුරුදු 18ට අඩු බාලවයස්කරුවන් මෙන්ම තරුණ පිරිස විසින් සිදු කරනු ලබන යම් යම් වැරදි හේතුවෙන් අධිකරණයෙන් දඬුවම් ලැබ සහ පුනරුත්ථාපන කටයුතුවලට භාජනය වී නැවත සමාජගත වන තරුණ පිරිස් නීතියෙන් දඬුවම් ලැබූවන් ලෙස වාර්තාගත වෙනවා.

මෙම තරුණ පිරිස් නැවත සමාජයේ රැකියාවලට අයදුම් කිරීමේදී හා වෙනත් කටයුතුවලට යොමු වීමේදී නීතියෙන් දඬුවම් ලැබූවන් ලෙස සමාජයට නිරාවරණය වන බැවින්, ඔවුන්ට රැකියා ලබා ගැනීමට හා අනෙකුත් සමාජ ක්‍රියාකාරකම්වලට යාමේදී විවිධ බාධාවන්ට හා විවිධ සමාජ අසාධාරණකම්වලට මුහුණ පෑමට සිදු වේ.

එබැවින් යහමඟට පැමිණි බාලවයස්කරුවන් සඳහා සහ තරුණ පිරිසට ඇතිවන මෙම බාධා ඉවත් කිරීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදන සකස් කළ යුතු යැයි මෙම ගරු සභාවට මම යෝජනා කරමි."

ගරු කථානායකතුමනි, වර්තමානය වන විට අපේ තරුණ දරුවන් විශාල පිරිසක් අධ්‍යාපන කටයුතු සඳහා, රැකියා සඳහා විදේශගත වෙනවා. ඒ අවස්ථාවලදී ඔවුන්ට පොලිස් වාර්තාවක් ලබා ගැනීමට සිද්ධ වෙනවා. ගරු කථානායකතුමනි, තරුණ පිරිස් වාගේම බාලවයස්කාර දරුවන් නොදැනුවත්කමින් හෝ අත් වැරදීමකින් හෝ බල අපරාධ නොවන සුළු අපරාධ කළ පසු යම් දඬුවමක් ලබලා, පුනරුත්ථාපනය වෙලා සමාජගත වීමෙන් පසුව නැවත අධ්‍යාපනය ලබනවා. යහපත් පුරවැසියන් ලෙස මේ සමාජයේ ජීවත් වීම සඳහා ඔවුන්ට රැකියාවක් ලබා ගැනීමට හෝ වෙනත් කටයුත්තකට -ඔවුන්ට නීතිමය වශයෙන් යම් යම් ගැටලුසහගත තත්ත්ව තිබෙන නිසා- පොලිස් වාර්තා ලබා ගන්නවා. ඔවුන් නීතියෙන් දඬුවම් ලැබූ පිරිසක් හැටියට එම වාර්තාවල සඳහන් කරනවා. එවැනි අවස්ථාවලදී මුළු ජීවිතයම යථා තත්ත්වයට පත් කර ගන්න බැරි තැනකට ඔවුන් පත් වෙනවා. ඒ ගැන ඔවුන් අපිත් එක්ක ඇවිල්ලා කථා කරලා තිබෙනවා. මවක් විධියට මම ඉතා සානුකම්පිතව ඒ දරුවන්ගේ ප්‍රශ්නවලට ඇහුම්කන් දීලා තිබෙනවා. නමුත්, අපට ඒ වෙනුවෙන් ගන්න පුළුවන් පියවර මොකක්ද? මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරියක විධියට මට ඒ දරුවෝ වෙනුවෙන් කරන්න පුළුවන් මොකක්ද කියලා ගැටලුසහගත තත්ත්වයක් ඇති වුණා. ඒ නිසා තමයි අද මම මේ කාරණය මේ මේ ගරු උත්තරීතර සභාවට යොමු කරන්නේ. විශේෂයෙන්ම මම මේ කාරණය ගරු අධිකරණ අමාත්‍යතුමා වෙත යොමු කරන්න කැමැතියි. ඒ වාගේම අපේ අනාගත පරපුරට මේ කටයුතුවලදී යම් සාධාරණයක් ඉටු විය යුතුයි කියාත් මා යෝජනා කරනවා.

ගරු කථානායකතුමනි, මම ඉතා කෙටියෙන් මේ අවස්ථාවේ යෝජනා කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපේ දරුවන්ට ලැබිලා තිබෙන අයිතිවාසිකම් වාගේම, ජීවත්වීමේ අයිතියත් ඔවුන්ට මේ උත්තරීතර සභාව තුළින් අපි ලබා දිය යුතු බවයි. ඒ නිසා ඇති වෙලා තිබෙන මේ ගැටලුව නිරාකරණය කර ගැනීම සඳහා නීතිමය වශයෙන් යම් සංශෝධන ගෙනැල්ලා සුදුසු මට්ටමකට ඒ අයගේ මානසික තත්ත්වය යහපත් කරනවා වාගේම, ඒ අයගේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා මේ උත්තරීතර සභාවට තීරණාත්මක වූ නීති-රීති ගෙනැල්ලා සුදුසු පියවරක් ගත යුතුයි කියාත් යෝජනා කරමින්, මේ යෝජනාව වෙනුවෙන් අදහස් දක්වන්න එකතු වෙන අයට ඒ සඳහා ඉඩහසර ලබා දෙමින් මා නිහඬ වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
යෝජනාව ස්ථිර කිරීම, ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමා.

[අ.භා. 5.53]

**ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා**
(மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய)
(The Hon. (Major) Sudarshana Denipitiya)
ගරු කථානායකතුමනි, ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මා ස්ථිර කරනවා.

ගරු කථානායකතුමනි, වයස අවුරුදු 18ට අඩු බාලවයස්කරුවන් මෙන්ම තරුණ පිරිස විසින් සිදු කරනු ලබන යම් යම් වැරදිවලට අධිකරණයෙන් දඬුවම් ලැබූ සහ පුනරුත්ථාපන කටයුතුවලට භාජන වී සමාජගත වන තරුණ පිරිස් නීතියෙන් දඬුවම් ලැබූවන් ලෙස වාර්තා වෙනවා. මේ පිළිබඳව හැම තැනකම කථා වෙනවා. නමුත්, ඒකට කිසිම පිළිතුරක්

[ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා]

ලැබිලා නැති තත්ත්වයක් තමයි තිබෙන්නේ. මොකක් හෝ වැරැද්දක් කරලා ඒකට දඬුවම් ලැබීමෙන් පසු සමාජගත වුණත් ඔවුන්ට වැරදිකරුවන් කියන ලේබල් එක වැදිලා ඉවරයි. එතකොට ඔවුන් තවත් විනය විරෝධී කටයුතු කරන්න පෙලඹෙනවා. මොකද, ඔවුන්ට වැදුණු ඒ ලේබල් එක නිසා. ගරු කථානායකතුමනි, ඔවුන් පුනරුත්ථාපනයෙන් පස්සේ ගෙදරට යනකොට මොකක්ද වෙන්නේ? සමහර වෙලාවට ඒ පුද්ගලයා මත්ද්‍රව්‍ය පාවිච්චි කළ කෙනෙක් වෙන්න පුළුවන්. එහෙම නැත්නම් හොරකමක්, දූෂණයක්, අපරාධයක් කරපු කෙනෙක් වෙන්න පුළුවන්. ඒ අය පුනරුත්ථාපනය කරලා තමයි නැවත සමාජයට යොමු කරන්නේ. එහෙම පුනරුත්ථාපනය කරලා සමාජයට යොමු කළත්, සමාජය ඔවුන් පිළිගන්නේ නැහැ. සමාජයෙන් ඔවුන්ට කියනවා, කුඩු ගහලා අහුවෙලා පුනරුත්ථාපනය වෙලා දැන් ඇවිල්ලා ඉන්නවා කියලා. ඔවුන් සමාජයට යන්නේ නැවත වතාවක් ඒ වැරැද්ද කරන්නේ නැහැ කියලා හිතාගෙන.

නමුත්, සමාජයෙන්ම ඒ අය කොන් කරලා පැත්තකට කරනවා. Police report එකක් ගන්න ගියාම, ග්‍රාම නිලධාරි සහතිකයක් ගන්න ගියාම, පාසල් සහතිකයක් ගන්න ගියාම, චරිත සහතිකයක් ගන්න ගියාම වුණත් ඔවුන්ට කවදාවත් ඒ සහතිකය හරියට ලැබෙන්නේ නැහැ. මොකද, ඒ කරපු වරද නිසා. සමහර වෙලාවට ඒක ඔවුන් නොදැන කරපු වරදක් වෙන්නත් පුළුවන්. එම නිසා පුනරුත්ථාපනයෙන් පසු සමාජගත කරන කොට ඔවුන්ට යම්කිසි අරමුණක්, target එකක් දෙන්න ඕනෑ. එවැනි අරමුණක් ලබා නොදීම තමයි සමාජයෙන් කරන වැරැද්ද. පුනරුත්ථාපන ක්‍රියාවලියෙන් පස්සේ රැකියාවක් කරා යොමු වෙන්න කියලා ඔවුන්ට අරමුණක් දෙන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, මා නම් යෝජනා කරන්නේ, ඔවුන්ට විදේශ රැකියාවකට යන්න අවස්ථාව ලබා දෙන්න ඕනෑ කියලායි. විදේශ රැකියා අවස්ථා ඕනෑ තරම් දැන් අපට ලැබිලා තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, කොරියාවට weldersලා 14,000කගේ විතර රැකියා අවස්ථා ප්‍රමාණයක් ලැබිලා තිබෙනවා. ඒ අය train කරලා, කොරියන් භාෂාවත් උගන්වලා ඒ අවශ්‍ය සුදුසුකම් එක්ක සමාජගත කරන්න පුළුවන් නම්, ඔවුන්ට අරමුණක් තිබෙනවා, ආපසු ඒ වැරැදිවලට සම්බන්ධ නොවී විදේශ රටකට ගිහිල්ලා ජීවිතය ගොඩ නහා ගන්න පුළුවන් කියලා. හොඳ රැකියාවක් හම්බ වුණාම ඔවුන්ගේ ජීවිතය ගොඩ නහා ගන්න පුළුවන්. ඒ වාගේ ක්‍රමයක් ඇති කළොත් තමයි ඔවුන් යහමඟට ගන්න පුළුවන් වෙන්නේ. එහෙම නැත්නම් ඔවුන් ගෙදරට ආපු ගමන් සමාජයට වෛර කරනවා. ඔවුන් කොන් කරන්න, කොන් කරන්න සමාජයට වෛර කරනවා. සමාජයට වෛර කිරීම නිසා ඔවුන් පාතාලය පැත්තට එකතු කර ගන්නත් සමහරු උත්සාහ කරනවා. ඔවුන් යන එන තැන්වල පාතාලයට සම්බන්ධ පුද්ගලයන් ගැවසෙන නිසා ඒ අයගේ අනුදැනුම මත මේ පිරිස පාතාලයට සම්බන්ධ වෙන්නත් පුළුවන්. සමාජයෙන් කොන් කරලා කෙළවරකට කරලා තිබෙන නිසා ඔවුන්ට කර ගන්න දෙයක් නැහැ. ඔවුන්ගේ එකම option එක තමයි, පාතාලයට ගිහිල්ලා මුදල් හොයන එක. ඒ විධියට මොකක් හරි වැරැදි වැඩක් කරන්න තමයි ඔවුන් උත්සාහ කරන්නේ.

ගරු කථානායකතුමනි, ඔවුන් ඒකෙන් ගලවා ගන්න අපි ලොකු වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුයි. එහෙම නැතුව ඔවුන් කොච්චර සමාජගත කළත් වැඩක් වෙන්නේ නැහැ. ඒක හරිම sensitive issue එකක්. ඔවුන් නැවතත් වෙනත් වැරැදිවලට හෝ පෙලඹෙන්න පුළුවන්. මුදල් හොයන්න, ඔවුන් සමාජයෙන් කොන් කරන පුද්ගලයන්ගෙන් පළිගන්න ඔවුන් කටයුතු කරනවා. අපි එවැනි කථා තමයි පාතාලය සම්බන්ධයෙන් අහලා තිබෙන්නේ. පාතාලයට සම්බන්ධ පුද්ගලයන් ඔක්කෝම වාගේ කුමන හෝ සමාජ අසාධාරණයට ලක් වෙලා තිබෙනවා. ඔවුන් සමාජයෙන් කොන් කරපු නිසා තමයි එහෙම වෙලා තිබෙන්නේ. එම නිසා ඒ තත්ත්වයෙන් අපි ඒ දරුවෝ ගොඩගත යුතුමයි. ඔවුන් අත මොන වරද තිබුණත්, අපි ඔවුන් ගොඩගත යුතුමයි. ගරු කථානායකතුමනි, මම යෝජනා කරන්නේ මෙයයි. ඔවුන් විදේශ රැකියාවලට සම්බන්ධ කරන්න පුළුවන් නම් අපට ඒ අය මේකෙන් ගලවා ගන්න පුළුවන් වෙයි. ඒක තමයි අවශ්‍යතාව.

ගරු කථානායකතුමනි, මටමේ වෙලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වසන්ත යාපාබණ්ඩාර මැතිතුමා.

[අ.භා. 5.57]

**ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி வசந்த யாப்பாபண்டார)
(The Hon. Wasantha Yapabandara, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මේ යෝජනාව ගෙනා ගරු මංජුලා දිසානායක මැතිනියටත්, එම යෝජනාව ස්ථිර කරපු සුදර්ශන දෙනිපිටිය මැතිතුමාටත් මා ස්තුතිවන්ත වෙනවා. මේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව කාලීන යෝජනාවක්.

ගරු කථානායකතුමනි, විශාල කාලයක් දරුවන් සමඟ ගත කරපු කෙනෙකු විධියට මම මේ කාරණය කියන්න ඕනෑ. වයස අවුරුදු 18ට අඩු දරුවන් අපි කාණ්ඩ කිහිපයකට වර්ග කරනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාත් දන්නවා ඇති, සාමාන්‍යයෙන් වයස අවුරුදු 8-12 වාගේ වයසේ පසුවන දරුවන් කරන යමක් වරදක් විධියට අධිකරණය සලකන්නේ නැහැ කියලා. නමුත්, වයස අවුරුදු 12ට එහා දරුවෙකු කරන වරදක් සම්බන්ධයෙන් අධිකරණය යම් පරීක්ෂණයක් පවත්වනවා. එහෙම පරීක්ෂණයක් පවත්වා ඔහු කරපු ක්‍රියාවේ ප්‍රතිවිපාක තේරුම් ගන්න පුළුවන් කෙනෙක්ද කියන එක අවබෝධ කරගෙන තමයි ඒ වරදට දඬුවමක් ලබා දෙන්නේ. මම යෝජනා කරන්නේ මෙයයි. සමහර ළමයි ආදීනව පිළිබඳව දැනුවත්ව හෝ නොදැනුවත්ව හෝ කරන ක්‍රියා අවසානයේ ඒ දරුවන් අපරාධකරුවන් දක්වා විකාශනය වීමට හේතු වෙනවා. සමහර දරුවන් අද තිබෙන තාක්ෂණය සහ සමාජ ජාල නිසා විශාල විනාශයකට ලක් වෙලා තිබෙනවා. වරදක් කළාම පළමුවැනි පැමිණිල්ල යන්නේ පොලීසියට. පොලීසියේදී ඒ පිළිබඳ මූලික විමර්ශනයක් කරනවා, ගරු කථානායකතුමනි. පොලිස් විමර්ශනවලදී ඒ දරුවන් පිළිබඳව සොයා බලන්නේ විවෘත අවකාශයක් තුළ. එහිදී ප්‍රශ්න කිරීම් කරන්නේ කිසියම් විද්‍යාත්මක පදනමක් යටතේ නොවෙයි කියලා මම එක පැත්තකින් චෝදනාවක් කරනවා. මේ නිසා පොලීසිය තුළදී මේ දරුවන් harassment එකකට, අනර්ථයකට, විනාශයකට ලක් වෙනවා. පොලීසිය විවෘත අවකාශයක් තුළ ඒ දරුවන්ගෙන් ප්‍රශ්න කරන කොට, හරස් ප්‍රශ්න අහන විලාසයෙන් ඒ කටයුතු කාරණා සිදුවනකොට වරදක් නොකළ දරුවන් පවා වැරැදිකරුවන් කියලා සමාජයේ මතයක් ගොඩනැඟෙනවා. ඒ දරුවන් පිළිබඳව පොලීසිය කරන විමර්ශනයෙන් පසුව අධිකරණ ක්‍රියාවලියට ගියාට පස්සේ අධිකරණයේදී කරන ප්‍රශ්න කිරීම් හමුවේ නිවැරැදිකරුවනුත් වැරැදිකරුවන් විධියට තමයි උසාවි සංකීර්ණය තුළත් ඉන්නේ, ඉන් පිටතටත් යන්නේ. එම නිසා මේ විමර්ශන කටයුතු පිළිබඳවත් අපේ අවධානය යොමු කරන්න ඕනෑ කියලා

අපේ අධිකරණ අමාත්‍යතුමාගෙන් අපි ඉල්ලීමක් කරනවා. මොකද, මෙහිදී නිවැරදි දරුවන් වැරදිකරුවන් විධියට සමාජගත වීම අපි කිසිසේත්ම අනුමත කරන දෙයක් නොවෙයි.

ඒ වාගේම, පසුගිය කාලයේ පරිගණක අපරාධ, ටැබ් යන්ත්‍ර එහෙම නැත්නම් ජංගම දුරකථන යන මේ සියල්ල හරහා ළමා අපචාර විශාල වශයෙන් වර්ධනය වෙලා තිබෙනවා. ඒ නිසා ඇත්තටම අද වනකොට cyberbullying පිළිබඳව ලෝකයේ තිබෙන Actsවල provisions ලංකාවේ ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

මෙම දරුවන් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරපු අපේ මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය කාලීන මාතෘකාවක් පිළිබඳ කල්තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මම කියන්න කැමැතියි, අද විශාල වශයෙන් මිනිස්සු අතර, නැත්නම් තරුණයන් අතර, විශේෂයෙන්ම ළමයින් අතර -උසස් පෙළ, සාමාන්‍ය පෙළ දරුවන් අතර- බහුල වශයෙන් විවිධ ක්‍රමවලට මත් ද්‍රව්‍ය ව්‍යාප්ත වෙමින් තිබෙන බව. ඇත්ත වශයෙන්ම මේ අවදානම පිළිබඳවත් අපට සලකා බලන්න වෙනවා. ගැටවර වියේ පසුවන අය අත්හදා බැලීම් සඳහා මේ දේවල් වැඩි වැඩියෙන් භාවිත කරනවා. මෙම දරුවන් -සාමාන්‍ය පෙළ කරපු ළමයින්- විශේෂයෙන්ම සමූහගත වුණාට පසු නිදහස් අවකාශය තුළ කිසියම් ප්‍රචණ්ඩ තත්ත්වයක් මුදා හරිනවා. එම නිසා ඔවුන් නිතැතින්ම යම් යම් අපරාධමය කාරණා වෙත යොමු වෙනවා.

පාසල්වල උසස් පෙළ සහ සාමාන්‍ය පෙළ හදාරන දරුවන්ට උගන්වන ගොඩක් ගුරුවරුන්ට සුවිශේෂ පුහුණුවක් මේ කාරණය සම්බන්ධයෙන් නොමැති බවයි මගේ අවබෝධය. මෙම දරුවන් -ගැටවර වියේ ප්‍රචණ්ඩ දරුවන්- අවනත වෙන්නේ ගුරුවරුන් කිහිප දෙනෙකුට පමණයි. මේ දරුවන් අවනත කර ගැනීම සඳහා සුවිශේෂ දක්ෂතාවක් සෑම ගුරුවරයෙකුටම නැත කියලා මම කියනවා. එම නිසා ගැටවර වියේ පසුවන දරුවන් හරහා සිද්ධ වන ප්‍රචණ්ඩත්වය නිසාත්, මත් ද්‍රව්‍ය ප්‍රශ්නය නිසාත්, අද වනකොට තිබෙන සමාජ ජාල අවකාශය තුළත් මේ දරුවන් විනාශකාරී කටයුතුවලට යොමු වෙනවා. සාමාන්‍යයෙන් රාජකාරිවලට යන දෙමව්පියන්ට තිබෙන ආර්ථිකමය වපසරිය තුළ ඒ දරුවන් පිළිබඳව සොයා බැලීම් කරන්න තරම් කාලයක් නැහැ.

ගරු කථානායකතුමනි, තරුණ දරුවන් තමයි අපේ රටේ අනාගත ජීවනාලිය වන්නේ. මේ තරුණ දරුවන් අකාලයේ මිලින වෙලා යෑම තුළින් මේ රටේ අනාගත සුබසිද්ධියට විශාල අගතියක් ඇති වෙනවා කියලා මම විශ්වාස කරනවා. අපේ අධිකරණ රාජ්‍ය අමාත්‍යතුමා මේ සභාවේ ඉන්නවා. ඔබතුමාගේ විශේෂ අවධානයත්, අධිකරණ අමාත්‍යතුමාගේ විශේෂ අවධානයත් මේ කරුණුවලට යොමු කරන්න. ගැටවර වියේ පසුවන දරුවන්ගේ හැසිරීම ප්‍රචණ්ඩත්වය කරා යෑම සහ අවසානයේදී ඔවුන් අපරාධකරුවන් බවට පත් වීමත්, මත් ද්‍රව්‍ය ජාවාරම්කාරයන්ගේ අතට හසු වීමත් නිසා ඒ තරුණ දරුවන්ගෙන් රටට විශාල විනාශයක් සිද්ධ වෙනවා.

ඒ වාගේම මෙහිදී සාකච්ඡා වුණ තවත් පොඩි කාරණාවක් ගැන මම කියන්න ඕනෑ. එම කාරණාවත් මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. විශේෂයෙන්ම බහුකාර්ය යෝජනා ක්‍රම යටතේ රැකියාවලට බඳවා ගත්ත දරුවන්ගේ රැකියා ස්ථිර කිරීම මේ දවස්වල කරනවා. සමහර වෙලාවට පොලිස් විමර්ශන තිබෙන, අධිකරණ හරහා දීලා තිබෙන තීන්දු නිසා ඔවුන් ස්ථිර කිරීමේ කටයුත්ත කරන්න බැරි වෙනවා. එම නිසා මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ඒ නිසා මේ අයගේ යම් යම් වැරදි තිබුණා වුණත් මේ වෙලාවේ ඔවුන් එළවා දැමීමෙන් ආර්ථික වශයෙන් ලොකු අනර්ථයක් වෙනවා කියලා මම හිතනවා. එම දරුවන්ට අධිකරණ හරහා තීන්දු දීලා තිබෙන නිසා සමහර වෙලාවට ඔවුන් ස්ථිර කිරීමට බාධාවක් තිබෙනවා. නමුත්, ඒ ගැන සාධාරණව බලලා ඒ පිළිබඳවත් කටයුතු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරමින්, ගරු කථානායකතුමනි, මට මේ කාලය ලබා දුන්නාට ඔබතුමාට ස්තුතිය ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කපිල අතුකෝරල මන්ත්‍රීතුමා.

[අ.භා. 6.03]

**ගරු කපිල අතුකෝරල මහතා**
(மாண்புமிகு கபில அதுகோரல)
(The Hon. Kapila Athukorala)
ගරු කථානායකතුමාගෙන් අවසරයි.

ගරු කථානායකතුමනි, ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය ගෙනෙන ලද මෙම කාලෝචිත යෝජනාව පිළිබඳව වචන කිපයක් කථා කරන්න මට හිතුණා. ගරු කථානායකතුමනි, වයස අවුරුදු 18ට අඩු බාල වයස්කාර දරුවන්ට, එහෙම නැත්නම් තරුණ පිරිසට සිදු වෙන අනර්ථය පිළිබඳවත්, මගේ දිස්ත්‍රික්කයේ තරුණ ප්‍රජාව පිළිබඳවත්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විධියට මට විශාල දැනීමක් තිබෙනවා. අවුරුදු 25ක්, 30ක් තිස්සේ තිබුණු යුද්ධය නිසා අපේ පළාතේ ඉන්න දරුවන්ට හරිහමන් අධ්‍යාපනයක් ලබා ගන්න බැරි වුණා. ඒ නිසා ඒ මිනිස්සු දුප්පත් වුණා. සමහර අය නූගත්භාවය අත්පත් කර ගත්තා.

ඒත් එක්කම වර්තමානයේ තිබෙන ආර්ථික අර්බුදයත් එක්ක අපි විශාල ඩොලර් අර්බුදයකට මැදි වෙලා ඉන්නවා. ඒ වාගේම මේ වෙලාව අපේ රට දැවැන්ත ආර්ථික පරිහානියකට ලක් වෙලා තිබෙන වෙලාවක්. අද අපේ රටේ කොච්චර තරුණ පිරිසක්, මිනිස්සු පිරිසක් අසරණ වෙලා ඉන්නවාද? වැඩ කරන පැය ගණනත් එක්ක නිෂ්පාදන ආර්ථිකයක් ගැන කථා කරන අපට යල් පැන ගිය නීති-රීති එක්ක රටක් විධියට ඉදිරියට යා හැකිද කියන ප්‍රශ්නය මා හමුවේ තිබෙනවා.

ගරු කථානායකතුමනි, මා ඔබතුමාට මතක් කරනවා, තරුණයන් වෙනුවෙන් එක් එක් රජයන් නොයෙකුත් වැඩ පිළිවෙළ යෝජනා කර තිබෙනවාය කියන කාරණය. ඒ, ජාතික තරුණ සේවා සභාව හරහා වෙන්න පුළුවන්, යොවුන් සේනාංක හරහා වෙන්න පුළුවන්, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන හරහා වෙන්න පුළුවන්. ඒ මොනවා කළත්, පුංචි හෝ වැරැද්දක් කරලා තිබුණොත්, ඒ වැරැද්ද කළා කියලා පොලිස් වාර්තාව ආවාම, ඒ දරුවාට එතැනින් එහාට ගමනක් නැති වෙනවා. රැකියාවකට ගන්නකොට -විදේශ රටක වෙන්න පුළුවන්, පෞද්ගලික ආයතනයක වෙන්න පුළුවන්, රාජ්‍ය ආයතනයක වෙන්න පුළුවන්- අහන එක ප්‍රශ්නයක් තමයි, "ඔබ උසාවියක වැරදිකරුවෙකු වී තිබේද?" කියන එක. එතකොට වැරැදි කරන අය උගත් ද, බුද්ධිමත් ද, නූගත් ද කියන කාරණාවත්, ඒ අය පොහොසත් ද, දුප්පත් ද කියන කාරණාවත් අදාළ වන්නේ නැහැ. මේ සමහර වැරැදි ඒ දරුවෝ සමාජයෙන් අත්පත් කරගත්ත ඒවා. සමාජයේ තිබෙන වැරදිත් එක්ක නිවැරදිකරුවන් පවා සමහර අධිකරණවල වැරැදිකරුවන් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරන්නේ, මෙන්න මේ තරුණ දරුවන්ට රැකියාවකට යන්න -විදේශ රැකියාවකට යන්න, පෞද්ගලික අංශයේ රැකියාවකට යන්න- තිබෙන මේ බාධාව ඉවත් කළ යුතු බවයි.

[ගරු කපිල අතුකෝරල මහතා]

ගරු කථානායකතුමනි අපි වාහනයේ එනකොට දකිනවා, වැලිකඩ සිර ගෙදර ඉස්සරහ තාප්පයේ "සිරකරුවෝ ද මනුෂ්‍යයෝ ය" කියලා ගහලා තිබෙන ආකාරය. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයට අනුව, මිනිස්සු ඔක්කොටම මානව අයිතිවාසිකම් අයිතියි. හැබැයි, වයස අවුරුදු 18ට අඩු දරුවෙක් වේවා, තරුණ කෙනෙක් වේවා පුංචි හෝ වැරැද්දක් කළාට පස්සේ දඬුවම් කිහිපයකට ලක් වෙනවා. එක පැත්තකින්, පොලිස් කූඩුවේ ඉන්න ඕනෑ. පැය 24කට කලින් නඩුවක් පවරන්න ඕනෑ. එතැනින් පස්සේ සැකකරුවකු විධියට සිරගත කළොත් -දවස් 7ක් වෙන්න පුළුවන්, දවස් 14ක් වෙන්න පුළුවන්, ඊට වඩා කාලයක් වෙන්න පුළුවන්- ඒ කාලය තුළදීත් දඬුවමක් විඳින්න ඕනෑ. ඊට පස්සේ නඩු කටයුත්ත යනවා. ඒ නඩු කටයුත්තේදී පනවන දඬයකට යටත් වෙන්නත් ඕනෑ. නඩුවක් පවරපු ගමන් දඬයක් නියම කරන රාජකාරිය කලට වේලාවට වෙන්නෙත් නැහැ. සමහර වෙලාවට අවුරුද්දක්, දෙකක්, අවුරුදු පහක්, දහයක් දික් ගැස්සෙන නඩුත් තිබෙනවා. එතකොට ඒ කාලය තුළත් වන්දි ගෙවන්න වෙනවා. සිතා හෝ නොසිතා කරන වැරදි නිසා සමහර තරුණ කණ්ඩායම් ලොකු ප්‍රශ්නවලට මුහුණ දී තිබෙනවා.

ඒ වාගේම මම ඔබතුමාට මේ කාරණයත් මතක් කරනවා. සමහර වෙලාවට තාත්තා වැරැද්දක් කර තිබෙනවා නම්, "තාත්තා වැරැද්දක් කර තිබෙන නිසා මේ කටයුත්ත කරන්න බැහැ" කියන එක අර රැකියාවට යන දරුවාගේ පොලිස් වාර්තාවට ඇතුළත් කරනවා. ඒ වාගේම පවුලේ සහෝදරයෙක් වැරැද්දක් කරලා තිබෙනවා නම් ඒක ඇතුළත් කිරීමෙන් කරන්නේත් සමාජය ඉස්සරහට එන දරුවන්ට අගතියක් කියන එක මම ඔබතුමාට මේ වෙලාවේ මතක් කරනවා.

අපරාධමය ගණයට වැටෙන මත්ද්‍රව්‍ය පිළිබඳ නඩු, ස්ත්‍රී දූෂණ නඩු, මිනී මැරුම් නඩු ගැන නොවෙයි මම මේ කථා කරන්නේ. නමුත්, අපරාධමය වැරැද්දක් වුණත්, එක වැරැද්දක් කරලා අහු වුණොත් ඔහු අපරාධකරුවෙකු විධියට ලියාපදිංචි වෙනවා. වැරදි දෙකක් හෝ කිහිපයක් කළාට පස්සේ දිවයිනේ ලියාපදිංචි අපරාධකරුවෙක් කියන ලේබලය ඔහුට ගහනවා. එතකොට දිවයිනේ ලියාපදිංචි අපරාධකරුවෙකු වසර 60ක්, 70ක් යනකල් පොලීසියේ අධීක්ෂණය යටතේ පසුවෙනවා. එතකොට ඔහුට ව්‍යාපාරයක් කරන්නත් බැහැ, රජයේ රැකියාවක් කරන්නත් බැහැ, විදේශගත වෙන්නත් බැහැ.

මගේ දැනීමේ හැටියට මේ වනකොටත් සිරගත වෙලා ඉන්න සංඛ්‍යාව 25,000කට හෝ 30,000කට එහා ගණනක් වනවා. ඒ අයත් එළියට ආවාට පස්සේ මේ රටට බරක් මිසක් සුගතියක් වන වැඩක් වෙන්නේ නැති බව මම ඔබතුමාට මතක් කරනවා.

ගරු මංජුලා දිසානායක මැතිතුමිය සභාව කල් තබන අවස්ථාවේ ගෙනා මේ යෝජනාව අනුමත කරමින්, පාර්ලිමේන්තුව -මේ උත්තරීතර සභාව- ඇතුළේ පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව රටේ දරුවන් ගැන, රටේ තරුණ ප්‍රජාව ගැන අපි මීට වඩා සිතා බලා කටයුතු කළ යුතුයි කියන යෝජනාව පොලීසිය භාර අමාත්‍යවරයාට හෝ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාට මම ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, මම නියෝජනය කරන ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තිබෙන Lanka IOC ආයතනය පෞද්ගලික සමාගමක්. කෙනෙකුගේ පොලිස් වාර්තාවේ පුංචි හෝ රථ වාහන වැරැද්දක්, එහෙම නැත්නම් සුළු පැමිණිල්ලක් හෝ සටහන් වෙලා තිබුණොත්, ඒ සමාගමේ බවුසරයේ රියදුරු රැකියාවටවත් ගන්නේ නැහැ. එම නිසා මේ තත්ත්වය වෙනස් කර දෙන්න කියා ඉතා ඕනෑකමින් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජයන්ත වීරසිංහ මන්ත්‍රීතුමා.

[අ.භා. 6.09]

**ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி ஜயந்த வீரசிங்க)
(The Hon. Jayantha Weerasinghe, PC)

ගරු කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ගෙනා යෝජනාව ගැන කථා කරන්න මට සුළු කාලයක් හෝ ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඉතා කාලෝචිත, කාලීන මාතෘකාවක් ගැන සාකච්ඡා කෙරෙන මෙම යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව මම ප්‍රථමයෙන්ම ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමියට ස්තුතිවන්ත වෙනවා. එතුමිය මවක් හැටියට වාගේම තරුණ අයගේ ප්‍රශ්න දන්නා කෙනෙකු හැටියට මේ යෝජනාව ඉදිරිපත් කළා. ඒ යෝජනාව ස්ථිර කළ ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමාත්, ඒ ගැන කථා කරපු අනෙක් සියලු ගරු මන්ත්‍රීවරුත් දැක්වූ ඉතා වැදගත් අදහස් මා මේ අවස්ථාවේදී අනුමත කරනවා.

ගරු කථානායකතුමනි, ජ්‍යෙෂ්ඨ ජනාධිපති නීතිඥවරයෙකු හැටියට මා දැක තිබෙනවා, මේ කියන කාරණයට සම්බන්ධ සිදුවීම්. බාල වයස්කාර දරුවෙක් යම් වරදක් කළාම පුනරුත්ථාපනයට යොමු කරනවා. පුනරුත්ථාපනය කරනවා කියන්නේ ඒ පුද්ගලයා කරපු වැරදි නිවැරදි කරලා නැවත සමාජයට ඇතුළු කිරීමයි. එහෙම පුනරුත්ථාපනයට ලක් වූ දරුවෙකුට පොලිස් වාර්තාවක් ගන්න අවශ්‍ය වුණාම අසවල් වරද නිසා ඔහු පුනරුත්ථාපනය වුණා, අසවල් වරදට ඔහු හසු වුණා කියන එක ඒ පොලිස් වාර්තාවට ඇතුළත් කරනවා නම් ඒ පුද්ගලයාට රැකියාවකට යන්න බැරි වෙනවා, අනාගතයේ ඔහුට කිසිම රටකට යන්න බැරි වෙනවා, පිට රටකින් වීසා ගන්න බැරි වෙනවා. ඒ නිසා ඔවුන් විශාල අගතියකට පත් වෙනවා. මේ කාරණය මම දැක තිබෙනවා. විශේෂයෙන් පුනරුත්ථාපනය කළ යුතුයි කියා තීරණය කරන්නේ බාල වයස්කාර දරුවන්. ඒ කියන්නේ අවුරුදු 18ට කලින් නොදන්නාකමින් වැරදි සිදු කළ අය. එහෙම නම් නොදන්නාකමින් වෙච්ච වැරදි, කෙනෙකුට ලේබල් හැටියට වදිනවා නම් අනාගතයේදීත් ඔහුගේ කටයුතු කර ගන්න බැරි වෙන්න, ඒක විශාල වරදක් කියා මම හිතනවා. මෙවැනි දේවල් දිනපතා සිද්ධ වෙන බව අපි උසාවිවලදී අසා තිබෙනවා. එම නිසා මම ගරු අධිකරණ රාජ්‍ය ඇමතිතුමාට දන්වා සිටිනවා, ගරු ඇමතිතුමාත් දැනුවත් කරලා මේ කාරණාවට අවධානය යොමු කරන්න කියලා. පුනරුත්ථාපනයට භාජන වෙච්ච බාල වයස්කාර දරුවෙකුට -මම බාල වයස්කාර කියන්නේ අවුරුදු 18ට අඩු හින්දා- කවදාවත් කිසිම විධියකින් ලේබලයක් වදින්න ඉඩ තියන්න එපා. ඒ සඳහා අවශ්‍ය නීති සකස් කර දෙන්න කියා මා ඉල්ලා සිටිනවා. ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමියට අනේක වාරයක් ස්තුතිවන්ත වෙනවා මේ යෝජනාව ගෙන ඒම ගැන.

[අ.භා. 6.12]

**ගරු සමන්ප්‍රිය හේරත් මහතා**
(மாண்புமிகு சமன்பிரிய ஹேரத்)
(The Hon. Samanpriya Herath)

ගරු කථානායකතුමනි, අප කාගේත් අවධානයට ලක් විය යුතු කාරණයක් ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය විසින් සභාව කල් තැබීමේ යෝජනාව හැටියට අද ඉදිරිපත් කර තිබෙනවා කියා මා හිතනවා. වයස අවුරුදු 18ට අඩු බාල වයස්කාර දරුවන් අතින් ගෙදරදී හෝ බාහිර සමාජයේදී සිදු වෙන වැරැද්දක් වෙනුවෙන් මූලික පරීක්ෂණ ආරම්භ කරන්න වාගේම, පැමිණිලි කරන්න ඉස්සෙල්ලාම යන්නේ පොලීසියේ ළමා හා කාන්තා කාර්යාංශයට. ඇත්තටම එතැන ඉඳලා ඒ දරුවන්ට සිදු වෙන අසාධාරණය ගැන අපි අවධානය යොමු කරන්න ඕනෑ. විශේෂයෙන්ම ඒ දරුවන් සමාජය විසින් යම් යම් වැරැදිවලට පොලඹවා ගත් අය වෙන්න පුළුවන්. ඒ වාගේම නොදැනුවත්කම නිසා වැරැදිවලට පෙලඹුණු අය වෙන්න පුළුවන්. නමුත් අවසානයේදී ඒ දරුවන් උසාවිය දක්වා ගිහිල්ලා, ඒ හැම අවස්ථාවකදීම ඉතාම අපහසුතාවට ලක් වෙනවා. ඒක එසේ නොවිය යුතුයි. මේ රටේ අනාගතය බාර ගන්න ඉන්න පිරිස වන ඒ දරුවන්ට යහපත් සමාජයක් නිර්මාණය කර දෙන්නට වැඩිහිටියන් විධියට අපට ලොකු වගකීමක් තිබෙනවාය කියන කාරණය මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

යම් වරදක් පිළිබඳව මූලික පරීක්ෂණ කටයුතු කළාට පස්සේ දරුවෙක් යොමු කරන්නේ පුනරුත්ථාපනයට. පුනරුත්ථාපනයට යොමු කළාට පස්සේ මම හිතන හැටියට ඒ දරුවන්ට නැවතත් වැරැදිවලට පෙලඹෙන මානසිකත්වයක් තමයි ඇති වෙන්නේ. ඒ දරුවා ඊට පස්සේ සමාජගත වුණාමත් සමාජයෙන් කොන් වෙන තත්ත්වයට පත් වෙනවා. ඒ වාගේම ඒ අය රැකියාවකට ඉල්ලුම් කරන අවස්ථාවේදීත් ඒ කළ වරද ගැන අනිවාර්යයෙන් police report එකේ සඳහන් වෙනවා. ඒක බරපතළ ව්‍යසනයක්. ඒ නිසා සමාජය කෙරෙහි යම් වෛරයක් ඇතිවෙලා, සමාජයේ විනාශය කෙරෙහි විශාල බලපෑමක් කරන පුද්ගලයෙකු බවට ඒ දරුවා පත් වෙනවා.

එය එසේ නොවිය යුතුයි කියන තැනයි අපි ඉන්න ඕනෑ. පොලීසියේ සිට පුනරුත්ථාපන කඳවුර දක්වාම මේ නිවැරැදිතාව අපි ආරක්ෂා කරන්න ඕනෑ. ඒකට පාර්ලිමේන්තුව විධියට අපට යම් යම් නීති සම්පාදනය කරන්න වෙයි. ඒ දරුවන්ගේ අනාගතය ආරක්ෂා කර ගැනීමේ වගකීම තිබෙන්නේ අපට. ගරු රාජ්‍ය ඇමතිතුමාත් මේ ගරු සභාවේ ඉන්නවා. අද පාර්ලිමේන්තුවට මේ යෝජනාව ගෙනැල්ලා ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය මවක විධියට, ඒ වාගේම ගුරුවරියක විධියට මේ කාරණය අපේ අවධානයට ලක් කිරීම වෙනුවෙන් අපි එතුමියට ස්තුතිවන්ත වෙනවා. අද මේ කථා බහට ලක් වෙන දරුවන්ට මේ සමාජය තුළ ජීවත්වීමට අවශ්‍ය යහපත් වටපිටාව අපි හදනවා වාගේම, ඒ අය යහපත් පුරවැසියන් විධියට සමාජගත කිරීමේ වගකීමත් අපට තිබෙනවා. විශේෂයෙන් පාසල් තුළත් ඒ තත්ත්වය ඇති කළ යුතුයි. මොකද ඒ දරුවන් නැවත පාසලට ගියාම ඒ පාසල් තුළදීත් යම් යම් අපහසුතාවලට ලක් වෙනවා. ඒ වාගේම සමාජ මාධ්‍ය, මුද්‍රිත මාධ්‍ය, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය තුළ පවා ඒ දරුවන් අපහසුතාවට ලක් වෙන අවස්ථා අපි ඕනෑ තරම් දැක තිබෙනවා. ඒවා වැළැක්වීම සඳහා යම් යම් නීති අවශ්‍යයි. ඒ කාරණය ගැන ව්‍යවස්ථාදායකය විධියට මේ ගරු සභාවේ අවධානය යොමු කරලා කටයුතු කළ යුතුයි. ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා, ඒ සඳහා අවශ්‍ය නීති සකස් කරන්න කියලා. ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය ගෙන ආපු මේ යෝජනාව ඉතාම වැදගත් යෝජනාවක් බව නැවතත් මතක් කරමින්, යහපත් අනාගත ළමා පරපුරක් ගොඩනඟන්න අවශ්‍ය ඒ වැඩ පිළිවෙළ නිර්මාණය කරන්න කියන ඉල්ලීමත් කරමින්, මට මේ අවස්ථාව ලබාදීම ගැන ගරු කථානායකතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 6.16]

**ගරු අනුරාධ ජයරත්න මහතා (අධිකරණ හා බන්ධනාගාර කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுராத ஜயரத்ன - நீதி மற்றும் சிறைச்சாலை அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Anuradha Jayaratne - State Minister of Justice and Prison Affairs)

ගරු කථානායකතුමනි, මේ කාරණය පිළිබඳව අද මේ ගරු සභාවේ අවධානය යොමු කරවීම පිළිබඳව ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමියට මා ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අනෙකුත් වැදගත් අදහස් ඉදිරිපත් කළ, අපේ ගරු මන්ත්‍රීතුමන්ලා සියලුදෙනාටත් මා ස්තුතිවන්තපේ ගරු මන්ත්‍රීතුමන්ලා සියලු දෙ වෙනවා.

ගරු කථානායකතුමනි, අවුරුදු 18ට අඩු බාලවයස්කාර පිරිස් වරදකරුවන් බවට පත් වුණාම, ඔවුන් පුනරුත්ථාපනය කිරීම සහ මේ කියන සියලු කාරණා අද අපි සිදු කරනවා. තරුණ වරදකරුවන් සම්බන්ධයෙන් වන අභ්‍යාස විද්‍යාල පිහිටුවීම පිළිබඳව වන ආඥාපනත යටතේ සහතික ලබපු පුහුණු පාසල්වලට ඒ දරුවන් යොමු කරලා විනයානුකූලව නිසි මඟට ගැනීමේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්න අවශ්‍ය ප්‍රතිපාදන මේ වෙනකොට මේ උත්තරීතර සභාව මඟින් සකස් කරලා තිබෙනවා.

මේ අවස්ථාවේ මම තවත් කාරණා කිහිපයක් සඳහන් කළ යුතුයි. මේ වැදගත් මාතෘකාව විවාදයට ගන්නා වෙලාවේ අපි අමාත්‍යාංශය හැටියටත් මෙහි තිබෙන බැරෑරුම්කම හා එවැනි පිරිස් යහපත් පුරවැසියන් හැටියට නැවත සමාජගත කිරීමේදී, ඔවුන්ගේ නොදැනුවත්කම, එහෙමත් නැත්නම් යම් විධියකින් වෙච්ච වැරැද්ද නිසා සමාජයට නැවත නිවැරැදිව මුහුණ දෙන්න පුළුවන් පරිසරය හදන්නේ කොහොමද කියන කාරණයට අවධානය යොමු කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, එහිදී යම් යම් සාධනීය කාරණා කිහිපයක් අපි මේ වන විට ඉටු කරලා තිබෙනවා. එහි එක කාරණාවක් තමයි අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කියපු, අපි භාවිත කරන "පුනරුත්ථාපනය" කියන වචනය. අපි දැකපු එක දෙයක් තමයි, පුනරුත්ථාපනය වෙච්ච දරුවෙක්, එහෙම නැත්නම් පුනරුත්ථාපනය වෙච්ච පුද්ගලයෙක් සමාජගත වුණා කිව්වාම, ඒක අද බරපතළ තත්ත්වයක් බව. මොකද, ඊට පස්සේ රැකියාවක් හෝ ඕනෑම දෙයකට ඔවුන් ඉල්ලුම් කරන විට පුනරුත්ථාපනය වෙච්ච පුද්ගලයෙක් කිව්වාම, ඔවුන්ට සමාජයේ තිබෙන තත්ත්වය මොකක්ද කියන එක අපි දන්නවා. ඒ නිසා දැනට අපි තීන්දු කරලා තිබෙනවා, "පුනරුත්ථාපනය" කියන වචනය සම්පූර්ණයෙන්ම ඉවත් කරන්න. මම එක උදාහරණයක් කියන්නම්, ගරු කථානායකතුමනි. අපි දන්නවා, මහරගම පිළිකා රෝහල වශයෙන් තිබුණු රෝහල අපි අපේක්ෂා රෝහල බවට පත් කළ බව. ඒ වාගේ අපේ තිබෙන පුනරුත්ථාපන මධ්‍යස්ථාන සියල්ලේම නම් ටික වෙනස් කරලා, ඒවාට වෙනත් නම් දමන්න මේ වන විට කටයුතු කරලා, ඒ සියල්ල අනුමත කරලා තිබෙනවා.

කන්දකාඩු පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ යම් කෙනෙක් පුහුණු වෙලා සහතිකයක් ගත්තොත්, 'ඒ කන්දකාඩු මධ්‍යස්ථානයේ හිටපු පුද්ගලයෙක්' කියලා සමාජයට ගියොත් සියල්ල විනාශයි. මම හිතන්නේ නැහැ, ඔහුට සමාජයේ කිසිම අවස්ථාවක් ලැබෙයි කියලා. ඒ නිසා අපි මෙතැනින් එහාට ඒ සහතික නිකුත් කරන්නේ "නවෝදා ප්‍රතිකාර මධ්‍යස්ථානය" හැටියට. ඊළඟට, අපේ සේනපුර තිබෙන මධ්‍යස්ථානය සහතික නිකුත් කරන්නේ, "නවෝදා තෘතීය හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානය" හැටියට. ඊළඟට, අපේ වවුනියාවේ තිබෙන පුහුණු කඳවුරට ඇතුළු වෙන ඕනෑම කෙනෙකුට "සාරංගා මධ්‍යස්ථානය" හැටියට තමයි ඔවුන්ගේ සහතික පත්‍ර නිකුත් කරන්නේ.

[ගරු අනුරාධ ජයරත්න මහතා ]

ඔවුන්ට සමාජයේ පිළිගැනීමකට ලක්වීමට තිබිච්ච අවස්ථාව, කන්දකාඩු, සේනපුර, වවුනියාව වැනි නම් භාවිත කරලා නැති වුණා නම්, මේ යෝජනා ක්‍රියාත්මක වීම තුළින් මින් ඉදිරියට ඒ තත්ත්වය අයින් වෙයි කියා අපි විශ්වාස කරනවා.

ගරු කථානායකතුමනි, පුහුණු වෙච්ච ඒ දරුවන් වෙනුවෙන් සහතික පත්‍ර නිකුත් කරන විට අපි කිසිම අවස්ථාවක ඔවුන් මේ කියන මධ්‍යස්ථානවල වැරදිකරුවන් හැටියට සිටියා කියලා හෝ ඔවුන් කර තිබෙන වරදේ ස්වභාවය පිළිබඳව ඒ සහතිකවල හෝ වෙනත් කිසිම දෙයක ලකුණු කරන්නේ නැහැ. උදාහරණයක් හැටියට කිව්වොත්, NVQ Level 4 දක්වා සහතික පත්‍ර ලබා දීමේ හැකියාව අපට මෙහිදී තිබෙනවා. හැබැයි, ඒ NVQ Level 4 සහතික පත්‍රයේ මොනම විධියකින් හෝ සඳහන් වුණා නම්, ඔහු මත් ද්‍රව්‍යවලට ඇබ්බැහි වුණු පුද්ගලයෙක් කියලා, ඔවුන්ට ඒ මොන සහතිකය ලබා දුන්නත් අවසානයේ වැඩක් වෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි, එම නිසා මේ කියන කිසිම කාරණාවකදී වරදේ ස්වභාවය අපි මොනම විධියකින්වත් සඳහන් කරන්නේ නැහැ කියන එක මම කියන්න ඕනෑ.

අද වන විට තිබෙන සංඛ්‍යාලේඛන ගත්තොත්, වයස අවුරුදු 18ට අඩු තැනැත්තන් 200කට අඩු පිරිසක් බන්ධනාගාරගත වෙලා ඉන්නවා. ඒ අතරින් 150 දෙනෙකු පමණ ඉන්නේ රිමාන්ඩ් බන්ධනාගාරගත රැඳවියන් හැටියට. අපි ඔවුන් පල්ලන්සේන, වටරැක, තල්දෙන වාගේ ස්ථානවල රඳවා තිබෙනවා. සුවිශේෂී වූ වෙනම ස්ථානවලයි ඔවුන් රඳවා තිබෙන්නේ. ඔවුන්ට අවශ්‍ය වෘත්තීය පුහුණුව වෙනත් පුහුණුවීම් ලබා දිය හැකි තැන් හැටියට එම ස්ථාන සංවර්ධනය කරලා, ඒ ස්ථානවල ඔවුන් ස්ථානගත කරලා, NVQ Level 4 දක්වා යන සහතික පත්‍ර පවා ලබා දෙන්න අපි මේ වන විට කටයුතු කරමින් යනවා. ගරු කථානායකතුමනි, වයස අවුරුදු 18ට අඩු වරදකරුවන් හැටියට උසාවියෙන් තීන්දු වෙච්ච පිරිසට පුහුණුවීම් ලබා දුන්නාම, ඒ අයට මොනම විධියකින්වත් ගැටලුවක් වීමට අපි ඉඩ තබන්නේ නැහැ. ඔවුන් නැවත සමාජගත වෙලා, ඒ සහතික පත්‍ර උපයෝගී කරගෙන රැකියාවකට යොමු වෙනවා නම්, විදේශගත වෙනවා නම්, ඒ කිසිම දෙයකට බලනොපාන ආකාරයට තමයි අපි ඒ සහතික පත්‍ර ලබා දෙන්න කටයුතු කරන්නේ.

ගරු මන්ත්‍රීතුමියනි, මේ යෝජනාවත් පදනම් ගෙන අද අපි විශේෂ සාකච්ඡාවක් කළා. ගරු කථානායකතුමනි, වටරැක, තල්දෙන වාගේ මධ්‍යස්ථානවල සිටින රැඳවියන් අතර NVQ Level 4 දක්වා යන රැඳවියන් ඉන්නවා. ඒ රැඳවියන්ට අප ලබා දෙන සහතිකවලත්, බන්ධනාගාරගත වෙච්ච රැඳවියන්ට ලබා දෙන සහතිකවලත් මොනම විධියකින්වත් ඒ වරද ලකුණු කරන්නේ නැහැ කියා අපි ඒ සාකච්ඡාවේදීත් තීන්දු කළා. බන්ධනාගාර දෙපාර්තමේන්තුව හැටියට අපි ඒ තීරණය ගත්තේ, ඒ තරුණයන්ගේ, එහෙම නැත්නම් youthful offendersලාගේ ඉදිරි අනාගතය යම් විධියකට නිවැරදි තැනකට අරගෙන ඔවුන් කටයුතු කරගෙන යනවා නම්, ඔවුන්ට ශක්තියක් වීම පිණිසයි.

ගරු කථානායකතුමනි, ඒ අනුව ඒ සහතික පත්‍ර ලබා දීමේදී ඔවුන් කළ වරද සඳහන් නොවුණත්, අපේ ගරු මන්ත්‍රීතුමන්ලා යොමු කරපු ප්‍රශ්නවල තිබිච්ච බරපතළම ප්‍රශ්නය තමයි, ඒ තරුණයන් පොලිස් නිෂ්කාශන වාර්තා ලබා ගැනීමේදී ඇති වන ප්‍රශ්නය. යම් රැකියාවකට යනවා නම් ඒ සෑම අවස්ථාවකදීම පොලිස් වාර්තාවක් අරගෙන එන්න කියනවා. ඒ පොලිස් නිෂ්කාශන වාර්තාවල සඳහන් වෙනවා, ඔවුන්ගේ පෙර වැරැදි. එහෙම නැත්නම්, ඔවුන්ගේ දෙමව්පියන්ගේ වැරදි. ඒ සියල්ල ඒ වාර්තාවේ සටහන් වෙනවා. එවැනි කරුණු කාරණා පොලිස් වාර්තාවේ සටහන් වුණාම ඒ රැඳවියන් සමාජයේ කොයි තරම් යහපත් පුරවැසියන් හැටියට වාසය කළත් මොකද වෙන්නේ? ඔවුන්ට රැකියාවක් හෝ වෙනත් ඕනෑම අවස්ථාවක් හිමි වෙන්න නියමිතව තිබුණා නම්, එවැනි පොලිස් වාර්තාවක් ඉදිරිපත් කළාම, ඔහුට ලැබෙන්න තිබුණු ඒ අවස්ථා ගිලිහී යනවා. ගරු කථානායකතුමනි, පොලිස් විෂය භාර ගරු අමාත්‍යතුමා, අපේ ගරු අධිකරණ අමාත්‍යතුමා, නීතිපතිතුමා, පොලිස්පතිතුමා ඇතුළු කණ්ඩායම මේ පිළිබඳව සාකච්ඡා කළා. මොකද, විදේශගත වීමට බලාපොරොත්තුවෙන් ඉන්න අපේ බොහෝ පිරිසක් ඉන්නවා, මෙවැනි කුඩා කාරණා නිසා විදේශගත වෙන්නට බැරි වුණු. සමාජයට ගියාට පසුව මෙවැනි කාරණා නිසා කළ වරදේ ස්වභාවයට වඩා දඬුවම් විඳින්න සමහර විට ඔවුන්ට සිදු වෙලා තිබෙනවා. එම නිසා මේ කාරණයට අදාළව විශේෂ කැබිනට් පත්‍රිකාවක් අපේ ගරු ටිරාන් අලස් ඇමතිතුමා ඉදිරිපත් කර තිබෙනවා. ගරු කථානායකතුමනි, ඒ කැබිනට් පත්‍රිකාවේ සඳහන් වෙනවා, වංක පරිහරණය ගැන. ඒ කියන්නේ, දණ්ඩනීති සංග්‍රහයේ 387 වගන්තියට අදාළ වන කාරණා පොලිස් නිෂ්කාශන වාර්තාවට ඇතුළත් නොකළ යුතුය කියා සඳහන් වෙනවා. බලන්න, මා ළඟ මේ තිබෙන්නේ ඒ කැබිනට් පත්‍රිකාවෙන් ඉදිරිපත් කරපු කාරණාවලට අදාළව මම ලබා ගත්තු සටහනක්. එහි සඳහන්ව තිබෙනවා, "2017 අංක 29 දරන පනතින් සංශෝධිත අපරාධ වැළැක්වීමේ ආඥාපනතේ උපලේඛනයේ සඳහන් වන වැරදිවලින් අදාළ පෙර වැරදි අතුරින් පහත දක්වා ඇති වැරදි පොලිස් නිෂ්කාශන වාර්තාවට ඇතුළත් නොකළ යුතුයි" කියලා. ඒවායෙන් එකක් තමයි, වංක පරිහරණය. ඊළඟ එක, සාපරාධී විශ්වාසය කඩ කිරීම. ඒ කියන්නේ, දණ්ඩනීති සංග්‍රහයේ 389 වගන්තියේ ඉඳලා 392 දක්වා වගන්ති. ඊළඟ එක, වංචා කිරීම. දණ්ඩනීති සංග්‍රහයේ 400 වගන්තියේ සිට 403 දක්වා වන වගන්ති ඊට ඇතුළත් වෙනවා.

ඊළඟට තිබෙනවා, විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතේ 78 (5) උපවගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන නඩු. ගරු කථානායකතුමනි, මේ කියන කාරණා පොලිස් නිෂ්කාශන වාර්තාවට ඇතුළත් කරන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ඊළඟට අපි ඒ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරලා අවසරය ලබා ගෙන තිබෙනවා, යම් පුද්ගලයෙකු අධිකරණයේදී නිදොස් කොට නිදහස් කළ පුද්ගලයෙකු නම්, එය මින් මතුවට කිසිම විධියකින් පොලිස් නිෂ්කාශන වාර්තාවේ සඳහන් නොකර සිටීමට. මොකද, සමහර වෙලාවට තිබෙන ගැටලුවක් තමයි, ඔවුන් නිදොස් කොට නිදහස් කළත්, මෙවැනි සිද්ධියකට මුහුණ දුන්නාය කියන එක පොලිස් වාර්තාවේ සඳහන් වුණොත් බලන කෙනා ඒ දෙස වෙනත් කෝණයකින් බැලීම. අපි බොහෝ විට සමාජය තුළ එවැනි දේවල් දකිනවා. පත්තරේ headline එකක් යනවා කෙනෙක් රිමාන්ඩ් කළා කියලා, එහෙම නැත්නම් බන්ධනාගාරගත කළා කියලා. හැබැයි, ඉන් පසුව නිදොස් කොට නිදහස් කළත්, ඒ මනුස්සයාට වෙන්න ඕනෑ දේ වෙලා ඉවරයි. එම නිසා එවැනි කාරණාත් මින් මතුවට පොලිස් නිෂ්කාශන වාර්තාවල සඳහන් වන්නේ නැහැ. මම හිතනවා වැඩිහිටි පිරිසට වඩා මෙහි වාසිය ලැබෙන්නේ තරුණ පිරිසට කියලා. අපේ සමාජයේ රැකියා අවස්ථා ලබාගෙන කටයුතු කරන්න සිටින පිරිසට තමයි මෙහි වැඩිම වාසිය ලැබෙන්නේ. මා ඒ බව විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමිය කළ යෝජනාව සම්බන්ධයෙන් මේ වන විටත් අපි සාකච්ඡා කර තිබෙනවා. පොලිස් විෂය භාර ගරු ඇමතිතුමා, නීතිපතිතුමා, පොලිස්පතිතුමා, බන්ධනාගාර කොමසාරිස් ජනරාල්තුමා සහ

අනෙකුත් සියලු කණ්ඩායම් සමඟ සාකච්ඡා කර අවශ්‍ය තීන්දු ටික අරගෙන සුවිශේෂී ස්ථාන තුනක් ඉදිකරලා ඒවායේ තමයි මේ කටයුතු ටික කරගෙන යන්නේ. ඒ යෝජනා හා අදහස් අනුව දැන් වනකොට එම වැඩ කටයුතු ක්‍රියාත්මක වෙනවා, ගරු කථානායකතුමනි.

අපේ ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමියට අද අපි විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා. අප ගෙන තිබෙන මේ තීන්දු ඉදිරියේදී ක්‍රියාත්මක වන විට, කරන ලද වැරැදි ආදිය පොලිස් නිෂ්කාශන වාර්තාවල සටහන් නොවන විට, NVQ Level 4 හෝ යම් පුහුණු පාඨමාලා හදාරන අයගේ සහතිකවල බන්ධනාගාරගත වී සිටියාය කියන කාරණා සඳහන් නොවන විට මේ කියන අපහසුතා බොහොමයක් වළකා ගෙන, අවශ්‍ය සමාජ අවශ්‍යතා ගොඩනගාගෙන, කෙනෙකුට හිමි අවස්ථා ලබාගෙන ඉදිරියට යා හැකි පුරවැසියන් බවට ඔවුන් පත් වෙයි කියා අපි විශ්වාස කරනවා, ගරු කථානායකතුමනි.

අවසාන වශයෙන්, මම නැවතත් කියන්න කැමැතියි, අද දින සභාව කල් තබන අවස්ථාවේ මේ යෝජනාව ඉදිරිපත් කළ අපේ ගරු මංජුලා දිසානායක මන්ත්‍රීතුමියට අප ස්තුතිවන්ත වන බව. මොකද, මෙය අද සමාජයේ ඉටු විය යුතු අත්‍යවශ්‍ය කාරණාවක්. ඒ අය යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම අප හැමගේම යුතුකමක්; වගකීමක්. ඒ නිසා මේ යෝජනාව ගැන මෙතැනදී අදහස් දක්වමින් යම් යම් යෝජනා ඉදිරිපත් කළ සියලු ගරු මන්ත්‍රීතුමන්ලාට සහ ගරු මන්ත්‍රීතුමියලාට අපේ ගෞරවනීය ස්තුතිය පුද කරන ගමන්, අප ඇතුළත් කර නොගත් යම් සුවිශේෂී කාරණා මේ අදහස් සහ යෝජනා අතර තිබෙනවා නම්, ඒවා ද ඇතුළත් කර ගැනීමට අප කටයුතු කරන බව සඳහන් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.26ට, 2023 සැප්තැම්බර් 06වන බදාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி. ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி. ப. 6.26க்கு, பாராளுமன்றம் 2023 செப்ரெம்பர் 06, புதன்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. SPEAKER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.26 p.m. until 9.30 a.m. on Wednesday, 06th September, 2023.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන
නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා
**හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.